නොසැලෙන ශක්තියක්

විශ්වාසයේ ආලෝකයක්

ලංකා බැංකුව වාර්ෂික වාර්තාව 2023

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

නොසැලෙන ශක්තියක්

විශ්වාසයේ ආලෝකයක්

ලංකා බැංකුව සැමවිටම මූල්‍ය ක්ෂේත්‍රයේ ඇතිවූ අභියෝග හමුවේ පරිවර්තනීය වෙනස්කම් සිදු කරමින් සියළු බාධා මැඩගෙන නොසැලෙන ශක්තියකින් ක්‍රියා කරයි. වෙළඳපළ ගතිකත්වයන් සහ නිරන්තරව වෙනස්වන ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් සඳහා සාර්ථකව ප්‍රතිචාර දක්වමින් වසර ගණනාවක් පුරා අපි අපගේ නොසැලෙන ශක්තිය සහ ස්ථාවරත්වය ප්‍රදර්ශණය කර ඇත්තෙමු. අප සතු උපායමාර්ගික දැනුම සහ දීර්ඝකාලීන අත්දැකීම් සම්භාරය උපයෝගී කරගනිමින් ජාතියක් වශයෙන් රට මුහුණදුන් දුෂ්කරතාවන් මැඩගෙන යළි නැඟිසිටීමේ භාරදූර කාර්යයේ පෙරමඟ ගැනීමේ වගකීම සහ මෙහෙවර සඳහා බැංකුව වෙත තබන ලද විශ්වාසය 2023 වසරේදී තවදුරටත් වර්ධනය විය.

අපගේ පාර්ශ්වකරුවන්ට පරිවර්තනීය සහ තිරසාර ප්‍රගතියක් ජනිත කිරීම මූලික කොටගෙන නවෝත්පාදනය සහ නවීන තාක්ෂණය මත බලගැන්වූ ආර්ථික සමාජීය සහ යහපාලන ව්‍යාපාර භාවිතයන් උපයෝගී කර ගන්නා ලදී. අප්‍රතිහත කැපවීම සහ ධෛර්යය මත ගොඩනැඟුණු නොසැලෙන ශක්තිය මතින් පෝෂණය වූ ලංකා බැංකුව සිය පාර්ශ්වකරුවන් වෙත විශ්වාසයේ ආලෝකය පතුරවමින් ඉන්ද්‍රබීලයක් මෙන් නොසැලී ඉදිරියටම ගමන් කරනු ඇත.

ලංකා බැංකුව

BOC

ජාතියේ මහා පහන් ටැඹ

පටුන

1 දළ විශ්ලේෂණය →
ජාතික මූල්‍ය පද්ධතියට මඟ කියන්නාවූ මහා පහන් ටැඹ

මෙම වාර්තාව පිළිබඳව 4
සමෝධානික චින්තනය තුළින් වටිනාකමක් ඇති කිරීම 7
ලංකා බැංකුව පිළිබඳව සංක්ෂිප්තව 8
මූල්‍ය කාර්යසාධන විශේෂාංග 12
වටිනාකම් නිර්මාණයේ සුවිශේෂී අවස්ථා 13
සම්මාන සහ ඇගයීම් 14

2 නායකත්ව දර්ශනය →
අසමසම විශ්වාසය සහ නායකත්වය

සභාපතිතුමාගේ පණිවිඩය 16
මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය 20
නව සභාපතිතුමාගේ පණිවිඩය 24
අධ්‍යක්ෂ මණ්ඩලය 26
ආයතනික කළමනාකාරිත්වය 32
විධායක කළමනාකාරිත්වය 38

3 අපගේ උපායමාර්ග →
අපගේ උපායමාර්ගික අභිප්‍රාය

මෙහෙයුම් සන්දර්භය 44
පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් 49
ප්‍රමාණාත්මක වැදගත් කරුණු 53
උපායමාර්ග සහ සම්පත් විභජනය 57
තිරසාර බවට අනුගත වීම 61
අපගේ ව්‍යාපාරික ආකෘතිය 64
එකතු කළ අගය මත ප්‍රකාශය 66

4 අපගේ කාර්යසාධනය →
මූල්‍ය ශක්තිය සහ මූල්‍ය ස්ථායීතාව අඛණ්ඩව පවත්වා ගැනීම

මූල්‍ය සමාලෝචනය 68
ව්‍යාපාර අංශවල කාර්යසාධනය 73

5 පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ →
සැමට සාමූහික වටිනාකමක්

අපගේ ගනුදෙනුකරුවන් සඳහා ශක්තිමත් හවුල්කරුවෙක් 84
ජයග්‍රාහී, දක්ෂ සහ විවිධත්වයෙන් යුතු කණ්ඩායමක් 90
ඩිජිටල්කරණයෙන් බල ගැන්වූ බැංකුවක් 98
අපගේ සෑම ක්‍රියාවලියකදී ම විශ්වාසයේ තහවුරුව 103

6 යහපාලනය →
ශක්තිමත් යහපාලනයක් සමඟ මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීම

ආයතනික යහපාලනය 111
විගණන කමිටු වාර්තාව 122
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව 124
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව 126
නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු වාර්තාව 128
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව 130
අවදානම් සහ අවස්ථා 132

7 මූල්‍ය වාර්තා →
මූල්‍ය ශක්තීන් උදෙසා ප්‍රමිතීන් සකස් කිරීම.

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව 150
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම 155
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 156
ස්වාධීන සහතික වීමේ වාර්තාව 158
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 159
විගණකාධිපතිතුමාගේ වාර්තාව 160
මූල්‍ය ප්‍රකාශන - පටුන 165
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 166
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 167
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 168
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 170
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 174
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 176

8 අනුකූලතා ඇමුණුම් →
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා 353
2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා 359
කොළඹ කොටස් හුවමාරුව විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත කිරීමේ රීතිවල 9 වන වගන්තියට අනුකූල වීම 378
කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා 384
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා 386
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය 390

9 අතිරේක තොරතුරු →
GRI දර්ශකය 402
ස්වාධීන සහතිකවීමේ වාර්තාව - තිරසාරකත්වය 405
ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ඇ.ඩො.) 407
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (ඇ.ඩො.) 408
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ඇ.ඩො.) 409
කාර්තුමය විශ්ලේෂණය 410
කොටස් හා ණයකර තොරතුරු 413
දස වර්ෂ සංඛ්‍යාන සාරාංශය - බැංකුව 414
පරිපාලිතයන් හා ආශ්‍රිතයන් 416
විදේශ රටවල නියෝජිත බැංකු - රටවල් පදනම් මත 418
විනිමය හුවමාරු සමාගම් - රටවල් පදනම් මත 424
මූල්‍ය සහ බැංකුකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහය 425
ආයතනික සහ විදේශීය කාර්යාල 430
ආයතනික තොරතුරු 432

1

ජාතික මූල්‍ය පද්ධතියට මඟ කියන්නාවූ මහා පහන් ටැඹ

හිරු කිරණ කදම්බයක් වන්වූ ධනාත්මක දැක්මකින් මඟ පෙන්වීම සිදුකරනු ලබන බැංකුව විනිවිදභාවයෙන් යුතු විශ්වාසදායකවූ මූල්‍ය සේවා සැපයීමේ නියුතුවෙයි.


ස්ථාවරත්වයේ සහ වර්ධනයේ මංසලකුණක් ලෙස ක්‍රියාකරන, පුළුල් ව්‍යාප්තියකින් මුල් බැසගත් පැවැත්මක් සහිත ලංකා බැංකුව සිය ගනුදෙනුකරුවන්ව ඔවුන්ගේ මූල්‍ය අභිලාෂයන් වෙත යොමුකරමින් ආර්ථිකය සවිබල ගන්වයි.

මෙම වාර්තාව පිළිබඳව

ලංකා බැංකුවේ 2023 වාර්ෂික වාර්තාව වෙත ඔබව සාදරයෙන් පිළිගනිමු

අපගේ එකොළොස්වන ඒකාබද්ධ වාර්තාව මඟින් මූල්‍ය, ආර්ථික, සමාජීය සහ යහපාලන ගැටළු සම්බන්ධයෙන් අපගේ කාර්යසාධනය සහ අනාගත දැක්ම පිළිබඳ සමබර හා නිවැරදි පිළිබිඹුවක් සැපයීම අරමුණු කරයි. මෙම වාර්තාවේ මූලික අභිප්‍රාය වනුයේ අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් උත්පාදනය සඳහා බාහිර පරිසරය, අවදානම් අවස්ථාවන් සහ අවශ්‍යතා යන මූලික කරුණු පිළිබඳව වූ අපගේ උපායමාර්ගික ප්‍රවේශයට අදාලව ප්‍රගතිය බෙදා ගැනීමයි.






වාර්තා කිරීමේ විෂය පථය සහ සීමාව

මෙම වාර්තාව 2023 ජනවාරි 1 සිට 2023 දෙසැම්බර් 31 දක්වා ලංකා බැංකුවේ (මෙතැන් සිට 'බැංකුව' ලෙස හැඳින්වේ) දේශීය හා විදේශීය මෙහෙයුම් සහ එහි අනුබද්ධිත සමාගම් ('සමූහය' ලෙස හැඳින්වේ) පිළිබඳ පුළුල් දැක්මක් සපයයි. මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු ඒකාබද්ධ තොරතුරු වන අතර මූල්‍ය නොවන තොරතුරු සමූහය තුළ ඇති ප්‍රමුඛතාවය අනුව බැංකුවට පමණක් සීමා වේ. වාර්තාකරණ සීමාවන් පෙර වසරට වඩා නොවෙනස්ව පවතින අතර සමූහයේ විශාලත්වය, ව්‍යුහය හෝ සැපයුම් දාමයේ සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැත.

මෙම වාර්තාව අත්සන් කිරීමේ දිනයට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු වූ වෙනස්කම් අනුව, බැංකුවේ අලුතින් පත් කළ සභාපතිවරයාගේ පණිවිඩයක් මෙම වාර්තාවට ඇතුළත් වේ.



ප්‍රමාණාත්මකභාවය

හෙළිදරව් කිරීම් වාර්තා කිරීමට අදාළ කරුණු තීරණය කිරීම සඳහා බැංකුව ද්විත්ව ප්‍රමාණාත්මකතා දැක්මක් යොදාගනී, එමඟින් වටිනාකම් නිර්මාණය කිරීමට හෝ ආරක්ෂා කිරීමට අපගේ ඇති හැකියාව (මූල්‍ය ප්‍රමාණාත්මකතා) සහ පරිසරයට, ප්‍රජාවන්ට සහ සමාජයට සිදුවන අපගේ බලපෑම (බලපෑම් ප්‍රමාණාත්මකතා) කෙටි කාලීනව, මධ්‍ය හා දිගු කාලීනව හඳුනා ගනී. ප්‍රමාණාත්මකභාවය තීරණය කිරීමට අදාළව බැංකුවේ ක්‍රියාවලිය සහ වාර්තාකරණ ප්‍රමිති සමඟ ඒවා පෙළගැස්වීම පිටු 53 සිට 56 දක්වා සඳහන් කර ඇත.

දේශීය ප්‍රමිතීන් සහ වාර්තාකරණ රාමු

- 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධන
- 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්
- 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත සහ සංශෝධන
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මූලික කොටගත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ වාර්තාකරණ රාමුව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහය (2023)
- කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ රීතීන් සහ පාරිසරික, සාමාජීය සහ යහපාලනයට අදාළ වාර්තාකරණ රාමුව
- ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අනාවරණ ප්‍රකාශයට පත් කිරීමේ මඟ පෙන්වීම

ගෝලීය හොඳම භාවිතයන්

INTEGRATED REPORTING <IR>

ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ වාර්තාකරණ රාමුව (IIRC)

Global Reporting Initiative GRI

ගෝලීය වාර්තාකරණ මූලපිරීම තිරසාර වාර්තාකරණ මාර්ගෝපදේශ (GRI ප්‍රමිති).

SASB

තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද වාණිජ බැංකු සඳහා වන ප්‍රමිති (SASB)

SUSTAINABLE DEVELOPMENT GOALS

තිරසාර සංවර්ධනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රයේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ගෝලීය දර්ශක රාමුව (A/RES/68/261)

පූර්ව ආරක්ෂණ මූලධර්මය

බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර මෙහෙයුම් තුළට තිරසාර බව අනුගත කරමින් පූර්ව ආරක්ෂණ මූලධර්මය සඳහා මූලික ප්‍රවේශයක් ලබාදී ඇත. 62 පිටුවේ දක්වා ඇති තිරසාර මූල්‍යකරණය සඳහා බැංකුව දරන ප්‍රයත්නයන්, මෙහෙයුම්වල ඇති විය හැකි ඍණාත්මක බලපෑම් අවම කිරීමට පමණක් නොව, පරිසරයට සහ පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාවට වැදගත් වන දේශීය හා ගෝලීය අභියෝග වලට කල්තියා ආමන්ත්‍රණය කිරීමට සවිස්තරාත්මක ක්‍රියාමාර්ග ගෙන ඇත.

ඒකාබද්ධ සහතිකය

කළමනාකරණය, අභ්‍යන්තර විගණනය සහ බාහිර සහතික සපයන්නන්ගේ අධීක්ෂණයේ එකතුවක් හරහා අපගේ මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු දෙකෙහිම අඛණ්ඩතාව සහතික කිරීම අපගේ අරමුණයි. මෙම ඒකාබද්ධ සහතික ආකෘතිය හරහා, අපි ශක්තිමත් සදාචාරාත්මක සන්දර්භයක් සහ අනුකූලතාව සහතික කිරීම සඳහා වූ යාන්ත්‍රණයන් පෝෂණය කරන අතරම කළමනාකරණය, අභ්‍යන්තර විගණනය සහ බාහිර සහතික සපයන්නන්ගෙන් ලබාගත් සහතිකය ප්‍රශස්ත කිරීමට උත්සාහ කරමු.

විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන කාර්යයන්

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන් සහ අභ්‍යන්තර පාලනයන්හි සඵලතාවය සහතික කිරීම සඳහා වගකීම දරයි.

ජාතික විගණන කාර්යාලය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ බාහිර සහතිකය

ආයතනික කළමනාකරණ කණ්ඩායම

වාර්තාව සකස් කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට වගකියනු ලබයි.

මෙම වාර්තාව සකස් කර ඇත්තේ නායකත්ව කණ්ඩායමේ උපදෙස්, අභ්‍යන්තර සහ වෙනත් අදාළ බාහිර තොරතුරු සමඟිනි. වාර්තාවේ ප්‍රකාශිත තිරසාර තොරතුරු KPMG (වරලත් ගණකාධිකාරීවරුන්) ආයතනය විසින් බාහිරව සහතික කර ඇත.

පසුගිය වසරේ ප්‍රකාශයට පත් කරන ලද කිසිඳු ප්‍රධාන මූල්‍ය නොවන තොරතුරුවල නැවත ප්‍රකාශයන් නොමැත.

ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශය

සමූහය සම්බන්ධයෙන් යම් ඉදිරි දැක්මක් සහිත ප්‍රකාශ, අනාගත කාර්යසාධනය සහ අපේක්ෂාවන් මෙම වාර්තාවට ඇතුළත් විය හැකිය.

මෙහි සඳහන් ප්‍රකාශයන් අනාගත ප්‍රතිඵල ලෙස හෝ අනාගත වගවීම් ලෙස සැලකිය නොහැකිය. නැඟී එන අවදානම්, අනාගත සිදුවීම්, වෙනස් වන තත්ත්වයන් සහ පුරෝකථන කල නොහැකි සහ බැංකුවේ පාලනයෙන් බැහැර අනෙකුත් වැදගත් සාධක මඟින් ඒවාට බලපෑම් කළ හැකිය. මෙම වාර්තාවේ අනාවරණය කර ඇති පරිදි අපගේ වර්තමාන අපේක්ෂාවන්ට වඩා සැබෑ ප්‍රතිඵල වෙනස් වීමට මෙම සිදුවීම් හේතු විය හැක.

මෙම වාර්තාව පිළිබඳව

අපගේ වාර්තාකරණයේ පරිණාමය

'නොසැලෙන ශක්තියක් - විශ්වාසයේ ප්‍රතිමූර්තියක්' යන තේමාව යටතේ අපගේ 2023 වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනයේ මඟ පෙන්වන්නා ලෙස බැංකුවේ භූමිකාව ඉදිරිපත් කර ඇත. 2023 දී, ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීම සඳහා සමස්ථ ශක්තිය යොදවමින් බැංකුව ජාතියේ බැංකුකරුවා ලෙස උපරිම සහයෝගය ලබාදී ඇත.


වගකීම් සහගතව ක්‍රියාකරන ආයතනයක් ලෙස පාරිසරික බලපෑම අවම කිරීම සඳහා මෙම වාර්තාවේ මුද්‍රිත පිටපත් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු කර ඇත. මෙම වාර්තාව පාර්ශ්වකරුවන් වෙත යොමු කිරීම සඳහා ඩිජිටල් මාධ්‍ය භාවිතා කර ඇති අතර ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන්ම ඉදිරිපත් කර ඇත.



2019 වාර්ෂික වාර්තාව



2020 වාර්ෂික වාර්තාව




2021 වාර්ෂික වාර්තාව



2022 වාර්ෂික වාර්තාව

වාර්තාකරණයේ වැඩිදියුණු කිරීම



- තොරතුරු හා බැඳුනු දැඩි සම්බන්ධතාවය
- ප්‍රමාණාත්මකතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සංක්ෂිප්ත භාවය වැඩිදියුණු කිරීම
- බැංකුව එහි ව්‍යාපාරික ආකෘතිය බාහිර පරිසරයට ප්‍රතිචාර දැක්වීමට සහ එය මුහුණ දෙන අවදානම් සහ අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමට උපායමාර්ගයන් සකස් කරන ආකාරය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.
- වැඩි දියුණු කළ විෂය පථය සහ මූල්‍ය නොවන තොරතුරු ආනාවරණය කිරීම

පරිශීලන සලකුණු

පාර්ශ්වකරුවන්

ගනුදෙනුකරුවන් | සේවකයින් | කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන් | ප්‍රජාව සහ පරිසරය | ව්‍යාපාරික හවුල්කරුවන් | නියාමකයින්

ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රාග්ධනය | නිෂ්පාදිත ප්‍රාග්ධනය | මානව ප්‍රාග්ධනය | බුද්ධිමය ප්‍රාග්ධනය | සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය | ස්වාභාවික ප්‍රාග්ධනය

උපායමාර්ගික ප්‍රමුඛතා

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය | ගනුදෙනුකාර අත්දැකීමේහි විශිෂ්ටත්වය | ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය | ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය | කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම

අවදානම් කාණ්ඩයන්

R1 ණය අවදානම | R2 වෙළඳපල අවදානම | R3 ද්‍රවශීලතා අවදානම | R4 උපායමාර්ගික අවදානම | R5 මෙහෙයුම් අවදානම

ප්‍රතිචාර

කරුණාකර මෙම වාර්තාව පිළිබඳ යෝජනා සහ අදහස් **dgmfp@boc.lk** වෙත යොමු කරන්න.

ප්‍රකාශිත වෙබ් අඩවිය වෙත යොමු වීමට සහ *HTML* අනුවාදය වෙත යොමු වීමට *QR* කේතය පරිලෝකනය කරන්න.

සමෝධානික චින්තනය තුළින් වටිනාකමක් ඇති කිරීම

කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රතිඵල සමතුලිත කිරීමට අවශ්‍ය මානසිකත්වයක් ප්‍රවර්ධනය කිරීමට සමෝධානික චින්තන සංකල්පය අපට උපකාරී විය, එය තිරසාර ලෙස වටිනාකම් නිර්මාණය කිරීමට සහ තීරණ ගැනීම සඳහා පුළුල් සහ උපායමාර්ගික ප්‍රවේශයක් ඇති කිරීමට අපව දිරිමත් කරයි.

මෙහෙයුම් මෙහෙයුම් සන්දර්භය

පිටු 44-48


පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන්

පිටු 49-52

- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්
- ප්‍රජාව සහ පරිසරය
- ව්‍යාපාරික හවුල්කරුවන්
- නියාමකයින්

ප්‍රතිඵල සහ අවදානම්

පිටු 132-148



ප්‍රධාන ව්‍යාපාරික අංශ හරහා උපායමාර්ග ක්‍රියාත්මක කිරීම

ව්‍යාපාරික අංශ බැංකුවේ උපායමාර්ග ක්‍රියාවට නැංවීමේ මූලිකත්වය ගනී.



ශාඛා බැංකුකරණය

පිටු 73-75



ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය

පිටු 76-78



ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්

පිටු 79-82

අපගේ උපායමාර්ග සැකසීම සහ සම්පත් විභජනය

උපායමාර්ගික ප්‍රමුඛතා පිටු 57-60

- ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය
- ගණුදෙනුකාර අත්දැකීමේහි විශිෂ්ටත්වය
- ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය
- ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය
- කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම

සම්පත් විභජනය පිටු 57-60

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය

අවදානම් කළමනාකරණය, නිසි ආයතනික යහපාලනය සහතික කිරීම සහ තිරසාර බවට අනුගත වීම

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සඳහා ක්‍රමානුකූල සහ ක්‍රියාශීලී ප්‍රවේශයක් යොදාගෙන ඇති අතර එමඟින් බැංකුවේ ස්ථාවරත්වය සහ රඳා පැවතීමේ හැකියාව ප්‍රවර්ධනය කරන අතරම පාර්ශ්වකරුවන්ට නිරතුරුවම අගය එක් කිරීමක් ලබා දීමට බැංකුවට හැකියාව ලැබේ.

පිටු 132-148

ආයතනික යහපාලනය

ශක්තිමත් ආයතනික යහපාලන රාමුවක් ඔස්සේ බැංකුවේ සියලුම ක්‍රියාවන් අධීක්ෂණය කරයි. එය බැංකුවේ මෙහෙයුම් හරහා සදාචාරාත්මක සහ වගකීම් සහගතව කටයුතු කිරීම සහතික කරන අතර බැංකුවේ මූලික වටිනාකම් සහ මූලධර්ම වලට අනුකූල වේ.

පිටු 111-131

තිරසාර බව

තිරසාර බව අපගේ සියලුම මෙහෙයුම් වලට අන්තර්ගත වේ. අපගේ අරමුණ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDGs) වෙත තිරසාර වටිනාකමක් ලබා දීමට කැපවීමයි.

පිටු 61-63

පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් ඉටු කිරීම

ඒකාබද්ධ චින්තනය බැංකුවේ උපායමාර්ග පෙළගැස්වීමේදී සාකල්‍ය ඉදිරි දර්ශනයක් ප්‍රවර්ධනය කිරීම මඟින් පාර්ශ්වකරුවන්ගේ වටිනාකම් නිර්මාණය මෙහෙයවන මාර්ගෝපදේශක මූලධර්මයක් ලෙස ක්‍රියා කරයි. බැංකුව විසින් එහි පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් ඉටු කළ ආකාරය පිටු 49 සිට 52 දක්වා විස්තරාත්මකව විග්‍රහ කෙරේ.

ලංකා බැංකුව පිළිබඳව සංක්ෂිප්තව

"ජාතියේ මහා පහන් ටැඹ"

පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතු ලංකාවේ ප්‍රධානතම බලපත්‍රලාභී වාණිජ බැංකුව වන ලංකා බැංකුව බැංකු ක්ෂේත්‍රයේ වත්කම්, ණය සහ අත්තිකාරම්, තැන්පතු, ලාභ සහ ප්‍රේෂණ යන අංශයන්ගේ 22% කට වඩා වැඩි වෙළඳපළ හිමිකාරිත්වයක් දරයි.

දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් වශයෙන් වසර 80 කට වඩා වැඩි උරුමයක් සහිත ක්ෂේත්‍රයේ පෙරගමන්කරුවා ලෙස අපගේ කැපවීම ගනුදෙනු වලින් ඔබ්බට යයි. එය කල්පවත්නා සබඳතා ගොඩනඟා ගැනීම, මූල්‍ය සවිබල ගැන්වීම් පෝෂණය කිරීම, ජාතික ආර්ථික වර්ධනය මෙහෙයවීම දක්වා විහිදේ. ලංකා බැංකුව එහි වටිනා ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කරන ලද පුළුල් බැංකු විසඳුම් රාශියකින් සමන්විත වීම පිළිබඳව ආඩම්බර වෙයි. ශක්තිමත් පදනමක්, අති නවීන තාක්ෂණය සහ පලපුරුදු වෘත්තිකයන් කණ්ඩායමක් සමඟින් බැංකුව මූල්‍ය ක්ෂේත්‍රය තුළ තවදුරටත් ඉදිරියට යාමට සූදානම්ව සිටියි.



අපගේ දැක්ම

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකික සලකුණ බවට පත්වෙමින් ගනුදෙනුකාර කේන්ද්‍රීය නව්‍ය මූල්‍ය පහසුකම් පිරිනමන ජාතියේ බැංකුකරුවා වීම.

අපගේ මෙහෙවර

ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් අප ගනුදෙනුකාර ප්‍රජාව වෙත ළඟා කරලමින් සේවක පරිපූර්ණත්වය මත ගොඩ නැංවූ වඩාත් කාර්යක්ෂමවූත්, නවීන තාක්ෂණවේදයන් මුසුවූත් මූල්‍ය සේවාවන් හරහා සියළු පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් උත්පාදනය කරලීම.

ආයතනික වටිනාකම් ප්‍රකාශය

- ගනුදෙනුකාර කේන්ද්‍රීය වීම
- අප ආයතනය හා බැඳුනු විවිධ ජන කණ්ඩායම්හි විවිධත්වයට ගරු කිරීම
- ඉතා උසස් තත්ත්වයේ ආචාරධර්ම පිළිපැදීම සහ වෘත්තීමය පරිසරයක ස්ථාපනය සඳහා කැපවීම
- නම්‍යශීලි සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම
- අපගේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම වගවීම










ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	රු. බිලියන	8,579 ක	විදේශීය නියෝජිත බැංකු සබඳතා	ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන
15.8%	40.3 ක	සේවකයින් සංඛ්‍යාවක්	763	2,241
	බදු පෙර ලාභය			

අප සමූහයේ ව්‍යුහය සහ ප්‍රධාන ව්‍යාපාරික අංශ

ලංකා බැංකුව





ශාඛා බැංකුකරණය

අපි විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සහ තනි පුද්ගලයන්ගේ සිට ඉහළ මට්ටමේ වත්කම් ඇති පුද්ගලයන් හා ව්‍යවසායකයින් දක්වා ණයදීම, තැන්පතු, ගෙවීම් සේවා සහ ගනුදෙනු බැංකු විසඳුම් මාලාවක් පිරිනමනු ලබන්නෙමු.



ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය

අපි විසින් පුද්ගලික අංශයට සහ රාජ්‍ය අංශයේ ආයතනික සහ ආයතන වලට අදාලව ආයතනික අරමුදල් සහ තැන්පතු, ව්‍යාපෘති මූල්‍යකරණය, වෙළඳ සේවා සහ අක්වෙරළ බැංකු පහසුකම් ඇතුළු විවිධ මූල්‍ය සේවා සපයන්නෙමු.



ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්

බැංකුවේ ජාත්‍යන්තර අංශය විසින් විදේශ මුදල් මෙහෙයුම් හසුරුවන අතර භාණ්ඩාගාර අංශය ද්‍රවශීලතා සහ අරමුදල් කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි. ආයෝජන කටයුතු ආයෝජන අංශය හසුරුවන අතර බැංකුවේ විදේශීය ශාඛා මෙහෙයවීමේ වගකීම විදේශ මෙහෙයුම් අංශය සිදු කරයි.


ලංකා බැංකුව පිළිබඳව සංක්ෂිප්තව

අපගේ ඩිජිටල් ව්‍යාප්තිය

www.boc.lk

අපගේ පියසටහන්


ලංකා බැංකුව එහි වත්කම්, තැන්පතු සහ ණය සහ අත්තිකාරම්හි වැදගත්කම අනුව ශ්‍රී ලංකාවේ දේශීයව සංස්ථාපිත විශාලතම බැංකුව ලෙස තම ස්ථානය අබණ්ඩව පවත්වා ගැනීමට සමත්වී ඇත. දිවයින පුරා පිහිටි අංග සම්පූර්ණ ජංගම ශාඛා, සුළු හා මධ්‍ය පරිමාණ සේවා මධ්‍යස්ථාන, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර සහ මුදල් චක්‍රීකරණ යන්ත්‍ර ඇතුළු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,200 කට අධික ජාලයකින් සමන්විතව රටේ සියලුම පළාත් හරහා සිය ගනුදෙනුකාර ප්‍රවේශය ප්‍රවර්ධනය කර ඇත. බැංකුව ඉන්දියාව, මාලදිවයින සහ සීෂෙල්ස් හි ශාඛා තුනක්, හුල්හුමාලේහි සීමිත සේවා ශාඛාවක් සමඟ එක්සත් රාජධානියේ ලන්ඩන් හි පූර්ණ පරිපාලිත ආයතනයකින් යුක්තව විදේශයන් හි ක්‍රියාත්මක වේ.



විදේශීය මෙහෙයුම්
03 01 06

විදේශ රටවල නියෝජිත බැංකු
763

විදේශ විනිමය හුවමාරු ආයතන
94



● ශාඛා ● සීමිත සේවා ශාඛා ● ජංගම ශාඛා ● ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/ මුදල් තැන්පතු යන්ත්‍ර/ මුදල් චක්‍රීකරණ යන්ත්‍ර ● සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන ● BoC Connect නියෝජිතයන්



අපගේ සුවිශේෂීත්වයන්

ශ්‍රී ලංකාවේ **අංක 01 බැංකු සන්නාමය** BOC වන අතර එහි සන්නාම වටිනාකම **රු. බිලියන 50.2 කි.** මෙම අගයන් මූලික වශයෙන් අපව තරඟකරුවන් අතර ඉහළ ස්ථානය කරා ගෙන ගොස් ඇත.

ලංකා බැංකුව යනු පාරිසරික තිරසාරභාවය සහ ප්‍රජාව කෙරෙහි ඇති වගකීම කෙරෙහි අවධානය යොමු කරන අරමුණු මත පදනම් වූ බැංකුවකි. සමාජයට ධනාත්මක ලෙස දායක වෙමින් සදාචාරාත්මක සහ තිරසාර ලෙස තම ව්‍යාපාරය සාඩම්බරව පවත්වාගෙන යනු ලබයි.

පිටු 52

පාරිසරික

සමාජීය

යහපාලනය

'සමාජ, පාරිසරික සහ ආර්ථික පහළම ස්ථර හරහා තිරසාර සංවර්ධනයක්' යන දැක්ම සමඟින් යහපාලනය සහ ESG නායකත්වය තහවුරු කිරීමට බැංකුව කැපවී සිටී.

පිටු 103-109



2023 ලොව හොඳම බැංකු 1000 අතර



2023 වසරේ විශිෂ්ටතම බැංකුව (ශ්‍රී ලංකාව)



සේවය කිරීමට හොඳම මානව සම්පත් සංවිධානය - 2023 වසරේ ගෝලීය මානව සම්පත් විශිෂ්ටතා සම්මාන


ජාතියේ මහා පහන් ටැඹ ලෙස බැංකුව ලබාගෙන ඇති පිළිගැනීම බැංකුවේ කාර්යසාධන දත්ත මගින් පැහැදිලි වේ.

පිටු 12-13

විවිධ පරාසයන් පුරා විහිදුනු ණය සහ තැන්පතු නිෂ්පාදන සහ අනෙකුත් මූල්‍ය සේවා කළඹක් තුළින් බැංකුවට තරඟකාරී ශාඛා බැංකුකරණ ව්‍යාපාරයක්, ශක්තිමත් ආයතනික බැංකුකරණ සේවාවක් සමඟ ප්‍රමාණාත්මක විදේශීය පැවැත්මක් අත්කර ගැනීමට හැකියාව ලැබී ඇත.

පිටු 73-82

වෙළඳපළ ප්‍රමුඛයා ලෙස පුද්ගලයන්ට, සිල්ලර වෙළඳාමට සහ ආයතනික ව්‍යවසායකයන්ට ණය දීමේදී ණය සහ අත්තිකාරම්වල සැලකිය යුතු කොටසක් **"හරිත සංකල්පයට"** අනුව ලබාදීමට හැකිවී ඇත.



ඉහළ පෙළේ සේවාදායක තෘප්තිමත් මිනුම් සහ අසමසම ගනුදෙනුකාර විනිවිද යාම 73% ට වඩා වැඩි අගයක් ගනී.



ශක්තිමත් අවදානම් කළමනාකරණය

- විදේශීය නියෝජිත බැංකු සමඟ සම්බන්ධතා
- අභ්‍යන්තර ප්‍රේෂණ වල වෙළඳපළ ප්‍රමුඛයා
- විවිධ දක්ෂතා සහිත සේවක මණ්ඩලය

මූල්‍ය කාර්යසාධන විශ්ලේෂාංග

	බැංකුව			සමූහය		
	2023	2022	වෙනස %	2023	2022	වෙනස %
මෙහෙයුම් ප්‍රතිඵල (රු. මිලියන)						
මුළු ආදායම	**542,187**	513,149	5.7	**551,867**	520,891	5.9
ශුද්ධ පොළී ආදායම	**91,188**	126,346	(27.8)	**95,510**	129,769	(26.4)
මූල්‍ය සේවා සඳහා බදු පෙර ලාභය	**53,006**	42,290	25.3	**54,695**	42,372	29.1
බදු පෙර ලාභය	**40,342**	30,977	30.2	**41,773**	31,053	34.5
බදු පසු ලාභය	**26,694**	31,972	(16.5)	**27,618**	31,849	(13.3)
රජයට දායකත්වය	**25,948**	31,949	(18.8)	**26,999**	32,606	(17.2)
මූල්‍ය තත්ත්වය (රු. මිලියන)						
මුළු වත්කම්	**4,411,748**	4,336,460	1.7	**4,467,760**	4,390,769	1.8
දළ ණය සහ අත්තිකාරම්	**2,457,772**	2,584,779	(4.9)	**2,491,981**	2,617,905	(4.8)
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	**3,882,232**	3,334,774	16.4	**3,909,581**	3,358,198	16.4
මුළු වගකීම්	**4,160,034**	4,082,276	1.9	**4,195,181**	4,118,238	1.9
මුළු ස්කන්ධය	**251,715**	254,184	(1.0)	**272,579**	272,531	0.0
කොටස් පිළිබඳ දත්තයන් (රු.)						
කොටසක ඉපැයුම්	**1,068**	1,279	(16.5)	**1,103**	1,280	(13.8)
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම	**10,069**	10,167	(1.0)	**10,858**	10,859	0.0
කාර්යසාධන අනුපාත (%)						
වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය	**0.9**	0.8	0.1	**0.9**	0.8	0.1
ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය	**10.6**	14.1	(3.5)	**10.1**	13.1	(3.0)
පොළී ආන්තිකය	**2.1**	3.1	(1.0)	**2.2**	3.2	(1.0)
ආදායමට පිරිවැය	**55.7**	29.4	26.3	**56.8**	30.8	26.0
තැන්පතු වලට ණය අනුපාතය	**63.3**	77.5	(14.2)	**63.7**	78.0	(14.3)
ස්කන්ධය මත ණය	**32.2**	43.9	(11.7)			
හානිකරණ ප්‍රතිපාදන, දළ ණය සහ අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස	**10.1**	10.0	0.1	**10.1**	10.0	0.1
හානිකරණ ණය (අදියර 3)	**5.1**	5.3	(0.2)			
හානිකරණ ණය (අදියර 3) සඳහා ණය හානිකරණ ප්‍රතිපාදන වෙන් කිරීම්	**60.4**	59.7	0.7			
ව්‍යවස්ථාපිත අනුපාත (%)						
ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය) (අවම අවශ්‍යතාව 20%)	**42.8**	21.2	21.6			
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (රු.) (අවම අවශ්‍යතාව 2023-100%, 2022-90%)	**316.0**	169.0	147.0			
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලු මුදල්) (අවම අවශ්‍යතාව 2023-100%, 2022-90%)	**227.2**	122.8	104.4			
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (අවම අවශ්‍යතාව 2023-100%, 2022-90%)	**145.0**	137.0	6.0			
තෝලන අනුපාතය (අවම අවශ්‍යතාව - 3%)	**4.8**	4.6	0.2	**5.0**	4.7	0.3
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත (%)						
පොදු ස්කන්ධය ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව-8.50%)	**11.7**	11.3	0.4	**12.1**	11.4	0.8
ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 10.00%)	**12.8**	12.4	0.4	**13.1**	12.4	0.7
මුළු ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 14.00%)	**15.8**	15.4	0.4	**16.2**	15.3	0.9

වටිනාකම් නිර්මාණයේ සුවිශේෂී අවස්ථා

	මිනුම්	2023	2022	වෙනස %
ආර්ථික කාර්යසාධනය				
ආර්ථික වටිනාකම්				
රජයට දායකත්වය	රු. බිලියන	**25.9**	31.9	(18.7)
විදේශ ප්‍රේෂණ හරහා විදේශ විනිමය	ඇ. ඩො. බිලියන	**4.8**	3.2	53.3
බලශක්ති අංශයට දායකත්වය	ඇ. ඩො. බිලියන	**3.0**	1.9	56.9
සෞඛ්‍ය සේවා අංශයට දායකත්වය	ඇ. ඩො. මිලියන	**130.3**	70.0	86.2
ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට දායකත්වය	රු. බිලියන	**66.3**	52.6	26.1
ව්‍යාපාරික නිරාවරණ පුනර්ජීවනය	රු. බිලියන	**82.2**	65.4	25.7
මූල්‍ය ඇතුළත් කිරීම්				
ක්ෂුද්‍ර මූල්‍යකරණය හරහා බෙදා හැරීම	රු. බිලියන	**11.0**	5.4	104.2
ක්ෂුද්‍ර මූල්‍ය අංශයට නව ණය	ප්‍රමාණය	**32,115**	21,495	49.4
කාන්තා ප්‍රමුඛ ව්‍යාපාර සඳහා ක්ෂුද්‍ර මූල්‍යකරණය	%	**30**	31	(1.4)
බස්නාහිර පළාතෙන් පිටත පිහිටි ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන	ප්‍රමාණය	**1,617**	1,561	4.0
නව BOC Connect නියෝජිතයින්	ප්‍රමාණය	**43**	34	26.5
නව BOC මිතුරු සමාජ	ප්‍රමාණය	**214**	130	64.6
BOC ගම්මාන	ප්‍රමාණය	**4**	2	100.0
අස්වැසුම වැඩසටහන යටතේ ගිණුම් විවෘත කිරීම් (අඩු ආදායම් ලාභීන් සඳහා සමාජ සුබසාධන වැඩසටහන)	ප්‍රමාණය	**353,764**	අදාළ නොවේ	
සමාජ කාර්යසාධනය				
සේවකයින්				
සේවකයින් මත ආයෝජනය	රු. බිලියන	**29.8**	29.0	2.8
නව බඳවා ගැනීම්	ප්‍රමාණය	**764**	57	1,240.4
උසස්වීම්	ප්‍රමාණය	**946**	588	60.9
මුළු පුහුණු පැය	මිනිස් පැය	**275,019**	129,493	112.4
සේවක පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජන	රු. මිලියන	**200.1**	73.9	170.8
රඳවා තබා ගැනීමේ අනුපාතය	%	**95**	98	(3.1)
ගනුදෙනුකරුවන්				
ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන	ප්‍රමාණය	**2,241**	2,166	3.5
ඩිජිටල් සම්බන්ධතා මධ්‍යස්ථාන	ප්‍රමාණය	**1,490**	1,461	2.3
ඩිජිටල් ගනුදෙනු වර්ධනය	%	**11**	10	1.0
ව්‍යාපාරික පුනර්ජීවනය	ප්‍රමාණය	**174**	40	335.0
දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගීත්වය	ප්‍රමාණය	**1,000 (දළ වශයෙන්)**	1,019	18.7
පාරිසරික කාර්යසාධනය				
පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධතියට අනුකූලව ණය ඇගයීම්	ප්‍රමාණය	**1,223**	841	45.4
හරිත මූල්‍ය සඳහා ණය දීම්	රු. මිලියන	**530.9**	711.6	(25.4)
කඩදාසි ප්‍රතිචක්‍රීකරණය	මෙට්‍රික් ටොන්	**52.4**	21.9	139.4
ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි හරහා ඉතුරුම්				
ශාක	ප්‍රමාණය	**891**	373	138.9
ඉන්ධන	ලීටර්	**91,994**	38,477	139.1
විදුලිය	කිලෝ වොට් පැය	**209,672**	87,696	139.1
ජලය	ලීටර්	**1,665,844**	696,745	139.1
ඉඩම් භාවිතය	ඝණ මීටර්	**157**	66	137.9
සූර්ය බලශක්ති උත්පාදනය	මෙගා වොට් පැය	**3,245.3**	3,219.3	0.8

සම්මාන සහ ඇගයීම්





① **2023 වසරේ බැංකුව (ශ්‍රී ලංකාව)**
ද බෑන්කර් සඟරාව (එංගලන්තය)

② **අංක 1 බැංකු සන්නාමය - බ්‍රැන්ඩ් ෆයිනෑන්ස් ලංකා**
රු. බිලියන 50.2 ක සන්නාම වටිනාකමක් සහිතව අඛණ්ඩව 15 වැනි වසරටත් අංක 1 බැංකු සන්නාමය ලෙස ලංකා බැංකුව නම් කර ඇත.

③ **2023 වසරේ ලෝකයේ ප්‍රමුඛතම බැංකු දහස - ද බැන්කර් සඟරාව (එංගලන්තය)**
ලෝකයේ ප්‍රමුඛතම බැංකු දහස තුළ සිටින එකම ශ්‍රී ලාංකික බැංකුව

ටෙක්නොවේෂන් සම්මාන 2023

④ අපගේ B App යෙදුම වඩාත්ම ජනප්‍රිය ඩිජිටල් ගෙවීම් නිපැයුම (බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන-ජංගම යෙදුම් ගෙවීම්) - **රන් සම්මාන**

⑤ මූල්‍ය අන්තර්කරණය සඳහා වසරේ හොඳම බැංකුව - A කාණ්ඩය - **රන් සම්මාන**

⑥ මාර්ගගත ගෙවීම් වේදිකාවේ හොඳම අත්පත් කරගන්නා සඳහා **රන් සම්මානය**

⑦ අන්තර් බැංකු ඩිජිටල් ගෙවීම් හි (බැංකු ආයතන) සමස්ත විශිෂ්ටත්වය සඳහා **රිදී සම්මානය**

⑧ ශාඛා ගෙවීම් සඳහා හොඳම බැංකුවට හිමි **රිදී සම්මානය**

වසරේ හොඳම පොදු ATM සක්‍රීය කරන්නා සඳහා **කුසලතා සම්මානය** - A කාණ්ඩයේ

B App සඳහා වඩාත්ම ජනප්‍රිය ඩිජිටල් ගෙවීම් නිෂ්පාදන සඳහා **කුසලතා සම්මානය** (බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන අන්තර්ජාල බැංකුකරණය)

⑨ **Daraz ගෙවීම් හවුල්කාර කාර්යසාධන සම්මාන 2023**
2023 වසර සඳහා හොඳම ක්‍රියාකාරී හර කාඩ් පදනම වර්ධනය සඳහා සම්මානය

⑩ **TAGS සම්මාන - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය**
2022 වාර්ෂික වාර්තාව සඳහා රාජ්‍ය බැංකු කාණ්ඩයේ විශිෂ්ටත්ව රන් සම්මානය

තිරසාර සම්මාන
ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින්

⑪ වසරේ හරිත ව්‍යාපාර නායකත්ව සම්මාන - අඛණ්ඩව දෙවන වසර සඳහා බැංකු අංශයේ හොඳම බැංකුව

⑫ 2023 වසරේ හරිත කැපවීමේ විශිෂ්ටත්වය සඳහා වූ සම්මානය

⑬ ලංකා බැංකුව නගර ශාඛාව - හරිත කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම සඳහා වන රිදී සම්මානය

⑭ අඛණ්ඩ කැපවීම සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ ආර්ථික දායකත්වය සඳහා හොඳම ආයතනික පුරවැසි තිරසාර සම්මාන 2023

⑮ කාබන් සවිඥානික සහතිකය - ක්ලයිමේට් ස්මාර්ට් ඉනිශියේටිව් (පුද්ගලික) සමාගම

මානව සම්පත් සම්මාන

⑯ 2023 වසරේ ආසියාවේ හොඳම සේවා යෝජක සන්නාම සම්මානය

⑰ සේවය කිරීමට හොඳම මානව සම්පත් සංවිධානය - 2023 වසරේ ගෝලීය මානව සම්පත් විශිෂ්ටතා සම්මාන

සේවා සැපයීමේ විශිෂ්ටත්වය

⑱ 2023 ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ - කැන්ටාර් ජනතා සම්මාන 2023

2023 වසරේ හොඳම බැංකු සේවා සපයන්නා

LMD ගනුදෙනුකාර සමීක්ෂණ විශිෂ්ටත්වය අනුව ලංකාවේ බැංකු අතර ඉහළම බැංකු තුන අතර



2

අසමසම විශ්වාසය සහ නායකත්වය

පුනර්ජනනීය බලශක්තිය ජනනය කලහැකි සුලභ ප්‍රභවයක් ලෙසද, විවිධ පරිසර පද්ධති වල පැවැත්මේ මූලික ප්‍රභවයක් ලෙසද, ආහාර දාමයන්ගේ ශක්ති ප්‍රභවය ලෙසද, ක්‍රියාකරමින් හිරු තම කිරණින් උණුසුම දෙමින් දේශගුණික සාධකයන්ගේ තීරක ලෙසද ක්‍රියාකරයි.

ශක්තිමත් පදනමක් සමඟ ස්ථාවරත්වය සහ විශ්වාසනීයත්වය සපථ කරන ලංකා බැංකුව, පුද්ගලයන් සහ ව්‍යාපාර සමෘද්ධිය කරා යොමු කරමින් මූල්‍ය ක්ෂේත්‍රය වෙත නායකත්වය සපයයි.

සභාපතිතුමාගේ පණිවිඩය

"ඩිජිටල් පරිවර්තනය සහ මූල්‍ය ඇතුලත් කිරීම් කෙරෙහි උපායමාර්ගික අවධානය වෙන කවරදාටත් වඩා 2023 දී වඩාත් කැපී පෙනුනි. දිනෙන් දින වෙනස් වන අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මාර්ගගත සහ ජංගම බැංකුකරණ පහසුකම් සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරමින් අපි අපගේ ඩිජිටල් මුලපිරීම් වේගවත් කළෙමු."



ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා
සභාපති

අභියෝග රැසක් සනිටුහන් වූ වසරක, ලංකා බැංකුව ආර්ථික වර්ධනය, මූල්‍ය ඇතුළත්කරණය උදෙසා දායක වීම සහ ජාතියේ තිරසාර සංවර්ධනයට සහාය වීම උදෙසා නොසැලී කැපවී කටයුතු කළේය. මෙහෙයුම් ක්ෂේත්‍රයේ නොයෙකුත් විපර්යාස මධ්‍යයේ වුවද, බැංකුව සිය වෙළඳපළ නායකත්වය ශක්තිමත් කරමින් සහ දිවයින පුරා ආර්ථික ක්‍රියාකාරකම් වලට සහාය වෙමින් ශක්තිමත් කාර්යසාධනයක් වාර්තා කළේය. මේ අනුව, අපගේ සාමූහිකත්වය සහ ස්ථිර කැපවීම මඟින් ලංකා බැංකුවේ අචල ලක්ෂණ පිළිබිඹු වන ප්‍රකාශනයක් ලෙස 2023 වසරේ බැංකුවේ වාර්ෂික වාර්තාව, මම ඔබ වෙත ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

මෙහෙයුම් සන්දර්භය

කෝවිඩ්-19 වසංගත තත්ත්වය සමඟ පැන නැඟුණු භූ දේශපාලනික, සාමාජීය ගැටළු සහ මූල්‍ය අර්බුදකාරී තත්ත්වය මුළුමනින්ම පහව නොගිය අතර වීම අර්බුදකාරී පරිසරයේ ප්‍රතිඵලයන් මත 2023 වසරේ දී ද සංකීර්ණ ගෝලීය ආර්ථික තත්ත්වයක් පැවතුණි. එනම් ගෝලීය සැපයුම් දාම අවහිර වීමේ සිට ජාත්‍යන්තර වෙළඳපළවල සැලකිය යුතු අවිනිශ්චිතතාවයන් පැවතීම දක්වා දීර්ඝ කාලීන ගැටළුකාරී තත්ත්වයන් නිර්මාණය වී ඇත. මෙම ගෝලීය අභියෝග හමුවේ, ජාත්‍යන්තර ආර්ථික පරිසරය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් මත පදනම්ව, ලංකා බැංකුවේ උපායමාර්ගික මුලපිරීම් විචක්ෂණව සකස් කරන ලදී. අප මත ඇති විය හැකි අහිතකර බලපෑම් පූර්ව හඳුනාගැනීම, සහ අවම කිරීම, මෙහෙයුම් සහ මූල්‍යයෝපායික ඉලක්ක ගෝලීය ආර්ථික ගතිකත්වයට ක්ෂණිකව ප්‍රතිචාර දක්වනසේ සකස් කිරීම අපගේ අරමුණ විය.

දේශීය වශයෙන් ගත් කල, ශ්‍රී ලංකාවේ ආර්ථික පරිසරය බොහෝ අභියෝග වලින් පිරී තිබුණි. ඉදිකිරීම්, සංචාරක, නිෂ්පාදන, දේපළ වෙළඳාම් සහ මූල්‍ය සේවා ඇතුළු ප්‍රධාන අංශ දැඩි ආතතියකට මුහුණ දී ඇති අතර ආර්ථිකය කැපී පෙනෙන සංකෝචනයක් අත්විඳ ඇත. අපගේ ජාතික ආර්ථිකයට අත්‍යාවශ්‍ය වන මෙම අංශ, පුද්ගලික අංශයේ ණය සැපයුමේ මන්දගාමීත්වය, අත්‍යාවශ්‍ය යෙදවුම් හිඟය සහ පුළුල් සැපයුම් දාම අවහිර වීම හේතුවෙන් පීඩාවට පත් විය.

ඊට ප්‍රතිචාර වශයෙන් බැංකුව, මෙම අභියෝග ජයගැනීමට පමණක් නොව අපගේ ගනුදෙනුකරුවන් මෙන්ම ආර්ථිකය ද ශක්තිමත් කිරීමට සැලසුම් සහගත උපායමාර්ගික ක්‍රියාමාර්ග මාලාවක් ගෙන ඇත. අපගේ මෙම ප්‍රයත්නවල අරමුණ වූයේ ස්ථාවර මූල්‍ය පසුබිමක් සැපයීම සහ ආර්ථික අවපාතය නිසා පීඩාවට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහාය වන විසඳුම් පිරිනැමීමයි.

නොසැලෙන ශක්තියක්

වසර පුරා, ලංකා බැංකුව සිය මෙහෙයුම් මහ බැංකුවේ උපායමාර්ගික මූල්‍ය ප්‍රතිපත්ති ගැලපීම් සමඟ ඉතා සූක්ෂම ලෙස පෙළගස්වා ඇත. වසරේ මුල් භාගය තුළ පැවති ඉහළ පොළී අනුපාත, 2023 ජූනි මාසයේදී පදනම් ඒකක 550 කින් අඩු කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, 2023 නොවැම්බර් මාසයේදී පිළිවෙලින් 9% සහ 10% දක්වා අඩු කරන ලදී. මෙම වෙනස්කම් සඳහා අපගේ ක්‍රියාකාරී ප්‍රතිචාරයන් හරහා ණය දීමේ සහ තැන්පතු නිෂ්පාදන නැවත නංවා ගැනීමට අපට හැකි වූ අතර එමඟින් අපගේ ගනුදෙනුකරුවන්ට වඩාත් තරඟකාරී මිල ගණන් ලබා දීමට හැකි විය. මෙම උපායමාර්ගික අනුවර්තනය උද්ධමන පීඩනය ලිහිල් කිරීමට පහසුකම් සැලසුවා පමණක් නොව ව්‍යාපාර වලට සහ පුද්ගලයන්ට වඩාත් ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි මට්ටමේ ණය පහසුකම් ලබා දීමෙන් ආර්ථික ක්‍රියාකාරකම් යලි පන ගැන්වීය.

විදේශ විනිමය ද්‍රවශීලතා අභියෝගයන්ට ප්‍රතිචාර වශයෙන්, අපනයන මූල්‍යකරණය සහ ප්‍රේෂණ ගලා ඒම ප්‍රවර්ධනය කිරීම ඇතුළුව, රටේ විදේශ විනිමය තත්ත්වය ස්ථාවර කිරීමට සැලකිය යුතු ලෙස දායක වීමට බැංකුව ශක්තිමත් උපායමාර්ග ක්‍රියාත්මක කළේය. භාවිතා කළ හැකි විදේශ සංචිත වැඩි කර ගැනීම මඟින් ද්‍රවශීලතා පීඩනය ලිහිල් කිරීම සහ තීරණාත්මක කාල පරිච්ඡේදයකදී ජාතික ආර්ථිකයට සහාය වීම මෙම ප්‍රයත්නය තුළින් අවධාරණය කරන ලදී.

රජයේ දේශීය ණය ප්‍රශස්තකරණය (DDO) සඳහා බැංකුව ද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. අපගේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) ආයෝජන සහ රජයේ විදේශ මුදල් ණය හරහා ණය නිරාවරණය හේතුවෙන්, රජය සහ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා උපායමාර්ගික සහ ඵලදායී ප්‍රවේශයක් අවශ්‍ය විය. මෙම මූලපිරීම් සඳහා අපගේ මැදිහත්වීම රජයේ මූල්‍ය ස්ථායීතාවයේ ණය තිරසාරභාවය සහ තිරසාර ආර්ථික පරිසරයක් සඳහා ජාතික ආර්ථිකයේ ශක්තිමත් භාවය ඉහළ නැංවීම සඳහා අපගේ කැපවීම අරමුණු කර ගෙන ඇත.

අචල මූල්‍ය කාර්යසාධනය

ගෝලීය වශයෙන් සහ දේශීය වශයෙන් සැලකිය යුතු අභියෝග වලින් සනිටුහන් වූ වසරක් තුළ බැංකුවේ මූල්‍ය කාර්යසාධනය, ඔරොත්තු දීමේ සහ උපායමාර්ගික දුරදක්නාභාවයේ සංකේතයක් ලෙස පවතී. පෙර වසරට වඩා 30% ක වර්ධනයක් සනිටුහන් කරමින් 2023 වසර සඳහා බදු ගෙවීමට පෙර රු. බිලියන 40.3 ක කැපී පෙනෙන ලාභයක් වාර්තා කිරීමට හැකිවීම ගැන මම ආඩම්බර වෙමි. අප මුහුණ පෑ ආර්ථික සංචලනයන් සැලකිල්ලට ගත් විට මෙම ජයග්‍රහණය විශේෂයෙන් කැපී පෙනේ.

මෙම වසරේ බැංකුවේ වත්කම් පදනම 2% කින් වර්ධනය වී ඇති අතර එය අපගේ විචක්ෂණ කළමනාකරණය සහ උපායමාර්ගික ආයෝජනයට සාක්ෂියකි. මෙම වර්ධනය මධ්‍යස්ථ වුවද රට මුහුණ දුන් ආර්ථික අභියෝග වලට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයකි. අපගේ උපායමාර්ගික සැලසුම්, 2020 සිට අනුගමනය කරන ලද පූර්වාරක්ෂාකාරී ප්‍රවේශය මෙම ජයග්‍රහණයේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලද අතර, අපගේ වත්කම්වල වර්ධනය තිරසාර හා විභව ආර්ථික කම්පනවලට ඔරොත්තු දෙන බව සහතික කරයි.

මෙම උපායමාර්ගික ප්‍රතිපාදන බැංකුවේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කළා පමණක් නොව අනාගත වර්ධන අවස්ථා ප්‍රයෝජනයට ගැනීමටද අපව ස්ථානගත කළේය. අපගේ ප්‍රවේශය සකසන ලද්දේ අවදානම් සහ ප්‍රතිලාභ සමතුලිත කර ගනිමින්, වර්ධන අභිලාෂයන් හඹා යන අතරතුරම ස්ථාවර තත්ත්වයක බැංකුව රැඳී සිටින බව සහතික කරමිනි.

උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස ඩිජිටල් පරිවර්තනය

2023 දී ඩිජිටල් පරිවර්තනය සහ මූල්‍ය ඇතුළත් කිරීම් කෙරෙහි බැංකුවේ උපායමාර්ගික අවධානය වෙන කවරදාටත් වඩා කැපී පෙනුණි. අපගේ ගනුදෙනුකරුවන්ගේ වර්ධනය වන අවශ්‍යතාවන්ට බාධාවකින් තොරව සහ ආරක්ෂිත බැංකු අත්දැකීම් සැපයීමේ අරමුණින් අපගේ ඩිජිටල් පැවැත්ම අඛණ්ඩව වැඩිදියුණු කිරීම මෙම කැපවීම් සඳහා උදාහරණයක් විය.

සභාපතිතුමාගේ පණිවිඩය

මෙම ප්‍රයත්නයන් නව තාක්ෂණය අනුගමනය කිරීම පමණක් නොව මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය පුළුල් කිරීම, විශේෂයෙන් අඩු පහසුකම් සහිත ප්‍රදේශයන්හි වැඩි පිරිසකට ඩිජිටල් බැංකු විසඳුම් වලින් ප්‍රතිලාභ ලැබිය හැකි බව සහතික කිරීම සඳහා ද විය.

ව්‍යාපාර බලගැන්වීම

2023 දී, විශේෂයෙන්ම ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකය (BRRU) පුළුල් කිරීම සහ මෙහෙයවීම හරහා ව්‍යාපාරිකයින් මුහුණ දෙන සමාජ-ආර්ථික අභියෝග වලට සාර්ථකව පිළිතුරු සෙවීම සඳහා බැංකුව සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ඇත. මෙහි මූලපිරීම සිදු වුයේ වසංගතයෙන් පසු සංකීර්ණ ආර්ථික පීඩනය නිසා අරගල කරන ව්‍යාපාර වලට සහාය වීමේ තීරණාත්මක අවශ්‍යතාවය හඳුනා ගැනීමෙනි. මෙම ඒකකය හරහා අපගේ ප්‍රවේශය හුදෙක් ගනුදෙනු පමණක් නොව, ආර්ථික ප්‍රකෘතිය සහ තිරසාරත්වය පෝෂණය කිරීම සඳහා කැපවීම ද ගැඹුරින් අරමුණු කර ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කවය හරහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි (SMEs) ආර්ථික වර්ධනය සහ රැකියා නියුක්තිය සඳහා ඉටු කරණ ප්‍රධාන භූමිකාව හඳුනා ගැනීමෙන් බැංකුව සිය සහයෝගය තවදුරටත් තීව්‍ර කළේය. සැපයුම් දාම බිඳවැටීම් සහ ආනයන සීමා කිරීම් සහිටුහන් කරන ලද වසරක් තුළ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිදි වෙළඳපළ හිඩැස් පිරවීම සහ නව අවස්ථා හඳුනා ගැනීම තුළින් ඔවුන්ගේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කවය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අපගේ ඉලක්කගත සහයෝගය මූල්‍ය ආධාර ඉක්මවා ගියේය; එයට දැනුම ගොඩනැගීමේ වැඩමුළු, උපදේශන වැඩසටහන් සහ සාමූහිකත්වය ගොඩනැගීමේ අවස්ථා ඇතුළත් වූ අතර, මෙමඟින් ව්‍යවසායන්හි අභියෝග වලදී නොසැලී සිටීමේ ශක්තිය බලගැන්වීම අපේක්ෂා කර ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වෙනස් වන වෙළඳපළ ගතිකත්වයට අනුවර්තනය වීමට සහ මෙහෙයුම් අභියෝග ජය ගැනීමට නවෝත්පාදනයන් පෝෂණය කිරීම සහ තිරසාර ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හරහා මෙම තීරණාත්මක අංශයෙහි පුනර්ජීවනය සඳහා අපි දායක විය.

තිරසාරත්වය සඳහා කැපවීම

වසර තුළ බැංකුව පාරිසරික, සමාජීය, සහ යහපාලනය (ESG), එහි මෙහෙයුම්වල මූලික සැකැස්ම සමඟ ඒකාබද්ධ කිරීමට තවදුරටත් කැපවූ අතර ESG හොඳම භාවිතයන් සමඟ ව්‍යාපාරික භාවිතයන් පෙළගැස්වීමේ උපායමාර්ගික මූලපිරීම් කිහිපයක්ම ආරම්භ කළේය. මෙහිදී ප්‍රධාන පියවරක් වූයේ ESG උපායමාර්ග සංවර්ධනය කිරීමෙහි ලා විශේෂිත විශේෂඥතාව උපයෝගී කර ගැනීමට සැලසුම් කිරීමයි. ESG වෙත අපගේ ප්‍රවේශය විස්තීර්ණ සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරමින්, ගෝලීය හොඳම භාවිතයන් සහ නිවැරදි පරිචය ලබා ගැනීමට මෙම සහයෝගීතාවය තුළින් අපට හැකි විය.

අපගේ තිරසාර තීරණ ගැනීමෙහි ලා කේන්ද්‍රීය සංරචකය වූ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති (ESMS) ඒකකය, පුළුල් කිරීම තවත් වැදගත් සන්ධිස්ථානයකි. නාස්තිය අවම වන, පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය වන, පරිසර පද්ධති ආරක්ෂා කරන නවෝත්පාදන විසඳුම් ක්‍රියාත්මක කිරීම සඳහා අපි කැපවී සිටිමු. එමඟින් අනාගත පරම්පරාව සඳහා ධනාත්මක උරුමයන් සුරක්ෂිත කිරීමට හැකිවෙනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

පෙර දැක්ම

ඩිජිටල් තාක්ෂණයෙන් පිරිපුන් ආයතනයක් බවට පත්වීමේ ගමන වේගවත් කිරීමටත්, සීමා මායිම්වලින් ඔබ්බට ව්‍යාපාරික මෙහෙයුම් පුළුල් කිරීමටත්, අපේක්ෂිත වර්ධනයට සරිලන පරිදි කටයුතු කිරීමටත් බැංකුව සූදානමින් සිටී. අපගේ දැක්ම ගනුදෙනුකාර සහභාගීත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඩිජිටල් පරිවර්තනය සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් ආවරණය කරයි. නවීනතම ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගනිමින් අපගේ ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව, අවබෝධාත්මක සහ පුද්ගලාරෝපිත සේවා අත්දැකීමක් ලබාදීමේ අපගේ හැකියාව මත බැංකුකරණයේ අනාගතය පවතින බව අපි තේරුම් ගනිමු. අපගේ අරමුණ වන්නේ බැංකුකරණය සෑම කෙනෙකුටම ඕනෑම තැනක සහ ඕනෑම වේලාවක ආරක්ෂාකාරීව පහසුවෙන් ප්‍රවේශ විය හැකි තත්ත්වයට පත් කිරීමයි.

කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධන වැඩසටහන් වැඩි දියුණු කිරීම කෙරෙහි ද සැලකිය යුතු අවධානයක් යොමු කෙරේ. අපගේ ඉලක්කය වන්නේ ශීඝ්‍රයෙන් පරිණාමය වන ඩිජිටල් බැංකු පරිසරයක් තුළ දියුණු වීමට අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් අපගේ කණ්ඩායම සන්නද්ධ කිරීමයි. මෙයට ඩිජිටල් තාක්ෂණ, සයිබර් ආරක්ෂාව, ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය සහ නව්‍ය ගැටලු විසඳීමේ ක්‍රම පිළිබඳ විශේෂිත පුහුණුව ඇතුළත් වේ. අපගේ කාර්ය මණ්ඩලය සඳහා ආයෝජනය කිරීමෙන්, ඔවුන්ගේ වර්තමාන භූමිකාවන්හි ප්‍රවීණත්වය පමණක් නොව අනාගත අභියෝග සහ අවස්ථාවන් නොබියව භාරගැනීමට මනාව සූදානම්ව සිටින බව සහතික කරමින් අඛණ්ඩ දැනුවත්වීමේ සහ නවෝත්පාදන සංස්කෘතියකින් පෝෂණය කිරීම අපගේ අරමුණයි.

කෘතවේදීත්වය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මගේ සෙසු සාමාජිකයින්ට බැංකුවට උපායමාර්ගික මඟ පෙන්වීමක් ලබා දීම සඳහා ඔවුන්ගේ අඛණ්ඩ කැපවීම සහ සහාය සඳහා මගේ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. මගේ අවංක ප්‍රණාමය 2023 දී අපේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් වූ මනිල්ක ප්‍රනාන්දු මහතා සහ හර්ෂ විජයවර්ධන මහතා වෙත පිරිනමන අතර, නරේෂ් අබේසේකර මහතා සහ මහාචාර්ය කිත්සිරි වීම් ලියනගේ මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට මම සාදරයෙන් පිළිගනිමි.

උපායමාර්ගික අභිලාෂයන් ඉටුකර ගැනීම සඳහා වූ අභියෝග ජයගැනීම සඳහා මහා කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරී රසල් ෆොන්සේකා මහතා, කළමනාකාරිත්වය සහ ලංකා බැංකු කණ්ඩායමේ සාමාජිකයින්ගේ නොපසුබට කැපවීම අගය කිරීමට මම කැමැත්තෙමි.

අපගේ එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් ලබා දුන් මාර්ගෝපදේශයනට ගරු මුදල් අමාත්‍යවරයා සහ මුදල් අමාත්‍යංශයේ නිලධාරීන්ගේ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් මාගේ කෘතඥතාව සටහන් කිරීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාට සහ නිලධාරීන්ට, විගණකාධිපතිවරයාට සහ

ඔහුගේ කාර්ය මණ්ඩලයට, අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට, ව්‍යාපාරික හවුල්කරුවන්ට සහ මෙතෙක් බැංකුවේ ගමනට අත්‍යාවශ්‍ය කොටස්කරුවන් වූ අනෙකුත් සියලුම ඇල්ම දක්වන පාර්ශ්වකරුවන්ට මගේ කෘතඥතාව සහ ප්‍රශංසාව පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මෑතකදී අධ්‍යක්ෂ මණ්ඩලයට එක් වූ ජයමින් පැල්පොල මහතා සහ ජෙහාන් ස්මයිල් මහතා සාදරයෙන් පිළිගන්නා අතරම බැංකුව ජයග්‍රහණයේ ඉහළ තලයකට ගෙනයාමට නායකත්වයේ වගකීම භාර ගන්නා, නව සභාපති කාවන් රත්නායක මහතාට මගේ සුබ පැතුම් පිරිනැමීමට කැමැත්තෙමි.

අනාගතයේදී ද, ශ්‍රී ලංකා ආර්ථිකයේ ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා බැංකුව සිය දායකත්වය නිරන්තරව සපයනු ඇත. අපගේ ගනුදෙනුකරුවන්ගේ, සේවකයින්ගේ සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන් අපේක්ෂිත මට්ටමෙන් ඔබ්බට සපුරාලීම පෙරදැරිව අපගේ උපරිම ශක්තිය නව්‍යකරණය සමඟ සංයෝජනය කරමින් තිරසාර සංවර්ධනයක් උදෙසා නිබඳව කැපවෙමු. අපගේ ශක්තීන් උත්තේජනය කිරීමට, නවෝත්පාදනයන් වැලඳ ගැනීමට සහ තිරසාරත්වය පෝෂණය කිරීමට ද අපි කැපවී සිටිමු.



ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා
සභාපති

2024 මාර්තු 13
කොළඹ දීය.

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය



"ගනුදෙනුකරුවන්ට, ප්‍රජාවට සහ මුළු ජාතියටම ඇවැසි බැංකු සේවාවන් ලබාදීමේ සිය මෙහෙවර ඉටු කිරීම සඳහා බැංකුව ස්වකීය සියලු ශක්තීන් හැකියාවන් සහ කැපවීම උපරිම ලෙස යොදවමින් කටයුතු කළ බව වාර්තා කිරීම මට මහත් ආඩම්බරයකි."

ඩබ්ලිව්. පී. රසල් ෆොන්සේකා
මහා කළමණාකරු/
ප්‍රධාන විධායක නිලධාරී

මූල්‍ය ආයතනවල ශක්තිය සහ ආර්ථික අවපාතයන් වෙත සාර්ථක මුහුණ දීමේ හැකියාව පරීක්ෂාවට ලක් වූ තීරණාත්මක අවස්ථා අප රටේ ඉතිහාසය දෙස විමර්ශනය කරන විට හඳුනාගත හැකිවේ. ලංකා බැංකුවේ සැබෑ ශක්‍යතාවයන් වඩාත් ඔප්නැංවූයේ මෙවැනි අසීරු කාලයන් තුළය. පෙර වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් පැන නැඟුණු අභියෝග හමුවේ ගනුදෙනුකරුවන්ට, ප්‍රජාවට සහ මුළු ජාතියටම ඇවැසි බැංකු සේවාවන් ලබාදීමේ සිය මෙහෙවර ඉටු කිරීම සඳහා බැංකුව ස්වකීය සියලු ශක්තීන් හැකියාවන් සහ කැපවීම උපරිම ලෙස යොදවමින් කටයුතු කළ බව වාර්තා කිරීම මට මහත් ආඩම්බරයකි. විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ පිළිවෙත්, විවිධාංගීකරණය වූ ආදායම් ප්‍රවාහ සහ පිරිවැය කළමනාකරණය සහ කාර්යක්ෂම ක්‍රියාමාර්ග තුළින් අභියෝගාත්මක කාලවලදී නොසැලී කටයුතු කිරීමට සහ මතුවන නව අවස්ථා ප්‍රයෝජනයට ගැනීමටත්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකුව ලෙස අපි කටයුතු කළෙමු. මේ අනුව පසුගිය වසර තුළ බැංකුවේ කාර්යසාධනය, ජයග්‍රහණ සහ ඉදිරි ගමන පිළිබඳ වාර්ෂික සමාලෝචනය ඔබ සමඟ බෙදා ගැනීමට ලැබීම සතුටට කරුණකි.

සාකල්‍ය වටිනාකමක් ලබා දීම

වසර ගණනාවක් පුරා අපි අසමසම අභියෝග වලට මුහුණ දුන් නමුත් සෑම විටම ජාතියේ බැංකුකරු වශයෙන් අපගේ කාර්යභාරය නිසියාකාරව ඉටු කිරීමට යොමුවී සිටියෙමු. එනම් සෑම තරාතිරමකම සහ විවිධ වයස් මට්ටම් වල මිනිසුන්ගේ ජීවිත ඉදිරියට ගෙන යාමේ අපගේ අරමුණ, සෑම පුද්ගලයෙකුටම තම ප්‍රජාව තුළ සහ සමාජය තුළ අර්ථවත් වෙනසක් ඇති කිරීමට හැකියාව ඇති බවට අපගේ විශ්වාසය සහ තිරසාර අනාගතයක් සඳහා වැඩ කිරීමට අපගේ කැපවීම යනාදිය මෙහෙදී සැලකිල්ලට ගනු ලැබීය.

ඉහළ යන උද්ධමනය, ඉහළ පොළී අනුපාත, විචල්‍ය විනිමය අනුපාත, උග්‍ර ද්‍රවශීලතා හිඟය, අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයුම් මාර්ග අඩපණවීම, සහ සමාජ හා දේශපාලන අස්ථාවරත්වය සමඟ පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දුන් අපගේ ප්‍රධාන ප්‍රමුඛතාවය වූයේ 2023 දී යලි ආර්ථික කටයුතු නිසි මඟට ගෙන එමින් පුනර්ජීවනය උදෙසා අවශ්‍ය කටයුතු සම්පාදනයයි. බැංකුව විසින් ආර්ථික ක්‍රියාකාරකම්වල නියමුවෙකු ලෙස එය ඉටු කරන තීරණාත්මක කාර්යභාරය මනාව වටහාගත් අතර අභියෝග හරහා ගමන් කිරීමට සහ ආර්ථික පුනර්ජීවනය සඳහා දායක වීමට ක්‍රියාකාරී පියවර රාශියක් දියත් කරන ලදී. මෙම ක්‍රියාවලියේදී අපි තීරණාත්මක ආර්ථික අංශ හඳුනා ගනිමින් වඩාත් සාකල්‍ය දැක්මක් අනුගමනය කළෙමු.

එහි පළමු පියවර ලෙස අපි රට තුළ බලශක්ති සුරක්ෂිතතාව ඇති කිරීමට කටයුතු කළෙමු. බලශක්ති සුරක්ෂිතතාවය ආර්ථික ක්‍රියාකාරකම් මෙහෙයවීමේදී තීරණාත්මක නිර්ණායකයක් වන අතර අඩුවෙමින් පවතින විදේශ විනිමය සංචිත මධ්‍යයේ බලශක්ති උත්පාදනය සහ රටේ ප්‍රවාහන කටයුතු අබාධිත පවත්වා ගෙනයාම සඳහා ඉන්ධන ආනයනය කිරීම රජයට අසීරු කටයුත්තක් විය. බැංකුව එම අවස්ථාවේදී බලශක්ති ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා විවිධ උපායමාර්ගික මූලපිරීම් ක්‍රියාත්මක කළේය. කෙටි කාලීන ලාභදායීතාවයෙන් ඔබ්බට කටයුතු කරමින් ඉන්ධන නැව්ගත කිරීම් සහ ආර්ථිකයේ අනෙකුත් අත්‍යාවශ්‍ය අංශ සඳහා විදේශ විනිමය මුදා හැරීමට බැංකුව ප්‍රමුඛත්වය දුන් අතර, දීර්ඝ කාලයක් පැවතිය හැකි දුෂ්කරතා එමඟින් සමනය විය. අභ්‍යන්තර ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම සහ අපනයන ආදායම රටට ගලා ඒම දිරිමත් කිරීම තුළින් අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට පහසුකම් සැලසීමට සහ තීරණාත්මක අවස්ථාවක අපේ ජාතියට සේවය කිරීමට සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් උත්පාදනය කිරීමට අපට හැකි විය.

දෙවනුව, අපි ආර්ථිකයේ අවදානමට ලක්විය හැකි අංශ හඳුනාගෙන දුෂ්කරතාවන්ට ලක්වූ ව්‍යාපාර ආරක්ෂා කිරීමට අපගේ උපරිම උත්සාහය දැරුවෙමු. හඳුනාගත් ගනුදෙනුකරුවන්ට සහ ව්‍යාපාර වලට මූල්‍යකරණය, උපදේශන සේවා, අවදානම් කළමනාකරණ විසඳුම් සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය ඇතුළුව අදාළ මූල්‍ය සහාය බැංකුවේ ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකය (BRRU) හරහා ලබා දෙන ලදී. නිසි කළමනාකරණය සහ දැඩි අවධානය යොමු කිරීම තුළින්, අපගේ ගනුදෙනුකරුවන් මුහුණ දෙන බාධක හඳුනාගෙන නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග වලට යොමු වීම වෙනුවට, ඔවුන්ගේ ද්‍රවශීලතාව සහ සමස්ත මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. 2023 වසර තුළදී ව්‍යාපාර 174 ක් පුනර්ජීවනය කිරීමට අපට හැකි වූ අතර මෙම මූලපිරීම් සඳහා බැංකුවේ සේවක කණ්ඩායම දක්වන කැපවීම ගැන මම බෙහෙවින් ආඩම්බර වෙමි.

> **"අපි ආර්ථිකයේ අවදානමට ලක්විය හැකි අංශ හඳුනාගෙන දුෂ්කරතාවන්ට ලක්වූ ව්‍යාපාර ආරක්ෂා කිරීමට අපගේ උපරිම උත්සාහය දැරුවෙමු."**

ජනතාවගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම තහවුරු කිරීමේ අවශ්‍යතාවය අපි මනාව හඳුනා ගත් බැවින් ඖෂධ සහ වෛද්‍ය උපකරණ ආනයනය සඳහා අවශ්‍ය සහයෝගය දැක්වීමට අවධානය යොමු කළෙමු.

සංකීර්ණ සහ අස්ථාවර ආර්ථික පරිසරයක් තුළ, සමස්ත ජාතියටම සහය වන අතර අනපේක්ෂිත අභියෝගවලට නොසැලී මුහුණ දීමේ හැකියාව වර්ධනය කර ගැනීමට බැංකුවේ මූල්‍ය ශක්තිය සහ ශක්‍යතාව මූලික පදනම විය. ශ්‍රී ලංකා ආර්ථිකය යලි ස්ථාවරත්වයේ මාවතට ගෙන ඒම සඳහා බැංකුව දැක්වූ දායකත්වය දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද පිළිගැනීමට ලක් වූ අතර, බැංකුව ලොව හොඳම බැංකු 1,000 අතරට ශ්‍රේණිගත කිරීම සහ වික්සත් රාජධානියේ "ද බෑන්කර්" සඟරාව විසින් '2023 වසරේ ශ්‍රී ලාංකීය බැංකුව ලෙස ඇගයීමට පාත්‍රවිය. තවද ශ්‍රී ලංකාවේ අංක එකේ බැංකු සන්නාමය ලෙස "බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ලංකා" ආයතනය විසින් ලංකා බැංකුව අබාධිතව 15 වන වසරටත් නම් කර ඇත.

මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ ස්ථාවරත්වය

ධනාත්මක සටහනකින් අප වසර අවසන් කළ අතර, අපගේ මූල්‍ය කාර්යසාධනය අභියෝගාත්මක ආර්ථික සන්දර්භයක් තුළ ප්‍රදර්ශනය වන ශක්තිය සහ ස්ථාවරත්වය පිළිබඳ සාක්ෂියකි. පොළී ආදායමේ 15% ක වර්ධනය සමඟ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 40.3 ක් ලෙස වාර්තා විය.

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

කෙසේ වෙතත්, පොළී වියදම්හි වර්ධනය පොළී ආදායමේ වර්ධනයට වඩා වැඩි වූ අතර, එය ශුද්ධ පොළී ආදායමේ 28% ක පහත වැටීමට තුඩු දුන් අතර, එතුළින් පොළී අනුපාත ඉහළ නැංවීමේ පූර්ණ බලපෑම අප ගනුදෙනුකරුවන් වෙත විතැන් නොකර, ඔවුන්ගේ ව්‍යාපාර පුනර්ජීවනයට ප්‍රමුඛත්වය දීමේ බැංකුවේ ප්‍රයත්නය සහ කැපවීම පිළිබිඹු කරයි.

ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම 8% කින් වර්ධනය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් කාඩ්පත් ආශ්‍රිත ගනුදෙනු සහ සිල්ලර බැංකු සේවා ගනුදෙනු වල වර්ධනය හේතු විය. කෙසේ වෙතත්, ආයෝජන කටයුතු මත වෙළඳාමෙන් ලැබෙන ආදායම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් වලට ශ්‍රී ලංකා රුපියල අධිප්‍රමාණය වීම මත පැන නැඟුණු විනිමය පාඩු නිසා අහිතකර තත්ත්වයක් බලපෑවේය.

ණය අවදානම ඉහළ ගිය කර්මාන්ත හඳුනාගැනීම සහ ඉහළ අවදානම් සහිත ණය ගැනියන් වෙත නිරාවරණය නැවත තක්සේරු කිරීමෙන් බැංකුව කල්තියා ණය අවදානම් කළමනාකරණය කළේය. බැංකුවේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් අපේක්ෂිත අලාභ සඳහා පෙර වසර වලදී විචක්ෂණශීලී ප්‍රතිපාදන සම්පාදනය කරන ලදී. මෙම ක්‍රියාවල ප්‍රතිඵලයක් ලෙස සහ ව්‍යාපාර පුනර්ජීවන ක්‍රියාකාරකම්, දැඩි ණය නිරීක්ෂණ සහ රුපියල අධිප්‍රමාණය වීම හේතුවෙන් වර්ෂය තුළ හානිකරණ ප්‍රතිපාදනවල ශුද්ධ ප්‍රත්‍යාවර්තයක් සිදු විය.

පොළී අනුපාත අඩු කළද, බැංකුවේ තැන්පතු පදනම රු. ට්‍රිලියන 3.9 දක්වා 16% කින් වර්ධනය වුයේ බැංකුවේ ශක්තිමත් ගනුදෙනුකාර විශ්වාසය පිළිබිඹු කරමිනි. බැංකුවේ වත්කම් පදනම රු. ට්‍රිලියන 4.4 දක්වා ළඟා වුයේ, ණය සහ අත්තිකාරම් රු. ට්‍රිලියන 2.5 ක් සහ ආයෝජන රු. ට්‍රිලියන 1.7 ක් සමඟිනි.

පවතින අස්ථාවර වෙළඳපළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් බැංකුවේ විදේශ මුදල් සහ රුපියලේ ද්‍රවශීලතා මට්ටම් කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාශීලී සහ කාලීන ක්‍රියාමාර්ග අනුගමනය කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය 45% ක් වූ අතර එය නියාමන අවම අගය වන 20% හා සැසඳීමේදී සතුටුදායක මට්ටමකි. 2023 දෙසැම්බර් 31 දිනට ස්ථර 1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ සමස්ථ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පිළිවෙළින් 12.8% සහ 15.8% ලෙස පැවතුනි.

පාරිසරික, සමාජීය, සහ යහපාලන (ESG) වෙනුවෙන් අපගේ කැපවීම ශක්තිමත් කිරීම

අපගේ ESG රාමුව ශක්තිමත් කිරීමේ අදහසින්, වසර තුනක කාලයක් තුළ බැංකුව උදෙසා තිරසාර පෙර දැක්මක් සකස් කිරීම සඳහා අපට සහය වීමට ESG උපදේශකයෙකු පත් කළෙමු. තිරසාරත්වය සඳහා වන මහ බැංකුවේ පෙර දැක්ම මෙන්ම එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ ද අපි අපගේ මෙහෙයුම් පෙළගස්වා ඇත්තෙමු. ESG භාවිතයන් වර්ධනය කිරීම සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් සකසා ගැනීමෙන්, අපගේ පාර්ශ්වකරුවන් සහ සමස්ත සමාජය සඳහා ධනාත්මක ප්‍රතිඵල සඳහා දායක වීම අපගේ අරමුණයි.

මෙම අභියෝගාත්මක කාල පරිච්ඡේදයන් වලදී බැංකුවේ ගාමක බලය වූයේ අපගේ සේවක මණ්ඩලයයි. එබැවින් සේවක මණ්ඩලයට අවශ්‍ය සියළු පහසුකම් සහ ඇගයීම් කටයුතු වෙනුවෙන් බැංකුව නිරතුරුව කැපවේ. අපගේ සේවකයින්ගේ වෘත්තීය මෙන්ම පෞද්ගලික ජීවිතවල සංවර්ධනය සහ සුවතාවය වැඩි දියුණු කිරීම ඉලක්ක කරගත් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අපි විවෘත සන්නිවේදනය, වෘත්තීය සංවර්ධනය, රැකියාව සහ පෞද්ගලික ජීවිත සමතුලිතතාවය, පිළිගැනීම, විවිධත්වය සහ සැබැඳියාව සඳහා ප්‍රමුඛත්වය ලබා දුන්නෙමු. ආර්ථික පසුබෑම හේතුවෙන් සේවයෙන් ඉවත්ව යාමේ ප්‍රමාණය ඉහළ අගයක පැවති අතර, කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය සහ සක්‍රීයව තබා ගැනීමට අපි අපගේ උපරිම උත්සාහය දරමු.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නඟා සිටුවීමේ ප්‍රයත්නයන් ද අපි ත්‍රීව කළ අතර ඒ සඳහා බැංකුවේ මුදල් උපයෝගී කරගෙන රු. බිලියන 5.0 ක මුදලක් වෙන් කරන ලද "SME චැම්පියන්" ණය යෝජනා ක්‍රමය මෙම වසරේ දියත් කළෙමු.

රටේ ග්‍රාමීය ප්‍රදේශ සවිබල ගැන්වීම සහ ශක්තිමත් කිරීම අරමුණු කරගත් "BOC ගම්මාන" වැඩසටහන, ආයතනික සමාජ වගකීම සඳහා අපගේ හෘදයාංගම කැපවීම විදහාපාමින් 2023 වසර පුරාවටම ක්‍රියාත්මක විය. ග්‍රාමීය ආර්ථිකයන් වර්ධනය කිරීමට අමතරව, මෙම වැඩසටහන මගින් මිනිසුන් අතර මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සහ ණය දීමේ අවිධිමත් ක්‍රමවලින් සහ මූල්‍ය සූරාකෑමෙන් ඔවුන් ආරක්ෂා කිරීම ද අරමුණු කරයි.

බැංකුව පරිසරයේ යහපැවැත්ම සඳහා වන සිය වගකීම සහ කැපවීම ඉතා බැරෑරුම් ලෙස සලකන අතර කාබන් පියසටහන අඩු කිරීම, ස්වභාවික සම්පත් සංරක්ෂණය සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා ස්ථිර ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කරන ලදී. බැංකු කර්මාන්තයේ ප්‍රමුඛයා ලෙස පාරිසරික තිරසාරභාවය සඳහා අපගේ කැපවීම බැංකු කටයුතු වලින් ඔබ්බට විහිදී ගිය පුළුල් දර්ශණයක් සහිත වන අතරම වටිනාකම් ගොඩනැඟීමේ අප සතු හරහා ධනාත්මක වෙනස්කම් ඇති කිරීමට අපි කටයුතු කරන්නෙමු. වසර තුළ අපගේ හරිත ණය කළඹ, රු. මිලියන 530.9 කින් පුළුල් කළ අතර අපගේ ණය කළඹ හරහා සැලකිය යුතු තිරසාර බලපෑම් ඇති කරමින් ESMS චේකය හරහා ණය ලබාදීම වඩාත් දැඩි ලෙස විමර්ශනය කළෙමු. අපේ අනාගත පරපුර හරිත සංකල්පයන් වෙත අනුගත කිරීමත් ඒ ඔස්සේ ජීවිත ගොඩනැංවීමත් දිරිගැන්වීමේ අරමුණින් 'හරිත කැකුළු' සහ 'e-තුරු' යන නව තිරසාර තැන්පතු යෝජනා ක්‍රම දෙකක් ද අපි හඳුන්වා දුන්නෙමු. ධනාත්මක පාරිසරික වෙනසක් ඇති කිරීමට අප දරණ උත්සාහයට 2023 හරිත ව්‍යාපාර නායකත්ව සම්මානය මෙන්ම හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් 2023 වසරේ හරිත සංකල්පය උදෙසා කැපවීමේ විශිෂ්ටතා සම්මානය ද හිමි විය.

අනාගත ඩිජිටල් භාවිතය

බැංකු ක්ෂේත්‍රයේ විකාශනයත් සමඟම ගනුදෙනුකාර අත්දැකීම්, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ මූල්‍ය ඇතුලත්කරණය ආදී ප්‍රධාන අංශ වල වර්ධනය උදෙසා ඩිජිටල්කරණය සහ නවෝත්පාදනයන් භාවිතා කිරීම අපගේ ප්‍රධානතම අවධානය යොමුවූ උපායමාර්ගයකි.

මේ අනුව ඩිජිටල් බැංකු සේවා, ජංගම ගෙවීම් විසඳුම් සහ මූල්‍ය තාක්ෂණ (FinTech) හවුල්කාරිත්වයන් සඳහා අපගේ ආයෝජන මඟින් පහසු, ආරක්ෂිත සහ පුළුල් ප්‍රවේශ සහිත බැංකු සේවා සමඟ ගනුදෙනුකරුවන් සවිබල ගන්වා ඇත.

දැනටමත් අති නවීන ඩිජිටල් සේවා පරාසයක පුරෝගාමියා වන ලංකා බැංකුව, රටේ මූල්‍ය සේවා කර්මාන්තය අනාගත ලෝකයට ගැලපෙන පරිදි පරිවර්තනය කිරීම ඉලක්ක කරගත් බැංකු ක්ෂේත්‍රයේ නව්‍ය සේවා සැපයීමේ ප්‍රමුඛයා වීමට අපේක්ෂා කරයි.

ඩිජිටල් බැංකු ක්ෂේත්‍රයේ නවෝත්පාදනය, ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය සහ නායකත්වය සඳහා අපගේ කැපවීම ගෞරවයට ලක් කරමින් ''ලංකාපේ ටෙක්නොවේෂන් සම්මාන'' 2023 හිදී විශිෂ්ට ඩිජිටල් මූලපිරීම් සඳහා රන් සම්මාන තුනක් සහ රිදී සම්මාන දෙකක් සමඟින් ලංකා බැංකුව පිදුම් ලැබීය.

සයිබර් තර්ජන, නියාමන අවශ්‍යතා සහ ගනුදෙනුකරුවන් අපේක්ෂා කරන ලෙස දත්ත ආරක්ෂණ වැඩිදියුණු කිරීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් බැංකුව එහි තොරතුරු තාක්ෂණ පාලන ක්‍රියාවලීන් "COBIT-2019 රාමුව සමඟ අනුගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙම රාමුව අනුගමනය කරන ශ්‍රී ලංකාවේ ප්‍රථම බැංකුව ලෙස, "AI", Cloud Computing"," Open Banking", "Big-data" සහ "Blockchain" ඇතුළුව නැඟී එන තාක්ෂණ පරිසරයක් වෙත යොමු වන අතරම, සමස්ත කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අපගේ තොරතුරු තාක්ෂණ සම්පත් විධිමත් කිරීමට සහ ප්‍රශස්ත කිරීමට අපි කැපවී සිටිමු.

ඉදිරි ගමන් මඟ සහ ප්‍රණාමයන්

අඛණ්ඩ වසර දෙකක ආර්ථික පසුබෑම් තත්ත්වයක් අත් විඳීමෙන් අනතුරුව අවසානයේ ආර්ථිකය ක්‍රම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වන ලකුණු දිස්වී තිබේ. කෙසේ වෙතත්, අප තවමත් අවදානම් තත්ත්වයෙන් ඉවත් වී නොමැති අතර, මූල්‍ය අංශයේ අවදානම් අවම කිරීම සඳහා දූරදර්ශී පියවරයන් සමඟින්, බාහිර අංශයේ අසමතුලිතතාවයන් වැළැක්වීම සඳහා අඛණ්ඩව විදේශ මුදල් ප්‍රවාහ ලැබීම් වැඩිදියුණු කිරීමට තිරසාර ක්‍රියාමාර්ගයන් අවශ්‍ය වේ. සමස්ත මූල්‍ය අංශයේ ස්ථාවරත්වය ඉහළ නැංවීම සඳහා වෙළඳපළ සහභාගිවන්නන්, නියාමකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ අඛණ්ඩ සහ ඵලදායී සම්බන්ධීකරණයක් සහ සහයෝගීතාවයක් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ රජය සතු ව්‍යවසායන් ප්‍රතිසංස්කරණ කිරීම මඟින් වඩා හොඳ මූල්‍ය විනයක් සහිතව, ආර්ථිකයේ සමස්ත යහපැවැත්මට දායකත්වයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

ආර්ථිකයේ අපේක්ෂිත ප්‍රකෘතියට වඩා වේගවත් ප්‍රකෘතියක් සංඥා කරමින් මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති අතර පැහැදිලි සීමා නිර්ණය කිරීම ද අපේක්ෂා කළ හැකිය. සංචාරක හා වී ආශ්‍රිත අංශවල ප්‍රබෝධය මඟින් හිතකර විදේශ මුදල් සංචිත තත්ත්වය පෙන්නුම් කරන අතර, මහා පරිමාණ සහ සෘජු විදේශ ආයෝජන, අවිනිශ්චිතතාවයන් යටතේ සම්පූර්ණයෙන්ම ඉහළ නැංවිය නොහැක.

මෙම පසුබිම තුළ, බැංකුව සිය ව්‍යාපාරික ආකෘතිය ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇති අතර පුද්ගලික අංශයේ ණය දීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස, අඩු ක්‍රියාකාරී රාජ්‍ය ආයතන වෙත අවධානය අඩු කෙරෙන අතර රාජ්‍ය සහ පුද්ගලික අංශය සඳහා නොවෙනස් ලෙස ණය ඇගයීම සහ අධීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක වනු ඇත.

මූලික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, කාර්මික ව්‍යාපාර සහ ජාතියේ සෑම අංශයකම ආර්ථික ප්‍රගතිය ඇති කිරීම සඳහා බැංකුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අවශ්‍ය සහය සහ ණය ලබාදීමේ කාර්යභාරය අඛණ්ඩව ඉටු කරනු ඇත. අපගේ විදේශීය පැවැත්ම පුළුල් කිරීමට සහ මෙම කලාප හරහා නව ණය දෙන නිෂ්පාදන හඳුන්වා දීමට ද අපි බලාපොරොත්තු වෙමු.


ඉදිරියේ දී ඩිජිටල්කරණය සහ නවෝත්පාදනය මුල්කරගත් විශිෂ්ට ගනුදෙනුකාර සේවාවක් සපයමින් අපගේ සම්පත් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස හසුරුවමින් තරඟකාරී මිලකරණය මත වෙළෙඳපළ නායකත්වය පවත්වා ගැනීමට අපි අදහස් කරන්නෙමු. ඩිජිටල් බැංකුකරණ පද්ධතියේ ආරක්ෂාව, විශ්වසනීයත්වය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා අපි නවීන තාක්ෂණයන්, දත්ත විශ්ලේෂණ සහ සයිබර් ආරක්ෂණ පියවරයන් සඳහා ආයෝජනය කරන්නෙමු.

අවසාන වශයෙන්, මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුලදී ඔවුන්ගේ නායකත්වය වෙනුවෙන් සභාපතිවරයාට සහ සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට මගේ අවංක ස්තූතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. අපගේ ඇල්ම දක්වන පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ 2023 වසරේ ජාතික ආර්ථික ප්‍රබෝධයේ සියලුම අංගයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දීම සඳහා දිවා රෑ නොබලා කටයුතු කළ ආයතනික සහ විධායක කළමනාකාරිත්ව කණ්ඩායමට සහ සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ අවංක කෘතඥතාව පළ කරමි.

අභියෝගාත්මක වර්ෂයකදී මුදල් අමාත්‍යාංශයේ, ජාතික විගණන කාර්යාලයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ට ඔවුන්ගේ මඟපෙන්වීම සම්බන්ධයෙන් ස්තූති කිරීමටත්, ඉදිරි වර්ෂයේදී ඔවුන්ගේ සහයෝගය අපේක්ෂා කිරීමටත් මම මෙය අවස්ථාවක් කර ගනිමි.

අවසාන වශයෙන්, අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට, ව්‍යාපාරික හවුල්කරුවන්ට, වෘත්තීය සම්තිවලට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට වසර ගණනාවක් පුරා ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සහ විශ්වාසය වෙනුවෙන් තුති පුදමි.

මෑත ඉතිහාසයේ මෙම පරිච්ඡේදය ගැන මම මෙනෙහි කරන විට, ප්‍රගතිය සඳහා උත්ප්‍රේරකයක් ලෙස සහ විපත්ති කාලවලදී විශ්වාසයේ පහනක් ලෙස ලංකා බැංකුව විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යභාරය ගැන මම ආඩම්බර වෙමි. අභියෝග හමුවේ, අපගේ බැංකුවේ අනභිභවනීය ජවය දීප්තිමත් අනාගතයක් කරා මාවත ආලෝකමත් කරයි.



ඩබ්ලිව් ඒ රසල් ෆොන්සේකා

මහා කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරී

2024 පෙබරවාරි 27
කොළඹ දීය.



නව සභාපතිතුමාගේ පණිවිඩය

කාවන් රත්නායක
සභාපති

මම සභාපතිවරයාගේ භූමිකාව භාර ගන්නේ වසර 84 ක අභිමානවත් ඉතිහාසයක් ඇති ලංකා බැංකුවට සේවය කිරීමට අවස්ථාව ලැබීම ගැන නිහතමානී ගෞරවය පෙර දැරිවයි. ශ්‍රී ලංකාවේ විශාලතම වාණිජ බැංකුව ලෙස ලංකා බැංකුව, රට මුහුණ දුන් අභියෝග රාශියක් මධ්‍යයේ, තම පාර්ශ්වකරුවන්ට අගය නිර්මාණය කිරීමට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. පසුගිය වසර කිහිපය තුළ උපායමාර්ගික තීරණ ගැනීම සහ නොසැලෙන අධිෂ්ඨානය තුළින් බැංකුව දැඩි අභියෝග වලට මුහුණ දුන්නා පමණක් නොව, වෙන කවරදාටත් වඩා ශක්තිමත්ව සහ ක්‍රියාශීලීව නැගී සිටීමට හැකි වී ඇත. අති නවීන ඩිජිටල් විසඳුම් රාශියක් හඳුන්වා දීමෙන් ඩිජිටල් බැංකු ක්ෂේත්‍රය තුළ නව්‍යයකරණය, ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය සහ නායකත්වය සඳහා පෙරමුණ ගැනීමෙහිලා බැංකුව සමත් වී ඇත. එය ඉදිරි වසරවල සාර්ථකත්වයේ ප්‍රධාන ධාවකයක් වනු ඇතැයි මම විශ්වාස කරමි.

ඉදිරි මාවත

මා වෙත පැවරී ඇති වගකීම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇතිව මම මගේ රාජකාරී භාර ගන්නා අතර ජාතියට සහ ආර්ථිකයට සහාය වීමේදී ලංකා බැංකුව දරණ විශිෂ්ටත්වයේ උරුමය ආරක්ෂා කිරීමට මම කැපවී සිටිමි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය, සහනදායී සහ සංවර්ධන ණය ලබා දීම වැනි සහය දැක්වීමට ගෙන ඇති මූලපිරීම් මගින් ආර්ථිකයේ සංවර්ධනය සඳහා බැංකුවේ කැපවීම තවදුරටත් සනාථ වී ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය ස්ථාවරත්වය සහ ප්‍රගතිය නිවැරදි මාවතකට යොමු කිරීම සඳහා බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කවය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. මෙහි ඇති තීරණාත්මක වැදගත්කම හඳුනාගෙන මූල්‍ය පද්ධතියට සහ ආර්ථිකයේ ස්ථායීතාවයට පහසුකම් සැලසීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට, විශේෂයෙන් අපනයනය ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහ සමාග මිවලට ණය දීම කෙරෙහි අවධානය යොමු කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල්කරණය බැංකුවේ පරිවර්තනීය උපායමාර්ගයේ වටිනාම ප්‍රමුඛතාවයකි. පසුගිය වසර කිහිපය තුළ, මූල්‍ය ඇතුළත්කරණය මෙහෙයවන අතරම, අපගේ ගනුදෙනුකාර පදනම හරහා වැඩි ඩිජිටල් භාවිතයක් ගෙන ඒම සඳහා

"තාක්ෂණික දියුණුවේ ප්‍රතිලාභ, බැංකුවේ සවිමත් ගනුදෙනුකාර පදනම සමඟ බෙදා ගැනීමට මෙමඟින් බැංකුවට හැකිවනු ඇත. එසේම බැංකුවේ පුළුල් නිෂ්පාදන පරාසය සමඟ සියලුම ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ අනාගත මූල්‍ය අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීමට හැකි වේ."

බැංකුව ඩිජිටල් යටිතල පහසුකම් සඳහා සිය ආයෝජනය යොමු කර ඇත. ඩිජිටල්කරණය මූලික කරගත් ව්‍යාපාර ආකෘතිය බැංකුවට තම ගනුදෙනුකරුවන් වෙත ළඟා වීමට, ඔවුන්ව අභිප්‍රේරණය කිරීමට සහ ව්‍යාපාර කටයුතු සීඝ්‍ර ලෙස වර්ධනය කර ගැනීමට දායක වේ. එකී තාක්ෂණික දියුණුවේ ප්‍රතිලාභ, බැංකුවේ සවිමත් ගනුදෙනුකාර පදනම සමඟ බෙදා ගැනීමට මෙමඟින් බැංකුවට හැකිවනු ඇත. එසේම බැංකුවේ පුළුල් නිෂ්පාදන පරාසය සමඟ සියලුම ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ අනාගත මූල්‍ය අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීමට හැකි වේ. අපගේ ඩිජිටල් නාලිකාවල අඛණ්ඩ ආයෝජනය, උසස් ගනුදෙනුකාර අත්දැකීමක් නිර්මාණය කිරීම සඳහා සේවා ප්‍රමිතීන් සංවර්ධනය කරනු ඇත. එපමණක් නොව, වැඩ ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් හරහා ගතවන කාලය අඩු කිරීම මඟින් බැංකුව සිය ගනුදෙනුකාර කේන්ද්‍රීය සේවාව වැඩිදියුණු කරනු ඇත. ඩිජිටල්කරණය සහ ඩිජිටල් නිෂ්පාදන වෙත සංක්‍රමණය සඳහා වන අපගේ ප්‍රයත්නයන් වෙත බැංකුවේ අනාගත ගමන් පථයේ ප්‍රධාන අවධානයක් යොමු වනු ඇති අතර එමඟින් වර්ධනය වන වෙළඳපළ කොටස සහ වැඩිවන වත්කම් පදනම සමඟ ස්ථාවර වර්ධනයක් කරා යන මාවතක ඉදිරියට යාමට අපේක්ෂා කෙරේ.

අපගේ සේවක කණ්ඩායමේ කැපවීම බැංකුවේ ප්‍රගමනය උදෙසා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. වසර ගණනාවක් තිස්සේ මුහුණ දුන් අභියෝග මධ්‍යයේ වුවද බැංකුව අංක එකේ ස්ථානයේ පවත්වාගෙන යාමට අසීමිත කැපවීමකින් ක්‍රියා කළ අට දහසකට අධික කාර්ය මණ්ඩලය බැංකුව සතු විශාල වත්කමකි. සියලුම සේවකයින් පරිවර්තනීය ගමනේ පූර්ණ වශයෙන් නියැලී සිටින බව සහතික කිරීම සහ අපගේ දැක්මට අනුගත වීම අපගේ සාර්ථකත්වයට ප්‍රධාන වේ. පුහුණුව, කුසලතා සංවර්ධනය සහ වෘත්තීය ප්‍රගතිය සඳහා වන ක්‍රියාමාර්ග තුළින් අපගේ සේවකයින්ගේ ඉහළ නැංවීම සඳහා අපි දිගටම ආයෝජනය කරන්නෙමු.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකුව ලෙස මූලික ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කිරීම අපගේ අරමුණ වන අතර බැංකුවේ විෂය පථයට සෘජුවම සම්බන්ධ නොවන ව්‍යාපාර කිහිපයකින් උපායශීලීව ඉවත් වී ඇත. තවද, ජාත්‍යන්තර ශාඛා ජාලය හරහා අපගේ විදේශීය මෙහෙයුම් ශක්තිමත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන්, වෘත්තීය ජීවිතය තුළ විශිෂ්ටත්වය දැක්වූ, පුළුල් සහ විවිධ අත්දැකීම් ඇති සාමාජිකයින්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයේ දායකත්වය තුළින් බැංකුවට සැලකිය යුතු වටිනාකමක් එක් කිරීම මම සහතික කරමි. ආචාරධර්ම, විනිවිදභාවය සහ යහපාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට මම දැඩි ලෙස කැපවී සිටිමි. අපගේ සියලු මෙහෙයුම් වලදී සහ අනෙකුත් සියළු කටයුතු වලදී අඛණ්ඩතාව සහ වගවීම සඳහා ප්‍රමුඛත්වය දෙනු ඇත. විවිධ වූ අවස්ථාවන් සහිත ඉදිරි අනාගතය තුළ නවෝත්පාදනය, සාමූහික කැපවීම සහ අපගේ මූලික වටිනාකම් වලට අනුගතව ඉදිරි අභියෝග උදෙසා ශක්තිමත්ව මුහුණ දීමට හැකිවනු ඇතැයි මම විශ්වාස කරමි.

ප්‍රණාමය

බැංකුවේ උන්නතිය සඳහා වසර ගණනාවක් පුරා දැක්වූ මඟ පෙන්වීම වෙනුවෙන් මගේ පූර්වගාමියා වූ ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතාට සහ ඉවත්ව යන අධ්‍යක්ෂවරුන්ට මගේ කෘතඥතාවය පුදකරමින්, තවදුරටත් සාර්ථකත්වය වෙත බැංකුව රැගෙන යාම සඳහා මම අධ්‍යක්ෂ මණ්ඩලයට එක් වෙමි.

මහා කළමනාකරු රසල් ෆොන්සේකා මහතා ඇතුළු කණ්ඩායමට මෙම වාර්තාවේ දක්වා ඇති උපායමාර්ගික අභිලාෂයන් සහ ආකර්ෂනීය කාර්යසාධනය ඉටු කිරීම සඳහා ඔවුන්ගේ නොපසුබස්නා උත්සාහය සහ කැපවීම පිළිබඳව මම සුබ පතමි. අභියෝග රාශියක් මධ්‍යයේ ගෙවී ගිය වසර තුළ ලබා ගත් සාර්ථකත්වය මඟින් විදහා දැක්වෙන්නේ බැංකුවේ සේවක මණ්ඩලයේ කැපවීම සහ ඔවුන්ගේ ලැදියාවයි, බැංකුවේ ජයග්‍රහණ පිටුපස ඇති ගාමක බලවේගය ද එය වේ.

අපගේ චිකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය ලබා දුන් මාර්ගෝපදේශයන්ද, ගරු මුදල් අමාත්‍යවරයා සහ මුදල් අමාත්‍යංශයේ නිලධාරීන්ගේ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන්ද, මගේ කෘතවේදීත්වය සහ ප්‍රශංසාව පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්, අපගේ වටිනා ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ද බැංකුවේ සාර්ථක ගමන් මඟේ කොටස්කරුවන් වේ.

ජයමින් පැල්පොල මහතා සහ ජෙහාන් ස්මයිල් මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සාදරයෙන් පිළිගැනීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ, කළමනාකාරිත්වයේ සහ අපගේ සුවිශේෂී කාර්ය මණ්ඩලයේ සාමූහික කැපවීමෙන් බැංකුව ඉදිරියටත් ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ප්‍රමුඛයා වනු ඇතැයි මම විශ්වාස කරමි. ආර්ථික වර්ධනය පෝෂණය කරමින් සහ සැමට තිරසාර අනාගතයක් නිර්මාණය කරමින් අපි, අපගේ ජාතියට සහ එහි ජනතාවට සේවය කිරීමට කැපවී සිටිමු.



කාවන් රත්නායක
සභාපති

2024 මාර්තු 14
කොළඹ දීය

අධ්‍යක්ෂ මණ්ඩලය





වමේ සිට දකුණට

ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි.
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා
සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

නරේෂ් අබේසේකර මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

ජානකී සේනානායක සිරිවර්ධන මිය
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

(2023 දෙසැම්බර් 31 දිනට)

අධ්‍යක්ෂ මණ්ඩලය



ජනාධිපති නීතිඥ රොනල්ඩ් සී පෙරේරා මහතා

සභාපති (ඉවත්ව යන)

(ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ)

පත් වීම් ලද දිනය:
2023 ජනවාරි 20
2024 මාර්තු 13 ඉවත් විය

නිපුණතා හා පළපුරුද්ද

- ප්‍රාථමික අධිකරණයේ, අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ පුළුල් පළපුරුද්දක් ඇති ජනාධිපති නීතිඥවරයෙකි.
- විශේෂයෙන් සිවිල් හා අපරාධ නඩු කටයුතු, බේරුම් කිරීම් සහ ගිවිසුම් සම්බන්ධ පුළුල් පළපුරුද්දක් ඇත.
- වාණිජ නීති, බැංකු නීති, කාර්මික නීති, තහනම් නියෝග, අපහාස නඩු, මැතිවරණ පෙත්සම්, සිවිල් අභියාචනා, සංශෝධනය කිරීමේ අයදුම්පත්, නීති ආඥා සහ මූලික අයිතිවාසිකම් නඩු සම්බන්ධ විශේෂඥයකු වේ. එමෙන්ම ඔහු විවිධ වාණිජ බේරුම්කරණ කටයුතු සඳහා ද දායකත්වය සපයා ඇත.
- කොළඹ විශ්වවිද්‍යාලයේ නීති උපාධිය සහ එක්සත් රාජධානියේ නෝර්තම්බ්‍රියා විශ්වවිද්‍යාලයෙන් අන්තර්ජාතික වාණිජ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබාගෙන ඇත.

කලින් දැරූ තනතුරු

- 2015 ජනවාරි සිට 2019 නොවැම්බර් දක්වා ලංකා බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ.
- ලංකා බැංකුව (යූ.කේ.) සමාගමෙහි සභාපති.
- මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී හි සභාපති.
- සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම සහ සී/ස මිරේකා හෝම්ස් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ.
- ජාතික ලොතරැයි මණ්ඩලයේ වැඩබලන සභාපති.

වෙනත් පත්වීම්:

විධායක නොවන සභාපති ලෙස
- හොටෙල්ස් කලම්බු (1963) සමාගමෙහි (2024 මාර්තු 13 දක්වා)
- සී/ස ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගමෙහි (2024 මාර්තු 13 දක්වා)
- ලංකා බැංකුව (යූ.කේ.) සමාගමෙහි (2024 මාර්තු 13 දක්වා)
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව.



කාවන් රත්නායක මහතා

නව සභාපති

(ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ)

පත් වීම් ලද දිනය:
2024 මාර්තු 14

නිපුණතා හා පළපුරුද්ද

- රිවසයිඩ් කැම්පස් කැලිෆෝනියා විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (භෞතික විද්‍යාව) උපාධියක් ලබා ඇත.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) ක්ෂේත්‍රයේ පුරා දශක තුනකට වැඩි පළපුරුද්දක් ඇත.
- විදුලි සංදේශ, සංචාරක, බැංකු සහ මාධ්‍ය ඇතුළු විවිධ අංශ හරහා නායකත්ව තනතුරු වලින් ලබා ගත් අත්දැකීම් සම්භාරයකින් යුක්තය.
- සේවාලාභී සබඳතා කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, හවුල්කාර කළමනාකරණය, සාමාන්‍ය කළමනාකරණය, නායකත්ව සහ රාජ්‍ය සබඳතා පිළිබඳ විශේෂඥතාව සතුය.

කලින් දැරූ තනතුරු

- ජාතික සංවර්ධන බැංකුවේ සභාපති (NDB).
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති
- සී/ස ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ.
- ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස්හි (DBN) හි ප්‍රධාන විධායක නිලධාරී
- ඩයලොග් ආසියාටා පී එල් සී සමූහයෙහි ප්‍රධාන ආයතනික නිලධාරී.
- ලංකා වාණිජ මණ්ඩලයේ කමිටු සාමාජික.
- සීමාසහිත ඇගිලිටි ඉනෝවේෂන් සමාගමේ හි අධ්‍යක්ෂ.
- අයිබීඑම් වර්ල්ඩ් ට්‍රේඩ් කොපරේෂන් හි මෙරට මහා කළමනාකරු.

වෙනත් පත්වීම්:

- සීමාසහිත කේබීවිස්වල් ඉන්ෆෝමේෂන් ටෙක්නෝලොජීස් සමාගමේ හි විධායක නොවන අධ්‍යක්ෂ.
- සීමාසහිත කෝඩින් ලෙජන්ඩ්ස් (පුද්ගලික) සමාගමේ හි විධායක නොවන අධ්‍යක්ෂ.
- සීමාසහිත ටෙරා ටෙක් (පුද්ගලික) සමාගමේ හි විධායක නොවන අධ්‍යක්ෂ.
- ජයම් විජේරත්නම් ට්‍රස්ට්හි භාරකරු.
- ඩයලොග් පදනමේ භාරකරු.



ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා

ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ

පත්වීම් ලද දිනය:
2020 අප්‍රේල් 28 සහ 2023 අප්‍රේල් 29 නැවත පත් කරන ලදී.

නිපුණතා හා පළපුරුද්ද

- වසර 26 කට වඩා පළපුරුද්ද සහිත ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.
- ද්වි පාර්ශ්වික සාකච්ඡා, සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමඟ සම්බන්ධීකරණය ඇතුළුව සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශීය අරමුදල් වීකරාශී කිරීම සම්බන්ධ බහු පාර්ශ්වික සංවර්ධන බැංකුකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් සහිතය.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හා නෝර්වේහි කෘෂිකාර්මික විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය පිළිබඳ විද්‍යාපති උපාධියක් හිමිකර ගෙන ඇත.

කලින් දැරූ තනතුරු

- ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති.
- ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සාමාජික.
- චීන මහජන සමූහාණ්ඩුවේ බීජිං හි ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) විකල්ප විධායක අධ්‍යක්ෂ.
- මහජන බැංකුවේ අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ.
- සී/ස මූල්‍ය අධ්‍යයන ඇකඩමි (ගැරන්ටි) ලිමිටඩ්හි අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ.
- කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලයේ සාමාජික.
- ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) අධ්‍යක්ෂ.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ.
- ජාතික පදනමේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශයේ උපදේශක මණ්ඩලයේ සාමාජික.
- ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ සාමාජික.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජික.
- දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ විධායක සභාපති.

වෙනත් පත්වීම්:

- මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.
- ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විධායක නොවන සාමාජික.
- කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (පෞද්ගලික) සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ.
- කාම්බෝජය, ඉන්දුනීසියාව, ලාඕසය (PDR), ශ්‍රී ලංකාව සහ ටිමෝ-ලෙස්ටේ නියෝජනය කරමින් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ විධායක නොවන අධ්‍යක්ෂ.



මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.සේ.වි.

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් ලද දිනය:
2021 ජනවාරි 08
2024 ජනවාරි 07 අධ්‍යක්ෂධුරයෙන් ඉවත් විය.

නිපුණතා හා පළපුරුද්ද

- රාජ්‍ය අංශයේ නායකත්ව තනතුරු දරා ලද රාජ්‍ය සේවා පිළිවෙත් හා රෙගුලාසි පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇත.
- ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ හා බංගලාදේශයේ ආරක්ෂක සේවා අණ දීම් හා නිලධාරී විද්‍යාලයේ උපාධිධාරියෙකි.
- රණ වික්‍රම පදක්කම, විශිෂ්ට සේවා විභූෂණ, උත්තම සේවා පදක්කම ඇතුළු විශේෂිත ඇගැයීම් දිනාගෙන ඇත.

කලින් දැරූ තනතුරු

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී තනතුර (යුධ හමුදාවේ 2 වැනි අණදෙන නිලධාරී) ඇතුළු ප්‍රධාන අණදීම් හා මාණ්ඩලික තනතුරු රැසක් සමගින් වසර 35 ක කීර්තිමත් යුධ හමුදා පළපුරුද්ද.
- ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මේජර් ජෙනරාල් තනතුර.
- ඒකාබද්ධ මෙහෙයුම් ආඥා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකායේ රෙජිමේන්තු අණ දෙන නිලධාරී.
- යාපනය ආරක්ෂක සේවා මූලස්ථානයේ අණදෙන නිලධාරී.
- අතිගරු ජනාධිපතිතුමාගේ හමුදා ආරක්ෂක සම්බන්ධීකාරක.
- යුද්ධයට පසු උතුරු පළාතේ අභ්‍යන්තරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම සඳහා බලය ලත් නිලධාරී.
- උතුරු පළාතේ ආණ්ඩුකාර ධුරය.

වෙනත් පත්වීම්:

- ශ්‍රී ලංකා ගුවන් තොටුපොල හා ගුවන් සේවා (පුද්ගලික) සමාගමේ විධායක නොවන සභාපති (2023 දෙසැම්බර් 12 දක්වා).

අධ්‍යක්ෂ මණ්ඩලය



මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය:
2023 මාර්තු 31

නිපුණතා හා පළපුරුද්ද

- ශ්‍රී ලංකාවේ, ජපානයේ, ෆින්ලන්තයේ සහ එක්සත් ජනපදයේ වසර 25 කට වැඩි අධ්‍යාපනික සේවයක් සහිත ඉහළ පළපුරුදු ඉංජිනේරුවරයෙකි.
- රජයේ ප්‍රධාන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, උපදේශක ආයතන සහ කමිටු සමඟ ජාතික මට්ටමේ භූමිකාවන් කිහිපයකට සම්බන්ධ වී ඇත.
- ටෝකියෝ විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු උපාධියක් ද එම විශ්වවිද්‍යාලයේම විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් ද ලබා ඇත.
- ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) අධිසාමාජිකත්වය සහිත වරලත් ඉංජිනේරුවරයකු වේ.
- ඇමරිකා එක්සත් ජනපදයේ, විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ (IEEE) ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වේ.

කලින් දැරූ තනතුරු

- ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු ළමා යෞවන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.
- සභාපති, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL).
- සභාපති, ඉංජිනේරු සේවා මණ්ඩලය.
- ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ (NSCC) සාමාජික.
- රුහුණු විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ වැඩබලන පීඨාධිපති.
- පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT).
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සහ පරිගණක මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශ ප්‍රධානී.
- මිලෝදා මූල්‍ය අධ්‍යන අංශයේ අධ්‍යක්ෂ.
- ටෝකියෝ විශ්වවිද්‍යාලයේ, වොෂින්ටන් විශ්වවිද්‍යාලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ සාමාජික.
- ටෝකියෝ විශ්වවිද්‍යාලයේ, ඕවිල් විශ්වවිද්‍යාලයේ සහ මෙයිජෝ විශ්වවිද්‍යාලයේ ආරාධිත පීඨ සාමාජික.

වෙනත් පත්වීම්:

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය.
- ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ටෙලිකොම්.



නරේෂ් අබේසේකර මහතා

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය:
2023 මැයි 04

නිපුණතා හා පළපුරුද්ද

- යුරෝපයේ සහ ආසියාවේ ගල්ෆ් සහයෝගිතා කවුන්සිලයේ (GCC), ගනුදෙනු උපදේශක, ණය සහ පුද්ගලික කොටස් ව්‍යුහගත කිරීම සහ අරමුදල් සැපයීම පිළිබඳ විශේෂඥතාවය සතුය.
- ඇමරිකානු ඩොලර් මිලියන 100 ට වැඩි ආයතනයන්හි ප්‍රධාන මූල්‍ය නිලධාරීන් අතරින් ලාබාලතම නිලධාරියා ලෙස නම් ලබා ඇත.
- ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට කරන ලද දායකත්වය වෙනුවෙන් මෘදුකාංග සේවා සමාගම් හි ශ්‍රී ලංකා සංගමය (SLASSCOM) විසින් පිරිනමන කර්මාන්ත නායකත්ව සම්මානය ලබා ඇත.
- කොළඹ කොටස් හුවමාරු ජංගම යෙදුම සහ ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළඳපළ ඩිජිටල්කරණය කිරීම සඳහා ප්‍රධානත්වය දැරීම.
- අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ සම-ආරම්භක වීම.
- මැලේසියාවේ ISDB හි ජාත්‍යන්තර බදුකරණය සහ ජාත්‍යන්තර බදු උපායමාර්ග පිළිබඳ පුහුණුව ලබා ඇත.
- ජපානයේ ටොයෝටා නිෂ්පාදන කම්හලේ ලීන් (LEAN) සංකල්පය පිළිබඳ පුහුණුව ලබා ඇත.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධිසාමාජිකයෙකු සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (එක්සත් රාජධානියේ) සාමාජිකයෙකි.
- කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ලබා ඇත.

කලින් දැරූ තනතුරු

- ලන්ඩන් කොටස් හුවමාරු සමූහයේ වෙළඳපළ සේවා සහ තාක්ෂණය සඳහා ගෝලීය ප්‍රධාන මූල්‍ය නිලධාරී.
- ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) සාමාජික.
- කොළඹ කොටස් වෙළඳපළ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ඩිජිටල්කරණය පිළිබඳ ඒකාබද්ධ කමිටුවේ සභාපති.

වෙනත් පත්වීම්:

- ප්‍රධාන විධායක නිලධාරී/ ක්‍රියාකාරී අධ්‍යක්ෂ SECQUORO.
- විධායක නොවන අධ්‍යක්ෂ - ෆුට්වෙයාර් රිටේලර්ස් (පුද්ගලික) සමාගම.
- විධායක නොවන අධ්‍යක්ෂ - සොෆ්ට්ලොජික් කැපිටල් පී එල් සී.



ජෙහාන් ස්මයිල් මහතා

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය:
2024 පෙබරවාරි 07

නිපුණතා හා පළපුරුද්ද

- ප්‍රධාන වශයෙන් ආසියාවේ බටහිර අර්ධ ගෝලයේ සහ මැදපෙරදිග රටවල වාණිජ හා ආයෝජන බැංකුකරණය පිළිබඳ දශක හතරකට වැඩි පළපුරුද්දක් ඇත.
- ප්‍රධාන පද්ධතිය ආශ්‍රිත ව්‍යාපෘති සම්බන්ධීකරණය කර ඇති අතර ආයෝජන බැංකු ආශ්‍රිත සියළු ආධාරක ක්‍රියාකාරකම් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරා ඇත.
- බැංකුකරණය සහ වෙළඳ මූල්‍ය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුව පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙක් වශයෙන් කටයුතු කොට ඇත (ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය).
- වසර 02 කට වැඩි කාලයක් පුරා විධායක ශ්‍රේණි නිලධාරීන් පුහුණු කිරීමෙන් ලද අත්දැකීම් වලින් පිරිපුන් ය.
- ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (රසායන විද්‍යාව) ගෞරව උපාධියක් ලබා ඇත.
- එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ අධිසාමාජිකයෙකි.
- INSEAD සහ Cranfield හි බාහිර කළමනාකරණ සහ නායකත්ව සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

කලින් දැරූ තනතුරු

- සී/ස එම් පවර් කැපිටල් හි අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී.
- ෆස්ට් කැපිටල් හෝල්ඩිංග්ස් පීවිල්සී හි අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී.
- HSBC කොලොම්බියා සහ HSBC සවුදි අරාබිය හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී.
- SABB සෙක්‍යුරිටිස් හි ප්‍රධාන විධායක නිලධාරී (HSBC සමූහය, සවුදි අරාබිය).
- ජ්‍යේෂ්ඨ උප සභාපති ආයතනික බැංකු HSBC ඉන්දුනීසියාව සහ ගෝලීය සබඳතා කළමනාකරු ආයතනික බැංකු HSBC හොංකොං.

වෙනත් පත්වීම්:

- ස්වාධීන නොවන විධායක සභාපති, සී/ස එම් පවර් කැපිටල්.
- ස්වාධීන නොවන විධායක නොවන සභාපති සී/ස එම් පවර් කැපිටල් සිකියුරිටිස්.
- ස්වාධීන නොවන විධායක අධ්‍යක්ෂ, සී/ස කොමන් වෙල් (පුද්ගලික) සමාගම.
- ස්වාධීන නොවන විධායක අධ්‍යක්ෂ, සී/ස කපිටාන් (පුද්ගලික) සමාගම.
- ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ, ලිට්ල් ජිම් ලංකා (පුද්ගලික) සමාගම.



ජයමින් පැල්පොල මහතා

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය:
2024 පෙබරවාරි 22

කුසලතා හා අත්දැකීම්:

- ආයෝජන බැංකුකරණය, වත්කම් කළමනාකරණය සහ ඩිජිටල් මූල්‍යකරණය පිළිබඳ වසර 15 ක ජාත්‍යන්තර පළපුරුද්ද.
- ඇමරිකානු ඩොලර් බිලියන 20 ඉක්මවන ජාත්‍යන්තර ආයෝජන ව්‍යුහගත කර ඇත.
- ජ්‍යේෂ්ඨ උපදේශකයෙකු ලෙස, බැංකු අංශයේ ප්‍රතිසංස්කරණ පිළිබඳව එක්සත් ජනපද බැංකුවලට සහ ජාත්‍යන්තර මහ බැංකුවලට උපදෙස් ලබා දී ඇති අතර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තීරණ, ප්‍රාග්ධනීකරණය සහ බැංකුකරණයේ ඩිජිටල් නවෝත්පාදන යෙදීම පිළිබඳව බෑන්ක් ඔෆ් ඇමෙරිකා, සිංගප්පූරු සංවර්ධන බැංකුව, වෙල්ස් ෆාගෝ සහ ඩොයිෂ් බැංකු හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් දීම ද ඇතුළත් වේ.
- මූල්‍ය තාක්ෂණ (FinTech) අංශයේ ආයෝජකයකු සහ ව්‍යවසායකයෙකු ලෙස අත්දැකීම් බහුලය.
- හාවඩ් විශ්වවිද්‍යාලයෙන් (කේම්බ්‍රිජ්, මැසචුසෙට්ස්) ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ලබා ඇත.
- වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනය (ඇමෙරිකාව) සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (එංගලන්තය) යන ආයතන වල සාමාජිකත්වය ලබා ගෙන ඇත. එවකට ලෝකයේ ලාබාලතම වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරයා බවට පත් විය.
- වරලත් අලෙවිකරණය ආයතනය (එංගලන්තය) වෙතින් අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත.

කලින් දැරූ තනතුරු

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) අධ්‍යක්ෂ සහ විගණන කමිටුවේ සභාපති.
- මනිවර්ක්ස් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගමේ නිර්මාතෘ.
- ගෝල්ඩ්මෑන් සැක්ස් හි ආයෝජන කළමනාකරු සහ දේපළ අලෙවිකරු.
- නොමුරාහි ජ්‍යේෂ්ඨ උපදේශක.

වෙනත් පත්වීම්:

- ඔන්ටෙරා සමූහයේ විධායක නොවන අධ්‍යක්ෂ.
- ජයරු ටී.පී. හි විධායක නොවන අධ්‍යක්ෂ.



ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විස්තර, පිටු අංක 34 හි දැක්වේ.

ආයතනික කළමනාකාරීත්වය



වමේ සිට දකුණට අසුන් ගෙන

ඩබ්ලිව් බී පී රත්නායක මහත්මිය, ඩී එස් මුතුකුඩආරච්චි මහතා

වමේ සිට දකුණට සිට ගෙන

එම් ආර් එන් රෝහණ කුමාර මහතා, වයි ඒ ජයතිලක මහතා, පී පී එම් විජේසේකර මහත්මිය, සමීර ඩී ලියනගේ මහතා, එච් ප්‍රියාල් සිල්වා මහතා, එම් පී රුවන් කුමාර මහතා, ඒ ආර් එෆ් ජෝන් පුල්ලේ මහතා, පී ඒ ජයශාන්ත මහතා



වමේ සිට දකුණට අසුන් ගෙන

ඩබ්ලිව් පී රසල් ෆොන්සේකා මහතා, ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

වමේ සිට දකුණට සිට ගෙන

නිලන්ත මෙනේරිපිටියගේ මහතා, ආර් එම් එන් ජීවන්ත මහතා, පී මදුවන්ත ලියනගේ මහතා, එස් සිවන්ජන් මහතා, කේ ඒ ඩී විජයවර්ධන මහතා, බී කේ ගුරුසිංහ මහතා, කේ ඒ අජිත් කරුණාරත්න මහතා, රොෂෙල් ප්‍රනාන්දු මහත්මිය, බුද්ධික සීලනාථ මහතා

ආයතනික කළමනාකාරීත්වය



ඩබ්ලිව් පී රසල් ෆොන්සේකා මහතා
මහා කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරී

2023 ජනවාරි මාසයේ දී මහා කළමනාකරු ලෙස පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය, සිල්ලර බැංකුකරණය, ජාත්‍යන්තර, භාණ්ඩාගාර සහ ආයෝජන බැංකුකරණය පිළිබඳ බැංකු සේවාවේ වසර 33 කට වැඩි විශේෂඥ පළපුරුද්දක් ඇත. මහා කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්වීමට පෙර, ඔහු බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස කටයුතු කරමින්, මූල්‍ය හා බැංකු විනය පිළිබඳ ඔහුගේ ප්‍රවීණත්වය මත බැංකුවේ උපායමාර්ගයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම කල්තියාම සකස් කරමින් අවශ්‍ය කටයුතු කළමනාකරණය කළේය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය ද, ඇමෙරිකා එක්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසලේ උසස් කළමනාකරණ වැඩසටහන ද නිමකොට ඇති අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය මෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ජ්‍යේෂ්ඨ අධි සාමාජිකත්වය ද ලබා ඇත.



ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය
ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණී
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2010 ඔක්තෝබර් මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

සමාගම් ලේකම් සහ ආයතනික යහපාලනය පිළිබඳ බැංකුවේ වසර 27 කට වැඩි පළපුරුද්දක් ඇත.

නීතිවේදී උපාධියක් සහිත වෘත්තියෙන් නීතීඥවරියකි.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනපති උපාධිය විශිෂ්ට සාමාර්ථයක් සහිතව හිමිකරගෙන ඇත.



ඩී එස් මුතුකුඩාරච්චි මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම් - ආයතනික)

2020 පෙබරවාරි මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

බැංකු මෙහෙයුම් හා සබැඳි විවිධ වූ අංශ පිළිබඳ වසර 33 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ණය කළමනාකරණය, ණය අවදානම් සහ විදේශීය ශාඛා මෙහෙයුම් පිළිබඳ විශේෂිතව, ශාඛා සහ ආයතනික බැංකුකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් සහිත වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දේපළ කළමනාකරණය සහ තක්සේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ගෙන ඇත.



වයි ඒ ජයතිලක මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන)

2020 පෙබරවාරි මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා මෙහෙයුම්, භාණ්ඩාගාර සහ විදේශීය මෙහෙයුම්, ව්‍යාපෘති කළමනාකරණය, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය, නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය, ණය මෙහෙයුම් සහ අයකරගැනීම් ආදී විවිධ වූ භූමිකාවන්හි වසර 26 කට වැඩි පළපුරුද්දක් ඇත.

ලංකා බැංකුව (යූ.කේ) සමාගමේ මූලික බැංකු පද්ධතිය සහ වෙළඳ මූල්‍ය පද්ධති වැනි බැංකුවේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මූලික බැංකුකරණ සහ ටෙලර් පද්ධතිය වැඩිදියුණු කිරීම, ලේඛන කළමනාකරණ පද්ධතිය, කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණ පද්ධතිය සහ ගනුදෙනුකරුවන් වෙත පිරිනැමෙන ඩිජිටල් සේවාවන් කිහිපයක් ද බැංකුවේ ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වී ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියකු වන අතර කැළණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර මූල්‍යනය පිළිබඳ පශ්චාත් උපාධියද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ උසස් පාඨමාලාව ද ලබාගෙන ඇත.



එච් ප්‍රියාල් සිල්වා මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා මෙහෙයුම්)

2020 පෙබරවාරි මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

මූල්‍ය, ආයතනික, ශාඛා හා සංවර්ධන බැංකුකරණය, ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර මෙහෙයුම්, විකුණුම් සහ අලෙවිකරණය ඇතුළු ශාඛා මෙහෙයුම් පිළිබඳ විශේෂිත වූ බැංකුකරණයේ විවිධ අංශවල වසර 26 කට වැඩි පළපුරුද්දක් ඇත.

රුහුණු විශ්වවිද්‍යාලයේ අලෙවිකරණය පිළිබඳව විශේෂිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියද, කැළණිය විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති උපාධියද, එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ වෘත්තීය අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද සහිතව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සාමාජිකත්වය ද උසුලයි.



ජී ඒ ජයශාන්ත මහතා

(ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය)

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා බැංකුකරණය සහ මෙහෙයුම්, ශාඛා ණය, භාණ්ඩාගාර මෙහෙයුම්, වත්කම් සහ වගකීම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, ආපසු අයකර ගැනීම් සහ ආයතනික හා අක්වෙරළ මෙහෙයුම් වැනි බැංකුවේ විවිධ අංශවල වසර 26 කට වඩා වැඩි විශේෂිත අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පළමු පන්තියේ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියෙකු වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ණය කළමනාකරණය සම්බන්ධව ඩිප්ලෝමාවක් ද ලබා ගෙන ඇති අතර එහි ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.



ඩබ්ලිව් බී පී රත්නායක මහත්මිය

නියෝජ්‍ය මහා කළමනාකාරිණී (අනුකූලතා)

2020 සැප්තැම්බර් මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

සිය වෘත්තිය කාල පරාසය තුළ දේශීය හා විදේශීය වාණිජ බැංකුකරණයේ සියලු අංශවල වසර 26 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ආයතනික හා ශාඛා ණය පිළිබඳ පළපුරුද්ද මෙන්ම අවදානම් කළමනාකරණය, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ බැංකුව සඳහා අවදානම් කළමනාකරණ ක්‍රමවේද සංවර්ධනය කිරීමෙහි ලා ප්‍රවීණයෙකු වේ.

රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරිනියක ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිධාරිනියක ද වන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් විධායක උපාධි ඩිප්ලෝමාවද එක්සත් රාජධානියේ ජාත්‍යන්තර අනුකූලතා සංගමයේ යහපාලනය, අවදානම් සහ අනුකූලතා පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමාධාරිනියක මෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් ද වේ.



ආර් එම් එන් ජීවන්ත මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු

(ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන)

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

භාණ්ඩාගාර කළමනාකරණය, ආයෝජන බැංකුකරණය, මූල්‍ය කළමනාකරණය, ණය කළමනාකරණය සහ ශාඛා බැංකුකරණය වැනි ක්ෂේත්‍රවල වසර 21 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනයේ ව්‍යාපාර පරිපාලනපති උපාධියද ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධි සාමාජිකත්වය ද හොබවයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බාහිර කථිකාචාර්ය වරයෙකු වශයෙන් ද කටයුතු කරයි.



එම් පී රුවන් කුමාර මහතා

ප්‍රධාන මූල්‍ය නිලධාරී

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

මූල්‍ය කළමනාකරණය, උපායමාර්ගික සැලසුම්කරණය, ආයෝජන බැංකුකරණය, වාණිජ බැංකුකරණය සහ විදේශීය බැංකු කටයුතු පිළිබඳ වසර 21 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පොදුරාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනපති උපාධිය ද හිමි ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරණ අතර ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු ද වේ. තවද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය ද උසුලයි.



එස් සිවන්ජන් මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු

(ශාඛා ණය මෙහෙයුම් කලාප 1)

2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා බැංකු මෙහෙයුම්, ණය අයකර ගැනීම්, සංවර්ධන බැංකු කටයුතු, ක්ෂුද්‍ර මූල්‍ය සහ ජාත්‍යන්තර හා විදේශීය මෙහෙයුම් සම්බන්ධව වසර 21 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

යාපනය විශ්වවිද්‍යාලයේ පළමු පන්තියේ (ගෞරව) විද්‍යාවේදී උපාධියක් හිමි වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති උපාධියක් ද හිමිය.



බී කේ ගුරුසිංහ මහතා

ප්‍රධාන නීති නිලධාරී

2020 සැප්තැම්බර් මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

බැංකු වෘත්තිකයෙකු ලෙස ආයතනික බැංකු කටයුතු, ශාඛා බැංකු කටයුතු සහ ආයතනික පරිවර්තනමය ව්‍යාපෘති පිළිබඳ වසර 26 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතීඥයෙකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද,

ආයතනික කළමනාකාරීත්වය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පොදුරාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනපති උපාධිය ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු ද වන අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය හා ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමයේ සාමාජිකත්වය දරනු ලබයි.



එම් ආර් එන් රෝහණ කුමාර මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන)

2021 ජනවාරි මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන, අයකර ගැනීම්, ශාඛා ණය සහ ව්‍යාපෘති මූල්‍යකරණය සම්බන්ධයෙන් විධායක නායකත්ව භූමිකාවන් ඇතුළුව බැංකුවේ වසර 21 කට වැඩි පළපුරුද්දක් ඇත.

ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ මහ ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

කැළණිය විශ්වවිද්‍යාලයෙන් ගණිතය පිළිබඳ විද්‍යාවේදී පළමු පන්තියේ උපාධිය, ඇමරිකා එක්සත් ජනපදයේ උතුරු ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ නායකත්වය පිළිබඳ ඩිප්ලෝමාව සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයද දරයි.



ඒ ආර් එග් ජෝන් පුල්ලේ මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(මූල්‍ය හා සැලසුම්)

2021 ජූලි මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

භාණ්ඩාගාර කළමනාකරණය, ශාඛා බැංකුකරණය, අවදානම් කළමනාකරණය සහ විදේශීය බැංකු මෙහෙයුම් පිළිබඳ විශේෂඥතාව ඇති වාණිජ බැංකුකරණයේ සෑම අංශයකම වසර 32 කට වැඩි පළපුරුද්දක් ඇත. චෙන්නායි හි ලංකා බැංකුවේ භාණ්ඩාගාර අංශයේ ප්‍රධානියා ලෙස ද ලන්ඩනයේ ලංකා බැංකුව (යූ.කේ) සමාගමේ හි ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස ද සේවය කර ඇත.

ඉතාලියේ "Universita' Pontificia Salesiana" වෙතින් දර්ශනවේදය පිළිබඳ දර්ශනවේදී පළමු පන්තියේ උපාධිය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය උසුලනු ලැබේ.



නිලන්ත මෙනේරිපිටියගේ මහතා
ප්‍රධාන අවදානම් නිලධාරී

2021 ජූලි මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ආයතනික බැංකුකරණය, ශාඛා මෙහෙයුම් සහ සංවර්ධන බැංකුකරණය, ශාඛා බැංකුකරණය සුළු හා මධ්‍ය පරිමාණ ණයදීම්, අවදානම් කළමනාකරණය, ණය කාඩ්පත් මෙහෙයුම්, භාණ්ඩාගාර මෙහෙයුම්, ව්‍යවෘති කළමනාකරණය, පාරිසරික, සමාජීය සහ යහපාලනය, තොරතුරු තාක්ෂණය සහ මාලදිවයිනේ ශාඛා මෙහෙයුම් වැනි ක්ෂේත්‍රවල දේශීය සහ විදේශීය මෙහෙයුම් පිළිබඳ වසර 31 කට වැඩි පළපුරුද්දක් ඇති වෘත්තීය බැංකුකරුවෙකු වේ.

ඔහු ප්‍රධාන විධායක නිලධාරී/ විධායක අධ්‍යක්ෂ ලෙස ලංකා බැංකුව (යූ.කේ.) සමාගම සඳහා නායකත්වය ලබා දී ඇති අතර එක්සත් රාජධානියේ නියාමන රාමුව යටතේ සමාගමේ වගකීම් ඉටු කිරීමේ වගකීම දරණ ලදී. බැංකුවේ උපායමාර්ග සැකසීමට සහ ක්‍රියාත්මක කිරීමට නායකත්වය දුන් අතර තිරසාර සහ ශක්තිමත් ව්‍යාපාර ආකෘතියක් සඳහා ශක්තිමත් පදනමක් තබමින් නව මූලික බැංකු විසඳුමක් සහ වෙනත් විවිධ උපකාරක යෙදුම් පද්ධති ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගෙන ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (කළමනාකරණ) ගෞරව (විශේෂ) උපාධිය සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හිමි ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරයි.

මොරටුව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන අංශයට, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයට සහ අපනයන සංවර්ධන මණ්ඩලයට අනුබද්ධව බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කර ඇත.



කේ ඒ ඩී විජයවර්ධන මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(මානව සම්පත්)

2021 ඔක්තෝබර් මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා බැංකුකරණය, ණය සහ සිල්ලර බැංකුකරණය ආදී ක්ෂේත්‍ර වල බැංකුවේ වසර 21 කට වඩා වැඩි පළපුරුද්දක් හා මානව සම්පත් මෙහෙයුම් අංශවල ආයතනික සහ විධායක නායකත්ව තනතුරු හොබවා ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (සාමාන්‍ය) දෙවන පන්තියේ (ඉහළ අංශය) ගෞරව උපාධිය ද, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.



කේ ඒ අජිත් කරුණාරත්න මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම් - පළාත්)

2021 අගෝස්තු මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා බැංකුකරණය, වෙළඳ මූල්‍ය, ආයතනික සහ ප්‍රිමියර් බැංකු මෙහෙයුම් යන ක්ෂේත්‍රවලට විශේෂිතව බැංකුවේ වසර 21 කට වැඩි පළපුරුද්දක් සහිත වේ.

ශාඛා බැංකුකරණයේ විවිධ වූ පැතිකඩයන් හි අත්දැකීම් සහ ව්‍යාපාර ප්‍රවර්ධනය, පරිපාලනය සහ මානව සම්පත් සඳහා වගකීම් සහිතව පළාත් කිහිපයක විධායක නායකයෙකු ලෙස අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය ද,

ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද ලබා ඇත.



පී පී එම් විජේසේකර මහත්මිය

නියෝජ්‍ය මහා කළමනාකාරණී (උපකාරක සේවා)

2023 මාර්තු මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා බැංකුකරණය, ආයතනික ණය, ආපසු අයකර ගැනීම්, අක්වෙරළ බැංකුකරණය, පරිපාලන සේවා, අලෙවිකරණය, විදේශීය ශාඛා සහ ණය විගණන මෙහෙයුම් සඳහා විශේෂිත වූ බැංකුකරණයේ විවිධ ක්ෂේත්‍රවල වසර 32 කට වැඩි පළපුරුද්දක් ඇත.

ඇය ලංකා බැංකුව (යූ.කේ.) සමාගමේ සේවා කාලය තුළ ජාත්‍යන්තර බැංකුකරණය පිළිබඳ පළපුරුද්ද ලබා ගන්නා ලදී.

ලන්ඩනයේ මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය විශිෂ්ට සාමාර්ථයක් සහිතවද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව ද හිමිකර ගෙන ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය උසුලයි.



රොෂෙල් ප්‍රනාන්දු මහත්මිය

නියෝජ්‍ය මහා කළමනාකාරණී (සංවර්ධන බැංකුකරණ, ශාඛා ණය මෙහෙයුම් - කලාප 2)

2023 මාර්තු මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා බැංකුකරණය, ආයතනික බැංකුකරණය සහ වෙළෙඳ මූල්‍ය විශේෂයෙන් අක්වෙරළ බැංකු අංශයේ ආනයන අංශයට අදාළ සියලුම කාර්යයන් ආවරණය කරමින් වසර 26 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය හිමි අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් මෙහෙයවනු ලබන ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා කළමනාකරණ සංවර්ධන වැඩසටහන සඳහා සහභාගී වී ඇත. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක සහ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකාවකි.

2018 සිට 2022 දෙසැම්බර් දක්වා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජාත්‍යන්තර වෙළඳාමට අදාළ බැංකු ක්‍රියා පටිපාටි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව/ ඉහළ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සම්පත් දායිකාවක ලෙස සම්බන්ධ වී ඇත. බැංකුකරුවන්ගේ වෙළෙඳ මූල්‍ය සංගමයේ සභාපති ලෙස ද කටයුතු කරයි.



පී මදුවන්ත ලියනගේ මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක

2014 දෙසැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

මූල්‍ය වෘත්තිකයෙකු ලෙස බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 24 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ලංකා බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත් වීමට පූර්ව ඔහු සී/ස කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී සහ පෑන් ඒෂියා බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කර ඇත. ලියනගේ මහතා 2006 සිට 2008 කාලපරිච්ඡේදයේ දී ලංකා බැංකුවේ අභ්‍යන්තර විගණක ලෙස ද කටයුතු කර ඇත. සී/ස ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගමේ මූල්‍ය හා පරිපාලන කළමනාකරු ලෙසත්, අර්න්ස්ට් ඇන්ඩ් යංග් ආයතනයේ සුදුසුකම් ලත් වෘත්තීය ගණකාධිකාරිවරයෙකු ලෙසත් ලත් අත්දැකීම් ඔහුගේ පළපුරුද්දට ඇතුලත් වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ තොරතුරු පද්ධති විගණන සංගමයෙහි (ISACA) සහතිකලත් තොරතුරු පද්ධති විගණකවරුන්ගේ සංගමයේ (CISA) සාමාජිකත්වය ද දරනු ලැබේ.



සමීර ඩී ලියනගේ මහතා

ප්‍රධාන අලෙවිකරණ නිලධාරී

2020 අගෝස්තු මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

බැංකුකරණය සහ අලෙවිකරණය පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල වසර 25 කට වඩා වැඩි වෘත්තීය විශේෂඥතාවයකින් යුක්තය.

2015 වර්ෂයේ දී චික්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන වරලත් අලෙවිකරු සම්මානයෙන් පිදුම් ලැබීය.

චික්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයෙන් පශ්චාත් උපාධි අලෙවිකරණ ඩිප්ලෝමාව ලද ඔහු චික්සත් රාජධානියේ අලෙවිකරණ ආයතනය, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය යන ආයතන වල සාමාජිකත්වය දරනු ලබයි.



බුද්ධික සීලනාථ මහතා

ප්‍රධාන තොරතුරු නිලධාරී

2023 සැප්තැම්බර් මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය.

නිපුණතා සහ පළපුරුද්ද

රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ආයතන හරහා වසර 25 කට වැඩි බැංකු සහ තොරතුරු තාක්ෂණ පළපුරුද්දක් ඇත. ආයතන තුළ, ආදායම ඉහළ නැංවීම සහ ගනුදෙනුකාර අත්දැකීම් ඉහළ නැංවීම මගින් සමස්ත අගය ඉහළ නැංවීම අරමුණු කරගත් ඩිජිටල් පරිවර්තන උපායමාර්ග මෙහෙයවීම සහ ක්‍රියාත්මක කිරීමෙහිලා සාර්ථකත්වය ලබා ඇත. යෙදුම් සංවර්ධනය, දත්ත ගබඩා කිරීම සහ දත්ත විශ්ලේෂණ ඇතුළු ප්‍රධාන විෂයන් හි ප්‍රවීණතාවය ලබා ඇත.

අයර්ලන්තයේ ඩබ්ලින් හි ජාතික විශ්වවිද්‍යාලයේ, කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය හිමිය.

විධායක කළමනාකාරීත්වය



ඒ එම් ආර් ඩී සුබසිංහ මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ආපසු අයකර ගැනීම් - පළාත්)

ටී පෙරේරා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(පුහුණු හා සංවර්ධන)

කේ ජී සී දිපාල් මහතා
සහකාර මහා කළමනාකරු
(තොරතුරු පද්ධති විගණන)

පේ ඥානසම්බන්ධන් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය)



ආර් එම් එම් විරසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ශාඛා ණය - කලාප I)

කේ ජී මල්ලිකා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(විමර්ශන)

අයි එස් එන් පෙරේරා මහතා
සහකාර මහා කළමනාකරු
(ආයතනික සබඳතා)

එස් ජී සී කේ ප්‍රනාන්දු මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ආයතනික ණය)



සීනා රුවයිස් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (අයවැය, ක්‍රමෝපායික සැලසුම් හා කළමනාකරණ තොරතුරු පද්ධති)

ජී කේ ජී මහින්ද බණ්ඩාර මහතා
සහකාර මහා කළමනාකරු
(උතුරු මැද පළාත)

ඩබ්ලිව් එම් ඒ වනිගසේකර මහතා
සහකාර මහා කළමනාකරු
(විශ්‍රාම නඩත්තු අංශය)

ජී එම් විතාන ආරච්චි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ශාඛා මෙහෙයුම්)



එච් එම් එම් ඩී හේරත් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(දකුණු පළාත)

එස් එච් එම් එම් පී හේරත් මෙනෙවිය
නේවාසික කළමනාකාරිණී (මාලේ ශාඛාව)

කේ කේ අයි සී කේ කන්නංගර මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී
(ආපසු අයකර ගැනීම් - ආයතනික)

එස් අරුණ කුමාර මහතා
ප්‍රධාන විධායක නිලධාරී
(ලංකා බැංකුව (යූ කේ) සමාගම)



එම් ටී එස් ඒ පෙරේරා මහතා
සහකාර මහා කළමනාකරු (නිමැවුම් සංවර්ධන කටයුතු හා ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ)

එස් පිරපාහරන් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (මධ්‍යම ණය මෙහෙයුම්)

එස් කේ වික්‍රමසිංහ මහතා
සහකාර මහා කළමනාකරු (පිටකොටුව ශාඛාව)

ඩී ඒ එස් එස් විමලසිරි මහතා
සහකාර මහා කළමනාකරු (පාරිභෝගික හා සංවර්ධන බැංකුකරණය)




කේ ජේ යෝගරත්නම් මහත්මිය
නේවාසික කළමනාකාරිණී (චෙන්නායි ශාඛාව)

එන් ඩබ්ලිව් ජේ එස් පී නානායක්කාර මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී (ආපසු අයකර ගැනීම්)

ජේ එම් පී ඩබ්ලිව් තිලකරත්න මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී (ජාත්‍යන්තර කටයුතු, මානව සම්පත් සහ මෙහෙයුම්)

එන් එන් නිශානදි මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී (ණය)



එස් බී ඒ එම් පී එස් අරම්පත් මහතා
සහකාර මහා කළමනාකරු (අක්වෙරළ බැංකුකරණය)

ඩබ්ලිව් එම් එන් ඩී දායාවංස මහතා
සහකාර මහා කළමනාකරු (මධ්‍යගත මෙහෙයුම්)

කේ දීපා කුමාරි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (ණය අවදානම්)

එස් පී කේ ලියනගේ මහතා
සහකාර මහා කළමනාකරු (බස්නාහිර පළාත - උතුර)



ඩී එම් ඒ මාධව මහතා
සහකාර මහා කළමනාකරු (ගිණුම්කරණ හා බදු)

ඩබ්ලිව් කේ එල් බී එන් සමන්ති මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (ශාඛා ණය - කලාප II)

ආර් එම් සමරක්කොඩි මහතා
සහකාර මහා කළමනාකරු (වෙළෙඳපළ අවදානම් සහ මෙහෙයුම් අවදානම්)

වී සිවානන්දන් මහතා
සහකාර මහා කළමනාකරු (උතුරු පළාත)

විධායක කළමනාකාරිත්වය



ඒ ඩබ්ලිව් ආර් තුෂාන්ත මහතා
නේවාසික කළමනාකරු (සීෂේල්ස් ශාඛාව)

එස් ඩබ්ලිව් එම් එස් විජේසිංහ මහතා
සහකාර මහා කළමනාකරු (මධ්‍යම පළාත)

එස් එස් ටී කුළසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (ව්‍යාපෘති මූල්‍යන)

පී චන්ද්‍රදේව මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (තොරතුරු තාක්ෂණ - ආරක්ෂණ සහ අනුකූලතා)



ඩබ්ලිව් ඒ පී එල් විරක්කොඩි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (ණය විගණනය)

එම් ඒ ඩී පී ඩයස් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (මානව සම්පත් මෙහෙයුම්)

එන් ක්‍රිෂ්ණකුමාර් මහතා
සහකාර මහා කළමනාකරු (ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන - ආයතනික)

අයි කේ නවරත්න මහතා
සහකාර මහා කළමනාකරු (ඌව පළාත)




එන් ආර් ඩී එන් පෙරේරා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (මෙට්‍රොපොලිටන් ශාඛාව)

ආර් පී ඩී ආර් ආර් රුවන්පතිරණ මහතා
සහකාර මහා කළමනාකරු (ජාත්‍යන්තර)

අයි යූ කේ ඩී විජේගුණවර්ධන මහතා
සහකාර මහා කළමනාකරු (විද්‍යුත් බැංකුකරණ මධ්‍යස්ථානය)

ඕ පී සී පී බණ්ඩාර මහතා
සහකාර මහා කළමනාකරු (පර්යේෂණ සහ සංවර්ධන)



ඩී කේ ආර් දෙල්ගොඩ මහතා
සහකාර මහා කළමනාකරු (වයඹ පළාත)

එස් කේ ගජනායක මහතා
සහකාර මහා කළමනාකරු (බස්නාහිර පළාත - මධ්‍යම)

බී සී මාටින් මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී (නැගෙනහිර පළාත)

එස් ඒ එන් සී පියුමාල් මහතා
සහකාර මහා කළමනාකරු (ඩිජිටල් බැංකු සේවා ප්‍රවර්ධන)



කේ ඩබ්ලිව් වයි බී ප්‍රේමරත්න මහතා
සහකාර මහා කළමනාකරු
(අලෙවිකරණ)

බී වී සී ජී පී රණසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
(සබරගමුව පළාත)

එස් සබේසන් මහතා
සහකාර මහා කළමනාකරු
(තිරසාර බැංකුකරණය)

එම් ආර් ඒ ශකූර් මහතා
සහකාර මහා කළමනාකරු
(ආයෝජන)



කේ එම් සී එන් කොඩිතුවක්කු මහතා
සහකාර මහා කළමනාකරු - තොරතුරු තාක්ෂණ (මෙහෙයුම් සහ තාක්ෂණ සහාය)

පී ටී ගුණතිලක මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (අනුකූලතා)

යූ එන් හේරත්රන්දෙණි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(රාජ්‍ය ව්‍යවසාය සබඳතා)

ඒ ඒ වයි කේ කේ ජයසූරිය මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී (ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන - පළාත්)



කේ සී මහවත්ත මහතා
සහකාර මහා කළමනාකරු
(පරිපාලන සේවා)

කේ කේ එන් ජේ ප්‍රියදර්ශිකා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(විදේශීය ශාඛා)

ආර් පී එල් අයි රණසිංහ මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ප්‍රසම්පාදන)

කේ කේ සුසන්ත මහතා
සහකාර මහා කළමනාකරු
(වෙළඳ සේවා)



පී ජයතුංග මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(තොරතුරු තාක්ෂණ - යෙදවුම් පද්ධති)

බී ටී එස් පෙරේරා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(තොරතුරු තාක්ෂණ - සැපයුම් හැසිරවීම්)

ලංකා බැංකුව සංකීර්ණ හා ගතික සාර්ව
පරිසරයක් හරහා සිය මෙහෙයුම් කටයුතු
සිදු කරන ලදි. මෙම ගතික සන්දර්භය
භූ-දේශපාලනික සිදුවීම්, නියාමන වෙනස්කම්,
දේශගුණික හා සමාජීය වෙනස් වීම් මෙන්ම
ආර්ථික අවිනිශ්චිතතාවන් ඇතුළු අභ්‍යන්තර
හා බාහිර සාධක වලින් බලපෑමට ලක් වූ අතර
අප වෙත අභියෝග සහ අවස්ථාවන් උත්පාදනය
කරන ලදී.



3

අපගේ උපායමාර්ගික අභිප්‍රාය

සූර්යයා සෞරග්‍රහ මණ්ඩලයේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරන්නාක් මෙන්, මනාව නිර්වචනය කරන ලද උපායමාර්ගයක් බැංකුවේ මෙහෙයුම් සඳහා දිශානතිය සහ ශක්තිය සපයයි.

සූර්යයා උණුසුම සහ ආලෝකය විහිදුවන්නාක් මෙන්, මනාව සකස් කරන ලද උපායමාර්ගයන් මගින් අපගේ පාර්ශ්වකරුවන්ගේ පොදු අරමුණු සාර්ථකත්වය වෙත රැගෙන යාමට අවශ්‍ය අවබෝධය සහ සහජීවනය පෙළගස්වයි.

මෙහෙයුම් සන්දර්භය

ලංකා බැංකුව විසින් කෙටි, මධ්‍ය සහ දිගු කාලීන වටිනාකම් ජනනය කිරීමේ හැකියාව කෙරෙහි බලපාන ප්‍රමාණාත්මක අවදානම් සහ අවස්ථා හඳුනා ගැනීම සඳහා PESTEL විශ්ලේෂණය භාවිතයෙන් මෙහෙයුම් පරිසරය අඛණ්ඩව අධීක්ෂණය කරයි. පහත දැක්වෙන්නේ වසර තුළ බැංකුවේ කාර්යසාධනය සහ උපායමාර්ගය කෙරෙහි බලපෑ තීරණාත්මක සාධකයි.



දේශපාලන සහ ආර්ථික සන්දර්භය

ගෝලීය සන්දර්භය

ගෝලීය ආර්ථිකය තුළ කොවිඩ්-19 මගින් ඇති වූ අහිතකර බලපෑම් ජයගනිමින් ක්‍රමක්‍රමයෙන් නැඟී සිටින තත්ත්වයක් මත, 2023 වසරේදී යලිත් අභියෝගාත්මක ගැටළු රාශියකට මුහුණ දීමට සිදු විය. නැගෙනහිර යුරෝපයේ භූ දේශපාලනික ආතතීන් සහ මැද පෙරදිග වර්ධනයන්ගේ ආධිපත්‍යය නිසා ගෝලීය ආර්ථිකය 2023 දී ප්‍රබල කැළඹීම් වලට මුහුණ දුන්නේය. උද්ධමන අගයන් ඉහළ මට්ටමක පැවතීම නිසා ජීවන වියදම දැඩි ලෙස ඉහළ ගිය අතර මෙම සාධක ලෝක ආර්ථිකයට සෘජු බලපෑමක් ඇති කළේය.

ලෝක ආර්ථික දැක්මට අනුව, 2024 දී ගෝලීය ආර්ථික වර්ධනය 3.1% දක්වා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ආසියාව වේගයෙන්ම වර්ධනය වන කලාපය වනු ඇති අතර 5.4% කින් ප්‍රසාරණය වෙමින් ගෝලීය වර්ධනය ඉදිරියට ගෙන යනු ඇත. ප්‍රධාන ආර්ථිකයන් අතර, චීක්සත් ජනපදය 2023 දී 0.2% ක සුළු පසුබෑමක් ද, චීක්සත් රාජධානියේ 0.5% ක සංකෝචනයක් ද අත්විඳිනු ඇතැයි අපේක්ෂා කරන අතර, යුරෝපයේ 0.4% ක සුළු වර්ධනයක් අපේක්ෂිතය.

ගෝලීය ශීර්ෂ උද්ධමනය 2023 දී 6.8% සිට 2024 දී 5.2% දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. බොහෝ රටවල මිල පීඩනය තවමත් ඉහළ යමින් පවතින අතර මැද පෙරදිග භූ දේශපාලනික ගැටුම් තවදුරටත් උත්සන්න වීම උද්ධමනය ඉහළ යාමේ තර්ජනයක් මතු කරයි.

දේශීය සන්දර්භය

2022 දී අතිශය අභියෝගාත්මක කාල පරිච්ඡේදයකට මුහුණ දීමෙන් පසු, ඵලදායී සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කාලෝචිත ලෙස ක්‍රියාවට නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් ශක්තිමත් සහ ස්ථාවර තත්ත්වයක් ළඟා කරගන්නා සළකුණු පෙන්නුම් කළේය.

2023 පළමු කාර්තුවේදී සංකෝචනයක් දුටු දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පසුව වර්ධනය වූ අතර, මූල්‍ය කොන්දේසි ලිහිල් කිරීම සහ ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ලද උපායමාර්ගික ප්‍රතිපත්ති මගින් දේශීය ආර්ථිකයට තිරසාර වර්ධන මට්ටමක් ළඟා කර ගැනීමේ ශක්‍යතාවයක් හිමිවී ඇත.

2022 දී මතුපිට උද්ධමනය (ගනුදෙනුකාර) 73.7% ක් ලෙස උච්චතම ස්ථානයට පැමිණීමෙන් පසු, සමස්ත ඉල්ලුම අඩුවීම, දේශීය සැපයුම් දාම නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ගෝලීය භාණ්ඩ මිල ගණන් සාමාන්‍යකරණය වීමත් සමඟ ශ්‍රී ලංකාව ක්‍රමානුකූලව මිල අඩුවීමක් අත්විඳිමින් සිටී. දේශීය උද්ධමනය ස්ථාවර කිරීම මගින් මිලදී ගැනීමේ ශක්තිය වැඩිදියුණු කිරීමට සහ ණය ආපසු ගෙවීමේ හැකියාව වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාව දුෂ්කර වසරකින් යථා තත්ත්වයට පත් වන විට, 2023 දී රුපියල ක්‍රමයෙන් අධි ප්‍රමාණය වන සලකුණු පෙන්නුම් කළේය. මෙය තිරසාර ආර්ථික වර්ධනයක් කරා රට මෙහෙයවීම සඳහා විචක්ෂණශීලී සැලසුම්කරණයක් සඳහා පෙර නිමිති වේ.


ශ්‍රී ලංකාවේ නිල සංචිත නොවැම්බර් මාසයේදී ඇ. ඩො. බිලියන 3.7 ක් වූ අතර 2023 දෙසැම්බර් මාසයේදී ඇ. ඩො. බිලියන 4.3 ඉක්මවා ගියේය. මෙය රට ආර්ථික අර්බුදයට ඇද වැටීමෙන් පසු වාර්තා කළ ඉහළම මට්ටම වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ කාර්යසාධනය සතුටුදායක වූ අතර, රටේ ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ සඳහා සහය දැක්වීම සඳහා විශේෂ ගැනුම් හිමිකම් (SDR) සඳහා ප්‍රවේශය ශ්‍රී ලංකාවට ලබා දෙමින්, ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීමට, ආදායම ඉහළ නැංවීමට, සංචිත අවශ්‍යතාවන් නැවත ගොඩනැඟීමට උද්ධමනය අඩු කිරීමට සහ මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීමට හේතු විය.




ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි සපුරාලීමෙන් පසු IMF මගින් සැපයෙන පැකේජයේ පළමු වාරිකය සහ අපේක්ෂිත දෙවන වාරිකය ලැබීමෙන් ශ්‍රී ලංකාව ආර්ථිකයේ ප්‍රකෘතිය කරා යන ගමනේ යෙදී සිටින බව ජාත්‍යන්තර ප්‍රජාවට ඇඟවුම් කර ඇති අතර, ආසියානු රටක් ලෙස එහි ආර්ථික උච්චතම අවස්ථාව නැවත ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.


කාර්තුමය මූර්ත දළ දේශීය නිෂ්පාදන වර්ධනය



උද්ධමනය: කොළඹ පාරිභෝගික මිල දර්ශකය සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය වසරින් වසර %



ණය සහ තැන්පතු අනුපාතය



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

බැංකු කර්මාන්තයේ සන්දර්භය

2023 සඳහා අපේක්ෂිත සංකෝචනය නොතකා බැංකු අංශය ප්‍රත්‍යස්ථව පැවති අතර, මුදල් ප්‍රතිපත්තිය ක්‍රමානුකූලව ලිහිල් කිරීමත් සමඟ එය දැඩි ලෙස අඩු විය. සාර්ව-ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඵල දරමින් ආර්ථිකය ස්ථාවර වීමේ තාවකාලික සලකුණු පෙන්වයි.

වත්කම් පදනම

මුළු වත්කම් (රු.)

2023	ට්‍රිලියන 20.4 කි
2022	ට්‍රිලියන 19.4 කි

ණය කළඹ

දළ ණය සහ අත්තිකාරම් (රු.)

2023	ට්‍රිලියන 11.0 කි
2022	ට්‍රිලියන 11.3 කි

මෙහෙයුම් සන්දර්භය


අරමුදල් සැපයීම

තැන්පතු (රු.)




ලාභය

බදු පෙර ලාභය (රු.)




ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව


ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය



ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය



ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාතය



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙටි හා මධ්‍ය කාලීනව ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රකෘතිය රඳා පවතින්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (IMF) ලබාගත් විස්තීරණ අරමුදල් පහසුකම (EFF) අනුව පදනම් වූ ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ සාර්ථකව සහ අඛණ්ඩව පවත්වාගෙන යාම මතය. මේ සඳහා මිල ස්ථායීතාවය සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව සහතික කරන අතරම, මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීමට සහ විදේශීය අංශය අවශ්‍යතාවන් ශක්තිමත් කිරීමට විශ්වාසනීය ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

වෙළඳපළ ණය පොළී අනුපාත ක්‍රමානුකූලව සාමාන්‍යකරණය කිරීම සහ ආයෝජකයින්ගේ සහ ව්‍යාපාරිකයින්ගේ විශ්වාසය වැඩිදියුණු කිරීම පුද්ගලික අංශයේ ණය ප්‍රසාරණය සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බැංකු ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇති බව සහතික කර ගනිමින්, බැංකුවල අනාගත වර්ධනය සඳහා ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව හඳුනා ගැනීමට මහ බැංකුව දැඩි ඇගයීම් ක්‍රියාවලියක යෙදී සිටී. තවද, ව්‍යාපාර, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි (SMEs) තිරසාර පුනර්ජීවනය සඳහා බලපත්‍රලාභී බැංකුවල කාර්යභාරය ශක්තිමත් කිරීම උදෙසා වත්කම්වල ගුණාත්මක බව සහතික කිරීම මූලික කොටගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පුළුල් මාර්ගෝපදේශ නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

ලංකා බැංකුවට බලපෑම

- IMF යෝජනාවක් අනුව දේශීය ණය ප්‍රශස්ත කිරීමේ උපායමාර්ගය මෙන්ම රජය සතු ව්‍යවසාය (SOEs) ප්‍රතිව්‍යුහගත කිරීම බැංකු අංශයේ ශේෂ පත්‍රයට බලපෑ හැකිය.
- වසර තුනකට පසු ප්‍රථම වතාවට පොළී අනුපාත පහත හෙළන ලද අතර එමඟින් ණය හා අත්තිකාරම්හි වර්ධනය සඳහා අවස්ථාවක් නිර්මාණය විය.
- අන්තර් බැංකු වෙළඳපළේ අරමුදල් ප්‍රමාණවත් නොවීම මත අන්තර් බැංකු ණය ගැනීම් අසීරු තත්ත්වයකට පත්විය.

ආශ්‍රිත අවදානම් R1 R2 R3 R4

ආශ්‍රිත ප්‍රමාණාත්මකව වැදගත් කරුණු M1

අපගේ ප්‍රතිචාරය

- සමස්ත ජාතික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් බලශක්ති සහ ඖෂධ ක්ෂේත්‍රවල ප්‍රධාන රජය සතු ව්‍යවසායන් වෙත අරමුදල් සපයා ඇත.
- ණය ආපසු ගෙවීමේදී පීඩනයට මුහුණ දෙන ගනුදෙනුකරුවන්ට කාලීන සහාය ලබා දීම.
- ද්‍රවශීලතාවය ආරක්ෂා කිරීම කෙරෙහි වැඩි අවදානයක් යොමු කිරීම.
- අත්‍යාවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීමට ප්‍රමුඛත්වය දීම.

විකාශනය වන සමාජ සන්දර්භය

මන්දගාමී ආර්ථික වර්ධනය, ඉහළ උද්ධමනය සහ බදු වැඩිවීම්, ජීවනෝපායන්, ආදායම් සහ සමාජ-ආර්ථික විෂමතා මත වැඩි පීඩනයකට තුඩු දී ඇත. වැඩිහිටියන්, ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයින් ඇතුළු අවදානමට ලක්විය හැකි ජනගහනය විශේෂයෙන් දරිද්‍රතාවයේ සහ සමාජ බැහැර කිරීමේ අවදානමට ලක්ව ඇති අතර මේ සඳහා ඉලක්කගත සමාජ ආධාර සහ ආධාරක යාන්ත්‍රණ අවශ්‍ය වේ.

විශේෂයෙන්ම තරුණ පිරිස් අතර වෙනත් රටවල් වෙත සංක්‍රමණය අඛණ්ඩව වර්ධනය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නිපුණතා සහිත පුද්ගලයින් අඩු විය.

ලංකා බැංකුවට බලපෑම

- ණය ගැතියන්ගේ ආපසු ගෙවීමේ හැකියාව අඩුවීම හේතුවෙන් ණය අවදානම වැඩි වීම, ණය කළඹේ ගුණාත්මක භාවයට අහිතකර බලපෑම් ඇති කරයි.
- පුහුණු ශ්‍රමිකයන් සංක්‍රමණය වීම සහ බුද්ධි ගලනය ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුමකට තුඩු දී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස බැංකු ක්ෂේත්‍රයේ විශේෂිත නිපුණතා ඇති සේවකයන්ගේ හිඟයක් ඇති වීම.
- 2023 වසර තුළ විනිමය අනුපාත ඉහළ යාම නිසා විදේශගත පුද්ගලයන් විසින් එවන ප්‍රේෂණ වර්ධනය වූ අතර, එය බැංකුවට ධනාත්මක බලපෑමක් ඇති කරන ලදී.

ආශ්‍රිත අවදානම් R1 R4 R5 ආශ්‍රිත ප්‍රමාණාත්මකව වැදගත් කරුණු M3 M4

අපගේ ප්‍රතිචාරය

- බැංකුව සේවකයින්ට කිසිදු මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ කප්පාදු නොකළ අතර ඉහළ යන උද්ධමනයට අනුකූලව ජීවන වියදම් දීමනාව ගැලපීමට පියවර ගත්තේය.
- ගනුදෙනුකාර ප්‍රමුඛතා ජාතියේ අවශ්‍යතා සහ ගනුදෙනුකාර පක්ෂපාතිත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීම.

ඩිජිටල් පරිවර්තනය

රට තුළ ඩිජිටල්කරණය සඳහා වන යොමුවීම වර්ධනය වූ අතර, තාක්ෂණික දියුණුව, වෙනස්වන ගනුදෙනුකාර හැසිරීම් සහ රජයේ මූලපිරීම් මගින් විවිධ අංශ හරහා ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබීය. වසර තුළදී, කෘත්‍රිම බුද්ධිය, රොබෝ විද්‍යාව, ක්ලවුඩ් කම්පියුටින් සහ විශාල දත්ත - රටේ ව්‍යාපාරික හා ආර්ථික ක්‍රියාවලීන් වෙත බහුලව භාවිතා කිරීම දැකිය හැකි විය.

ජනගහනයෙන් විශාල ප්‍රතිශතයක් ස්මාර්ට් ෆෝන් සහ ජංගම උපාංග හරහා අන්තර්ජාලයට පිවිසීමත් සමඟ ජංගම සහ අන්තර්ජාල භාවිතයේ සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. ඩිජිටල් බැංකුකරණය, අන්තර්ජාලය හරහා ණය ප්‍රදානය, ජංගම ගෙවීම් සහ සම්ප්‍රදායික බැංකු සේවා සඳහා විකල්ප ඉදිරිපත් කිරීම, මූල්‍ය ඇතුළත් කිරීම් ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය ගනුදෙනු සහ සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම වැනි ක්ෂේත්‍ර තාක්ෂණික භාවිතය මගින් නව්‍යකරණය වෙමින් පවතී.

ලංකා බැංකුවට බලපෑම

- මූල්‍ය සේවා ඩිජිටල්කරණය බැංකු ක්‍රියාත්මක වන ආකාරය පරිවර්තනය කරයි. එබැවින්, ස්වයංක්‍රීයකරණය සහ පද්ධති වැඩිදියුණු කිරීම් හරහා බැංකුව සිය ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමට උත්සාහ කරයි.
- ඩිජිටල්කරණය වැඩි වීමත් සමඟම සයිබර් ප්‍රහාර සහ වංචා අවදානම ද වැඩි වී ඇති බැවින් තොරතුරු තාක්ෂණ ආරක්ෂක යටිතල ව්‍යුහයන් සඳහා යොමුවීමද වැඩි කර ඇත.

ආශ්‍රිත අවදානම් R4 R5 ආශ්‍රිත ප්‍රමාණාත්මකව වැදගත් කරුණු M1

අපගේ ප්‍රතිචාරය

- ගනුදෙනුකාර පදනමේ ඩිජිටල් භාවිතය වර්ධනය කරමින් ඩිජිටල් සාක්ෂරතාව වැඩිදියුණු කිරීම.
- ක්‍රියාවලි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ පිරිවැය අවම කිරීම සඳහා තාක්ෂණයේ භාවිතාව.
- තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම.

මෙහෙයුම් සන්දර්භය

නියාමන සංවර්ධනයන්

බැංකුව ක්‍රියාත්මක වන්නේ මූල්‍ය අංශයේ ස්ථායිතාව ආරක්ෂා කිරීම සඳහා නිරන්තරයෙන් නව නියාමන අවශ්‍යතා පනවන දැඩි නියාමන පරිසරයක් තුළය;

- බලපත්‍රලාභී වාණිජ බැංකුවල (LCB) අභිමතය පරිදි ගෙවීම් සිදු කිරීම සීමා කිරීම,
- ආනයන වලට එරෙහිව ආන්තික අවශ්‍යතා සහ ඇතැම් ණය පහසුකම් ලබා දීමේ දී උපරිම පොළී අනුපාත පැනවීම.
- ණය පොළී අනුපාත පහළ දැමීමක්, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් අපේක්ෂා කිරීම.
- ණය ගැනීම් වලට සීමා පැනවීම.

ලංකා බැංකුවට බලපෑම

- නියාමන ක්‍රියාවලීන් සහ තොරතුරු වාර්තාවන් සැපයීම ඉහළ යාම.
- අනුකූලතා පිරිවැය ඉහළ යාම.

ආශ්‍රිත අවදානම් R1 R2 R3 R4 R5

ආශ්‍රිත ප්‍රමාණාත්මකව වැදගත් කරුණු M2

අපගේ ප්‍රතිචාරය

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝග/මෙහෙයුම් උපදෙස් සහ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ වෙත අනුගතව කටයුතු කිරීම.
- වෘත්තීමය ආයතන සහ අනෙකුත් අදාල ආයතන මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් වලට අනුකූල වීම.

දේශගුණික විපර්යාස

කුඩා දූපතක් මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස මෙන්ම ඒ මත ඇතිවන උෂ්ණත්වය ඉහළ යාම, වර්ෂාවේ වෙනස් වීම්, මුහුදු මට්ටමේ ඉහළ යාම වැනි අවස්ථාවන් වලට නිරාවරණය වීමේ ප්‍රවණතාවය වැඩිවේ. එලෙසම මෙම කරුණු රටේ සෑම ක්ෂේත්‍රයකම ආර්ථික කටයුතු වලට දැඩි බලපෑමක් ඇති කරයි.

2022 නොවැම්බර් මස පැවති චක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවේදී දියත් කරන ලද ශ්‍රී ලංකාවේ දේශගුණික සෞභාග්‍ය සැලැස්ම, කෘෂිකර්මාන්තය හෝ ධීවර කර්මාන්තය වැනි දේශගුණික අවදානම් වලට වඩාත් නිරාවරණය වන අංශවල විස්තීරණ අවදානම් මූල්‍ය උපායමාර්ගයක් සමඟින් වේගවත් අනුවර්තනය වීමේ උපායමාර්ගයක් සංවර්ධනය කිරීමට කැපවීමෙන් දේශගුණ ආරක්ෂණය උත්තේජනය කිරීම සහ අවදානම් දැනුවත් ආයෝජන ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි. ,

ලංකා බැංකුවට බලපෑම

- බැංකුවක් ලෙස, අද ලෝකය මුහුණ දෙන තීරණාත්මක පාරිසරික ගැටළු විසඳීම සඳහා දැඩි ලෙස අප වෙතින් අපේක්ෂා කරන අතර, තිරසාර ණය දීම, විමෝචන අඩු කිරීමේ උපායමාර්ග සහ දේශගුණයට අනුවර්තනය වීම සහ අවම කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.
- පාරිසරික ඇඟවුම් පිළිබඳ ගනුදෙනුකාර දැනුවත්භාවය වැඩි වන විට, සමාජ සහ පාරිසරික සලකා බැලීම් ඇතුළත් වගකීම් සහිත ණය දීමේ තීරණ සඳහා බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ණය දෙන්නන්ගෙන් වැඩි අපේක්ෂාවක් පවතී.

ආශ්‍රිත අවදානම් R1 R4 R5

ආශ්‍රිත ප්‍රමාණාත්මකව වැදගත් කරුණු M4

අපගේ ප්‍රතිචාරය

- දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් විසඳීමට සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සඳහා නව බැංකු විසඳුම් සකස් කර ඇත.
- අපගේ තිරසාර න්‍යාය පත්‍රයට තවත් හරිත සංකල්ප ඇතුළත් කර ඇත.
- උපායමාර්ග සහ තීරණ ගැනීම් සඳහා සමාජ සහ පාරිසරික තිරසාරත්වය පිළිබඳ සලකා බැලීම් අඛණ්ඩව ඇතුළත් කර ඇත.
- සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීම සහ පෘථිවිය ආරක්ෂා කිරීම සඳහා SDG 17 සමඟ අපගේ ක්‍රියාවන් පෙළගස්වා ඇත.

පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන්

පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සඳහා ප්‍රවේශය

විවිධ පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත පරිසරයක් තුළ, ඔවුන් හා පවතින සබඳතා අඛණ්ඩව සහ ඵලදායී ලෙස පවත්වා ගැනීම උදෙසා සෑම පාර්ශ්වකරුවන් සමඟම අඛණ්ඩවූ විවෘත සබඳතාවක් පවත්වා ගනිමින් ඔවුන් උදෙසා වැඩි ප්‍රතිලාභ ලබාදීමට අපි නිරතුරුව වෙර දරන්නෙමු.

අපගේ බාහිර පාර්ශ්වකරුවන්ගේ පැතිකඩට ගනුදෙනුකරුවන්, ප්‍රජාව සහ පරිසරය, කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, නියාමකයින් සහ ව්‍යාපාරික හවුල්කරුවන් ඇතුළත් වන අතර අපගේ අභ්‍යන්තර පාර්ශ්වකරුවන් ධූරාවලියේ විවිධ මට්ටම්වල අපගේ සේවකයින්ගෙන් සමන්විත වන අතර ඒවා වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ කේන්ද්‍රීය සාධකය වේ.

විවිධ විධිමත් සහ අවිධිමත් මාර්ග හරහා පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධවීම පහසු කර ඇති අතර, විවිධ පාර්ශ්වකරුවන්ගේ ආවේනික අවශ්‍යතා මත පදනම්ව ඔවුන් හා සම්බන්ධ වීමේ ප්‍රවේශය සකස් කර ඇත. අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් අපි ඔවුන් සමඟ සම්බන්ධ වන ආකාරය සහ හේතුව ඔවුන්ගේ අවධානයට ලක්වන ප්‍රධාන මාතෘකා සඳහා අපගේ ප්‍රතිචාර පහතින් දක්වා ඇත.

පාර්ශ්වකරුවන් හා සම්බන්ධවීමේ ක්‍රියාවලිය

අදියර 1 – හඳුනා ගැනීම
- පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම සහ ප්‍රමුඛත්වය ලබා දීම
- සම්පත් වෙන් කිරීම

අදියර 2 – සැලසුම් කිරීම සහ සම්බන්ධ වීම
- අරමුණු ස්ථාපිත කිරීම
- සම්බන්ධ වීමේ ක්‍රම තීරණය කිරීම

අදියර 3 – සකස් කිරීම සහ පෙළගැස්ම
- පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා උපායමාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම


අදියර 4 – අධීක්ෂණය, ඇගයීම සහ වාර්තා කිරීම
- කාර්යක්ෂමතාව මැනීම
- අඛණ්ඩ නිරීක්ෂණය කිරීම
- පාර්ශ්වකරුවන්ට වාර්තා කිරීම
- අවශ්‍ය පරිදි වැඩිදියුණු කිරීම

පාර්ශ්වකරුවන් හඳුනාගැනීම

ගනුදෙනුකරුවන්
ගනුදෙනුකාර කේන්ද්‍රීය බැංකුවක් ලෙස, අපි අපගේ ගනුදෙනුකරුවන්ට සහය වන අතර ඩිජිටල් බැංකු සේවා හරහා ඔවුන්ගේ ගනුදෙනුකාර අත්දැකීම් පොහොසත් කරමු.

නියාමකයින්
විනිවිද භාවයෙන් යුතුව අඛණ්ඩව සම්බන්ධ වෙමින් අදාළ සියලුම නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා පිළිපැදීම.

ප්‍රජාව සහ පරිසරය
තිරසාරභාවය සඳහා අපගේ දිගුකාලීන ප්‍රවේශය තුළින් අප ක්‍රියාත්මක වන ප්‍රජාවක් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරමු.



සේවකයින්
ගනුදෙනුකරුවන් සහ බැංකුව අතර වැදගත් සබඳතාවය ගොඩනඟන බැංකුවේ කාර්ය මණ්ඩලය අපි අගය කරමු. අපගේ මානව සම්පත් ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි අනාගතයට සූදානම් කණ්ඩායමක් ගොඩනැඟීමට සහ පෝෂණය කිරීමට උපකාරී වේ.

කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්
අපගේ විස්තීරණ උපායමාර්ග හරහා අපි හවුල් පාර්ශ්වකාර වටිනාකමක් සහ ස්ථාවරත්වයක් නිර්මාණය කරන්නෙමු.

ව්‍යාපාරික හවුල්කරුවන්
අපගේ තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අපි සියලුම සැපයුම්කරුවන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ අඛණ්ඩ සහ විවෘත සබඳතාවක් පවත්වා ගෙන යන්නෙමු.

● ඉහළ ● ඉහළ සිට මධ්‍යස්ථ

පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන්

කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්

අපගේ චිකම කොටස් හිමියා රජය වන බැවින් බාහිර ප්‍රාග්ධනය ලබා ගත හැක්කේ රජයෙන් පමණි.

බැංකුවේ ණයකර වල ආයෝජනය කර ඇති ආයෝජකයින් විසින් ණය ලබා දී ඇත.

සම්බන්ධ වීමේ හේතුව

ආයෝජකයින්ගේ ආකල්ප බැංකුවේ අපේක්ෂාවන් මත බලපෑම් ඇති කරයි, එබැවින් විනිවිදභාවය, තොරතුරු වෙත පහසු ප්‍රවේශ වීම, ගැටළු තේරුම් ගැනීමට සහ විසඳීමට විවෘත සංවාදය ඉතා වැදගත් වේ.

ප්‍රධාන අවධානයන්

- අවදානමට සරිලන ප්‍රමාණවත් ප්‍රතිලාභ
- විනිවිදභාවය හා කාලීන වාර්තාකරණය
- ශක්තිමත් ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන්
- කීර්තිය
- වගකීම් සහගත ව්‍යාපාරික පිළිවෙත්

අපගේ ප්‍රතිචාරය

- ප්‍රමාණවත් ප්‍රතිලාභ සහිත අගයක් නිර්මාණය කිරීම
- ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම
- ඵලදායී ආන්තික කළමනාකරණය
- ප්‍රාග්ධන වර්ධනය ශක්තිමත් කිරීම කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම
- නියමිත වේලාවට වෙළඳපළ හෙළිදරව් කිරීම්

සම්බන්ධ වීමේ වේදිකා

- BoC වෙබ් අඩවිය — O
- වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන — A O
- නිතිපතා රැස්වීම් — P
- විශාල ආයෝජකයින් වෙත ගොස් කරන රැස්වීම් — P
- වෙළඳපළ අතරමැදියන් හරහා සම්බන්ධ වීම — P

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: **ශක්තිමත්**

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත බලපෑම



ගනුදෙනුකරුවන්

අපගේ ගනුදෙනුකරුවන්ට සිල්ලර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, දේශීය සහ විදේශීය ආයතනික ගනුදෙනුකරුවන් ඇතුළත් වන අතර, අපි ඔවුන්ට මූල්‍ය සේවා සහ නිෂ්පාදන රැසක් පිරිනමන්නෙමු.

සම්බන්ධ වීමේ හේතුව

අපගේ මෙහෙයුම් සහ වාණිජ විශිෂ්ටත්වය පිළිබිඹු කරන සහ බැංකුවේ ලාභදායිත්වය සහ තිරසාර බව සහතික කරන උසස් සහ ගුණාත්මක සේවාවක් ලබාදීමට අපි ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වෙමු.

ප්‍රධාන අවධානයන්

- කඩිනම් සහ පහසු සේවාවක්
- පහසු, විශ්වසනීය සහ ආරක්ෂිත වේදිකා
- ණය සහන
- විනිවිද පෙනෙන, තරඟකාරී මිලකරණය
- මූල්‍ය සඳහා ප්‍රවේශය

අපගේ ප්‍රතිචාර

- ගනුදෙනුකාර කේන්ද්‍රීය විසඳුම්
- ගනුදෙනුකාර අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කිරීම
- ඩිජිටල් පිරිනැමීම් වැඩි දියුණු කිරීම
- ස්වයංක්‍රීයකරණය හරහා ගනුදෙනු සඳහා ගතවන කාලය අඩු කිරීම

සම්බන්ධ වීමේ වේදිකා

- සමීක්ෂණ — P
- ශාඛා සහ ඩිජිටල් නාලිකා හරහා සෘජුව සම්බන්ධ වීම — O
- වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය — O
- ගනුදෙනුකාර ක්ෂණික ඇමතුම් අංකය — O
- මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් — O
- අලෙවිකරණය, ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය — O

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: **ශක්තිමත්**

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත බලපෑම



A වාර්ෂිකව | O අඛණ්ඩව | P කාලානුරූපව | BI අර්ධ වාර්ෂික | Q කාර්තුමය

සේවකයින්

අපගේ සේවක කණ්ඩායම දිවයින පුරා මෙන්ම විදේශයන්හි ද ව්‍යාප්තව සිටින අතර, අපගේ ව්‍යාපාරික උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී වටිනා දායකත්වයක් ලබා දීමට අපි ඔවුන්ව නිරතුරුව දිරිමත් කරමු.

සම්බන්ධ වීමේ හේතුව

සේවකයින් බැංකුවේ ප්‍රධාන වත්කමක් වන අතර, වටිනා දායකත්වයක් ලබා දීමට අපි ඔවුන්ව දිරිමත් කිරීම සහ තෘප්තිමත් කිරීම සඳහා ස්ථාවර රැකියාවක්, සාධාරණ වේතනයක්, ත්‍යාග සහ වෘත්තීය සංවර්ධනය මූලික කර ගත් පුහුණුවක් ලබා දෙමු.

ප්‍රධාන අවධානයන්

- තරඟකාරී වැටුප් යෝජනා ක්‍රම
- ආරක්ෂිත සේවා ස්ථානය
- වෘත්තීය දියුණුව
- කුසලතා සංවර්ධනය සඳහා ඉගෙනුම් අවස්ථා
- සමාන අවස්ථාවන්
- රැකියා සුරක්ෂිතභාවය
- විශ්‍රාම ගැනීමෙන් පසු ප්‍රතිලාභ

අපගේ ප්‍රතිචාරය

- ශාරීරික හා මානසික යහපැවැත්ම සහතික කිරීම සඳහා පියවර
- පුහුණුව සහ කුසලතා සංවර්ධනය සඳහා අඛණ්ඩ අවස්ථා
- ආකර්ශනීය ඇගයීම් සහ සහන ව්‍යුහයන්
- ජීවන වියදම වැඩි වීමත් සමඟ වේතනය ගැලපීම
- විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම
- ණය අය කර ගැනීමේ දී සහන ලබා දීම

සම්බන්ධ වීමේ වේදිකා

- බහු මට්ටමේ කාර්ය මණ්ඩල රැස්වීම් O
- විවෘත දොර සංස්කෘතිය O
- දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය O
- tvBOC හරහා අතථ්‍ය සබැඳියාව O
- කාර්යසාධන ඇගයීම BI
- වෘත්තීය සමිති හරහා සම්බන්ධ වීම O
- වාර්ෂික ක්‍රියාකාරකම් දින දර්ශනය O

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය **ශක්තිමත්**

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත බලපෑම



නියාමකයින්

බැංකුවේ ප්‍රධාන නියාමකයින් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL), ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) සහ කොළඹ කොටස් හුවමාරුව (CSE) ය. විදේශීය ශාඛා නියාමනය කරනු ලබන්නේ අදාළ රටේ මහ බැංකු හරහා ය.

සම්බන්ධ වීමේ හේතුව

සියලුම නීතිමය සහ නියාමන අවශ්‍යතා වලට අනුකූල වීම සහතික කිරීම සහ නිසි කල්හි නියාමකයින් දැනුවත් කිරීම.

ප්‍රධාන අවධානයන්

- ව්‍යාපාර සහ ආර්ථික පුනර්ජීවනයට සහාය වීම
- මූල්‍ය ක්ෂේත්‍රය කෙරෙහි විශ්වාසය තබා ගැනීම
- ශක්තිමත් පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන්
- මූල්‍ය ඇතුළත් කිරීම සඳහා පහසුකම් සැලසීම

අපගේ ප්‍රතිචාරය

- කාලීන වාර්තාකරණය සහ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම්
- සියලුම රෙගුලාසි/මාර්ගෝපදේශ සමග පූර්ණ අනුකූලතාවය
- පීඩාවට පත් අංශ වෙත ණය දීමේ අවශ්‍යතා පිළිපැදීම
- දැඩි බලපෑමට ලක් වූ අංශ සඳහා අඛණ්ඩ සහාය
- අඛණ්ඩතාව සහ ක්ෂේත්‍රයේ සහයෝගිතාවය පවත්වා ගැනීම

සම්බන්ධ වීමේ වේදිකා

- නියාමන වාර්තාකරණය O
- පුද්ගල රැස්වීම් O
- බැංකු ක්ෂේත්‍රයේ සංවිධානයන් හරහා සාකච්ඡා O
- වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන A Q

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය **ශක්තිමත්**

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත බලපෑම



පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන්

ප්‍රජාව සහ පරිසරය

බැංකුව ක්‍රියාත්මක වන ප්‍රජාවන්, සාමාන්‍ය ජනතාව සහ ස්වභාවික පරිසරය

සම්බන්ධ වීමේ හේතුව

අපගේ සමාජ ක්‍රියාකාරිත්වයන් වලදී ප්‍රජාව සහ පරිසරය ප්‍රධාන කොටස් වේ. ආර්ථික, සමාජීය සහ පාරිසරික තිරසාරත්වය සඳහා අපට සහාය විය හැකි ආකාරය අවබෝධ කර ගැනීමට අපි විවෘතව ප්‍රජාව සහ පරිසරය සමඟ සම්බන්ධ වෙමු.

ප්‍රධාන අවධානයන්

- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය
- වගකීම් සහගත ව්‍යාපාරික පිළිවෙත්
- ආර්ථිකයේ පුනර්ජීවනය මෙහෙයවීම සඳහා මූල්‍ය ඇතුළත් කිරීම් සහ සවිබල ගැන්වීම
- ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට බැංකුවේ උපායමාර්ග පෙළගැස්වීම

අපගේ ප්‍රතිචාරය

- ශක්තිමත් පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන්
- රැකියා උත්පාදනය
- රට පුරා මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා පහසුකම් සැලසීම
- ආයතනික සමාජ වගකීම් ඇති ව්‍යාපෘති සඳහා අඛණ්ඩ සහ දිගුකාලීන ආයෝජන
- රජයට වටිනාකම් නිර්මාණය කිරීම
- රටේ ආර්ථික පුනර්ජීවනයට සහාය වීම

සම්බන්ධ වීමේ වේදිකා

- වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන — A O
- BoC වෙබ් අඩවිය — O
- කර්මාන්ත සංසඳ සහ රැස්වීම් — O
- ශාඛා හරහා සම්බන්ධ වීම — O
- ප්‍රජාවන් සඳහා ආයෝජනය කිරීම — O
- මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය ප්‍රචාරණ — O

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: ශක්තිමත්

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත බලපෑම



ව්‍යාපාරික හවුල්කරුවන්

අපගේ දේශීය සහ ගෝලීය සැපයුම්කරුවන්ගේ සහ ව්‍යාපාරික හවුල්කරුවන්ගේ පුළුල් ජාලය.

සම්බන්ධ වීමේ හේතුව

කාලීනව සුරක්ෂිත ලෙස භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම සඳහා අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ශක්තිමත් සහ තිරසාර සබඳතා පවත්වා ගත යුතුය.

ප්‍රධාන අවධානයන්

- විනිවිදභාවයෙන් යුත් තෝරා ගැනීමේ ක්‍රියාවලි සහ තරඟකාරී මිලකරණය
- ගනුදෙනු කිරීමේ පහසුව
- විකඟ වූ කාල අනුව ගෙවීම්
- ස්ථිර සහ පුරෝකථනය කළ හැකි ඉල්ලුම

අපගේ ප්‍රතිචාරය

- විනිවිදභාවයෙන් යුත් තෝරා ගැනීමේ ක්‍රියාවලි සහ ප්‍රසම්පාදන පිළිවෙත්
- ගෙවීම් පැහැර හැරීම් නොමැත
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය

සම්බන්ධ වීමේ වේදිකා

- අඛණ්ඩ ලිඛිත සන්නිවේදනය — O
- නිතිපතා රැස්වීම් — P
- ලංසු තැබීමේ ක්‍රියාවලිය — P
- කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තාව — Q A

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය: ශක්තිමත්

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත බලපෑම



A වාර්ෂිකව | O අඛණ්ඩව | P කාලානුරූපව | BI අර්ධ වාර්ෂික | Q කාර්තුමය

ප්‍රමාණාත්මක වැදගත් කරුණු

ද්විත්ව ප්‍රමාණාත්මක මූලධර්මයට අනුකූලව, අපගේ ඒකාබද්ධ වාර්තාව මූල්‍ය වාර්තාකරණයෙන් ඔබ්බට විහිදෙන අතර අඛණ්ඩව වටිනාකම් එක් කිරීමට අපගේ හැකියාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති ප්‍රධාන පාර්ශ්වකරුවන්ට සම්බන්ධිත මූල්‍ය නොවන කාර්යසාධනය, අවදානම්, අවස්ථා සහ ප්‍රතිඵල ඇතුළත් වේ.

බැංකුවට ප්‍රමාණාත්මක වශයෙන් වැදගත් වන කරුණු සමාලෝචනය කිරීම සහ ඇගයීම සඳහා අපගේ ප්‍රමාණාත්මක නිර්ණය කිරීමේ ක්‍රියාවලිය වාර්ෂිකව සිදු කෙරේ. සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ මෙහෙයුම් ක්ෂේත්‍රයේ සිදු වූ සිදුවීම් මෙම ගැටලුවලට ඇතුළත් වන අතර, එය අපගේ උපායමාර්ගික අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වටිනාකමක් ඇති කිරීමට අපට ඇති හැකියාව කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑ හැකිය. අපි බැංකුවේ උපායමාර්ග සහ මෙහෙයුම් වලට බලපාන ප්‍රමාණාත්මක මාතෘකා හඳුනා ගැනීමට පහත දක්වා ඇති පරිදි ව්‍යුහගත ක්‍රියාවලියක් අනුගමනය කරන්නෙමු.

අපගේ ප්‍රමාණාත්මකතාවය නිර්ණය කිරීමේ ක්‍රියාවලිය

හඳුනා ගැනීම

මෙහෙයුම් සන්දර්භය → පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් → අවදානම් සහ අවස්ථා

තක්සේරු කිරීම

බැංකුවේ උපායමාර්ගයට ඇති බලපෑම සහ පාර්ශ්වකරුවන්ගේ තීරණ කෙරෙහි ඇති බලපෑම අනුව අපි සාපේක්ෂ වැදගත්කම තක්සේරු කරමු

ප්‍රමුඛත්වය දීම

ප්‍රමාණාත්මක ගැටළු ඒවායේ සම්භාවිතාව සහ බලපෑම මත ශ්‍රේණිගත කෙරේ

අධීක්ෂණය සහ වාර්තාකරණය

මෙහෙයුම් පරිසරයේ වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් අපි හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක මාතෘකා අඛණ්ඩව අධීක්ෂණය කරන අතර බැංකුවේ උපායමාර්ගය නැවත පෙළගස්වමින් ප්‍රතිචාර දක්වන්නෙමු. මෙහි ප්‍රගතිය පාර්ශ්වකරුවන්ට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තා කරනු ලැබේ.

අපගේ ප්‍රමාණාත්මක තේමා

2023 සඳහා ප්‍රමාණාත්මක තක්සේරුව ගොඩනැගී ඇත්තේ පෙර වසර තුළ හඳුනාගත් ප්‍රමාණාත්මක මාතෘකා මත වන අතර මෙම වසරේ අපි මෙම මාතෘකා පුළුල් තේමා හතරක් යටතේ කාණ්ඩගත කළෙමු. මෙහෙයුම් වල වෙනස්කම් සමඟ මෙම මාතෘකා සමාලෝචනය කළ අතර එහිදී වාර්තාකරණ සීමාවන්ට සැලකිය යුතු වෙනස්කම් සිදු වී නොමැති බව හෙළි විය.


M1 වෙනස්වන පරිසරයට අනුගතවීම

M2 වගකීම් සහගත වර්ධනය උදෙසා කටයුතු කිරීම

M3 අපේ සේවක මණ්ඩලය වෙත දක්වන අවධානය

M4 තිරසාර ව්‍යාපාරික මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම

ප්‍රමාණාත්මක වැදගත් කරුණු



A

M2 - 6	වගකිවයුතු බැංකුකරණය
M4 - 3	දේශගුණික විපර්යාස සහ පාරිසරික පියසටහන්

B

M2 - 3	වගකිවයුතු ප්‍රසම්පාදන

C

M3 - 3	විවිධත්වය සහ සමාන අවස්ථාවන්

D

M1 - 1	සාර්ව ආර්ථික වර්ධනයන් සහ ප්‍රතිපත්ති ප්‍රවණතා
M1 - 2	ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම්

M1 - 3	ගනුදෙනුකාර රහස්‍යතාවය සහ දත්ත සුරක්ෂිතභාවය
M1 - 4	ඩිජිටල්කරණය සහ තාක්ෂණය
M2 - 1	ගනුදෙනුකාර සහාය සහ ව්‍යාපාර පුනර්ජීවනය
M2 - 2	සන්නාමයේ කීර්තිය
M2 - 4	අල්ලස හා දූෂණ විරෝධී විවිධත්වය සහ සමාන අවස්ථා
M2 - 5	නියාමන පරිසරය, පාලනය සහ අනුකූලතාවය
M3 - 1	සේවක සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම
M3 - 2	කුසලතා කළමනාකරණය සහ සේවක සබඳතා
M3 - 4	සේවක අයිතිවාසිකම් (කොන්ත්‍රාත් පදනම මත)
M4 - 1	මූල්‍ය කාර්යසාධනය
M4 - 2	සමාජ-ආර්ථික දායකත්වය සහ මූල්‍ය ඇතුළත් කිරීම

ප්‍රමාණාත්මක මාතෘකා	බැංකුවට එය ප්‍රමාණාත්මක වීමට හේතුව	අපගේ ප්‍රතිචාර	බලපෑමට ලක්වන ප්‍රාග්ධනයන්	බලපෑමට ලක්වන පාර්ශ්වකරුවන්	තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDGs) වෙත දායකත්වය
M1 : වෙනස්වන පරිසරයට අනුගතවීම					
1 **සාර්ව ආර්ථික වර්ධනයන් සහ ප්‍රතිපත්ති ප්‍රවණතා**	ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බලපාන බහුවිධ අභියෝග සහ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති වර්ධනයන් මූල්‍ය අංශයේ මෙහෙයුම්, කාර්යසාධනය සහ තිරසාරත්වය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි.	මෙහෙයුම් සන්දර්භය පිටු 44 සිට 48 දක්වා	මූල්‍ය ප්‍රාග්ධනය නිෂ්පාදිත ප්‍රාග්ධනය	කොටස් හිමියා සහ ආයෝජක් සපයන්නන් සේවකයින් ගනුදෙනුකරුවන්	
2 **ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම්**	ශ්‍රී ලංකාව තුළ දැඩි තරඟකාරී බැංකු අංශයේ ප්‍රධානත්වය	අපගේ ගනුදෙනුකරුවන් සඳහා ශක්තිමත් හවුල්කරුවෙක් පිටු 84 සිට 89 දක්වා.	සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය	ගනුදෙනුකරුවන්	
3 **ගනුදෙනුකාර රහස්‍යතාවය සහ දත්ත සුරක්ෂිතභාවය** (GRI 418 SASB FN-CB-230a.2)	ඩිජිටල්කරණය කෙරෙහි ඇති වැඩි නැඹුරුව ගනුදෙනුකාර රහස්‍යතා සහ ආරක්ෂක ගැටලුවලට ඇති අවදානම ඉහළ නංවා ඇති අතර එමඟින් තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ක්‍රමවේද ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.	ඩිජිටල්කරණයෙන් බල ගැන්වූ බැංකුවක් පිටු 98 සිට 102 දක්වා.	සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය	ගනුදෙනුකරුවන්	
4 **ඩිජිටල්කරණය සහ තාක්ෂණය**	ඩිජිටල් විශිෂ්ටත්වය ඉදිරියට ගෙනයාම බැංකුවේ ප්‍රධාන උපායමාර්ගික අපේක්ෂාවකි.	ඩිජිටල්කරණයෙන් බල ගැන්වූ බැංකුවක් පිටු 98 සිට 102 දක්වා	නිෂ්පාදිත ප්‍රාග්ධනය	ගනුදෙනුකරුවන් සේවකයින්	


ප්‍රමාණාත්මක මාතෘකා	බැංකුවට එය ප්‍රමාණාත්මක වීමට හේතුව	අපගේ ප්‍රතිචාර	බලපෑමට ලක්වන ප්‍රාග්ධනයන්	බලපෑමට ලක්වන පාර්ශ්වකරුවන්	තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDGs) වෙත දායකත්වය
M2 : වගකීම් සහගතව වර්ධනය උදෙසා කටයුතු කිරීම					
1 ගනුදෙනුකාර සහාය සහ ව්‍යාපාර පුනර්ජීවනය (SASB FN-CB-240a.1 SASB FN-CB-240a.2)	නැවත සැලසුම් කිරීම/ප්‍රතිව්‍යුහගත කිරීමේ පහසුකම්, මුදල් ප්‍රවාහ අධීක්ෂණය සහ මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශය සකසා දීම හරහා ව්‍යාපාර පුනර්ජීවනයට සහාය වෙමින් අපි රටේ ආර්ථික ප්‍රකෘතිය සඳහා අඛණ්ඩව නායකත්වය දෙන්නෙමු.	අපගේ ගනුදෙනුකරුවන් සඳහා ශක්තිමත් හවුල්කරුවෙක් පිටු 84 සිට 89 දක්වා.	සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය	ගනුදෙනුකරුවන්	8, 9, 10, 12, 16
2 **සන්නාමයේ කීර්තිය**	ශ්‍රී ලංකාවේ අංක 1 බැංකු සන්නාමය ලෙස අඛණ්ඩව ශ්‍රේණිගත කර ඇති අතර සන්නාමය සහ කීර්තිය ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට උපකාරී වේ.	අපගේ ගනුදෙනුකරුවන් සඳහා ශක්තිමත් හවුල්කරුවෙක් පිටු 84 සිට 89 දක්වා.	මූල්‍ය ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය	කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, සේවකයින්, ගනුදෙනුකරුවන්	
3 **වගකිවයුතු ප්‍රසම්පාදන** (GRI 204)	ලංකා බැංකුව විශාල සැපයුම්කරුවන් පිරිසක් සමඟ සම්බන්ධ වන අතර තිරසාර භාවිතයන් ප්‍රවලිත කිරීම තුළින් ප්‍රසම්පාදනයේදී වගකීම් සහගත පරිචයන් සහතික කරයි.	අපගේ සෑම ක්‍රියාවලියකදීම විශ්වාසයේ තහවුරුව පිටු 103 සිට 109 දක්වා.	සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය, ස්වාභාවික ප්‍රාග්ධනය	ව්‍යාපාරික හවුල්කරුවන්	
4 **අල්ලස හා දූෂණ විරෝධී** (GRI 205, 406 SASB FN-CB-510a.2)	රජය සතු ආයතනයක් ලෙස, හවුල් වටිනාකමක් වගකීමෙන් නිර්මාණය කිරීමේදී අල්ලස හා දූෂණ විරෝධී සංස්කෘතියක් පෝෂණය කිරීම ඉතා වැදගත් වේ.	ජයග්‍රාහී, දක්ෂ හා විවිධත්වයෙන් යුතු වූ කණ්ඩායමක් පිටු 90 සිට 97 දක්වා.	මානව ප්‍රාග්ධනය, සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය	ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන්, සේවකයින්	
5 **නියාමන පරිසරය, යහපාලනය සහ අනුකූලතාවය** (GRI 207, 419, 307)	වර්තමාන සහ නැගී එන රෙගුලාසි වලට අනුකූල වීම සහතික කළ යුතු අතර එසේ කිරීමට අපොහොසත් වීම හිතිමය සහ අනුකූලතා අවදානම් සහ කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම් වලට තුඩු දෙයි	ආයතනික යහපාලනය පිටු 111 සිට 121 දක්වා අවදානම් සහ අවස්ථා පිටු 132 සිට 148 දක්වා.	සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය	කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, නියාමකයින්, සේවකයින්	
6 **වගකිවයුතු බැංකුකරණය**	වගකීම් සහගත ණය දීමේ පිළිවෙත් මත බලපෑමෙන් යුත් සමාජ - ආර්ථික වෙනසක් ඇති කිරීමට ලංකා බැංකුවට හැකියාව ඇත.	ව්‍යාපාර අංශවල කාර්යසාධනය පිටු 73 සිට 82 දක්වා.	මූල්‍ය ප්‍රාග්ධනය, සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, ස්වාභාවික ප්‍රාග්ධනය	කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, ගනුදෙනුකරුවන්, සේවකයින්, ප්‍රජාව සහ පරිසරය	

ප්‍රමාණාත්මක වැදගත් කරුණු

ප්‍රමාණාත්මක මාතෘකා	බැංකුවට එය ප්‍රමාණාත්මක වීමට හේතුව	අපගේ ප්‍රතිචාර	බලපෑමට ලක්වන ප්‍රාග්ධනයන්	බලපෑමට ලක්වන පාර්ශ්වකරුවන්	තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDGs) වෙත දායකත්වය
M3 : අපගේ සේවක මණ්ඩලය වෙත දක්වන අවධානය					
1 **සේවක සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම** (GRI 403)	සේවක සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම මගින් සේවක ඵලදායිතාව වැඩි දියුණු කිරීම, නොපැමිණීම අවම වීම, සේවක පිරිවැටුම සහ බඳවා ගැනීමේ පිරිවැය අවම කිරීම	ජයග්‍රාහී, දක්ෂ හා විවිධත්වයෙන් යුතු කණ්ඩායමක් පිටු 90 සිට 97 දක්වා.	මානව ප්‍රාග්ධනය	සේවකයින්	3, 5, 8, 9
2 **කුසලතා කළමනාකරණය සහ සේවක සබඳතා** (GRI 401, 402, 404, 407)	ආයතනික උපක්‍රම මෙහෙයවීමේදී සේවකයන් අත්‍යාවශ්‍ය වන අතර බැංකුවේ වටිනාම වත්කම් වලින් එකක් වන සේවකයන් සම්බන්ධ ගැටලු ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.	ජයග්‍රාහී, දක්ෂ හා විවිධත්වයෙන් යුතු කණ්ඩායමක් පිටු 90 සිට 97 දක්වා.	මානව ප්‍රාග්ධනය	සේවකයින්	
3 **විවිධත්වය සහ සමාන අවස්ථා** (GRI 405)	විවිධත්වයට ප්‍රමුඛත්වය දීම මත ධනාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීම බැංකුවේ සමස්ත ඉලක්ක සහ එහි දිගුකාලීන සාර්ථකත්වයට දායක වේ.	ජයග්‍රාහී, දක්ෂ හා විවිධත්වයෙන් යුතු කණ්ඩායමක් පිටු 90 සිට 97 දක්වා.	මානව ප්‍රාග්ධනය	සේවකයින්	
4 **සේවක අයිතිවාසිකම් (කොන්ත්‍රාත් පදනම මත)** (GRI 408, 409)	ස්ථිර සේවක සංඛ්‍යාවට අමතරව බැංකුවේ නියැලී සිටින සියලුම බාහිරින් ලබා ගන්නා සහ කොන්ත්‍රාත් සේවකයින් සඳහා ආරක්ෂිත සහ හිතකර සේවා පරිසරයක් සැපයීමට ලංකා බැංකුව කැපවී සිටී.	ජයග්‍රාහී, දක්ෂ හා විවිධ තත්ත්වයෙන් යුතු කණ්ඩායමක් පිටු 90 සිට 97 දක්වා.	මානව ප්‍රාග්ධනය	සේවකයින්	
M4 : තිරසාර ව්‍යාපාරික මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම					
1 **මූල්‍යමය ක්‍රියාකාරිත්වය** (GRI 201)	පාර්ශ්වකරුවන්ට වාණිජ තිරසාරභාවය සහ අඛණ්ඩ වටිනාකම් උත්පාදනය සහතික කිරීමේදී බැංකුව තීරණාත්මකව කටයුතු කරයි.	මූල්‍ය සමාලෝචනය පිටු 68 සිට 72 දක්වා.	මූල්‍ය ප්‍රාග්ධනය	කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්, සේවකයින්	7, 8
2 **සමාජ-ආර්ථික දායකත්වය සහ මූල්‍ය ඇතුළත් කිරීම** (GRI 201, 202, 413, 203 SASB N-CB-240a.3 SASB FN-CB-240a.4)	සමාජ-ආර්ථික සවිබල ගැන්වීම සහ මූල්‍ය ඇතුළත් කිරීම් ප්‍රවර්ධනය කිරීම, නව වෙළඳපළ සඳහා විවෘත ප්‍රවේශය, නව ආදායම් මාර්ග උත්පාදනය කිරීම, කීර්තිය වැඩි දියුණු කිරීම සහ ආර්ථික සංවර්ධනයට දායක වීම.	අපගේ සෑම ක්‍රියාවලියකදීම විශ්වාසයේ තහවුරුව පිටු 103 සිට 109 දක්වා. තිරසාර බවට අනුගත වීම පිටු 61 සිට 63 දක්වා.	සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය	සේවකයින්, ගනුදෙනුකරුවන්, ප්‍රජාව සහ පරිසරය	8, 10, 11, 12
3 **දේශගුණික විපර්යාස සහ පාරිසරික පියසටහන්** (GRI 302, 305 SASB FN-CB-410a.2)	පාරිසරික බලපෑම් අවම කිරීම නියාමන අවශ්‍යතා සපුරාලීමට, කීර්ති නාමය වැඩි දියුණු කිරීමට, වියදම් අඩු කිරීමට, ආදායම වැඩි කිරීමට සහ නව ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කිරීමට පාරිසරික බලපෑම් අවම කිරීම උපකාරී වේ	අපගේ සෑම ක්‍රියාවලියකදීම විශ්වාසයේ තහවුරුව පිටු 103 සිට 109 දක්වා	ස්වාභාවික ප්‍රාග්ධනය	ප්‍රජාව සහ පරිසරය	13

උපායමාර්ග සහ සම්පත් විභජනය

ආර්ථික ගතිකත්වය සහ තාක්ෂණික පරිණාමය මගින් නිර්වචනය කරන ලද සන්දර්භයක් තුළ, බැංකුකරණයේ අනාගතය යළි නිර්වචනය කිරීමට බැංකුව පෙරමුණ ගෙන සිටී. අපගේ උපායමාර්ග හුදු ඉදිරිගමනේ සැලැස්මක් පමණක් නොවේ; එය නවෝත්පාදනය, ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය සහ තිරසාර වර්ධනය සඳහා කැපවීමකි. මෙම පරිච්ඡේදය අපගේ උපායමාර්ගික රාමුවේ ප්‍රධාන ප්‍රමුඛතා සහ සියලු පුරවැසියන් සඳහා වර්ධනය සහ සමෘද්ධිය ඇති කිරීමට අප ගන්නා ක්‍රියාකාරී පියවරයන් ගෙනහැර දක්වයි.



අපගේ ශක්තීන් භාවිතා කිරීම

- රට පුරා පැතිරී ඇති පුළුල් ශාඛා ජාලය සහ පුළුල් ආවරණයක් සහිත විශාල නියෝජිත බැංකු ජාලය.
- රටේ ප්‍රමුඛතම බැංකු සන්නාමය
- වෙළඳපළ නායකත්වය

අපගේ දුර්වලතා නිවැරදි කර ගැනීම

- නව පරම්පරාව ආකර්ෂණය කර ගැනීම
- අදියර 3 ණය නිරාවරණය වීමේ අවදානම.
- විවිධ පද්ධති ඒකාබද්ධතාවයේ අභියෝග.

අවස්ථා හඳුනා ගැනීම

- ඩිජිටල්කරණය වැඩි වීම
- හරිත මූල්‍යකරණය සඳහා ඇති ප්‍රවණතාවය
- ආර්ථික ක්‍රියාකාරකම්වල උද්දීපනයට අනුකූලව ණය ඉල්ලුම

තර්ජන වලින් ආරක්ෂා වීම

- සම ආයතන සහ ෆින්ටෙක් සමාගම් වලින් තරඟය
- සයිබර් ආරක්ෂණ තර්ජනය
- දේශගුණික විපර්යාසවල බලපෑම්
- බුද්ධි ගලනය

අපේක්ෂිත ප්‍රතිඵල

ගනුදෙනුකාර අත්දැකීම්හි විශිෂ්ටත්වය

සියලුම භෞතික සේවා මධ්‍යස්ථාන සහ අතථ්‍ය වේදිකා හරහා ස්ථාවර සහ උසස් ගනුදෙනුකාර අත්දැකීමක් සහතික කිරීම.

වෙළඳපළ නායකත්වය රඳවා තබා ගැනීම

බැංකුවේ සන්නාම ශක්තිය සහ අසමසම ගනුදෙනුකාර විනිවිදියාම අදාළ නිෂ්පාදන සහ උසස් ගනුදෙනුකාර අත්දැකීම් ලබා දීම තුළින් වෙළඳපළ නායකත්වය පවත්වා ගැනීම.

ඩිජිටල් අනුගත වීම සඳහා නායකත්වය ගැනීම

අති නවීන තාක්ෂණය භාවිතා කිරීමෙන් අභ්‍යන්තර සහ බාහිර ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් නව මානයකට පරිවර්තනය කිරීම.

තිරසාර බැංකුකරණයේ විශිෂ්ටත්වය

ක්‍රියාශීලී සහ අර්ථවත් විසඳුම් යෙදවීමෙන් ආර්ථික, සමාජීය සහ පාරිසරික ක්ෂේත්‍රවල පවතින අභියෝග ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීම.

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා: M2, M4

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක: 8 DECENT WORK AND ECONOMIC GROWTH, 11 SUSTAINABLE CITIES AND COMMUNITIES, 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

එය වැදගත් වන්නේ ඇයි

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනයට ප්‍රමුඛත්වය දීම අපගේ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය සහ පක්ෂපාතිත්වය ගොඩනංවයි, සදාචාරාත්මක මෙහෙයුම් සහතික කරයි, ප්‍රජාවට සහ පරිසරයට කල් පවත්නා බලපෑමක් ඇති කරයි.

සම්පත් විභජනය

- අත්‍යාවශ්‍ය දෑ (ඉන්ධන සහ ගෑස්) ආනයනය සඳහා ඇ. ඩො. බිලියන 3.0 ක් වෙන් කිරීම.
- ප්‍රජා සහභාගීත්වය සඳහා රු. මිලියන 129.7 ක ආයෝජනයක්.
- 2023 අවසන් වන විට සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා 52 ක්.
- ESMS පරීක්ෂාව සඳහා නිලධාරීන් 1,126 දෙනෙකු පුහුණු කර ඇත.

ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන්

- වඩා හොඳ සන්නද්ධ ශ්‍රම බලකායක්; ව්‍යාපාරික හවුල්කරුවන්, නියාමකයින් සහ ප්‍රජාවන් සමඟ සබඳතා වැඩිදියුණු කිරීම සහ ධනාත්මක පාරිසරික බලපෑමක් ප්‍රධාන ප්‍රවාහයේ තිරසාර වර්ධනයට ප්‍රාග්ධන වෙන් කිරීම සහ ලංකා බැංකුවෙහි තිරසාර මූල්‍ය මාර්ග සිතියම සමඟ සමපාත වීම, සන්නාම පැවැත්ම සහ සාධාරණත්වය වැඩිදියුණු කිරීමට හේතු වී ඇත.

ප්‍රාග්ධනයට බලපෑම

මූල්‍ය ප්‍රාග්ධනය (+/-), නිෂ්පාදිත ප්‍රාග්ධනය (+), මානව ප්‍රාග්ධනය (+), බුද්ධිමය ප්‍රාග්ධනය (+), සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය (+), ස්වාභාවික ප්‍රාග්ධනය (+)

2023 ප්‍රතිඵල

ආර්ථික වටිනාකමක් ඇති කිරීම	රු. බිලියන 144.1
කාබන් පියසටහන් අඩු කිරීම	28%
පුනර්ජනනීය බලශක්ති උත්පාදනය	3,245.3 MWh
නැණපජය ප්‍රතිලාභීන්ට ශිෂ්‍යත්ව	2,872
රන් කැකුළු ගිණුම් හිමියන්ට හපනා 5 ශිෂ්‍යත්ව	12,459

2024 අවධානය

- වෙළඳපළ නායකත්වය පවත්වාගෙන යාම
- විදේශීය ශාඛාවල මෙහෙයුම් වේගවත් කිරීම
- තිරසාර බැඳීම් වැඩි දියුණු කිරීම

ගනුදෙනුකාර අත්දැකීම්හි විශිෂ්ටත්වය

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා: M1, M2, M4

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක: 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE, 10 REDUCED INEQUALITIES, 11 SUSTAINABLE CITIES AND COMMUNITIES

එය වැදගත් වන්නේ ඇයි

අපගේ ගනුදෙනුකරුවන් අප කරන සෑම දෙයකම හරය වේ. මේ අනුව, ඔවුන්ගේ පරිණාමය වෙමින් පවතින අවශ්‍යතා සහ වුවමනා අවබෝධ කරගෙන ඒ සඳහා පුද්ගලාරෝපිත විසඳුම් ලබා දෙමින් ඔවුන්ගේ මූල්‍ය ඉලක්ක සපුරාලීමට අපි කැපවී සිටිමු.

සම්පත් විභජනය

- දේපළ, පිරියත සහ උපකරණ සඳහා රු. බිලියන 3.2 ක ආයෝජනයක්
- ශාඛා 42 ක් නවීකරණය කර ඇත.
- ගනුදෙනුකාර සේවා සම්බන්ධයෙන් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් 35 ක්.
- ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 1,210 ක් පවත්වන ලදී.
- නැවත සැලසුම් කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන්ට විවිධ සහන.

ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන්

- ගෙවීම් කල්දැමීම, පොළී අනුපාත අඩු කිරීම් ආදිය හේතුවෙන් මූල්‍ය ප්‍රාග්ධනයට බලපෑම් විල්ල විය.
- මෙම ක්‍රියාවන් අපගේ ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට සහ අපගේ සන්නාම ප්‍රතිරූපය ශක්තිමත් කිරීමට උපකාරී විය.
- ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම මගින් දිවයින පුරා අපගේ පැවැත්ම ශක්තිමත් කිරීම.

ප්‍රාග්ධනයට බලපෑම

මූල්‍ය ප්‍රාග්ධනය (-), නිෂ්පාදිත ප්‍රාග්ධනය (+), සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය (+), බුද්ධිමය ප්‍රාග්ධනය (+)

2023 ප්‍රතිඵල

ශුද්ධ ප්‍රවර්ධක ලකුණු (NPS)	33%
ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ ලකුණු (CSAT)	79%
අත්පත් කරගත් නව ගනුදෙනුකරුවන් ගණන	1,045,000
ඉලක්ක වෙළඳපළ ප්‍රතිශතය	73%
ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන	2,241

2024 අවධානය

- පිරිවැටුම් කාලය වැඩි දියුණු කිරීම
- තරුණ පරම්පරාවට ආකර්ෂණය වන නිෂ්පාදන හඳුන්වා දීම

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා: M1

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක: 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE; 11 SUSTAINABLE CITIES AND COMMUNITIES

එය වැදගත් වන්නේ ඇයි

පහසුව ප්‍රමුඛ වන යුගයක, ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම්, මෙහෙයුම් විධිමත් කිරීම සහ නව්‍ය මූල්‍ය නිෂ්පාදන සහ සේවා හඳුන්වා දීම වැඩිදියුණු කිරීම සඳහා අති නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම වඩාත් යෝග්‍ය බව අපි විශ්වාස කරමු.

සම්පත් විභජනය

- ඩිජිටල් යටිතල පහසුකම් සඳහා රු. බිලියන 1.4 ක ආයෝජනයක්
- මුදල් චක්‍රීකරණ යන්ත්‍ර 163 ක් ස්ථාපනය කර ඇත.
- නව POS යන්ත්‍ර 1,026 ක්
- නව IPG වෙළඳුන් 156 ක්

ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන්

- සයිබර් ආරක්ෂණය ඇතුළු බැංකුවේ ඩිජිටල් යටිතල පහසුකම් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ආයෝජන සිදු කරන ලදී.
- මෙම ආයෝජන මගින් පිරිවැය ඉතිරිකිරීම්, ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම, ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ ක්‍රියාවලි කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සිදු කරයි.

ප්‍රාග්ධනයට බලපෑම

මූල්‍ය ප්‍රාග්ධනය (-) | නිෂ්පාදිත ප්‍රාග්ධනය (+) | මානව ප්‍රාග්ධනය (+) | බුද්ධිමය ප්‍රාග්ධනය (+) | සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය (+)

2023 ප්‍රතිඵල

ඩිජිටල් ගනුදෙනු පරිමාවේ වර්ධනය	8%
ගනුදෙනුකරුවන්ගේ අතථ්‍ය වේදිකා සඳහා ප්‍රවේශය	778,427
ඩිජිටල් සක්‍රීය ගනුදෙනුකරුවන්	34%
අතථ්‍යව සක්‍රීය ගනුදෙනුකරුවන්	19%

2024 අවධානය

- ක්‍රියාවලි විධිමත් කිරීම
- දත්ත පදනම් වූ සංස්කෘතිය
- ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් භාවිතය වැඩි කිරීම

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා: M2

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක: 8 DECENT WORK AND ECONOMIC GROWTH

එය වැදගත් වන්නේ ඇයි

ගුණාත්මක ණය කළඹක් මූල්‍ය ස්ථාවරත්වයට සමාන වේ. එය වත්කම්වල ගුණාත්මකභාවය සහ බැංකුවේ ණය අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිළිබිඹු කරයි.

සම්පත් විභජනය

- රු. බිලියන 3.4 ක ණය සහන ලබා දී ඇත.
- පුහුණු වැඩසටහන් 58 ක් පවත්වන ලදී.
- BRRU විසින් කළමනාකරණය කරනු ලබන ගනුදෙනුකාර මුදල් ප්‍රවාහයන් රු. බිලියන 38.8 කි.
- ප්‍රතිසාධන වැඩමුළු 21 ක් පවත්වන ලදී.
- BRRU යටතේ ගනුදෙනුකරුවන් 174 දෙනෙකුට සහාය විය.

ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන්

ව්‍යාපාර, එහි ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශයේ කොටසක් ලෙස මූල්‍ය ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය යන දෙකම වෙන් කිරීම මගින් බැංකුව පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපනය සඳහා ප්‍රමුඛත්වය ලබා දුන්නේය

ප්‍රාග්ධනයට බලපෑම

මූල්‍ය ප්‍රාග්ධනය (+/-) | මානව ප්‍රාග්ධනය (+) | සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය (+)

2023 ප්‍රතිඵල

ණය හා අත්තිකාරම් වටිනාකම	රු. ට්‍රිලියන 2.5 කි
අඩියර 3 ණය අනුපාතය	5.1%
පුනර්ජීවනය වූ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව	174

2024 අවධානය

- අඩියර 3 ණය සහ අත්තිකාරම් අඩු කිරීම
- පුද්ගලික අංශයට ණය දීම වැඩි කිරීම
- හරිත ණය සඳහා වැඩි අවධානයක්

උපායමාර්ග සහ සම්පත් වෙන් කිරීම

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

අදාළ ප්‍රමාණාත්මක මාතෘකා

M3

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

එය වැදගත් වන්නේ ඇයි

අපගේ සේවක ප්‍රජාව කේන්ද්‍රීය ආයතනික සංස්කෘතිය අපගේ අනන්‍යතාවයේ ලකුණ වේ. නවෝත්පාදන සහ නිර්මාණශීලිත්වය වැඩිදියුණු කිරීම සඳහා අපගේ ශ්‍රම බලකායට විවිධත්වය සහ සමානාත්මතාවය ඇතුළත් කිරීම මඟින් අනාගත සේවා ස්ථානයන් සුවිශේෂී ස්ථානයක් කිරීමට අපේක්ෂිතය.

සම්පත් විභජනය

- රු. බිලියන 29.8 ක් වේතන සහ ප්‍රතිලාභ සඳහා ආයෝජනය කර ඇත.
- රු. මිලියන 200.1 ක් පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කර ඇත.
- රු. මිලියන 183.4 ක් කාර්ය මණ්ඩල ආරක්ෂාව සහ යහපැවැත්ම සඳහා ආයෝජනය කර ඇත.

ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන්

- අනෙකුත් ප්‍රතිලාභ අතර, ඉහළ යන ජීවන වියදමට අනුකූලව වේතන සකස් කිරීම සඳහා මූල්‍ය ප්‍රාග්ධනය සහ සහනදායී මිල ගණන් යටතේ ණය සහ අත්තිකාරම් වෙන් කරන ලදී. එවැනි ආයෝජන මගින් සේවක පක්ෂපාතිත්වය, ගනුදෙනුකාර සේවා/ අත්දැකීම් ඉහළ නැංවීමට සහ වැඩි ඵලදායිතාවයක් සහ කාර්යක්ෂමතාවයක් ඇති කිරීමට අපට හැකියාව ලැබී ඇත.

ප්‍රාග්ධනයට බලපෑම

මූල්‍ය ප්‍රාග්ධනය | මානව ප්‍රාග්ධනය | බුද්ධිමය ප්‍රාග්ධනය | සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

2023 ප්‍රතිඵල

රඳවා ගැනීමේ අනුපාතය	95%
සේවකයෙකු සඳහා සාමාන්‍ය පුහුණු පැය	32
සේවකයෙකු සඳහා ශුද්ධ ලාභය	රු. මිලියන 3.1
කාන්තා නියෝජනය	60%

2024 අවධානය

- ඵලදායිතාව වැඩි දියුණු කිරීම
- බැංකුවේ මානව සම්පත අතථ්‍ය පරිසරය සඳහා සූදානම් කිරීම
- සේවක යහපැවැත්ම වැඩි කිරීම

මූල්‍යමය සේවා සහාය

රටේ ප්‍රමුඛතම බැංකුවක් ලෙස, ලංකා බැංකුව ක්ෂේත්‍රයේ සංගම් සහ වෘත්තීය ආයතනවල සාමාජිකත්වය හරහා ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සමඟ සක්‍රීයව සහයෝගයෙන් කටයුතු කරයි. මෙම ආයතනවල බැංකුවේ සාමාජිකත්වය ක්ෂේත්‍රයේ, මූල්‍ය සේවා අංශය සහ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි සංවර්ධනයට දායක වේ. මෙම සංගම්වල බැංකුවේ සාමාජිකත්වය ක්ෂේත්‍රයේ ප්‍රතිලාභය සඳහා ශක්තිය සහ හවුල්කාරිත්වය උපයෝගී කර ගැනීමට අවස්ථාවකි.


- ආසියා පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය සංගමය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය
- බයෝ ඩයිවර්සිටි ආයතනය ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (සීමාසහිත) සමාගම
- ශ්‍රී ලංකා බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමය
- ශ්‍රී ලංකා නීති විද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමය

තිරසාර බවට අනුගත වීම

ආර්ථික පරිවර්තනය, ඩිජිටල් ප්‍රගතිය සහ තිරසාර මෙහෙයුම් යන උපායමාර්ග තුන හරහා ආර්ථික, පාරිසරික, සමාජීය සහ යහපාලන අවශ්‍යතා මෙහෙයවීමට අපගේ කැපවීම මත ලංකා බැංකුවෙහි තිරසාරභාවය බැංකුවේ උපායමාර්ගයට ඒකාබද්ධ වේ. පාර්ශ්වකරුවන් පාරිසරික, සමාජීය සහ යහපාලන (ESG) ගැටළු සහ රෙගුලාසි අඛණ්ඩව ශක්තිමත් කිරීම සඳහා වැඩි වැදගත්කමක් ලබා දෙන බැවින්, බැංකුවේ තිරසාර අරමුණු, යහපාලන ව්‍යුහය සහ වාර්තාකරණය බැංකුවේ තිරසාර ප්‍රතිපත්තිය මගින් බැංකුවේ සියලු මෙහෙයුම් කටයුතු වලට අනුබද්ධ කිරීමට කටයුතු කර ඇත.


දිවයින පුරා විහිදුන ප්‍රවේශයක් ඇති රාජ්‍ය බැංකුවක් ලෙස, අපගේ අභිලාෂය වන්නේ තිරසාර මූල්‍යකරණයේ වෙළඳපළ ප්‍රමුඛයා වීම, මූල්‍ය ඇතුළත් කිරීම් මෙහෙයවීම සහ ප්‍රජාවේ සියලුම කොටස්වලට මූල්‍ය ප්‍රවේශය ඇති බවට වග බලා ගැනීමයි. අප ඉහත අභිලාෂය ලුහුබඳින අතරම, අපගේ මෙහෙයුම්වල සෑම අංශයකටම තිරසාර බව ඒකාබද්ධ කරමින් කාබන් මධ්‍යස්ථ ආයතනයකට සංක්‍රමණය වීමට සවිඥානික පියවර ගනිමින් සිටිමු. වසර තුළදී, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDGs) කෙරෙහි තව තවත් අනුගත වෙමින් ගෝලීය අභියෝග සඳහා සාර්ථකව මුහුණදීමට බැංකුව කැපවීමෙන් කටයුතු කරයි.

තිරසාර රාමුව



තිරසාර බවට අනුගත වීම

තිරසාර පාලනය



වැඩිදුර විස්තර සඳහා පිවිසෙන්න https://www.boc.lk/sustainability-framework

සේවක මණ්ඩලයේ ශක්‍යතාවයන් ගොඩනැඟීම

ලංකා බැංකුව බැංකුවේ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති (ESMS) ප්‍රතිපත්තියට අනුකූලව ලංකා බැංකුවෙහි ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) යටතේ ක්‍රියාත්මක ESMS අංශයේද සහයෝගය ඇතිව, සේවක මණ්ඩලයේ විභවතාවය ගොඩනැඟීම සඳහා අඛණ්ඩව ආයෝජනය කරයි. බැංකුව 2023 දී ආයතනික කළමනාකාරිත්වයේ ඉහළම ස්ථරයේ සිට බැංකුවේ ණය නිලධාරීන් සහ සම්බන්ධතා නිලධාරීන් දක්වා සේවකයින්ගේ දැනුවත්භාවය ගොඩනැඟීම සඳහා අභ්‍යන්තර හා බාහිර සම්පත් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් උපයෝගී කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් සිදු කරන ලදී.

ESG උපායමාර්ගය, ESG අවදානම් කළමනාකරණය සහ ESG වාර්තාකරණයට සහ බැංකුවේ පරිපූර්ණ ESG පුනර්ජීවනය සඳහා ESG උපදේශකයෙකු පත් කළ පළමු වාණිජ බැංකුව ලංකා බැංකුව වේ.

උපායමාර්ගික හවුල්කාරිත්වයන්


විශ්වවිද්‍යාල කිහිපයක්, පරිසර සංවිධාන සහ වෙළඳ ප්‍රජාව සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, සංකීර්ණ අභියෝග වලට මුහුණ දීමට අවශ්‍ය විවිධ ඉදිරි දර්ශන, විශේෂඥ දැනුම සහ සම්පත් ඒකාබද්ධ කිරීම සහ ESG මූලපිරීම් සම්බන්ධව බැංකුව අඛණ්ඩව කටයුතු කරයි.

- සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)
- ශ්‍රී ලංකා පෙව විවිධත්ව ආයතනය (BSL)
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

තිරසාර වාර්තාකරණය

බැංකුව සිය වාර්ෂික ඒකාබද්ධ වාර්තාව සහ ආයතනික වෙබ් අඩවිය පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා වලට ප්‍රතිචාර දැක්වීම, ප්‍රමාණාත්මක තක්සේරු කිරීම් සහ කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් ඇතුළුව එහි තිරසාර උපායමාර්ග ගෙනහැර දැක්වීමේ මූලික මාධ්‍යයක් ලෙස භාවිතා කරයි. මෙම වාර්තාවේ අඩංගු තිරසාර දර්ශක සම්පාදනය කිරීමට අදාළ වන දත්ත, මිනුම් ක්‍රම, ගණනය කිරීමේ ක්‍රමවේද, උපකල්පන සහ ඇස්තමේන්තු, ජාත්‍යන්තර වාර්තාකරණ රාමු, හොඳම භාවිතයන් සහ GRI ප්‍රමිතියට අනුකූල වන අතර ESG/තිරසාර තොරතුරු පිළිබඳ බාහිර සහතික කිරීම් ඇතුළත් වේ.

UN SDGs සහ අනෙකුත් ගෝලීය වශයෙන් පිළිගත් හරිත බැංකු මූලධර්ම සමඟ අනුකූලව එහි මෙහෙයුම්, නිෂ්පාදන සහ සේවා හරහා තිරසාරත්වය ඉදිරියට ගෙන යාමට බැංකුවේ කැපවීම පිළිබඳ විස්තර පසු කොටස් මඟින් සපයයි.



ආර්ථික පරිවර්තනය

තිරසාර මූල්‍යකරණය තුළින් ගනුදෙනුකරුවන්/ව්‍යාපාරයන් සවිබල ගැන්වීමට සහ යලි ශක්තිමත්ව නැඟී සිටීමට සහාය දැක්වීම.

අපගේ කැපවීම	කාර්යසාධන දර්ශක	තිරසාර සංවර්ධන ඉලක්ක
2023 දී නිකුත් කරන ලද මුළු හරිත මූල්‍ය ණය	2023 දී ලබා දුන් මුදල රු. මිලියන 530.9 2023.12.31 දිනට ශේෂය රු. මිලියන 5,028.6	13 CLIMATE ACTION
කාන්තාවන් ප්‍රමුඛ ව්‍යාපාර සඳහා දුන් ක්ෂුද්‍ර මූල්‍ය ණය	කාන්තා මූලික ව්‍යාපාර සඳහා ණය වලින් 30% ක් ලබා දී ඇත (31% : 2022)	5 GENDER EQUALITY, 10 REDUCED INEQUALITIES



ඩිජිටල්කරණයේ ප්‍රගතිය

ඉහළම ආරක්ෂාව පවත්වා ගනිමින් අපගේ නිෂ්පාදන සහ සේවා සඳහා ප්‍රවේශය වැඩි කිරීම

අපගේ කැපවීම	කාර්යසාධන දර්ශක	තිරසාර සංවර්ධන ඉලක්ක
ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සඳහා ආයෝජනය	රු. බිලියන 1.4 (2022 : රු. බිලියන 1.8)	9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
දත්ත කඩකිරීම් සංඛ්‍යාව භෞතිකව සිදුකරන ගනුදෙනුවලට වඩදිරිව ඩිජිටල් ගනුදෙනු	කිසිවක් නැත (2022 : කිසිවක් නැත)	



තිරසාර මෙහෙයුම්

අපගේ ජනතාවගේ හැකියාවන්, යහපැවැත්ම සහ විවිධත්වය සඳහා ආයෝජනය කිරීම, ස්වභාවික පරිසරයට අපගේ බලපෑම අවම කිරීම සහ වගකිවයුතු සහ සදාචාරාත්මක ව්‍යාපාර සහ සැපයුම් දාමයක් ක්‍රියාත්මක කිරීම.

අපගේ කැපවීම	කාර්යසාධන දර්ශක	තිරසාර සංවර්ධන ඉලක්ක
දේශීය සැපයුම්කරුවන් සඳහා ගෙවීම්	රු. බිලියන 8.6 ක් දේශීය සැපයුම්කරුවන් සඳහා ගෙවීම	8 DECENT WORK AND ECONOMIC GROWTH
ප්‍රජා සංවර්ධනය සඳහා ආයෝජනය	රු. මිලියන 129.7 (2022 : රු. මිලියන 60.1)	11 SUSTAINABLE CITIES AND COMMUNITIES
BOC ගම්මාන ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීම	රු. මිලියන 5.4 (2022 : රු. මිලියන 2.5)	10 REDUCED INEQUALITIES
BOC මිතුරු ක්ෂුද්‍ර ණය කණ්ඩායම් සඳහා අරමුදල් සම්පාදනය	රු. මිලියන 77.9 (2022 : රු. මිලියන 59.4)	1 NO POVERTY, 2 ZERO HUNGER

ඉදිරි දැක්ම

තිරසාරත්වය ඉදිරියට ගෙන යාම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. අපි අනාගතය දෙස බලන විට, අපගේ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීමටත්, වැඩි විනිවිදභාවයක් සහ වගවීමක් සැපයීම සඳහා අපගේ තිරසාර රාමුව යාවත්කාලීන කිරීමටත් අපි බලාපොරොත්තු වෙමු.

තිරසාර න්‍යාය පත්‍රයේ දක්වා ඇති අනුමත මූලපිරීම් සහ සන්ධිස්ථාන ක්‍රියාත්මක කිරීමේදී අපගේ නායකත්වය සියුම් ප්‍රවේශයක් අනුගමනය කරනු ඇත. මූලික කරුණු ක්‍රියාත්මක වූ පසු, නියමිත ඉලක්ක සපුරා ගැනීම සහ ඒවා පවත්වා ගැනීම සඳහා තිරසාර වැඩසටහන් වඩාත් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඔවුන් අවධානය යොමු කරනු ඇත. අපගේ තිරසාර සැලැස්ම සංවර්ධනය කිරීමේදී එහි ඇති බාහිර අභියෝග සැලකිල්ලට ගත යුතුය.

වෙළඳපළේ සංකීර්ණතා සමඟ ඉදිරියට යාමට, අපගේ අභ්‍යන්තර ව්‍යුහය සහ බැංකුව සතු හැකියාවන් සහ සම්පත් ප්‍රමාණවත් බව අපි සහතික කරමු. මෙය කාලෝචිත හා ඵලදායී ආකාරයෙන් අප වෙත පැමිණිය හැකි අවදානම් සහ අවස්ථාවන් විසඳීමට අපට උපකාර කරනු ඇත.

ඉදිරියේදී තිරසාරභාවය අපගේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ගයේ මූලික අංගයක් ලෙස තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ටද, ආයෝජන ප්‍රමුඛතා සහ සම්පත් වෙන් කිරීම් ආදියේදී ද සැලකිල්ලට භාජනය වනු ඇත. අපගේ පවතින තිරසාර මූලපිරීම් සහ භාවිතයන් උපරිමයෙන් ප්‍රයෝජනයට ගනිමින් විවෘතව සහ නම්‍යශීලීව වගකීම් සහගතව කටයුතු කරනු ඇත.

අපගේ ව්‍යාපාරික ආකෘතිය

යෙදවුම්

මූල්‍ය ප්‍රාග්ධනය

කොටස් හිමියාගේ අරමුදල්
රු. බිලියන 251.7

තැන්පතු
රු. ට්‍රිලියන 3.9

ණය ගැනීම්
රු. බිලියන 176.9

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන
2,241

ස්ථාවර වත්කම්වල ආයෝජනය
රු. බිලියන 2.3

මානව ප්‍රාග්ධනය

සේවකයින්
8,579

පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය
රු. මිලියන 200.1

බුද්ධිමය ප්‍රාග්ධනය

සන්නාම සංවර්ධනය සඳහා ආයෝජනය
රු. මිලියන 1,082.6

සේවා පළපුරුද්දේ සාමාන්‍ය
අවුරුදු 11

ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය
රු. බිලියන 1.4

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

පක්ෂපාතී සහ විශාල ගනුදෙනුකාර පදනම
මිලියන 16.0

විදේශ රටවල නියෝජිත බැංකු සබඳතා
763

ලියාපදිංචි සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්
536

ස්වභාවික ප්‍රාග්ධනය

බලශක්ති පරිභෝජනය
මෙගා වොට් පැය 22,726.0

ජල පරිභෝජනය
ඝන මීටර 325,613.0

බැංකුව විසින් භාවිතා කරන ලද භූමි ප්‍රදේශය
අක්කර 47


අපගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්



අපගේ දැක්ම

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකික සළකුණ බවට පත්වෙමින් ගනුදෙනුකාර කේන්ද්‍රීය නව්‍ය මූල්‍ය පහසුකම් පිරිනමමින් ජාතියේ බැංකුකරුවා වීම

අපගේ ප්‍රධාන බැංකු කටයුතු



- ශාඛා බැංකුකරණය
- ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය
- ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්

අපි සපයන සේවාවන්

- ණය දීම්
- ප්‍රතිමූල්‍යකරණය
- ගනුදෙනුකාර බැංකු සේවා සහ ගෙවීම් සේවා
- තැන්පතු භාර ගැනීම්
- අරමුදල් කළමනාකරණය
- භාරකරු ආයෝජන කළඹ කළමනාකරණ සහ භාරකරු සේවා
- ආයෝජන බැංකුකරණය
- විදේශ විනිමය සහ සුරැකුම්පත් කළමනාකරණය
- උපදේශන සේවා
- වෙළඳ සේවා

පාදක වන

- ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය
- ගනුදෙනුකාර අත්දැකීමිහි විශිෂ්ටත්වය
- ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය
- ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය
- කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

උපායමාර්ගික ප්‍රමුඛතා

අපගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් අපගේ ගනුදෙනුකරුවන්ට වඩා හොඳ මූල්‍ය යහපැවැත්මක් ලබා දීම, වඩාත් තිරසාර භාවිතයන් වැලඳ ගැනීම සහ කොටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන අපගේ පාර්ශ්වකරුවන්ට අර්ථවත් වටිනාකමක් ජනනය කිරීම සඳහා යොමු කෙරේ.

ප්‍රතිඵල

ප්‍රාග්ධනයට ප්‍රවේශය

දළ ණය සහ අත්තිකාරම් කළඹ
රු. ට්‍රිලියන 2.5 කි
(2022 - රු. ට්‍රිලියන 2.6)

ශක්තිමත් ආයෝජන කළඹ

අරමුදල් කළමනාකරණ කළඹ
රු. ට්‍රිලියන 1.7 කි
(2022 - රු. ට්‍රිලියන 1.6)

ආයෝජන වලින් ලද පොළී ආදායම
රු. බිලියන 189.7 කි
(2022 - රු. බිලියන 146.0)

මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය

සිදු කරන ලද ගනුදෙනු
ප්‍රමාණය රු. මිලියන 613.5 කි
(2022 - රු. මිලියන 620.5)

නව/නවීකරණය කරන ලද ශාඛා
42 (2022 - 61)

සේවක ප්‍රතිලාභ, පුහුණු හා සංවර්ධන

සේවක වැටුප්, වේතන සහ දිරි දීමනා
රු. බිලියන 29.8 කි
(2022 - රු. බිලියන 29.0)

සාමාන්‍යයෙන් එක් සේවකයෙකු සඳහා ලබා දුන් පුහුණු පැය
32 (2022 - 16)

ඩිජිටල් බැංකුකරණය

ඩිජිටල් නාලිකා හරහා සිදුවන ගනුදෙනු **43%** (2022 - 48%)

සම්පත් වෙන් කිරීම සහ ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන්

ශක්තිමත් ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණය

ප්‍රතිලාභ

මූල්‍ය ප්‍රාග්ධනය

කොටසක ඉපැයීම්
රු. **1,068** කි

උත්පාදනය කරන ලද ලාභය (බදු පෙර ලාභය)
රු. බිලියන **40.3**

ශේෂ පත්‍රයේ ශක්තිය
රු. ට්‍රිලියන **4.4**

නිෂ්පාදිත ප්‍රාග්ධනය

රජයට දායකත්වය
රු. බිලියන **25.9**

ස්ථාවර වත්කම්වල වටිනාකම
රු. බිලියන **42.6**

කාර්ය මණ්ඩල උසස් කිරීම්
946

මානව ප්‍රාග්ධනය

නව බඳවා ගැනීම්
764

රඳවා ගැනීමේ අනුපාතය
95%

සමස්ත ස්ත්‍රී පුරුෂ අනුපාතය (ස්ත්‍රී:පුරුෂ) **60:40**

බුද්ධිමය ප්‍රාග්ධනය

සන්නාම වටිනාකම
රු. බිලියන **50.2**

සම්මාන හා ඇගයීම්
18

ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලි
28

ඩිජිටල් සක්‍රීය ගනුදෙනුකරුවන්
34%

ඩිජිටල් ගනුදෙනු වර්ධනය
16%

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

ශුද්ධ ප්‍රවර්ධක ලකුණු අනුපාතය
33%

ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ ලකුණු
79%

පරිසරය හා සමාජ කළමනාකරණ පද්ධතියට අනුකූලව සපයන ලද ණය ප්‍රමාණය
රු. බිලියන **1.1**

ස්වභාවික ප්‍රාග්ධනය

හරිත මූල්‍යකරණය යටතේ නව පහසුකම්
රු. මිලියන **530.9**

සූර්ය බලශක්තිය නිපදවීම
මෙගා වොට් පැය **3,245.3**

කාබන් පියසටහන් අඩු වීම
28%

තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය

8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
3 GOOD HEALTH AND WELL-BEING
5 GENDER EQUALITY
10 REDUCED INEQUALITIES
11 SUSTAINABLE CITIES AND COMMUNITIES
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS
6 CLEAN WATER AND SANITATION
7 AFFORDABLE AND CLEAN ENERGY
13 CLIMATE ACTION
14 LIFE BELOW WATER
15 LIFE ON LAND

එකතු කළ අගය මත ප්‍රකාශය

බැංකුවේ අගය එක් කිරීම සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා එම අගය විසර්ජනය වන ආකාරය පිළිබඳව විශ්ලේෂණයක් පහත දැක්වේ.

	2023	2022	වෙනස
	රු. මිලියන	රු. මිලියන	%
එකතු කළ අගය			
බැංකු කටයුතු සේවා සැපයීමෙන් ලද ආදායම	545,800	494,578	10
සේවා සැපයීමේ පිරිවැය	(403,034)	(252,715)	59
බැංකු සේවා තුළින් එකතු කළ අගය	142,766	241,863	(41)
බැංකු සේවා නොවන ආදායම	(3,613)	18,571	(119)
ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ වෙන් කිරීම්	4,906	(87,156)	(106)
	144,059	**173,278**	**(17)**
අගය විසර්ජනය			
සේවකයින්ට			
වැටුප්, වේතන සහ අනෙකුත් ප්‍රතිලාභ	**29,818**	**28,991**	**3**
රජයට			
ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ	173	346	(50)
ආදායම් බදු	13,111	13,550	(3)
අධිභාර බද්ද	-	6,739	(100)
මූල්‍ය සේවා සඳහා බදු	12,664	11,313	12
	25,948	**31,948**	**(19)**
ප්‍රජාව වෙත			
සමාජ වගකීම් ව්‍යාපෘති	**130**	**60**	**117**
බාහිර අරමුදල් සපයන්නන්ට			
සෙසු ණය ගැනීම උදෙසා පොළිය	45,200	89,293	(49)
නිකුත් කළ ණයකර සඳහා පොළිය	12,052	8,358	44
	57,252	**97,651**	**(41)**
ව්‍යාපෘති හා වර්ධනය උදෙසා			
රඳවාගත් ලාභය	26,520	31,626	(16)
අධිභාර බද්ද	-	(6,739)	(100)
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	3,853	4,287	(10)
විලම්බිත බදු	538	(14,546)	(104)
	30,911	**14,628**	**111**
	144,059	**173,278**	**(17)**



4

මූල්‍ය ශක්තිය සහ මූල්‍ය ස්ථායීතාව අඛණ්ඩව පවත්වා ගැනීම

විවිධ කිරණ කළඹකින් සමන්විත වූ හිරු කිරණ පරිසරයට ගතිකත්වයක් ආරෝපණය කරන අතර විශ්වය ජව සම්පන්න කරමින් විශ්වයටම ජීවය දෙයි. උණුසුම සහ ආලෝකය සපයමින් හිරුගේ, සෑම කිරණයක්ම විශ්ව පරිණාමයේ සහ එහි අන්තර් සම්බන්ධතාව පිළිබඳ අරුත පවසමින්, විශ්වයේ අසීමිත සුන්දරත්වය සහ සංකීර්ණත්වය අපට මතක් කරවයි.

අපගේ වැඩි දියුණු කල නිෂ්පාදන සහ සේවා කළඹ, විවිධ පරාසයන්හි පුද්ගලයන් සහ ව්‍යාපාරික ආයතනයන්හි අභිලාෂයන් සවිබල ගැන්වීම සඳහා මූල්‍ය විසඳුම් ලබා දෙමින් අඛණ්ඩ ඉදිරි ගමනකට ඔවුන්ට ශක්තියක් සපයයි.

මූල්‍ය සමාලෝචනය



අභියෝගාත්මක වෙළඳපළ තත්ත්වයන් මධ්‍යයේ වුවද, බැංකුවේ පාර්ශ්වකරුවන්ට අභිතකර බලපෑම් අවම කරමින් බැංකුවේ ස්ථාවරත්වය පවත්වා ගැනීම සහතික කිරීමට ලංකා බැංකුව සාධනීය පියවර රාශියක් ගන්නා ලදී. 'ජාතියේ මහා පහන් ටැඹ' ලෙස අපගේ මූල්‍ය ප්‍රාග්ධනය ක්‍රමානුකූලව වෙන් කිරීම සහ අපගේ උපායමාර්ග විචක්ෂණශීලීව ක්‍රියාත්මක කිරීම තුළින් ආර්ථිකය පුනර්ජීවනය කිරීමට සහ ස්ථාවර කිරීමට විශාල උත්සාහයක් දරා ඇත. අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් යටතේ ඉහළට නැඟී සිටි බැංකුව, ශක්තියේ බලවේගයක් ලෙස නැඟී සිටිමින්, අඛණ්ඩව ධනාත්මක මූල්‍ය ප්‍රතිඵල ලබා දෙමින්, රු. බිලියන 40.3 ක බදු පෙර ලාභයක් සමඟින් සාර්ථකව වසර අවසන් කළේය.

කොටස් හිමියන් සඳහා වටිනාකම

10.6% (2022: 14.1%)
ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය

උපායමාර්ගික කාර්යසාධනය

රු. බිලියන 542.2 (2022: රු. බිලියන 513.1)
ආදායම

රු. බිලියන 40.3 (2022: රු. බිලියන 31.0)
බදු පෙර ලාභය

30% (2022 : - 28%)
බදු පෙර ලාභයේ වර්ධනය

තැන්පතු හා ණය

රු. ට්‍රිලියන 3.9 (2022: රු. ට්‍රිලියන 3.3)
තැන්පතු

රු. ට්‍රිලියන 2.5 (2022: රු. ට්‍රිලියන 2.6)
දළ ණය සහ අත්තිකාරම්

ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාව

12.8% (2022 : 12.4%)
ස්ථර 1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය


316% (2022 : 169%)
ද්‍රවශීලතා ආවරණ අනුපාතය

අවදානම් පැතිකඩ

5.1% (2022 : 5.3%)
අදියර 3 අවධියේ ණය අනුපාතය

60.4% (2022 : 59.7%)
අදියර 3 ණය සහ අත්තිකාරම් සඳහා ණය හානිකරණ ප්‍රතිපාදන වෙන් කිරීම්

- 2021 සහ 2022 දී අස්ථාවර සහ දුෂ්කර වසර දෙකකට මුහුණ දුන් ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රය, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාවට නංවන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස 2023 වසරේ අවසාන භාගයේදී යළි සාර්ථකත්වයේ මං සලකුණු පෙන්වන ලදී.
- ආර්ථික උච්චාවචනයන් සහ වෙනස්වන වෙළඳපළ තත්ත්වයන් මධ්‍යයේ, මෙම අංශය අනුවර්තනය වීමේ හැකියාව සහ අප්‍රතිහත ධෛර්යය ප්‍රදර්ශනය කරමින් පරිවර්තනීය අවධියක් පසු කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොළී අනුපාත ලිහිල් කිරීම සහ ණය අවදානම් ස්ථායීකරණය කිරීමත් සමඟ 2023 අවසානය වන විට ක්‍රමානුකූලව ණය සහ අත්තිකාරම් වල වැඩි වීමක් දක්නට ලැබුනු අතර අදියර 3 අවධියේ ණය සහ අත්තිකාරම්වල වර්ධනයේ මන්දගාමීත්වයක් පෙන්නුම් කරන ලදී.




ප්‍රමුඛතා ක්ෂේත්‍ර 01:

ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් ලබා දීම

ශුද්ධ පොළී ආදායම

බැංකුවේ මුළු ආදායමෙන් 97% ක් වන පොළී ආදායම 15% ක වර්ධනයක් සනිටුහන් කරමින් සමාලෝචිත වර්ෂය සඳහා රු. බිලියන 524.8 ක් වාර්තා කරන ලදී.

බැංකුවේ මුළු පොළී ආදායමෙන් 64% ක් ණය සහ අත්තිකාරම් වලින් ලැබෙන පොළී ආදායම වූ අතර එය වසර තුළ 8% ක වර්ධනයක් පෙන්නුම් කරයි. වසරේ මුල් භාගයේදී අත්විඳින ලද ණය සඳහා අඩු ඉල්ලුම ණය සහ අත්තිකාරම් වලින් ලැබෙන පොළී ආදායමට සෘණාත්මකව බලපෑ අතර, ණය සහ තැන්පතු අනුපාතය 2022 වසර අවසානයේ අනුපාතය වූ 78% සිට 2023 වසර අවසානයේ 63% දක්වා පහත වැටීමෙන් මෙය තහවුරු වේ.




බැංකුවේ අතිරික්ත ද්‍රවශීලතාවය, පොළී උපයන ආයෝජන වත්කම්වල ආයෝජනය කිරීම නිසා ආයෝජන වලින් ලැබෙන පොළී ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව 30% කින් වැඩි විය.

සමාලෝචිත වර්ෂය තුළ පොළී වියදම් රු. බිලියන 433.6 දක්වා 31% කින් වර්ධනය විය. මුළු පොළී වියදම් වලින් 87% ක් වූ තැන්පතු සඳහා වන පොළී වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව 63% කින් වර්ධනය විය. කෙසේ වෙතත්, බැංකුව උපායමාර්ගිකව අරමුදල් පිරිවැය කළමනාකරණය කළ බැවින් බැංකුවේ ණය ගැනීමේ පිරිවැය රු. බිලියන 56.1 දක්වා 43% කින් අඩු විය (2022: රු. බිලියන 98.1).

පොළී වියදමේ වර්ධනය, පොළී ආදායමේ වර්ධනය අභිබවා ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රු. බිලියන 91.2 ක ශුද්ධ පොළී ආදායම පහත වැටුණු අතර එය පෙර වසරට සාපේක්ෂව 28% ක අඩුවීමකි. මෙම සංකෝචනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉහළ පොළී අනුපාත යටතේ රැස් කරන ලද ස්ථාවර තැන්පතු නව පොළී අනුපාත මත නැවත අළුත්වැඩියාවට කල්පිරීම් කාලය ඉදිරියට තිබීමයි. කෙසේ වෙතත් පොළී අනුපාත ඉහළ යාමේ අහිතකර බලපෑමෙන් ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීමට දැඩි උත්සාහයක් ගන්නා ලදී. විචල්‍ය පොළී අනුපාත සහිත ණය, වෙළඳපළ පොළී අනුපාත වැඩිවීමට අනුකූලව මුළුමනින්ම වෙනස් නොකිරීමට බැංකුව වග බලා ගත් අතර ස්ථාවර පොළී අනුපාත සහිත ණය සහ අත්තිකාරම් වලද පොළී අනුපාත ඵලෙසම පවත්වා ගන්නා ලදී. බැංකුව විසින් පොළී අනුපාතවල ඉහළ යාම මුළුමනින්ම ගනුදෙනුකරුවන් වෙත විතැන් නොකළ අතර, ආර්ථික අර්බුදයෙන් පැන නැඟී ඇති අභියෝගාත්මක තත්ත්වයන්ට මුහුණ දෙන ව්‍යාපාර සහ කුටුම්භ සඳහා සැලකිය යුතු මුදලක් ඉතිරි කර දෙමින් ගනුදෙනුකරුවන් වෙත ප්‍රතිලාභ ලබා දෙන ලදී.

ගාස්තු මත පදනම් වූ ආදායම් ලාභ/අලාභ

ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම 8% ක වර්ධනයක් පෙන්නුම් කරමින් වසර අවසානයේ දී රු. බිලියන 17.7 ක් වාර්තා කරන ලදී. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ කාඩ්පත් ගනුදෙනු වල ක්‍රියාකාරකම් වැඩි වීම සහ ශාඛා බැංකුකරණයේ ඩිජිටල් බැංකු සේවා වැඩි වශයෙන් භාවිතා කිරීමයි.



2023 දී, ණය කාඩ්පත් කළඹ රු. බිලියන 9.6 දක්වා රු. බිලියන 2.1 කින් වැඩි විය. ඒ අනුව, ණය සහ හර කාඩ්පත් ගාස්තු ආදායම රු. බිලියන 2.8 කින් වැඩි වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළදී රු. බිලියන 11.6 ක සමුච්චිත මුළු ගාස්තු ආදායමක් කාඩ්පත් ගනුදෙනු මත ලැබිණි. මුළු ගාස්තු ආදායමෙන් 45% ක් නියෝජනය කරමින්, මෙම වර්ධනය පිළිබිඹු කරනුයේ බැංකුව ඩිජිටල්කරණය සඳහා යොමු කරන අඛණ්ඩ අවධානයයි.

වෙනත් අරමුදල් නොවන ආදායම්

වෙනත් අරමුදල් නොවන ආදායම් උත්පාදනය පහත පරිදිවේ.


- විදේශ විනිමය වලින් ලැබෙන වෙළඳ ලාභ/අලාභ, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල සාධාරණ අගයේ වෙනස්වීම්, කොටස් වෙළඳපල ආයෝජන වලින් ලැබෙන ලාභාංශ ආදායම.
- ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය මත වර්ගීකරණය කරන ලද කොටස් සහ ණය උපකරණවල ආයෝජන වලින් අත් කරගත නොහැකි ලාභ/අලාභ.
- මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/අලාභ
- පරිපාලිත සමාගම් වලින් ලැබෙන ලාභාංශ ආදායම, විදේශ ව්‍යවහාර මුදල් වත්කම්/බැරකම් වාර්තා කරන මුදල් වර්ගයට ප්‍රති තක්සේරුකරණයෙන් ලැබෙන ලාභ/අලාභ, කුලී ආදායම

අරමුදල් නොවන ආදායමට වෙළඳ ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ ලාභ සහ ශුද්ධ අනෙකුත් මෙහෙයුම් ආදායම් අහිතකර ලෙස බලපෑ අතර ප්‍රධාන වශයෙන් වසර තුළ රුපියලේ අගය 11% කින් අධිප්‍රමාණය වීමත් සමඟ වාර්තා වූ රු. බිලියන 12.7 ක විනිමය අලාභ හේතු විය (2023: රු. 323.9233, 2022: රු. 363.1100).

කෙසේ වෙතත්, පාස්කු ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික නොසන්සුන්තාව සමඟ 2019 සිට වාර්තා වූ කැපී පෙනෙන පහත වැටීමකින් පසුව කොටස් වෙළඳපළ වර්ධනය වීමට පටන් ගැනීමත් සමඟ කොටස් සහ ඒකක භාර ආයෝජනයන්ගේ වෙළඳපළ ලාභ පෙන්නුම් කරන ලදී.

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභ රු. මිලියන 858.7 ක් වූ අතර මූල්‍ය වත්කම් බැහැර කිරීමෙන් ශුද්ධ ලාභය රු. මිලියන 1,361.9 ක් වර්ෂය තුළ වාර්තා කරන ලදී.

හානිකරණ ප්‍රතිපාදන



මූල්‍ය සමාලෝචනය

වසර ගණනාවක් පුරා අපේක්ෂිත ණය අලාභ ආකෘතිය යටතේ සැලකිය යුතු හානිකරණ ප්‍රතිපාදන පවත්වා ගැනීමට බැංකුව විවක්ෂණශීලී ප්‍රවේශයක් අනුගමනය කළ අතර, 2023 ආරම්භයේදී අදියර 3 අවධියේ ණය සඳහා 60% ක ප්‍රතිපාදන ආවරණයක් පවත්වා ගෙන ඇති අතර එම ආවරණය වසර අවසානය තෙක් පවත්වා ගෙන යන ලදී.

2023 දී, බැංකුව විසින් රු. බිලියන 2.7 ක ණය සහ අත්තිකාරම් සඳහා වූ හානිකරණ ප්‍රතිපාදන ශුද්ධ ප්‍රතිවර්ත්‍යයක් වාර්තා කරන ලදී. ශක්තිමත් ව්‍යාපාර පුනර්ජීවන ක්‍රියාකාරකම්, දැඩි ණය අධීක්ෂණ භාවිතයන් සහ ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය අධිප්‍රමාණය වීම ඇතුළු විවිධ සාධකවල හිතකර බලපෑම මෙම ධනාත්මක ප්‍රතිඵලයට හේතු විය. වාර්තාකරණ කාල සීමාව තුළදී ඉහළ ණය අවදානමක් සහිත අලුතින් හඳුනාගත් ගනුදෙනුකාර අංශ සඳහා අතිරේක ප්‍රතිපාදන සැපයීමේ සිය විවක්ෂණ ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යාමට බැංකුව කටයුතු කරන ලදී.

මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දුන් ගනුදෙනුකරුවන් පුනර්ජීවනය කිරීම සඳහා බැංකුව ගෙන ඇති උපායමාර්ගික ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් අදියර 3 අවධියේ ණය සහ අත්තිකාරම් රු. බිලියන 12.8 කින් අඩු වී ඇත. අදියර 2 අවධියේ ණය රු. බිලියන 64.9 කින් වැඩි වූ අතර අදියර 2 අවධියේ ණය සඳහා ප්‍රතිපාදන ද රු. බිලියන 3.4 කින් වැඩි විය. කළමනාකරණ ආවරණ භාවිතා කරමින්, ඉහළ අවදානම් සහිත කර්මාන්ත හඳුනාගෙන ඇති අතර, එවැනි අංශවල මුළු නිරාවරණයම අදියර 2 යටතේ වර්ගීකරණය කරන ලදී.


ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම පිළිබඳ 2021 අංක 13 දරණ ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානය යටතේ බලපත්‍රලාභී බැංකු අදියර 1 අවධියේ ණය සඳහා අවම වශයෙන් 0.5% ආවරණයක් පවත්වා ගැනීමට අවශ්‍ය වන අතර ලංකා බැංකුව විසින් 2023 අවසානය වන විට 1.7% ආවරණයක් චිනම් නියාමන අවම මට්ටමට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පවත්වා ගෙන ගොස් ඇත.

වාර්තාගත වර්ෂය තුළදී බැංකුව විසින් රු. බිලියන 2.2 ක අනෙකුත් මූල්‍ය උපකරණ සඳහා වූ හානිකරණ ප්‍රතිපාදන ශුද්ධ ප්‍රතිවර්ත්‍යයක් වාර්තා කරන ලදී. රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) හි ආයෝජන මෙම වසර තුළදී ශ්‍රී ලංකා භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා පවත්වාගෙන ගිය සමුච්චිත ප්‍රතිපාදන ප්‍රතිවර්ත්‍ය කරනු ලැබූ අතර ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරහි ආයෝජන පියවීම සඳහා ලැබුණු ශ්‍රී ලංකා භාණ්ඩාගාර බැඳුම්කර හඳුනා ගැනීම මත සාධාරණ අගය ගැලපීම් ද ගිණුම්ගත කර ඇත.

සමස්ත මෙහෙයුම් පිරිවැය

සමස්ත මෙහෙයුම් වියදම් 11% කින් ඉහළ ගොස් ඇති අතර, මූලික වශයෙන් ඉහළ උද්ධමනයට අනුකූලව අනෙකුත් පරිපාලන වියදම් ඉහළ නැංවීම සහ රුපියල අවප්‍රමාණය මගින් බලපෑමට ලක් වූ අතිරේක මිල ගැලපීම් හේතු විය.

පිරිවැය කළමනාකරණය



පසුගිය වසරට සාපේක්ෂව සේවක මණ්ඩල පිරිවැය 3% කින් වැඩි වූ නමුත්, ප්‍රධාන වශයෙන් පොළී පිරිවැය සහ අනෙකුත් වියදම් ඉහළ යාම හේතුවෙන් බැංකුවේ පිරිවැය සහ ආදායම් අනුපාතය 55.7% ක් වාර්තා විය.

බදු අය කිරීම

වසර තුළදී ලංකා බැංකුව බදු වශයෙන් රජයට රු. බිලියන 25.7 ක් ගෙවා ඇත. බැංකුව විසින් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වියදම් ලෙස රු. බිලියන 13.6 ක් දරා ඇති අතර, එය පෙර වසරේ රු. බිලියන 1.0 ක ප්‍රතිවර්ත්‍යයක් සිට 1,471% ක වර්ධනයකි. 2022 අංක 45 දරණ දේශීය ආදායම් පනතට අනුව, බැංකුවේ බදු අය කළ හැකි ආදායම මත 30% ක ආයතනික ආදායම් බදු අනුපාතය භාවිතා කරන ලදී.

මෙහෙයුම් ලාභදායීතාවයේ ශක්තිමත් වර්ධනයට අනුකූලව මූල්‍ය සේවා මත බදු රු. බිලියන 12.7 දක්වා 12% කින් වැඩි විය.

GRI 207- 1 සිට 4


බදුකරණයට ප්‍රවේශය: බැංකුවේ බදු උපායමාර්ගය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන අතර මූල්‍ය කණ්ඩායම විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. අභ්‍යන්තර විගණන කණ්ඩායම විසින් අඛණ්ඩ පදනමක් මත බදු රෙගුලාසි වලට අනුකූල වීම අධීක්ෂණය කරනු ලබන අතර, මූල්‍ය වර්ෂය අවසානයේ දී බාහිර විගණකවරුන් විසින් ස්වාධීන ඇගයීමක් සිදු කරනු ලැබේ.

බදු අධිකාරීන් සමඟ සම්බන්ධ වීමේ සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු වාර්තා ගොනු කිරීමේ වගකීම බදු අංශය සතු වන අතර බදු උපදේශන සේවයට අවශ්‍ය උපදේශන බාහිර විශේෂඥයන් මගින් ලබා ගනී. ලංකා බැංකුව ක්‍රියාත්මක වන සෑම රටකම සියලුම බදු රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ අතර වසර තුළදී කිසිදු අනුකූල නොවන සිදුවීම් වාර්තා නොවීය.

ලාභදායීත්වය

බාහිර අභියෝගවලට මුහුණ දී තිබියදීත්, බැංකුව 2022 වසරට වඩා 30% ක වර්ධනයක් සනිටුහන් කරමින් රු. බිලියන 40.3 ක බදු පෙර ලාභයක් සමඟ 2023 වසර අවසන් කළේය. ඉහළ ආදායම් බදු වියදම මත, බදු පසු ලාභය 16.5% ක අඩුවීමක් පෙන්නුම් කළ අතර පෙර වසරේ රු. බිලියන 32.0 ට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා රු. බිලියන 26.7 ක් වාර්තා කරන ලදී.

ලාභදායීත්වය



ප්‍රමුඛතා ක්ෂේත්‍ර 02 :


මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම

මුළු වත්කම්

වසර තුළ බැංකුවේ මුළු වත්කම් 2% කින් වර්ධනය වී රු. ට්‍රිලියන 4.4 දක්වා ළඟා වූ අතර එමඟින් බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස එහි තත්ත්වය තවදුරටත් තහවුරු විය. දුර්වල ආර්ථික තත්ත්වයන් සහ රාජ්‍ය ණය සුරැකුම්පත්වල ඉහළ ආයෝජන මධ්‍යයේ ණය ඉල්ලුම අඩුවීමත් සමඟ වසර තුළදී වත්කම්වල සංයුතිය වෙනස්කම් කිහිපයකට භාජනය විය.

වත්කම් සංයුතිය

රු. බිලියන



ඉහළ පොළී අනුපාත තත්ත්වය යටතේ අඩු ණය ඉල්ලුම සහ අවිනිශ්චිත ආර්ථික තත්ත්වයන් යටතේ ආයෝජකයින් විසින් අනුගමනය කරන ලද මන්දගාමී ස්වභාවය නිසා ප්‍රධාන වශයෙන් දළ ණය පහත වැටීමක් සනිටුහන් විය. කෙසේ වෙතත්, වසරේ දෙවන භාගය තුළදී, ණය ගැනුම්කරුවන්ගේ ඉල්ලුම තරමක ඉහළයාමක් පෙන්නුම් කළ අතර දළ ණය ප්‍රමාණය 5% කින් (රු. බිලියන 131.5) වැඩි විය. කෙසේ වුවද, බැංකුවේ මුළු වත්කම් වලට 50% ක දායකත්වයක් ලබා දෙන ශුද්ධ ණය කළඹ 2023 අවසන් වන විට රු. බිලියන 116.5 කින් අඩු විය. බැංකුවල ඇති තැන්පතු රු. බිලියන 75.0 දක්වා 355% කින් වර්ධනය වී ඇති අතර රජයේ සුරැකුම්පත්වල ආයෝජන ඇතුළු වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් 470% කින් රු. බිලියන 49.5 දක්වා වර්ධනය විය. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 4% සිට 2% දක්වා සංශෝධනය කිරීමෙන් පසු ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ඇති ශේෂයන් 50% කින් අඩු විය. බැංකුවේ ණය අවදානම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමුවූ ප්‍රධාන කරුණක් වූ අතර වත්කම්වල ගුණාත්මකභාවය අඛණ්ඩව අධීක්ෂණය කිරීම තවදුරටත් පුළුල් කරමින් අවශ්‍ය උපායමාර්ග ක්‍රියාත්මක කරන ලදී. අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇති අතර, අදියර 2 සහ 3 අවධියේ ණය අධීක්ෂණය, ද්‍රවශීලතාවය සහ බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා විශේෂ කාර්ය බලකායන් නිර්මාණය කරන ලදී.


මුළු වගකීම්

සමස්ත වගකීම් පෙර වර්ෂයට සාපේක්ෂව 2% ක වැඩිවීමක් පෙන්නුම් කර ඇති අතර, මූලික වශයෙන් බැංකුවේ තැන්පතු පදනමේ වර්ධනය මඟින් මෙහෙයවනු ලැබීය. එය 2022 දී වාර්තා වූ රු. ට්‍රිලියන 3.3 සිට 2023 අවසන් වන විට රු. ට්‍රිලියන 3.9 දක්වා පුළුල් විය.

ඉතුරුම් තැන්පතු පෙර වසරට සාපේක්ෂව 85% ක වර්ධනයක් සනිටුහන් කරමින් වසර අවසානයේ දී රු. ට්‍රිලියන 1.2 දක්වා ළඟා විය. ස්ථාවර තැන්පතු සඳහා ඇති ඉල්ලුම වැඩිවීම නිසා ස්ථාවර තැන්පතු පදනම පෙර වසරේ රු. ට්‍රිලියන 1.6 සිට 2023 දී රු. ට්‍රිලියන 1.7 දක්වා වර්ධනය වීමට හේතු විය. රුපියලෙහි අගය අධිප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස වසර තුළ විදේශ මුදල් තැන්පතු 7% කින් අඩු විය. බැංකුවේ ජංගම සහ ඉතුරුම් ගිණුම් (CASA) අනුපාතය පෙර වසරේ වාර්තා වූ 29% සිට 37% දක්වා වැඩි විය.

තැන්පතු සංයුතිය

%




2023 දෙසැම්බර් මාසයේ දී බැංකුව විසින් රු. බිලියන 10.0 ක් වටිනා බාසල් III අනුකූල යටත් කළ II මට්ටමේ ලැයිස්තුගත, ශ්‍රේණිගත, සුරකුම් රහිත, යටත් කාලීන, නිදහස් කල හැකි ණයකර සාර්ථකව නිකුත් කරන ලදී. බැංකුව කෙරෙහි ආයෝජකයන්ගේ දැඩි විශ්වාසය පිළිබිඹු කරමින් ණයකර නිකුතුවට වැඩි දායකත්වයක් ලබා දී ඇත.

ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය

බැංකුව රු. බිලියන 171.4 ක් වූ රඳවාගත් ඉපැයුම්වල වර්ධනයක් වාර්තා කළ අතර වසර අවසානයේ දී කොටස් හිමියන්ගේ මුළු ස්කන්ධය රු. බිලියන 251.7 ක් ලෙස වාර්තා විය.

අරමුදල් සංයුතිය

රු. බිලියන



2023 වර්ෂයේදී බැංකුවට මුහුණදීමට සිදුවූ අසීරු කරුණක් වූයේ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමයි. වෙළඳපළ තුළ පවතින ද්‍රවශීලතා අභියෝග මධ්‍යයේ වුවද උපායමාර්ගිකව සිය තැන්පතු පදනම කෙරෙහි අවධානය යොමු කරමින් බැංකුව සිය ද්‍රවශීලතා තත්ත්වය සහ අවදානම මනාව කළමනාකරණය කළ අතර වසර අවසාන වන විට ධනාත්මක දේශීය හා විදේශීය මුදල් ද්‍රවශීලතා තත්ත්වයක් වාර්තා කර ඇත. බැංකුව සතු පුළුල් ප්‍රවේශය තුළ විදේශීය මුදල් ප්‍රේෂණ ගලා ඒම තවදුරටත් ශක්තිමත් කරමින් සිය වෙළඳපළ නායකත්ව තත්ත්වය පවත්වා ගැනීම මඟින් විදේශ මුදල් ද්‍රවශීලතාව තහවුරු කර ගත්තේය.

ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය 42.80% (2022 : 23.0%) වූ අතර නියාමන අවම අවශ්‍යතාවය වන 20% ට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පැවතුනි. පළමු ස්ථරයේ සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත 12.76% සහ 15.84% ලෙස පැවති අතර, නියාමන අවම මට්ටම් වන 10% සහ 14% ට වඩා ඉදිරියෙන් ඇත.

මූල්‍ය සමාලෝචනය

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 03 :

කොටස්හිමියාගේ වටිනාකම නිර්මාණය කිරීම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	2023	2022	2021	2020	2019
ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය (%)	10.6	14.1	21.0	11.9	16.8
කොටසක ඉපැයුම (රු.)	1,067.7	1,278.9	1,503.6	710.6	971.8
කොටසක ලාභාංශ (රු.)	6.9	13.9	73.9	63.9	14.6
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	10,068.6	10,167.4	8,030.4	6,266.4	5,691.3

අනපේක්ෂිත දුෂ්කරතා මධ්‍යයේ වුවද, කොටස් හිමියා සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් උත්පාදනයට හානියක් නොවන පරිදි බැංකුව අභියෝගවලට මුහුණ දෙන ලදි.

මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම සහ කොටස් මත ප්‍රතිලාභ 10% ට වඩා ඉහළ මට්ටමක පවත්වා ගනිමින් කොටස් හිමියාට ප්‍රතිලාභ ලබා දීමේ ප්‍රධාන අවශ්‍යතා අතර වඩා හොඳ ගනුදෙනුවක් පවත්වා ගැනීමට බැංකුවට හැකි විය.

අනෙකුත් පාර්ශ්වකරුවන් උදෙසා වටිනාකම් නිර්මාණය කිරීම පිටු 84 සිට 109 දක්වා ඉදිරිපත් කර ඇත.

විදේශීය මෙහෙයුම් සහ සමූහයේ කාර්යසාධනය

වසර තුළ බදු පෙර ලාභය සඳහා මාලේ, චෙන්නායි සහ සීෂෙල්ස් යන විදේශීය ශාඛාවල දායකත්වය 20% කි.

ඒකාබද්ධ මට්ටමින්, 2022 වසරට සාපේක්ෂව 35% ක වර්ධනයක් සමඟින් සමූහයේ බදු පෙර ලාභය වසර සඳහා රු. බිලියන 41.7 ක් වාර්තා කර ඇත. 2023 වසර අවසන් වන විට, බැංකුවට පරිපාලිත සමාගම් නවයක් සහ ආශ්‍රිත සමාගම් හතරක් තිබූ අතර ඒවා මූල්‍ය සේවා, දේපළ කළමනාකරණ සේවා සහ විවේක කළමනාකරණය වැනි විවිධ ක්ෂේත්‍ර වලට සම්බන්ධ වේ. එංගලන්තයේ පිහිටි (පූර්ණ අයිතිය බැංකුව සතු) පරිපාලිත සමාගමක් වන BOC (UK) Ltd. මඟින් එක්සත් රාජධානියේ වෙළඳපළ ප්‍රවේශයට මෙන්ම බැංකුවේ කීර්තිය පවත්වා ගනිමින් කාර්ය මණ්ඩලය සඳහා විදේශ අත්දැකීම් ලබා ගැනීමටද සහය දක්වයි.

සමස්ත වත්කම් වලින් 99% ක් නියෝජනය කරන බැංකුවල සමූහය තුළ ප්‍රමුඛතම ආයතනය වේ. පරිපාලිත සමාගම්වල වාර්ෂික විස්තීර්ණ කාර්යසාධන සමාලෝචන ඇතුළත් පරිපාලිත ප්‍රඥප්තියක් යටතේ බැංකුව එහි පරිපාලිත සමාගම් කළමනාකරණය කරනු ලැබේ. සමූහයේ සමස්ත අවදානම් රුචියට අනුකූලව පිළිගත හැකි මට්ටම් තුළ අවදානම් කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා අවදානම් දර්ශකයන් බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරිතුමන් වෙත යොමු කරන අතර පරිපාලිත සමාගම්වල මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය බැංකුව විසින් නිරන්තරව අධීක්ෂණය කරනු ලැබේ. මේ අතර, පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් වල මෙහෙයුම් බැංකුවේ අපේක්ෂාවන්ට අනුකූලව සිදු කෙරෙන බව සහතික කිරීම සඳහා බැංකුවේ නියෝජිතයෙකු මෙම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරයි.

ඉදිරි දැක්ම

කෙටි කාලීනව ශ්‍රී ලංකාව නොවැළැක්විය හැකි සාර්ව ආර්ථික පීඩනයකට මුහුණ දෙන බැවින්, ගනුදෙනුකරුවන්ගේ දිගු කාලීන තිරසාර බව සහතික කිරීම සඳහා ඔවුන්ට සහාය වීමට බැංකුව කැපවී සිටී. මෙම අභිලාෂයන්ට අනුකූලව, උපායමාර්ගික සැලසුම් මෙහෙයවීම සඳහා ස්ථර 2 ප්‍රාග්ධන උපකරණද ඇතුළුව අභ්‍යන්තර සහ බාහිර මූලාශ්‍ර හරහා සිය ප්‍රාග්ධන තත්ත්වය ඉහළ නැංවීම කෙරෙහි ද බැංකුව අවධානය යොමු කරනු ඇත. සුදුසු ගනුදෙනුකරුවන් කල්තියා හඳුනා ගැනීම තුළින් බැංකුවේ අඩු පිරිවැය තැන්පතු පදනම තවදුරටත් පුළුල් කරන අතරම දේශීය හෝ ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතන වලින් සහනදායී මිල ගණන් යටතේ අරමුදල් ලබා ගැනීමට ද අපි බලාපොරොත්තු වෙමු. ක්‍රියාවලි ඩිජිටල්කරණය සහ නව ජාත්‍යන්තර හොඳම භාවිතයන් යොදා ගැනීම තුළින් අපගේ මූල්‍ය වාර්තාකරණය ශක්තිමත් කිරීම කෙරෙහි ද උපායමාර්ගික අවධානය යොමු කරනු ඇත.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය



පුද්ගලයන්, ව්‍යවසායකයින් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ඉලක්ක කර ගනිමින් ණය දීම, තැන්පතු සහ ගනුදෙනු බැංකුකරණය සම්බන්ධ විසඳුම් මාලාවකින් සමන්විත වේ.

ප්‍රධාන ශක්තීන්

- වෙළඳපලේ සැලකිය යුතු කොටසක් නියෝජනය කරන අතර බැංකුවේ මුළු ණය කළඹෙන් 42% කින් සමන්විත වේ.
- ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,100 කට අධික සංඛ්‍යාවක්.
- විශ්වාසවන්ත ගනුදෙනුකාර පදනම
- සංවර්ධන ණය ප්‍රදාන වෙත ප්‍රවේශය
- බහුවිධ නිෂ්පාදන කළඹ

ප්‍රතිඵල

- තැන්පතු
- ණය සහ අත්තිකාරම්
- සංවර්ධන ණය
- ගනුදෙනු බැංකුකරණය

මෙහෙයුම් සන්දර්භය

අතිශය අභියෝගාත්මක වසරකින් පසු, 2023 වර්ෂය සඳහා අපේක්ෂිත ආර්ථික සංකෝචනය මධ්‍යයේ වුවද, අපේක්ෂිත ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම, උද්ධමනය මධ්‍යස්ථ කිරීම සහ මූල්‍ය ස්ථාවරත්වය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් කිරීමත් සමඟ, බැංකු අංශයට ධනාත්මක පරිසරයක් ගොඩනැගිය හැකි විය. අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය සහ 2023 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද මුදල් නීති පනත ඇතුළු දැඩි නියාමන පාලනයන් මගින් බැංකුවේ ශාඛා බැංකුකරණ අංශයට බලපෑම් එල්ල විය. අභියෝග මධ්‍යයේ වුවද, ශාඛා අංශය සිය ණය කළඹ ශක්තිමත් කිරීමට අඛණ්ඩව ක්‍රියා කළ අතර පුද්ගලයන්, ව්‍යවසායකයින් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහාය වීම කෙරෙහි අවධානය යොමු කළේය.

වසරේ අවසන් භාගය වන විට පොළී අනුපාත වල පහත වැටීමක් සිදුවිය. වසර ආරම්භයේදී පැවති ඉහළ පොළී අනුපාත යටතේ පවතින ස්ථාවර තැන්පතු වල පොළී අනුපාත වලෙසම පවතාවා ගෙන ගිය අතර නිත්‍ය පොළී අනුපාත යටතේ වූ ණය පහසුකම් සඳහා පොළී අනුපාත පහල යමේ වාසිය ලබා දීමට කටයුතු කරන ලදී.

උපායමාර්ගයට එරෙහිව කාර්යසාධනය

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- විගණන සහ අනුකූලතා අවශ්‍යතා වලට අනුගත වීම සඳහා අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම.
- නව තැන්පතු සහ ණය දීම හරහා හරිත බැංකු සංකල්පය ප්‍රවර්ධනය කිරීම.
- ව්‍යාපාර තිරසාරභාවය සහ සියලු අංශවල ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ඉලක්ක ලබා දීම.
- ESMS ණය දීමේ නිර්ණායක හරහා සමාජ සහ පාරිසරික සවිඥානකත්වය ප්‍රචාරණය කරන ලදී.
- හරිත මූල්‍යකරණය සඳහා 'අයිඩියා ග්‍රීන් ටෙක්', 'බීච්චම් ග්‍රීන්' සහ 'හේලීස් ෆෙන්ටන්ස්' වැනි නියෝජිතායතන කිහිපයක් සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ස්ථාපනය කිරීම.

ගනුදෙනුකාර අත්දැකීම්හි විශිෂ්ටත්වය

- ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ආරම්භක සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ආයෝජන ණය සහ කාරක ප්‍රාග්ධනය ලෙස අමතර ණය මුදල් ලබා දීම.
- ආනයන සඳහා ආදේශකයක් ලෙස දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා නව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මූල්‍ය ආධාර ලබා දීම.
- බලපෑමට ලක් වූ ණය ගැණුම්කරුවන්ට අවස්ථානෝචිතව සහනදායී පොළී අනුපාත පිරිනැමීම.
- ව්‍යවසායකයින් සහ වෘත්තිකයන් සඳහා ව්‍යාපාරික දැනුම සංවර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම .

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

- මුදල් ප්‍රවාහ ගැටළු මඟහරවා ගැනීමට සහ ණය පහසුකම් සක්‍රීය තත්ත්වයේ පවත්වා ගැනීමට අක්‍රීය ණය හිමි ගනුදෙනුකරුවන්ට ණය මූල්‍ය සහය ලබාදීම සහ මඟ පෙන්වීම.
- ග්‍රාමීය ප්‍රජාවන්ගේ මූල්‍ය ශක්‍යතාවය වර්ධනය කිරීම සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා "BOC ගම්මාන" පිහිටු වීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ නව අපනයන ව්‍යාපාර සඳහා සහය දැක්වීම මූලික කොට ගෙන 'සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කවය' සහ 'අපනයන කවය' ශක්තිමත් කිරීම.

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- මාර්ගගත ක්‍රමයට ණය අයදුම්පත් යොමු කිරීමට පහසුකම් සැලසීම.
- බහු අභ්‍යන්තර ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම.
- ගනුදෙනුකාර ඇතුළත්වීමේ ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම.
- ශාඛා ගනුදෙනුකරුවන් සඳහා සේවා සැපයීම වැඩිදියුණු කරමින් ඩිජිටල් නිෂ්පාදන දියත් කිරීම.

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණය පහසුකම් ලබා දීමෙන් ආර්ථික වර්ධනය සහ අපනයන ඉපැයීම් උත්තේජනය කිරීම සඳහා බැංකුවේ අරමුදල් උපයෝගී කරගෙන සපයන ණය යෝජනා ක්‍රමය වන 'SME Energizer' හඳුන්වා දෙන ලදී.
- ගෝලීය සහ කලාපීය මට්ටමේ අරමුදල් සපයන ආයතන සම්බන්ධ කර ගනිමින් බහු වාර්ෂික බෝග අංශ සඳහා අරමුදල් සැපයීම.
- ශ්‍රී ලාංකීය කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා කාන්තාවන් මගින් මෙහෙයවන ව්‍යාපාර සඳහා විශේෂිත ණය පහසුකම් ලබා දීම.
- මූල්‍යමය වශයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම සඳහා සහාය ලබා දීමට ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය (BRRU) වෙත යොමු කිරීම.
- ණය ඇගයීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට සහ ශාඛා ණය ලබා දීම කඩිනම් කිරීම සඳහා ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන (RLC) ප්‍රකෘතිමත් කිරීම.
- ව්‍යාපාරවල මුදල් ප්‍රවාහයන්ට අනුකූලව, ව්‍යාපාර කටයුතු පසුබෑමකට ලක් වූ ණය ගැතියන්ගේ පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම.
- ව්‍යාපාර සහ මුදල් ප්‍රවාහ ඇගයීම මගින් බලපෑමට ලක් වූ ණය ගැතියන්ට ණය අයකර ගැනීමේදී සහන කාලයක් ලබා දීම.

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

- සේවකයින් සඳහා සෞඛ්‍ය සම්පන්න රැකියා ජීවිත සමතුලිතතාවයක් සහතික කිරීම සඳහා නව සේවා ආකෘති ගවේෂණය අඛණ්ඩව සිදු කිරීම.
- ගනුදෙනුකාර සේවයේ යෙදී සිටින සේවකයින් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.
- සේවකයින්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා ත්‍යාග යෝජනා ක්‍රම හඳුන්වා දීම.

තැන්පතු

2023 වසරේ මැද භාගයේ සිට පොළී අනුපාත පහත වැටීමට පටන් ගත්තද, තැන්පතු පදනමේ වර්ධනයක් වාර්තා කිරීමට බැංකුවට හැකි විය. බැංකුව තැන්පතු හරහා අරමුදල් සැපයීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය. සමස්ත බැංකු තැන්පතු පදනමෙන් 62% ක් ශාඛා අංශය නියෝජනය කරන අතර ශාඛා බැංකු (රුපියල්) තැන්පතු පදනමෙන් 51% ක් ස්ථාවර තැන්පතු වලින් සමන්විත වේ. 2023 වසරේ මුල් කාල පරිච්ඡේදයේදී, ඉහළ තැන්පතු අනුපාත යටතේ ශාඛා අංශයේ තැන්පතු පදනම සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. ස්ථාවර තැන්පතු (රුපියල්) 9% කින් සහ මුළු තැන්පතු 7% කින් වර්ධනය විය.

වෙළඳපළ ගතිකතාවයන්ට අනුවර්තනය වීමට සහ පොළී සහ විනිමය අනුපාතවල වේගවත් උච්චාවචනයන් සමග අනුගත විය හැකි නව නිෂ්පාදන හඳුන්වා දෙමින්, බැංකුව පූර්ව සූදානම් සහිතව කටයුතු කිරීමට පියවර ගන්නා ලදී. තවද බැංකුව විසින් නව මිතුරු කණ්ඩායම් පිහිටුවා අඩු පිරිවැය සහිතව රු. මිලියන 26.0 ක තැන්පතු රැස් කර ගත්තේය.

2023 දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලික ගනුදෙනුකරුවන් අත්විඳින අස්ථාවර ව්‍යාපාරික සන්දර්භය පිළිබිඹු කරමින් ශාඛා බැංකු අංශයේ ජංගම සහ ඉතුරුම් ගිණුම් (CASA) අනුපාතය 33% ක් විය.

ණය සහ අත්තිකාරම්

ඉහළ ණය අවදානමක් සහිත ආර්ථික තත්ත්වයන් යටතේ, ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා සඳහා දැඩි පාලනයන් සහ දැඩි ප්‍රතිපාදන අවශ්‍යතා යටතේ, ශාඛා අංශය සිය ණය කළඹ ක්‍රමානුකූලව පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය.

නව සංවර්ධන ණය යෝජනා ක්‍රම තුනක් හඳුන්වා දෙන ලදී.

බැංකුවේ අරමුදල් උපයෝගී කරගෙන 'SME Energizer' ණය යෝජනා ක්‍රමය යටතේ රු. බිලියන 2.5 ක් ලබාදෙන ලදී.

රු. බිලියන 66.3 ක් සංවර්ධන ණය යටතේ ලබාදෙන ලදී.

අභියෝග මධ්‍යයේ වුවද, මෙම අංශය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ව්‍යාපාර නඟා සිටුවීමට හා පුනර්ජීවනය කිරීමට අවශ්‍ය කාරක ප්‍රාග්ධනය සහ ආයෝජන ණය ලබා දීම කෙරෙහි අවධානය යොමු කළේය. මෙම දායකත්වයට නිදසුනක් ලෙස, බැංකුව 2023 දී රු. බිලියන 2.5 ක බැංකු අරමුදල් උපයෝගී කරගෙන 'SME Energizer' ණය යෝජනා ක්‍රමය දියත් කළේය. මෙය පුරෝගාමී මුලපිරීමක් වූ අතර එය අපගේ ගනුදෙනුකරුවන්ට දුෂ්කර කාලවලදී නැඟී සිටීමට අවශ්‍ය ශක්තිය සහ මූල්‍යමය සවියක් සැපයීමට අපට හැකියාව ලබා දුන් අතරම ණය කළඹ පුළුල් කිරීමටද හේතු විය.

'BoC සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කවය' සහ 'BoC මිතුරු සමාජ' හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සේවා සැපයීම සහ ඔවුන්ගේ ව්‍යාපාර වැඩිදියුණු කිරීම සඳහා මඟ පෙන්වීම සිදු කරයි. ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය මඟින් පුළුල් ඇගයීමක් සිදු කර මූල්‍යමය වශයෙන් පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන්ට අවශ්‍ය මූල්‍යකරණය සමඟින් යළි ව්‍යාපාරයන් ප්‍රකෘති තත්ත්වයට රැගෙන ඒමට අවශ්‍ය සහයෝගය සපයා ඇත.

වසර තුළදී නිවාස, අධ්‍යාපනික සහ වාණිජ ණය අභිබවා හරිත මූල්‍යකරණ යටතේ, පුනර්ජීවන බලශක්ති විසඳුම්, ජීව වායු සහ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා ණය ලබා දීම, විද්‍යුත් වාහන සඳහා ලීසිං පහසුකම් වැඩි කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කළේය.


කල්බදු ව්‍යාපාරයේ වර්ධනය සඳහා ඇති අවස්ථා අවබෝධ කර ගනිමින් සියලුම පළාත් පුරා ප්‍රචාරණ කටයුතු සිදු කරන ලදී.

සෑම පළාතක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන 15 ක් දිවයින පුරා ස්ථාපනය කර ඇත. එම මධ්‍යස්ථාන අධීක්ෂණය විධිමත් කිරීම සඳහා නව මධ්‍යම ණය මෙහෙයුම් අංශයක් පිහිටුවන ලදී. ප්‍රමාණවත් සහ පළපුරුදු සේවකයින් අනුයුක්ත කිරීම සහ අඛණ්ඩ පුහුණු වැඩසටහන් ලබා දීම මඟින් ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන ශක්තිමත් කරන ලදී. සමස්ථ ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන විධිමත් කරමින් නිවාස හා වාණිජ ණය ගනුදෙනු නියමිත පිරිවැටුම් කාලය (TAT) තුළ සැපයීමට සහ ණය ලබා දීමේ ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී.

කෙටි කාලීන අරමුදල් අවශ්‍යතා සපුරාලීමට හැකි, ඉක්මන් සහ පහසුවෙන් ලබා ගත හැකි අරමුදල් මූලාශ්‍රයක් ලෙස රන් උකස් ණය වෙත ජනතාව යොමු වීම නිසා 'රන්සුරැකුම්' ණය හි 39% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

ගනුදෙනු බැංකුකරණය

බැංකු ක්ෂේත්‍රය ඩිජිටල්කරණය සහ ණය සහ හර කාඩ්පත් හරහා බාධාවකින් තොරව මුදල් රහිත ගනුදෙනු වෙත යොමු වීම නිසා, විවිධ තනි පුද්ගල ගනුදෙනුකරුවන් සහ සේවා සපයන්නන් වෙත ප්‍රවේශය පහසු සහ වේගවත් වී ඇති අතර 2023 වසර තුළදී ගනුදෙනු පරිමාවේ 21% ක වැඩිවීමක් ද පෙන්නුම් කළේය.



ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයින් සඳහා විශේෂිත වූ ණය කාඩ්පතක් දියත් කරන ලදී.

ආරක්ෂිත අන්තර්ජාල ගනුදෙනු සහ ගෝලීය විද්‍යුත් වාණිජ්‍ය විසඳුම් සපයන ජාත්‍යන්තර මාස්ටර්කාඩ් සමඟ හවුල්කාරිත්වයෙන් බැංකුවේ අන්තර්ජාල ගෙවීම් දොරටුව (IPG) හඳුන්වා දී ඇති අතර, එමඟින් ගනුදෙනු ප්‍රමාණය 7% කින් වැඩි වීමට හේතු විය.

2023 දී බැංකුවේ POS යන්ත්‍ර පහසුකම් 34% ක ස්ථාවර වෙළෙඳපළ වර්ධනයක් වාර්තා කළේය. ගනුදෙනු බැංකුකරණයේ වර්ධනය, ඩිජිටල්කරණය සඳහා බැංකුවේ අඛණ්ඩ ගමනේ පිළිබිඹුවකි. අපගේ පුළුල් ශාඛා ප්‍රවේශය හරහා, දිවයිනේ සෑම ප්‍රදේශයකම මූල්‍ය සේවා සඳහා ප්‍රවේශවීමේ හැකියාව සහතික කරමින්, අපි දිවයිනේ සියලුම පළාත් තුළ ශාඛා හරහා මෙන්ම ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ද සේවා සපයන්නෙමු.

ඉදිරි ගමන් මඟ

අවස්ථාවන්

- හදිසි අරමුදල් අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහය වීමට ණය දීමේ අවස්ථා උදා විය හැකිය.
- කල්බදු කළඹ වැඩි කිරීමට අවස්ථා උදා විය හැක.
- හරිත නිෂ්පාදන මුලපිරීම් හරහා ව්‍යාපාර පුළුල් කිරීමට අවස්ථා ඇති වීම.

අවදානම්

- නව ණය සඳහා ප්‍රවේශය සහ ආපසු ගෙවීමේ හැකියාව සීමා කරමින් එකතු කළ අගය මත බදු පැනවීම, පුද්ගල ණය සහ සුළු පරිමාණ ව්‍යාපාරවල අඛණ්ඩ පැවැත්මට තර්ජනය කරයි.
- ණය ගැතියන් නියමිත වේලාවට තම ණය බැඳීම් සපුරාලීමට අපොහොසත් වීම හේතුවෙන් ඉහළ ගිය ණය අවදානම.
- බැංකුවේ ඵලදායිතාවයට බලපෑම් ඇති කරමින් සක්‍රීය ඇති සේවකයින් රැකියාවෙන් ඉවත් වීම නිසා සේවක පිරිවැටුම් අනුපාතිකය ඉහළ යාම හේතුවෙන් මෙහෙයුම් අවදානමක් පැන නැඟීම.
- ඉහළ වටිනාකමක් ඇති ගනුදෙනුකරුවන් තරඟකාරී අනුපාත පිරිනමන වෙනත් බැංකු වෙත මාරුවීම හේතුවෙන් ඇතිවන ව්‍යාපාරික අලාභයන්.

ඉදිරි දැක්ම

- ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකුව ලෙස, ලංකා බැංකුව ප්‍රජාවට සේවය කිරීමට සහ අරමුදල් වෙත ප්‍රවේශය, පුද්ගලාරෝපිත විසඳුම් සහ උපදේශන හැකියාව තුළින් ව්‍යාපාර ප්‍රකෘතියට සහාය වීමට කැපවී සිටී.
- ශාඛා තැන්පතු සහ ණය පහසුකම් ඇතුළුව සපයනු ලබන සේවාවන් හරහා දේශගුණික විපර්යාස දෙසට වැඩි අවධානය යොමු කිරීම.
- ඩිජිටල්කරණයේ ප්‍රතිලාභ උපරිම කරමින් මුදල් රහිත ගනුදෙනු දිරිමත් කරන අතරම, ප්‍රජාවන් තුළ ඩිජිටල් සාක්ෂරතාව සහ මූල්‍ය ඇතුළත් කිරීම් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.
- ණය කළඹ පුළුල් කිරීම, අපනයනය ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අරමුදල් සැපයීම මඟින් සීඝ්‍ර වර්ධනයක් කරා හඹා යාම.
- සෞභාග්‍ය සංවර්ධන කාර්යාංශයට අනුගතව "සෞභාග්‍ය ණය යෝජනා" ක්‍රමය යටතේ කාරක ප්‍රාග්ධනය සහ ආයෝජන මෙන්ම මඟපෙන්වීම, උපදේශනය සහ පුහුණුව ලබා දීම. මෙමඟින් ග්‍රාමීය ජනතාවගේ කාර්යක්ෂමතාවය සහ නිෂ්පාදන සක්‍රීයතාවය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය



ප්‍රධාන ශක්තීන්

- ශ්‍රී ලංකාවේ විශාලතම ආයතනික ණය දෙන්නා වන අතර රු. ට්‍රිලියන 1.3 කට වැඩි ණය නිරාවරණයක් සහිතව බැංකුවේ මුළු ණය කළඹට 53% ක දායකත්වයක් සපයයි.
- සමස්ත සැපයුම් දාමයට බලපාන මහා පරිමාණ කර්මාන්ත, ආයතන සහ ව්‍යාපෘති සඳහා සහය දක්වයි.
- මිලියන සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන් සඳහා රැකියා අවස්ථා උත්පාදනය කිරීම.
- බැංකුවට මෙන්ම රටේද විදේශ විනිමය අවශ්‍යතා සඳහා සහාය වේ.

ප්‍රතිඵල

- ආයතනික ණය දීම
- ගනුදෙනුකාර තැන්පතු
- අක්වෙරළ බැංකුකරණය
- ව්‍යාපෘති මූල්‍යකරණය
- වෙළඳ මූල්‍යකරණය
- ප්‍රිමියර් බැංකුකරණය

මෙහෙයුම් සන්දර්භය

මෑතකාලීන ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් වූ ආයතන විවිධ අභියෝග මධ්‍යයේ අඛණ්ඩව ක්‍රියාත්මක විය. ගෝලීය ආර්ථික පසුබෑමේ ප්‍රතිඵලයක් ලෙස, ගෝලීය සැපයුම් දාමයන්ට බාධාවන් එල්ල වූ අතර, එමඟින් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය ප්‍රමාද විය. එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදනය ප්‍රමාද වී ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් ප්‍රමාද විය.

බොහෝ ව්‍යාපාර ඉහළ පොළී අනුපාත තත්ත්වය යටතේ අවදානමට ලක්ව තිබූ අතර ඉහළ නංවන ලද බදු අනුපාත හේතු කොට ගෙන තවදුරටත් අභියෝගයට ලක් විය.

කෙසේ වෙතත්, තුන්වන කාර්තුව තුළ ආර්ථිකයේ සහ බැංකු ව්‍යාපාරවල යම් දියුණුවක් අපට දැකගත හැකි විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොළී අනුපාත ලිහිල් කිරීමත් සමඟ ක්‍රමානුකූලව ණය වර්ධනයක් දක්නට ලැබිණි.

උපායමාර්ගයට එරෙහිව කාර්යසාධනය

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- අරමුදල් සැපයීමට පෙර පාරිසරික හා සමාජීය කළමනාකරණ (ESMS) අනුකූලතාව සහතික කිරීම.
- හරිත මූල්‍යකරණය හරහා පුනර්ජනනීය බලශක්ති, පරිසර හිතකාමී කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
- විදේශ විනිමය විධාන ඇතුළු අදාළ නීති රීති වලට අනුකූල වීම.
- අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් හමුවේ උවද සමස්ත ජාතික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ප්‍රධාන රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා පහසුකම් සලසා ඇත.

ගනුදෙනුකාර අත්දැකීම්හි විශිෂ්ටත්වය

- සිදුවෙමින් පවතින/නව ව්‍යාපෘතිවල ව්‍යාපාරික ශක්‍යතාව සලකා අවස්ථානෝචිතව අමතර පහසුකම් ලබා දී ඇත.
- අපනයන සහ විදේශ විනිමය ගලා ඒම වැඩි දියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් තම ව්‍යාපාර විවිධාංගීකරණය කිරීමට අපේක්ෂා කරන ගනුදෙනුකරුවන්ට මූල්‍ය ආධාර ප්‍රදානය කරන ලදී.
- පහසුකම්වල කාලසීමාව දීර්ඝ කිරීම සහ පොළී සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම් කල් දැමීම මඟින් ගනුදෙනුකරුවන්ට අවශ්‍ය සහය ලබා දීම.

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- ආයතනික ගනුදෙනුකරුවන් සඳහා ස්මාර්ට් ඔන්ලයින් පහසුකම හඳුන්වා දෙන ලදී.
- ඩිජිටල් ක්‍රමවේද හරහා සියලුම වෙළඳ මූල්‍ය සම්බන්ධ බැංකු කටයුතු පහසු කිරීම සහ හැසිරවීම සඳහා වෙළඳ මූල්‍ය පද්ධතිය දියත් කරන ලදී.

- නව වෙළෙඳ මූල්‍ය පද්ධතියක් හඳුන්වාදීමත් සමඟ ශාඛා මට්ටමේ වෙළෙඳ මෙහෙයුම් ස්වයංක්‍රීය කර ඇත.
- මාර්ගගත තත්කාලීන වලංගු කිරීම සහ යාවත්කාලීන කිරීම දීර්ඝ කිරීම.

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

- ගනුදෙනුකරුවන්ගේ පවතින මුදල් ප්‍රවාහයන්ට අනුව ණය ආපසු ගෙවීම ගැළපෙන පරිදි පවතින පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම.
- ව්‍යාපාරික අරමුණු සහ ණය ආපසු ගෙවීම සඳහා මුදල් ප්‍රවාහයන් භාවිතා කිරීම සහතික කිරීම සඳහා ව්‍යාපාරික මුදල් ප්‍රවාහයන් අධීක්ෂණය කරන ලද අතර එමඟින් මූල්‍ය විනය සාක්ෂාත් කර ගැනීමට ආයතනිකයින්ට සහාය වේ.
- රජය සතු ව්‍යවසායන් (SOE) සම්බන්ධතා ඒකකයක් ස්ථාපිත කිරීම මගින් ගුණාත්මක සේවා සැපයීම තහවුරු කිරීම.
- අනුමත බලධාරීන් විසින් පනවන ලද ගිවිසුම් සහ කොන්දේසි අනුගමනය කිරීම.

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

- විෂය කරුණු සහ අදාළ මාතෘකා සම්බන්ධයෙන් අඛණ්ඩ දැනුම බෙදාගැනීමේ සැසි පවත්වන ලදී.
- ජාත්‍යන්තර වෙළඳ ව්‍යාපාර වලට අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා UCP 600, URC 522, නෞභාර පත්, ජාත්‍යන්තර වෙළඳ ක්‍රමවේදයන් සහ සමුද්‍ර රක්ෂණය යන අංශ පුනුණු කරමින් වැඩසටහන් පහක් පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ අත්‍යාවශ්‍ය ආනයන සඳහා විශාලතම අරමුදල් සපයන්නා වේ

අපනයන කවය හරහා අපනයන ප්‍රේෂණ ඇ. ඩො. මිලියන 14.2 ක් ලැබී ඇත

ආයතනික බැංකුකරණය

අවිනිශ්චිත මෙහෙයුම් පරිසරයක් නිර්මාණය කරමින් අභියෝග රාශියක් පැනනැඟුණ මධ්‍යයේ, ආයතනික අංශය මූලික වශයෙන් එහි උපායමාර්ගික අරමුණු සඳහා අඛණ්ඩව ප්‍රමුඛත්වය දෙමින් අවදානම් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. සමාලෝචිත වර්ෂය තුළ පුද්ගලික අංශය වෙත ණය සැපයුම් ප්‍රමාණය 30% සිට 35% දක්වා වර්ධනය වූ අතර, නව ගනුදෙනුකරුවන් ඇතුළු කිරීමට, ව්‍යාපාර ගවේෂණය කිරීමට, නැගී එන කර්මාන්තවලට සහාය වීමට සහ අර්බුදකාරී ව්‍යාපාරවලට කාරක ප්‍රාග්ධන මූල්‍යකරණය පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ජාත්‍යන්තර බැංකු වෙතින් ආදායම මත ගෙවීම් පහසුව සහිත අරමුදල් බොහෝ දුරට ලබා ගත නොහැකි වූ අවස්ථාවක, ඇඟලුම්, ඉදිකිරීම්, සංචාරක, පොහොර සහ තවත් බොහෝ දේ ඇතුළුව පුද්ගලික අංශයේ දැඩි ලෙස පීඩාවට පත් වූ අංශ සඳහා සහය දැක්වීමට ලංකා බැංකුව පියවර ගත්තේය.

ආයතනික අංශය විසින් තම ගනුදෙනුකරුවන් වෙත අගය එකතු කිරීම වැඩිදියුණු කරන ලද අතර, එමඟින් අංශයේ විශේෂිත සේවාවන් තවදුරටත් වැඩි දියුණු කරන ලදී. ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට අමතරව, උපදේශන සේවා ආදී මූල්‍ය නොවන සේවාවන් පිරිනැමීම කෙරෙහි මෙම අංශය අවධානය යොමු කළේය.

අක්වෙරළ බැංකුකරණය

අක්වෙරළ බැංකු අංශය, අපනයනකරුවන්ට විදේශ මුදල් වශයෙන් කෙටි කාලීන සහ දිගු කාලීන පහසුකම් ලබාදෙමින්, ඔවුන්ගේ අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගේ අභ්‍යන්තර/පිටත ප්‍රේෂණ සඳහා පහසුකම් සැලසීම මගින් මූල්‍ය ආධාර අඛණ්ඩව ලබා දුන් අතර, එමඟින් ආර්ථිකයේ අපනයන ආදායම ඉහළ නැංවීය. මීට අමතරව, ශ්‍රී ලංකාව සහ මාලදිවයින් ජනරජයේ මූල්‍ය වෙළඳපළ තුළ එහි පැවැත්ම තවදුරටත් තහවුරු කරමින්, 2023 වර්ෂයේදී මාලදිවයින් ජනරජයේ මහා පරිමාණ නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් සහ සංචාරක නිකේතන ව්‍යාපෘති කිහිපයක් සඳහා මෙම අංශය සාර්ථකව මූල්‍ය පහසුකම් ලබා දුන්නේය.

වෙළඳ මූල්‍යකරණය

ආර්ථික පුනර්ජීවනය සහ සමාජ ස්ථාවරත්වය පෝෂණය කිරීමේ ජාතික කැපවීමේ කොටසක් ලෙස ඉන්ධන, ද්‍රව පෙට්‍රෝලියම්, ගෑස්, ආහාර ද්‍රව්‍ය, චීන්නත් සහ ඖෂධ ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනයට සම්බන්ධ ප්‍රමුඛතා අංශවලට සහාය දැක්වීමේදී ලංකා බැංකුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. ඉහළ ආනයන බිල්පත් දැරීමට සිදු වුවද, අර්බුදකාරී තත්ත්වයකට රට මුහුණ දී සිටින විට සහාය වීම සඳහා බැංකුව හුවමාරු ගිවිසුම් සහ බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ණය මාර්ග සකස් කළේය. කෙටි කාලීන පොළී අනුපාත අඩු කිරීම, කොමිස් ගාස්තු අඩු කිරීම, ශ්‍රී ලංකා රුපියලේ අගය අධිප්‍රමාණය වීම, වසරේ වැඩි කාලයක් පැවති ආනයන සීමා කිරීම් සහ පෞද්ගලික අංශයේ ණයවල වර්ධනයේ මන්දගාමීත්වය හේතුවෙන් වෙළඳ මූල්‍ය ආදායමට දැඩි ලෙස බලපා ඇත.

මෙම අංශය ශාඛා ජාලය සමඟ සහයෝගීතාවයෙන් 'BOC අපනයන කවය' හරහා නව අපනයන-අභිමුඛ ආරම්භක සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහය දැක්වීම අඛණ්ඩව සිදු කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) වැනි ප්‍රධාන රාජ්‍ය ආයතන සහ අදාළ වෙළඳ සංගම් සමඟ සම්බන්ධව අපනයන ආශ්‍රිත උපදේශන සේවා සඳහා සහාය සහ මඟ පෙන්වීම ලබා දෙන ලදී.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය



බැංකුවේ ඩිජිටල් න්‍යාය පත්‍රයට අනුකූලව, මෙම අංශය විසින් වසර තුළදී සමස්ත ශාඛා ජාලයටම ව්‍යාප්ත වූ නව වෙළෙඳ මූල්‍ය පද්ධතියක් දියත් කරන ලදී. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් වෙළඳ මූල්‍ය මෙහෙයුම් විධිමත් කිරීමට සහ ශාඛා මට්ටමින් ගනුදෙනුකාර සේවා වැඩිදියුණු කිරීමට හැකිවිය. මීට අමතරව, මෙම අංශය බැංකුවේ නව වෙළඳ මූල්‍ය මාර්ගගත බැංකු පද්ධතිය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රචාරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර එමඟින් ගනුදෙනුකරුවන්ට සියලුම වෙළඳ මූල්‍ය සම්බන්ධ බැංකු කටයුතු අන්තර්ජාලය හරහා ක්‍රියාවට නැංවීමට පහසුකම් සලසයි.

ව්‍යාපෘති මූල්‍යකරණය

අවිනිශ්චිත වෙළඳපළ තත්ත්වයන් මධ්‍යයේ යටිතල පහසුකම් සංවර්ධනය සහ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වන ආයෝජන කල්දැමීමට හෝ නවතා දැමීමට ව්‍යාපාර දිගින් දිගටම කටයුතු කළේය. මෙම අංශයේ ව්‍යාපාර වලට ඉහළ යන ද්‍රව්‍ය මිල, ඉහළ පොළී අනුපාත සහ සමහර ඉදිකිරීම් ආශ්‍රිත ද්‍රව්‍ය සඳහා ආනයන සීමා කිරීම් බලපෑ අතර, එමඟින් වර්ෂය තුළ ව්‍යාපෘති මූල්‍යකරණයේ විෂය පථය සීමා විය. කෙසේ වෙතත්, පුනර්ජනනීය බලශක්ති කර්මාන්තයේ නැඟී එන අවස්ථා හඳුනාගෙන ඇති අතර එවැනි ව්‍යාපෘති සඳහා ණය මාර්ග පුළුල් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන කර්මාන්ත, සෘජු විදේශ ආයෝජන හරහා අර්ධ වශයෙන් මූල්‍යකරණය කරන ලද මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සහ ආනයන ආදේශක ලෙස භාවිතා කළ හැකි සෞඛ්‍ය ආරක්ෂණ නිමැයුම් නිෂ්පාදනය කිරීම සඳහා මූල්‍ය ආධාර සැපයීම කෙරෙහි මෙම අංශය අවධානය යොමු කළේය. ජාතියේ උන්නතිය සඳහා විදේශ විනිමය උපයා ගැනීමටත් ඉතිරි කිරීමටත් හැකි වන පරිදි කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය කිරීම, විදුලි බයිසිකල් සහ ඒ ආශ්‍රිත නිමැවුම් නිෂ්පාදනය කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම ඇතුළුව නැගී එන වෙළඳපළ තුළ ශක්‍ය ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා උපදේශන සේවා අඛණ්ඩව ලබාදෙන ලදී.

තවද, බහුපාර්ශ්වික අරමුදල් සපයන ආයතනවල ණය මාර්ග සමඟ විදේශ අරමුදල් ආධාර කිරීම තුළින් රටේ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයන සඳහා පහසුකම් සපයන ලදී.

රජය සතු ව්‍යවසාය සම්බන්ධතා ඒකකය

රජය විසින් යෝජිත රජය සතු ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණයට සමගාමීව රජය සතු ව්‍යවසායවල ව්‍යාපාරික අවශ්‍යතා සඳහා කැපවූ සේවාවක් සැපයීම සඳහා 'රජය සතු ව්‍යවසාය සම්බන්ධතා ඒකකය' නමින් නව ව්‍යාපාරික ඒකකයක් 2023 මැද භාගයේදී ස්ථාපිත කරන ලදී. රාජ්‍ය අනුග්‍රහය ලබන සුරැකුම්පත් වලට සීමා නොවී, ඔවුන්ගේ මුදල් ප්‍රවාහ මත පදනම්ව රජය සතු ව්‍යවසාය මූල්‍යකරණය කරනු ලැබේ. ආර්ථික පුනර්ජීවනය සහ සමාජ ස්ථාවරත්වය පෝෂණය කිරීමේ ජාතික කැපවීමේ කොටසක් ලෙස ඉන්ධන, ද්‍රව පෙට්‍රෝලියම් වායු, චීන්නත් සහ ඖෂධ ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනයට සම්බන්ධ රජය සතු ව්‍යවසාය වෙත අඛණ්ඩ සහයෝගය ලබා දෙන ලදී.

රටේ ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීමේ අරමුණින් ස්වයංපෝෂිත රාජ්‍ය ව්‍යවසායන් සඳහා මූල්‍යකරණය රජයේ පෙර දැක්මට සමගාමීව අනාගතයේදී තීරණාත්මක ලෙස සලකා බලනු ලැබේ.

ඉදිරි ගමන් මඟ

අවස්ථාවන්

- මෙහෙයුම් විධිමත් කිරීමට, ආරක්ෂාව වැඩි කිරීමට සහ නව්‍ය අන්තර්ජාල බැංකු සේවා පිරිනැමීමට උසස් ඩිජිටල් තාක්ෂණයන් ඒකාබද්ධ කිරීම.
- සංචාරක පැමිණීම්වල සැලකිය යුතු වර්ධනයක් සහ සංචාරක ක්ෂේත්‍රයේ දියුණුවක්.
- පුනර්ජනනීය බලශක්ති අංශය තුළ නැඟී එන අවස්ථා.

අවදානම්

- අක්වෙරළ මෙහෙයුම් හේතුවෙන් පුළුල් භූගෝලීය සහ භූ දේශපාලන විෂය පථයකට නිරාවරණය වීම.
- ඉදිකිරීම් අංශයේ මන්දගාමී වර්ධනය සහ ණය පැහැර හැරීමේ අවදානම වැඩි වීම.

ඉදිරි දැක්ම

- බැංකුවේ තරඟකාරී තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා විශේෂයෙන් විද්‍යුත් වාණිජ්‍යය තුළ සේවා කාර්යක්ෂමතාව සහ සේවාදායකයින්ගේ තෘප්තිය වැඩිදියුණු කිරීමට ඩිජිටල් පරිවර්තනය සහ නව වෙළඳපළ වෙනස්කම් වලට අනුවර්තනය වීම.
- උපායමාර්ගික පියවරක් ලෙස විවිධාංගීකරණය සහ වර්ධනය සඳහා යෝග්‍ය නව වෙළඳපළවල් ගවේෂණය කිරීම.
- තිරසාර ව්‍යාපාර සහ කර්මාන්ත දියුණු කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ සහ ආරම්භක අපනයනකරුවන් සඳහා පළාත් මට්ටමේ අපනයන සංසද හරහා අපනයන කවයේ ප්‍රවේශය පුළුල් කිරීම.
- අපගේ විදේශීය ශාඛා හරහා විභව වෙළඳ මූල්‍ය ව්‍යාපාර උපයෝගී කර ගැනීම සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් තුළින් වෙළඳ ව්‍යාපාර පදනම වැඩි කිරීම.
- නව විකුණුම් සංස්කෘතිය සහ හරස් විකුණුම් අවස්ථා පිළිබඳ වැඩි අවබෝධයක් ගොඩනැගීම.



ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්

මෙම අංශය විදේශ මුදල් සම්බන්ධ ගනුදෙනු, ද්‍රවශීලතා සහ අරමුදල් කළමනාකරණය, ආයෝජන කටයුතු සහ විදේශීය ශාඛාවල මෙහෙයුම් කටයුතු හසුරුවයි.

ප්‍රධාන ශක්තීන්

- විදේශීය බැංකු සහ ප්‍රතිපාර්ශ්ව සමඟ දිගුකාලීන සබඳතා මගින් ජාත්‍යන්තර පැවැත්ම.
- අභ්‍යන්තර ප්‍රේෂණවල වෙළඳපළ ප්‍රමුඛයා වීම.
- බැංකුවේ ක්‍රියා පටිපාටි, ක්‍රියාවලි සහ පාලන ආකෘති අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සහාය දක්වන කැපවූ කණ්ඩායම්.

ප්‍රතිඵල

- ද්‍රවශීලතා කළමනාකරණය
- භාණ්ඩාගාර කටයුතු
- ආයෝජන බැංකු කටයුතු
- අභ්‍යන්තර ප්‍රේෂණ
- විදේශීය නියෝජිත බැංකු සබඳතා
- විදේශීය ශාඛා වල කාර්යසාධනය

මෙහෙයුම් සන්දර්භය

වසංගත හා ආර්ථික අර්බුදයෙන් පැන නඟින දැඩි අභියෝග වලට මුහුණ දීමෙන් පසු, 2023 අග භාගයේදී, දේශීය ආර්ථිකයේ මෙන්ම බැංකු අංශයේ ද යම් ප්‍රගතියක් දක්නට ලැබිණි. වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාර්ගෝපදේශ කිහිපයක් නිකුත් කරන ලදී. ණය (රුපියල්) සැපයීම් උපරිම පොළී අනුපාත, 1988 අංක 30 දරණ බැංකු පනතේ 86 සහ 76J නව වගන්තිය යටතේ ද්‍රවශීල වත්කම් නිර්වචනය සංශෝධනය කිරීම, සංචිත අවශ්‍යතා පිළිබඳ මෙහෙයුම් උපදෙස්, මහ බැංකුවෙන් සපයන අත්තිකාරම් මත පොළී අනුපාත (බැංකු අනුපාතිකය), ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත වෙළඳපළ මෙහෙයුම් කටයුතු සම්බන්ධව උපදෙස් සහ බැංකුවලට සහ භාණ්ඩාගාර මෙහෙයුම්වලට බලපෑමක් ඇති කළ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුත් කිරීම පිළිබඳ උපදෙස් එයට ඇතුළත් වේ.

දේශීය ණය ප්‍රශස්තකරණය (DDO) ක්‍රියාත්මක කිරීමත් සමඟ, 2023 දෙවන කාර්තුව අවසානයේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB), ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (ISB) සහ විදේශ ව්‍යවහාර මුදල් ණය මගින් රාජ්‍ය බැංකු රජය වෙත බෙහෙවින් නිරාවරණය විය. කෙසේ වුවද, බැංකුවේ ද්‍රවශීලතාවය, ලාභදායිත්වය සහ ශුද්ධ විවෘත තත්ත්වය (NOP) හෝ විදේශ විනිමය වෙළඳපළට බලපෑමක් ඇති නොවන පරිදි SLDB ප්‍රතිව්‍යුහගත කිරීම බැංකුව විසින් සාර්ථකව නිම කරන ලදී.

අභියෝග මධ්‍යයේ වුවද, බැංකුවේ කැපවීම ප්‍රදර්ශනය කරමින්, අභ්‍යන්තර ප්‍රේෂණවල වෙළඳපළ ප්‍රමුඛ ස්ථානය රඳවා ගැනීමට බැංකුවට හැකි විය.

උපායමාර්ගයට එරෙහිව කාර්යසාධනය

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- දැනුවත් කිරීමේ වැඩසටහන්, සියලුම පාර්ශ්වකරුවන් සමඟ සමීප සම්බන්ධතා මගින් අඛණ්ඩව සම්බන්ධ වීම.
- බැංකුවේ අනාගත වර්ධනය සඳහා ආරම්භ කරන ලද උපායමාර්ගික හවුල්කාරිත්වයන්.
- කොටස් ආයෝජන කළඹ උපරිම ලාභයක් ගෙන දෙන පරිදි ප්‍රතිව්‍යුහගත කිරීම.

ගනුදෙනුකාර අත්දැකීම්හි විශිෂ්ටත්වය

- විදේශීය ගනුදෙනුකරුවන්ට සහය වීම සඳහා 'විදේශ කවය' පුළුල් කරන ලදී.
- විදේශීය සේවක ප්‍රේෂණ ප්‍රවාහයේ වර්ධනය අරමුණු කරගෙන 2023 වසර තුළදී නව විදේශීය නියෝජිත ආයතන පහක් සමඟ සම්බන්ධවීම.
- විදේශ රටවල් වෙත පිටත්වීමට පෙර සහ පසු අවශ්‍ය වන මූලික කටයුතු වලට සහනයක් ලෙස ණය යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

- ඉහළ වත්කම් වටිනාකමකින් යුත් තැන්පතු ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් විදේශීය මෙහෙයුම් හරහා පැවැත්වූ ගනුදෙනුකාර සංසද.

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- ආයෝජන බැංකු අංශයේ භාරකරු ආයෝජන සහ වත්කම් කළමනාකරණ කාර්යයන් ස්වයංක්‍රීය කරන ලදී.
- තත්පර 5-15 ක් ඇතුළත අන්තර්ජාල තත්කාලීන සැකසුම් සැපයීම ඉලක්ක කරගත්, රට තුළ වේගවත්ම ප්‍රේෂණ බෙදාහැරීමේ අත්දැකීම ලබා දීම සඳහා Smart Remit පද්ධතිය යාවත්කාලීන කරන ලදී.
- මාලදිවයිනේ සියලුම බැංකු ශාඛා වසරේ පැය 24/ දින 7 පුරා මාලදිවයින් රුෆියා (MVR) හිඟුම් හිමියන් සඳහා ක්ෂණික ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.
- 2023 තුළ නව යෙදුම් ක්‍රමලේඛන අතුරු මුහුණත් (API) ඒකාබද්ධ කිරීම් 14 ක්.
- දත්ත සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා පද්ධති වැඩිදියුණු කිරීම්.

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

- ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවේ නිරන්තර තක්සේරුව.

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

- ඩිජිටල් සහ භෞතික යන මාර්ග දෙකම හරහා අභ්‍යන්තර ප්‍රේෂණ ආශ්‍රිත සේවාවන් සඳහා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- දුරස්ථ වැඩ කිරීමේ පහසුකම ලබා දී ඇත.
- කාර්ය මණ්ඩලයේ විවිධ ඵලදායිතා වැඩි දියුණු කිරීමේ මූලපිරීම් ක්‍රියාත්මක කරන ලදී.

ජාත්‍යන්තර බැංකුකරණය

දේශීය වෙළඳපළේ පවතින දැඩි තරඟකාරිත්වය නිසා විදේශ විනිමය මූලාශ්‍රයක් ලෙස විදෙස් ගත සේවකයින්ගේ ප්‍රේෂණ කැපී පෙනෙන අතර, බැංකුව සිය සේවක ප්‍රේෂණ වෙළඳපළ කොටස රඳවා තබා ගැනීම සහ වැඩි දියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය. වර්තමානයේදී, ලංකා බැංකුව විසින් ලොව පුරා විදේශීය නියෝජිත සබඳතා බැංකු 763 ක් සහ විනිමය සමාගම් 94 ක් සමඟ බැංකු සබඳතා ඇති අතර, විදේශගත වන්නන්ට තම උපයාගත් මුදල් තම ආදරණීයයන් වෙත එවීම සඳහා පහසු ප්‍රවේශයක් සලසා දෙයි. 2023 වර්ෂය තුළ නව විදේශීය සම්බන්ධතා ඒකක පහක් ස්ථාපිත කරන ලද අතර, විදෙස් ගත සේවක ප්‍රේෂණ වෙළඳපළ කොටස වර්ධනය කිරීමට එය තවදුරටත් උපකාරී වනු ඇත. විදේශයන්හි සිටින ගනුදෙනුකරුවන්ට තම බැංකු කටයුතු සුමටව කරගෙන යාමට සහාය වීම සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් 30 ක් ලොව පුරා තෝරාගත් ස්ථාන සඳහා යොදවා ඇත.

2023 වසරේදී සේවක ප්‍රේෂණ වෙළඳපළේ සැලකිය යුතු කොටසක් අත්පත් කර ගැනීමටත් වෙළඳපළ තුළ සිය ප්‍රමුඛ ස්ථානය තහවුරු කර ගැනීමටත් බැංකුවට හැකි විය. සමස්ත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණය ඇ. ඩො. මිලියන 1,237.4 ක් වූ අතර එය 2022 ට සාපේක්ෂව 49% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. අපගේ පුළුල් නියෝජිත සබඳතා හරහා ලෝකයේ සෑම රටකින්ම පාහේ ශ්‍රමික ප්‍රේෂණ ලැබී ඇත.


බැංකුවේ විශ්වාසවන්ත ගනුදෙනුකාර පදනම ඇගයීම සඳහා මෙම අංශය විසින් ඔවුන් ඇගයීමේ වැඩසටහන් 38 ක් සංවිධානය කරන ලදී. තවද සමාලෝචිත වර්ෂය තුළ, 9,400 කට ආසන්න ගනුදෙනුකරුවන් පිරිසකගේ සහභාගීත්වයෙන් වැඩසටහන් 190 ක් පවත්වන ලදී. සංක්‍රමණික සේවකයන්, ඔවුන්ගේ පවුල් සහ අනාගත සංක්‍රමණිකයන් සඳහා බැංකුව විසින් සපයනු ලබන මූල්‍ය සේවා පිළිබඳව වැඩි අවබෝධයක් ලබා දීම කෙරෙහි බැංකුවේ විශේෂ අවධානය යොමු කර ඇත.

අභ්‍යන්තර ප්‍රේෂණ
ඇ. ඩො. බිලියන 4.8 කි.

විදේශ විනිමය සහ දේශීය මුදල් ද්‍රවශීලතා තත්ත්වයන්හි ධනාත්මක වර්ධනය

රු. බිලියන 10.0 ක බාසල් III අනුකූල, ලැයිස්තුගත ණයකර නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජ්‍ය බැංකුව

BoC My Sri Lanka
විශේෂ විදේශ මුදල් ස්ථාවර තැන්පතු



ලොව පුරා විදේශීය නියෝජිත බැංකු සමඟ සබඳතා 763 ක් සහ විනිමය සමාගම් 94 ක්

2023 වර්ෂය තුළ නව විදේශීය සම්බන්ධතා ඒකක පහක් ස්ථාපිත කිරීම

ලොව පුරා ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් 30 ක්

ලංකා බැංකුව හරහා ප්‍රේෂණ එවීමට විදේශගත ප්‍රජාව දිරිමත් කිරීම සඳහා, 2023 වර්ෂය පුරාවට පහත ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

BoC පිට පිට රට නැඟි

රටින් කාසි බිලට වාසි

BoC රන් කහවනු ගුවන් විදුලි වැඩසටහන

එතෙර මෙතෙර රූපවාහිනී වැඩසටහන

විවිධ රටවල විනිමය හුවමාරු සමාගම් සමඟ ඒකාබද්ධව අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලද අතර බැංකුව හරහා වැඩි ප්‍රේෂණ ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට එවීමට ඔවුන් දිරිමත් කිරීම සඳහා ප්‍රමුඛ විනිමය හුවමාරු සමාගම් වෙත විශේෂිත ගාස්තු ව්‍යුහයන් සහ වට්ටම් ලබා දී ඇත.

භාණ්ඩාගාර මෙහෙයුම්

වසරේ මුල් කාර්තු දෙක තුළ, භාණ්ඩාගාර මෙහෙයුම් අංශය විසින් ඉහළ පොළී වියදම් වලට තුඩු දුන් ඉහළ පිරිවැයක් සහිත ණය ගැනීම් සහ තැන්පතු සමඟින් බැංකුවේ ද්‍රවශීලතාව කළමනාකරණය කරන ලදී. ඒ අතරම, ණය දීමේ අඩුවීම මත පොළී ආදායමේ ද අඩුවීමක් සිදුවූ අතර අක්‍රීය ණය වැඩිවීමත් සමඟ ශුද්ධ පොළී ආන්තිකය තවදුරටත් පටු වීමට හේතු විය. කෙසේ වෙතත්, ඉහළ පිරිවැයක් සහිත දේශීය සහ විදේශ මුදලින් ණය ලබාගැනීම් පියවීම සහ අඩු පොළී අනුපාත යටතේ තැන්පතු ප්‍රතිමිලකරණය කිරීම මගින් පොළී වියදම් සැලකිය යුතු ලෙස අඩු කරමින් වසරේ අග භාගයේදී බැංකුව යථා තත්ත්වයට පත් විය. වසර ආරම්භයේ පැවති සෘණාත්මක ද්‍රවශීලතා තත්ත්වය 2023 මැයි වන විට ධනාත්මක තත්ත්වයකට හැරුණ අතර වසරේ ඉතිරි කාලය පුරාවට ස්ථාවරව පවත්වා ගෙන යනු ලැබිණි.

අපේක්ෂිත ආතති සිදුවීම්වලට සහ බැංකුවේ නිසි ක්‍රියාකාරිත්වයට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතා අවශ්‍යතාවයන් පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා අංශය විසින් ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව නිරන්තරයෙන් තක්සේරු කරන ලදී.

විවිධ බාධාවන් මධ්‍යයේ වුවද, අංශය විසින් නියාමන අනුපාත පවත්වා ගෙන ගිය අතර මධ්‍යස්ථ මෙහෙයුම් කාර්යයක් ලෙස භාණ්ඩාගාරයේ කාර්යභාරය ස්ථාපිත කරන ලදී. භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වලින් සමන්විත අපගේ රාජ්‍ය සුරැකුම්පත් කළඹ 2022 වසරට සාපේක්ෂව වර්ධනයක් සනිටුහන් කළ අතර රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපළේ ඇති වෙළඳ අවස්ථා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගනිමින් කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත්වල අතිරික්ත ද්‍රවශීලතාව ආයෝජනය කළ බැවින් භාණ්ඩාගාර මෙහෙයුම් අංශය වසර අවසානයේදී ප්‍රාග්ධන ලාභයක් උපයා ගන්නා ලදී.

ආයෝජන බැංකුකරණය

රු. බිලියන 10.0 ක බාසල් III අනුකූල ලැයිස්තුගත ණයකර නිකුත් කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජ්‍ය බැංකුව ලෙස ආයෝජන බැංකුකරණ අංශය කැපී පෙනෙන සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. ලංකා බැංකු ණයකර ලැයිස්තුගත කිරීමත් සමඟ, ලංකා බැංකු ණයකර වලට අමුණා ඇති ලක්ෂණ සපුරාලීම සඳහා ප්‍රථම වරට කොටස් වෙළඳපළේ සදාකාලික නිත්‍ය බැඳුම්කර ලැයිස්තුගත කිරීමට කොළඹ කොටස් වෙළඳපළේ පහසුකම් සලසා ඇත.

නව ගනුදෙනුකරුවන් වෙත පිරිනැමෙන වැඩිදියුණු කළ ආයෝජන කළමනාකරණ සේවාවක් සමඟින්, අංශය සිය ගනුදෙනුකාර පදනම 28% කින් වැඩි කර ගැනීමට සමත් විය.

කොටස් වෙළඳපළ ආයෝජන තුළ දිගුකාලීනව අලාභ ලබන කොටස් විකිණීම සහ කොටස් වල ආයෝජන තාර්කිකකරණය කරන ලදී.

තවද, ආයෝජන බැංකුකරණ කාර්යය ස්වයංක්‍රීය කිරීම ද සිදු වෙමින් පවතී.

විදේශීය මෙහෙයුම්

විදේශීය මෙහෙයුම් කටයුතු ආරම්භ කරමින්, ලංකා බැංකුව විදේශයන් හි සිය ව්‍යාප්තිය පුළුල් කර ඇති අතර, බැංකුව පූර්ණ හිමිකාරිත්වය දරණ BOC (UK) Ltd. ඇතුළු ප්‍රධාන ස්ථාන හතරක විදේශීය පිහිටීම් සටහන් කර ඇත.

ලංකා බැංකුව පූර්ණ භාණ්ඩාගාර මෙහෙයුම් සමඟ බාධාවකින් තොරව ගෝලීය පුද්ගලික සහ ව්‍යාපාරික ගනුදෙනුකාර සේවා සපයන විදේශීය බැංකු මෙහෙයුම්වල විශ්වාසනීය හවුල්කරුවෙකු ලෙස සිය භූමිකාව ශක්තිමත් කර ඇත.

චෙන්නායි

ගෝලීය අර්බුදකාරී තත්ත්වයන් පැවතියද, නිෂ්පාදන, වෙළඳාම සහ අපනයන කර්මාන්ත හරහා විශේෂ මහා පරිමාණ ව්‍යාපෘති කිහිපයකට අරමුදල් සැපයීමට ශාඛාව සමත් විය. මෙහෙයුම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා විශේෂිත කළමනාකරණ උපක්‍රමයන් ලෙස:

- දැනුවත් කිරීමේ වැඩසටහන්, සියලු පාර්ශ්වකරුවන් අතර සම්බන්ධතාවන් ඇති කිරීම මගින් අබණ්ඩ බැංකුවේ ප්‍රතිරූපය ගොඩනැගීමේ උත්සාහයන්
- නිරන්තරව සැලසුම් කරන ලද ගනුදෙනුකාර සංසද
- කාර්ය මණ්ඩලය සඳහා ධාරිතාව සහ චිත්ත ධෛර්යය ගොඩනැගීමේ වැඩසටහන්

ශාඛා මෙහෙයුම්වල දත්ත ආරක්ෂාව සහ සයිබර් ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා පද්ධති වැඩිදියුණු කිරීම් කිහිපයක් ද වසර තුළ සිදු කරන ලදී.

මාලදිවයින

මාලදිවයිනේ පිහිටි අපගේ ශාඛාවේ කළමනාකාරිත්වය බැංකුවේ මෙහෙයුම් සහ එහි පාර්ශ්වකරුවන්ගේ යහපැවැත්ම යන දෙකම ආරක්ෂා කරමින් අවිනිශ්චිතතාවයන් මඟහරවා ගැනීමට බහුවිධ උපායමාර්ගයක් ක්‍රියාත්මක කළේය. සේවක සුභසාධන මූලපිරීම්, නියාමන අධිකාරීන් සමඟ සහයෝගීතාවය, ක්‍රියාකාරී ප්‍රජා සහභාගීත්වය සහ නිරන්තර අධීක්ෂණය සහ අනුවර්තනය වීම, නැගී එන අභියෝග කළමනාකරණය කිරීමට බැංකුවේ කැපවීම අවධාරණය කරයි.

- අන්තර්ජාල සේවා මත රඳා පැවැත්ම වැඩිවීමත් සමඟ ඩිජිටල් බැංකු නාලිකා කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇත. මාලදිවයිනේ මුදල් අධිකාරියේ මූලපිරීමක් ලෙස, මාලදිවයින් රුෆියා (MVR) ගනුදෙනු සඳහා ක්ෂණික ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශාඛාව වසර තුළදී 'Favara' පද්ධතිය සමඟ සාර්ථකව ඒකාබද්ධ වී ඇත.
- වර්ෂය තුළ දී මාලදිවයිනේ සංචාරක, ඉදිකිරීම් සහ දේපළ වෙළඳාම් කර්මාන්ත සඳහා මහා පරිමාණ ණය පැකේජ පිරිනමන ලදි.

ව්‍යාපාර අංශවල කාර්යසාධනය

- ගනුදෙනුකාර සහාය මූලපිරීම් වලට ප්‍රමුඛත්වය දීම, නම්‍යශීලී ආපසු ගෙවීමේ විකල්පයන් ඉදිරිපත් කිරීම සහ මූල්‍ය අභියෝග වලට මුහුණ දෙන ගනුදෙනුකරුවන්ට සහන සැලසීමේ වැඩසටහන් සඳහා මඟ පෙන්වීම.
- අත්‍යාවශ්‍ය සේවා සඳහා ශාඛාවල දැඩි ආරක්ෂිත ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම මගින් ගනුදෙනුකරුවන්ගේ සහ කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම අවධාරණය කිරීම.
- විනිවිද පෙනෙන සන්නිවේදනය, අඛණ්ඩ අවදානම් තක්සේරුව සහ හදිසි සැලසුම්.

සීෂෙල්ස්

සීෂෙල්ස් ශාඛාවේ කළමනාකාරිත්වය ගනුදෙනුකාර සබඳතා වැඩිදියුණු කිරීම සඳහා, විශේෂයෙන්ම තැන්පත්කරුවන්ගේ විශ්වාසය ගොඩනැගීම සඳහා පියවර කිහිපයක් ගෙන ඇත. ගුණාත්මක ණය කළඹක් පවත්වා ගැනීමට ඇති කැපවීම ප්‍රදර්ශනය කරමින් ශාඛාව සිය වත්කම් ගුණාත්මකභාවය සාර්ථකව වැඩිදියුණු කර ඇත.

ඩිජිටල් අංශයෙන්, ශාඛාව වසර තුළ අන්තර්ජාල බැංකුකරණ විසඳුමේ පළමු අදියර සහ ස්වයංක්‍රීය වෙළඳ මූල්‍ය පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී. සීෂෙල්ස් ශාඛාව 2023 වර්ෂයේදී ද අඛණ්ඩව ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත.

අපගේ ඉදිරි ගමන් මඟ

අවස්ථාවන්

- ඩිජිටල්කරණය, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය, කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ මානව ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කිරීමෙන් අඛණ්ඩ ජයග්‍රහණ අත්කර ගැනීමට හැකිවීම.
- ලංකා බැංකුවේ ජාත්‍යන්තර ප්‍රවේශය පුළුල් කිරීම සහ නව වෙළඳපළවල් වලට පිවිසීමෙන් එහි පැවැත්ම
- මුදල් සහ ද්‍රවශීලතා පුරෝකථනය සහ පුරෝකථන වාර්තා කිරීම තුළින් ව්‍යාපාර තීරණ ගැනීම දිරිමත් කිරීම.
- ප්‍රාග්ධන වෙළඳපළ උපදේශන සේවා සැපයීම, භාරකරු ක්‍රියාකාරකම් පුළුල් කිරීම සහ ආයෝජන කළඹ කළමනාකරණ සේවා සැපයීම සඳහා බැංකුවේ ශක්තීන් උපයෝගී කර ගැනීමට හැකිවීම.

අවදානම්

- ගෝලීය සාර්ව ආර්ථික පීඩනය
- කොටස් වෙළඳපළේ අස්ථාවරත්වය

ඉදිරි දැක්ම

- ඉහළ පරිමාවන් සහ අඩු පොළී ආන්තිකය සමඟ විනිමය ආදායම වැඩි කිරීම.
- පොළී ආදායම, ප්‍රාග්ධන ලාභ සහ ශුද්ධ පොළී ආන්තිකය (NIM) වැඩි කිරීම සඳහා අඩු වියදම් තැන්පතු ප්‍රවර්ධනය කිරීම සහ ආයෝජන පුළුල් කිරීම.
- ශාඛා ජාලය හරහා ගනුදෙනු මෙහෙයුම් වැඩි කිරීම.
- විද්‍යුත් වෙළඳාම් පද්ධතියන් හරහා ව්‍යුත්පන්න නිෂ්පාදන විවෘත කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- ලංකා බැංකු චෙන්නායි ශාඛාවේ සහයෝගිතාවයෙන් ඉන්දියානු රුපියල් (INR) හි විදේශ විනිමය ගනුදෙනු වර්ධනය කිරීම.
- මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය.
- ගාස්තු ආදායම ඉහළ නැංවීම සඳහා අලෙවිකරණ ප්‍රවර්ධනය හරහා ආයෝජන කළඹ කළමනාකරණ සේවාව පුළුල් කිරීම.
- අපගේ ජාත්‍යන්තර පැවැත්ම පුළුල් කිරීම.
- සියලුම විදේශීය ශාඛා සහ කාර්යයන් හරහා ඩිජිටල්කරණය වැඩිදියුණු කිරීම.






5

සැමට සාමූහික වටිනාකමක්

සූර්යයාගේ අඛණ්ඩ ගමන් පථය මතින් නිරායාසයෙන්ම අහස සිසාරා සිය අණසක පතුරවමින් ශාකවල ප්‍රභාසංශ්ලේෂණය මෙහෙයවන අතරම පෘථිවියේ ජීවය පවත්වා ගැනීම සඳහා පාරිසරික ක්‍රියාවලීන්ට මූලික ප්‍රභවය වේ.

බැංකුව විහි දීර්ඝ කාලීන අත්දැකීම් සමඟින් සිය තීරණ හරහා ශ්‍රී ලාංකිකයන්ගේ දිගුකාලීන අපේක්ෂාවන්ට ප්‍රතිලාභ ලබා දෙන බවට සහතික කරයි. අපගේ පාර්ශ්වකරුවන්ට තිරසාරව සියල්ල අන්තර්ගත සාමූහික වටිනාකමක් ලබා දෙන අතරම ධනාත්මක දිගු කාලීන බලපෑමක් ඇති කිරීමට අපි කැපවී සිටින්නෙමු.

අපගේ ගනුදෙනුකරුවන් සඳහා ශක්තිමත් හවුල්කරුවෙක්



විශිෂ්ටත්වය, පහසුව සහ විශ්වාසය ඉහළම පදනම් කරගත් අත්දැකීම් ලබා දීමේ අභිලාෂය බැංකුවේ සෑම කාර්යයක් සමඟම ඒකාබද්ධ කරමින් විශිෂ්ට ගනුදෙනුකාර අත්දැකීමක් ලබා දීම බැංකුවේ ප්‍රයත්නය වේ. අප සමඟ කල් පවත්නා සබඳතා පවත්වා ගෙන යාමේදී ගනුදෙනුකරුවන් හා ව්‍යාපාර යන දෙඅංශයටම වර්ධනය සඳහා වසරින් වසර අවශ්‍ය වටිනාකම් ලබා දීමට අප බැඳී සිටින්නෙමු.

2,241
සෘජු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන

මිලියන 16 ක
ගනුදෙනුකරුවන්

73%
ඉලක්ක වෙළෙඳපල ආවරණය

50%
කාන්තා ගනුදෙනුකරුවන්

ගනුදෙනුකරුවන්ට
රු. ට්‍රිලියන 2.5 ක
මූල්‍ය පහසුකම්

නව නිෂ්පාදන
නවයක්

තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා බලපෑම



ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා: M1 M2

- ආර්ථික අර්බුදය හේතුවෙන් ගනුදෙනුකරුවන්ට විනිමය අනුපාත අස්ථාවරත්වය, වර්ධනය වන උද්ධමන පීඩනය, ඉහළ පොළී අනුපාත සහ පාලන තන්ත්‍රයේ සාමූහික බලපෑම්වලට මුහුණ දීමට හේතු වූ අතර එමඟින් ණය ආපසු ගෙවීම සහ ඔවුන්ගේ සුබසාධනය කෙරෙහි පීඩනයක් එල්ල විය.
- සීමිත ඉන්ධන සැපයුම සහ ඉහළ මිල සංශෝධන හේතුවෙන් සංචලනය අභියෝගාත්මක වූ අතර ගනුදෙනුකරුවන්ට බැංකු සේවා සඳහා සුරක්ෂිතව ප්‍රවේශ වීමේ පහසුව සඳහා වැඩි අවශ්‍යතාවයක් නිර්මාණය විය.





- මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය
- අසමසම ගනුදෙනුකාර පදනම
- වගකීම් සහගත බැංකුකරණය

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 01

මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය

GRI 2-7

ලංකා බැංකුව, ශ්‍රී ලංකාව පුරා සහ ඉන් ඔබ්බට මිලියන 15 කට අධික ගනුදෙනුකරුවන්ගෙන් සමන්විත විවිධ ගනුදෙනුකාර පදනමක් සඳහා සේවා සපයයි. 73% ක අසමසම ඉලක්ක වෙළඳපළ ආවරණය අනුපාතයක් සමඟින්, ළදරුවන්ගේ සිට ජ්‍යේෂ්ඨ පුරවැසියන් දක්වා ද, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් ද, බහුජාතික සමාගම් ද, රජය සතු ව්‍යවසායන් සහ විශාල සමාගම් වලින් සමන්විත පුළුල් ගනුදෙනුකාර පදනමක් සහිත ලංකා බැංකුව මෙම සියළුම පිරිස් සඳහා වන බැංකු සේවාවන් සැපයීමට සමත් විශාල පරාසයක් සහිත බැංකු සේවාවන් රැසකින් සමන්විතය.


වේගයෙන් දියුණු වන වෙළඳපළක ගතික ඉල්ලීම් සපුරාලීම හා තම ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම සඳහා බැංකුව තම පුළුල් නිෂ්පාදන මිශ්‍රය සහ තම දිගුකාලීන ජාත්‍යන්තර සබඳතා යොදා ගනී.

බැංකුව, සමාජයේ සියලුම ජන කොට්ඨාස සඳහා සේවා සපයයි. ජාතියේ විශාලතම ශාඛා ජාලය, විවිධත්වයෙන් පොහොසත් නිෂ්පාදන කළඹ, වේගයෙන් වර්ධනය වන ඩිජිටල් හා භෞතික සේවා සැපයීම මගින් සෑම තරාතිරමකම ගනුදෙනුකරුවන් සමඟ බැංකුව සම්බන්ධ වේ. තවද අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශ වලට බැංකු පහසුකම් සැපයීමද අඩු නියෝජනයක් ඇති සමාජ කාණ්ඩ මූල්‍ය කටයුතු වලට යොමු කිරීම, ඉතුරුම් සංස්කෘතියක් පෝෂණය කිරීම සහ මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය පුළුල් කිරීම මගින් ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නැංවීමට බැංකුව සිය දායකත්වය සපයයි.

බැංකුවේ ජංගම සහ සීමිත සේවා ශාඛා සේවාවන් බැංකුකරණ පහසුකම් සඳහා බාධාවකින් තොරව ප්‍රවේශය සහතික කරන අතරම, තාක්ෂණික දැනුමැති ගනුදෙනුකරුවන්ද බැංකුකරණයේ ඩිජිටල් නාලිකා හරහා තම රුචිකත්වය පරිදි බැංකුකරණ සේවාවන් ලබා ගැනීමේ පහසුව සපයයි. අපගේ බැංකුකරණයට B App, SmartPay යෙදුම, BOC Connect නියෝජිත බැංකුකරණය සහ Meta Banking විසඳුම් ඇතුළත් වේ.

බැංකුවේ ඩිජිටල් හැකියාවන් පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර 'ඩිජිටල්කරණයෙන් බල ගැන්වූ බැංකුවක්' පිටු 98 සිට 102 දක්වා බලන්න.

භූගෝලීය වශයෙන් ගනුදෙනුකරුවන් බෙදීයාම %



අබණ්ඩව සේවා සැපයීම සහතික කිරීම

සමාලෝචිත වර්ෂය තුළ දිවයිනේ ප්‍රවේශතාව, ප්‍රවාහනය සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සැලකිය යුතු බාධා කිරීම් සිදු විය. ඉන්ධන අර්බුදය පවතින කාලය පුරාවට කිසිදු ශාඛාවක් වසා නොදැමීමට වගබලා ගනිමින් බැංකුව තම ව්‍යාපාර කටයුතු වල අඛණ්ඩ පැවැත්මට ප්‍රමුඛත්වය දෙන ලදී. මීට අමතරව, ලංකා බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන විශාල ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන ජාලය තම ගනුදෙනුකරුවන් සඳහා බාධාවකින් තොරව සේවා ප්‍රවේශය සහතික කරයි.

තවද, ඉන්ධන අර්බුදය තුළ ග්‍රාමීය හා දුරස්ථ ස්ථාන සමඟ සම්බන්ධ වීමට බැංකුවේ කලින් ස්ථාපිත ජංගම බැංකු ඒකක ("ජංගම සේවා රථ") සහ BOC Connect නව නියෝජිතායතන බෙහෙවින් උපකාරී විය. බැංකුවේ ඩිජිටල් හැකියාවන් වසර තුළ පුළුල් කරන ලද අතර එමඟින් වසර තුළ මෙහෙයුම් සුමටව පවත්වාගෙන යාමට බැංකුවට ඇති හැකියාව ශක්තිමත් විය.

බැංකුවේ සේවා ජාලය පුළුල් කිරීම

දිවයින පුරා පැතිරුණු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,231 ක් සමඟින් පුළුල් පරාසයක භූගෝලීය ආවරණයක් පුරා බැංකුව සිය සේවා සැපයීම ව්‍යාප්ත කර ඇත. එමෙන්ම ගෝලීය හා කලාපීය නව ප්‍රවණතා සමඟ සමපාත වූ බහු නාලිකා උපායමාර්ග හා ඩිජිටල් ප්‍රවේශ හේතුවෙන් 2023 වසරේ ගනුදෙනු වලින් 46% ඩිජිටල් මාධ්‍යය හරහා සිදු විය.

වීරඹුගෙදර නව ශාඛාවක් ද කන්කසන්තුරේ සහ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල, වේරහැර නව සීමිත සේවා ශාඛා දෙකක් විවෘත කිරීම හරහා බැංකුව සිය භෞතික පැවැත්ම ශක්තිමත් කිරීමට සහ තහවුරු කිරීමට අඛණ්ඩව කටයුතු කළේය.

මීට අමතරව, ශාඛා නවයක් ප්‍රතිස්ථාපනය කල අතර ප්‍රවේශවීමේ පහසුව සඳහා නව BOC Connect නියෝජිතයින් 43 ක් ද නව මුදල් චක්‍රීකරණ යන්ත්‍ර 163 ද ස්මාර්ට් කලාප 19 ක් ද වසර තුළදී ස්ථාපිත කරන ලදී.

ශාඛා 9 ක්
ගනුදෙනුකාර පහසුව සඳහා ප්‍රතිස්ථාපනය කර ඇත

නව ශාඛා 3 ක්
විවෘත කරන ලදී (සීමිත සේවා ශාඛා ඇතුළුව)

ස්මාර්ට් කලාප **19 ක්** ආරම්භ කිරීම

නව මුදල් චක්‍රීකරණ යන්ත්‍ර **163 ක්** ස්ථාපනය කර ඇත


නව BOC Connect නියෝජිත සම්බන්ධතා **43 ක්** ආරම්භ කිරීම



අපගේ ගනුදෙනුකරුවන් සඳහා ශක්තිමත් හවුල්කරුවෙක්

2023 දී ගනුදෙනුකාර නාලිකා

වසර තුළ, පහත නාලිකා මෙහෙයුම් කටයුතු සඳහා උපරිම ප්‍රවේශය සක්‍රීය කළේය:



ප්‍රමුඛතා ක්ෂේත්‍ර 02

අසමසම ගනුදෙනුකාර පදනම

ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය සඳහා ලංකා බැංකුවේ කැපවීම එහි සමස්ත නිෂ්පාදන, සේවා සහ ක්‍රියාවලි මගින් අනාවරණය වේ. ආර්ථික අර්බුදය නිසා ඇති වන අභියෝග හමුවේ වසර තුළදී, බැංකුව විසින් ගනුදෙනුකාර අවශ්‍යතා සඳහා කාලීන ප්‍රතිචාර දැක්වීම තුළින් අඛණ්ඩව පහසුකම් සැලසීය.

ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපනය

GRI 201-1

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය හේතුවෙන්, විශේෂයෙන්ම බැංකුවේ ආයතනික ගනුදෙනුකරුවන්ට පෙර නොවූ විරූ අභියෝග වලට මුහුණ පෑමට සිදු විය. හීනවන වෙළඳපල කොටස, ඉහළ යන ණය පිරිවැය, මුදල් ප්‍රවාහය සහ කාරක ප්‍රාග්ධනය හා සම්බන්ධ සැලකිය යුතු අභියෝග සහ සමහර අවස්ථා වලදී අවසන් ප්‍රතිඵලය ලෙස බංකොලොත් භාවයට පත්වීම යන විවිධ වූ අභියෝග වලට මුහුණ දීමට ආයතනයන්ට සිදු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අක්‍රීය ණය පහසුකම් (NPCF) සංඛ්‍යාව ඉහළ යමින් පැවතුනි.

පවතින අර්බුදවලට ප්‍රතිචාර වශයෙන් බැංකුව පැහැර හැරී ණය අයකර ගැනීමට වඩා ව්‍යාපාර පුනර්ජීවනයට ප්‍රමුඛත්වය දුන්නේය. ප්‍රතිලාභදායක ණය සංස්කෘතියක් සහ ශක්තිමත් ණය කළඹක් ස්ථාපිත කිරීම බැංකුවේ උපායමාර්ගික සැලැස්මේ තීරණාත්මක කරුණක් ලෙස අඛණ්ඩව අවධානයට ලක් කෙරුණි.

බැංකුවේ ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය (BRRU), ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් ගනුදෙනුකරුවන්ට උපකාර කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත:

ගනුදෙනුකරුවන්ට සහාය වීම සඳහා ගත් උපායමාර්ග

- අක්‍රීය/අඩු කාර්යසාධනයට පත් වූ ව්‍යාපාර සඳහා අභියෝගාත්මක තත්ත්වයන් යටතේ වුවද දිගුකාලීනව තම මෙහෙයුම් සහ ලාභදායීත්වය ගොඩනංවා ගැනීමට සහ පවත්වා ගැනීමට සහයෝගය දැක්වීම.
- අක්‍රීය/අඩු කාර්යසාධනයට පත් වූ ව්‍යාපාර සඳහා මුදල් ප්‍රවාහය පදනම් කරගෙන අරමුදල් සැපයීම සහ එම පහසුකම් සමීපව නිරීක්ෂණය කිරීම.
- දැඩි අයකර ගැනීමේ පිලිවෙත් වලින් බැහැරව ගනුදෙනුකරුවන් සමඟ යහපත් සම්බන්ධතාවක් ගොඩනඟා ගැනීමෙන් අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- මුදල් ප්‍රවාහය ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ අරමුණින් මෙම ඒකකය යටතට ගත් ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර සඳහා මූල්‍ය උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම.
- අනුමත BRRU ගනුදෙනුකරුවන් සඳහා නම්‍යශීලී නියමයන් සහ කොන්දේසි ඉදිරිපත් කිරීම.
- ව්‍යාපාරික මෙහෙයුම් හා මුදල් ප්‍රවාහ පිළිබඳ නිරන්තර සමාලෝචනය.
- නිරන්තරව ගනුදෙනුකරුවන් මුණ ගැසීම හා පසු විපරම් කිරීම.

ව්‍යාපාර පුනර්ජීවනය සහ පුනරුත්ථාපන ඒකකය ශක්තිමත් කිරීමේ උපායමාර්ග

- BRRU යටතේ වෙනම ණය ආධාරක අංශයක් පිහිටුවීම.
- සියලුම පළාත් BRRU නිලධාරීන් සඳහා තම රාජකාරී කටයුතු පිළිබඳ ප්‍රායෝගික පුහුණුව.
- ගනුදෙනුකරුවන් ඇගයීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන්.
- සමාජ මාධ්‍ය හරහා ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන්.

174
2023 වසර තුළ පුනර්ජීවනය කළ ගනුදෙනුකරුවන්

රු. මිලියන 4,822.2
2023 වර්ෂය තුළ අයකර ගැනීම්

පුනර්ජීවනය කල ව්‍යාපාරයන් හි මුළු ණය පහසුකම් ප්‍රමාණය
රු. බිලියන 82.2

6,500
ආසන්න වශයෙන් රැකියා සුරක්ෂිත කිරීම

සේවා විශිෂ්ටත්වය


ඩිජිටල් සහ භෞතික නාලිකා පුළුල් කිරීමට සහ ශක්තිමත් කිරීමට අමතරව, සමස්ත ගනුදෙනුකාර අත්දැකීම්හි තෘප්තිමත් මට්ටම වැඩිදියුණු කිරීමට බැංකුව වැඩසටහන් මාලාවක් ආරම්භ කළේය.

ගනුදෙනුකරුවන් සමඟ සුහද සම්බන්ධතාවය තවදුරටත් වර්ධනය කරගනිමින් අඛණ්ඩව පවත්වා ගෙන යාමට මූලික අරමුණ කොට ගත් 'Tea with BOC' සංකල්පය හඳුන්වා දුන් අතර, වසර තුළ එවැනි හමුවීම් 1,650 ක් පවත්වන ලද අතර, දිවයිනේ විවිධ ප්‍රදේශයන් හිදී ගනුදෙනුකරුවන් 11,300 ක් මේ සඳහා සහභාගී විය. ගනුදෙනුකරුවන්ට සහාය වීමට සහ ඔවුන්ට පහසුකම් සැලසීමට Meeter Greeter (ගනුදෙනුකරුවන් ශාඛාවට පැමිණීමේදී ඔවුනුට අවශ්‍ය සේවා අංශ වෙත යොමු කරමින් ඔවුන්ට සහය සැපයීම) පහසුකම ද ශක්තිමත් කරන ලදී.

මීට අමතරව, ගනුදෙනුකාර සේවා වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම ගොඩනැගීමේ අරමුණින් සියලුම සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති ගනුදෙනුකරුවන්ට සහාය වීම සඳහා සෑම ශාඛාවකම සම්බන්ධතා නිලධාරීන් පත් කරන ලද අතර, ශාඛා ජාලය හරහා 5s සංකල්පය ක්‍රියාත්මක කිරීමෙන් සමස්ත වැඩ පරිසරය ක්‍රමවත් කරන ලදී.

පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තියක් හරහා ගනුදෙනුකරුවන් විසින් යොමු කරන ගැටළුකාරී තත්ත්වයන් සමනය කිරීමට ක්‍රමවත් ක්‍රියාවලියක් අනුගමනය කෙරේ. තවද, ඉදිරිපෙල සේවක ධාරිතාව ඉහළ නංවමින් නව ව්‍යාපාර අවස්ථා ගවේෂණය කිරීම සහ ගනුදෙනුකාර පැමිණිලි සහ සේවා සම්බන්ධ ගැටළු විසඳීම සහ අවශ්‍ය නිවැරදි කිරීම් හඳුනා ගැනීම මගින් විශිෂ්ඨ සේවාවක් සැපයීම සඳහා බැංකුවේ ගනුදෙනුකාර අත්දැකීම් ඒකකය ස්ථාපිත කර ඇත.

අපගේ සේවයේ තෘප්තිමත් භාවය මැන බැලීම හා වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් සමීක්ෂණ පවත්වන අතර එමගින් බැංකුව තුළ සේවා නැඹුරු සංස්කෘතියක් ඒකාබද්ධ කිරීමට දායක වේ



නිෂ්පාදන සහ බැංකු සංවර්ධන අංශය ව්‍යාපාරයේ තීරණාත්මක ක්ෂේත්‍රවල හිඩැස් හඳුනා ගැනීමට සහ එම අවශ්‍යතාවන් සඳහා විසඳුම් ගොඩනැගීමට ක්‍රියාශීලීව ක්‍රියා කරයි.



නවෝත්පාදනය සහ නිෂ්පාදන සංවර්ධනය

ලංකා බැංකුවෙ හි, නිෂ්පාදන සහ බැංකු සංවර්ධන අංශය ව්‍යාපාරයේ තීරණාත්මක ක්ෂේත්‍රවල හිඩැස් හඳුනා ගැනීමට සහ එම අවශ්‍යතාවන් සඳහා විසඳුම් ගොඩනැගීමට ක්‍රියාශීලීව ක්‍රියා කරයි. 2022 දී දියත් කරන ලද BoC Innolab මගින් නිෂ්පාදන සහ සේවාවල නවෝත්පාදනයන් සිදු කරමින් ගනුදෙනුකරුවන් වෙත වඩා හොඳ බැංකු අත්දැකීම් ලබා දීමට කටයුතු කරයි. එමෙන්ම ව්‍යාපාර ප්‍රතිනිර්මාණ හා ප්‍රතිස්ථාපන ඒකකය (BRRU) මෙන්ම ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) වක්ව නව්‍ය නිෂ්පාදන සහ වැඩිදියුණු කළ සේවාවන් සංවර්ධනය සඳහා මංපෙත් විවර කරමින් කාලෝචිත උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරමින් බැංකුවේ ගනුදෙනුකරුවන්ට වඩාත් පහසු අයුරින් ගනුදෙනු කරගෙන යාමට අවස්ථාව උදා කරයි.

වත්මන් බැංකු ගනුදෙනු සහ අවශ්‍යතා සපුරාලීම සඳහා පහත සඳහන් නව නිෂ්පාදන සහ සේවා වසර තුළ දියත් කරන ලදී:

අපගේ ගනුදෙනුකරුවන් සඳහා ශක්තිමත් හවුල්කරුවෙක්

My Sri Lanka විදේශ මුදල් ස්ථාවර තැන්පතු

මෙය ශ්‍රී ලංකාවේ විදේශ මුදල් තැන්පතු පදනම ඉහළ නැංවීමට දායක වීමට කැමති ගනුදෙනුකරුවන් සඳහා හඳුන්වා දුන් විශේෂ විදේශ මුදල් ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමයකි. ඔවුන් වෙහෙස මහන්සි වී උපයාගත් විදේශ විනිමය සඳහා උපරිම ප්‍රතිලාභ ලබා ගනිමින් ශ්‍රී ලංකා ආර්ථිකය නඟා සිටුවීම සඳහා යෙදවීමට ගත් තීරණාත්මක පියවරකි. මෙමගින් වටිනාකම් පරාසයක් හරහා විදේශ මුදල් තැන්පතු සඳහා ඉහළ පොළියක් (කාලසීමාව අනුව) පිරිනමන ලදී.

BoC Flexi ආයෝජක යෝජනා ක්‍රමය

BoC Flexi මගින් ගනුදෙනුකරුවන්ට තම ඉලක්ක තැන්පතු මුදල, දරණ කාලය, දැරිය හැකි මිල, ආකර්ශනීය ප්‍රතිලාභ සහ පුළුල් පරාසයක් මත පදනම්ව ඔවුන්ගේම ආයෝජන සැලැස්මක් ස්ථාපිත කිරීමට නම්‍යශීලී බවක් ලබා දෙයි. ගනුදෙනුකරුවන් කැමති ව්‍යුහාත්මක ප්‍රවේශයක් භාවිතා කර ඔවුන්ගේ මූල්‍ය ඉලක්ක ඉක්මනින් සාක්ෂාත් කර ගැනීමට මෙම ආයෝජන විකල්පය උපකාර කරයි.

වාරික මුදල පැහැර හැරුණ විටදී වුවද ගනුදෙනුකරුවන්ගෙන් කිසිදු දඩ මුදලක් අය නොකෙරේ. ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ඉලක්ක සපුරා ගැනීමට හැකි වන පරිදි ඩිජිටල් නාලිකා හරහා පහසුවෙන් ගනුදෙනු මෙහෙය වීමට බැංකුව පහසුකම් සපයයි.

BoC කාන්තා රන් ගිණුම් ඉතුරුම් සහතිකය

BoC කාන්තා රන් ගිණුම් ඉතුරුම් සහතිකය යනු කාන්තාවන් සඳහා පමණක් නිර්මාණය කර ඇති ඉහළ ප්‍රතිලාභයක් ලබා දෙන ආයෝජන විකල්පයකි.

ලංකා බැංකු රන් කැකුළු ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමය

අනාගත පරම්පරාවේ ප්‍රගතිය හා වර්ධනයට ඉවහල් වන ස්ථාවර පදනමක් සැපයීම සඳහා වයස අවුරුදු 18 ට අඩු ළමුන් සඳහා විශේෂ ස්ථාවර තැන්පතු ක්‍රමයක් දියත් කරන ලදී.

රන් කැකුළු ස්මාර්ට් ආයෝජනය

මූල්‍යමය වශයෙන් ස්ථාවර අනාගතයක් සඳහා ඔවුන් සවිබල ගන්වමින් වයස අවුරුදු 18 ට අඩු ළමුන් සඳහා නිර්මාණය කර ඇති විශේෂිත ගිණුමකි.

'අස්වැසුම' සමාජ සුබසාධන ප්‍රතිලාභ වැඩසටහනේ ප්‍රතිලාභීන් සඳහා විශේෂ ඉතුරුම් යෝජනා ක්‍රමය

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන 'අස්වැසුම' සමාජ සුබසාධන ප්‍රතිලාභ වැඩසටහනේ ප්‍රතිලාභීන් සඳහා විශේෂ ඉතුරුම් ක්‍රමයක් හඳුන්වා දී ඇත. මෙම ගිණුමට සාමාන්‍ය ඉතුරුම් ගිණුම් සඳහා ඇති සියලුම විශේෂාංග ලබා දෙන අතර මූලික තැන්පතුවකින් තොරව ගිණුමක් විවෘත කිරීමට පහසුකම් සපයයි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බලගැන්වීම

කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය, සංචාරක, කර්මාන්ත, සේවා, කාන්තා මූලික ව්‍යාපාර, අපනයන ආශ්‍රිත ව්‍යාපාර සහ ආරම්භක ව්‍යාපාර සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයකි.

පොළී සහනාධාර පොරොන්දු ණය යෝජනා ක්‍රමය

සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්කරුවන්ට, වී ගබඩා හිමියන්ට සහ වී එකතු කරන්නන්ට අස්වැන්න නෙලාගන්න කන්නවලදී වී මිලදී ගැනීම සඳහා සහන පොළී අනුපාතයකට ඔඩපණ ණය ලබාදීම සඳහා පොළී සහනාධාර ණය යෝජනා ක්‍රමයකි.

ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් සඳහා මනුසවි ණය යෝජනා ක්‍රමය

විදේශ විනිමය ඉපැයීම් සඳහා ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ගේ ප්‍රධාන භූමිකාව අගය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) සමඟ එක්ව හඳුන්වා දුන් ප්‍රතිමූල්‍ය ණයකි.

අපනයන කවය

BOC අපනයන කවය වැඩසටහන යටතේ, අපනයනය ඉලක්ක කරගත් ව්‍යාපාර සඳහා, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය ආධාර, ජාලකරණය සහ ධාරිතා ගොඩනැගීමේ අවස්ථා වලදී අඛණ්ඩව සහය ලබා දෙයි. බැංකුව, අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) වැනි ප්‍රධාන රාජ්‍ය හා කර්මාන්ත ආයතන සමඟ සමීපව කටයුතු කරමින් ගනුදෙනුකරුවන්ට තීරණාත්මක, කාලෝචිත සහ අඛණ්ඩ සහයෝගයක් ලබා දෙයි.

SME කවය

SME කවය ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් (SMEs), සඳහා අවශ්‍ය ආධාර සහ මඟ පෙන්වීම් ලබා දෙයි. ව්‍යවසායකත්වය පෝෂණය කිරීමට සහ අපගේ ජාතික ආර්ථිකයේ කොඳු නාරටිය ශක්තිමත් කිරීමට අපගේ ඇති කැපවීම පිළිබිඹු කරමින් ගනුදෙනුකරුවන් 400 කට අධික සංඛ්‍යාවකට විශිෂ්ට ප්‍රතිඵල ලබා දී ඇත.

ව්‍යාපාර 15 ක් සඳහා අපනයන මට්ටම වෙත සංවර්ධනයට අනුග්‍රහය දී ඇත.

විදේශ කවය

විදේශ කවය ජාත්‍යන්තර අංශය විසින් දියත් කරන ලද අතර විදේශයන්හි සේවය කරන සහ ජීවත්වන ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ප්‍රමුඛ ගනුදෙනුකාර සේවාවක් සැපයීම අරමුණු කරයි.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 03:

වගකීම් සහගත බැංකුකරණය

බැංකුව සිය මෙහෙයුම්වල බලපෑම සහ ප්‍රමාණය පිළිබඳව අවධානයෙන් සිටින අතර, එමඟින් සියලු සන්නිවේදනයන් වගකීම් සහගත ආකාරයෙන් ආරක්ෂිතව ඉහළම විශ්වසනීය මට්ටමින් ක්‍රියාත්මක වන බවට සහතික කිරීමෙහි නිරතුරු අවධානයෙන් කටයුතු කරයි.

තවද, විචක්ෂණශීලී බැංකුකරණ භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට සහ ගනුදෙනුකාර වර්ධන හැකියාව උපරිම කිරීමට බැංකුව සිය ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට උත්සාහ කරයි.

අනුකූලතාවය සහ වගකීම් සහිත සන්නිවේදනය


නිෂ්පාදන සහ සේවා සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන්ට පැහැදිලි සහ නිවැරදි තොරතුරු ලබාදීමට ලංකා බැංකුව කැපවී සිටින අතර එහි සියලු අන්තර් ක්‍රියා හරහා වගකීම සහ විනිවිදභාවය තහවුරු කරයි. බැංකුව සිය ගනුදෙනුකරුවන්ට ඔවුන් කැමති භාෂාවෙන් පොළී අනුපාත, කල්පිරීමේ දින සහ සියලුම නියමයන් සහ කොන්දේසි ඇතුළුව අදාළ සියලු තොරතුරු සපයයි.

බැංකුවේ පරිචයන් සහ ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීමේ ක්‍රියාවලීන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනුකාර ප්‍රඥප්තිය සමඟ සමපාත වන අතර එය ගනුදෙනුකරුවන්ට අදාළ වගකීම් සහ ප්‍රතිපත්ති විස්තර කරයි.

අලෙවිකරණ සන්නිවේදනයට අනුකූල නොවන සිදුවීම් සහ සමාජ හා ආර්ථික ක්ෂේත්‍රවල නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම වසර තුළ වාර්තා වී නොමැත.

ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම

ව්‍යවසායකයින්, සංක්‍රමණිකයන්, සිසුන් සහ රාජ්‍ය සේවකයින් ඇතුළු පුළුල් පරාසයක කණ්ඩායම් කෙරෙහි, බැංකුවේ අඛණ්ඩ ගනුදෙනුකාර අධ්‍යාපනය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී අවධානය යොමු කරයි.



සංක්‍රමණිකයන්

එතෙර මෙතෙර, BOC රන් කහවනු ගුවන් විදුලි වැඩසටහන, SLBFE පුහුණුවීම් ඇතුළු වැඩසටහන් කිහිපයක් සංක්‍රමණිකයන් සහ ඔවුන්ගේ පවුල් සඳහා පවත්වන ලදී.

සිසුන්

- **රන් කැකුළු 5 ශ්‍රේණියේ සම්මන්ත්‍රණ මාලාවෙන්**
  සිසුන් 12,459 ක් ප්‍රතිලාභ ලබා ඇත.

  5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව සඳහා සිසුන් 5,092 කට වවුචර්පත් ලබා දෙන ලදී.
- **නැණපය 18+ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන**
  උසස් පෙළ සහ සා/පෙළ සිසුන් ඉලක්ක කර ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 14 ක් පැවැත්වීම.

ඉදිරි දැක්ම

ගනුදෙනුකාර අවශ්‍යතාවන් වඩාත් හොඳින් අවබෝධ කර ගනිමින්, අවශ්‍යතා හා අපේක්ෂා වලට ගැලපෙන විසඳුම් ලබා දීමට ද දත්ත විශ්ලේෂණ සහ තීක්ෂණ බුද්ධිය උපයෝගී කරගනිමින් සියලු සම්බන්ධතා මධ්‍යස්ථාන හරහා ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශයකට අපි ප්‍රමුඛත්වය ලබා දෙන්නෙමු. නව ගනුදෙනුකාර අපේක්ෂාවන් සපුරාලීම සඳහා ඩිජිටල් නවෝත්පාදන ඉතා වැදගත් වන අතර එබැවින් අපි ප්‍රවේශතාව පහසු කිරීම, ප්‍රතිචාර දැක්වීමේ කාලය අවම කිරීම, බාධාවකින් තොරව සහ ගනුදෙනු කිරීම සඳහා ඩිජිටල් නාලිකා සහ නව තාක්ෂණය බැංකුකරණ සේවා වෙත අන්තර් ගත කිරීම උදෙසා ආයෝජනය කරමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ අඛණ්ඩ පැවැත්මට අපි නිරතුරුව සහය දීමට අපේක්ෂා කරමු.

ජයග්‍රාහී, දක්ෂ සහ විවිධත්වයෙන් යුතු කණ්ඩායමක්



අපගේ කණ්ඩායම අපගේ මෙහෙයුම්වල මූලික අඩිතාලම වන අතර, සෑම තරාතිරමකම බහුවිධ, දක්ෂ පුද්ගලයින්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයේ විශාලතම සේවා යෝජකයා ලෙස ලංකා බැංකුව සිය ශ්‍රම බලකායේ සංවර්ධනය, ප්‍රගතිය හා දියුණුව සඳහා නිබඳව කැපවී සිටින අතරම බැංකුවේ කටයුතු උපරිම කාර්යක්ෂමතාවයකින් ඉටු කිරීමට අවශ්‍ය හැකියාව සහ දැනුම ලබා දේ.

8,579
සේවකයින්

කාන්තා නියෝජනය
60%

32
එක් සේවකයෙකුට සාමාන්‍ය පුහුණු මිනිස් පැය ගණන

සම්මාන

උසස්වීම්
946 ක්

රු. මිලියන 200.1 ක්
පුහුණුව හා සංවර්ධනය සඳහා ආයෝජනය

තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා බලපෑම

4 QUALITY EDUCATION | 5 GENDER EQUALITY | 8 DECENT WORK AND ECONOMIC GROWTH | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | 10 REDUCED INEQUALITIES | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා: M1 M3

- රටේ පැවති ආර්ථික අර්බුදය හේතු කොට ගෙන සෑම ක්ෂේත්‍රයකම පාහේ සේවක රඳවා තබා ගැනීම ප්‍රධාන අභියෝගයක් ලෙස මතු විය.
- උද්ධමනය, බදුකරණය සහ ඉහළ යන ජීවන වියදම් සේවක අභිප්‍රේරණයට සහ සුබසාධනයට දිගින් දිගටම බලපෑවේය.
- ඩිජිටල්කරණය නිරතුරුව අවධානය යොමු කරන ප්‍රධාන අංශයක් වන අතර එමඟින් සේවක ප්‍රවේශය, රාජකාරී පහසුව සහ සේවක කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අපේක්ෂා කෙරුණි.

2023 සඳහා සන්දර්භය

උපායමාර්ගික ප්‍රමුඛතා

ප්‍රමුඛතා ක්ෂේත්‍ර

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

- විවිධත්වය පෝෂණය කිරීම
- යහපාලනය ශක්තිමත් කිරීම
- ඵලදායිතාවය වැඩිදියුණු කිරීම
- සුභසාධනය වැඩිදියුණු කිරීම
- ඩිජිටල්කරණය සහ තිරසාරකත්වය

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 01

විවිධත්වය පෝෂණය කිරීම

GRI 2-7

ශ්‍රී ලංකාවේ පළාත් නවය පුරා විසිරුණු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 8,579 ක් ද, මාලදිවයින, සීෂෙල්ස් සහ ඉන්දියාව යන රටවල් වල පිහිටි ශාඛාද ලන්ඩනයේ පිහිටි අනුබද්ධිත පරිපාලිත සමාගමක්ද සහිතව ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනය ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයේ විශාලතම සේවා යෝජකයා ලෙස ලංකා බැංකුව විවිධ සමාජ ආර්ථික පසුබිම් වලින් ද විවිධ ආගමික හා ජන වාර්ගික අංශ වලින් ද බඳවා ගැනීම් සිදු කරමින් විවිධත්වයෙන් පෝෂණය වූ සේවක මණ්ඩලයක් පවත්වා ගනී. ප්‍රමුඛතම සේවා යෝජකයෙකු ලෙස සිය කීර්තිය තහවුරු කරන අතරම, ප්‍රමුඛතම දක්ෂතා සහ හැකියාවන් සහිත පුද්ගලියන් ආකර්ෂණය කරගනිමින් බඳවා ගැනීම බැංකුවේ බොහෝ ජයග්‍රහණ පිටුපස ඇති ගාමක බලවේගය වේ.



ස්ථිර සේවකයින්ගේ **අවුරුදු 11 ක** සාමාන්‍ය සේවා කාලය

දේශීය ප්‍රජාව අතරින් බඳවා ගත් ජ්‍යේෂ්ඨ කළමනාකාර්ත්වයේ සාමාජික ප්‍රතිශතය - **100%**


පළාත් අනුව සේවකයින් - රැකියාවේ ස්වභාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව

පළාත	ස්ථිර		බාහිර ආයතන වලින් බඳවා ගත්		කොන්ත්‍රාත්		එකතුව
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	
බස්නාහිර පළාත	1,528	2,425	365	17	3	-	4,338
මධ්‍යම පළාත	264	445	157	7	-	-	873
නැගෙනහිර පළාත	269	187	133	-	-	-	589
උතුරු පළාත	232	274	140	-	-	-	646
උතුරු මැද පළාත	284	285	125	-	-	-	694
වයඹ පළාත	245	432	138	3	-	-	818
සබරගමුව පළාත	210	321	126	-	-	-	657
දකුණු පළාත	230	496	159	-	-	-	885
ඌව පළාත	211	241	128	-	-	-	580
එකතුව	3,473	5,106	1,471	27	3	-	10,080

වයස සහ රැකියා ශ්‍රේණිය අනුව සේවකයින්

ශ්‍රේණිය/ වයස	ආයතනික කළමනාකාර්ත්වය	විධායක කළමනාකාර්ත්වය	ප්‍රධාන කළමනාකරුවන්	ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්	කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන්	කළමනාකරණ අභ්‍යාසලාභීන් සහ අනෙකුත් නිලධාරී ශ්‍රේණීන්	බැංකු සහකාර/ කාර්යාල සහකාර සහ සමාන ශ්‍රේණි	2023 හි එකතුව
35 අඩු	-	-	-	-	55	1,015	3,048	4,118
35 - 55	8	44	124	155	1,086	1,720	1,059	4,196
55 වැඩි	10	19	26	15	36	60	99	265
එකතුව	**18**	**63**	**150**	**170**	**1,177**	**2,795**	**4,206**	**8,579**

සේවා කාලය අනුව සේවකයින් %



සමාන අවස්ථා ලබා දීම

අනෙකුත් ප්‍රතිපත්ති අතර, සේවක දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය, විනය සංග්‍රහය සහ බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය සමාන අවස්ථා සහ හිරිහැර වලින් තොර වැඩ පරිසරයක් තහවුරු කරයි. සේවක දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය මෙන්ම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිපත්ති සම්මත කිරීමෙන් සමානාත්මතාවයෙන් යුතු වැඩ පරිසරයක් නිර්මාණය සඳහා බැංකුවේ ඇති කැපවීම පිළිබිඹු වේ.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිපත්තිය වෙනස්ව සැලකීමෙන් තොර වැඩ පරිසරයක් සඳහා නිර්නායක සපයන අතර, එමඟින් සියලුම බැංකු සම්පත් සහ අවස්ථා සඳහා කාන්තාවන්ට සහ පිරිමින්ට සමාන ප්‍රවේශයක් සහතික කෙරේ.

ජයග්‍රාහී, දක්ෂ සහ විවිධත්වයෙන් යුතු කණ්ඩායමක්

මෙම ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාවට නැංවීමේදී තනතුර හෝ සේවා ස්ථානය නොසලකා බැංකුවේ සියලුම සේවකයන්ට පහත අවස්ථා වලදී අදාළ වේ:

- බඳවා ගැනීම, තෝරා ගැනීම සහ උසස් කිරීම
- රැකියා නියමයන් සහ කොන්දේසි
- පුහුණුව, වෘත්තීය සංවර්ධනය සහ වෘත්තීය දියුණුව සඳහා ප්‍රවේශය
- ආරක්ෂිත වැඩ පරිසරය
- නායකත්වය, කළමනාකරණය සහ වගවීම
- දුක්ගැනවිලි, විනය ක්‍රියාමාර්ග සහ රැකියාවෙන් ඉවත් කිරීම
- වන්දි සහ ප්‍රතිලාභ

තවද, ආබාධිත පුද්ගලයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් බැංකුවේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන අතර, 2023 වසරේ දී එවැනි සේවකයින් දාහතර දෙනෙකු බැංකුවට බඳවා ගෙන ඇති අතර හැකියාවන් සහ සමාන අවස්ථාවන් වර්ධනය කර ගැනීමට ඉඩ සලස්වා ඇත.

වෙනස් කොට නොසැලකීම GRI 406-1

වසර තුළ වෙනස්කම් කිරීම් හෝ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කිසිවක් වාර්තා වී නොමැත.


පාලන යාන්ත්‍රණයෙහි සහ සේවකයින්ගේ විවිධත්වය

GRI 405-1


2023 දී සේවක මණ්ඩලයෙන් 60% ක් කාන්තාවන් වන අතර බැංකු ක්ෂේත්‍රයේ කාන්තා නියෝජන අනුපාත වලින් ඉහළම අගයකට හිමිකම් කියයි. බැංකුවේ විධායක කළමනාකාරිත්වය 49% ක කාන්තා නියෝජනයක් සහිත වීමෙන් විවිධත්වය සඳහා වූ බැංකුවේ කැපවීම තවදුරටත් පිළිබිඹු කරයි.

පාලන යාන්ත්‍රණයෙහි විවිධත්වය

% / සංඛ්‍යාව




ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක මණ්ඩලය



ශ්‍රේණිය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක වර්ගීකරණය

සංඛ්‍යාව



බඳවා ගැනීම

GRI 401-1

සියලුම බඳවා ගැනීමේ අවස්ථා ප්‍රසිද්ධියේ ප්‍රචාරය කරනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මිනිස් බල සැලැස්මකට අනුව සිදු කරනු ලැබේ. බඳවා ගැනීමේ ක්‍රියාවලියේදී, විවිධත්වය කුසලතා, පළපුරුද්ද සහ සුදුසුකම් ඇතුළුව බොහෝ සාධක සැලකිල්ලට ගනී. අවශ්‍ය පරිදි ලිඛිත විභාග පැවැත්වීමත් සමඟ සාධාරණ හා අපක්ෂපාතී තෝරා ගැනීමේ ක්‍රියාවලියක් තහවුරු කිරීම සඳහා දැඩි පරීක්ෂණ ක්‍රියාවලියක් සහ දැඩි මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක වේ.

ස්ත්‍රී පුරුෂ භාවය අනුව නව බඳවා ගැනීම්

ස්ත්‍රී පුරුෂ භාවය	
පුරුෂ	ස්ත්‍රී
270	494



65%
කාන්තා බඳවා ගැනීම්

පළාත් අනුව නව බඳවා ගැනීම්

පළාත	පුරුෂ	ස්ත්‍රී	එකතුව	මුළු බඳවා ගැනීමෙහි ප්‍රතිශතයක් ලෙස
මධ්‍යම	6	33	39	5%
නැගෙනහිර	42	30	72	9%
උතුර	27	44	71	9%
උතුරු මැද	52	51	103	13%
වයඹ	21	54	75	10%
සබරගමුව	18	60	78	10%
දකුණ	16	57	73	10%
ඌව	46	55	101	13%
බස්නාහිර (ප්‍රධාන කාර්යාලයද ඇතුළුව)	42	110	152	20%
එකතුව	270	494	764	100%

සාධාරණත්වය සහ ඇතුළත් කිරීම පෝෂණය කිරීම

සේවා ස්ථානයේදී සිදුවිය හැකි ලිංගික හිංසනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට මාර්ගෝපදේශ, ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලි සවිස්තරාත්මකව අන්තර්ගත විනය සංග්‍රහයක් බැංකුව සතුව ඇත. තවද දුක්ගැනවිල්ලක් හෝ ගැටළුවක් ඇති අවස්ථාවක, විමසුමේ සිට විසඳීම දක්වා විස්තීර්ණ මාර්ගෝපදේශ සහ ක්‍රමවත් ක්‍රියාවලියක් බැංකුවේ දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තියේ දක්වා ඇත.

මාපිය නිවාඩු

GRI 401-3

මාපිය නිවාඩු යනු කාන්තා කාර්ය මණ්ඩලය රඳවා ගැනීමට බැංකුව විසින් අනුගමනය කරන එක් උපායමාර්ගික ක්‍රියාවලියකි.

මාපිය නිවාඩු සඳහා ගිය සේවකයින්ගෙන් 100% ක් රඳවා තබා ගැනීම සහ මෙම පුද්ගලයින්ගෙන් රැකියාවට ආපසු වාර්තා කිරීමේ අනුපාත නිරන්තරයෙන් නිරීක්ෂණය කර ඇත.

2023 දී පිරිමි සේවකයින් සඳහා (වැඩකරන දින 03 ක වැටුප් සහිත) පීතෘ නිවාඩු හඳුන්වා දෙන ලදී.

දර්ශකය	2023
මාතෘ නිවාඩු සඳහා හිමිකම් සහිත සේවිකාවන්	5,106
මාතෘ නිවාඩු ලබා ගත් සේවිකාවන්	340
මාතෘ නිවාඩු සම්පූර්ණ කිරීමෙන් පසු නැවත සේවයට පැමිණි සේවිකාවන්	307
මාතෘ නිවාඩු සම්පූර්ණ කිරීමෙන් පසු නැවත සේවයට පැමිණි මාස 12 ක් ගතවූ සේවිකාවන්	445
නැවත සේවයට වාර්තා කිරීමේ අනුපාතය	100%
සේවයේ රැඳී සිටීමේ අනුපාතය	100%

සමාන වැටුප් GRI 405-2

2021-2023 සඳහා අත්සන් කරන ලද සාමූහික ගිවිසුමේ නියමයන්ට අනුව සහ බැංකුවේ ස්ථාපිත ප්‍රතිපත්ති වලට අනුව, ලංකා බැංකුව ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සමාන වැටුප් (1:1 අනුපාතය) ලබා දීම සහතික කරයි.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 02:

යහපාලනය ශක්තිමත් කිරීම

සමාන අවස්ථා ලබා දෙන සේවා යෝජකයෙකු ලෙස ද ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය හෝ වෙනත් ඕනෑම අංශයකින් වෙන් කිරීමකින් තොරව සියලුම සේවකයන්ට එක හා සමානව සැලකීම සහ සමාන අවස්ථා ලැබෙන බව සහතික කිරීම සඳහා බැංකුව තුළ ප්‍රතිපත්ති, භාවිතයන් සහ ප්‍රමිති මාලාවක් ස්ථාපිත කර ඇත.

වෙනස් කොට සැලකීමකින් තොර වැඩ පරිසරයක් පෝෂණය කරන අතරම මෙම පාලන යාන්ත්‍රණයන් මඟින් සියලුම දේශීය නීති සහ අන්තර්ජාතික තලයේ ලොව පුරා හොඳම භාවිතයන් යොදා ගන්නා බවට සහතික වේ.

මානව සම්පත් හා පාරිශ්‍රමික උපකමිටු සමඟ එක්ව, මහා කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් යුත් මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව, ප්‍රතිපත්ති මට්ටමින් මඟ පෙන්වීම ඇතුළුව බැංකුවේ සමස්ත මානව සම්පත් පිළිබඳ උපායමාර්ග වලට අදාළ සියලු කටයුතු භාරව සිටී.

තවද, තිරසාර ප්‍රතිපත්තියක් මඟින් ශ්‍රම බලකාය, තිරසාර මූලධර්ම වලට අනුව ක්‍රියාත්මක වන බවට සහතික කරයි.

බැංකුවේ මානව සම්පත් කළමනාකරණය කිරීම මානව සම්පත් දෙපාර්තමේන්තුවේ වගකීම වේ. සෑම සේවක මාරුවක්ම ස්ථාන මාරු මණ්ඩලයක් මඟින් අධීක්ෂණය කරනු ලැබේ.

මීට අමතරව, විවෘත සංස්කෘතිය හරහා සියළුම මෙහෙයුම් සහ වාර්තාකරණ වලට බැංකුවේ වගවීම සහ විවෘතභාවය තහවුරු කරයි.

විසිල්-බ්ලෝවිං ප්‍රතිපත්තිය

විනිවිදභාවය සහ වගවීම සඳහා බැංකුවේ කැපවීම පෙන්නුම් කරන විසිල්-බ්ලෝවිං ප්‍රතිපත්තිය වසර තුළදී සමාලෝචනය කරන ලදී. මෙම ප්‍රතිපත්තිය උපරිම රහස්‍යභාවය පවත්වා ගෙන යන අතර සේවකයන්ට ඕනෑම විෂමාචාරයක් හෝ වංචනික ක්‍රියාකාරකමක් වාර්තා කළ හැකි බව සහතික කරයි.

ජයග්‍රාහී, දක්ෂ සහ විවිධත්වයෙන් යුතු කණ්ඩායමක්

එක්ව කටයුතු කිරීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම

GRI 407, GRI 402-1

බැංකුව සාමූහික කේවල් කිරීම සහ වීකරාශි වීමේ නිදහස වෘත්තීය සමිති වලට ලබා දෙන අතර ශ්‍රම බලකායෙන් 100% ක් වෘත්තීය සමිති හයෙන් එකක සාමාජිකත්වය දරයි. තේරී පත් වූ නියෝජිතයන් විසින් හසුරුවන වෘත්තීය සමිති සමඟ පවත්වනු ලබන ඕනෑම සාකච්ඡාවකදී ඉහළම විනිවිදභාවය පවත්වා ගෙන යනු ලැබේ. 2021 දී අත්සන් කරන ලද 2021-2023 කාලපරිච්ඡේදය ඇතුළත් වූ සාමූහික ගිවිසුම වර්ෂය තුළ ක්‍රියාත්මක විය.

සියලුම ස්ථිර සේවකයින් ආවරණය වන සාමූහික ගිවිසුම් දැනුම් දීමේ වේලාව මෙන්ම සාකච්ඡා සහ උපදේශනය සඳහා වන ක්‍රියාමාර්ග ද නියම කරයි. සැලකිය යුතු ප්‍රධාන මෙහෙයුම් හෝ ආයතනික වෙනස්කම් පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම සහතික කිරීම සඳහා මාස හයක දැනුම් දීමේ කාලයක් ලබා දී ඇත.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 03

ඵලදායිතාව ඉහළ නැංවීම


ඵලදායී සහ ඉහළ කාර්යසාධනයක් සහිත ශ්‍රම බලකායක් ගොඩනැගීමට හිතකර පරිසරයක් නිර්මාණය කරන අතරම සේවක කුසලතා සහ හැකියාවන් වැඩිදියුණු කිරීමට බැංකුව නිරතුරුව කටයුතු කරයි.

පුහුණුව හා සංවර්ධනය

ලංකා බැංකුව කාර්ය මණ්ඩල පුහුණුව කෙරෙහි සැලකිය යුතු ආයෝජනයක් වෙන් කරමින් විශේෂ අවධානයක් යොමු කරයි. එමඟින් මානව සම්පත් දෙපාර්තමේන්තුව, කාර්ය මණ්ඩල සාමාජිකයින් වඩාත් උචිත තීරණ ගන්නන්, සහ දක්ෂ නායකයින් බවට පත් කිරීමට කටයුතු කරයි.

ගතික සහ පුරෝකථනය කිරීමට අපහසු නිරන්තරයෙන් වෙනස් වන සේවා පරිසරයක් තුළ කාර්යක්ෂමව රාජකාරී කටයුතු ඉටුකිරීමට අවශ්‍ය හැකියාව සහ දැනුම සංවර්ධනය කිරීමට මූලික කොට ගත් විශේෂිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

පහත රාමුව මඟින් සේවක පුහුණුව තීරණය කිරීමේ ක්‍රියා පටිපාටි හා ශිල්පීය ක්‍රම ද විස්තර කරයි.



පුහුණුව සඳහා ආයෝජනය


GRI 404-1

රු. මිලියන 200.1
පුහුණුව හා සංවර්ධනය සඳහා ආයෝජනය

596
පුහුණු වැඩසටහන්

275,019
සමස්ත පුහුණු මිනිස් පැය

32
සේවකයෙකු සඳහා සාමාන්‍ය පුහුණු මිනිස් පැය



වසර තුළ ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි මූලික අවධානය යොමු කරන ලදී.

- ණය දීම
- තොරතුරු තාක්ෂණය
- අනුකූලතාවය
- ණය එකතු කිරීම සහ අයකර ගැනීම
- සාමාන්‍ය බැංකු කටයුතු සහ බැංකු මෙහෙයුම්
- අභ්‍යන්තර පාලනය සහ විගණනය
- භාණ්ඩාගාර මෙහෙයුම්
- මානව සම්පත් කළමනාකරණය
- නිපුණතා වර්ධනය
- විකුණුම් සහ අලෙවිකරණය
- මූල්‍ය හා සැලසුම්
- අවදානම් කළමනාකරණය
- නීතිය
- ආරක්ෂාව
- පුද්ගල සංවර්ධනය සහ ආචාරධර්ම
- රැකියා හා පුද්ගලික ජීවිතයේ සමබරතාවය හා ආතති කළමනාකරණය
- තිරසාර බැංකු භාවිතයන්

කාර්යසාධන කළමනාකරණය

GRI 404-3

බැංකුව ද්වි-වාර්ෂික පදනමක් මත ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) ඇගයීමක් සහ නිපුණතා තක්සේරු කරන කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් භාවිතා කරයි. කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය ස්වයංක්‍රීය වන අතර එමඟින් වසර පුරා සේවක කාර්යසාධනය පිළිබඳ සාධාරණ සහ අපක්ෂපාතී තක්සේරුවක් සහතික කෙරේ.

වෘත්තීය සංවර්ධනය සහ අනුප්‍රාප්තික සැලසුම් කිරීම

කළමනාකරණ ශ්‍රේණිය සහ ඊට ඉහළ ශ්‍රේණීන් සඳහා නායකත්ව හැකියාවන් සහ වෘත්තීය දැනුම පුළුල් කිරීම පදනම් කරගත් අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවට නංවා ඇති අතර ඒ සඳහා සුදුසු තාක්ෂණික ක්‍රියාවලීන් උපයෝගී කරගනී.

මෙයට නිශ්චිත භූමිකාවන් හඳුනා ගැනීම සහ වැඩි වගකීම් සහ ජ්‍යෙෂ්ඨ තනතුරු භාර ගැනීමට සුදුසුකම් ලත් අපේක්ෂකයින් සූදානම් කිරීම ඇතුළත් වේ. විධායක සහ කළමනාකරණ නායකත්ව සංවර්ධන වැඩසටහන් සහ පාඨමාලා, බාහිර සංවිධානවල විශේෂඥතාව සහ සම්පත් දායකත්වය මත ක්‍රියාවට නැංවේ.



ප්‍රමුඛතා ක්ෂේත්‍ර 04

සුභසාධනය වැඩිදියුණු කිරීම

බැංකුව සිය සේවකයින්ට වැටුප් සහ ප්‍රතිලාභ වලට එහා ගිය වටිනාකම් රාශියක් පිරිනමනු ලබයි.

- තරඟකාරී වේතනය සහ කුසලතා මත පදනම් වූ ඇගයීම්
- නොවෙනස්ව කටයුතු කිරීම සහ සේවක අභිප්‍රේරණය
- සෞඛ්‍යය සහ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරමින් වැඩ-ජීවිත සමතුලිතතාවය
- ආරක්ෂිත සහ ගතික වැඩ පරිසරය
- සහනදායී සහ අනුපූරක ප්‍රතිලාභ
- පුහුණුව, සංවර්ධනය සහ වෘත්තීය දියුණුව සඳහා අඛණ්ඩ ආයෝජනය
- පශ්චාත් රැකියා ප්‍රතිලාභ

තරඟකාරී වේතනය සහ කුසලතා මත පදනම් වූ ඇගයීම්

GRI 401-2

2021-2023 කාලසීමාව සඳහා එකඟ වූ සාමූහික ගිවිසුමට අනුව සේවක ප්‍රතිලාභ සහ දිරිගැන්වීම් වෙළඳපළ මිල සමඟ අනුරූප වේ. සෑම සේවකයකුගේම වැටුප් සහ වැටුප් නොවන ප්‍රතිලාභ ඉහත සඳහන් කළ සාමූහික ගිවිසුමේ දක්වා ඇති අතර, එමඟින් සියලු බැංකු සේවකයින්ට සාධාරණ හා සමානාත්මක ලෙස ගෙවීම් සහ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.

පවතින ආර්ථික තත්ත්වයන් මත ඉහළ ගිය උද්ධමනයට අනුව බැංකුව ජීවන වියදම් දීමනාව (COLA) ගලපමින් සේවකයින්ට යම් මට්ටමක සහනයක් ලබා දුන්නේය.

අඛණ්ඩ සම්බන්ධතාවය සහ සේවක අභිප්‍රේරණය

බැංකුව සිය ශ්‍රම බලකාය සමඟ දිගුකාලීන සබඳතාවයන් ශක්තිමත් කරන අතරම, සේවක සබැඳියාව සහ අභිප්‍රේරණය සහතික කිරීම සඳහා වැඩසටහන් මාලාවක් පවත්වයි.





ජයග්‍රාහී, දක්ෂ සහ විවිධත්වයෙන් යුතු කණ්ඩායමක්

සහනදායී සහ අනුපූරක ප්‍රතිලාභ

බැංකුවේ කැපවීමේ කොටසක් ලෙස, සේවකයින් හට වැටුප් සහිත නිවාඩු, වෛද්‍ය ප්‍රතිපූරණ, අභිමත ප්‍රසාද දීමනා, දිරි දීමනා, සහනදායී ණය පහසුකම් සහ සුබසාධන ප්‍රවාහන පහසුකම් සපයයි.

ආර්ථික අර්බුදය හේතුවෙන් බැංකුව සහනදායී මිල ගණන් යටතේ සහන ණය පහසුකම් ලබා දෙන අතරම, ණය ආපසු ගෙවීමේදී නම්‍යශීලී පිලිවෙතක් අනුගමනය කරන ලදී.

සෞඛ්‍යය සහ මානසික යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරමින් වැඩ-ජීවිත සමතුලිතතාවය

ලංකා බැංකුව විසින් රැකියා-ජීවිත සමතුලිතතාවය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම සහ සේවකයින්ගේ සෞඛ්‍ය සහ මානසික යහපැවැත්මට සහාය වීමේ වැදගත්කම හඳුනා ගනී. ශාරීරික යෝග්‍යතා පහසුකම්, යෝග සැසි, නිවාඩු නිකේතන සහ පුස්තකාල ප්‍රවේශය සේවකයින්ට ශාරීරික සෞඛ්‍යය හා මානසික ප්‍රවර්ධනය සඳහා සපයනු ලැබේ.

පුද්ගලික හෝ රැකියා ආශ්‍රිත අභියෝග වලට මුහුණ දෙන සේවකයින්ගේ යහපැවැත්ම සහ ආතතිය කළමනාකරණය සඳහා "ශ්‍රී ලංකා සුමිත්‍රයෝ" වැඩසටහන යටතේ පෞද්ගලිකත්වය රකිමින් උපදේශන සහාය සේවා සැපයීම සඳහා උපදේශකයෙකු ද පත්කර ඇත.

ආරක්ෂිත සහ ගතික වැඩ පරිසරය

GRI 403-1/403-4/403-5/403-7/ 403-8/403-9/403-10

සේවක යහපැවැත්ම, ආරක්ෂාව සහ සෞඛ්‍යය ලංකා බැංකුවේ ප්‍රමුඛතා අතරට අයත් වේ. වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාවට අදාළ තීරණාත්මක අංග ආමන්ත්‍රණය කරන ශක්තිමත් ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ බැංකුව ස්ථාපිත කර ඇත. තවද, වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව (OHS) උත්සුකයන් සඳහා සම්බන්ධ වීම සහ නියැලීම දිරිමත් කරන බැංකුවේ සාමූහික ගිවිසුම් වෛද්‍ය ආධාර යෝජනා ක්‍රම යටතේ සේවක හිමිකම් පැහැදිලිව විස්තර කරයි.

වසර පුරා, රැකියාවට සම්බන්ධ රෝග සහ/හෝ තුවාල වීම් හේතුවෙන් මුළු දින 459 ක නිවාඩු වාර්තා විය.

බැංකුව සේවක සෞඛ්‍යය සහ ආරක්ෂාව ආරක්ෂා කිරීම සඳහා එහි අඛණ්ඩ කැපවීමේ ප්‍රධාන අංගයක් ලෙස සේවක නියෝජනය සහිත OHS කමිටුවක් ස්ථාපිත කර ඇත. කාර්ය මණ්ඩල දැනුම ඉහළ නැංවීම සහ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ සංස්කෘතියක් ව්‍යාප්ත කිරීම සඳහා නිතිපතා දැනුවත් කිරීමේ වැඩමුළු සහ ගිනි ආරක්ෂණ පුහුණු වැඩසටහන් වසර පුරා පැවැත්විණි. මීට අමතරව, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙන් සමන්විත ඉහළ මට්ටමේ විශේෂ ආරක්ෂක කාර්යසාධක බලකායක් හරහා සියලුම සෞඛ්‍ය සහ ආරක්ෂිත යෙදුම් වල යෝග්‍යතාවය, නිරන්තර ඇගයීමට සහ අධීක්ෂණයට ලක් වේ.

GRI 403-6

සේවක සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා, බැංකුව ප්‍රධාන කාර්යාලයේ ඔසුසලක් සහ ස්ථානීය වෛද්‍යවරයකු ස්ථාපිත කර ඇත. තවද, සියලු ස්ථිර සේවකයින් රෝහල් ගත ප්‍රතිකාර සහ බාහිර රෝගී (OPD) ප්‍රතිකාර ආවරණය වන පුළුල් වෛද්‍ය ආධාර වැඩසටහනක් සඳහා සුදුසුකම් ලබයි.

පශ්චාත් රැකියා ප්‍රතිලාභ

GRI 401-2

බැංකුව විසින් විශ්‍රාමික සේවකයන්ගේ බැංකුවට කැප වූ සේවා කාලය වෙනුවෙන් විශ්‍රාම දීමනා සහ වෛද්‍ය අවශ්‍යතා සඳහා ද සහාය ලබා දේ. බැංකුවේ ප්‍රතිපත්තියට අනුව වැන්දඹුවන් සහ අනාථ දරුවන් ද මෙම ආධාරය සඳහා සුදුසුකම් ලබයි.

- විශ්‍රාමිකයින් 7,299 ක් බැංකුවේ විශ්‍රාම වැටුප් වැඩසටහනෙන් ආධාර ලබයි.
- වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදලේ ප්‍රතිලාභීන් 2,133 ක් විය.




සේවක ඉල්ලා අස්වීම්

GRI 401-1

ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වූ මූල්‍ය පීඩනය රට තුළ දැඩි බුද්ධි ගලනයකට තුඩු දුන් අතර, 2023 වසර තුළදී සේවකයින් විදේශ රැකියා සඳහා යාමෙන් බැංකු කාර්ය මණ්ඩල පිරිවැටුමේ වැඩි වීමක් අත්විඳින ලදී. බැංකුවේ සේවක රඳවා ගැනීමේ අනුපාතිකය 98% සිට 95% දක්වා පහත වැටී ඇති අතර, වසර තුළදී ඉල්ලා අස් වූ මුළු සංඛ්‍යාවෙන් 72% ක් සංක්‍රමණය වීම හේතුවෙන් සිදු විය.

	ඉල්ලා අස්වූ	විශ්‍රාම ගිය	මුළු සංඛ්‍යාව
පුරුෂ	84	30	114
කාන්තා	190	50	240
මුළු සංඛ්‍යාව	274	80	354

සේවයෙන් ඉවත්ව යෑම් වයස සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව සංඛ්‍යාව



පළාත් අනුව	ඉල්ලා අස්වීම්	විශ්‍රාම ගැනීම්
මධ්‍යම	14	5
නැගෙනහිර	6	3
උතුරු මැද	17	1
වයඹ	20	3
උතුර	9	6
සබරගමුව	16	5
දකුණ	16	7
ඌව	11	3
බස්නාහිර	165	47
එකතුව	274	80

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 05:

ඩිජිටල්කරණය සහ තිරසාරකත්වය

අනාගතයේ වේගයෙන් පරිණාමය වන ඩිජිටල් පරිසරයකට සූදානම් ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීමට ප්‍රමුඛත්වය දෙමින් බැංකුව, සේවකයින්ට අනුවර්තනය වීමට අවශ්‍ය පහසුකම් ලබා දෙයි. කාර්යාලය තුළ සහ ඉන් පිටත වැඩ කිරීමේ හැකියාව ඇති දෙමුහුන් සේවා පරිසරයකට සහාය දීමෙන් බැංකුව තවදුරටත් සේවකයින්ට නම්‍යශීලී බවක් ලබා දෙයි.

බැංකුවේ ඩිජිටල් භාවිතය ලේඛන කටයුතු අඩු කිරීමට සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමට පද්ධති සහ වේදිකා සාර්ථකව භාවිතා කර ඇත. මානව ප්‍රාග්ධන කළමනාකරණ (HCM) පද්ධතිය හඳුන්වාදීම සහ වැඩ ප්‍රවාහ සහ විකුණුම් සේවා භාවිතය බැංකුව තුළ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

ලංකා බැංකුවෙහි තිරසාරත්වය

වෙනම සහකාර මහා කළමනාකරණ අංශයක් මඟින් බැංකුව තුළ තිරසාර සංවර්ධනය අධීක්ෂණය කරන අතර, සේවකයින්ට ESG මූලධර්ම සහ හරිත බැංකුකරණය සම්බන්ධයෙන් ස්ථාවර පුහුණුවක් සහ දැනුවත් කිරීමේ සැසි ලබාදෙයි. විශේෂයෙන් ණය පුහුණුව සම්බන්ධ සෑම වැඩසටහනකදීම, ESG පිළිබඳ අවම වශයෙන් පැය භාගයක පුහුණුවක් සේවකයින්ට ලබාදේ. බැංකුවේ දැනට ක්‍රියාත්මක වන තිරසාර මූලපිරීම් සහ tvBOC හරහා ඉදිරිපත් කරන අන්තර්ගතයන් මඟින් තව දුරටත් මෙම භාවිතාවන් ශක්තිමත් වේ. තවද, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතය සඳහා සේවකයින් දිරිමත් කිරීමට බැංකුව විසින් සූර්ය බලශක්ති ණය පහසුකමක් පිරිනමනු ලැබේ.

GRI 403-6

2023 දී, ක්‍රියාවලි විධිමත් කිරීම, කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ පිරිවැය අඩු කිරීම සඳහා බැංකුව තුළ ඩිජිටල්කරණ කටයුතු ඒකාබද්ධ කිරීමේ උත්සාහයන් ලෙස බැංකුව විසින් 'හොඳම ඩිජිටල් භාවිත ශාඛාව' සඳහා සම්මානය හඳුන්වා දෙන ලදී.

ඉදිරි දැක්ම

තාක්ෂණික දියුණුව, පරිණාමය වන ගනුදෙනුකාර අපේක්ෂා, නියාමන වෙනස්කම් සහ ශ්‍රම බලකායේ ප්‍රවණතා මඟින් මානව ප්‍රාග්ධනය නිරතුරුව වෙනස් වෙමින් පවතී. විශේෂයෙන් විදෙස් සංක්‍රමණ ඉහළ මට්ටමක පවතින බැවින් කුසලතා ඇති පිරිස් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම ප්‍රමුඛතාවයක් ලෙස පවතී. අනාගතයේදී බැංකුකරණයට අවශ්‍ය නිපුණතා වලින් සේවකයන් සන්නද්ධ කිරීම, පුහුණු කිරීම සහ කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන් සඳහා ආයෝජනය කරන අතරම, සේවක යහපැවැත්ම සහ මානසික සෞඛ්‍යය කෙරෙහි අපගේ අවධානය යොමු කරන්නෙමු. බඳවා ගැනීම් සහ නායකත්වයේ විවිධත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුව විසින් දරන ප්‍රයත්නයන් ශක්තිමත් කරන අතරම සියලුම සේවකයින්ට වටිනාකමක් සහ ගෞරවයක් ලැබෙන සංස්කෘතියක් තවදුරටත් වර්ධනය කිරීමට බැංකුව කටයුතු කරනු ඇත.

ඩිජිටල්කරණයෙන් බල ගැන්වූ බැංකුවක්



ඩිජිටල් පරිවර්තනය යනු ලංකා බැංකුවේ අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, අපගේ මෙහෙයුම් සහ ව්‍යාපාර ප්‍රවේශය තුළ එය ගැඹුරින් මුල් බැස ඇත. අපගේ ඩිජිටල් භාවිතයන් ගනුදෙනුකරුවන්ට පහසුව සහ ප්‍රවේශතාව ලබා දීමෙන් කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ වගකීම් සහිත පරිභෝජනය වැඩි කිරීම හරහා පුළුල් පරාසයක ප්‍රතිඵල ලබා ගැනීමට උපකාරී වේ.

රු. බිලියන 1.4 ක්
ඩිජිටල්කරණය සඳහා ආයෝජනය

1,490
ඩිජිටල් සම්බන්ධතා ස්ථාන

34%
ඩිජිටල් සක්‍රීය ගනුදෙනුකරුවන්

19%
අතථ්‍ය ගනුදෙනුකරුවන්

46%
ඩිජිටල් ගනුදෙනු

11%
ඩිජිටල්කරණය සඳහා ප්‍රවිශ්ටවීම

තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා බලපෑම

ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා M1 M2

- ආර්ථික අර්බුදය හේතුවෙන් ගනුදෙනුකරුවන්ට සහ සේවකයින්ට සංචලනය සහ ප්‍රවේශතාව සම්බන්ධයෙන් අභියෝග වලට මුහුණ දීමට සිදු විය.
- සම්පත් හිඟය සහ දේශගුණික විපර්යාස හේතුවෙන් සම්පත් වල තිරසාර භාවිතය හා කාර්යක්ෂමතාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
- ඩිජිටල්කරණය ඉහළ යාමත් සමඟ, සංවේදී තොරතුරු වල රහස්‍යභාවයට තර්ජන මතු වූ අතර සයිබර් ආරක්ෂාවට පිළිබඳ විශේෂ සැලකිලිමත් භාවයක් ඇතිවීම
- සේවක සංක්‍රමණය වැඩිවීම මධ්‍යයේ ඵලදායිතාව සහ ස්වයංක්‍රීයකරණය සඳහා වැඩි අවශ්‍යතාවයක් ඇතිවීම

2023 සඳහා සන්දර්භය

උපායමාර්ගික ප්‍රමුඛතා

ප්‍රමුඛතා ක්ෂේත්‍ර

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

ගනුදෙනුකාර පහසුව සහ ප්‍රවේශය

ක්‍රියාවලි සහ යටිතල පහසුකම් සංවර්ධනය

ආරක්ෂාව ශක්තිමත් කිරීම

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 01:

ගනුදෙනුකාර පහසුව සහ ප්‍රවේශය

ඕනෑම ස්ථානයක සිට ඕනෑම වේලාවක ප්‍රධාන බැංකු කටයුතු වෙත උපරිම ප්‍රවේශය ලබාදෙමින් තම ගනුදෙනුකරුවන්ට බහුවිධ ඩිජිටල් නාලිකා සහ වේදිකා වෙතින් දිවයිනේ ඕනෑම ස්ථානයක සිට පහසුවෙන් බැංකු කටයුතු ඉටු කර ගැනීමට අවශ්‍ය පහසුව සලසා දී ඇත.

ඩිජිටල් නිෂ්පාදන සහ සේවාවන්








පවතින නාලිකා වැඩිදියුණු කිරීම

බැංකුව සිය නාලිකා සහ ඩිජිටල් වේදිකා නිරන්තරයෙන් වැඩිදියුණු කිරීමෙන් සෑම ඩිජිටල් අන්තර් ක්‍රියාවක්ම බාධාවකින් තොරව, ඒකාබද්ධ වූ සහ තම ගනුදෙනුකරුවන්ට පහසු අත්දැකීමක් වන බවට සහතික වේ.

සමාලෝචිත වර්ෂය තුළදී, සමස්ත පරිශීලක අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා බැංකුව තම "Smartpay" (ගෙවීම්) යෙදුම සාර්ථකව ප්‍රතිව්‍යුහ ගත කරන ලද අතර බැංකුවේ ජංගම යෙදුම සහ අන්තර්ජාල බැංකු යෙදුම නවීකරණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ බැංකුව සිය ඩිජිටල් ප්‍රවේශයන් තවදුරටත් පුළුල් කළේය.

ඩිජිටල්කරණයෙන් බල ගැන්වූ බැංකුවක්

බැංකුවේ වෙබ් අඩවිය තම විශාල ගනුදෙනුකාර පදනම සඳහා ඕනෑම ස්ථානයක සිට 24/7 ඩිජිටල් සේවය සපයන්නා ලෙස ක්‍රියා කරන අතර 2023 වසරේදී එහි ප්‍රතිඵලයක් ගත කිරීමත් සමඟම පහත විශේෂාංග ඇතුළත් විය:



- වැඩිදියුණු කළ අතුරු මුහුණතක් සහ තොරතුරු ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු වැඩිදියුණු කිරීම්
- ත්‍රිභාෂාවෙන් (ඉංග්‍රීසි/සිංහල/දෙමළ) පරිශීලන පහසුකම්.
- ඉහළ ජංගම ප්‍රතිචාර.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක උපදේශ අනුව විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෙන් වූ ප්‍රවේශතා පහසුකම් සැපයීම.
- නිෂ්පාදන සහ සේවා විස්තර මුල් පිටුවට සම්බන්ධ කිරීමෙන් ප්‍රවේශතාව වැඩිදියුණු කිරීම.
- දේශීයත්වය තේමාව කරගත් නිර්මාණාත්මක පසුබිම.
- ගූගල් සිතියම් සමඟ ඒකාබද්ධ වූ ශාඛා ජාලය/ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන.
- ණය පහසුකම් සහ තැන්පතු සඳහා වන පොළී වියදම/ආදායම පවතින අනුපාතයන් මත ගණනය කර ගැනීමේ පහසුව.
- 'BOC කෞතුකාගාරය' නැරඹීම පසුකරමින් මාර්ගගත ක්‍රමය මත වෙන් කිරීම් සිදු කිරීමට ඉඩ ප්‍රස්ථා සැලසීම.

www.boc.lk

නව නාලිකා සංවර්ධනය

බැංකුව වෙළඳපළට නව්‍යතා හඳුන්වා දීමේ අඛණ්ඩ පුරෝගාමීයා ලෙස ඉලෙක්ට්‍රොනික බැංකුකරණය, කාඩ්පත් මෙහෙයුම් වලට අමතරව තම නවෝත්පාදන ඒකකය සහ නිමැවුම් සංවර්ධන කටයුතු සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ ව්‍යාපෘති (BPRP) වල ඒකාබද්ධ ශක්තිය උපරිම ලෙස භාවිතයට ගැනේ.

CARDLESS Withdrawal

ලබා ගත හැකි සේවා →
- මුදල් ආපසු ගැනීම්
- තෙවන පාර්ශ්වීය මුදල් ගෙවීම්

ප්‍රධාන පහසුකම් →
- අත්‍යවශ්‍ය හා හදිසි අවස්ථාවක මුදල් ආපසු ගැනීමේ හැකියාව
- නිකුත් කරන ලද හර කාඩ්පත් නොමැති අවස්ථාවක පවා මුදල් ආපසු ගැනීමේ හැකියාව

BOC META banking

ලබා ගත හැකි සේවා →
- ණය කාඩ්පත් ශේෂය විමසීම්
- ප්‍රේෂණ විමසීම්
- වට්ස් ඇප් පණිවිඩ හුවමාරුව මගින් තොරතුරු දැනගැනීමේ පහසුව
- මූලික නිෂ්පාදන ආශ්‍රිත විමසීම්
- ජංගම සහ ඉතුරුම් තැන්පතු, ණය සහ ස්ථාවර තැන්පතු ශේෂ විමර්ශනය/කුඩා ගිණුම් ප්‍රකාශන ලබා ගැනීම ආදිය.

ප්‍රධාන ප්‍රතිලාභ
- 24×7 ප්‍රවේශය
- ආරක්ෂිත සහ පහසු බැංකුකරණය
- මූල්‍ය විමසීම් සහ අනෙකුත් සේවාවන්
- සජීවී කතාබස් හරහා ගනුදෙනුකාර සහාය ලබා ගැනීමේ හැකියාව
- ජාතික හැඳුනුම්පත සහ ජංගම දුරකථන අංකය (දේශීය හා විදේශීය) සමඟ ස්වයං-ලියාපදිංචිය
- ලංකා බැංකුවේ නොවන ගනුදෙනුකරුවන්ට ගාස්තු, පොළී අනුපාත, ප්‍රේෂණ විමසීම්, ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍ර හා ශාඛා ඇති ස්ථාන වැනි සේවාවන් වෙත ප්‍රවේශ විය හැක.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 02:

ක්‍රියාවලි සහ යටිතල පහසුකම් සංවර්ධනය

බැංකුවේ මෙහෙයුම් ක්‍රියාවලීන් හි කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීමේ සහ අඛණ්ඩව ක්‍රියාකාරීත්වය අරමුණ කොට ගෙන ක්‍රියාවලි සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති රාශියක් ක්‍රියාවට නංවන ලදී. සමස්තයක් වශයෙන්, බැංකුව වැඩ ප්‍රවාහ 28 ක් ස්වයංක්‍රීය කර ඇති අතර, විවිධ සේවා සැපයීම් මෙහෙයවන මාර්ගයන් වැඩි දියුණු කිරීම් සහ එහි ප්‍රධාන මුලපිරීම් ගණනාවක් පහත ලැයිස්තුගත කර ඇත;

වැඩි දියුණු කළ ක්‍රියාවලිය	ප්‍රතිඵලය	බලපෑමට ලක්වූ කාණ්ඩය	වැඩි දියුණු කරන ලද ක්‍රියාවලි සහ සම්පූර්ණ කරන ලද වැඩ ප්‍රවාහ වල ප්‍රතිඵල
ප්‍රතිචාර ක්‍රියාවලිය විධිමත් කිරීම	විසඳීමට ගතවන කාලය සැළකිය යුතු ලෙස අඩුවීම	ගනුදෙනුකරුවන්, සේවකයන්	කඩදාසි **මිලියන 3.9 ක්** සුරැකීම
Oracle exadata වේදිකාවේ නවතම අනුවාදය	IFRS පද්ධති දත්ත සමුදායන් සඳහා පහසුකම් සැලසීම, කාර්යසාධනය වැඩි දියුණු කිරීම හා බලපත්‍ර පිරිවැය අඩු කිරීම	ගනුදෙනුකරුවන්, සේවකයන්	**ටෝනර් 1,265 ක්** සුරැකීම
VMware සමඟින් ශ්‍රී ලංකාවේ ප්‍රථම මෘදුකාංග දත්ත මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම	භෞතික සර්වර් සඳහා යොදවන වායු සමනය, ඉඩකඩ හා යොදන බලය අඩුවීම. බලපත්‍ර පිරිවැය අඩුකිරීම, කාර්යසාධනය වැඩි දියුණු කිරීම	ගනුදෙනුකරුවන්, සේවකයන්	**මිලියන 1.2 ක** ජංගම හා ඉතුරුම් ගිණුම් විවෘත කිරීම
ගනුදෙනුකාර වැඩ ප්‍රවාහ මාර්ගගත කිරීම	ක්‍රියාවලි සඳහා ගතවන කාලය අඩු වීම වැඩි නිරවද්‍යතාවයක් පවත්වා ගැනීම අභ්‍යන්තර හා නියාමන පාලනයන්ට අනුගත වීම	ගනුදෙනුකරුවන්, සේවකයන්, නියාමකයන්	**365,803 ක** ස්ථාවර තැන්පතු ගිණුම් විවෘත කිරීම
එදිනෙදා ආරක්ෂණ වැඩ ප්‍රවාහ ස්වයංක්‍රීය කිරීම	වැයවන කාලය අඩු කිරීම	ගනුදෙනුකරුවන්, සේවකයන්	**57,749** ණය පහසුකම්

BOC BANKPEDIA

BOC බෑන්ක්පීඩියා

බැංකුව සිය සේවකයන්ගේ දැනුම වර්ධනය සඳහා පහසු සහ වේගවත් ක්‍රමයක් ලෙස විද්‍යුත් ඉගෙනීම් මාර්ගයන් මත විශ්වාසය තබන අතර ඒ සඳහා විස්තීරණ දැනුම් බැංකුව, BOC Bankpedia හඳුන්වා දෙන ලදී.

ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා සංචලන බාධක ඇති විට නිවසේ සිට වුවද සේවා සැපයීම සිදු කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දී ඇත.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 03:

ආරක්ෂාව ශක්තිමත් කිරීම

2022 අංක 9 දරණ, දත්ත ආරක්ෂණ පනතට අනුකූල වීම අධීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් දත්ත ආරක්ෂණ නිලධාරියෙකු (DPO) පත් කර ඇත. වර්තමානයේ, දත්ත ආරක්ෂණ නිලධාරී ප්‍රධාන අවදානම් නිලධාරීගේ විෂය පථය යටතේ ක්‍රියා කරයි.



බැංකුවේ DPO හි රාජකාරී වලට දත්ත ආරක්ෂණ පනතට අනුකූල වන පරිදි දත්ත රහස්‍යතා පියවර ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම අධීක්ෂණය කිරීම ඇතුළත් වේ. ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ආරක්ෂා කරමින් දත්ත හසුරුවීම සම්බන්ධ සංකීර්ණ ප්‍රතිපත්ති සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සඳහා DPO ක්‍රියාකාරීව සම්බන්ධ වේ. ගනුදෙනුකාර තොරතුරු සුරක්ෂිතව හැසිරවීම සහතික කිරීමේ අරමුණින් දත්ත හැසිරවීම සඳහා වූ පුළුල් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මගින් බැංකුවේ දත්ත ආරක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩලයට දත්ත ආරක්ෂණ පිළිවෙත් පිළිබඳ අඛණ්ඩ පුහුණුව ලබා දීම සඳහා DPO අතිරේක වගකීම් දරයි.

කිසියම් දත්ත විනාශ වීම් හෝ පෞද්ගලිකත්ව කඩකිරීම් කඩිනමින් විමර්ශනය කිරීම සහ අවශ්‍ය පියවර ගැනීම සඳහා, DPO විසින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එමඟින් බැංකුවේ මෙහෙයුම්වල විශ්වාසය, විනිවිදභාවය සහ රහස්‍යභාවය තහවුරු කරයි.

ඩිජිටල්කරණයෙන් බල ගැන්වූ බැංකුවක්

ක්‍රියාකාරිත්වය	ප්‍රතිඵලය
විශේෂ දත්ත කාන්දු වීම වැළැක්වීමේ (DLP) විසඳුමක් යොදවා ඇත	අනවසරයෙන් දත්ත වෙත ප්‍රවේශ වීම විමර්ශණය සහ වැළැක්වීම
සහයෝගීතා වේදිකාවක් හඳුන්වාදීම	ආරක්ෂක කණ්ඩායම් අතර තොරතුරු තථ්‍ය කාලීනව බෙදා හැරීම
තාක්ෂණික වංචා හඳුනා ගැනීම	නොමඟ යවන සුළු සහ විභව ප්‍රහාරකයන් හඳුනා ගැනීම
ෆයර්වෝල් ස්ථාපනය හරහා වේගවත් පරිශීලක වෙන් කිරීම	දත්ත ආරක්ෂාව වැඩි දියුණු කිරීම
උසස් විශ්ලේෂණ මෙවලම් ක්‍රියාත්මක කිරීම	ක්‍රියාකාරී තර්ජන හඳුනා ගැනීම සහ හදිසි සිදුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.

ගනුදෙනුකාර පෞද්ගලිකත්වය

GRI 418-1

2023 වසර තුළ ගනුදෙනුකාර පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සනාථ කරන ලද පැමිණිලි කිසිවක් වාර්තා නොවීය.

වසර තුළ ගනුදෙනුකාර දත්ත කාන්දුවීම්, වංචාවක් සොරකම් හෝ අහිමිවීම් සිදුවී නොමැත.

හොඳම භාවිතයන්, සම්මතයන් සහ ක්‍රියාත්මක කිරීම

බැංකුව සිය ඩිජිටල්කරණ ගමනේ ඉදිරියට ගමන් කරන විට, තොරතුරු තාක්ෂණයේ වටිනාකම, ආවේනික අවදානම් කළමනාකරණය සහ නියාමන අනුකූලතාවයේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. මේ සඳහා නායකත්වය, ආයතනික ව්‍යුහය සහ ක්‍රියාවලි වලින් සමන්විත විස්තීරණ තොරතුරු තාක්ෂණ පාලන ආකෘතියක් අවශ්‍ය වේ.

තොරතුරු තාක්ෂණ පාලනය එහි සමස්ත පාලන රාමුවේ තීරණාත්මක අංගයක් වන අතර, අවදානම් නිසි ලෙස කළමනාකරණය කරන අතරම ව්‍යාපාරික අරමුණු සඳහා සහය වීමට තාක්ෂණය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන ඇති බව සහතික කරයි.

බැංකුවේ 'තොරතුරු සහ ඒ ආශ්‍රිත තාක්ෂණ පාලන රාමුව (COBIT 2019)' ක්‍රියාත්මක කිරීමට නියමිත පහත ප්‍රමිතීන් සහ හොඳම භාවිතයන් ඇතුළත් වේ:


- **තත්ත්ව කළමනාකරණ පද්ධති (ISO 9001:2015 සම්මත)**
- **සේවා කළමනාකරණ පද්ධතිය (ISO 20000-1:2018 සම්මත)- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පුස්තකාලය (ITIL) හොඳම භාවිතය**
- **අවදානම් කළමනාකරණය (ISO 31000:2018 සම්මත)**
- **තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (ISO 27001:2013 සම්මත)**
- **ව්‍යාපෘති කළමනාකරණ දැනුම (PMBOK)**

ඵලදායී තොරතුරු තාක්ෂණ පාලනයක් සඳහා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ තොරතුරු තාක්ෂණ කණ්ඩායම් ඇතුළු විවිධ කාර්යයන් හරහා සහයෝගීතාව සහ සම්බන්ධීකරණය කිරීම අවශ්‍ය වේ. එය තාක්ෂණය, නියාමන භූ දර්ශන සහ ව්‍යාපාරික ප්‍රමුඛතාවල වෙනස්කම් අධීක්ෂණය, ඇගයීම සහ අනුවර්තනය වීමේ අඛණ්ඩ ක්‍රියාවලියකි.

ඉදිරි දැක්ම

- UI/UX අතුරු මුහුණත් සහ බැංකුවේ ඩිජිටල් වේදිකා හරහා පරිශීලක අත්දැකීම ප්‍රතිසංස්කරණය කිරීම.
- පවතින විසඳුම් පුළුල් කිරීම සහ ආයතනික ගනුදෙනුකරුවන්ට සේවය කිරීම සඳහා නව නිෂ්පාදන සංවර්ධනය කිරීම.
- සියලුම මූලික විසඳුම් ස්ථාවර කිරීමට සහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් ඇතුළත් ඒකාබද්ධ වේදිකාවක් ගොඩනැගීමට ශක්තිමත් පසුපෙළක් සංවර්ධනය කිරීම.
- අති නවීන ෆයර්වෝල් විසඳුම් භාවිතයෙන් ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ කර්මාන්තයේ ප්‍රවීණයන් සහ නායකයින් සමඟ සාකච්ඡා කර අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහ සංවර්ධනයන් සිදු කිරීම.
- කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා සෘජු ක්‍රියාමාර්ගයක් සහ e-KYC භාවිතා කිරීම.
- ක්‍රියාවලි කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකාර සේවය වැඩි කිරීමට AI සහ දත්ත විශ්ලේෂණ භාවිතා කිරීම.

ක්‍රියාවලි කාර්යක්ෂමතාව සහ ගණුදෙනුකාර සේවය වැඩි කිරීමට AI සහ දත්ත විශ්ලේෂණ භාවිතා කිරීම.



අපගේ සෑම ක්‍රියාවලියකදී ම විශ්වාසයේ තහවුරුව



ලංකා බැංකුවේදී, මිනිසුන් සහ ලෝකය කෙරෙහි අපගේ බලපෑම පිළිබඳව අපි අවධානයෙන් සිටිමු. එබැවින්, අපගේ මෙහෙයුම් පදනම් වී ඇත්තේ පරිසරය මත අපගේ බලපෑම අවම කරන අතරම, සමාජය ධනාත්මක ලෙස අභිප්‍රේරණය වන බව සහතික කිරීම මතය. එසේ කිරීමෙන් ආර්ථිකයට සහය දෙමින්, තිරසාර වර්ධනයක් කරා මෙහෙයවමින්, අපගේ පාර්ශ්වකරුවන් සැමට යහපත් අනාගතයක් උදා කළ හැකි බව අපි විශ්වාස කරන්නෙමු.

රු. බිලියන 5.0 ක
හරිත මූල්‍ය සඳහා ආයෝජනය

රු. බිලියන 1.1 ක
ESMS අනුකූලතාවයෙන් පසු ණය දීම්

52
සූර්ය බලය භාවිතා කරන ශාඛා

රු. මිලියන 129.7 ක
ප්‍රජා ආයෝජන

BOC ගම්මාන **හතරක්**

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත බලපෑම

7 AFFORDABLE AND CLEAN ENERGY | 10 REDUCED INEQUALITIES | 11 SUSTAINABLE CITIES AND COMMUNITIES | 13 CLIMATE ACTION

ප්‍රමාණාත්මකව වැඟදුන් මාතෘකා: M2, M4

- අධි උද්ධමනය සහ වෙනස්වන ආර්ථිකයේ ද්විත්ව බලපෑම් වලට ලක් වූ ප්‍රජාව ව්‍යාපාරවල හා ජීවනෝපායන්හි අස්ථාවරත්වයන්ටද මුහුණ දුන්හ.
- දිනෙන් දින වර්ධනය වන දේශගුණික විපර්යාස හා සම්බන්ධ අන්තරායන් සහ තර්ජන හේතුවෙන් ණයදීම හා ආයෝජන සම්බන්ධ මූල්‍ය තීරණ ගැනීමේදී සමාජීය හා පාරිසරික අංශ වෙනුවෙන් ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාව තීව්‍ර වී ඇත.

2023 සඳහා සන්දර්භය

උපායමාර්ගික ප්‍රමුඛතා

ප්‍රමුඛතා ක්ෂේත්‍ර

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- තිරසාර යහපාලනය වැඩි දියුණු කිරීම
- සමාජ හා ආර්ථික ස්ථාවරත්වය ප්‍රවර්ධනය
- තුලිත කාබන් භාවිතය හා බලපෑම් කළමනාකරණය

අපගේ සෑම ක්‍රියාවලියකදී ම විශ්වාසයේ තහවුරුව

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 01:

තිරසාර යහපාලනය වැඩිදියුණු කිරීම

ලංකා බැංකුව මෙහෙයවනු ලබන්නේ සංවිධානය පුරා ESG පැතිරවීමට සහ තිරසාර බැංකුකරණයේ වෙළඳපළ ප්‍රමුඛයා බවට පත්වීමේ මූලික අභිලාෂයෙනි. ආයතනය, හුදු ලාභදායිත්වයෙන් ඔබ්බට විහිදෙන අරමුණු ළඟා කර ගැනීමට උත්සාහ කරයි. එබැවින් මෙම කැපවීම ශක්තිමත් කිරීමට බැංකුවේ ක්‍රියාවන් සඳහා වග වීමට, බලපෑමක් ඇති ක්ෂේත්‍ර හරහා දිගුකාලීන ධනාත්මක පරිවර්තනයක් සහතික කිරීම සඳහා ශක්තිමත් පාලන පද්ධති ක්‍රියාත්මක වේ.

බාහිර උපදේශකයින්ගේ සහාය ඇතිව තිරසාර පෙර දැක්මක් සැකසීමට බැංකුව තවදුරටත් ප්‍රත්‍යක්ෂ පියවර ගෙන ඇති අතර එමඟින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි පාලන රාමු හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීමට අපේක්ෂිතය.

වගකිවයුතු හවුල්කාරිත්වයන් සහ ESG අවදානම් කළමනාකරණය

වසර තුළදී, බැංකුව විසින් පාරිසරික සහ සමාජීය (E&S) නිර්ණායක සඳහා පාරිභෝගික හා සංවර්ධන බැංකු අංශය යටතේ ණය පහසුකම් 1,223 ක් පරීක්ෂා කරන ලදී.

වර්ෂය තුළදී ESMS අනුකූලතා සඳහා වූ තක්සේරු කිරීම් වලින් පසු වර්ෂය තුළ රු. බිලියන 1.1 ක් ණය ලබා දී ඇත.

ලංකා බැංකුවේ ස්ථාපිත ESMS ප්‍රතිපත්තිය ADB, AIIB සහ CBSL මාර්ගෝපදේශ වලට අනුකූල වන අතර, A, B, හෝ C ශ්‍රේණිගත කිරීම් සහිත ණය E&S පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියකට යටත් වේ.

වර්ෂය තුළදී, බැංකුව පෙව විවිධත්වය අනතුරේ හෙළන මූලපිරීම් වලට සහය දැක්වීම හෝ අරමුදල් සැපයීම සිදු නොකරන සිය ප්‍රතිඥාව පවත්වා ගෙන ගියේය. තවද, අරමුදල් සඳහා ඉල්ලුම් කරන ව්‍යාපෘති සඳහා ප්‍රථමයෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් (EPL) ලබා ගත යුතු අතර, මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් නිකුත් කරන ලද සහ ජාතික පාරිසරික පනතේ නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූල බවට අදාළ බලධාරීන්ගෙන් පූර්ව නිෂ්කාශන ලබා ගත යුතුය.

E & S පරීක්ෂාව සඳහා පුහුණු වූ නිලධාරීන් සංඛ්‍යාව	1,126
වර්ෂය තුළ ESMS අනුකූලතාව සඳහා පරීක්ෂා කරන ලද ණය සංඛ්‍යාව	1,223
ESMS අනුකූලතාවයෙන් පසු වර්ෂය තුළ ප්‍රදානය කල ණය මුදල (රු. බිලියන)	1,145
වර්ෂය තුළ ESMS අනුකූල නොවූ ප්‍රතික්ෂේප කරන ලද ණය ප්‍රමාණය	29

මීට අමතරව, සැපයුම්කරුවන් තෝරාගැනීමේදී, සමාජීය හා පාරිසරික සාධක ද සැලකිල්ලට ගනී. උදාහරණයක් වශයෙන්, යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ISO ප්‍රමිතීන් පිළිපැදීම, ප්‍රසම්පාදනයේදී කම්කරු නීතිවලට අනුකූල වීම, පවතින පාරිසරික ප්‍රමිතීන්ට අනුකූල වීම, ශබ්ද මට්ටම්, කාබන් විමෝචනය ආදිය පිළිබඳව තක්සේරුවක් මත සේවාවන් ලබා ගනී.

තිරසාරත්වය මත සේවක ධාරිතාව ගොඩනැගීම

විශේෂඥ උපදෙස් යටතේ බැංකුවේ හි ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) තුළ ඇති ESMS ඒකකය සහ බැංකුවේ ESM ප්‍රතිපත්තියට අනුකූලව, බැංකුව විසින් සිය සේවක සංඛ්‍යාවේ ධාරිතා සංවර්ධනය සඳහා අරමුදල් සැපයීම දිගටම කරගෙන යයි. 2023, දී බැංකුව කාර්ය මණ්ඩල දැනුවත් කිරීම සහ වැඩි දියුණු කිරීම අරමුණු කරගත් මූලපිරීම් කිහිපයක් පවත්වන ලදී. සේවකයින්ගේ දැනුවත්භාවය, පුහුණු කිරීම සහ කුසලතා වර්ධනය තිරසාරත්වය, ඩිජිටල් පරිවර්තනයට අදාළ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා බැංකුව අභ්‍යන්තර හා බාහිර සම්පත් මතද විෂය විශේෂඥයින්ගේ සහය ලබා ගැනීමටද ආයෝජනය කරයි. බැංකුව තිරසාරත්වය හා සම්බන්ධ ධාරිතා ගොඩනැගීමේ මූලපිරීම් සංවිධානය කරනු ලබන අතර, බැංකුවේ ණය නිලධාරීන්, සම්බන්ධතා නිලධාරීන් සිට ආයතනික කළමනාකාරිත්වයේ ඉහළම මට්ටම් දක්වා සහභාගීත්වය යොමුවේ.

වගවීම සහ හෙළිදරව් කිරීම්

මෙය බැංකුවේ 11 වැනි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව වන අතර එය ESG/තිරසාරත්ව දත්ත සහ ගෝලීය වාර්තාකරණ රාමු සහ හොඳම භාවිතයන්ට අනුගත වේ.

බැංකුවේ හෙළිදරව් කිරීම් වලට ESG සාධක ඇතුළත් කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර 05 පිටුවේ 'මෙම වාර්තාව පිළිබඳව' යොමු වන්න.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 02:

සමාජ හා ආර්ථික ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම

සුවිශේෂී බාධාවන් මධ්‍යයේ ජාතික වර්ධනය සහ ස්ථාවරත්වය සඳහා බැංකුවේ දායකත්වය මෙම වාර්ෂික වාර්තාවෙන් ඉස්මතු කරයි. වසර තුළදී, බැංකුවේ නොපසුබස්නා උත්සාහයන්, ආර්ථික ප්‍රකෘතිමත් වීමට, සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීමට, අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා අබණ්ඩව පවත්වාගෙන යාමට ඉඩ සැලසීමට සහ ප්‍රමුඛ බැංකු සේවා සැපයීමට අමතරව මූල්‍ය පද්ධතිය ස්ථාවර කිරීමට හේතු විය.

සාර්ව ආර්ථික ස්ථාවරත්වයට සහාය වීම

බැංකුව විසින් රජයේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අබණ්ඩව සහාය ලබා දී ඇති අතර, ජාතික ආර්ථික පරිසරය වැඩිදියුණු කිරීම අරමුණු කර ගෙන ඇත. විදෙස් ප්‍රේෂණ කර්මාන්තය තුළ ප්‍රමුඛයා වීමෙන්, රට තුළට අත්‍යාවශ්‍ය විදේශ මුදල් ගලා වීම සක්‍රීය කළේය. බැංකුව රජයේ සුරුකුම්පත් වෙළඳපළේ ආයෝජනය කරන අතර රජයට බදු සහ ලාභාංශ වශයෙන් මෙහෙයුම් සඳහා අවශ්‍ය වන අරමුදල් සපයයි.

ඇ. ඩො. බිලියන 3
බලශක්ති අංශය සඳහා මූල්‍ය පහසුකම්

ඇ. ඩො. මිලියන 130.3
ඖෂධ ආනයනය සඳහා පහසුකම් සැලසීම්

රු. බිලියන 25.9
රජයට බදු හා ලාභාංශ ගෙවීම්

ව්‍යාපාර 174 කට
බැංකුවේ ව්‍යාපාර පුනර්ජීවන ක්‍රමවේදය යටතේ සහය වීම



රු. බිලියන 27.6
කෘෂි කර්මාන්ත, ආහාර සැකසීම් හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන්ට සංවර්ධන ණය ලබා දීම.

ඇ. ඩො. බිලියන 4.8
ආමුඛ ප්‍රේෂණ පහසුකම්.

2023 දී, බැංකුව මෙහෙයුම් පරිසරය තුළ සැලකිය යුතු බාධාවන් හමුවේ පවා සිය ශාඛා වෙත ප්‍රවේශය සහ ක්‍රියාකාරිත්වය සහතික කරමින් ව්‍යාපාරයන්හි අඛණ්ඩ පැවැත්මට තවදුරටත් ප්‍රමුඛත්වය දුන්නේය.

බැංකුවේ පුළුල් ශාඛා ජාලය, ඩිජිටල් වේදිකා, බිම් මට්ටමේ නියෝජිත ජාලය සහ ජංගම බැංකුකරණ හැකියාවන් සමඟින් දිවයින පුරා මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය පවත්වාගෙන යනු ලැබීය.

රටේ විදේශ විනිමය සංචිත ක්ෂය වී තිබියදී පවා වෛද්‍ය උපකරණ, ඖෂධ, ගෑස් සහ ඛනිජ තෙල් ඇතුළු අත්‍යවශ්‍යය භාණ්ඩ ආනයනය කිරීමට බැංකුව සම්බන්ධ විය.

විශේෂයෙන් අර්බුදයෙන් පීඩාවට පත් ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සහය ලබා දීම සහ ඔවුන්ගේ ව්‍යාපාරවල තිරසාරභාවය ප්‍රවර්ධනය කරමින් සහන ලබා දීම, පහසුකම් ප්‍රතිසංවිධානයන සහ ප්‍රතිනිර්මාණය, සැලකිය යුතු ලෙස බලපෑමට ලක් වූ කර්මාන්ත වලට ප්‍රකෘතිමත් වීමට අරමුදල් වෙන් කිරීම මඟින් ජාතියේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමට හා පෝෂණය කිරීමට බැංකුව මූලපිරීම් මාලාවක් භාවිතා කළේය.

යටිතල පහසුකම් සංවර්ධනය

ලංකා බැංකුව ජීවන තත්ත්වයන් ඉහළ නංවන සහ ශ්‍රී ලංකා ආර්ථිකය උත්තේජනය කරන පෙරළිකාර මූලපිරීම් ඇතුළුව රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම යටිතල පහසුකම් සංවර්ධනය සඳහා තීරණාත්මක අරමුදල් මූලාශ්‍රයක් ලෙස සේවය කරයි. වසර අවසාන වන විට යටිතල පහසුකම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා රු. බිලියන 974.6 ක නිරාවරණයක් බැංකුව සතු විය.

ප්‍රජා සංවර්ධනය සහ ශාක්‍යතාවන් ගොඩනැඟීම

බැංකුව විසින් 2023 වර්ෂයේදී මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට සහ බැංකුවේ සහනදායී නිෂ්පාදන සහ පිරිනැමීම් පිළිබඳ දැනුම කාර්යය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන් අතර ඉහළ නැංවීම සඳහා වසර පුරා මූලපිරීම් ක්‍රියාත්මක කරන ලදී.

බැංකුවේ ප්‍රමුඛතම වැඩසටහන වන 'BOC ගම්මාන' වසර තුළ අඛණ්ඩව ප්‍රගතියක් ලබා ඇත. ප්‍රජාවගේ පාරිසරික, සමාජීය සහ සංවර්ධන අවශ්‍යතා සඳහා පරිපූර්ණ සහය ලබා දෙන අතරම ඉලක්කගත ප්‍රජාවන්ගේ සෞඛ්‍යය සහ සුබසාධනය වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන විවිධ සංවිධාන සහ සේවාවන් සමඟ සම්බන්ධීකරණය කරයි. මේ ප්‍රජාවන් මූල්‍ය සාක්ෂරතාව සහ ඉතිරි කිරීමේ පිළිවෙත් ගැන තවදුරටත් බැංකුවෙන් පුහුණුව ලබා ඇත.


ඊට අමතරව, සංස්කෘතික හා ආගමික උත්සව, වෘත්තීය සහ ව්‍යාවසායකත්ව වර්ධනය, ක්‍රීඩා ක්ෂේත්‍ර දියුණුව, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ විද්‍යා හා තාක්ෂණවේදය යන ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 68.3 කට වැඩි මුදලක් වෙන්කරමින් ප්‍රධාන සමාජ කණ්ඩායම්වල ඉල්ලීම් වලට බැංකුව අඛණ්ඩව ප්‍රතිචාර දක්වා ඇත.


ලංකා බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් ඔවුන්ගේ අසල්වැසි ප්‍රදේශවල හදිසි හෝ අනපේක්ෂිත අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් ප්‍රජා සංවර්ධන මූලපිරීම් ස්වේච්ඡාවෙන් සැලසුම් කිරීමෙන් වසර පුරා ප්‍රජාව වෙත උපකාර කරන ලදි. බැංකුව විසින් සිය කාර්ය මණ්ඩලය ස්වේච්ඡා සේවයේ නිරත වීමට දිරිමත් කරන ලදී.

සංවර්ධන ණය දීම

සමස්ත සැපයුම් දාමයන් ආරක්ෂා කරන, ව්‍යාවසායකත්වය ප්‍රවර්ධනය කරන, රැකියා උත්පාදනය සහ පවත්වාගෙන යන, ජාතියේ කාර්මික හා ග්‍රාමීය වර්ධනයට ආධාර කරන සංවර්ධන ණය හරහා බැංකුව සමාජයට සැලකිය යුතු දායකත්වයක් සපයයි.

අපගේ සෑම ක්‍රියාවලියකදී ම විශ්වාසයේ තහවුරුව





වෛතිහාසික වශයෙන් අඩු පහසුකම් ලැබී ඇති නමුත් ශ්‍රී ලංකා ආර්ථිකයේ අඛණ්ඩ පැවැත්මට වැදගත්, අවදානමට ලක්විය හැකි කණ්ඩායම් හා කර්මාන්ත සඳහා ලංකා බැංකුව මූල්‍ය සේවා සපයයි. බැංකුව සමාජ හා මූල්‍ය ඇතුළත් කිරීම් මෙන්ම සාධාරණ සංවර්ධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. මීට අමතරව, දිවයින පුරා අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සහය වන, අර්බුදයෙන් පීඩාවට පත් ක්ෂේත්‍ර සඳහා ආධාර සපයන, හරිත තාක්ෂණයන් සහ ව්‍යවසායන් භාවිතය දිරිමත් කරන, සහනදායී ණය මාර්ග ගණනාවක් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනයක් (PFI) ලෙස බැංකුව ක්‍රියා කරයි.

අද්විතීය ණය නිෂ්පාදන සහ බැංකුවෙහි ජනප්‍රිය ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන වන 'BOC මිතුරු' හරහා බැංකුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ගෘහ ව්‍යාපාර සහ ව්‍යවසායකත්ව ප්‍රයත්නයන් දිරිමත් කරන අතර මූල්‍යකරණය කරයි.

මීට අමතරව, බැංකුව කාන්තා ව්‍යවසායකයින් සහ කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාර සඳහා මූල්‍යකරණය වැඩි දියුණු කිරීම කෙරෙහි සිය උත්සාහයන් යොමු කරමින්, එමගින් දිවයින පුරා සිටින දහස් ගණන් කාන්තාවන්ට, ඔවුන්ගේ පවුල් සහ ප්‍රජාවන් නඩත්තු කෙරෙන ආදායම් මාර්ග සහ විකල්ප ජීවනෝපාය මාර්ග නිර්මාණය කිරීමට සහ පුළුල් කිරීමට බල ගන්වයි.

ක්ෂුද්‍ර මූල්‍යකරණය 2023

රු. බිලියන 11.0 ක
නව ක්ෂුද්‍ර මූල්‍ය ණය අරමුදල්

32,115
නව ක්ෂුද්‍ර මූල්‍ය ණය

රු. බිලියන 3.3
කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාර සඳහා ණය අරමුදල්

කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාර **13,252** සඳහා ණය

සැපයුම්කරුවන්හට සහය වීම

බැංකුව වසර තුළදී දේශීය සැපයුම්කරුවන් වෙත රු. බිලියන 8.6 ක් (සම්පූර්ණ සැපයුම්කරුවන්ගේ ගෙවීම් වලින් 95% ක්) ලබා දෙමින් සිය සැපයුම්කරුවන් සමඟ හවුල්කාරිත්වය දිගටම පවත්වාගෙන ගියේය.

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 03

තුලිත කාබන් භාවිතය හා බලපෑම් කළමනාකරණය

දේශගුණික විපර්යාස අවම කිරීම කෙරෙහි රජයේ අවධානයට අනුකූලව, බැංකුව මේ වන විට කාබන් මධ්‍යස්ථ ආයතනයක් බවට පත්වීම සහ කාබන් පියසටහන් අවම කිරීම සඳහා වසරින් වසර පියවර ගනිමින් සිටී. මේ සම්බන්ධයෙන් බැංකුවේ ප්‍රයත්නයන්, තිරසාර මූල්‍යකරණය, හරිත මූල්‍යකරණය, පරිසර සංරක්ෂණය සහ කාබන් පියසටහන් අවම කිරීම සඳහා විහිදේ. බැංකුව වසර 2023 දී කාබන් පියසටහන් 28% කින් අඩු කරන ලද අතර GHG විමෝචන තීව්‍රතාවය ද 3.3 සිට 2.3 දක්වා අඩු කරන ලදී.

බැංකුවේ කාබන් පිය සටහන්

එහි පුළුල් භූගෝලීය ප්‍රවේශය සහ විශාල ගනුදෙනුකාර පදනම අනුව, පරිසරය මත වන මෙහෙයුම් බලපෑම් අඩු කිරීමට බැංකුව අවශ්‍ය පියවර ගනී. බැංකුවේ මෙහෙයුම් ක්‍රියාකාරකම් පුරා තිරසාර භාවිතයන් දිරිමත් කිරීම සහ එහි මෙහෙයුම්වල සියලු අංශ හරහා පරිසර හිතකාමී භාවිතයන් ඒකාබද්ධ කිරීම මගින් මෙය ඉටු කිරීමට බැංකුව උත්සාහ කරයි.

පරිසර හිතකාමී භාවිතයන් සිය උපායමාර්ග සහ මෙහෙයුම්වලට ඒකාබද්ධ කිරීමේ උත්සාහයක් ලෙස බැංකුව සිය ව්‍යාපාරික ඒකක සහ ක්‍රියාකාරකම්වල සෑම අංගයක් තුළම තිරසාර සංස්කෘතියක් වැක් කරයි.

බැංකුවේ තිරසාර ප්‍රතිඥාව සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සූර්ය බල ශක්තිය උත්පාදනය සඳහා අඩු පිරිවැය සහිත මූල්‍ය සැලසුම් සැපයීම මගින් සේවක පුහුණුව සහ දැනුවත් කිරීමේ මුලපිරීම් සිදු කෙරේ. තිරසාර බව අවධාරණය කිරීම සහ කාර්ය මණ්ඩල සහභාගීත්වය වැඩි කිරීම සඳහා වූ නව ප්‍රවේශයක කොටසක් ලෙස, බැංකුව 2022 වර්ෂයේදී ශාඛා මට්ටමින් ගෙවතු වගා වැඩසටහනක් දියත් කළ අතර එය 2023 වසර තුළද අඛණ්ඩව පැවතුනි. එහි ප්‍රතිඵලයක් ලෙස 2023 දී ශාඛා 332 ක් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් 148 ක් මෙම ගෙවතු වගා ක්‍රියාදාමයට සක්‍රීයව සම්බන්ධ විය.

බලශක්ති පරිභෝජනය

GRI 302-1/2/3

බැංකුව සිය ශාඛා ජාලය සහ ක්‍රියාකාරකම් හරහා බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නංවන අතරම පොසිල ඉන්ධන මත යැපීම පහත හෙලීමට කැපවී සිටී. 2023 වසර තුළ දී ද, ශාඛා සූර්ය බලශක්තිකරණ වැඩසටහන අඛණ්ඩව සිදු වූ අතර, ශාඛා 52 ක් ප්‍රකාශක වෝල්ටීයතා බලයෙන් සමන්විත වූ අතර ශාඛා 21 ක් සූර්ය බලශක්තිකරණය කරන ලදී. බැංකුව කාබන් කළමනාකරණ සැලැස්මකට කටයුතු කරමින් සිටින අතර කාබන් මධ්‍යස්ථත ඉලක්ක අවසන් කරමින් සිටී.

10
හරිත ගොඩනැගිලි සඳහා සම්මාන

01
හරිත ගොඩනැගිලි සංකල්පය අනුව නිම කළ ශාඛා

06
හරිත ගොඩනැගිලි සහතික සඳහා සමාලෝචිත ශාඛා

8%
ශාඛා ජාලයෙන් සූර්ය බලය සහිත ශාඛා

14%
සමස්ත මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය බල ශක්ති ප්‍රමාණයෙන් පුනර්ජනනීය මූලාශ්‍ර මගින් ක්‍රියාත්මක වන ප්‍රතිශතය

පුනර්ජනනීය බලශක්ති නිපැයුම
මෙගා වොට් පැය 3,245.3

රු. මිලියන 146.6
සූර්ය බලශක්ති උදෙසා යෙදවූ ආයෝජනය

මෙගා වොට් 10
මූල්‍ය පහසුකම් සපයන ලද සූර්යය බලශක්ති ජනනය

බැංකුව විසින් සිදුකරන ඕනෑම නව ඉදිකිරීම් ව්‍යාපෘතියක්, හරිත ගොඩනැගිලි කවුන්සිලයේ (GBC) හරිත ගොඩනැගිලි ප්‍රමිතීන්ට අනුකූලව සිදුවන බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ බැංකුව විසින් ස්ථාපිත කර ඇත. අඛණ්ඩව වසර ගණනාවක් පුරා, හරිත ගොඩනැගිලි අනුකූලතාවන් සහ හරිතකරණය සඳහා වන බැංකුවේ කැපවීම අගයමින් හරිත ගොඩනැගිලි කවුන්සිලය වෙතින් 'හරිත ව්‍යාපාර නායකත්ව සම්මානය' බැංකුවට පිරිනමා ඇත.

මේ වන විට බැංකුව විසින් ශාඛා 30 කට සූර්ය බලශක්තිය ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර ශාඛා පරිසර හිතකාමී ගොඩනැගිලි බවට පරිවර්තනය කිරීම සඳහා සමාලෝචන සිදු වෙමින් පවතී.

බැංකුව හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් අනුමැතිය ලත් ඉංජිනේරුවන් සේවයේ යොදවා ඇති අතර ජාතික පිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය (NCPC) විසින් සහතික කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් තිරසාරත්ව ඒකකය තුළ සේවයේ යොදවා ඇත. හරිත තාක්ෂණය සහ බලශක්ති කාර්යක්ෂමතා හැකියාවන් වර්ධනය කිරීම සඳහා ආයෝජනය කරමින්, බැංකුව 2023 දී බාහිර පුහුණුව සහ කුසලතා වර්ධනය උදෙසා සුදුසු සේවකයින් ප්‍රධාන වශයෙන් හඳුනා ගන්නා ලදී.

හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් පවත්වන ලබන වාර්ෂික හරිත ගොඩනැගිලි සම්මාන උළෙලේ දී 2023 වසර තුළ සූර්ය බලශක්තිකරණය සහ හරිත ගොඩනැගිලි සංකල්පය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් බැංකුවේ මුලපිරීම් ඇගයීමට ලක් කරන ලදී.



	2023	2022	% වෙනස
පුනර්ජනනීය බලශක්තියෙන් නිපදවන විදුලිය	14%	13%	1
විමෝචන තීව්‍රතාවය (මිලියන වලින්)	0.05	0.04	25

GRI 302-1/302-4/305-4/303-5

	2023	2022	% වෙනස
විදුලිය (මෙගා වොට් පැය)	22,730.0	25,301.4	(10)
ඉන්ධන (m3)	102.9	226.9	(55)
සූර්ය බලශක්තිය (මෙගා වොට් පැය)	3,245.3	3,219.3	1
GHG විමෝචනය (tCO2eqv)	19,708	27,332.7	(28)

බලශක්ති ඉතිරිකිරීම් සහ ප්‍රශස්තකරණය පිළිබඳව කාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීමේ සැසි පවැත්වීම, බලශක්ති භාවිතය කාර්යක්ෂම විදුලි උපකරණ (ආලෝක, වායුසම්කරණ, පරිගණක යනාදී) භාවිතය යන ආදී ක්‍රියාවට නැංවීම තුළින් බැංකුව සිය විදුලි පරිභෝජනය අවම කිරීමට තවදුරටත් පියවර ගත්තේය. තවද නව තොරතුරු තාක්ෂණ දත්ත ගබඩාව බලශක්ති ඉතිරිකිරීම් සහ ප්‍රශස්තකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ඉදිකර ඇත.

අපගේ සෑම ක්‍රියාවලියකදී ම විශ්වාසයේ තහවුරුව

විමෝචනය

GRI 305- 1/2/3/4

හරිතාගාර වායු විමෝචනය මැනීම සහ වාර්තා කිරීම සඳහා වන 14064:1 ප්‍රමිතිය බැංකුවේ හරිතාගාර වායු විමෝචනය තක්සේරු කිරීම සහ අනාවරණය කිරීම සඳහා පදනම ලෙස ක්‍රියා කරයි. බැංකුව 2022 දී පුළුල් කාබන් කළමනාකරණ සැලැස්මක් සකස් කර සම්මත කර ගත් අතර 2023 වසර තුළදී ද බැංකුවෙහි කාබන් පියසටහන් මැනීම, අඩු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නව ප්‍රවේශයන් ක්‍රියාත්මක කළේය.

පරිභෝජනය ක්‍රියාවලීන්

GRI 306-1/3/4

බැංකුව විසින් ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණ අඛණ්ඩව වර්ධනය කළ අතර, එය කඩදාසි රහිත බැංකුකරණය සඳහා බැංකුවේ නැඹුරුව ඉහළ නැංවීය. ඩිජිටල්කරණය කෙරෙහි ඇති උපායමාර්ගික අවධානය සහ ඩිජිටල් නාලිකා භාවිතා කරන ගනුදෙනුකරුවන්ගේ වර්ධනය යන ප්‍රවණතාවයන් හා ඒකාබද්ධව ඉදිරි වසර වලදී මෙම උත්සාහයන් තවදුරටත් නිවැරදිව ස්ථාන ගත කිරීමට බැංකුව කටයුතු යොදනු ඇත.

පරිසර හිතකාමී තෑගි භාණ්ඩ සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සපයා ගැනීමෙන්, සැපයුම් දාමය හරහා සිය පරිසර හිතකාමී පරිභෝජන රටාව තවදුරටත් දියත් කිරීම සඳහා බැංකුව කැපවී සිටී. බැංකුව සිය ප්ලාස්ටික් සහ පොලිතින් පරිභෝජනය අවම කිරීම සඳහා ප්‍රත්‍යක්ෂ උත්සාහයක් ගෙන ඇත. ආයතනික උත්සව සහ රැස්වීම් වලදී ප්ලාස්ටික් බෝතල් භාවිතය අවම කිරීම මෙයට නිදසුනකි.

බැංකුව විසින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය, ඝණ අපද්‍රව්‍ය සහ ආහාරමය අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කෙරේ. පහත සඳහන් ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම කළමනාකරණය සඳහා බැංකුව විසින් අනුගමනය කරන ක්‍රියාවලියේ ප්‍රතිඵලයන්ය.



තිරසාර මූල්‍යකරණය

පාරිසරික සහ සමාජීය (E&S) අවදානම් කළමනාකරණය කිරීමට බැංකුව උත්සාහ කරන අතර, ණය දීමේ තීරණ වලදී (E&S) සාධක වලට අනුකූලවීම සඳහා ප්‍රමුඛත්වය දෙයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍ය සඳහා වන පෙරදැක්ම අනුකූලව බැංකුව විසින් විවිධ හරිත මූල්‍යකරණ ණය සහ ආධාරක සේවා හරහා සමාජීය වශයෙන් පරිසර හිතකාමී/දේශගුණික හිතකාමී ව්‍යාපෘති, නිෂ්පාදන සහ සේවාවන් සඳහා ක්‍රියාකාරිව සහාය දක්වයි.

හරිත මූල්‍යකරණය

බැංකුව විසින් මෙහෙයවන නව්‍ය හරිත මූල්‍ය ප්‍රයත්නයන්ගෙන් එකක් ලෙස සහනදායී අරමුදල් විකල්පයන් නියෝජනය වේ. මෙම මූලපිරීම් සැලසුම් කර ඇත්තේ පිරිසිදු තාක්ෂණයන් සහ පුනර්ජනනීය බලශක්තිය භාවිතා කිරීමට ගෘහස්ථ සහ වාණිජ පාරිභෝගිකයින් දිරිමත් කිරීම සඳහා ය. බැංකුව ජීව වායු සහ සූර්ය බලාගාර සඳහා ණය මෙන්ම පොසිල ඉන්ධන මත යැපීම අඩු කරන විද්‍යුත් වාහන සඳහා ණය හා කල්බදු පහසුකම් ලබා දෙමින් කාබන් විමෝචනය අවම කිරීමෙන් දේශගුණික විපර්යාස වල බලපෑම අවම කිරීමට දායක වේ.

රු. මිලියන 478
තිරසාර නිෂ්පාදනය සඳහා ලබා දී ඇත

රු. මිලියන 350
අපද්‍රව්‍ය කළමනාකරණ සඳහා ලබා දී ඇත

අපගේ මෙහෙයුම් ක්‍රියාවලිය මගින් ජනිත වන කාබන් ප්‍රමාණයේ බලපෑම අවම කිරීම	
කඩදාසි ප්‍රතිචක්‍රීකරණය (කි.ග්‍රෑම්. 52,418)	59.9 tCO_2e
e-අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය	5.7 tCO_2e
සූර්ය බල ශක්තිය	1,338.3 tCO_2e

891
2023 දී කඩදාසි ප්‍රතිචක්‍රීකරණය මගින් සම්පූර්ණයෙන්ම වැඩුණු ශාක ආරක්ෂා කර ඇත.

සූර්ය බලශක්ති අංශය සඳහා අයවිය යුතු ණයවල වටිනාකම (රු. බිලියන)	1.6
පුනර්ජනනීය බලශක්ති අංශය සඳහා අයවිය යුතු ණය පහසුකම් සංඛ්‍යාව	13,575
හරිත මූල්‍ය සඳහා 2023 දී ලබා දුන් නව ණය පහසුකම්වල වටිනාකම (රු. මිලියන)	530.9
හරිත මූල්‍ය සඳහා ලබා දී ඇති නව ණය පහසුකම් සංඛ්‍යාව	175

අවම ප්ලාස්ටික් භාවිතයකට මුලපිරීම

ලංකා බැංකුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) සහ ශ්‍රී ලංකා වෙරළ සංරක්ෂණ අධිකාරිය සමඟ එක්ව තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම සඳහා වූ සිය කැපවීම ඉටු කරමින් දිවයින පුරා තෝරාගත් ස්ථාන වලින් ප්ලාස්ටික් සහ පොලිතීන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ප්‍රයත්නයට හවුල් විය. ඒ අනුව, 2023 ලෝක පරිසර දිනයේදී රට පුරා සමුද්‍ර ස්ථාන 6 ක් පිරිසිදු කිරීමට ලංකා බැංකුව අනුග්‍රහය දක්වන ලදී. එකතු කරන ලද අපද්‍රව්‍ය වර්ග කර ලියාපදිංචි ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කරන්නන්ගේ සහාය ඇතිව ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන ලද අතර, මේ අයුරින් අපද්‍රව්‍ය ලෙස ගොඩබිම තුළ රැස්වන ප්ලාස්ටික් ප්‍රමාණය අඩු කිරීමට ලංකා බැංකුවේ දායකත්වය ලබා දී ඇත.

ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම

වසර තුළදී, ලංකා බැංකුව MEPA සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවේ පෙරළ විවිධත්ව 'ලයිෆ් ටු අවර් බීච්' වැඩසටහන සමඟ අත්වැල් බැඳ ගත්තේය. ශ්‍රී ලංකාවේ පෙරළ විවිධත්වයේ ආරම්භක සාමාජිකයෙකු ලෙස, පාර්ශ්වකරුවන් ද සම්බන්ධ කර ගනිමින් බැංකුව විසින් අනුග්‍රහය දක්වන ව්‍යාපෘති හරහා ස්වභාවධර්මය සහ එහි පෙරළ විවිධත්වය සුරැකීමේ වැඩසටහන්වල සක්‍රීයව නිරත වී ඇත. 'ලයිෆ් ටු අවර් බීච්' වැඩසටහන යටතේ තෝරාගත් වෙරළ තීරයන් ප්ලාස්ටික් සහ අනෙකුත් දූෂක ද්‍රව්‍ය වලින් තොර පිරිසිදු වෙරළ තීරයන් බවට පත් කරමින් සංරක්ෂණය කිරීම කෙරෙහි දායකවීම එවැනි දිගුකාලීන ව්‍යාපෘතියකි.

පරිසර සංරක්ෂණය

අනාගතයේදී පරිසරයට අපද්‍රව්‍ය විමෝචනය සිදුවන ක්‍රියාවලීන් ඇතුලත් කර්මාන්ත සඳහා ණය පහසුකම් සැපයීම හැකිතාක් අවම කිරීමට බැංකුව අදහස් කර සිටී. එමෙන්ම බැංකුවේ උපායමාර්ගික සැලැස්ම ඔස්සේ ශ්‍රී ලංකාවේ හරිත සංවර්ධනය සඳහා අරමුදල් සැපයීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙලෙස කර්මාන්ත හරිතකරණය සහ ව්‍යාපාර සහ කර්මාන්තවල කාබන් ඩයොක්සයිඩ් විමෝචනය අවම කිරීම සඳහා බැංකුව කැපවී සිටී. රටේ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සපුරා ගැනීම සඳහා සක්‍රීය දායකත්වය සපයමින් බැංකුව සූර්ය බලය මෙගා වොට් 10.0 කටත් වඩා ඉහළ අගයකින් ජාතික විදුලි බල සැපයුමට විදුලිය මුදාහැරීම උදෙසා කටයුතු කර ඇත. ඉහත කරුණු වලට අමතරව පරිසරයට හෝ පෙරළ විවිධත්වයට හානියක් නොවන පරිදි මෙහෙයුම් කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් බැංකුව අවධානය ලබා දේ. ප්‍රධාන කාර්යසාධන දර්ශක වලට පාරිසරික සාධක ඇතුළත් කිරීමෙන් තිරසාර වර්ධනයක් හරහා සැමට සමාන ප්‍රමුඛතා ලබා දීමට අප කටයුතු කරන්නෙමු.

ඉදිරි දැක්ම

තිරසාරභාවය වර්ධනය කිරීම සඳහා දිගුකාලීන දැක්මක් ඇතිව, බාහිර විශේෂඥයින්ගේ සහ උපදේශකයින්ගේ සහාය ඇතිව තිරසාර පෙර දැක්ම සකස් කිරීමේ ක්‍රියාවලියක බැංකුව නිරතව සිටී.

තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, කාර්යාලීය උපකරණ සහ ආලෝක පද්ධති සඳහා බලශක්ති කාර්යක්ෂම තාක්ෂණික උපකරණ ප්‍රසම්පාදනයට ප්‍රමුඛත්වය දීම.

අමුද්‍රව්‍ය නිස්සාරණය, නිෂ්පාදනය, ප්‍රවාහනය, භාවිතය සහ ජීවන චක්‍රය බැහැර කිරීම සම්බන්ධ අංග ඇතුළුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ නිෂ්පාදන සහ සේවාවන්හි සමස්ත බලපෑම අවම කරගනිමින් තීරණ ගැනීම.


අඩු පාරිසරික බලපෑම් සහ දිගු ආයු කාලයක් සහිත නිෂ්පාදන සහ සේවා සඳහා වැඩි ඉල්ලුමක් ඇති කිරීම.

බලශක්ති කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය කළමනාකරණය, ශ්‍රම පරිචයන් සහ පාරිසරික රෙගුලාසිවලට අනුකූල වීම වැනි සාධක සලකා බලමින් සැපයුම්කරුවන් සඳහා නිර්ණායක ස්ථාපිත කිරීම.

ප්‍රතිඵලය :

කිලෝ ග්‍රෑම් 438.65 ක සමුද්‍ර ප්ලාස්ටික් ඉවත් කරන ලදී

එකතු කරන ලද ප්ලාස්ටික් වලින් කිලෝ ග්‍රෑම් 220.8 ක් ප්‍රතිචක්‍රීකරණය කරන ලදී





6

ශක්තිමත් පාලනයක් සමඟ මූල්‍ය ඒකාග්‍රතාව ශක්තිමත් කිරීම

සූර්යයාගේ ගුරුත්වාකර්ෂණ බලය මඟින් තමා වටා ගමන් කරන ආකාශ වස්තූන් හි ගමන් පථයන් නිර්ණය කරන්නක් මෙන් බැංකුවේ ශක්තිමත් යහපාලන ව්‍යුහය බැංකුවේ ස්ථාවරත්වය පවත්වා ගෙන යාමේ ගාමක බලය වේ.

විස්තීරණ සහ සාධාරණ ව්‍යාපාර ආකෘතියක් නිර්මාණය කිරීම සඳහා අපගේ යහපාලන ක්‍රියාවලීන් හරහා අපි සියලු පාර්ශ්වකරුවන් සමඟ විවෘතව සහ විනිවිදභාවයෙන් සම්බන්ධ වෙමු.

ආයතනික යහපාලනය



"විකාශනය වන නියාමන අවශ්‍යතා සහ හොඳම භාවිතයන්ට අනුවර්තනය වීමට අපි අපගේ පාලන රාමුව සමාලෝචනය කර යාවත්කාලීන කිරීම දිගටම කරගෙන යන්නෙමු, අපි ආයතනික යහපාලන විශිෂ්ටත්වයේ ඉදිරියෙන්ම සිටින බව සහතික කරමු. ගනුදෙනුකරුවන් වෙත අති නවීන බැංකු විසඳුම් පිරිනැමීම සඳහා ලංකා බැංකුවෙහි ඩිජිටල්කරණ අභිලාෂයන් වෙත මඟ පෙන්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී."

ආයතනික යහපාලනය පිළිබඳ නව සභාපතිතුමාගේ පණිවිඩය

ඵලදායී ආයතනික යහපාලනය බැංකුවේ අරමුණු සහ උපායමාර්ග ඉටු කිරීමට ඇති හැකියාව සඳහා මූලික වේ. ආයතනික යහපාලනය සඳහා අපගේ ප්‍රවේශය අප අපගේ ව්‍යාපාරය කරගෙන යන ආකාරය සහ අපගේ පාර්ශ්වකරුවන්ට වටිනාකමක් ලබා දීම සඳහා පදනම සකසයි. බැංකුව විසින් අත්පත් කරගත් කාර්යසාධනය සහ ස්ථාවරත්වය පෙන්නුම් කරන්නේ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා කාර්යසාධනය සහ සමාජීය අවශ්‍යතා සමඟ පෙළගැස්වීම මත තබා ඇති වටිනාකමයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පාලනය, මූල්‍ය ස්ථායීතාවය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ වැඩි අධීක්ෂණයක් සිදු කරමින් සියලුම පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දීම සඳහා කටයුතු කළේය. සාධාරණත්වය, විනිවිදභාවය, ස්වාධීනත්වය යන මූලධර්ම මඟින් මෙහෙයවනු ලබන ආයතනික යහපාලන රාමුව ශක්තිමත් කිරීමට සහ වගවීමට අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය පළපුරුදු වෘත්තිකයින්ගෙන් සහ විවිධත්වයෙන් සමන්විත වේ.

අපි ඉහළම ස්ථරයේ සිට ඉදිරිපෙළ දක්වා බැංකුව පුරා අඛණ්ඩතාව, වෘත්තීයභාවය සහ සදාචාරාත්මක හැසිරීම් සංස්කෘතියක් පෝෂණය කිරීමට උත්සාහ කරමු. අපගේ සේවකයන් අපගේ ප්‍රධානතම වත්කම වන අතර, අවංකව, කඩිසරව සහ සියලු පාර්ශ්වකරුවන්ට ගෞරවයෙන් යුතුව ක්‍රියා කිරීමට අපි ඔවුන්ව බල ගන්වන්නෙමු. අපගේ අභ්‍යන්තර ප්‍රයත්නයන්ට අමතරව, මෙහෙයුම්වල විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා අපි අපගේ කොටස් හිමියා, නියාමකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ නිරතුරුව සම්බන්ධ වෙමු. අපගේ පාලන භාවිතයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සහ අප සේවය කරන ප්‍රජාවන් සමඟ සබඳතා ශක්තිමත් කිරීමට එය උපකාර වන බැවින් ඔවුන්ගේ ප්‍රතිචාර සහ යෝජනාවන් බෙහෙවින් අගය කරනු ලැබේ.

ඉදිරි දැක්ම

අනාගතය දෙස බලන විට, බැංකුව සිය ආචාරධර්ම වලට අනුකූලව ආයතනික පාලනයේ සහ සදාචාරාත්මක හැසිරීම්වල ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට කැපවී සිටී. විකාශනය වන නියාමන අවශ්‍යතා සහ හොඳම භාවිතයන්ට අනුවර්තනය වීමට අපි අපගේ පාලන රාමුව සමාලෝචනය කර අවශ්‍ය සංශෝධනයන් කරමින් විශිෂ්ට ආයතනික පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කරන බව සහතික කරමු.

ලංකා බැංකුව වෙත මඟ පෙන්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටින අතර ඩිජිටල්කරණ අභිලාෂයන් තම ගනුදෙනුකරුවන්ට නවීනතම බැංකු විසඳුම් ලබා දීමට අපේක්ෂා කරයි.

මෙම වාර්තාව සහ 353-389 පිටුවල ඇති අනුකූලතා ඇමුණුම් මඟින් ප්‍රායෝගිකව පරිපාලනය සඳහා බැංකුවේ ප්‍රවේශය සහ ආයතනික යහපාලන රෙගුලාසි සහ හොඳම භාවිතයන් සමඟ අඛණ්ඩව අනුකූල වීම පෙන්නුම් කරයි. ආයතනික යහපාලනයේ මූලධර්ම ලංකා බැංකුව හරහා හොඳින් ඒකාබද්ධ වී ඇති බවත් බැංකුවේ සියලුම අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි මෙන්ම සදාචාරාත්මක ව්‍යාපාරික හැසිරීම් සඳහා බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව තම යුතුකම් සහ වගකීම් ඉටු කර ඇති බවත් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

කාවන් රත්නායක
සභාපති

2024 මාර්තු 14
කොළඹ දීය.

ආයතනික යහපාලනය


යහපාලනය සඳහා අපගේ ප්‍රවේශය

GRI 2-9

ආයතනික යහපාලනය සඳහා අපගේ කැපවීම අපගේ පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දීමේ අපගේ මෙහෙවරට අත්‍යාවශ්‍ය වේ. ආයතනික වටිනාකම්, කීර්තිය සහ වත්කම් ආරක්ෂා කරමින් බැංකුවේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනික පාලන රාමුව සහාය වන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරන අතර විකාශනය වන රෙගුලාසි සහ හොඳම භාවිතයන්ට අනුකූල වන පරිදි මෙය නිතිපතා සමාලෝචනය කර යාවත්කාලීන කරයි. ලංකා බැංකුව, අනිවාර්ය නියාමන අනුකූලතාවයෙන් ඔබ්බට ගොස් ව්‍යාපාරයේ සියලුම ක්ෂේත්‍ර හරහා අනුකූලතා භාවිතයන් පුළුල් කරන අතර, වගකිවයුතු ආයතනික හැසිරීම් ප්‍රවර්ධනය කිරීම, මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීම, විවිධ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සැලකිල්ලට ගැනීම සහ අවසානයේ තිරසාර කාර්යසාධනයක් උදෙසා බැංකුව යොමු කිරීම වෙත දැඩි අවධානය යොමු කරනු ලැබේ.

යහපාලනය සඳහා අපගේ ප්‍රවේශය බැංකුවේ ආයතනික යහපාලන රාමුවේ ප්‍රධාන අංග හතර හරහා පිළිබිඹු වේ: පුද්ගලයන්, ක්‍රියාවලි, සහ කාර්යසාධනය.

යහපාලන රාමුව සහ ව්‍යුහය



සමබර පාලන ව්‍යුහයක් පවත්වා ගැනීම



අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විවිධ කුසලතා, අත්දැකීම් සහ ප්‍රවීණත්වයේ සම්මිශ්‍රණයක් ගෙන එන අධ්‍යක්ෂවරුන් හය දෙනෙකුගෙන් සමන්විත වේ.

අධ්‍යක්ෂවරුන් හය දෙනාම විධායක නොවන වන අතර ඔවුන්ගෙන් පස් දෙනෙකු ස්වාධීන වේ. මුදල් විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙකු අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලතල දරන තනතුරක් දරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය ආඥා පනතෙහි ස්ථාපිත කර ඇති අතර, රාජ්‍ය බැංකු සම්බන්ධයෙන් වගකිව යුතු අදාළ අමාත්‍යවරයා අධ්‍යක්ෂවරුන් පත් කරයි.

දක්ෂ ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායමක් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දක්වන අතර, ඔවුන්ගේ විශේෂඥභාවය බැංකුවේ උපායමාර්ගයන් ඉටු කිරීමට ඇති හැකියාව තහවුරු කරයි.

ස්වාධීනත්වය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති මාර්ගෝපදේශ වලට අනුව අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය තක්සේරු කරයි. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයට බලපෑම් කිරීමට හෝ බලපෑම් කිරීමට ඉඩ ඇති සබඳතා හෝ තත්ත්වයන් නොමැති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.

කාර්යභාරය සහ වගකීම්

GRI 2-11 | 2-12

බැංකුවේ ඉහළම යහපාලන ආයතනය ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික සහ ව්‍යාවසායක නායකත්වය සපයන අතර, ලංකා බැංකුවේ හි උපායමාර්ගික දැක්ම සහ යහපාලන මූලධර්ම සමඟ සමපාත වීමට සුදුසු අගයන් සහ ප්‍රමිතීන් සකස් කරයි. මේ හැර, ව්‍යාපාරයේ ප්‍රධාන අංගයන් නිසි ලෙස පාලනය කිරීම සහ අවධානය සඳහා වගකිව යුතු ප්‍රධාන අධිකාරිය ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය පවතී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලිව දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය හරහා ඔවුන්ගේ කාර්යභාරය සහ වගකීම් ඵලදායී ලෙස වෙන් කිරීම සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි. මහා කළමනාකරු/ සාමාන්‍යාධිකාරී විධායක නායකත්ව කණ්ඩායමට නායකත්වය දෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල තනතුරක් දරන්නේ නැත. මෙමගින්, තමන් වෙත පැවරෙන කාර්යභාරය සහ ඵලදායී තීරණ ගැනීම පැහැදිලිව වෙන් කර දක්වයි. මීට අමතරව, තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී කිසිදු අධ්‍යක්ෂවරයෙකුට අසීමිත බලයක් නොමැත.

සභාපතිවරයාගේ භූමිකාව


- අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දීම.
- යහපාලන පිළිවෙත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සහ විශ්වාසනීයත්වය පවත්වා ගැනීම.
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ විවිධ අදහස් සහ යෝජනාවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඉදිරිපත් වන බවට කටයුතු සැලසීම සහ සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය සහතික කිරීම.
- අදාළ වන සියලුම නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සහතික කිරීම.
- කොටස් හිමියාගේ විශේෂිත අවධානයට ලක්වන කරුණු නිසි ලෙස සැලකිල්ලට භාජනය වන බව සහතික කිරීම.

මහා කළමනාකරුගේ භූමිකාව

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇති මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්කවලට අනුකූලව බැංකුවේ උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති උපායමාර්ගික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම.
- බැංකුවේ කටයුතුවල කාර්යසාධනය අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- බැංකුවේ ව්‍යාපාරයට බලපානු ලබන අවදානම් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා අභ්‍යන්තර පාලන සහ විගණන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය සඳහා අනුප්‍රාප්තික සැලැස්ම සංවර්ධනය කිරීම.
- බැංකුවේ වටිනාකම් මත පදනම් වූ සංස්කෘතියක් ගොඩනැගීම.

විවිධ කුසලතා සහ අත්දැකීම් වල ශක්තිමත් දායකත්වය

සංඛ්‍යාව



ආයතනික යහපාලනය

අධිකාරී බලය පැවරීම

GRI 2-13

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වෙත බලය පැවරීම, අධ්‍යක්ෂ මණ්ඩලයට සිය තීරණ ගැනීම සඳහා වෙන් කර ඇති කරුණු සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන් කිරීමට ඉඩ ලබා දෙන අතරම, පැවරී ඇති කරුණු සවිස්තරාත්මක අවධානයට ලක්වන බව සහතික කරයි. තනි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ විශේෂිත විශේෂඥතාවයෙන් ප්‍රයෝජන ගැනීමට ද එය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉඩ සලසයි. උපකමිටු පාලනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත නියෝග සහ නියමයන් මගිනි. සෑම කමිටුවකම සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඔවුන්ගේ කාර්යන් සහ නිර්දේශ පිළිබඳව වාර්තා කරන අතර, මේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. බැංකුවේ එදිනෙදා කළමනාකාරිත්වය මහා කළමනාකරු/සාමාන්‍යාධිකාරී විසින් මෙහෙයවනු ලබන ආයතනික කළමනාකරණ කණ්ඩායම වෙත පවරා ඇත. මීට අමතරව, බැංකුව විසින් පැහැදිලිව නිර්වචනය කරන ලද නියෝග සහ වගකීම් සහිත විධායක මට්ටමේ කමිටු කිහිපයක් පිහිටුවා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුව	අධීක්ෂණ පරාසය
විගණන කමිටුව (122 සහ 123 පිටුවල කමිටු වාර්තාව)	• අභ්‍යන්තර හා බාහිර විගණනය • අභ්‍යන්තර පාලන • මූල්‍ය වාර්තාකරණය සහ අනුකූල වීම
මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (පිටු 126 සහ 127 පිටුවල කමිටු වාර්තාව)	• වැටුප් ප්‍රතිපත්තිය • මානව සම්පත් ප්‍රතිපත්තිය • ප්‍රධාන කළමනාකාරිත්වය සඳහා අරමුණු සහ ඉලක්ක • කාර්යසාධනය ඇගයීම
නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව (පිටු 128 සහ 129 පිටුවල කමිටු වාර්තාව)	• ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය තක්සේරු කිරීම • ආචාරධර්ම සංග්‍රහය • අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ එහි උපකමිටුවල කාර්යක්ෂමතාව • ආයතනික යහපාලනය
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (124 සහ 125 පිටුවල කමිටු වාර්තාව)	• ණය, වෙළඳපළ, මෙහෙයුම්, ද්‍රවශීලතාව, සයිබර්/ තොරතුරු තාක්ෂණ, උපායමාර්ගික අවදානම් සහ ESG අවදානම ඇතුළු අවදානම් කළමනාකරණය • නීති සහ රෙගුලාසි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට අනුකූල වීම සහතික කිරීම
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව (130 සහ 131 පිටුවල කමිටු වාර්තාව)	• තොරතුරු තාක්ෂණ නිෂ්පාදන, සේවා, ප්‍රතිපත්ති, භාවිතයන් සහ යටිතල පහසුකම් සඳහා අධීක්ෂණ වගකීම

විධායක කමිටු

වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)	ආයතනික කළමනාකරණ කමිටුව	අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රාමාණත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) සහ ප්‍රතිසාධන සැලැස්ම (PCP)	ශිෂ්‍යත්ව වැඩසටහන් කමිටුව
ශාඛා අංශය ණය කමිටුව	ආයතනික උපායමාර්ග සමාලෝචන කමිටුව	ආයෝජන කමිටුව	tvBOC මෙහෙයුම් කමිටුව
ව්‍යාපාර අඛණ්ඩතා සම්බන්ධීකරණ කමිටුව	ණය කමිටුව	තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව	තිරසාර කමිටුව
ව්‍යාපාර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ කමිටුව	හානි තක්සේරු සහ ප්‍රතිසංස්කරණ කමිටුව (DARC)	අලෙවිකරණ කමිටුව	තාක්ෂණික හා මෙහෙයුම් කමිටුව
ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ මෙහෙයුම් කමිටුව (BCMSC)	විදේශ මුදල් ගෙවීමේ ප්‍රවාහ කළමනාකරණ කමිටුව	අක්‍රීය වත්කම් සමාලෝචන කමිටුව	tvBOC හි කෘත්‍යාධිකාරී මණ්ඩලය
මෙහෙයුම් පාඩු සම්බන්ධයෙන් කටයුතු කරන කමිටුව	වංචා අවදානම් කළමනාකරණ කමිටුව	මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව	
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සඳහා කමිටුව	මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව (HRPC)	ත්‍යාග සහ පිළිගැනීමේ ප්‍රතිපත්ති කමිටුව (RRPC)	
ආයතනික තොරතුරු ආරක්ෂණ කමිටුව	නිෂ්ක්‍රීය වත්කම් කමිටුව	ශිෂ්‍යත්ව වැඩසටහන් තෝරාගැනීම කමිටුව (සමාලෝචන කමිටුව)	

සමාගම් ලේකම්

සමාගම් ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් සෑම විටම බැංකුව තුළ යහපාලන පිළිවෙත් පවත්වාගෙන යන බව සහතික කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටිවලට අදාළ කරුණු සහ අදාළ නීති සහ රෙගුලාසි පිළිබඳ ඕනෑම පැහැදිලි කිරීමක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් සඳහා ප්‍රවේශය ඇත.

- බැංකුවේ ආයතනික යහපාලන රාමුව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.
- අදාළ නීති රීති සහ රෙගුලාසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි අනුගමනය කරන බව සහතික කරයි.
- නැගී එන හොඳම භාවිතයන්, නියාමන වෙනස්කම් සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් බැංකුවේ පාලන රාමුව නිතිපතා සමාලෝචනය කරයි.
- සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රය සැකසීම.

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය ලෙස කටයුතු කරන අතර බැංකු පනතේ අවශ්‍යතා සහ අදාළ සංශෝධන වලට අනුව පත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීන කිරීම

GRI 2-10

නව පත්වීම්, විශ්‍රාම ගැන්වීම් සහ ඉල්ලා අස්වීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය වරින් වර යාවත්කාලීන වේ. අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීන කිරීම මඟින් නව කුසලතා, තීක්ෂණ බුද්ධිය සහ ඉදිරි දර්ශන සහිත සාමාජිකයින් හඳුන්වා දීමට ඉඩ සලසයි. එමෙන්ම ක්ෂේත්‍ර පිළිබඳ වටිනා දැනුම රඳවා තබා ගනිමින් අඛණ්ඩතාව පවත්වා ගනී.

පත්වීම	විශ්‍රාම ගැනීම/ඉල්ලා අස්වීම
• අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් සිදු කරනු ලබන්නේ රාජ්‍ය බැංකුවලට වගකිව යුතු අමාත්‍යවරයා විසිනි. බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්තියට අනුව සුදුසුකම් සහ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායක සත්‍යාපනය කළ පසු, නව පත්වීම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය අපේක්ෂා කෙරේ. 2021 අංක 19 දරණ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) නව පනත යටතේ, නව අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම් සඳහා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ද සිය කැමැත්ත ලබා දෙයි.	අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් ඉල්ලා අස්වීම් හෝ ඉවත් කිරීම ද එම අමාත්‍යවරයාගේ අවධානයට යොමු කරනු ලබන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව, විනිමය ආරක්ෂක කොමිෂන් සභාව, සහ කොළඹ කොටස් හුවමාරුව (CSE) වෙත අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් යම් වෙනස්කම් පිළිබඳව දැනුවත් කරනු ලැබේ.
2023 තුළ පත්වීම්	**2023 දී ඉල්ලා අස්වීම්**
• නරේෂ් අබේසේකර මහතා • මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ	• ඒ සී මහිල්ක ප්‍රනාන්දු මහතා • හර්ෂ විජයවර්ධන මහතා
2024 තුළ පත්වීම්	**2024 දී ඉල්ලා අස්වීම්**
• කාවන් රත්නායක මහතා • පෙහාන් ස්මයිල් මහතා • ජයමින් පැල්පොල මහතා	• ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතා • මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.සේ.වී

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

GRI 2-15

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන අතර එය සෑම වසරකම සමාලෝචනය කෙරේ. සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදීම පරිචයක් ලෙස, වෙනත් ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩලයකට හෝ ආයතනයකට කොන්ත්‍රාත්තු/නව පත්වීම් පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් ප්‍රකාශ කළ යුතුය. අධ්‍යක්ෂවරුන් සාකච්ඡාවලට සහභාගී වීමේදී ඔවුන්ගේ මතය ප්‍රකාශ කිරීමෙන් හෝ අනුමත කිරීම් වලින් හෝ වැළකී සිටිති.

රැස්වීම් සහ සහභාගීවීම

අධ්‍යක්ෂ මණ්ඩලය තම රාජකාරී ඉටු කිරීමට සහ අවදානම් කළමනාකරණය සඳහා උපායමාර්ගික දිශාව සහ ප්‍රවේශය නිර්ක්ෂණය කිරීමට එහි රැස්වීම් භාවිතා කරයි.

කාල පරාසය

- සෑම වසරකම ආරම්භයේදී, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ උපකමිටු රැස්වීම් සඳහා දින දර්ශනය සකසා ඇති අතර එය අධ්‍යක්ෂවරුන්ට දැනුම් දෙනු ලැබේ.

න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා

- සභාපතිවරයා විසින් පවරන ලද අධිකාරී බලය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් න්‍යාය පත්‍රය සකසයි.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කිරීම සඳහා න්‍යාය පත්‍රයට යෝජනා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට නිදහස තිබේ.
- අභ්‍යන්තර/බාහිර වර්ධනයන්ගෙන් පැන නඟින කරුණු න්‍යාය පත්‍රයට එකතු කළ හැක.

දැණුවත් කිරීම්

- දැණුවත් කිරීම් සාකච්ඡා කළ යුතු කරුණු සමාලෝචනය කිරීමට සහ අවශ්‍යය නම් අමතර පැහැදිලි කිරීම් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීම සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සකස් කර අධ්‍යක්ෂවරුන් වෙත ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යක් ඔස්සේ බෙදා හරිනු ලැබේ.

රැස්වීම්

- කාර්යසාධන පිළිබඳව සහ, පාලන කටයුතු සහ අවදානම් වාර්තා ඇතුළුව උපකමිටුවල නිර්දේශ සාකච්ඡාවන්.
- අවශ්‍යය නම් අමතර පැහැදිලි කිරීම් සැපයීම සඳහා කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින්ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ආරාධනා කරනු ලැබේ.

රැස්වීමෙන් පසු

- අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් වාර්තාව සකස් කර, රැස්වීමෙන් දින 10 ක් ඇතුළත ආරක්ෂිත විද්‍යුත් මාර්ගයකින් අධ්‍යක්ෂවරුන් අතර සංසරණය කරයි.
- රැස්වීමෙන් පසු දින ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම වෙත කෙටුම්පත් වාර්තාව බෙදා හරිනු ලැබේ.
- පසුව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පෙර රැස්වීමේ වාර්තාව සම්මත කරනු ලැබේ.
- කැපී පෙනෙන කරුණු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කෙරේ.

ආයතනික යහපාලනය

2023 තුළ අධ්‍යක්ෂ මණ්ඩල සහ උපකමිටු රැස්වීම්වල සහභාගීත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය තුළ රැස්වීම් 22 ක් පවත්වා ඇති අතර මෙම රැස්වීම් වලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පහත දැක්වේ.

අධ්‍යක්ෂවරයාගේ නම	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	විගණන කමිටු රැස්වීම්	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම්	නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටු රැස්වීම්	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්	තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද කමිටු රැස්වීම්
ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතා						
සභාපති	22/22	-	-	-	3/7	-
ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා						
නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ	22/22	12/13	2/2	10/10	7/7	12/12
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී ඒ චන්ද්‍රසිරි වී.සේ.වී						
විධායක-නොවන අධ්‍යක්ෂ	20/22	9/13	2/2	10/10	4/7	11/12
මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ						
විධායක-නොවන අධ්‍යක්ෂ[1]	17/17	-	1/1	6/6	-	12/12
නරේෂ් අබේසේකර මහතා						
විධායක-නොවන අධ්‍යක්ෂ[2]	16/16	8/8	-	-	3/3	12/12
ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා						
විධායක-නොවන අධ්‍යක්ෂ[3]	6/6	5/5	1/1	4/4	-	-

1. 2023 03 31 වන දින පත්කරන ලදී 2. 2023 05 04 වන දින පත්කරන ලදී 3. 2023 04 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය.

අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම සහ පුහුණුව

අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම නව සාමාජිකයෙකුගේම අවශ්‍යතා, කුසලතා සහ පළපුරුද්දට ගැලපෙන පරිදි අපගේ හඳුන්වාදීමේ වැඩසටහන සකස් කර ඇත. මෙම වැඩසටහන මගින් නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ඔවුන්ගේ ව්‍යාවස්ථාපිත රාජකාරි ඉටු කිරීමේදී සහය දීමේ වැදගත්කම හඳුනා ගනිමින්, බැංකුවේ උපායමාර්ග අවබෝධ කර ගනිමින්, සහ බැංකුවේ එදිනෙදා මෙහෙයුම්වල තීරණ ගන්නන් සහ ප්‍රධානීන් සම්බන්ධ කරගනිමින් බැංකුවේ අධ්‍යක්ෂකවරයකු ලෙස ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳ නිසි අවබෝධයක් ලබා දෙයි.

ආරක්ෂක දැනුවත් කිරීමේ ලේඛන

බැංකුවේ දළ විශ්ලේෂණයක්, පාලන රාමු නියාමන රාමු, පිළිබඳ විස්තර සහ ආයතනික කළමනාකරණ කණ්ඩායම සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකාරක රාමුව පිළිබඳ විස්තර මෙහි ඇතුළත් වේ.

ඉදිරිපත් කිරීම්

මහා කළමනාකාරතුමා විසින් බැංකුවේ ඉතිහාසය, ව්‍යාපාර ආකෘතිය, ආයතනික ව්‍යුහය, ව්‍යාපාර සිරස්තල සහ උපකාරක කාර්යයන් විස්තර කෙරේ.

රැස්වීම්

අවශ්‍යය පරිදි හෝ ඉල්ලීම මත රැස්වීම් සහ දෙපාර්තමේන්තු නිරීක්ෂණයන් සැලසුම් කර ඇත.

ආරම්භක දැනුවත් කිරීමෙන් පසුව, අදාළ නීති වෙනස් කිරීම ඇතුළු විවිධ මාතෘකා පිළිබඳ සවිස්තරාත්මක යාවත්කාලීන කිරීම් සහ පුහුණුව ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන් දිරිමත් කරනු ලැබේ.

රෙගුලාසි, ප්‍රතිති සහ විවිධ නීති වල වෙනස්කම් සහ මෙහෙයුම් මතින් නැඟී එන ප්‍රවණතා, පිළිබඳව ඔවුන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමට පහසුකම් සලසන අතර ඔවුන්ගේ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය සහය ලබාදේ. වසර තුළදී, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය මූල්‍යකරණයට එරෙහි වීම (AML/CFT) පිළිබඳ පුහුණුවකට අධ්‍යක්ෂවරු සහභාගි වූහ.

තවද බැංකුවේ පිරිවැය මත ස්වාධීන වෘත්තීය උපදේශනය උදෙසා බාහිර විශේෂඥයන් වෙතින් අවශ්‍ය උපදේශන සේවා ලබා ගැනීමේ අවස්ථාව සලසා දෙනු ලැබේ.

ක්‍රියාවලි - ඵලදායී පාලන ක්‍රමවේදයන්

ප්‍රතිපත්ති රාමුව

GRI 2-23 | 2-24

ලංකා බැංකුවෙහි, අපගේ ක්‍රියාකාරකම් පාලනය කරන, අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් මෙහෙයවන සහ අපගේ උපායමාර්ගික අරමුණු, නියාමන අවශ්‍යතා සහ සදාචාරාත්මක ප්‍රමිතීන් සමඟ පෙළගැස්වීම සහතික කරන ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවකට අනුකූලව ක්‍රියා කිරීමට අපි කැපවී සිටිමු. අපගේ ප්‍රතිපත්ති රාමුව අවදානම් කළමනාකරණය, පුද්ගල කළමනාකරණය, තොරතුරු තාක්ෂණ පාලනය සහ තිරසාර කළමනාකරණය ඇතුළු අපගේ මෙහෙයුම්වල විවිධ ක්ෂේත්‍ර ආවරණය කරයි. වෙනස්වන අභ්‍යන්තර සහ බාහිර සාධක සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා වූ රාමුව නිතිපතා සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබේ.

සියලුම සේවකයින්ට සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන්ට පහසුවෙන් යොමු කළ හැකි බව සහතික කරමින්, ප්‍රතිපත්ති පැහැදිලි ආකාරයකින් ලේඛනගත කර ඇත.

අවශ්‍ය විටෙක ප්‍රතිපත්ති වලට සහ ප්‍රතිපත්තිමය කැපවීම් හඳුන්වා දීමට සහ පැහැදිලි කිරීමට ඵලදායී සන්නිවේදන මාර්ග භාවිත කෙරේ.

පහත දැක්වෙන්නේ අපගේ මෙහෙයුම්වල පදනම වන ප්‍රධාන ප්‍රතිපත්ති පිළිබඳ දළ විශ්ලේෂණයකි.

අවදානම් කළමනාකරණය

- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- රටේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ICAAP ප්‍රතිපත්තිය (අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රාමාණත්මකතා තක්සේරු ක්‍රියාවලිය)
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- වංචා අවදානම් කළමනාකරණ

තොරතුරු තාක්ෂණ කළමනාකරණය

- විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය
- තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

පුද්ගල කළමනාකරණය

- මානව සම්පත් ප්‍රතිපත්තිය
- පුහුණු හා සංවර්ධන ප්‍රතිපත්තිය
- බඳවා ගැනීමේ පටිපාටිය
- නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තිය
- නික්මන් සම්මුඛ සාකච්ඡා ප්‍රතිපත්තිය
- අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය

තිරසාර කළමනාකරණය

- පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තිය
- යහපාලන ප්‍රතිපත්තිය
- සන්නිවේදන ප්‍රතිපත්තිය
- ගනුදෙනුකාර පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි

අවදානම් අධීක්ෂණය

ශක්තිමත් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් සැකසීම සහ බැංකුවේ අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන රාමු අධීක්ෂණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) සහ විගණන කමිටුව එහි අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. අවදානම් සහ අවස්ථා වාර්තාව (පිටු 132 සිට 148 දක්වා), විගණන කමිටු වාර්තාවෙහි (පිටු 122 සිට 123 දක්වා) සහ IRMC වාර්තාවෙහි (පිටු 124 සිට 125 දක්වා) වසර තුළ අවධානය යොමු කරන ලද ප්‍රධාන ක්ෂේත්‍ර විස්තරාත්මකව දක්වා ඇත.

අවදානම් සම්බන්ධ කාර්යයන්

- බැංකුවේ අවදානම් අභිරුචිය අනුමත කිරීම
- බැංකුව මුහුණ දෙන ප්‍රධාන අවදානම් පිළිබඳව නිතිපතා තක්සේරු කිරීම
- IRMC රැස්වීම් වලදී අවදානම් අභිරුචිය සහ අර්ථ දක්වා ඇති ප්‍රමිතිවලට එරෙහිව කාර්යසාධනය සමාලෝචනය කිරීම
- මෙම අවදානම් ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා අවම කිරීමේ මෙවලම් පවතින බවට සහතික කිරීම

විදේශීය මෙහෙයුම් පාලනය කිරීම

බැංකුව රටවල් තුනක පිහිටි ශාඛා 3 ක් සහ පරිපාලිත සමාගමක් හරහා විතෙර මෙහෙයුම් කටයුතු සිදු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ එම රටවල අදාළ නියාමන අධිකාරීන්ගේ අවසරය යටතේ පිහිටුවන ලද ශාඛා සහ එක්සත් රාජධානියේ පිහිටි පරිපාලිත සමාගමක් මෙයට ඇතුලත් වේ. මෙම ශාඛා අදාළ රටවල බලධාරීන් විසින් අධීක්ෂණය කරනු ලැබේ. සහකාර මහා කළමනාකරුවකු නායකත්වය සපයන වෙනමම අංශයක් යටතේ අධීක්ෂණය කෙරෙන 'විදේශීය ශාඛා ප්‍රඥප්තිය' හරහා විදේශීය ශාඛා පාලනය වේ.

විදේශීය ශාඛා ඒකකය කාර්තුමය වශයෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඔවුන්ගේ කාර්යසාධනය වාර්තා කරන අතර උපායමාර්ගික මට්ටමේ තීරණ සියල්ලමද අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කෙරේ. විතෙර ශාඛා සඳහා ප්‍රධාන විධායක නිලධාරීන් පත්කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියද අදාළ රටේ බලධාරීන්ගේ අනුමැතියද ලබා ගත යුතුය. විශේෂ විගණනය මගින් ලංකා බැංකුවේ ප්‍රධාන කාර්යාලය හරහා අනුකූලතාව, විගණනය සහ කාර්යසාධනය ද නිරීක්ෂණය කරනු ලැබේ. ජාතික විගණන කාර්යාලය බැංකුවේ වාර්ෂික විගණනයට අනුකූලව විගණන ක්‍රියා පටිපාටි මගින් මෙම ශාඛා ආවරණය කරයි.

තවද, ක්‍රියාත්මක වන රටෙහි බාහිර විගණකවරුන් අදාළ රෙගුලාසි වලට අනුව ස්වාධීන විගණන ද සිදු කරයි.

2023 හඳුන්වා දුන් ප්‍රතිපත්ති

- සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය
- අපේක්ෂිත ණය හානි ගණනය කිරීමේ ආකෘති තහවුරු කිරීමේ ප්‍රතිපත්තිය
- විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණක නියුක්ත වීමේ ප්‍රතිපත්තිය

තොරතුරු තාක්ෂණ පාලනය

බැංකුවේ තොරතුරු වත්කම් සහ මෙහෙයුම් පද්ධති ආරක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටින අතර සයිබර් ආරක්ෂණ සහ කළමනාකරණ පද්ධති පුළුල් කිරීම සඳහා අවශ්‍ය ආයෝජන සිදු කරයි. බැංකුවේ තොරතුරු වල ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සහ උපදෙස් ඇතුලත් තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක වේ.

ශක්තිමත් තොරතුරු තාක්ෂණ පාලන ක්‍රියාවලීන් අනුගමනය කිරීමෙන් ලංකා බැංකුව සිය තොරතුරු තාක්ෂණ ආයෝජනවල වටිනාකම ප්‍රශස්ත කිරීම සහ ඩිජිටල්කරණය පදනම් කරගත් තරඟකාරී පරිසරය තුළ තම උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම තහවුරු කරයි. සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු ද පත් කර ඇත. වසර තුළදී, COBIT-2019 රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා මූලික අඩිතාලම දමමින් සහ තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යුහය සඳහා වන ආයෝජන වැඩි කරමින් බැංකුව සිය තොරතුරු තාක්ෂණ පාලන ක්‍රමවේදයන් තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කර ඇත. තවද ප්‍රවේශ පාලන සහ දත්ත හානිවීම වැළැක්වීමේ ක්‍රමවේදයන් ද අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

ආයතනික යහපාලනය

අනුකූලතාවය

GRI 2-27

රෙගුලාසි වලට අනුකූල වීම සඳහා බැංකු පනත සහ කොළඹ කොටස් වෙළඳපලේ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා අනුව ලංකා බැංකුව හට ව්‍යවස්ථාපිත බැඳීමක් ඇති අතර සමූහයට ඒවායේ අදාළත්වය සහ බලපෑම තීරණය කිරීම සඳහා නියාමන වර්ධනයන් කල්තියා අධීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම ද අපේක්ෂා කෙරේ. නීති, රෙගුලාසි සහ කර්මාන්ත ප්‍රමිතීන්හි වෙනස්කම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නිරතුරුව දැනුවත් කරයි. බැංකුවේ අනුකූලතා වගකීම් සහ අවදානම් නිරාවරණය කෙරෙහි ඇති විය හැකි බලපෑම තක්සේරු කිරීම සඳහා බැංකුවේ මෙහෙයුම් වලට බලපෑම් කළ හැකි නියාමන වර්ධනයන් අධීක්ෂණය කරනු ලැබේ. කිසියම් නියාමන උල්ලංඝනයක්, බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග, හෝ නැඟී එන අනුකූලතා ගැටළු ඇතුළුව බැංකුවේ අනුකූලතා තත්ත්වය පිළිබඳ අනුකූලතා ප්‍රධානියා සහ කළමනාකාරිත්වය වෙතින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිරන්තරව වාර්තා ලැබේ.

වැඩි විස්තර සඳහා කරුණාකර මෙම වාර්ෂික වාර්තාවේ පිටු 353 සිට 389 දක්වා බලන්න.

තීරණාත්මක ගැටළු පිළිබඳ සන්නිවේදනය

GRI 2-16 I 2-25

තීරණාත්මක ගැටළු පහත පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සන්නිවේදනය කිරීමට පහසුකම් සැලසීම සඳහා යාන්ත්‍රණ ගණනාවක් ස්ථාපිත කර ඇත.

- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ උපකමිටු රැස්වීම්: තීරණාත්මක ගැටළු අදාළ උපකමිටු හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හෝ මහ කළමනාකරු හරහා ඉදිරිපත් කළ හැක.
- විසිල්-බ්ලෝවිං ප්‍රතිපත්තිය.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්: කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර සම්බන්ධීකාරක ලෙස.

අභිමතාර්ථ - වගවීම, විනිවිදභාවය සහ අවංකභාවය තහවුරු කිරීම

වටිනාකම් මූලික සංස්කෘතිය

GRI 2-25

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වටිනාකම් පදනම් කරගත් සංස්කෘතියක් ගොඩනැඟීම සහ පවත්වා ගෙනයාම සඳහා බැංකුවේ ඉහළම තලයේ සිට අවසන් ස්ථරය දක්වා සියළුම සේවක සේවිකාවන් විසින් නීති රීති වලට අනුගතව, සමානාත්මතාවයෙන් සහ එකමුතු කමින් කටයුතු කරන බව සහතික කරගැනීමට විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරයි.

රැස්වීම්, අභ්‍යන්තර සන්නිවේදනය සහ පුහුණු සැසි හරහා සෑම සේවක ස්ථරයකටම බැංකුවේ මූලික ව්‍යාපාර අගයන් සන්නිවේදනය කරයි.

කාර්යසාධන කළමනාකරණය, බඳවා ගැනීම් සහ පූර්ව හැඳින්වීමේ වැඩසටහන් වැනි ව්‍යාපාරික ක්‍රියාවලීන් සහ සේවකයින්ගෙන් අපේක්ෂා කරන වගකීම් සහ සදාචාරාත්මක හැසිරීම් සඳහා පොළඹවන සංස්කෘතියක් පවත්වාගෙන යාමට ක්‍රමවේදයන් පහසුකම් සපයයි.

චර්යාධර්ම සංග්‍රහය සහ ආචාරධර්ම

- **අධ්‍යක්ෂවරුන්ගේ ආචාරධර්ම සංග්‍රහය**

  අධ්‍යක්ෂ මණ්ඩලය ව්‍යාපාර චර්යා සංග්‍රහය සහ ආචාරධර්ම මඟින් බැඳී සිටින අතර ඒවායේ අනුකූලතාව පිළිබඳ වාර්ෂික තහවුරු කිරීමක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. චර්යාධර්ම සංග්‍රහය විධිවිධාන සමඟ බැංකුවේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට අධ්‍යක්ෂවරුන් දිරිමත් කරන අතරම අබණ්ඩතාව, විනිවිදභාවය සහ දූෂණ විරෝධී ශක්තිමත් සංස්කෘතියක් ප්‍රචාරය කිරීම මෙම සංග්‍රහයේ අරමුණයි.

- **සේවක ආචාරධර්ම සංග්‍රහය**

  මෙය සියලුම සේවකයන්ට අදාළ වන අතර අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමඟ ගනුදෙනු කිරීම, හැසිරීම් සහ යහපත් චර්යාව, අල්ලස් සහ දූෂණ වැලැක්වීම යන ආදී වැදගත් කරුණු පිළිබඳව පැහැදිලිව දක්වා ඇත.

විසිල්-බ්ලෝවිං ප්‍රතිපත්තිය

අරමුණ	සන්නිවේදනය	පරීක්ෂණ
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විසිල්-බ්ලෝවිං ප්‍රතිපත්තියක් මඟින් රහස්‍යභාවය පිළිබඳ සහතිකයක් ලබා දෙමින් සැකකටයුතු සොරකම්, වංචා, දූෂණ, බැංකුවේ වත්කම් අවභාවිතය හෝ සදාචාර විරෝධී හෝ නීති විරෝධී යැයි සැලකෙන වෙනත් ක්‍රියා සම්බන්ධයෙන් පැමිණිලි වාර්තා කිරීමට අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් දිරිමත් කරයි.	ඕනෑම පාර්ශ්වකරුවෙකුට තැපැල්, විද්‍යුත් තැපෑල, දුරකථන, ෆැක්ස්, වෙබ් අඩවි, ඇමතුම් මධ්‍යස්ථානය හෝ මුහුණු පොත වැනි සමාජ මාධ්‍යය හරහා පුද්ගලිකව තම ගැටළු/පැමිණිලි ප්‍රකාශ කළ හැකිය. පැමිණිලි යොමු කරනු ලබන්නේ සහ අධීක්ෂණය කරනු ලබන්නේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වන අතර නියෝජ්‍ය මහා කළමනාකාර ශ්‍රේණියේ හෝ ඊට ඉහළ මට්ටමේ සේවකයින්ට එරෙහිව කරන ලද පැමිණිලි විගණන කමිටුවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබේ.	• අදාළ අධිකාරිය පැමිණිලිකරු විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව ලැබුණු පැමිණිල්ලේ මූලික සමාලෝචනයක් සිදු කරන අතර අවශ්‍ය නම් අමතර තොරතුරු ඉල්ලා සිටී. • මූලික ඇගයීම් කටයුතු සිදු කිරීමෙන් පසු හැකි ඉක්මනින් ගැටලුව විසඳීමට කටයුතු කර වැඩිදුර විමර්ශනයක් අවශ්‍ය නම් පැමිණිලිකරුට දැනුම් දෙනු ලැබේ. • පැමිණිල්ල දින 21 ක් ඇතුළත විසඳිය යුතුය.

දූෂණ විරෝධී පිලිවෙත්

බැංකුව අල්ලස සහ දූෂණයෙන් තොර පරිසරයක් උදෙසා කැපවෙන අතර බැංකුව ක්‍රියාත්මක වන ඕනෑම තැනක සිය ව්‍යාපාරික ගනුදෙනු සහ සබඳතා වලදී වෘත්තීමය වශයෙන් සාධාරණව සහ අවංකව ක්‍රියා කිරීමට කැපවී සිටී. දූෂණ විරෝධී සහ අල්ලස් සම්බන්ධයෙන් බැංකුවේ ප්‍රතිපත්තිය බඳවා ගැනීමේ වැඩසටහන් අතරතුර සියලුම සේවකයින්ට පැහැදිලිව දැනුම් දෙනු ලබන අතර නිතිපතා පුහුණුවීම් සහ දැනුවත් කිරීමේ සැසි මඟින් යාවත්කාලීන කරනු ලැබේ.

අනුකූල නොවූ අවස්ථා

දණ්ඩනය නියම කළ දිනය	ගෙවීම් කළ දිනය	දණ්ඩන වර්ගය	දණ්ඩනයට හේතුව	මුදල රු.	දඩ මුදල පැනවීමට හේතු වූ අනුකූල නොවූ නීතිය
07.11.2023	21.11.2023	පරිපාලන	දේශපාලනික වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් කිහිප දෙනෙකු සමඟ ව්‍යාපාරික සබඳතා වලට එළඹීමේදී පූර්ව අනුමැතිය ලබා නොගැනීම.	6,000,000.00	2016 ජනවාරි 27 දිනැති අංක 1951/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2016 අංක 1 දරණ මූල්‍ය ආයතනවල (ගනුදෙනුකරුවන් විශ්ලේෂණ) රීති 59.
			මූල්‍ය සම්බාධක වලට නියමිත කාලයේදී අනුකූල නොවීම		2012 අංක 1 දරණ චක්සත් ජාතීන්ගේ රෙගුලාසි වල 4(7) වන රෙගුලාසිය

- සමාලෝචිත වර්ෂය තුළ දී වංචා, ඇතුළාන්ත ගනුදෙනු, විශ්වාස-විරෝධී, පිළිගත නොහැකි තරඟකාරීත්වය, වෙළඳපළ හැසිරවීම, අක්‍රමිකතා, හෝ වෙනත් අදාළ මූල්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස මුදල් අලාභයක් සිදු නොවීය. ක්‍රියාකාරී පියවරක් ලෙස, 2006 අංක 06 (FTRA) දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති දේශපාලනික වශයෙන් නිරාවරණය වූ පුද්ගලයන් (PEPs) සම්බන්ධ මාර්ගෝපදේශ පිළිපැදීම සහතික කිරීම සඳහා පද්ධති පාලන සහ අධීක්ෂණ ක්‍රියාවලීන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

- නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම සහතික කිරීම, පරීක්ෂා කිරීමට සහ වහාම අනුමත කිරීම සඳහා පද්ධති විශේෂාංග සහ පාලනයන් වැඩිදියුණු කර ඇත. PEPs හා සම්බන්ධ විය හැකි අවදානම් අවබෝධ කර ගැනීමට, තක්සේරු කිරීමට සහ හැසිරවීමට අවශ්‍ය නිසි දැනුවත්භාවයෙන් සහ කුසලතාවයෙන් කාර්ය මණ්ඩලය සන්නද්ධ කිරීම සඳහා විශේෂ පුහුණුවීම් හා දැනුවත් කිරීම් දියුණු කරන ලදී.

වගකිවයුතු ආයතනික පුරවැසිභාවය

බැංකුවේ උපායමාර්ගික දිශානතිය අනුමත කිරීම සහ එය මූලධර්ම සමඟ සමපාත වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

වගකිවයුතු ආයතනික පුරවැසිභාවය, උපායමාර්ගික තීරණවල පාරිසරික, සමාජීය සහ යහපාලන (ESG) ඇඟවුම් සලකා බැලීම සහ විවිධ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සමතුලිත කිරීම මෙයට ඇතුළත් වේ. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම මහා කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් යුත් තිරසාර කමිටුවකට පැවරෙන අතර, තිරසාරත්වයට අදාළ සියලු කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය සපයයි. ESG ආශ්‍රිත ඉලක්ක සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරිත්වය වගකීම දරයි.

තිරසාර කමිටුවේ වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ.

- බැංකුවේ තිරසාරභාවය (ESG) සම්බන්ධ තීරණය ගැනීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාරභාවය සම්බන්ධ පෙර දැක්මේ අනුකූලතාවය සඳහා පරීක්ෂා කිරීම.
- තිරසාරභාවය සම්බන්ධ ව්‍යාපෘති අනුමත කිරීම.
- ණය පහසුකම් සඳහා A කාණ්ඩයේ ESMS අනුකූලතා සඳහා අනුමැතිය ලබා දීම.
- තිරසාරභාවය සහතික කිරීම, ESG සම්මත අනුකූලතාව සහ පරිසරය සහ සමාජ අවදානම් සම්බන්ධ තීරණ සඳහා අවසාන පරිපාලන අධිකාරිය.

2023 දී ESG ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

- බැංකුවේ වත්මන් ESG කාර්යසාධනය තක්සේරු කිරීමට, ESG කාර්යසාධනය වැඩි දියුණු කිරීමට සහ ගෝලීය ප්‍රමිතීන් සහ හොඳම භාවිතයන් සමඟ සමපාත වීමට ගැලපෙන උපායමාර්ග සංවර්ධනය කිරීමට ESG උපදේශකයෙකු පත් කිරීම.
- තිරසාර වාර්තාකරණය සඳහා KPMG විගණකවරුන්ගෙන් බාහිර සහතික වාර්තාවක් ලබා ගැනීම.
- කොළඹ කොටස් හුවමාරුව (CSE) විසින් නිකුත් කරන ලද ESG වාර්තාකරණය පිළිබඳ මාර්ගෝපදේශය අනුගමනය කිරීම.

ආයතනික වාර්තාකරණය

ප්‍රකාශනයට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික ඒකාබද්ධ වාර්තාව සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඇතුළු සියලුම බාහිර වාර්තාවන්හි නිරවද්‍යතාවය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළ වගකීමක් දරයි.

විශ්වසනීයත්වය වැඩි දියුණු කරන බැංකුවේ මූල්‍ය හා මූල්‍ය නොවන තත්ත්වය, කාර්යසාධනය සහ අපේක්ෂාවන් පිළිබඳ සම්බර තක්සේරුවක් 05 පිටුවේ දක්වා ඇති අදාළ නීති සහ ස්වේච්ඡාවෙන් සම්මත කරගත් වාර්තාකරණ ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ වලට අනුකූලව මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව මඟින් සපයයි.

ආයතනික යහපාලනය

පාර්ශ්වකරුවන්ගේ සබඳතා

බැංකුවට අදාළ කාරණා සම්බන්ධයෙන් ඔවුන්ගේ උත්සුකයන් සහ ඉදිරි දර්ශන අවබෝධ කර ගැනීම සඳහා කොටස් හිමියන්, සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, ප්‍රජාවන් සහ නියාමකයින් ඇතුළු පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීමේ වැදගත්කම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවබෝධ කර ගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව තීරණ ගන්නා අතර වගකිව යුතු ආයතනික පුරවැසිභාවයට දායක වන ක්‍රියාවලට ප්‍රමුඛත්වය දෙයි. බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී හා අදාළ සන්නිවේදනයක් පවත්වාගෙන යාම සඳහා මාර්ගෝපදේශ සපයන අතර නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ.

49 සිට 52 දක්වා පිටුවල ඇති 'පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් කොටසේ මතු කර ඇති කරුණු සඳහා බැංකුවේ ප්‍රධාන සම්බන්ධ වීමේ යාන්ත්‍රණ සහ ප්‍රතිචාර දක්වා ඇත.

කාර්යසාධනය - යහපාලනය හරහා වටිනාකමක් ඇති කිරීම

වටිනාකම් නිර්මාණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ දායකත්වය

අවධානය යොමු වූ ක්ෂේත්‍ර	
උපායමාර්ගය සහ අරමුණු	බැංකුවේ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. උපායමාර්ගයට විරෙහිව කාර්යසාධනය සඳහා පිටු 57 සිට 60 දක්වා බලන්න. අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල කාර්යයන් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ඉටු කිරීම. අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු රැස්වීම් සහ 2023 දී ඉටු කරන ලද රාජකාරි සඳහා පිටු 114 සිට 116 දක්වා බලන්න. ඉහළ යන පොළී අනුපාත, විදේශීය ඇතුළු ආර්ථික වර්ධනයන්හි විභව බලපෑම් කල්තියා හඳුනා ගැනීම සහ අවම කිරීම විදේශ මුදල් ද්‍රවශීලතා ගැටළු, උද්ධමනය ඉහළ යාම සහ නියාමන වෙනස්කම් ආදී අභියෝග වලට මුහුණ දීම පිළිබඳ පිටු 44 සිට 48 දක්වා බලන්න. ආර්ථිකයේ අවදානමට ලක්විය හැකි අංශ ආරක්ෂා කිරීම සහ පුනර්ජීවනය කිරීම සම්බන්ධ ගැටළු පිළිබඳ නියැලීම සහ සාකච්ඡා. පිටු 84 සිට 97 දක්වා බලන්න.
යහපාලනය, පාලනවිධි සහ අනුකූලතාව	බැංකුවේ ආයතනික යහපාලන ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම. බැංකුවේ යහපාලනය සහ යහපාලන පරිසරය ශක්තිමත් කිරීම සඳහා නව ප්‍රතිපත්ති/ක්‍රමවේද හඳුන්වා දීම. වාර්ෂික අයවැය, ප්‍රධාන ප්‍රාග්ධන වියදම්, මූල්‍ය නියෝජිත පිරිස සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල කාර්යයන් ඇගයීම. නීති, රෙගුලාසි සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම. තීරණ ගැනීමේදී පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගැනීම. වගකීම් සහගත ව්‍යාපාරික පරිචයන් සහ බැංකුවේ තිරසාර න්‍යාය පත්‍රය සඳහා නායකත්වය සැපයීම. දියුණු ආරක්ෂක පද්ධති වල ආයෝජන හරහා තොරතුරු තාක්ෂණ පාලනය ශක්තිමත් කිරීම. ඩිජිටල්කරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
අධීක්ෂණය සහ වාර්තා කිරීම	මූල්‍ය කාර්යසාධන වාර්තා, ප්‍රධාන කාර්යක්ෂමතා දර්ශක සහ ඉලක්ක අයවැය අගයන් හි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම. ප්‍රකාශනය සඳහා අතුරු සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම. මූල්‍ය තොරතුරුවල අඛණ්ඩතාව, අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම.
මානව ප්‍රාග්ධනය රඳවා තබා ගැනීම	ප්‍රධාන කළමනාකරණ පිරිස් කාර්යක්ෂමතා දර්ශක සඳහා අනුප්‍රාප්තික සැලසුම් කිරීම. ඉහළ යන ජීවන වියදම සැලකිල්ලට ගෙන සේවකයින්ගේ මූල්‍ය සුරක්ෂිතතාවයට සහය දැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා. අවශ්‍ය ඩිජිටල් කුසලතා වලින් සමන්විත අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය නිරීක්ෂණය කිරීම

ස්වයං ඇගයීම් යාන්ත්‍රණයක් හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂමතාව තක්සේරු කිරීම සඳහා බැංකුවට ව්‍යුහගත ක්‍රියාවලියක් ඇත. සෑම අධ්‍යක්ෂවරයෙකුම කාර්යසාධන ඇගයුම් පෝරමයක් සම්පූර්ණ කිරීම අවශ්‍ය වන අතර, ඉන් පසුව එවා සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. උපකමිටු විසින් ද එවැනිම ඇගයීමක් සිදු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය, මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් හි (KMP) හි කාර්යසාධනය ඇගයීමට ලක් කරයි.

වේතන

උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක මත පදනම්ව වාර්ෂිකව මානව සම්පත් සහ වේතන උපකමිටුව මෙම ප්‍රයත්නයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අපේක්ෂාවන් පැහැදිලිව හඳුනා ගනිමින් ඒවා සපුරා ගැනීම සහතික කරමින් වසර ආරම්භයේදී මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ අදාල නිර්ණායක එකඟ වේ. තවද මෙහෙයුම් හූ දර්ශනයේ ගතිකත්වය මෙන්ම තක්සේරුකරුගෙන් ලැබෙන ප්‍රතිපෝෂණ ද සැලකිල්ලට ගනී.

අධ්‍යක්ෂ මණ්ඩලය 2023 දී සඵලතාවය තක්සේරු කළ ආකාරය

- අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම සඳහා බැංකුවේ ක්‍රියාවලිය ඉතා සූක්ෂම සහ විස්තීරණ වේ.
- සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යයන් ආවරණය වන පරිදි ඇගයීම් පත්‍රිකාවක් භාවිතා කරමින්, විස්තීරණ ආකෘතියක් හරහා ප්‍රතිචාර එක්රැස් කරනු ලැබේ.
- ප්‍රතිශත ගණනය කිරීම් සහ ඒ සමඟ ඇති අදහස් කාර්යසාධන ක්ෂේත්‍ර පිළිබඳ විනිවිද පෙනෙන අවබෝධයක් සපයයි.

වේතන ප්‍රතිපත්තිය

බැංකුවේ වේතන ප්‍රතිපත්තිය එහි මානව සම්පත් කළමනාකරණ සහ පාලන රාමුවේ තීරණාත්මක අංගයක් වන අතර, බැංකුවේ උපායමාර්ගික අභිලාෂයන් ක්‍රියාත්මක කිරීමට කණ්ඩායමට සම්පත් ඇති බව සහතික කිරීමත්, අගය නිර්මාණය කිරීම සඳහා ඔවුන් දක්වන දායකත්වය සඳහා නිසි පිළිගැනීමක් සහ ත්‍යාග පිරිනැමීමත් මෙහි අරමුණයි. මෙම ප්‍රතිපත්තිය කාර්යසාධනය, වෙළඳපළ තරඟකාරිත්වය, නියාමන අවශ්‍යතා සහ බැංකුවේ උපායමාර්ගික අරමුණු සමඟ පෙළගැස්වීම වැනි විවිධ සාධක සැලකිල්ලට ගනී.

වැටුප් මූලධර්ම

- තරඟකාරී
- සාධාරණ
- විනිවිද පෙනෙන
- ඇතුළත්

වැටුප් ව්‍යුහය

අධ්‍යක්ෂවරුන්ගේ වේතනය තීරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ ලිපිවල තොරතුරු සහ ආඥාපනත් සහ එහි සංශෝධන ඇතුලත් කරමින් සකස් කරන ලද අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් ප්‍රතිපත්තිය මගිනි. ඔහුගේ/ඇයගේ වේතනය තීරණය කිරීමට කිසිදු අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ නොවේ.

මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වන වේතන පදනම් වන්නේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වේතන ප්‍රතිපත්තිය මත ය. මානව සම්පත් හා පාරිශ්‍රමික උපකමිටුව විසින් මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වේතන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන අතර, එය මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අදාළ අමාත්‍යවරයාට යොමු කරන අතර, ඔහු ආඥාපනතේ විධිවිධාන සහ එහි සංශෝධන වලට අනුකූලව අවසාන අනුමැතිය ලබා දෙයි. මහා කළමනාකරුගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් හි වේතනය සෑම වසර තුනකට වරක් සමාලෝචනය කෙරේ.

බැංකුවේ වේතන සංයුතියේ ප්‍රධාන අංග

ස්ථාවර වැටුප්	විචල්‍ය වැටුප්	ප්‍රතිලාභ සහ වරප්‍රසාද
• මූලික වැටුප සහ අනෙකුත් ස්ථාවර සංරචක, භූමිකාව සහ සේවක ශ්‍රේණිය මත තීරණය වේ	• දිරි දීමනා	• පශ්චාත් රැකියා ප්‍රතිලාභ • විශේෂ යෝජනා ක්‍රම යටතේ ණය • වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම

අධ්‍යක්ෂවරුන්ගේ වේතනය පිළිබඳ විස්තර සඳහා 200 පිටුව බලන්න. ප්‍රධාන කළමනාකරණ පිරිස් හි වැටුප් පිළිබඳ විස්තර සඳහා මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ වාර්තාව 126 සහ 127 පිටුවල ඇත.

විගණන කමිටු වාර්තාව

2023 වසර තුළ කමිටුවේ සංයුතිය

1. **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා ***
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **හර්ෂ විජයවර්ධන මහතා****
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
3. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
4. **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

සටහන්:

* 2023.04.21 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.

** 2023.01.13 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.

2023 මැයි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස්වීමෙන් පසු 2023 මැයි 05 දින සිට බලපැවැත්වෙන පරිදි පහත අධ්‍යක්ෂවරුන්ගෙන් විගණන කමිටුව සමන්විත විය.

1. **නරේෂ් අබේසේකර මහතා**
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
3. **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි. *****
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

සටහන්:

*** 2024.01.07 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.

2024 පෙබරවාරි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස්වීමෙන් පසු 2024 පෙබරවාරි 19 දින සිට බලපැවැත්වෙන පරිදි පහත අධ්‍යක්ෂවරුන්ගෙන් විගණන කමිටුව සමන්විත විය.

1. **නරේෂ් අබේසේකර මහතා**
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
3. **මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

කමිටුවේ ලේකම්

ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, නීතිඥවරියක මෙන්ම ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ජානකී වීස් සිරිවර්ධන මහත්මිය කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

අබණ්ඩව සහභාගිවන්නන්

- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ප්‍රධාන අවදානම් නිලධාරී
- ප්‍රධාන මූල්‍ය නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්)
- නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා)
- සහකාර මහා කළමනාකරු (මෙහෙයුම් විගණන)
- සහකාර මහා කළමනාකරු (විමර්ශන)
- සහකාර මහා කළමනාකරු (ණය විගණන)
- සහකාර මහා කළමනාකරු (තොරතුරු පද්ධති විගණන)
- අභ්‍යන්තර විගණක
- විගණකාධිපතිගේ නියෝජිත (බැංකුවේ බාහිර විගණක)

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- මහා කළමනාකරු
- ආයතනික හෝ විධායක කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු හෝ සේවක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු

2023 වර්ෂය තුළ දී කමිටුව රැස්වූ වාර ගණන දහයකි
(සාමාජික සහභාගිත්වය මෙම වාර්තාවේ පිටු අංක 116 හි දක්වා ඇත.)

ගණපූරණය: සාමාජිකයන්

හෝ බහුතර සාමාජිකත්වයෙන් වැඩි අගය.

කමිටුවේ කාර්යභාරය

විගණන කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන විගණන කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත විගණන කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ "ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය" සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග වල අවශ්‍යතා සහ ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ප්‍රධානතම අවධානය

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන හා විෂයානුබද්ධ සමාලෝචනයක් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කාර්යයන් ඉටු කරලීම සඳහා සහය දැක්වීම කෙරෙහි විගණන කමිටුව මූලිකව සිය අවධානය යොමු කර ඇත.

වාර්තාකරණ ක්‍රමවේදය

විගණන කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරේ. එහිදී සියලු ප්‍රධාන කරුණු, ගන්නා ලද ක්‍රියාමාර්ග, අත්පත් කර ගත් හෝ අත්පත් කරගැනීමට ඇති ප්‍රතිඵල සහ පසුවිපරම් ක්‍රියාමාර්ග පැහැදිලි කර ගැනීම සඳහා සාකච්ඡා කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2023 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

මූල්‍ය වාර්තාකරණය

- බැංකුවේ මාසික, කාර්තුමය, හා වාර්ෂිකව විගණනය නොකළ/කළ මූල්‍ය ප්‍රකාශන සුපරීක්ෂණ හා නියාමන බලධාරීන් විසින් පනවන ලද අවශ්‍යතා හා අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා අනුරූප වන පරිදි පිළියෙල කොට හා ප්‍රසිද්ධ කොට තිබෙන බව තහවුරු කරනු පිණිස මෙම ප්‍රකාශන සමාලෝචනය කරන ලදී.
- ද්‍රවශීලතා කළමනාකරණය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ විදේශ මුදල් කළමනාකරණය සමාලෝචනය කරන ලදී.

නියාමන අනුකූලතාවය

- අනිවාර්ය බැංකු කටයුතු හා අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ වූ අනුකූලතාවය සමාලෝචනය කරන ලදී.
- නියාමකයින් විසින් පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණයන්ගෙන් හඳුනාගන්නා ලද කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග වල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

අභ්‍යන්තර පාලනය

- 2023 වසර සඳහා යාවත්කාලීන කරන ලද අභ්‍යන්තර පාලන ආකෘතිය මඟින් 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග වල 3 (8) (ii) (ආ) කොටසට අනුකූලව බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මකතාවය සහ සඵලත්වය සමාලෝචනය කරන ලදී.
- නිරන්තරව සහ අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය හේතු විශ්ලේෂණ මත පද්ධති, පටිපාටි සහ අභ්‍යන්තර පාලන විධිවිධාන වල ශක්තිමත්භාවය ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන ක්‍රියාමාර්ග වල ස්වාධීනත්වය, වාස්තවිකත්වය සහ කාර්යසාධනය මෙන්ම දෙපාර්තමේන්තුවේ සම්පත් වල ප්‍රමාණාත්මක බව සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කරමින් සැලසුම ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය වසර පුරාම සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර පාලනයේ අධීක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ මුල්පිරීම්හි ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝගවලට අනුව අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ සහ විගණන කමිටු ප්‍රඥප්තියේ අනුකූලතාවය අධීක්ෂණය කරන ලදී.
- COBIT-2019 (තොරතුරු තාක්ෂණ පාලන රාමුව) ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කරන ලදී.
- ලංකා බැංකුවේ විසිල්-බ්ලෝවිං පද්ධතියේ ඇති ප්‍රතිචාර දැක්වීමේ අංශයට ප්‍රධාන අභ්‍යන්තර විගණකට සෘජුවම ප්‍රවේශ වීමේ හැකියාව ද ලංකා බැංකුවේ අන්තර්ජාල වෙබ් ද්වාරය හරහා සෘජුවම පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි විසිල්-බ්ලෝවිං ක්‍රමය වැඩි දියුණු කර ඇත.
- අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ වර්තමාන සන්දර්භයට ව්‍යුහය ගැලපීම අරමුණු කරගනිමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය සමාලෝචනය කර සංශෝධනය කරන ලදී. ඒ අනුව නව වෘත්තීය කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට නිර්දේශ කර ඇත.
- බැංකුවේ ණය කළඹේ ගුණාත්මකභාවය ඇගයීම සහ ණය ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මුලපිරීම් නිර්දේශ කිරීම.
- පරිපාලිත ආයතනවල අභ්‍යන්තර විගණන ක්‍රියාවලීන් ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.
- අපේක්ෂිත ණය අලාභ ආකෘති, සයිබර් ආරක්ෂාව, පරිත්‍යාගශීලීන්ගේ නියෝජිත ආයතන අරමුදල් උපයෝගී කරගෙන ලබාදී ඇති ණය පිළිබඳව විශේෂ සමාලෝචනයක් සිදු කරන ලදී.

බාහිර විගණනය


- රටේ ව්‍යවස්ථාව අනුව බාහිර විගණනය කරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසිනි. අර්න්ස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරීවරු මේ වසරේ විගණනය සඳහා විගණකාධිපතිට සහය විය. ඵලදායී ලෙස හා ස්වාධීනව බාහිර විගණන කටයුතු කරගෙන යන බවටත් විගණන ප්‍රවේශය හා ක්‍රියා පිළිවෙත අනුව විගණකාධිපතිගේ නියෝජිතයන් සමඟ අඛණ්ඩව සම්බන්ධතාවක් පවත්වා ගෙන යන බවටත් කමිටුව සහතික වේ.
- විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් සමඟ "සංවෘත සාකච්ඡා" පැවැත්විණි.

ඉදිරි දැක්ම

වසර 2024 හා ඉන් ඔබ්බට අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමට ධනාත්මක සහ ඵලදායී අභ්‍යන්තර පාලන පරිසරයක් ඇති කිරීමට විගණන කමිටුව කැප වේ.

කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතාට සහ සාමාජිකයින් ලෙස කටයුතු කල හර්ෂ විජයවර්ධන මහතාට සහ මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි. මහතාට මෙම කමිටුවට ලබාදුන් විශිෂ්ට දායකත්වය වෙනුවෙන් කමිටුවේ ප්‍රණාමය පිරිනමනු ලැබේ.

විගණන කමිටුව වෙනුවෙන්,



නරේෂ් අබේසේකර
සභාපති
විගණන කමිටුව

2024 පෙබරවාරි 19

සටහන: ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ ජෙහාන් ස්මයිල් මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමත් සමඟ මෙම කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද පත් කරන ලදී.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

2023 වසර තුළ කමිටුවේ සංයුතිය

2023 වසර තුළ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

1. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සභාපති/ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
2. **ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
3. **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.සේ.වි.**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ*
4. **නරේෂ් අබේසේකර මහතා**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

   2023.05.09 වන දින සිට

සටහන්:

* මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.සේ.වි. ඔහුගේ ධූරකාලය අවසන් වීමෙන් පසු 2024.01.07 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.

කමිටුවේ ලේකම්

ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ජානකී වීස් සිරිවර්ධන මහත්මිය කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

අඛණ්ඩව සහභාගිවන්නන්

- මහා කළමනාකරු
- ප්‍රධාන අවදානම් නිලධාරී
- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා)
- ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී

ආයතනික හෝ විධායක කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු හෝ සේවක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු

2023 වර්ෂය තුළ දී කමිටුව රැස්වූ වාර ගණන හයකි

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 116 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන්

කමිටුවේ කාර්යභාරය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග වල අවශ්‍යතා සහ ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රඥප්තියෙහි හඳුනාගෙන ඇති පහත කරුණු සමාලෝචනය කිරීම සහ/හෝ නිර්දේශ කිරීම මෙයට ඇතුලත් වේ:

- අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ කළමනාකරණ කමිටු ප්‍රඥප්ති.
- ප්‍රධාන අවදානම් නිලධාරී විසින් නිර්දේශ කර ඇති පරිදි ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් තොරතුරු ආරක්ෂාව සහ වෙනත් අවදානම් සඳහා අභිරුචිය ඇති කරන අවදානම් සීමාවන් සහ ප්‍රතිපත්ති.
- විශේෂිත අවදානම් පාලනය කිරීම සඳහා සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය.
- විදේශීය ශාඛා සහ අනුබද්ධ ආයතන ඇතුළුව බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳ අවදානම් කළමනාකරණ වාර්තා මෙන්ම වත්මන් වෙළඳපළ සහ නියාමන අවදානම් සහ එවැනි අවදානම් හඳුනා ගැනීම, මැනීම, අධීක්ෂණය සහ පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග.
- බැංකුවේ ප්‍රතිපත්ති, නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත කමිටුව විසින් තීරණය කරන ලද විවක්ෂණ මට්ටම් ඉක්මවා අවදානම් ඇති අවස්ථාවක නිශ්චිත අවදානම් වල බලපෑම් අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග.
- ණය, වෙළඳපළ, ද්‍රවශීලතාව, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව සහ අනුකූලතා අවදානම් සම්බන්ධ අවදානම් හඳුනාගැනීම, මැනීම, අධීක්ෂණය සහ අවම කිරීමෙහි ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය.

ප්‍රධානතම අවධානය

අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණයේ සියලුම අංශයන් සඳහා සිය සුපරීක්ෂක වගකීම් ඉටු කරන්නට සහය වීමට කමිටුව ප්‍රධාන ලෙසම වග බලා ගනී. මේ පිළිබඳව කටයුතු කරද්දී කමිටුව ණය, වෙළඳපළ, ද්‍රවශීලතා, මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචනය කරන්නේ උචිත අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු අනුසාරයෙනි.

වාර්තාකරණ ක්‍රමවේදය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2023 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

අවදානම් සීමාවන් - අවදානම් අංශය විසින් ඉදිරිපත් කරන ලද අවදානම් වාර්තා හරහා බැංකුවේ අවදානම් අභිරුචිය අනුමත කරන ලද මට්ටමට සාපේක්ෂව සිදුව ඇති ව්‍යතිරේක අඛණ්ඩව අධීක්ෂණය කිරීම. බැංකුවේ ස්ථාපිත කර ඇති සීමා කළමනාකරණ රාමුවේ ව්‍යතිරේක, ඒවායේ යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් යෝජනා කරන ලද ක්‍රියාමාර්ග සමඟ දැඩි ලෙස නිරීක්ෂණය කරන ලදී.

ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි - විදේශ ශාඛා ප්‍රතිපත්ති ඇතුළුව අවදානමට අදාළ සියලුම ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා

ව්‍යාපාරික හෝ නියාමනයට අදාළ වෙනස්කම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී. විශේෂිත අවදානම් හෝ සමහර අවදානම් පැතිකඩයන් සම්බන්ධයෙන් කටයුතු කරන සියලුම කළමනාකරණ කමිටුවල යොමු වූ නියමයන් සමාලෝචනය කර සංශෝධනය කරන ලදී. බැංකුවේ සියලුම කළමනාකරණ කමිටු කාර්යක්ෂමතාවය ඇගයීමට ලක් කෙරුණේ, එක් එක් කමිටුවේ විධිවිධානයට අනුව එහි කාර්යයන් ඉටු කිරීම සහතික කිරීම උදෙසාය.

ද්‍රවශීලතාවය

- බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා උපරිම ප්‍රමුඛතාවය ලබා දුන් අතර ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී. අභියෝගාත්මක ආර්ථික තත්ත්වයකදී බැංකුව ස්ථාවරව පැවතීම සහතික කිරීම සඳහා සාම්ප්‍රදායික නොවන උපායමාර්ග, විශේෂ කණ්ඩායම් සහ කාර්යන් නිර්දේශ කරන ලදී.

- බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වයන් ආරක්ෂා කරමින් 2022 වර්ෂයේදී ස්ථාපිත කරන ලද විශේෂ යාන්ත්‍රණයන් තවදුරටත් ශක්තිමත් කරන ලදී.

- ජාතික අවශ්‍යතා මත රාජ්‍ය ව්‍යවසාය ආයතන වලින් කරන ලද ඉල්ලීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරන ලදී. බැංකුවේ ස්ථායිතාවය ආරක්ෂා කරමින් ඔවුන් සමඟ ව්‍යාපාරයට ඉඩ සැලසීමේ යෝග්‍යතාවය සහ ශක්‍යතාවය තක්සේරු කිරීම සඳහා කමිටුව හරහා අබණ්ඩව පසු විපරම් සිදු කරන ලදී.

- **වත්කම්වල ගුණාත්මකභාවය -** රට මුහුණ දෙන ලද අභියෝගාත්මක ආර්ථික තත්ත්වය හමුවේ ණය ගුණාත්මකබව පිරිහීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමට සමාලෝචිත වර්ෂය තුළ සිදුවිය. වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ සාකච්ඡා බහුවිධ විය. දැඩි අධීක්ෂණයක් සහ නිරන්තර වාර්තාකරණයක් සහිත ණය ගුණාත්මක ඒකකය හරහා ණය ගුණාත්මකභාවය අධීක්ෂණය කරන අතරම, අක්‍රීය ණය ප්‍රමාණයේ වර්ධනය සීමා කිරීම සඳහා පුළුල් සැලැස්මක් සකස් කරන ලදී. මේ අනුව ගනුදෙනුකරුවන් පුනර්ජීවනය කිරීම. කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

- **අනුකූලතාවය -** ශාඛා ජාලයේ මෙන්ම අංශවල අවධාරණය කර ඇති අනුකූලතා අවදානම් ගැටළු තක්සේරු කර ඒවා අවම කිරීම සඳහා සුදුසු උපායමාර්ග යෝජනා කරන ලදී. පරිපාලිත සමාගම්වල අනුකූලතා අවදානම නිරන්තර වාර්තා මගින් අධීක්ෂණය කරන ලද අතර සුදුසු උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට එකඟතාවය දක්වන ලදී.

- නියාමකයාට අවශ්‍ය නියාමන වාර්තාකරණ වේදිකාව වන goAML ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කමිටුව අබණ්ඩව අධීක්ෂණය කරන ලදී.

- පරිපාලිත සමාගම්වල අවදානම් පැතිකඩ තහවුරු කර ගැනීම සඳහා පුළුල් අවදානම් සමාලෝචන සිදු කරන ලද අතර ඒවා බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අනුව පවතින බව සහතික කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රාමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) සහ ප්‍රතිසාධන සැලැස්ම

ස්ථම්භ II අවදානම් සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටමක් පවත්වා ගැනීමට සහ බැංකුවේ ආතතිය පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේදී ඉස්මතු වූ අනපේක්ෂිත නමුත් පිළිගත හැකි සිදුවීම් වලට ඔරොත්තු දීමේ අරමුණින් ලංකා බැංකු සමූහයේ ICAAP සමාලෝචනය කර නිර්දේශ කරන ලදී.

- අනතුරු ඇඟවීම් සහ ප්‍රේරක සිදුවීම් පිළිබඳ කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග විස්තරාත්මකව සාකච්ඡා කරන ලදී.

- අමතර ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ස්වාධීන උපදේශක මගින් සිදු කරන ලද වත්කම්හි ගුණාත්මක භාවය පිළිබඳ සමාලෝචනය සහ රජය සතු ව්‍යාපාර (SOEs) ප්‍රතිව්‍යුහගත කිරීම් තුළින් ඇති විය හැකි බලපෑම් විවේචනාත්මකව විශ්ලේෂණය කරන ලදී.


ESMS මූලපිරිමි - ව්‍යාපාර අංශ සහ ශාඛා ජාලය හරහා බැංකුවේ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තිය එළිදැක්වීම.

තොරතුරු ආරක්ෂාව/තොරතුරු තාක්ෂණ අවදානම - සංවේදී දත්තවල රහස්‍යභාවය සහ අබණ්ඩතාව සහතික කරන අතරම ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව බැංකු අත්දැකීම් සහතික කිරීම සඳහා ශක්තිමත් තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මූලික ප්‍රමුඛතාවය වී ඇත. බැංකු සේවා විෂයෙහි පවත්වා ගෙන යාමට සහ දියුණුව සඳහා, ගෝලීය වශයෙන් පිළිගත් තොරතුරු තාක්ෂණ පාලන රාමුවක් "COBIT 2019" ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

සමාප්තිය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ලංකා බැංකුවේ මූල්‍ය ඒකාග්‍රතාව ආරක්ෂා කිරීම සඳහා කැපවී සිටියි. සවිස්තරාත්මක අවදානම් අවම කිරීමේ උපායමාර්ග, ක්‍රියාකාරී පියවරයන් සමඟින් ඉදිරි අභියෝග සඳහා මුහුණ දීමට බැංකුව හොඳින් ස්ථානගත කරයි. එසේම නිරන්තරයෙන් විකාශනය වන බැංකු ක්ෂේත්‍රයේ නව්‍යතාවයන් මත ව්‍යාපාර කටයුතු වර්ධනය කර ගැනීමටත් තිරසාර වර්ධනය උදෙසා කැපවීමටත් කමිටුව නිරතුරුව කටයුතු කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙනුවෙන්,



ආර් එම් ප්‍රියන්ත රත්නායක
සභාපති,
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2024 පෙබරවාරි 19

සටහන්:

* ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතා ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත්වීමත් සමඟ 2024.03.13 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉවත් විය.

* 2024 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලයට නව සාමාජිකයින් පත් කිරීමත් සමඟ වත්මන් කමිටුව පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

(i) ජෙහාන් ස්මයිල් මහතා
සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

(ii) ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

(iii) නරේෂ් අබේසේකර මහතා
සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

(iv) ජයමින් පැල්පොල මහතා
සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

2023 වසර තුළ කමිටු සංයුතිය

2023 වර්ෂය තුළ දී කමිටුවේ සංයුතිය.

1. **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා***
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ**
3. **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි.**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ*

ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිය ධූරකාලය අවසන් වීමෙන් පසු 2023.04.21 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්වීමෙන් පසු මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ මෙම කමිටුවට පත් විය. මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිය ධූරකාලය අවසන් වීමෙන් පසු 2024.01.07 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉවත් වීමත් සමගම ඉතිරි අධ්‍යක්ෂවරුන් දෙදෙනාගෙන් කමිටුව සමන්විත වූ අතර මෙම වාර්තාව සකස් කරන දිනට කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

1. **මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ**
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

2024 පෙබරවාරි 05 දින සිට

1. **මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ**
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

කමිටුවේ ලේකම්

ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, නීතිඥවරියක මෙන්ම ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ජානකී එස් සිරිවර්ධන මහත්මිය කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

අබණ්ඩව සහභාගිවන්නන්

- මහා කළමනාකරු
- නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්)
- ආයතනික හෝ විධායක කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙක්

2023 වසරේ දී කමිටුව රැස්වූ වාර ගණන: දෙකයි
(සාමාජික සහභාගිත්වය මෙම වාර්තාවේ පිටු අංක 116 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන්

කමිටුවේ කාර්යභාරය

කමිටුවේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ශ්‍රී ලංකාව තුළ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ නියාමනයන් මත මූලික වශයෙන් පදනම් වී ඇති අතර එය පහත පරිදි වේ:

- බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සම්බන්ධයෙන් වූ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) නිගමනය කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අරමුණු හා ඉලක්ක නියම කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ලබාදුන් අරමුණු හා ඉලක්ක වල කාර්යසාධනය කාල පදනමක් මත ඇගැයීම හා කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා තුළ පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා අනිකුත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම නිශ්චය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවට යොමු කළ කාර්ය මණ්ඩලයට අදාළ කරුණු සමාලෝචනය.
- බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය හා සංවිධාන ව්‍යුහය නිශ්චය කිරීම.

ප්‍රධානතම අවධානය

මූලිකව ප්‍රධාන කළමනාකරණ පිරිස් ඇගැයීම පිළිබඳව මානව සම්පත් සම්බන්ධ ගැටළු විසඳීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට උපකාරී වීම පිළිබඳව මෙම කමිටුව අවධානය යොමු කරයි.

වාර්තාකරණ ක්‍රමවේදය

කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර කමිටුවේ නිර්දේශයන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2023 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

ඉහත සඳහන් 2007 අංක 11 දරණ බැංකු ආඥා පනතේ නියෝග අනුව, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මෙම කමිටුව විසින් නිශ්චය කළ යුතුය. කෙසේ වුවත් ලංකා බැංකුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කරනු ලබන්නේ, එහි එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ හා උපදෙස් අනුවය. මෙහිදී 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා ඊට කළ සංශෝධනයන් ද සැළකිල්ලට ගනු ලැබේ. ඉහත දැක්වෙන පදනම්න් පිළියෙළ කළ, රජය විසින් නව රෙගුලාසි නිකුත් කරන විට අවශ්‍ය වන පරිදි සංශෝධනය කරනු ලබන පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත. මෙය අවසන් වරට 2023 වසරේදී සමාලෝචනය කරන ලද අතර අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමික පිළිබඳ විස්තර, වාර්ෂික වාර්තාව තුළින්, වාර්ෂික පදනමකින් අනාවරණය කෙරේ.

ප්‍රධාන කළමනාකරණ පිරිස් හි වේතන

සේවක මණ්ඩලයේ පාරිශ්‍රමික, ලංකා බැංකුවේ කටයුතු විෂය පථයට ගැනෙන අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව වසර තුනකට වරක් ප්‍රතිශෝධනය කරනු ලැබේ.

2023 වර්ෂයේදී වැටුප් සංශෝධනයක් සිදු නොවූ අතර ඒ අනුව 2023 දී ප්‍රධාන කළමනාකරණ පිරිස් හි වේතන පිළිබඳව කමිටුව සාකච්ඡා කළේ නැත.

කාර්යසාධන ඇගයීම

මහා කළමනාකාරතුමාද ඇතුළුව නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා), ප්‍රධාන අවදානම් නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ

කාර්යසාධන වාර්තා හැර ප්‍රධාන කළමනාකරණ පිරිසේ කාර්යසාධන වාර්තා මෙම කමිටුව මගින් සමාලෝචනය කරයි. අනෙකුත් ඉහත සඳහන් නිලධාරීන්ගේ කාර්යසාධනය ඔවුන්ගේ රාජකාරීන්ට අදාළ උපකමිටුව මගින් සිදු කරයි. උපායමාර්ගික සැලැස්මට අනුකූලව වර්ෂය ආරම්භයේ නියමකර ඇති ඉලක්ක මත පදනම්ව කමිටුව විසින් මෙම ඇගැයීම් වාර්ෂිකව සිදු කරනු ලැබේ.

ඉලක්ක සහ අරමුණු

කමිටුව 2023 වසර සඳහා ආයතනික කළමනාකාරිත්වය හා මහා කළමනාකරුගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) සමාලෝචනය කොට නිර්දේශ කළේය. නියෝජ්‍ය මහා කළමනාකාර (අනුකූලතා), ප්‍රධාන අවදානම් නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක අදාළ කමිටුවෙත ඉදිරිපත් කර ඇති අතර මෙය වාර්ෂිකව සිදුවේ.

සමාලෝචනය කර හෝ සංශෝධනය කර සම්මත කරගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් ඇති ප්‍රතිපත්ති/ ප්‍රඥප්ති.

- මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ප්‍රඥප්තිය.
- ස්ථාන මාරු ප්‍රතිපත්තිය
- දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය
- අලුතින් හඳුන්වා දුන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිපත්තිය
- පුහුණු සහ සංවර්ධන ප්‍රතිපත්තිය
- සීෂෙල්ස් ශාඛාවේ මානව සම්පත් ප්‍රතිපත්තිය
- මාලදිවයිනේ මෙහෙයුම් සඳහා සේවක අත්පොත


කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතාට සහ සාමාජිකයෙකු ලෙස කටයුතු කල මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.සේ.වී. මහතාට සභාපතිවරයෙකු ලෙස සහ සාමාජිකයකු ලෙස මෙම කමිටුවට ලබාදුන් විශිෂ්ට දායකත්වය වෙනුවෙන් කමිටුවේ ප්‍රණාමය පිරිනමනු ලැබේ.

ඉදිරි දැක්ම

කමිටු සාමාජිකයන් විසින්, කමිටුවේ කාර්යසාධනය සාමූහිකව ඇගැයීමට ලක් කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

කමිටුව බැංකුව තුළ ප්‍රශස්ත මානව සම්පත් පරිචයන් භාවිතය දිරිගැන්වීම උදෙසා තවදුරටත් කටයුතු කරනු ඇති අතර සේවකයින්ගේ සහ බැංකුවේ අඛණ්ඩ වර්ධනයට සහ සාර්ථකත්වයට උපකාරකරන සේවා පරිසරයක් පෝෂණය කරයි.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙනුවෙන්.



මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ
සභාපති,
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2024 පෙබරවාරි 19

සටහන්: 2024 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලයට නව සාමාජිකයින් පත් කිරීමත් සමඟ වත්මන් කමිටුව පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

1. ජෙහාන් ස්මයිල් මහතා
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
3. මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
4. ජයමින් පැල්පොල මහතා
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ.

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු වාර්තාව

2023 වසර තුළ කමිටුවේ සංයුතිය

පහත දැක්වෙන අධ්‍යක්ෂවරු 2023 වසර තුළ කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

2023 ජනවාරි 31 දින සිට

1. **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි.***
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා****
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
3. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

2023 අප්‍රේල් 18 දින සිට

1. **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි.***
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
3. **මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

2024 පෙබරවාරි 19 දින සිට කමිටුව පහත පරිදි ප්‍රතිසංවිධානය කරන ලදී

1. **මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ**
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
3. **ජයමින් පැල්පොල මහතා**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (යෝජිත අධ්‍යක්ෂ)

සටහන්:

* 2024.01.07 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධුරයෙන් ඉල්ලා අස්විය.

** 2023.04.21 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධුරයෙන් ඉල්ලා අස්විය.

කමිටුවේ ලේකම්

ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, නීතිඥවරියක මෙන්ම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ජානකී එස් සිරිවර්ධන මහත්මිය කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

අඛණ්ඩව සහභාගිවන්නන්

- මහා කළමනාකරු

කමිටුවේ අභිමතය පරිදි කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු.

2023 වසරේ දී කමිටුව රැස්වූ වාර ගණන: දහයයි

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 116 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන්

කමිටුවේ කාර්යභාරය

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනත හා සංශෝධන වලට අදාළ නියෝග වල අවශ්‍යතාවය හා ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය වීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ හොඳම පරිචය පිළිබඳ සංග්‍රහය සම්බන්ධයෙන් ද අලුතින් හඳුන්වා දුන් කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ නීතිරීතිවල 9 වැනි වගන්තිය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ප්‍රධානතම අවධානය

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුව නීතියෙන් නියමකර ඇති ආයතනික යහපාලන මූලධර්මයන්ට අනුකූල බවට සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වන අතරම මහා කළමනාකරු/ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන ආයතනික කළමනාකාරිත්වයේ පිරිස් පත් කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

වාර්තාකරණ ක්‍රමවේදය

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර කමිටුව විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2023 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ප්‍රතිපත්තිය

පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතු වන බැවින් අධ්‍යක්ෂවරුන් පත් කිරීම රාජ්‍ය බැංකු අධීක්ෂණය හාර අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධන වල විධිවිධාන වලට අනුව සිදු කරනු ලබයි. එබැවින් අධ්‍යක්ෂවරුන් පත් කිරීමට නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව සම්බන්ධ නොවේ. කෙසේ වෙතත් මෙම කමිටුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තියක් අනුමත කර ඇත. මෙම ප්‍රතිපත්තිය මගින් බැංකුවේ අධ්‍යක්ෂවරුන් ලෙස සේවය කිරීමට අවශ්‍ය නිර්ණායක නිරූපණය කරන අතර, ඉදිරියේදී අධ්‍යක්ෂවරුන් පත්කිරීමේදී සැලකිය යුතු නිපුණතා පිළිබඳව මෙම ප්‍රතිපත්තිය මගින් නිසි බලධාරීන් වෙත මගපෙන්වීමක් ලබාදේ. අධ්‍යක්ෂ මණ්ඩලයට නම් කරන ලද අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය පිළිබඳව කමිටුව විසින් සහතික කරයි.

ආයතනික යහපාලනය

ස්ථාපනය කරන ලද ආයතනික යහපාලන ප්‍රතිපත්තිය සහ පහත සඳහන් ප්‍රතිපත්ති සංශෝධනය කර සමාලෝචනය කරන ලදී.

- බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය.
- අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා ප්‍රවේශය පිළිබඳ ප්‍රතිපත්තිය.
- ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමේ ප්‍රතිපත්තිය.
- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය.
- සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල වේතන ප්‍රතිපත්තිය.

- අධ්‍යක්ෂවරුන් සඳහා වූ ව්‍යාපාර ආචාරධර්ම සහ හැසිරවීමේ සංග්‍රහය.
- අධ්‍යක්ෂවරුන්ගේ මැදිහත්වීම් පිළිබඳව අවධානය යොමු කෙරෙන ප්‍රතිපත්තිය.
- පරිපාලිත කළමනාකරණ ප්‍රඥප්තිය.
- පරිපාලිත සමාගම් සඳහා අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ප්‍රතිපත්තිය.
- විසිල්-බ්ලෝවිං ප්‍රතිපත්තිය.
- අදාළ සමාගම්වල සහ අනෙකුත් ආයෝජිත සමාගම්වල කොටස් හිමියා ලෙස පෙරකලාසිකරු පත් කිරීම් පිළිබඳ සංශෝධිත ප්‍රතිපත්ති ප්‍රකාශය සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කර ඇත.

අදාළ ආයතනික යහපාලන රෙගුලාසි හා අනුකූලතාවය සහතික කෙරුණි.

2023 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීම් වාර්තාව නිර්දේශ කරන ලදී.

යෝග්‍යතාව හා සුදුසුකම්

නිලධාරීන් ප්‍රධාන කළමනාකාරිත්ව කණ්ඩායමට පත් කළ හෝ උසස් කළ විට ඔවුන් එම තනතුරු දැරීමට නිසි හා යෝග්‍ය පුද්ගලයින් බවට සහතික කරන ලදී.

අනුප්‍රාප්තික විධිවිධාන

කුසලතා වර්ධනයේ අනිවාර්ය අංගයක් වන සංශෝධිත අනුප්‍රාප්තික සැලැස්ම ආයතනික කළමනාකාරිත්වය සඳහා නිර්දේශ කරන ලදී. හදිසි ආවරණය, මධ්‍ය කාලීන (අවුරුදු 1-3) සහ දිගු කාලීන (අවුරුදු 3-5) ලෙස හඳුනා ගනිමින් සකස් කරන ලද සියලුම ප්‍රධාන කළමනාකරණ භූමිකාවන් සඳහා කුසලතා ඉදිරි දැක්ම සමාලෝචනය කරන ලදී. 2024 දී අනුමත කරන ලද ලංකා බැංකුවේ මහා කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා උසස්වීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම සම්බන්ධව කමිටුව දීර්ඝව සාකච්ඡා කරන ලදී.

බැංකු ප්‍රවාහයේ නියෝජ්‍ය මහා කළමනාකාර සහ සහකාර මහා කළමනාකාර ශ්‍රේණිවල සේවකයන්ට අදාළ උසස්වීමේ යෝජනා ක්‍රමය සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ඉදිරි දැක්ම


බැංකුවේ මෙහෙයුම් වල අඛණ්ඩතාව සහ පාරදෘශ්‍යභාවය පවත්වාගෙන යාමේදී ශක්තිමත් ආයතනික යහපාලන භාවිතයන්හි වැදගත්කම කමිටුව අවබෝධ කර ගෙන සිටී. පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ඉහළ නැංවීමට සහ තිරසාරභාවය තවදුරටත් වර්ධනය කිරීමට බැංකුවේ සෑම තරාතිරමකම වගකීම සහ සදාචාරාත්මක හැසිරීම් කමිටුව ප්‍රවර්ධනය කරනු ඇත.

සමාප්තිය

සාමූහිකව සිදු කරන ලද වාර්ෂික ඇගැයීම තුළින් කමිටුව සිය කාර්යක්ෂමතාව සමාලෝචනය කළේය. මෙම කමිටුවේ කාර්යයන් තුළින් කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වලට තවදුරටත් වටිනාකමක් එක්කරනු ඇත.

කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.සේ.වි. මහතා ලබාදුන් විශිෂ්ට දායකත්වය වෙනුවෙන් කමිටුවේ ප්‍රණාමය පිරිනමනු ලැබේ.

නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව වෙනුවෙන්



මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ
සභාපති,
නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව

2024 පෙබරවාරි 19

සටහන්: 2024 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලයට නව සාමාජිකයින් පත් කිරීමත් සමඟ වත්මන් කමිටුව පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

1. ජෙහාන් ස්මයිල් මහතා
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. කාවන් රත්නායක මහතා
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ/සභාපති
3. ජයමින් පැල්පොල මහතා
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව

2023 වසර තුළ කමිටුවේ සංයුතිය

පහත දැක්වෙන අධ්‍යක්ෂවරු 2023 වසර තුළ කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

1. **මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ**
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
3. **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි.***
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
4. **නරේෂ් අබේසේකර මහතා**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

සටහන:

* ඔහුගේ ධූරකාලය අවසන් වීමෙන් පසු 2024.01.07 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.

වර්තමානයේ කමිටුව පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

1. **මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ**
   සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
2. **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
   සාමාජික/ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
3. **නරේෂ් අබේසේකර මහතා**
   සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2023.05.09 දින සිට බලපැවැත්වෙන පරිදි කමිටුවට පත් විය).

කමිටුවේ ලේකම්

ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, නීතිඥවරියක මෙන්ම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

අඛණ්ඩව සහභාගිවන්නන්

- මහා කළමනාකරු
- ප්‍රධාන තාක්ෂණික නිලධාරී/ප්‍රධාන තොරතුරු නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන)
- ප්‍රධාන අවදානම් නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (උපකාරක සේවා)
- ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ සහකාර මහා කළමනාකරුවන්
- සහකාර මහා කළමනාකරු (නිමැවුම් සංවර්ධන කටයුතු සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ)

කමිටුවේ අභිමතය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ, ආයතනික කළමනාකාරිත්වයේ හෝ කාර්ය මණ්ඩලයේ වෙනත් ඕනෑම සාමාජිකයෙකු.

2023 වර්ෂය තුළ දී කමිටුව රැස්වූ වාර ගණන දහයකි.

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 116 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන්

කමිටුවේ කාර්යභාරය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ප්‍රධානතම අවධානය

කමිටුවේ මූලික අරමුණ වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ වගකීම ඉටු කිරීම සඳහා බැංකුවේ තොරතුරු තාක්ෂණ නිෂ්පාදන හා සේවා, ප්‍රතිපත්තීන් සහ භාවිතයන් සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා ප්‍රධාන තාක්ෂණික ආයෝජනයන්හි ක්‍රියාකාරිත්වය ඵලදායීව පවත්වා ගැනීමට සහය වීමයි. එමඟින් බැංකුවේ යටිතල පහසුකම් සහ හැකියාවන් ශක්තිමත් ලෙස සෑම විටම ස්ථානගත කොට ඇති බවටත් නව තාක්ෂණික ප්‍රවණතා විශ්ලේෂණය කොට බැංකුවේ ආයතනික සැලැස්මට අනුගත වෙමින් හා ඉහළම ක්‍රියාපිළිවෙත් ඔස්සේ පවත්වා ගෙන යන බවටත් සහතික කරයි.

වාර්තාකරණ ක්‍රමවේද

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2023 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

සංවර්ධන අධීක්ෂණය

- විදේශීය ශාඛාවන් වන මාලදිවයින, චෙන්නායි සහ සීෂේල්ස් බැංකුවේ ක්‍රියාත්මක තොරතුරු තාක්ෂණ වර්ධනයන්/තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ව්‍යාපෘති පසු විපරම් කොට යෝජිත වර්ධනයන් ඉහළ නැංවීම සඳහා මඟ පෙන්වීම.
- බැංකුවේ පවත්නා තීරණාත්මක භාවිතයන්ගේ මෙහෙයුම් විපරම්කොට, පවත්නා ගැටළු නිරාකරණය/ සමථය කිරීම පිළිබඳ මඟපෙන්වීම.
- බැංකුවේ ඩිජිටල් බැංකුකරණ විසදුම (අන්තර්ජාල හා ජංගම බැංකුකරණ පද්ධතිය, බී ඇප්) හි ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබීය.
- AML/CET පද්ධතියේ ප්‍රසම්පාදනයේ ප්‍රගතිය නිරීක්ෂණය සිදු කරන ලදි.
- ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර/මුදල් චක්‍රීකරණ යන්ත්‍ර අක්‍රීය කාලය අඩු කිරීමට අධීක්ෂණය කර පියවර ගන්නා ලදී.
- උපායමාර්ගික සැලැස්ම තුළ අන්තර්ගත කරන ලද බැංකුවේ ඩිජිටල් ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා කරන ලදී.
- යෝජිත ජීව දත්ත පදනම් කරගත් ගෙවීම් පද්ධතිය සමාලෝචනය කරන ලදී.

තොරතුරු තාක්ෂණ යහපාලනය

- තොරතුරු තාක්ෂණ ඉදිරි සැලැස්ම සමාලෝචනය කර එය උපායමාර්ගයන්ට සම්බන්ධ කර ඇති බවට සහතික විය.
- අලුතින් හඳුන්වා දුන් තොරතුරු තාක්ෂණ පාලන රාමුව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ අතර ක්‍රියාවලිය වේගවත් කරන ලදී.
- 2023 වර්ෂයේදී සිදු වූ අන්තර්ජාල සහ ජංගම බැංකුකරණ පද්ධතීන් හි බිඳවැටීම් නිවැරදි කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීම.

- තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදන ක්‍රියාවලි සහ නඩත්තු ගිවිසුම් අළුත් කිරීම සමාලෝචන කර විධිමත් කරන ලදී.
- ශක්තිමත් සයිබර් ආරක්ෂණ කණ්ඩායමක් ගොඩනැගීමට කටයුතු යොදා ඇති බව අධීක්ෂණය කිරීම.
- ආපදා ප්‍රකෘතිකරණ කේන්ද්‍රයේ ධාරිතාවය සහ එහි ඵලදායී ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීමට අධීක්ෂණ කටයුතු සිදු කිරීම.

මානව සම්පත්

- නව තොරතුරු තාක්ෂණ අංශයේ සංවිධාන ව්‍යුහයට පහසුකම් සැලසීය.
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා අවශ්‍ය මානව සම්පත් සැපයුමට සහය වන ලදී.
- නව ප්‍රධාන තොරතුරු නිලධාරියෙකු පත් කිරීමට පහසුකම් සැලසීය.
- ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය අවශ්‍ය මානව සම්පත් වලින් ශක්තිමත් කරන ලදී.

ඉදිරි දැක්ම

කමිටුව සිය නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී අනාගත සහ නැඟී එන තාක්ෂණය දෙස අවධානය යොමු කරන අතර බැංකුවේ තාක්ෂණ වැඩසටහන් බැංකුවේ ව්‍යාපාරික අරමුණු සහ උපායමාර්ග සඳහා සහාය වීම සහ සුදුසු දත්ත ආරක්ෂාව සැපයීම සහතික කිරීමට උත්සාහ කරනු ඇත.

සමාප්තිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ සාමාජිකයින් 2023 වර්ෂය තුළ කමිටුවේ කාර්යසාධනය, ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාව ඇගැයීමට ලක් කර ඇත.

2023 වර්ෂයේ දී කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.සේ.වි. මහතා මෙම කමිටුවට ලබාදුන් විශිෂ්ට දායකත්වය වෙනුවෙන් කමිටුවේ ප්‍රණාමය පිරිනමනු ලැබේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව වෙනුවෙන්



මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ
සභාපති,
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

2024 පෙබරවාරි 19

සටහන: ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ ජයමින් පැල්පොල මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමත් සමග මෙම කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද පත් කරන ලදී.

අවදානම් සහ අවස්ථාවන්

අවදානම් සන්දර්භය

අයහපත් ගෝලීය ආර්ථික දැක්ම, භූ-දේශපාලනික බණ්ඩනය සහ ආර්ථික තත්ත්වයන් හේතුවෙන් එල්ල වූ සැලකිය යුතු අභියෝග මධ්‍යයේ බැංකුව සිය ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවේ සහාය ඇතිව 2023 වසරේ බැංකු ක්ෂේත්‍රයේ ඉහළම ලාභය අත්පත් කර ගැනීමට සමත් විය. ණය ප්‍රතිව්‍යුහගත කිරීම, බැංකුවේ අනාගත ලාභ අලාභ විශ්ලේෂණය සහ ඇති විය හැකි ඉදිරි ණය අලාභ ආවරණයට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම මෙහිදී ගෙන ඇති ක්‍රියාමාර්ග අතර වේ.

විභජනය කල හැකි ආදායම අඩුවීම, අධිඋද්ධමන අනුපාත සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා පියවරයන්, ණයගැතියන්ගේ ණය සේවා ධාරිතාව කෙරෙහි අබණ්ඩව බලපෑවේය. මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සහ උද්ධමනය තනි ඉලක්කමකට ළඟා වීමේ ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂයේ අවසන් භාගය ආරම්භයේ පටන් ශේෂ පත්‍රය මත වූ පීඩනයේ අඩු වීමක් බලාපොරොත්තු විය.

වසර පුරාම, පෙර නොවූ විරූ ලෙස පොළී අනුපාතය ඉහළ යාමෙන්, විශේෂයෙන්ම ශාඛා අංශයේ දැනට සිටින ණයගැතියන්ට සිදු වන පීඩනකාරී බලපෑම අවම කිරීම සඳහා බැංකුව දිගටම උත්සාහයන් දරන ලදී. වසරේ මුල් භාගයේ පැවති දැඩි මූල්‍ය ප්‍රතිපත්ති නිසා පෙර වසර හා සැසඳීමේදී ණය කළඹේ වර්ධනය අඩු වීමක් නිරීක්ෂණය කරන ලදී. කෙසේ වුවද, 2023 මැද භාගයේ සිට මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමත් සමඟ එහි වර්ධනයක් පිළිබිඹු විය.

දේශීය ණය ප්‍රශස්තකරණයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය සුරැකුම්පත්හි පොළී අනුපාත ක්‍රමානුකූලව සාමාන්‍යකරණය වීම නිරීක්ෂණය කරන ලද අතර, එය මූල්‍ය ප්‍රතිපත්තිය ඵලදායී ලෙස සම්ප්‍රේෂණය කිරීමට මඟ පෑදීය. 2023 දෙවන භාගයේදී, ප්‍රතිපත්ති පොළී අනුපාත පහතට ගැලපීමත් සමඟ වෙළඳපළ පොළී අනුපාත වල අඩුවීමක් නිරීක්ෂණය කරන ලදී.

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) අඩු කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳපළ විදේශ විනිමය අවශෝෂණය සහ ස්ථාවර පහසුකම් මත අධික ලෙස රඳා පැවතීම සීමා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වෙළඳපළ ද්‍රවශීලතාවයට අනුකූලව බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වයෙහි සැලකිය යුතු වැඩිවීමක් නිරීක්ෂණය විය.

දේශීය ණය ප්‍රශස්තකරණය (DDO) සහ රජය සතු ව්‍යවසායන් (SOEs) ප්‍රතිව්‍යුහගත කිරීම වැනි අභියෝග රැසක් මධ්‍යයේ වුවද, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ අනෙකුත් නියාමන අනුපාත සීමාවට වඩා ඉහළින් සාර්ථකව පවත්වාගෙන යන විශාලතම බැංකුව ලෙස ලංකා බැංකුව රටේ මූල්‍ය අංශයට දායක වේ.

ලංකා බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයේ වැදගත්කම සැලකිමේදී අදාළ නියාමනයක් හා මෙහෙයුම් සන්දර්භය පවත්වා ගෙන යන අතරතුර තිරසාර වර්ධනයක් සඳහා පහසුකම් සැලසීමේ බැංකුවේ කැපවීම මෙහි පසු පරිච්ඡේද වලදී ගවේෂණය කරනු ඇත.

ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ රාමුව නිරවුල්ව නිර්වචනය කරන ලද තන්ත්‍රණ ව්‍යුහයන්ගෙන්, ප්‍රතිපත්ති රාමුවලින් හා අවදානම් පිළිබඳ දැනුවත්භාවය යන අංග වලින් සමන්විත වන අතර, එය බැංකුව මුළුල්ලේ ඇති අවදානම් ඒකාකාර ලෙස කළමනාකරණය කිරීම සිදු කරයි. මෙම රාමුව ස්ථායී ලෙස අවදානම් හඳුනා ගැනීම, මැනීම, අවම කිරීම හා වාර්තා කිරීම පිණිස වූ විස්තීර්ණ මාර්ගෝපදේශ සපයනු ලබයි. නිරන්තරව වෙනස් වීමට ලක්වන මෙහෙයුම් පරිසරය හමුවේ එය උචිත වන බවට සහතික වනු පිණිස එය අවශ්‍ය පරිදි සමාලෝචනය හා ප්‍රතිශෝධනය කෙරේ.

මෙහෙයුම් පරිසරයේ සුවිශේෂී වෙනස්කම් වලට හා අභිනවයෙන් හඳුන්වා දෙන ලද අභ්‍යන්තර ක්‍රියාවලීන්ට ප්‍රතිචාර වශයෙන්, බැංකුව විසින් 2023 වර්ෂය තුළ සියලුම ප්‍රතිපත්ති සමාලෝචනය කොට යාවත්කාලීන කරන ලදී. පීඩනයට ලක්ව ඇති මෙහෙයුම් පරිසරයේ සංකීර්ණතාව සැලකිල්ලට ගනිමින්, බැංකුව ද්‍රවශීලතා, පොළී අනුපාතික හා පාරිසරික හා සාමාජීය අවදානම් කෙරෙහි අවධානය වැඩි කරනු පිණිස නිරීක්ෂණය කරන අවදානම්වල විෂය සීමාව පුළුල් කර ඇත.

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)



දැක්ම

බැංකුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීමේදී ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය හරහා සහාය වීම.



මෙහෙවර

විස්තීර්ණ අවදානම් කළමනාකරණය සහතික කිරීම හරහා ගතික කාර්යය පරිසරය තුළ නියාමන අවශ්‍යතා සහ බැංකු ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන් සමගින් සාමූහිකත්වය සහ වෘත්තීය වර්ධනය දිරිගන්වමින් බැංකුවේ තිරසාර වර්ධනය සඳහා පහසුකම් සැලසීම.

ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව

අරමුණු

- වර්ධනය සඳහා ඇති අවස්ථා උපරිම කරන අතරම අවදානම් කල්තියාම හඳුනා ගැනීම සහ අවම කිරීමට බැංකුවේ හැකියාව වැඩි දියුණු කිරීම.
- පවත්නා හා අනාගත අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය හා විශ්ලේෂණය සඳහා උචිත ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි ස්ථානගතව ඇති බවට වගබලා ගැනීම.
- අවදානම් කළමනාකරණය අඛණ්ඩව පවත්වා ගැනීම උදෙසා අවශ්‍ය ශක්තිමත් ක්‍රමවේදයක් සහ රාමුවක් සැපයීම.

අවදානම් පරිසරය

ප්‍රාථමික අවදානම්	ණය අවදානම	වෙළඳපළ අවදානම	මෙහෙයුම් අවදානම		ද්‍රවශීලතා අවදානම		
වෙනත් අවදානම්	උපායමාර්ගික අවදානම	තොරතුරු සුරක්ෂිතතා සහ තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අවදානම	මානව සම්පත් අවදානම	නියාමන හා අනුකූලතා අවදානම	දේශගුණය ආශ්‍රිත අවදානම සහ පාරිසරික, සාමාජීය හා තන්ත්‍රණ පැතිකඩ	නෛතික අවදානම	කීර්තිනාම අවදානම

අවදානම් පාලනය සහ අධීක්ෂණය

අධ්‍යක්ෂ මණ්ඩලය

- අවදානම් කළමනාකරණය සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)
- විගණන කමිටුව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

මහා කළමනාකරු

අවදානම් සම්බන්ධ විධායක කමිටු

ණය අවදානම
- ණය කමිටුව
- අක්‍රීය ණය සමාලෝචන කමිටුව
- නිෂ්ක්‍රීය වත්කම් කමිටුව

වෙළඳපළ අවදානම්
- වත්කම් හා බැරකම්
- කළමනාකරණ කමිටුව
- ආයෝජන කමිටුව

මෙහෙයුම් අවදානම
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව
- වංචා අවදානම් කළමනාකරණ කමිටුව
- මෙහෙයුම් අලාභ සම්බන්ධ කමිටුව
- ව්‍යාපාරික අවිච්ඡින්නතා කළමනාකරණ කමිටුව

තොරතුරු ආරක්ෂණය
- ආයතනික තොරතුරු ආරක්ෂක කමිටුව

1 පළමු මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය
- ව්‍යාපාරික ඒකක

2 දෙවන මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය
- ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IIRMD)

3 තුන්වන මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය
- අභ්‍යන්තර විගණනය

අවදානම් සම්බන්ධ ප්‍රතිපත්ති


අවදානම් අභිරුචිය, සංස්කෘතිය සහ කළමනාකරණය

- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- සමූහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්තිය
- ඒකාබද්ධ පාරිසරික හා සාමාජීය කළමනාකරණ ප්‍රතිපත්තිය
- විදේශීය ශාඛා අවදානම් කළමනාකරණ රාමුව
- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති
- වෙළඳපළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති
- ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති
- තොරතුරු තාක්ෂණ/ තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්ති
- අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රාමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) පිළිබඳ ප්‍රතිපත්ති

අවදානම් සහ අවස්ථාවන්

අවදානම් යහපාලනය සහ අධීක්ෂණය

අර්ථ දක්වා ඇති අවදානම් ප්‍රමිතීන්ට අනුකූලව බැංකුව තුළ අවදානම් කළමනාකරණය සඳහා අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) අවදානම් කළමනාකරණය සහ ඒ ආශ්‍රිත කටයුතු අධීක්ෂණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන අතර ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ඵලදායී ලෙස සිදු කිරීම සහතික කරයි.



මෙම ත්‍රිත්ව ආරක්ෂක යාන්ත්‍රණය, බැංකුව පුරා අවදානම් පාලනය සහ අධීක්ෂණයේ පදනම, වගකීම් වල පැහැදිලි බෙදීයාම, කෙරෙහි සහාය වේ.

1 මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය — **ව්‍යාපාරික ඒකක වල අවදානම් දැරීම හා වගකීම**

- අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා මැනීම. පළමු මට්ටමේ කළමනාකරුවන් විසින් අවදානම් අභිරුචි රාමුව, අදාළ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ මඟින් නිශ්චිතව දක්වා ඇති සීමාවන් තුළ දෛනික ගනුදෙනු මත වන අවදානම් සහ කළඹ මට්ටමේ අවදානම් කළමනාකරණය කරයි.

2 මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය — **ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) අධීක්ෂණය යටතේ අවදානම් කළමනාකරණය හා වගකීම**

- අවදානම් අභිරුචිය සැකසීමේදී අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ බැංකුවේ අවදානම් සංස්කෘතිය ස්ථාපිත කිරීම. පළමු මට්ටමේ අවදානම් කළමනාකරුවන්ට සහ අවදානම් ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ කළමනාකරණයට මඟපෙන්වීම සහ සහය ලබා දීම.

3 මට්ටමේ ආරක්ෂක ක්‍රමවේදය — **අභ්‍යන්තර විගණන සහතිකය**

- අවදානම් කළමනාකරණයේ සහ අභ්‍යන්තර පාලනවල සඵලතාවය සහ ප්‍රමාණවත් බව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රමාණාත්මක සහ ස්වාධීන සහතිකයක් ලබා දීම.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

පැහැදිලිව නිරූපණය කරන ලද භූමිකාවන් සහ වගකීම්, පැහැදිලිව අර්ථ දක්වා ඇති ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, සහ ක්‍රියාවලි සහිත බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව, ව්‍යාපාර ඒකක වල කාර්යයන් සහ මෙහෙයුම් හරහා පැන නඟින අවදානම් ස්ථිර ලෙස හඳුනා ගැනීම සහ කළමනාකරණය සඳහා සහය දක්වයි.



ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)	ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනකු ඇතුළු සාමාජිකයින් හතර දෙනකුගෙන් සමන්විත ය.	**ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් ප්‍රධානත්වය දරනු ලබන අතර ස්වාධීනව ක්‍රියා කරයි.**
කාර්යභාරය	
• අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණය සම්බන්ධ සිය අධීක්ෂණ කාර්යභාරය ඉෂ්ට කිරීමෙහිලා සහාය වීම. • පවත්නා හා අනාගත අවදානම් සෙවීම, අධීක්ෂණය හා විශ්ලේෂණය සඳහා උචිත ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි ස්ථානගතව ඇති බවට වගබලා ගැනීම. • බැංකුවෙහි අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් බැංකුවේ අවදානම් අභිරුචිය සමඟ අනුගතව තිබෙන බවට වගබලා ගැනීම. • උචිත අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු හරහා බැංකුවට ඇති සියලුම අවදානම් නිතිපතා තක්සේරු කිරීම. • බැංකුවෙහි ණය, වෙළඳපළ, මෙහෙයුම් හා තොරතුරු සුරක්ෂිතතා අවදානම් කළමනාකරණය උදෙසා බැංකුව විසින් ක්‍රියාවේ යොදවන විවිධ මූලකෘත්‍යයන් සම්බන්ධයෙන් උපායමාර්ගික මඟපෙන්වීම් ලබා දීම. • ප්‍රත්‍යාබල පරීක්ෂාවේදී පෙන්වා දෙන ලද විභව්‍ය වේදන ලක්ෂ්‍ය හඳුනා ගෙන ඒවායේ හානි අවම කරන අතරම, බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රාමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) ඔස්සේ එහි ප්‍රාග්ධන තත්ත්වය හා අනාගත අවශ්‍යතාවන් සමාලෝචනය කිරීම. • බැංකුවෙහි ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලැස්ම සමාලෝචනය කිරීම. • බැංකුව තුළ අවදානම් කළමනාකරණ සංස්කෘතිය හා දැනුවත්භාවය තවත් ශක්තිමත් කිරීම.	• ආයතන ව්‍යවසාය අවදානම් කළමනාකරණ පද්ධතිය සම්බන්ධීකරණය කරයි. • බැංකුව විසින් හඳුනා ගන්නා අවදානම් විමර්ශණය කිරීමේ වගකීම දරන අතර එම අවදානම් සුදුසු පරිදි කළමනාකරණය කිරීම සහතික කරයි. • අවදානම් පැතිකඩ සමාලෝචනය කිරීම, අනාගත අභියෝග සහ තර්ජන අපේක්ෂා කිරීම සහ විභව අවදානම් අවම කිරීම සඳහා ක්‍රියාකාරී පියවර වලට ප්‍රමුඛත්වය දීම. • නිශ්චිත ප්‍රධාන අවදානම් දර්ශක නිර්වචනය කිරීම, සුදුසු අධීක්ෂණ සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් ඇති බව සහතික කිරීම ඇතුළුව බැංකුවේ අවදානම් අභිරුචිය තීරණය කිරීම. • ව්‍යාපාරික වීකක වලට සහාය දීම සහ අඛණ්ඩ පුහුණුව සහ දැනුවත් කිරීම තුළින් අවදානම් හඳුනා ගැනීමේ සංස්කෘතියක් ඇති කිරීම. • අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රාමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP), ව්‍යාපාර අවිච්ඡින්නතා සැලැස්ම (BCP) සහ ප්‍රකෘතිකරණ සැලැස්ම (RCP) නියාමන අවශ්‍යතා අනුකූලතාවය සහතික කිරීම.

	අවදානම් ප්‍රභේදය	මුඛ්‍ය අවදානම් දර්ශකය	නියාමන අවශ්‍යතා/ ප්‍රතිපත්ති පරාමිතිය	සැබෑ තත්ත්වය	
				31.12.2023	31.12.2022
R1	**ණය අවදානම**				
	වත්කම් ගුණාත්මකතාව	3 මට්ටමේ ශුද්ධ ණය අනුපාතය (%)		5.07	5.27
		හානිකරණ ආවරණ (3 මට්ටම) ණය අනුපාතය (%)		60.44	59.73
	සංකේන්ද්‍රණය වීම හා නිරාවරණය	ක්ෂේත්‍ර අනුව සංකේන්ද්‍රණය වීම (HHI)		991	999
		භූගෝලීයව සංකේන්ද්‍රණය වීම		2,031	2,062
R2	**වෙළඳපළ අවදානම**				
		ශුද්ධ පොළී ආදායම (NII) (රු. මිලියන)		91,188	126,346
		ශුද්ධ පොළී ආන්තිකය (NIM) (%)		2.08	3.10
		මහා භාණ්ඩාගාර බැඳුම්කරවල පාදක ලක්ෂ්‍යයට මිල වටිනාකම (PVBP) (රු. '000)		577,985	75,767
R3	**ද්‍රවශීලතා අවදානම**				
		ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය) (%)	20.00	42.80	21.22
		ද්‍රවශීල වත්කම් අනුපාතය (විදේශීය) (%)	20.00	53.63	32.79
		ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) (%)	100.00	227.71	122.77
		ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) (%)	100.00	145.00	139.00
		ණය-තැන්පතු (CD) අනුපාතය (%)		63.38	77.58
R4	**උපායමාර්ගික අවදානම**				
		ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය (%)	10.00	12.76	12.41
		මුළු ප්‍රාග්ධන අනුපාතය (%)	14.00	15.84	15.38
		පොදු ස්කන්ධ ස්ථර 1 අනුපාතය (%)	8.50	11.71	11.34
		ස්කන්ධ මත ප්‍රතිලාභ (%)		10.55	14.06
R5	**මෙහෙයුම් අවදානම**				
		මෙහෙයුම් අලාභය අවදානම් අභිරුචියේ ප්‍රතිශතයක් ලෙස (%)		7.00	82.00

අවදානම් සහ අවස්ථාවන්

අවදානම් කළමනාකරණය කෙරෙහි බැංකුවේ ප්‍රවේශය

ලංකා බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය කේන්ද්‍රගතව ඇත්තේ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා, සංවිධානමය සංස්කෘතිය හා යහපාලන පරිචයන් සමග දිශාගත වන රාමුවක් ඇතුළත අවදානම් කළමනාකරණය කෙරෙන බවට සහතික කරන ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) රාමුවක් වටා ය.

නිරවුල්ව විග්‍රහ කරන ලද කාර්යභාරයන්හි හා වගකීම්වල සිට මනා ලෙස නිර්වචනය කරන ලද ප්‍රතිපත්ති, කාර්යපටිපාටි හා ක්‍රියාවලීන් දක්වා වූ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව ව්‍යාපාරික වීකක, කර්තව්‍ය හා මෙහෙයුම් සිසාරා අවදානම් හඳුනා ගැනීම හා කළමනාකරණය සඳහා උපකාර කරයි.

අවදානම් හඳුනා ගැනීම, මැනීම, අවම කිරීම සහ වාර්තා කිරීම සඳහා අවදානම් අභිරුචිය සවිස්තරාත්මක මාර්ගෝපදේශ සපයන අතර ගතික මෙහෙයුම් පරිසරය අනුව එය අදාළ වන බව සහතික කිරීම සඳහා නිතිපතා සමාලෝචනය කර සංශෝධනය කරනු ලැබේ.

2023 දී බැංකුව වෙනස්වන සහ අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයට ප්‍රතිචාර වශයෙන් නව පද්ධති, ක්‍රියාවලි සහ ව්‍යුහයන් හඳුන්වා දෙන ලදී. අඛණ්ඩ ඩිජිටල්කරණය සහ ස්ථාපිත නව පද්ධති අනුගමනය කිරීම මගින් තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

බැංකුව එහි පරිසර සහ සමාජ කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කරයි. එය ජාත්‍යන්තර හොඳම භාවිතයන්, රටේ අදාළ නෛතික ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) තිරසාර මූල්‍ය මුලපිරීම් සමඟ අනුකූල වන බවට සහතික කරයි.

ලංකා බැංකුව, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ සහ මූල්‍ය අංශයේ දිශානතියට සමගාමීව, බැංකුවේ මෙහෙයුම් ආරක්ෂාව හා තොරතුරු ආරක්ෂාව පිළිබඳව වන අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට අපේක්ෂා කරයි.

අවදානම් අභිරුචිය සහ උපරිම ධාරිතා සීමාවන්

අවදානම් අභිරුචිය සහ උපරිම ධාරිතා සීමාවන්, බැංකුවට දැරිය හැකි උපරිම අවදානම් ප්‍රමාණය තුළ උපායමාර්ගික අරමුණු ලුහුබැඳීම, සහතික කිරීම සඳහා ව්‍යාපාර සැලසුම් කිරීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් පෙළගැස්වීමට යොදා ගනී.

අවදානම් අභිරුචිය

- බැංකුවේ අවදානම් අභිරුචිය නිර්වචනය කර ඇත්තේ එහි උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇති හැකියාව ඇතුළත ගැනීමට සූදානම් අවදානමේ මට්ටම ලෙසය.

අවදානම් උපරිම ධාරිතා සීමාව

- බැංකුවට දැරිය හැකි උපරිම අවිනිශ්චිතතාවය සහ දැරිය නොහැකි අවදානම් මට්ටම මෙහිදී නිර්වචනය කෙරේ.

බැංකුවේ අවදානම් අභිරුචි මට්ටම් පිළිබඳව ප්‍රකාශය අවම වශයෙන් වාර්ෂිකව අඛණ්ඩව අධීක්ෂණය කර සමාලෝචනය කෙරේ. ප්‍රාග්ධන පදනම, සාර්ව ආර්ථික වෙනස්කම්, රටේ හා ප්‍රතිපාර්ශ්වයන්හි අවදානම, අපේක්ෂිත ව්‍යාපාර වර්ධනය සහ ආයතනික සැලැස්ම මෙහිදී සැලකිල්ලට ගනී.

ප්‍රත්‍යාබල පරීක්ෂාව

බැංකුවෙහි ප්‍රත්‍යාබල පරීක්ෂාව, බැංකු නියාමන මාර්ගෝපදේශ හා ජාත්‍යන්තර මට්ටමේ හොඳම ප්‍රතිපත්ති වලට අනුකූලව සකස් කර ඇත. බැංකුවේ ප්‍රත්‍යාබල පරීක්ෂා රාමුව සිද්ධිරූපන විශ්ලේෂණය සමගින් සාර්ව-ආර්ථික හා ව්‍යාපාරික ආකෘති ප්‍රත්‍යාබල පරීක්ෂාව ඇතුළු ශිල්පක්‍රම සංකලනයක් භාවිතා කරයි. ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්ති රාමුව මගින් ණය, වෙළඳපළ, මෙහෙයුම්, සංකේන්ද්‍රණ, ද්‍රවශීලතා, විදේශ විනිමය හා පොළී අනුපාතික වැනි සියලුම ප්‍රධාන අවදානම් අවම, මධ්‍යම සහ උපරිම යන එකිනෙකට වෙනස් ප්‍රත්‍යාබල මට්ටම් යටතේ ආවරණය කෙරේ.

නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාව මගින් බැංකුවේ ව්‍යාපාර කටයුතු මත විභව්‍ය අවදානම් ඇගයීමත්, බැංකුවේ අවදානම් අභිරුචියට සාපේක්ෂව වත්මන් හා විභව්‍ය අවදානම් පැතිකඩෙහි සංවේදීතාව තක්සේරු කිරීමත් කරයි.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ලාභදායීත්වය, ද්‍රවශීලතාව හා ප්‍රාග්ධනය මත ඇති වන බලපෑම මාසික පදනමින් හා අවශ්‍ය වන පරිදි හා අවශ්‍ය වන විට සඵලදායී තීරණ ගැනීම සඳහා ඉහළ කළමනාකාරිත්වය හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත වාර්තා කෙරේ. එමෙන්ම ප්‍රත්‍යාබල පරීක්ෂාව බැංකුවේ කාර්යයන් සිසාරා අවදානම් පිළිබඳ වැඩිදුර දැනුවත්භාවයක් සඳහා දායක වන අතර, පූර්ව-ක්‍රියාකාරී කළමනාකරණය මගින් ව්‍යාපාරික අවිච්ඡින්නතාව ආරක්ෂා කිරීමට ක්‍රියා කරයි. එය අවදානම් අභිරුචිය හා ධාරිතා සීමාවන් නියම කිරීම, අවදානම් හඳුනා ගැනීම හා පාලනය කිරීම, වෙනත් අවදානම් කළමනාකරණ මෙවලම් වලට අනුපූරක සැපයීම, සම්භව්‍යතා සැලසුම් සංවර්ධනය කිරීම යන අංශ වලින් බැංකුවට සහාය වන අතර, ප්‍රාග්ධන හා ද්‍රවශීලතා සැලසුම්කරණය සහ ව්‍යාපාරික තීරණ ගැනීම වැඩිදියුණු කරයි. දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් (D-SIB) ලෙස ලංකා බැංකුව තුළ සිදුකරනු ලබන අභ්‍යන්තර සහ බාහිර සවිස්තරාත්මක ප්‍රත්‍යාබල පරීක්ෂණවල ප්‍රතිඵලයන් නියාමකට, බාහිර ශ්‍රේණිගත කිරීමේ ආයතන වලට සහ බහුපාර්ශ්වික සංවර්ධන බැංකු වෙත පුළුල් දැක්මක් සපයයි.

මෙහෙයුම් පරිසරයේ වෙනස්කම්, ප්‍රමාණවත් බව සහ ප්‍රත්‍යාබල වාර ගණන අනුව පරීක්ෂණ, කම්පන මට්ටම් සහ උපකල්පන විවේචනාත්මකව සමාලෝචනය කර වෙනස් කර අවශ්‍ය පරිදි වෙනස්කම් සිදු කරන ලදී.

ලංකා බැංකුව ක්‍රියාශීලීව සහ විවිධ අවස්ථා සහ විවිධ ප්‍රත්‍යාබල මට්ටම් යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බලපෑම (දේශීය හා විදේශීය ආයෝජන සුරුකුම්පත් මත කප්පාදුව) පුළුල් ලෙස ඇගයීමට ලක් කෙරේ. බැංකුව සමස්ත ප්‍රත්‍යාබල පරීක්ෂාවන් මාලාව අතර, ඇති විය හැකි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ (දේශීය මෙන්ම විදේශීය ආයෝජන සුරුකුම් මත අඩු වන වටිනාකම වෙනුවෙන් ප්‍රතිශතයක් කපා දැමීමේ) බලපෑම, සහ බැංකුවේ විනිශ්චය මගින් ඇතිවන බලපෑම යනාදිය ප්‍රත්‍යාබල පරීක්ෂණ අවස්ථා වල සම්පූර්ණ පරාසය වේ. එවැනි විශ්ලේෂණවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන බලපෑම බැංකුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහය වන අතර එමඟින් මිලකරණ යාන්ත්‍රණය නැවත බැලීම සහ සංශෝධනය කිරීම, අවදානම් විභවයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසීම සහ විකල්ප අරමුදල් මාර්ග සොයාගැනීමට හැකියාව සලසයි.

බැංකුවේ ප්‍රත්‍යාබල පරීක්ෂණවල ප්‍රතිඵල නියාමකයින්ට සහ බාහිර අරමුදල් සපයන ආයතන වෙත ඉදිරිපත් කර ඇති අතර ඒවා පිළිබඳව සතුටුදායක ප්‍රතිචාරයක් සපයා ඇත.

අවදානම් සංස්කෘතිය

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ සදාචාරාත්මක චර්යාවන් සඳහා කැපවීම මගින් බැංකුවේ සෑම ස්ථරයකම සේවයේ නියුතු සේවකයන් වෙත අවදානම් කළමනාකරණය පිළිබඳව සැලකිලිමත් වීමේ වැදගත්කම අවධාරණය කරයි. මෙම ශක්තිමත් අවදානම් සංස්කෘතිය බැංකුවේ සෑම තරාතිරමකම අවදානම් දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ප්‍රවර්ධනය කරයි, අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේදී සේවකයින් ඔවුන්ගේ කාර්යභාරයන් සහ වගකීම් අවබෝධ කර ගැනීම සහතික කරයි.

පුහුණු වැඩසටහන්, වැඩමුළු, සහ වෙනත් සන්නිවේදන මාර්ග ඔස්සේ ශක්තිමත් ණය සංස්කෘතිය, අවදානම් කළමනාකරණය, තොරතුරු ආරක්ෂාව, වෙළඳපල සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය සහ කළමනාකරණ පිළිවෙත්, නියාමන අවශ්‍යතා සහ නැඟී එන අවදානම් පිළිබඳව දැනුවත් කිරීමට උපකාරී විය. අවදානම් සංස්කෘතිය සියලු පාර්ශ්වකරුවන් සමඟ වන අන්තර්ක්‍රියා මත පදනම් වූ අවදානම් ආවරණය කිරීම සඳහා බැංකුවේ සීමාවෙන් ඔබ්බට විහිදේ. නියාමකයින්, ආයෝජකයින්, ගනුදෙනුකරුවන් සහ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයන් ඇතුළුව සදාචාරාත්මක හැසිරීම්, නියාමන අනුකූලතාවය සහ වගකීම් සහිත අවදානම් කළමනාකරණ පිළිවෙත් තුළින් බාහිර පාර්ශ්වකරුවන් සමඟ විශ්වාසය, විනිවිදභාවය සහ විශ්වසනීයත්වය ගොඩනැගීම දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමේදී බැංකුවේ කීර්තිය සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවයි.

ප්‍රාග්ධන කළමනාකරණය සහ අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රාමාණත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

ප්‍රාග්ධන තත්ත්වය, ප්‍රාග්ධන මිශ්‍රය සහ එහි විභජනය ක්‍රියාකාරී ලෙස කළමනාකරණය කිරීම, නියාමන රෙගුලාසි වලට අනුව සකස් කර ඇති ප්‍රාග්ධන අවශ්‍යතා වලට අනුගත වීමටත් වඩා බැංකුවේ මූල්‍ය තත්ත්වය හා කීර්තිනාමය රැක ගැනීම පිණිස වන අවදානම් කළමනාකරණයේ තීරණාත්මක අංගයකි. ප්‍රාග්ධන කළමනාකරණය සඳහා බැංකුවේ ප්‍රවේශය එහි උපායමාර්ගික අරමුණු මඟින් මෙහෙයවනු ලබන අතර ස්ථර II නිර්ණායක සමඟ අනුගත වේ.

අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රාමාණත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) හා ප්‍රකෘතිකරණ සැලසුම් (RCP) නියමු කමිටුව ප්‍රාග්ධනය කළමනාකරණය සම්බන්ධයෙන් අවදානම් තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වගකීම දරණ අතර ප්‍රාග්ධන සප්‍රමාණතා සැලැස්ම සකස් කරයි.

දේශීය ණය ප්‍රශස්තකරණය, විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම, සහ රජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම ආදී තීරණ මත ඇතිවිය හැකි බලපෑම් සඳහා පෙර සූදානම් වෙමින් බැංකුව ප්‍රාග්ධන තත්ත්වය තවදුරටත් ශක්තිමත් කරමින් අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය සහ බාසල් III යටතේ ගැනෙන ලැයිස්තුගත ස්ථර 2 යටතේ රු. බිලියන 10 ක ණයකර නිකුත් කරන ලදී.

ප්‍රකෘතිකරණ සැලැස්ම (RCP)

ප්‍රකෘතිකරණ සැලැස්ම බැංකුවේ යහපාලනය දැඩි නමුත් පැන නැඟිය හැකි ආතති තත්ත්වයන්ගෙන් මිදීමට විශ්වාසනීය විකල්ප හඳුනාගැනීම, වෙළඳපල අස්ථාවර තත්ත්වයන්, ලාභදායීත්වය, ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන කළමනාකරණය සහ ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම සඳහා මාර්ගෝපදේශය සපයයි. ප්‍රකෘතිකරණ සැලැස්ම මගින් බැංකුවේ ඉහළම කළමනාකරණ තලය වෙත ඉදිරියේදී ඇතිවිය හැකි අවදානම් පිළිබඳව පූර්ව දැනුම් දීම විස්තරාත්මකව දක්වා ඇති අතර, යම් අවදානම් දර්ශකයක් හඳුනාගත හොත් ඒ පිළිබඳව වාර්තා කිරීම සහ ප්‍රකෘතිකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම අභ්‍යන්තර ප්‍රාග්ධන හා ප්‍රකෘතිකරණ නියමු කමිටුව මත පැවරේ.

ප්‍රකෘතිකරණ සැලසුම පහත ක්‍රියාවලි සමඟ ඒකාබද්ධ වේ.

- උපායමාර්ගික, අවදානම් කළමනාකරණය සහ ව්‍යාපාර තීරණ ගැනීම
- ප්‍රාග්ධන සහ අරමුදල් සැලසුම් කිරීම, ආතති පරීක්ෂණ ප්‍රවේශයන් සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්
- ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව තක්සේරු කිරීම්
- අවදානම් දත්ත එකතු කිරීම සහ අවදානම් වාර්තා කිරීම

ප්‍රකෘතිකරණ සැලසුම, ප්‍රේරක සහ පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය, ලාභදායීත්වය, වත්කම් වල ගුණාත්මකභාවය සහ වෙළඳපල සහ සාර්ව ආර්ථික දර්ශක මත පදනම්ව සකසා ඇත. අනතුරු ඇඟවීම් සහ ප්‍රේරක ලෙස සකසා ඇති අවදානම් දර්ශක නිතිපතා නිරීක්ෂණය කරනු ලබන අතර ප්‍රේරකයක් සිදුවීමට පෙර පූර්වාරක්ෂක ක්‍රියාවලි දියත් කරනු ඇත. කෙසේ වෙතත්, අවදානම් සහිත ප්‍රේරක අවස්ථාවක් පැන නැඟීම මත බැංකුවේ ප්‍රකෘතිකරණ සැලැස්ම ක්‍රියාත්මක කරයි.

2023 වසර තුළදී ශුද්ධ පොළී ආන්තිකය (NIM) මත ඇතිවූ බලපෑම නිසා අභ්‍යන්තර ප්‍රාග්ධන කළමනාකරණය සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු කිරීමේ සහ ප්‍රකෘතිකරණ සැලසුම් නියමු කමිටුව විවිධ ප්‍රකෘතිකරණ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රමවේදයන් හේතු කොට ගෙන ප්‍රධාන නියාමන දර්ශකයන් වන ශුද්ධ පොළී ආන්තිකය ක්‍රමක් ක්‍රමයෙන් වර්ධනය විය. එබැවින් ප්‍රකෘතිකරණ සැලසුම්, අහිතකර බලපෑම් සහිත අවස්ථාවන් වලදී නොසැලී ශක්තිමත් ලෙස එම පීඩනය දරා ගැනීමට සහ අභියෝග යන් ජයගනිමින් සියළු පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන් ආරක්ෂා කරමින් මූල්‍ය තත්ත්වය ස්ථාවරව පවත්වා ගෙනයාමට බැංකුවට උපකාරී වේ.

අවදානම් වාර්තා

වසර තුළ පැවති අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය යටතේ, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කාලීන, නිරවද්‍ය සහ විස්තීර්ණ අවදානම් වාර්තා සැපයීමේ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීමට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ක්‍රියා කරන ලදී. ණය, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, පොළී අනුපාත අවදානම සහ තොරතුරු ආරක්ෂාව සම්බන්ධ අවදානම, අවදානම් අතර අන්තර් යැපීම් සහ විභව අවදානම් අවම කිරීමේ උපායමාර්ග කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, නැඟී එන අවදානම් පිළිබඳ නිරන්තර පුළුල් විශ්ලේෂණය සහ අවදානම් හඳුනා ගැනීමේ පුවරු ඇතුළත් විස්තීර්ණ මාසික අවදානම් වාර්තා ආදිය මගින් අවදානම් කළමනාකරණ අධීක්ෂණය ශක්තිමත් කළේය.

බාසල් III නිර්ණායක විසින් නිශ්චිතව දක්වා ඇති නියාමන අවශ්‍යතා වලට අනුකූලව ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වාර්තා කිරීම් වාර්ෂික වාර්තාව, වෙබ් අඩවිය සහ මුද්‍රිත මාධ්‍ය හරහා සිදු කරන අතර, එමඟින් බැංකුව මුහුණ දෙන අවදානම් පිළිබඳව අර්ථවත් තක්සේරුවක් ලබාදේ.

අවදානම් සහ අවස්ථාවන්

ණය අවදානම

බැංකුවේ ණය අවදානම් කළමනාකරණ රාමුව "ත්‍රිත්ව ආරක්ෂක ආකෘතිය'' අනුව පාලනය කෙරෙනුයේ ණය ලබාදීම ආරම්භ වන මොහොතේ සිටමය. සමස්ත බැංකුව සිසාරා හා අවදානම් අභිරුචිය ඔස්සේ ඒකාකාර ලෙස ණය අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය, අවකරණය කිරීම හා වාර්තා කිරීම සඳහා ශක්තිමත් රාමුවක පිටුවහල ලැබේ.

යහපාලනය

බැංකුවේ ණය අවදානම්, නිර්වචනය කරන ලද අවදානම් අභිරුචිය තුළ කළමනාකරණය කිරීම සහතික කිරීමේ ඉහළ වගකීමක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) බැංකුවේ ණය අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාවට නැංවීමේ වගකීම දරන අතරම ණය අවදානම් කළමනාකරණයට අදාළ රාජකාරී සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

ණය කමිටුව

- ණය අවදානම් අභිරුචි සීමා සැකසීම, සමාලෝචනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- බලය ලත් සීමාවන් ඇතුළත ණය යෝජනා අනුමත/නිර්දේශ කිරීම
- බැංකුවේ අවදානම් ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ තුළ නියාමන අනුකූලතාව සහතික කිරීම
- ණය ආශ්‍රිත ප්‍රතිපත්ති නිර්දේශ කිරීම
- අවදානම් සංකේන්ද්‍රණය නිරීක්ෂණය කිරීම

ණය අවදානම් කළමනාකරණ ඒකකය

පළමු ආරක්ෂක මාර්ගය පිළිබඳව ස්වාධීන සමාලෝචනය සපයයි. බැංකුව සිසාරා ණය අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය

ණය ගුණාත්මකතාව සහතික කිරීමේ ඒකකය

විශාල ණය නිරාවරණයන් සම්බන්ධයෙන් අනුමැතියෙන් පසු සමාලෝචනය සිදු කරයි.

පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) ඒකකය

බැංකුවට සිය ණය කළඹේ පාරිසරික හා සාමාජීය අවදානම් කෙරෙහි නිරාවරණයන් හඳුනා ගෙන, කළමනාකරණය කරයි.

ප්‍රතිපත්ති රාමුව හා ක්‍රියාමාර්ගයන්

ණය අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ විස්තීර්ණ 'ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය' මගින් පහත දැක්වෙන ණය-පූර්ව අනුමැති හා ණය දීමෙන් පසුව නිරීක්ෂණ යාන්ත්‍රණයන් නියම කර ඇත.

පූර්ව ණය අනුමැතිය

- ව්‍යුහගත ණය ඇගයීම් යාන්ත්‍රණ හා නිශ්චිත ණය නිර්ණායක
- විවිධ මට්ටම්වල අනුමත කිරීමේ බලය හා ප්‍රධාන අවදානම් නිලධාරී විසින් ස්වාධීන සමාලෝචනය
- පැහැර හැරීම්, සංකේන්ද්‍රණ හා ප්‍රතිපාර්ශ්වීය වැනි ණය අවදානම් ප්‍රභේද සඳහා සීමා
- ණයගැති ශ්‍රේණිකරණ ආකෘති
- අවදානම්-පාදක මිලකරණය
- නියාමන සීමා

පශ්චිම - ණය නිරීක්ෂණය

- ක්‍රියාත්මකව ඇති හා දෘඪතර ණය සමාලෝචනය
- ණය කළඹ ඇගැයීම
- අවශ්‍යතාවන් හා ප්‍රත්‍යාබලයන් හඳුනා ගැනීමේදී ගනුදෙනුකරුවන් සමග පූර්ව-ක්‍රියාකාරී ලෙස නියැලීම
- ප්‍රත්‍යාබල පරීක්ෂාව හා සිද්ධි-රූපණ විශ්ලේෂණ
- අවදානම් සහිත නිරාවරණයන් නිරීක්ෂණය කිරීම
- ණය ගුණාත්මකතාව සහතික කිරීමේ ඒකකය විසින් ණය සමාලෝචන යාන්ත්‍රණය සහතික කිරීම
- පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා

2023 වර්ෂය තුළ ණය අවදානම් කාර්යසාධනය

- ආර්ථික කටයුතු පුනර්ජීවනය හා ප්‍රතිස්ථාපනය.
- බැංකුවේ පාරිසරික හා සාමාජීය ණය අවදානම සාර්ථකව තක්සේරු කිරීම.
- ණය ගුණාත්මකතාව සහතික වීමේ ඒකකය හරහා ණය අනුමත කිරීමෙන් පසු සමාලෝචන සිදු කිරීම.
- නිසි කලට ණය ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.

පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධතිය (ESMS)

මූල්‍ය ගනුදෙනුවල පාරිසරික හා සාමාජීය අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වූ කාර්යපටිපාටි පැහැදිලි කරන 'පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තියට' අනුකූලව බැංකුව විස්තීර්ණ 'පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති' මාර්ගෝපදේශ නිකුත් කර ඇත. තිරසාර හරිත මූල්‍යකරණය හා මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කරනු පිණිස බැංකු සේවා සුලභ කිරීමට සහයෝගය දෙන අතරම, පරිසරය, සමාජය හා යහපාලනය ආශ්‍රිත කාරණාවන් සමඟ බැඳුණු පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) මගින් බැංකුවේ ණය දීමේ ක්‍රියාකාරකම් හා මෙහෙයුම් පාරිසරික හා සාමාජීය වශයෙන් වගකීමෙන් යුතු වන බවටත්, ඒවා අදාළ නියාමනීය, පාරිසරික හා සාමාජීය ප්‍රමිතීන්, රටේ රෙගුලාසි මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විශිෂ්ටතම පිළිවෙත් සමඟ අනුකූල වන බවටත් වගබලා ගනී.

ලංකා බැංකුව ශ්‍රී ලංකාව තුළ වඩාත් හරිත හා තිරසාර ආර්ථිකයකට දායක වන 'නිසි පාරිසරික හා සාමාජීය අනවලස්භාවය' හරහා ඉඩප්‍රස්ථා හඳුනා ගැනීම මගින් අපගේ ගනුදෙනුකරුවන් සඳහා තිරසාර හා පාරිසරික වශයෙන් හිතකාමී යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය සහිතව, සිය ණය දීමේ කළඹ තුළ ඇති හරිත මූල්‍යකරණ ක්‍රියාකාරකම් හා දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම හා ඇගැයීම හරහා 'ශ්‍රී ලංකාව තුළ තිරසාර මූල්‍යය' සඳහා වූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය දෙයි.

අවස්ථාවන්

මූල්‍ය මැදිහත්වීම වැඩි දියුණු කිරීම
අරමුදල් කාර්යක්ෂමව මෙහෙයවන, අවදානම් කළමනාකරණය කරන සහ ආර්ථික වර්ධනයට සහාය වන ශක්තිමත් පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

හරිත මූල්‍යය වර්ධනය
හරිත මූල්‍ය නිෂ්පාදන සහ දේශගුණික අභියෝග වලට මුහුණ දෙමින් තිරසාර සංවර්ධනයට සහාය වන ණය කළඹ සංවර්ධනය කිරීම.


පෞද්ගලික අංශයේ ණය පදනම වැඩි කිරීම
බැංකු ණය කළඹ තව දුරටත් විවිධාංගීකරණය කරන අතරතුර ආර්ථික වර්ධනයට සහාය දීම.

පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපනය ඔස්සේ වත්කම්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
වසංගතයෙන් පසු ආර්ථිකයේ ඍණාත්මක බලපෑම්වලට ඔරොත්තු දීම සඳහා ව්‍යාපාර වලට සහාය ලබා දීම.


ඩිජිටල්කරණය හරහා ණය කළමනාකරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම.
ඩිජිටල්කරණය යොදාගැනීම හරහා ණය කළමනාකරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම.

ප්‍රධාන මූල්‍ය අංශවල ආර්ථික සංවර්ධනයට පහසුකම් සැලසීම
බැංකුවේ මූල්‍ය ශක්තිය උපයෝගී කර ගනිමින් රටේ ආර්ථික ශක්තිය වර්ධනය කිරීමට ආර්ථිකයේ ප්‍රධාන අංශ සඳහා ප්‍රාග්ධනය වෙන් කිරීම.


බැංකුව විදේශ රටවලට නිරාවරණය




භූගෝලීය සංකේන්ද්‍රණය




ක්ෂේත්‍රමය සංකේන්ද්‍රණය




ඇප සංකේන්ද්‍රණය



ශ්‍රේණි අනුව ව්‍යාප්තිය



අවදානම් සහ අවස්ථාවන්





වෙළඳපළ අවදානම යනු පොළී අනුපාත, විදේශ විනිමය අනුපාත, කොටස් මිල, භාණ්ඩ මිල සහ අනෙකුත් අදාළ මූල්‍ය දර්ශක වැනි වෙළඳපල විචල්‍යවල අහිතකර චලනයන් හේතුවෙන් පැන නඟින මූල්‍ය පාඩු සඳහා ඇති විභවතාවයි.

වෙළඳපළ අවදානම

වෙළඳපළ අවදානම ඇති වන්නේ පොළී අනුපාතික, විනිමය අනුපාතික, කොටස් මිල හා භාණ්ඩ මිල ගණන් වැනි විචල්‍යයන්හි ඍණාත්මක සංචලනය හේතුවෙනි. වෙළඳපළ අවදානම ණය දීමෙන් හා ආයෝජන හරහා පැන නඟින අතර, එයට පහත දේ ඇතුළත් වේ.

අවදානම් වර්ගය	කළමනාකරණ මෙවලම් සහ දර්ශක
පොළී අනුපාතික අවදානම - බැංකුවේ වෙළඳ හා වෙළඳ නොවන ආයෝජන වලින් පැන නඟින	• කල් පිරීමේ නොගැලපීම්, පොළී අනුපාතික පරතරයන් හා පාදක ලක්ෂ්‍යය සඳහා මිල වටිනාකම (PVBP) අඛණ්ඩ පදනමින් නිරීක්ෂණය කෙරේ. • සාර්ව ආර්ථික තත්ත්වයන්හි වෙනස් වීම්වල සංකූලතාවන් නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාවන් හරහා තක්සේරු කෙරේ. • පොළී අනුපාතික වෙනස්වීම්වල ප්‍රත්‍යාබල පරීක්ෂාවන් සිදු කෙරේ.
විදේශ විනිමය අවදානම - විදේශ මුදලින් දැක්වෙන ගනුදෙනු වලින් මතු වන අවදානම්	• අභ්‍යන්තරිකව හානිකර තත්ත්වයන් කළමනාකරණය කරනු පිණිස, තනි මෙන්ම සමස්තයක් වශයෙන් මුදල් ඒකක නිරාවරණයන්හි විවෘත තත්ත්වයන් සඳහා අවදානමේදී අගය (VaR) සීමාවන් හා පරිමා සීමාවන් යන මේවායින් සමන්විත විස්තීර්ණ සීමා ව්‍යූහයක් භාවිත කෙරේ. • එමෙන්ම බැංකුව ගෝචර වන විදේශ විනිමය සිද්ධි-රූපන පිළිබඳ ප්‍රත්‍යාබල පරීක්ෂාවන් සිදු කරයි. • අනුමැති යාන්ත්‍රණ, බාහිර නියාමන මාර්ගෝපදේශ හා බැංකුව හා නියාමන බලධාරියා විසින් නියම කරන ලද සීමාවන් ඇතුළු දැඩි අභ්‍යන්තර ප්‍රතිපත්ති මගින් විදේශ විනිමය ගනුදෙනු පාලනය කෙරේ.
ස්කන්ධ අවදානම - ස්කන්ධ මිල ගණන්වල විචල්‍යන් මත පැන නඟින අලාභ	• බැංකුවේ ආයෝජන තීරණයන් එහි අවදානම්-ආදායම් ගතිකයන් පිළිබඳ අපේක්ෂණයන් සමග අනුගතව ඇති බවට වගබලා ගනු පිණිස කැප වූ ආයෝජන කමිටුවක් ඇත. • ස්කන්ධ කළඹ නිසි ලෙස කළමනාකරණය කරනු පිණිස නිසි සීමා ව්‍යූහයක් ස්ථානගතව ඇති බවට වෙළඳපළ අවදානම් අංශය වගබලා ගනියි. • විස්තීර්ණ ප්‍රත්‍යාබල පරීක්ෂා විශ්ලේෂණයක් මගින් ස්කන්ධ අවදානම් කළමනාකරණ කාර්යය සඳහා උණ පූරණ සපයයි.

යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙළඳපළ අවදානම් කළමනාකරණ රාමුව සම්බන්ධයෙන් උපදෙස් සපයන අතර වෙළඳපළ අවදානමේ සියලු අංශ කළමනාකරණය කරන බව අධීක්ෂණය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ උපකමිටුවක් ලෙස, IRMC එහි අවදානම් කළමනාකරණය සහ අදාළ රාජකාරි අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුව (ALCO) සහ ආයෝජන කමිටුව බැංකුවේ වෙළඳපළ අවදානම කළමනාකරණය කිරීමේ වගකීම් දරන අතර IRMC වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO)

- මූල්‍ය වෙළඳපල ආශ්‍රිත වෙළඳපල අවදානම විශ්ලේෂණය කිරීම හා හානි අවකරණය කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- බලය පවරන ලද සීමාව ඇතුළත වෙළඳපල අවදානම් සීමාවන් නිර්දේශ කිරීම හා අනුමත කිරීම.
- ව්‍යවසාය සිසාරා වූ විවිධ වෙළඳපල අවදානම් නිරාවරණයන් අධීක්ෂණය කිරීම.
- උචිත මිලකරණ ව්‍යුහය නිර්දේශ කිරීම.

මහා භාණ්ඩාගාර අතරමැදි කාර්යාලය/වෙළඳපල ණය අවදානම් කළමනාකරණ ඒකකය

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයේ අතරමැදි කාර්යාලය භාණ්ඩාගාර මෙහෙයුම් සමාලෝචනය කරයි.

භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ අතරමැදි කාර්යාලයේ කර්තව්‍යයන් මූලික වශයෙන් වෙළඳපල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා සීමා කළමනාකරණ රාමුව හරහා පාලනය කෙරේ.

ප්‍රතිපත්ති රාමුව සහ ක්‍රමවේදයන්

වෙළඳපල අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ වෙළඳපල අවදානම් කළමනාකරණ රාමුව දෘඪතර කළමනාකරණ පිළිවෙත්වල වැදගත්කම හඳුනා ගෙන ඇති අතර එය වෙළඳපල අවදානම හඳුනා ගැනීම, ප්‍රමාණනය කිරීම හා කළමනාකරණය කිරීම පිණිස වූ නිරවුල්ව නිර්වචනය කරන ලද පාලන ව්‍යුහය, උපායමාර්ග සහ අවදානම් අවකරණය මෙවලම් හා කාර්යපටිපාටි මත පදනම්ව ඇත.

බැංකුවේ වෙළඳපල අවදානම් කළමනාකරණ කාර්යයේ මූලික සංරචක

වෙළඳපල අවදානම් ප්‍රතිපත්ති

වෙළඳපල අවදානම් ප්‍රතිපත්ති රාමුව පහත ඒවායින් සමන්විත වේ:-

- වෙළඳපල අවදානම ප්‍රතිපත්ති රාමුව
- සීමා කළමනාකරණ රාමුව
- විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- අතරමැදි කාර්යාලයේ මෙහෙයුම් පිළිබඳ කාර්යය සංග්‍රහය

ක්‍රියාත්මක වන සන්දර්භයෙහි වෙනස් වන ගතිකයන් සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කෙරේ.

අවදානම් සීමා

විදේශ මුදල් විවෘත තත්ත්ව සීමාවන්, ප්‍රතිපාර්ශ්ව සීමාවන්, නැවතුම් අලාභ සීමාවන් හා අලෙවි නියෝජිත සීමාවන් ඇතුළු භාණ්ඩාගාර හා ආයෝජන ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා අවදානම් සීමාවන් නියම කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම අභ්‍යාසය සඳහා වූ අවසාන වගකීම දරන අතර එයට වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුවේ සහයෝගය ලැබේ.

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වෙතින් ලැබෙන යෙදවුම් සමඟින්) නිතිපතා වෙළඳපල ප්‍රවණතාවන්ට අනුකූලව සීමාවන් සමාලෝචනය හා යාවත්කාලීන කරයි.

අවදානම් නිරීක්ෂණය

පොළී ආන්තිකයන්, විදේශ මුදල් නිරාවරණයන්, ස්කන්ධ නිරාවරණයන් හා අරමුදල් අවශ්‍යතාවන් ඇතුළු දර්ශක මාලාවක් හරහා වෙළඳපල අවදානම නිරීක්ෂණය කෙරේ.

නිරීක්ෂණ යාන්ත්‍රණය සඳහා අවදානමේදී අගය (VaR), පාදක ලක්ෂය සඳහා මිල වටිනාකම, කාලය, විතැන්වීම විශ්ලේෂණය, ප්‍රත්‍යාබල පරීක්ෂාව, සංවේදීතා විශ්ලේෂණය, සීමාවන් හා ශුද්ධ විවෘත ස්ථාවරයන් වැනි මෙවලම්වල ආධාරය ලැබේ.

2023 වර්ෂය තුළ මූලික වර්ධනයන්

- භාණ්ඩාගාර මෙහෙයුම් සඳහා අතිරේක අධීක්ෂණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කරන ලදී.

අධීක්ෂණ යාන්ත්‍රණයේ සඵලතාවය වැඩි දියුණු කිරීමට සහ වාර්තාකරණය පොහොසත් කිරීමට අමතර අවදානම් පරාමිතීන් කිහිපයක් ඇතුළත් කරමින් අධීක්ෂණ වසම පුළුල් කරන ලදී. පහත සඳහන් අවදානම් පරාමිතීන් දෛනික අධීක්ෂණ ක්‍රියාවලියට ඇතුළත් කර ඇත.

1. වෙළඳපලින් බැහැර විනිමය අනුපාත
2. ඉදිරි විනිමය ගිවිසුම් නොගැලපූ සීමාවන්
3. අන්තර් දින විවෘත ස්ථාවර සීමාව
4. ප්‍රතිපාර්ශ්වයන්ගේ ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල පූර්ව පියවීම් සීමාවන්

කළමනාකරණයට වාර්තා කිරීමේ විෂය පථය වැඩිදියුණු කිරීම සඳහා, දෛනික අවදානම් වාර්තාව එම අතිරේක අවදානම් පරාමිතීන් සමඟින් වැඩිදියුණු කරන ලදී.

- බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකය (NIM) වැඩි දියුණු කිරීම සඳහා අවදානම් පිළිබඳ අවබෝධය ලබා දී ඇත.

බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකය වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර පුළුල් ලෙස ආමන්ත්‍රණය කරන ලදී.


1. වත්කම් හා වගකීම්වල ප්‍රතිපත්ති අනුපාත සහ ව්‍යුහයට අනුකූලව පොළී අනුපාත ගැලපීම.
2. විදේශ විනිමය වත්කම් සහ වගකීම්වල ශුද්ධ පොළී ආදායම කෙරෙහි අවධානය යොමු කිරීම.
3. පොළී නොවන වත්කම් අඩු කිරීම
4. ශුද්ධ පොළී ආන්තිකය වැඩිදියුණු කිරීම සඳහා විචල්‍ය අනුපාත යාන්ත්‍රණ භාවිතය.
5. පොළී අනුපාත අවදානම අඩු කිරීම සඳහා නව හෙජින් ක්‍රම සොයා ගැනීම.
6. ජංගම හා ඉතුරුම් තැන්පතු වැඩිදියුණු කිරීම.

අවදානම් සහ අවස්ථාවන්


අවස්ථාවන්

- වෙළඳපළ අවකාශයේ නව ප්‍රවණතා භාවිතා කරමින් ද්‍රවශීලතාවය සහ ලාභදායිත්වය වැඩිදියුණු කිරීමට බැංකුව යම් යම් අවස්ථා අපේක්ෂා කරයි. විශේෂයෙන්, පොළී අනුපාත අඩු කිරීම සහ ආර්ථිකයේ විදේශ විනිමය ද්‍රවශීලතාවය ක්‍රමයෙන් වැඩි දියුණු කිරීම සමඟ අපනයන, ආනයන සහ සිල්ලර විදේශ විනිමය පරිවර්තනය වැනි වැඩි විදේශ විනිමය ගනුදෙනු හරහා පොළී අනුපාත අඩු කිරීම සහ වඩා හොඳ විනිමය වාසි සමඟ වඩා හොඳ ආන්තිකයක් ලබා ගැනීම සඳහා වත්කම් සහ වගකීම් කළමනාකරණ යාන්ත්‍රණයන් පෙළගැස්වීමට බැංකුවට අවස්ථාව තිබේ.


වත්කම් හා බැරකම් පිළිබඳ සංවේදීතා විශ්ලේෂණය - 2023 දෙසැම්බර්




අරමුදල් සංයුතිය




පාදක ලක්ෂ්‍යය සඳහා මිල වටිනාකම - භාණ්ඩාගාර බැඳුම්කර



වත්කම් හා බැරකම් කල්පිරීම පිළිබඳ විශ්ලේෂණය - 2023 දෙසැම්බර්





දුවශීලතාව අවදානම

බැංකුවේ මූල්‍ය වගකීම්භාරයන් පැන නඟින ඒ ඒ අවස්ථාවේදී සපුරා ලීමට නොහැකි වීම හේතුවෙන් ඉපැයීම් වලට සහ/හෝ ප්‍රාග්ධනයට ඇති විය හැකි අලාභයන් දුවශීලතා අවදානමට අදාළ වේ.

බැංකුවේ දුවශීලතා අවදානම් කළමනාකරණ රාමුව පදනම්ව ඇත්තේ උපායමාර්ග, යහපාලනය, ක්‍රියාවලි, පද්ධති හා දත්ත, ක්‍රමවේද හා වාර්තාකරණය මතයි. එය අනපේක්ෂිත දුවශීලතා අර්බුද වාතාවරණයන්ට මුහුණ දීමෙහිලා බැංකුවේ ප්‍රත්‍යාස්ථතාව සහතික කරයි.

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO)

- නියාමන අවශ්‍යතාවන්ට හා අභ්‍යන්තර ඉලක්ක වලට අනුකූලතාව සහතික කරනු පිණිස දුවශීලතාව ස්ථාවර ලෙස නිරීක්ෂණය කිරීම
- අසම්භව්‍ය දුවශීලතා සැලැස්මක් සකස් කිරීම
- දුවශීලතා අප්‍රමාණවත්කම් පියවීම හා විකල්ප අරමුදල් විධිවිධාන සඳහා මාර්ග ගවේෂණය කිරීම
- උචිත අවදානම් අභිරුචි සීමාවන් නිර්දේශ කිරීම
- ප්‍රත්‍යාබල පරීක්ෂාව ඇගයීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම

ප්‍රතිපත්ති රාමුව සහ ක්‍රමවේදයන්

දුවශීලතා අවදානම් කළමනාකරණ රාමුව

දුවශීලතා අවදානම් ප්‍රතිපත්ති

දුවශීලතා අවදානම කළමනාකරණය හා වත්කම් හා බැරකම් කළමනාකරණය වැනි ප්‍රතිපත්ති දුවශීලතා අවදානම් නිරාවරණයන් කළමනාකරණය කිරීමෙහිලා යොදා ගත යුතු යාන්ත්‍රණ, මෙවලම් හා ප්‍රත්‍යාබල පරීක්ෂා ක්‍රමවේද පිළිබඳව මාර්ගෝපදේශනය ලබා දෙයි.

දුවශීලතා මිනුම්

ප්‍රවාහ ප්‍රවේශය:- කාල පරාස තුළ ප්‍රක්ෂේපිත/තථ්‍ය ගලාඒම් හා ගලායාම් තක්සේරුව

අරමුදල් ප්‍රවේශය:- දුවශීල වත්කම් අනුපාතය, දුවශීලතා ආවරණ අනුපාතය, ශුද්ධ ස්ථාවර අරමුදල් සම්පාදන අනුපාතය හා තැන්පතු වලට ණය අනුපාතය ආදිය හරහා දුවශීලතා තත්ත්වය මනියි.

අසම්භව්‍යතා අරමුදල් සම්පාදන සැලැස්ම

මෙම සැලැස්ම මගින් දුවශීලතා පීඩනයකදී ව්‍යාපාරික අවිච්ඡින්නතාව සහතික කරනු පිණිස වගකීම් සහිතව විශේෂිත සිද්ධි-කාරකයන් හා ක්‍රියාමාර්ග සැලසුම් නිර්වචනය කෙරේ.

යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය දුවශීලතා කළමනාකරණ උපායමාර්ග, ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ අනුමත කිරීම සහ සමාලෝචනය කිරීම අධීක්ෂණය කරන අතර එහි නියෝජිත අනුකමිටුව, IRMC දුවශීලතාව අවදානම් කළමනාකරණය පිළිබඳ අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO) දුවශීලතා අවදානම් සඳහා වගකීම දරන අතර, නියාමන අවශ්‍යතාවන් සමග අනුකූල වීම හා අභ්‍යන්තර ඉලක්ක සපුරා ගැනීම සහතික වනු පිණිස බැංකුවේ දුවශීලතා තත්ත්වය ස්ථාවර ලෙස නිරීක්ෂණය කරයි.

2023 වර්ෂය තුළ වූ මූලික වර්ධනයන්

- ප්‍රධාන වශයෙන් සංක්‍රමණික සේවක ප්‍රේෂණවල ප්‍රතිඵලයක් ලෙස විදේශ මුදල් දුවශීලතා තත්ත්වයෙහි සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය.
- ප්‍රමුඛතා ගෙවීම් හරහා විදේශ මුදල් දුවශීලතාව දැඩි ලෙස කළමනාකරණය කිරීම
- ජංගම හා ඉතුරුම් තැන්පතු වැඩිදියුණු කිරීම

අවස්ථාවන්

- වෙළෙඳපළ තුළ විදේශ මුදල් දුවශීලතාවය ක්‍රමානුකූලව වැඩිදියුණු වීමත් සමඟ, අඩු වියදමකින් විදේශ මුදල් තැන්පතු ප්‍රවර්ධනය කිරීමේ අවස්ථා බැංකුවට ඇත.
- ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ දුවශීලතා ආතති තත්ත්වයන් සමනය කිරීමට වැඩි ණය ගැනීමේ අවස්ථා නිර්මාණය කිරීම.
- බැංකුවේ අසම්භව්‍ය අරමුදල් සැලැස්ම දුවශීලතා ආතතීන් ලිහිල් කිරීමට උපකාරී වේ.

අවදානම් සහ අවස්ථාවන්



මෙහෙයුම් අවදානම

ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන් නිසා ඇතිවන අලාභයේ අවදානම, පුද්ගලයන් සහ පද්ධති හෝ ස්වභාවික වැනි බාහිර සිදුවීම් වලින් විපත්ති මෙහෙයුම් අවදානම් ලෙස අර්ථ දක්වා ඇත. බැංකුවේ එම මෙහෙයුම් අවදානම් කළමනාකරණය මෙහෙයවනු ලබන්නේ ද්‍රව්‍යමය මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම, මැනීම, කළමනාකරණය, අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා සහාය වන මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව මගිනි.

යහපාලනය

බැංකුව තුළ මෙහෙයුම් අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වශයෙන් වගකිව යුතු අතර ක්‍රියාත්මක කිරීම සඳහා IRMC වගකීම දරයි. බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව, මෙහෙයුම් අවදානම් කළමනාකරණයට අදාළ රාජකාරී පිළිබඳ අධීක්ෂණය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

අවදානම් හඳුනාගැනීම සහ කළමනාකරණය මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC) සහ පළාත් මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව හරහා සිදු කෙරේ. ORMEC, වංචා අවදානම් කළමනාකරණ කමිටුව සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය, IRMC වෙත වාර්තා කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC)

මූලික වගකීම්

- බැංකුව තුළ මෙහෙයුම් අවදානම කළමනාකරණය සම්බන්ධයෙන් එහි ව්‍යවස්ථාපිත රාජකාරී සහ එහි වගකීම් ඉටුකිරීමට IRMC වෙත සහය වේ.
- මෙහෙයුම් අවදානම් උපායමාර්ග සහ ප්‍රතිපත්ති සංවර්ධනය සහ සමාලෝචනය
- යෝග්‍ය මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවක් පවතින බව නිරීක්ෂණය කිරීම සහ සහතික කිරීම
- මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම සඳහා සුදුසු පාලන/අවම කිරීම සාකච්ඡා කිරීම සහ නිර්දේශ කිරීම
- මෙහෙයුම් අලාභ සිදුවීම් සහ ආසන්න අතපසුවීම් වාර්තා කිරීමට යාන්ත්‍රණයක් ඇති බව සහතික කිරීම සහ සාධාරණ කාලයක් තුළ ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම
- බාහිර මෙහෙයුම් පරිසරයේ වර්ධනයන් සඳහා සුසංයෝගී සහ ස්ථාවර ප්‍රතිචාර සැකසීම.
- අන්තර් දෙපාර්තමේන්තු සහ අන්තර් ව්‍යාපාරික ඒකක වෙත ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීම.
- මෙහෙයුම් අවදානම් ක්‍රමවේද සහ මෙවලම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය කර අනුමත කිරීම.

වංචා අවදානම් කළමනාකරණ කමිටුව (FRMC)

මූලික වගකීම්

- වංචාව සිදු කිරීමට පහසුකම් සලසන පද්ධතිමය හිඩැස් ඇත්නම් ඒවා හඳුනා ගැනීම සහ එය නිවැරදි කිරීමට පියවර නිර්දේශ කිරීම.
- අවදානම් හඳුනාගැනීම ප්‍රමාද වීමට හේතු ඇත්නම්, බැංකුවේ ඉහළ කළමනාකාරිත්වයට වාර්තා කිරීම
- සියලුම වංචා සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල වගවීම සෑම මට්ටමකටම පරීක්ෂා කර ඇති බවටත් අවශ්‍ය නම් කාර්ය මණ්ඩල පාර්ශ්වයේ ක්‍රියාමාර්ග ගන්නා බවටත් සහතික වීම.
- බැංකුවේ/ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව/ පොලිස් විමර්ශන ප්‍රගතිය සහ ප්‍රතිසාධන තත්ත්වය අධීක්ෂණය
- අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම වැනි වංචාවන් නැවත සිදු නොවීමට ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීම.
- වංචාවට එරෙහි පියවර ශක්තිමත් කිරීම සඳහා අදාළ යැයි සැලකිය හැකි වෙනත් ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය

මූලික වගකීම්

- බැංකුවේ සියලුම මෙහෙයුම් අවදානම් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ කළමනාකරණය කිරීම
- සියලුම මෙහෙයුම් අවදානම් වලට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සහ කාලසීමාවන්ට අනුව ඒවායේ සමාලෝචනය සහතික කිරීම.
- අවදානම් සහ පාලනය කරන්න ස්වයං තක්සේරුව, ප්‍රධාන අවදානම් දර්ශක, අස්ථාන දත්ත කළමනාකරණය යනාදිය වැනි මෙහෙයුම් අවදානම් කළමනාකරණයට අදාළ මෙවලම් ක්‍රියාත්මක කිරීම සහ වැඩිදියුණු කළ පාලනයන් සහ අඩු අවදානම් ඉලක්ක කරා ක්‍රියා කිරීම.
- මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා නිෂ්පාදන/ ක්‍රියාවලි සමාලෝචනය සඳහා
- කාර්ය මණ්ඩලයට මෙහෙයුම් අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් නිති දැනුවත් කිරීම් සහ පුහුණු වැඩ සටහන් පැවැත්වීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය

ප්‍රතිපත්ති රාමු සහ ක්‍රමවේදයන්

මෙවලම් සහ යාන්ත්‍රණ

ප්‍රතිපත්ති රාමුව

මූලික ප්‍රතිපත්ති වලට ඇතුළත් වන්නේ:-

- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- තොරතුරු සුරක්ෂිතතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

මෙම ප්‍රතිපත්තීන් මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම, තක්සේරුව, අවකරණය හා නිරීක්ෂණය පිළිබඳ වගකීම්, මෙවලම් හා කාර්යපටිපාටි පිළිබඳ මාර්ගෝපදේශ දක්වයි.

අවදානම් හඳුනා ගැනීම හා මැනීම

අවදානම් හා පාලන ස්වයං තක්සේරු, (RCSA) රාමුව මගින් බැංකුවේ ව්‍යාපාරික අරමුණු, නිෂ්පාදිත හා මෙහෙයුම් ක්‍රියාවලි මගින් බිහිවන මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීමට හැකි වේ. වැදගත් ව්‍යාපාරික ඒකක සම්බන්ධයෙන් එම අවදානම් විනිශ්චය, පරීක්ෂණය හා පාලනයේ සඵලතාවය මැනීමක් සිදු වේ.

මෙහෙයුම් අවදානම වෙත නිරාවරණය ඇගයීමට මූලික අවදානම් දර්ශක, අභ්‍යන්තර අලාභ දත්ත හා මූල හේතුකාරක විශ්ලේෂණයද භාවිත කෙරේ.

වාර්තාකරණය හා නිරීක්ෂණය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කම්ටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය හිතිපතා මෙහෙයුම් අවදානම් සිදුවීම්/ අලාභයන් සහ පාලනවිධි අසාමාර්ථතා පිළිබඳව යාවත්කාලීන ලෙස දැනුවත් කෙරේ.

එමෙන්ම, ප්‍රවණතා හා මූල හේතුකාරක හඳුනා ගැනීමට ඉඩ සලසමින් බැංකුව මෙහෙයුම් අලාභයන් පිළිබඳ දත්ත සමුදායක්ද පවත්වා ගෙන යයි. අතිශය අවදානම් නිරාවරණයක් සහිත බැංකුවක් වශයෙන් මෙම බැංකුව සේවකයින්ට දැනුම බෙදාහදා ගැනීමට දිරිගන්වමින් අවදානම් සවිඥානක සංස්කෘතියක් පෝෂණය කිරීමට ප්‍රයත්න දරයි.

හානි අවකරණය

1. දෘඪතර අභ්‍යන්තර පාලන ව්‍යුහය
2. සියලු තීරණාත්මක ව්‍යාපාරික ඒකක සහ උපකාරක කාර්යයන් සඳහා ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලසුම්
3. අති නවීන ආපදා ප්‍රකෘතිකරණ කේන්ද්‍රය
4. විස්තීර්ණ රක්ෂණ ආවරණය
5. වැඩිදියුණු කිරීම් සඳහා අඛණ්ඩව ක්‍රියාත්මකව ඇති ක්‍රියාවලි ඇගැයීම
6. අවදානම් දැනුවත්භාවය පිළිබඳ සංස්කෘතියක් ඇති කිරීම

2023 වර්ෂය තුළ වූ වර්ධනයන්

- බැංකුවේ ගෝලීය මෙහෙයුම් හරහා ඇති විය හැකි අවදානම් සක්‍රීයව හඳුනා ගැනීමට සහ අවම කිරීමට IIRMD හි අඛණ්ඩ උත්සාහයන් යටතේ සුදුසු මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා පුළුල් ප්‍රශ්නාවලියක් හඳුන්වාදීම හරහා විදේශීය ශාඛාවල අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරන ලදී.
- බැංකුවේ තීරණාත්මක ඒකකවල අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව (RCSA) හරහා වැඩිදියුණු කරන ලද ක්‍රියාවලි පාලනයන්, කළමනාකරණ අධීක්ෂණයට පහසුකම් සපයන අවදානම් සහ පාලනය සඳහා තනි ප්‍රමිතියක් සහතික කරයි, ප්‍රශස්ත කරයි. සම්පත් භාවිතය සහ නියාමන අවශ්‍යතා සපුරාලයි.
- පළාත් ORMC හි ඵලදායී ක්‍රියාකාරිත්වයට අනුපූරක වන ශාඛා අවදානම් තක්සේරුවේ පිරික්සුම් ලැයිස්තුව සමාලෝචනය කර වැඩිදියුණු කරන ලදී.
- නව නිෂ්පාදනයක්/ක්‍රියාවලියක් හඳුන්වා දීමේදී සහ පවතින නිෂ්පාදන/ක්‍රියාවලීන් සමාලෝචනය කිරීමේදී අවදානම් ඉදිරි දර්ශනයක් සපයයි.
- සියලුම තරාතිරම්වල කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා "tvBOC" ඵලදායී ලෙස භාවිතා කිරීම, විශේෂයෙන්ම කළමනාකරුවන් සහ අභ්‍යන්තර පාලන නිලධාරීන් අලාභ සඳහා හේතු වන සිදුවීම් අවම කිරීමට යොමු කරයි.
- බැංකු පුරා චක්‍රලේඛ ප්‍රතිසංස්කරණය කිරීම: දශක අටකට අධික ඉතිහාසයක් ඇති බැංකුවක් ලෙස බැංකු ව්‍යාප්ත චක්‍රලේඛ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා BRRP සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිපෝෂණ සහ විශ්ලේෂණයන් සමඟ IIRMD ඒකකය විසින් විශේෂ කාර්යයක් සිදු කරනු ලැබේ.

අවස්ථාවන්

- **ස්වයංක්‍රීකරණය සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීම**

  අධීක්ෂණ යාන්ත්‍රණයේ ස්වයංක්‍රියකරණය නිරන්තරයෙන් දත්ත රැස් කර ස්වයංක්‍රීයව වාර්තාකරණයට මග පාදන අතර එමඟින් පෙර අවධානයට ලක් නොවූ ක්‍රියාවලීන්හි විස්තීර්ණ විශ්ලේෂණය සහ ගැටළු හඳුනා ගැනීමට හැකි වේ. මෙය ක්‍රියාවලීන්ගෙන් අති මහත් බහුතර මානව දෝෂ ඉවත් කිරීමට ද උපකාරී වේ.


- **වැඩිදියුණු කළ පාලන පරිසරය**


  වැඩිදියුණු කළ පාලන පරිසරය මඟින් ක්‍රියාවලි හුදෙක් අනුකූල මෙන්ම විශේෂයෙන් ඩිජිටල් පරිවර්තන ගමනේදී කාර්යක්ෂම බවද සහතික කරයි. අභ්‍යන්තර චක්‍රලේඛ යනු සේවකයින් සමඟ සන්නිවේදනය කිරීමට ඉතා ඵලදායී මාර්ගයක් වන අතර බැංකු පුරා ඇති චක්‍රලේඛ ප්‍රතිසංස්කරණය කිරීම මඟින් බැංකුව පුරා අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය විධිමත් කරනු ඇත.

- **පුහුණු කිරීම සහ දැනුවත් කිරීම**

  ඵලදායී ලෙස ක්‍රියාත්මක වන පුහුණු දෙපාර්තමේන්තුව, මනා සම්පත් අනූන මධ්‍යගත පුහුණු ආයතනයක් සහ බැංකුව සතු අභ්‍යන්තර රූපවාහිනී නාලිකාව සේවක සංවර්ධනයට විවිධ ආකාර වලින් දායක වේ. සේවක ඵලදායිතාව ඉහළ නැංවීම සහ බැංකුවේ සංස්කෘතිය වැඩිදියුණු කිරීම, කාර්ය සාධනය සහ පාලිත මෙහෙයුම් පරිසරයක් ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩ උත්සාහයන් මේ අතර වේ.

අවදානම් සහ අවස්ථාවන්





තොරතුරු සුරක්ෂිතතා හා තාක්ෂණවේද අවදානම

තොරතුරු සුරක්ෂිතතා හා තාක්ෂණවේද අවදානමට තොරතුරු, දත්ත සහ මුදල් අහිමි වීමේ හෝ බැංකුව තුළ තොරතුරු තාක්ෂණය භාවිතයේදී පැන නඟින විභව සේවා බිඳ වැටීම් ඇතුළත් වේ.

තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, ගනුදෙනුකාර දත්ත ආරක්ෂාව සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාවන්ට අභියෝග කරමින් සයිබර් ප්‍රහාර, තතුබෑම් වංචා හා දෘෂ්ඨ මෘදුකාංග සිද්ධීන් ඉහළ ගොස් ඇත. මෙම තර්ජන වලට ක්‍රියාශීලීව ආමන්ත්‍රණය කිරීමේ වැදගත්කම අවබෝධ කරගත් බැංකුව සිය ඩිජිටල් ආරක්ෂාව යාවත්කාලීන කිරීම සඳහා ආයෝජනය කිරීම දිගටම කරගෙන ගියේය.

යහපාලනය

ආයතනික තොරතුරු ආරක්ෂණ කමිටුව (CISC)

- තොරතුරු ආරක්ෂණ (IS) මූලපිරීම් සඳහා කළමනාකරණ මගපෙන්වීම සහ සහාය ලබා දීම.
- ව්‍යාපාරික අරමුණු වලට අනුකූලව තොරතුරු ආරක්ෂණ අරමුණු සහ සැලසුම් ස්ථාපිත කිරීම සහතික කිරීම.
- තොරතුරු ආරක්ෂණයෙහි නිශ්චිතව දක්වා ඇති ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි යෙදීම සහතික කිරීම ප්‍රතිපත්තිය (ISP).
- ලංකා බැංකුවෙහි තොරතුරු ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය පවත්වා ගැනීම සඳහා තොරතුරු ආරක්ෂණ සැලසුම් සහ වැඩසටහන් සමාලෝචනය කර සන්නිවේදනය කිරීම.
- CISO වෙත මඟ පෙන්වීම ලබා දීම.
- ආරක්ෂක මෙහෙයුම් වලට අදාළ සියලු අංශ අධීක්ෂණය කිරීම සහ ලංකා බැංකුවෙහි සමස්ත තොරතුරු ආරක්ෂාව මෙහෙයවීම.

තොරතුරු ආරක්ෂණ ඒකකය - ප්‍රධාන ක්‍රියාකාරකම්

- බැංකුවේ සහ විදේශීය ශාඛාවල ISP සංවර්ධනය, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- සමස්ත මෙහෙයුම් සහ නිෂ්පාදන පිළිබඳ විස්තීරණ අවදානම් තක්සේරු කිරීම්
- තොරතුරු ආරක්ෂණ සිද්ධීන් කළමනාකරණය කිරීම
- වත්මන් තොරතුරු ආරක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
- නීතිමය/නියාමනයට අනුකූල වීම අවශ්‍යතා/ප්‍රමිතීන්
- විවිධ නාලිකා හරහා සේවකයින්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය ශක්තිමත් කිරීම
- නිෂ්පාදන, බැංකුවේ ආරක්ෂක අවශ්‍යතා වලට අනුකූල බව සහතික කිරීම සඳහා ප්‍රසම්පාදන ආශ්‍රිත රැස්වීම් වලදී සම්පත්දායක වීම

තොරතුරු තාක්ෂණ අවදානම් ඒකකය - ප්‍රධාන ක්‍රියාකාරකම්

- පද්ධති අවශ්‍යතා, අලුතින් සංවර්ධනය කරන ලද පද්ධති සහ පවතින පද්ධති සඳහා සිදු කරන ලද වෙනස්කම් වල අවදානම තක්සේරු කිරීම.
- විදේශීය ශාඛා ඇතුළුව බැංකුවේ තොරතුරු තාක්ෂණ අවදානම් ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු තාක්ෂණ පාලනය ශක්තිමත් කිරීම.

ප්‍රතිපත්ති

- තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය
- සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- විදේශීය ශාඛා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති, තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති

2023 වර්ෂය තුළ වූ මූලික වර්ධනයන්

- දැනටමත් ක්‍රියාත්මක වූ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියට අමතරව, බැංකුව විසින් සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලදී.

- ප්‍රධාන අවදානම් නිලධාරී නායකත්වය යටතේ COBIT 2019 රාමුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. දැනට පවතින රාමු සහ ක්‍රියාවලීන් බැංකුවේ සමස්ත උපායමාර්ගය සමඟ පෙළගස්වන සහ තොරතුරු සුරක්ෂිතතාව, අනුකූලතාව සහ අවදානම් කළමනාකරණය පිළිබඳ පාලනය ශක්තිමත් කරන මෙම ගෝලීය වශයෙන් පිළිගත් තොරතුරු තාක්ෂණ පාලන රාමුව අනුගමනය කරන ශ්‍රී ලංකාවේ පළමු බැංකුව අපි වේ.
- ISO 27001 සමඟ පෙළගැසී ඇති අවදානම් තක්සේරු කිරීම් සම්පූර්ණ කිරීම.

- 2022 අංක 9 දරණ රහස්‍යතා දත්ත ආරක්ෂණ පනත බලාත්මක කිරීමට අනුකූලව දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කරන ලදී.
- තොරතුරු ආරක්ෂාව පිළිබඳ දැඩි දැනුවත් කිරීම සහ පුහුණු කිරීම

අවස්ථාවන්

- තොරතුරු තාක්ෂණ පාලන රාමුව ශක්තිමත් කිරීම සඳහා දත්ත ආරක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම.
- අපගේ නිෂ්පාදන පරාසය සහ ගනුදෙනුකාර ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ෆින්ටෙක්ස් සහ අගය එකතු කළ සේවා සපයන්නන් සමඟ හවුල්කාරිත්වය.
- ජාත්‍යන්තරව පිළිගත් COBIT 2019 රාමුව සමඟ ක්‍රියාවලි සහ රාමු පෙළගැසීම.

උපායමාර්ගික අවදානම

බැංකුවේ අනාගත ව්‍යාපාර සැලසුම්වල ඇති විය හැකි දෝෂ සහ උපායමාර්ග ප්‍රමාණවත් නොවීම සඳහා ඇති විය හැකි අලාභ මෙයට ඇතුළත් වේ. ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම් වලට සරිලන පරිදි බැංකුවේ උපායමාර්ග සංශෝධනය කිරීම සඳහා නිසි ප්‍රතිචාර සැලසුම් සකස් කිරීම උපායමාර්ගික අවදානම් කළමනාකරණය සඳහා අත්‍යවශ්‍ය වේ.

නිශ්චිත මැනිය හැකි කාල සීමාවන් ඉලක්ක කර ගනිමින් ලංකා බැංකුවෙහි ආයතනික සැලැස්ම තුළ ප්‍රකාශිත බැංකුවේ පුළුල් දැක්ම සහ මෙහෙවර මගින් බැංකුවේ උපායමාර්ගික දිශානතිය සපයනු ලබයි. බැංකුවේ උපායමාර්ගික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම සහ ආයතනික කළමනාකාරිත්වය සහ විධායක කළමනාකාරිත්ව කණ්ඩායමේ මැදිහත්වීම යටතේ මෙහෙයුම් සන්දර්භය සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවන්හි වෙනස්කම් සැලකිල්ලට ගනිමින් සංවර්ධනය කර ඇත. නිශ්චිත ඉලක්කවලට එරෙහිව කාර්යසාධනය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සිදු කරනු ලබන අතර උපායමාර්ගික අවදානම් නිරාවරණ මැනීම සඳහා විස්තීරණ ලකුණු පත්‍ර භාවිතා කරනු ලැබේ'

2023 වර්ෂය තුළ වූ මූලික වර්ධනයන්

- බැංකුවේ උපායමාර්ගික සැලැස්ම වසර පහක් සඳහා සංවර්ධනය කරන ලද අතර එය උපායමාර්ගික දිශානතිය තීව්‍ර කරන අතර බැංකුවට එහි පාර්ශ්වකරුවන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුළුල් සැලැස්මක් සැකසීමට හැකි වේ. ආයතනික උපායමාර්ගික සමාලෝචන කමිටුව විසින් පත් කරන ලද විශේෂ කමිටුවක් ඉදිරි වසර පහ සඳහා බැංකුවේ ව්‍යාපාර ආකෘතිය නැවත ස්ථානගත කිරීම සඳහා වන වෙනස්කම් අධ්‍යයනය කරන ලදී.

අවස්ථාවන්

මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම හා ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් කිරීම මඟින් බැංකුවේ වත්කම් වල ගුණාත්මකබවේ ඉලක්ක සපුරාලීමට, ණය බැඳීම් සපුරාලීමට හැකි වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) අඛණ්ඩ සහාය ඇතිව ආර්ථිකය යළි ගොඩනැගීමට සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී ප්‍රාග්ධනීකරණ ඉලක්ක සපුරා ගැනීමට හැකිවනු ඇත.

මානව සම්පත් අවදානම

අඛණ්ඩ අභියෝගාත්මක ආර්ථික පරිසරය සහ සමාජ-දේශපාලන තත්ත්වයන් බැංකුවේ මානව ප්‍රාග්ධනය මත පීඩනයක් ඇති කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුම සහ කුසලතා අත්පත් කර ගැනීමට අභියෝග ඇති වේ. මෙම සන්දර්භය තුළ බැංකුව සේවක යහපැවැත්ම, පුහුණුව සහ සංවර්ධනය මෙන්ම බැංකුවේ සේවකයින් ශක්තිමත් කිරීමට සහ ඔවුන්ගේ උපරිමයෙන් ක්‍රියා කිරීමට සන්නද්ධ කිරීමට කාර්යසාධනය හඳුනාගෙන ප්‍රතිලාභ ලබා දීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කළේය.

2023 වර්ෂය තුළ වූ මූලික වර්ධනයන්

- කළමනාකරණ අභ්‍යාසලාභීන් සහ මාණ්ඩලික සහායකයින් නව බඳවා ගැනීම් හරහා බැංකුවට දක්ෂතා අත්පත් කර ගැනීම හැකි විය.
- මානව ප්‍රාග්ධන කළමනාකරණයේ වෙනස්වන අවශ්‍යතා සඳහා නව මානව සම්පත් සම්බන්ධ ප්‍රතිපත්ති රාමු හඳුන්වාදීම සහ පවතින ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.
- අඛණ්ඩ සේවක සංවර්ධන වැඩසටහන්.
- සේවා මට්ටමට හානියක් නොවන පරිදි නම්‍යශීලී වැඩ කරන වේලාවන් සක්‍රීය කරමින් දුරස්ථ සේවා මත සිදුකරන පළමු අදියර බැංකුව තුළ සාර්ථක වී ඇත.
- සේවක නිල ඇදුම් සම්බන්ධ නම්‍යශීලී බව මානව ප්‍රාග්ධන කළමනාකරණ ඉතිහාසයේ ප්‍රධාන සන්ධිස්ථානයකි.

නියාමන හා අනුකූලතා අවදානම

නියාමන සහ අනුකූලතා අවදානම පැන නඟින්නේ බැංකු ක්‍රියාකාරකම් පාලනය කරන නීති, රෙගුලාසි සහ කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල නොවීමෙනි. 2023 දී, බැංකුව විසින් විචක්ෂණ රෙගුලාසි, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) අවශ්‍යතා, ගනුදෙනුකාර ආරක්ෂණ නීති සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ඇතුළුව සංකීර්ණ නියාමන පරිසරයක් නියාමකයින් සමඟ සමීප සහ ක්‍රියාශීලී ලෙස සම්බන්ධ වීමෙන් අඛණ්ඩව ගමන් කළේය. කැපවූ අනුකූලතා ඒකකයක් මාර්ගෝපදේශ සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරයි. විස්තීරණ අනුකූලතා ප්‍රතිපත්තියක් අනුකූලතා අවදානම් කළමනාකරණය පාලනය කරයි. අඛණ්ඩව දීප ව්‍යාප්ත පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ විදේශීය ශාඛා ඇතුළු ස්ථානීය අනුකූලතා තක්සේරු කිරීම් නියාමන සහ අනුකූලතා අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කරයි.

අවදානම් සහ අවස්ථාවන්

2023 වර්ෂය තුළ වූ මූලික වර්ධනයන්

- අනුකූලතා වාර්තාකරණ අවශ්‍යතා සඳහා ක්‍රියාත්මක කළ පද්ධති සංවර්ධනය.
- දීප ව්‍යාප්ත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ස්ථානීය අනුකූලතා තක්සේරුව.

දේශගුණය ආශ්‍රිත අවදානම

ස්වාභාවික විපත් ඇතුළු දේශගුණයට සම්බන්ධ අවදානම් සහ දිගුකාලීන දේශගුණික අනුගතවීම් සහ විසඳුම් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම, බැංකුව සහ එහි පාර්ශ්වකරුවන් මුහුණ දෙන ප්‍රධාන අවදානම් අතර වේ. දේශගුණික අවදානම ආමන්ත්‍රණය කිරීම සඳහා අපගේ අවදානම් කළමනාකරණ රාමු, උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලීන් සහ තීරණ ගැනීමේ පිළිවෙත් වලට දේශගුණ සලකා බැලීම් ඒකාබද්ධ කිරීම අවශ්‍ය වේ. මෙයට දේශගුණය ආශ්‍රිත අවදානම් සහ අවස්ථාවන් තක්සේරු කිරීම සහ හෙළිදරව් කිරීම, අවදානම් අවම කිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ තිරසාර මූල්‍ය සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ ප්‍රයත්නයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම ඇතුළත් වේ. දේශගුණික අවදානම ක්‍රියාශීලීව කළමනාකරණය කිරීමෙන්, ලංකා බැංකුව එහි ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම, මූල්‍ය අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ අඩු කාබන් මධ්‍යස්ථාන, දේශගුණික ඔරොත්තු දෙන ආර්ථිකයකට සංක්‍රමණය වීමට දායක වීම අරමුණු කරයි.

ප්‍රධාන මූල්‍ය නිලධාරී යටතේ කැපවූ ඒකකයක් පිහිටුවා ඇති අතර, බැංකුවේ ESG අංශය කළමනාකරණය කිරීම සඳහා සහකාර මහා කළමනාකරුවකු පත් කර ඇත. දේශගුණික අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ද ක්‍රියාත්මක කර ඇත. වටිනාකම් දාමය ඔස්සේ බැංකුවේ කැපවීම පුළුල් කරමින්, බැංකුවේ ESG මූලධර්ම වලට අනුකූලව පාරිසරික හා සමාජීය නිෂ්කාශනය ලබා දීම සඳහා බැංකුව රු. මිලියන 25 ට වැඩි ණය පහසුකම් විවක්ෂණශීලී සහ ප්‍රවේශමෙන් ඇගයීමට ලක් කරයි.

2023 වර්ෂය තුළ වූ මූලික වර්ධනයන්

- ශාඛා 52 ක් සූර්ය බලශක්තිය ලබා ගැනීම සඳහා පරිවර්තනය කරන ලදී. බැංකුව සතු සියලුම ගොඩනැගිලි 2024 වන විට එලෙස පරිවර්තනය කිරීමට නියමිතය.
- බැංකුවේ ණය ලබා දීමේ කළඹෙහි පාරිසරික හා සමාජීය අවදානම් තක්සේරු කිරීම සඳහා පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධතිය (ESMS) දිවයින පුරා සාර්ථකව දියත් කිරීම.
- පාරිසරික හා සමාජීය සලකා බැලීම් ඇතුළත් ආයෝජන විශ්ලේෂණය සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් වර්ධනය කිරීම සඳහා (ESMS) පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

අවස්ථාවන්

- තිරසාර මූල්‍යයන නිෂ්පාදන හඳුන්වා දීම
- ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතන සමඟ බැංකු සබඳතා ශක්තිමත් කිරීම

නෛතික හා කීර්තිනාම අවදානම

නෛතික සහ කීර්තිනාම අවදානම යනු නියාමන/ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන වලට අනුකූල නොවීම, නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් ඇති වන අවිනිශ්චිතතාවය හෝ බැංකුවට අදාළ අදාළ නීති හෝ රෙගුලාසිවල අදාළත්වය හෝ අර්ථ නිරූපණයෙහි අවිනිශ්චිතතාවය සහ පාර්ශ්වකරුවන්ගේ සෘණාත්මක අවබෝධය හේතුවෙන් බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් තත්ත්වය හා ඉපැයීම්වලට ඇති විය හැකි අලාභ සහ කීර්තිනාමය හානි ඇතුළත් වේ.

2023 වර්ෂය තුළ වූ මූලික වර්ධනයන්

- වෙනම ගනුදෙනුකාර පැමිණිලි හැසිරවීමේ ඒකකයක් පිහිටුවීම හරහා ගනුදෙනුකාර පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- සමාජ මාධ්‍ය භාවිතය වැඩි වීම කීර්තිනාම අවදානමට ඇති අවදානම පුළුල් කර ඇත. සමාජ මාධ්‍ය ප්‍රතිචාර හැසිරවීම සඳහා වෙනම ඒකකයක් පිහිටුවීම සමාජ මාධ්‍ය තුළ බැංකුවේ සෘණාත්මක ප්‍රතිචාර කළමනාකරණයට සාර්ථකව දායක වී ඇත.

අවස්ථාවන්

- ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තිරසාර පෙර දැක්මට අනුකූල වීමට අඛණ්ඩව උත්සාහ දරමින් බැංකුවේ කීර්තිනාමය ඉහළ නංවන පරිසර හිතකාමී ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘති සිදු කරයි.



7

මූල්‍ය ශක්තීන් උදෙසා ප්‍රමිතීන් සකස් කිරීම

සූර්යයාගේ පරිපූර්ණ ශක්තියෙන් ජීවය දියුණු කිරීම සහ පවත්වාගෙන යන පරිදි, ලංකා බැංකුවේ මූල්‍ය ශක්තිය මඟින් පාර්ශවකරුවන්ව බල ගැන්වීම සිදු කරනු ලබයි.

බැංකුවේ කාර්යසාධනය, මූල්‍ය ක්ෂේත්‍රයේ විශ්වාසය සහ ස්ථායීත්වය ලබා දෙන අතර එය දිගු කාලීන පැවැත්මට පදනමක් සපයයි.

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

1. හැඳින්වීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන් හි අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලද 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන විගණන වාර්තාව සමඟ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ කටයුතු පිළිබඳ සිය වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. තවද මෙම වාර්තාව තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ වන 2007 අංක 11 දරණ බැංකු පනත් නියාමනයන් සහ එහි පසුකාලීන සංශෝධනයන් මඟින් හා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති මඟින් දක්වන අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කරන හෙළිදරව් කිරීම් ද ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි 27 දින සමාලෝචනය කර අනුමත කරන ලදී.

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් යටතේ 1939 අගෝස්තු 1 දින ලංකා බැංකුව සංස්ථාපනය කරන ලද අතර 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් යටතේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වේ. බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව විසින් සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර නිකුත් කර ඇති අතර ඒවා කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත.

2. ව්‍යාපාර කටයුතු පිළිබඳ සමාලෝචනය

2.1 බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ප්‍රාථමික වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සමඟ ගනුදෙනු සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණය කාඩ් පත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් අදාළ මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

2.2 පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම්

පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක කරුණු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ පිටු අංක 176 හි ඇතුළත් වේ. සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි දක්වා ඇති වෙනස්වීම් හැරෙන්නට බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවය සමාලෝචිත වසර තුළදී සැලකිය යුතු තරමේ වෙනසකට භාජන වී නැත.

2.3 සමූහයේ සංයුතියේ වෙනස්වීම

වර්ෂය තුළ, සමූහයේ සංයුතියේ කිසිදු වෙනසක් සිදු වී නොමැති අතර, සමූහය පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 31 සහ 32 යටතේ පිටු අංක 245 සිට 253 දක්වා ඉදිරිපත් කර ඇත.

2.4 දැක්ම, මෙහෙවර සහ සංස්ථාපිත පරිචය

බැංකුවේ දැක්ම, මෙහෙවර සහ ආයතනික වටිනාකම් ප්‍රකාශනය මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 08 හි දක්වා ඇත. බැංකුව උසස්ම ආචාරධර්ම පද්ධතියකට අනුරූපව තම කටයුතු ඉටු කරන අතර එමඟින් දැක්ම, මෙහෙවර හා වටිනාකම් ප්‍රකාශනය යටතේ ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු කරා බැංකුව මෙහෙයවනු ලැබේ.

2.5 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ/සමූහයේ කාර්යසාධනය සහ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව විවරණයක් පිටු අංක 16 සිට 19 දක්වා අන්තර්ගත සභාපතිතුමාගේ පණිවිඩයෙහි ඇතුළත් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් පිටු අංක 20 සිට 23 දක්වා වූ මහා කළමනාකාරතුමාගේ සමාලෝචනයෙහි ඇතුළත් කර ඇත. බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පිළිබඳව "මූල්‍ය සමාලෝචනය" තුළ පිටු අංක 68 සිට 72 තෙක් දක්වා ඇති අතර, එම වාර්තාවලින් සාධාරණ සමාලෝචනයක් ඉදිරිපත් කර ඇති අතර, ඒවා මෙම වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.6 ශාඛා ව්‍යාප්තිය

ඩිජිටල් භාවිතය වැඩි දියුණු කරමින්, බැංකුව සිය ජාලය දිවයින පුරා මුදල් චක්‍රීකරණ යන්ත්‍ර 163 කින් වසර තුළ පුළුල් කළ අතර, සෘජු ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන 2,241 දක්වා වැඩි කරන ලදී. මෙම සංඛ්‍යාවට ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ විය හැකි අනෙකුත් බැංකුවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ පාසල් ඉතුරුම් මධ්‍යස්ථාන (සංසඳා) සහ ජංගම ඉතුරුම් ඒකක ඇතුළත් නොවේ.

රට තුළ පැවති ආර්ථික පසුබෑම හේතුවෙන් මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව බැංකුවේ ප්‍රාග්ධන වියදම් සමීපව නිරීක්ෂණය කරන ලදී. 2023 වර්ෂය තුළ බැංකුවේ භෞතික බෙදාහැරීමේ නාලිකා ජාලයට එක් ශාඛාවක් එක් කර ඇත.

2.7 ආයතනික පරිත්‍යාග

2023 වර්ෂය තුළ සිදු කරන ලද ආයතනික සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම් සඳහා බැංකුව රු. මිලියන 130 ක් පරිත්‍යාග කර ඇත (2022 - රු. මිලියන 60.1).

2.8 මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කරන ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට, 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන වලට, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති වලට අනුකූලවන ආකාරයට මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බවයි. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී 2007 අංක 07 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදන ද භාවිතා කර ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 159 හි ඉදිරිපත් කර ඇති අතර, එය මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාවේ සංකලිත කොටසකි.

2.9 විගණක වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා, ලංකා බැංකුවේ විගණක වශයෙන් පත්කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 160 සිට 164 තෙක් දක්වා ඇත.

2.10 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය සිය මූල්‍ය වාර්තා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං.ගි.ප්‍ර.) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.) අනුව පිළියෙල කරයි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 176 සිට 191 දක්වා ඇත.

3. සැලසුම්ගත සංවර්ධන කටයුතු

අනාගතය සඳහා බැංකුව විසින් සැලසුම්කර ඇති වර්ධනයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම වාර්ෂික වාර්තාවේ 16 සිට 19 දක්වා පිටුවල සභාපතිතුමාගේ පණිවිඩය සහ මහා කළමණාකාරතුමාගේ සමාලෝචනය පිටු අංක 20 සිට 23 දක්වා ඉදිරිපත් කර ඇත.

4. මුළු ආදායම

2023 වර්ෂය සඳහා සමූහයේ මුළු ආදායම රු. මිලියන 551,866.8 ක් වූ අතර එය පෙර වසරේ රු. මිලියන 520,891.2 ක් විය. බැංකුවේ මුළු ආදායම සමූහයේ මුළු ආදායමෙන් 98% (2022 - 99%) වේ. සමූහයේ ප්‍රධාන ආදායම පොලී ආදායම වන අතර එය මුළු ආදායමෙන් 96% (2022-89%) වේ.

5. ලාභාංශ සහ සංචිත

5.1 ලාභය සහ විසර්ජනයන්

2023 දී බැංකුව රු. මිලියන 40,342.4 ක බදු ගෙවීමට පෙර ලාභයක් වාර්තා කර ඇති අතර එය පෙර වසර සඳහා වාර්තා වූ රු. මිලියන 30,976.6 ට සාපේක්ෂව 30% ක වාර්තාගත ඉහළ අගයක් පෙන්නුම් කරයි.

රු. මිලියන 13,648.9 ක් ආදායම් බදු වියදමකින් පසු (2022 ආදායම් බදු ප්‍රතිවර්ත්‍ය රු. මිලියන 995.7) 2023 වර්ෂය සඳහා බදු පසු ලාභය රු. මිලියන 26,693.5 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය 2022 වර්ෂයේ වාර්තා වූ බදු පසු ලාභය වන රු. මිලියන 31,972.4 ට වඩා 16.5% ක අඩු වීමක් වේ.

ආදායම් බදු රු. මිලියන 14,155.4 ක් අය කිරීමෙන් පසු (2022 - බදු ප්‍රතිවර්ත්‍ය කිරීම රු. මිලියන 796.5), සමූහයේ වර්ෂය සඳහා බදු පසු ලාභය 2023 දී රු. මිලියන 27,617.6 කි (2022 - රු. මිලියන 31,849.0).

බැංකුවේ සහ සමූහයේ අදාළ ලාභය පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. මිලියන	2022 රු. මිලියන	2023 රු. මිලියන	2022 රු. මිලියන
සියලුම වියදම් දැරීමෙන් සහ ක්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන්, ක්‍රමක්ෂය, ණය හා අත්තිකාරම් සහ වෙනත් අලාභයන් සඳහා හානිකරණ ප්‍රතිපාදන හා අසම්භව්‍යන් සඳහා වෙන්කිරීමෙන් පසු, එහෙත් බදු පෙර වර්ෂයේ ලාභය	53,005.9	42,289.9	54,695.3	42,372.2
මූල්‍ය සේවා මත බදු	(12,663.5)	(11,313.3)	(12,955.8)	(11,442.5)
ආශ්‍රිත සමාගම්වල ලාභ/(අලාභ) කොටස, බදු පසු	-	-	33.5	122.8
ආදායම් බදු පෙර ලාභය	40,342.4	30,976.6	41,773.0	31,052.5
ආදායම් බදු (වියදම)/ප්‍රතිවර්ත්‍ය	(13,648.9)	995.8	(14,155.4)	796.5
වර්ෂය සඳහා ලාභය	26,693.5	31,972.4	27,617.6	31,849.0
වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු	(28,989.7)	27,806.9	(27,397.1)	32,230.3
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	(2,296.2)	59,779.3	220.4	64,079.3
විසර්ජනයන්				
ස්ථාවර සංචිත අරමුදලට මාරු කිරීම	(534)	(640)	(534)	(640)
ලාභාංශ	(173)	(346)	(173)	(346)

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

5.2 ලාභාංශ

සියලුම බදු, ණය අලාභයන් සඳහා වෙන්කිරීම් සහ සංචිත සඳහා අවශ්‍යවන්නා වූ මාරු කිරීම් යනාදිය සිදුකළ පසු ලාභය මත පදනම්ව බැංකුව විසින්, බැංකුවේ කොටස්කරු වශයෙන් ශ්‍රී ලංකා රජයේ උපදෙස් මත ලාභාංශ තීරණය කරනු ලැබේ. ඒ අනුව, 2023 වර්ෂය සඳහා ලාභාංශ ලෙස බැංකුව විසින් රු. මිලියන 173.2 ක මුදලක් ගෙවා ඇත (2022 - රු. මිලියන 346.4).

5.3 සංචිත

සමූහයේ මුළු සංචිත 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 245,727.9 ක් විය. (2022 - රු. මිලියන 245,743.6). සමූහයේ සංචිත පහත සඳහන් දෑ වලින් සමන්විත වේ.

	සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. මිලියන	2022 රු. මිලියන
ස්ථාවර සංචිත අරමුදල	15,665.0	15,131.0
මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය	5,251.5	25,620.6
ප්‍රත්‍යාගණන සංචිතය	33,687.4	27,558.1
නිදහස් සංචිතය	366.7	366.7
විනිමය පරිවර්තන සංචිතය	12,335.3	14,304.4
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	4,999.8	2,584.4
ව්‍යවස්ථාපිත සංචිතය	358.9	358.9
රඳවාගත් ඉපැයුම්	173,063.3	159,819.5
එකතුව	245,727.9	245,743.6

6. දේපළ, පිරියත හා උපකරණ

වර්ෂය තුළ දේපල පිරියත හා උපකරණ කල්බදු වත්කම් සහ අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රු. මිලියන 4,056.2 (2022-රු. මිලියන 4,195.2) වන අතර, ඒවා පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 255 සිට 273 දක්වා සහ 276 සිට 277 දක්වා ඇති සටහන් අංක 34 සහ 36 මගින් නිරූපනය කරයි.

7. නිදහස් දේපලවල අගය

2023 දෙසැම්බර් 31 දිනට සමූහය සතු නිදහස් දේපලවල වටිනාකම රු. මිලියන 38,748.4 (2022 - රු. මිලියන 31,125.9) ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන 34 හි ඇතුළත් කර ඇත.

8. ප්‍රකාශිත ප්‍රාග්ධනය හා කොටස් හිමිකම

8.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවූ ප්‍රාග්ධනය රු. මිලියන 25,000 (2022 - රු. මිලියන 25,000) විය. 2022 වර්ෂය තුළ දී රජයේ භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත ප්‍රාග්ධන දායකත්වය ලෙස රු. මිලියන 730.0 ක් ලබා දුන් අතර 2023 දෙසැම්බර් 31 අවසන් වන විට මෙම මුදල විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය යටතේ සටහන් කර ඇත.

8.2 කොටස් හිමිකම

බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජයයි.

9. යටත් කාලීන ණයකර/බැදුම්කර නිකුතුව

වසර තුළදී, බැංකුව දෙවන මට්ටමේ ප්‍රාග්ධන පදනමට සහය වීම සඳහා බාසල් III අනුකූල, ලැයිස්තුගත කළ, ශ්‍රේණිගත කළ, සුරැකුම් රහිත, යටත් කාලීන, ණයකර නිකුතුව හරහා සාර්ථකව රු. මිලියන 10,000.0 (2022 - රු. මිලියන 6,490.0) රැස් කර ඇත. මූල්‍ය තත්ත්වය ප්‍රකාශ දිනට හිඟ ණයකර පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල පිටු 297 සිට 299 දක්වා සටහන් 49 යටතේ දක්වා ඇත.

10. කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ කොටසක මූලික ඉපැයීම් සහ කොටසක ශුද්ධ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. 1,102.9 (2022 - රු. 1,279.8) සහ රු. 10,858.9 (2022 රු. 10,858.9) විය.

11. ආයතනික තිරසාරභාවය සහ වගකීම

ආයතනික තිරසාරභාවය සහ සමාජීය වගකීම් යටතේ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් පිළිබඳ විස්තරාත්මක සමාලෝචනයක් මෙම වාර්තාවෙහි අංක 103 සිට 109 දක්වා වූ පිටුවල "අපගේ සෑම ක්‍රියාවලියකදී ම විශ්වාසයේ තහවුරුව" යන අංශ යටතේ දක්වා ඇත.

12. අධ්‍යක්ෂ මණ්ඩලය

2023 වර්ෂය තුළ කටයුතු කළ අධ්‍යක්ෂවරුන්ගේ සහ මෙම වාර්ෂික වාර්තාව අත්සන් කරන දිනට නිලය දැරූ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පහත වගුවේ දක්වා ඇත. බැංකුවේ අධ්‍යක්ෂවරුන් බැංකුවේ විධායක තනතුරු දරන්නේ නැත. ඔවුන් බැංකුවට පුළුල් පරාසයක කුසලතා සහ අත්දැකීම් ගෙන එයි. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද මෙම වාර්ෂික වාර්තාවේ පිටු 28 සිට 31 දක්වා දක්වා ඇත. වාර්ෂික වාර්තාව අත්සන් කිරීමේ දිනය වන විට, නිලතල දරන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හයකි (6). 2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

12.1 අධ්‍යක්ෂක ලැයිස්තුව

ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ/සභාපති
(2023 ජනවාරි 20 වැනි දින පත් කරන ලදී, 2024 මාර්තු 13 වැනි දින ඉල්ලා අස්විය)

ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා

නිල බලයෙන් පත්වූ, ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ (පත්වීම ලද දිනය - 2020 අප්‍රේල් 28, නැවත පත්වීම ලද දිනය - 2023 අප්‍රේල් 29).

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.සේ.වී

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2021 ජනවාරි 08 වන දින පත් කරන ලදී, 2024 ජනවාරි 07 වන දින සිට අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීම නතර විය)

මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2023 මාර්තු 31 වැනි දින සිට පත් කරන ලදී).

නරේෂ් අබේසේකර මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2023 මැයි 04 වැනි දින සිට පත් කරන ලදී).

මූල්‍ය වාර්තා අත්සන් කරන දිනට සිටින අධ්‍යක්ෂ මණ්ඩලය,

කාවන් රත්නායක මහතා

2024 මාර්තු 14 ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ/සභාපතිතුමා ලෙස පත් කරන ලදී.

ජෙහාන් ස්මයිල් මහතා

2024 පෙබරවාරි 07 වැනි දින ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.

ජයමින් පැල්පොල මහතා

2024 පෙබරවාරි 22 වැනි දින ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.

ඒ අනුව වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලය පහත පරිදි වේ.

අධ්‍යක්ෂවරයාගේ නම	විධායක/විධායක නොවන බව	ස්වාධීන/ස්වාධීන නොවන බව
කාවන් රත්නායක මහතා	විධායක නොවන	ස්වාධීන
ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා	විධායක නොවන නිල බලයෙන් පත්වූ	ස්වාධීන නොවන
මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ	විධායක නොවන	ස්වාධීන
නරේෂ් අබේසේකර මහතා	විධායක නොවන	ස්වාධීන
ජෙහාන් ස්මයිල් මහතා	විධායක නොවන	ස්වාධීන
ජයමින් පැල්පොල මහතා	විධායක නොවන	ස්වාධීන

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම් අනුව අධ්‍යක්ෂකවරු, ස්වාධීන/ස්වාධීන නොවන අධ්‍යක්ෂකවරුන් ලෙස වර්ග කර ඇත.

12.2 අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුව

බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය සහ බැංකුවේ කටයුතු මනාව පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පහක් (5) පිහිටුවා ඇත. උපකමිටු සංයුතීන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 122 සිට 131 දක්වා උප කමිටු වාර්තාවල සඳහන් කර ඇත.

12.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීවලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 116 වන පිටුවේ දක්වා ඇත.

12.4 ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

බැංකුව සමග ඇති ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂකවරුන්ගේ සෘජු සහ වක්‍ර ඇල්ම පිළිබඳව දත්තයන් 155 පිටුවෙහි විස්තර කර ඇත. මෙම ඇල්ම පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂකවරු විසින් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලදී අනාවරණය කර ඇත. ඉදිරිපත් කර ඇති ගිවිසුම් වලට අමතරව කිසිම අධ්‍යක්ෂකවරයෙකු වෙනත් සෘජු හෝ වක්‍ර ඇල්මක් බැංකුව සමග ඇති කරගෙන නොමැති අතර, අනාගතයේදී යෝජිත ගිවිසුමකට සම්බන්ධයක් හෝ නොමැති බව ප්‍රකාශ කෙරේ.

12.5 බැංකුව/සමූහය මඟින් නිකුත්කර ඇති ණයකර පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

කිසිදු අධ්‍යක්ෂවරයෙකුගේ නමින් ණයකර ලේඛණගත කර නොතිබිණි.

12.6 අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා/ගාස්තු

අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන දීමනා/ගාස්තු සියල්ලම, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද, 2015 ජුනි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී ඊ ඩී 3/2015, 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී ඊ ඩී 01/2020 සහ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව සිදු කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ තොරතුරු පිටු අංක 200 හි සටහන් 17 යටතේ දක්වා ඇත.

13. අවධානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

13.1 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් ගනු ලැබූ නිශ්චිත ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ පිටු 132 සිට 148 දක්වා විස්තර කර ඇත.

13.2 අභ්‍යන්තර පාලනය

බැංකුව තුළ විගණන කමිටුව හරහා වඩාත් ඵලදායී සහ විස්තීරණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ.

විගණන කමිටුව විසින් භාරකාර වගකීම නිදහස් කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දෙනු ලැබේ. විගණන කමිටුවේ සභාපතිතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 122 සිට 123 දක්වා ඇත. සමාලෝචනයට පාත්‍ර වූ වර්ෂය තුළ මූල්‍ය වාර්තාව සහ වාර්ෂික වාර්තාව නිකුත් කල දිනය දක්වා වූ අභ්‍යන්තර

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

විගණන පාලන පද්ධතියෙහි ඵලදායිතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම්වල විධි විධාන අංක 3(8) (ii) (ආ) අනුව අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳව වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කර ඇත. ඉහත සඳහන් වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 156 සහ 157 හි ඇතුලත් කර ඇත. මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සාධාරණ තහවුරුවක් ලැබෙන පරිදි නිර්මාණය කර ඇති බවටත්, බාහිර පාර්ශ්වයන්ට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශ, අදාළ හිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වන ආකාරයෙන් සකස් වී තිබෙන බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය මත සහතිකවීමේ වාර්තාවක් විගණකාධිපතිතුමාගෙන් ලබාගෙන ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 158 හි දක්වා ඇත.

14. ආයතනික යහපාලනය

වඩාත් ඵලදායි ආයතනික යහපාලන රාමුවක් සහ ක්‍රියාවලීන් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටියි. බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාකාරකම් ආයතනික යහපාලන පරිචයට අනුකූල වන පරිදි මෙහෙයවීම සහ කාර්යක්ෂමව පාලනය කිරීම සිදු වේ. වාණිජ බැංකුවල නියාමක වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට මෙම පද්ධතීන් සහ පරිචයන් අනුකූල වන අතර, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 111 සිට 121 දක්වා ඇති "ආයතනික යහපාලනය" යටතේ සවිස්තරාත්මකව සඳහන් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉහත දැක්වූ 2007 අංක 11 විධිවිධානයන්ට අනුකූලවීම මත විගණකාධිපතිතුමාගෙන් වාර්තාවක් ලබා ගෙන ඇත.

15. මානව සම්පත

බැංකුව සතු ඉහළ වටිනාකමක් සහිත සම්පතක් ලෙස එහි සේවකයන් සලකන අතර, ඔවුන්ගේ සංවර්ධනය බැංකුවට ඉතාමත් වැදගත් වනු ඇත. සංස්ථාපිත අරමුණු ඉටු කර ගැනීමේදී ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ඉතා වටිනා මෙම මානව ප්‍රාග්ධනය තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියක් ගෙන ඇත. බැංකුවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ පරිචයන්, "ජයග්‍රාහී, දක්ෂ සහ විවිධත්වයෙන් යුතු කණ්ඩායමක්" යටතේ විස්තර කර ඇති අතර එය පිටු අංක 90 සිට 97 දක්වා ඇතුලත් කර ඇත.

16. නීති රීති සඳහා වූ අනුකූලතාවය

අධ්‍යක්ෂවරුන්, ඔවුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව මෙම වාර්තාවේ 119 පිටුවේ "අනුකූල නොවීම" යටතේ හෙළිදරව් කර ඇති දේ හැර නීති හා රෙගුලාසි වලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක් සමූහය විසින් සිදු කර නොමැති බව තහවුරු කරයි.

මෙම වාර්තාවේ අංගයක් වන "අනුකූලතා ඇමුණුම්" යන කොටස යටතේ 353 සිට 400 දක්වා පිටුවල බැංකුවේ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම පිළිබඳ විස්තර දක්වා ඇත.

17. සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය පරිදි සහ බැංකුවේ නීතිඥයින් විසින් තහවුරු කළ පරිදි දැනට බැංකුව විසින් මෙහෙයවනු ලබන තවමත් සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම් වලින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ අනාගත මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් අහිතකර බලපෑමක් සිදු වෙතැයි අපේක්ෂා නොකෙරේ.

18. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට ගෙවිය යුතු සහ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත කාලයේ සිදු කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසයෙන් තහවුරු කරයි.

19. පාරිසරික ආරක්ෂාව

පරිසරයට අයහපත් ප්‍රතිපල ළඟා කරදෙන කිසිම ක්‍රියාකාරකමක බැංකුව නිරත වී නැත. තවද පරිසරය රැකගැනීමේ අරමුණින් ගත් පියවර පිටු අංක 103 සිට 109 දක්වා "අපගේ සෑම ක්‍රියාවලියකදී ම විශ්වාසයේ තහවුරුව" යන මාතෘකාව යටතේ දක්වා ඇත.

20. ශේෂ පත්‍ර දිනෙන් පසු සිදු වූ සිද්ධීන්

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ගැලපීමක් හෝ හෙළිදරව්වක් සිදු කළ යුතු කිසියම් ප්‍රමාණාත්මක සිද්ධියක් ශේෂ පත්‍ර දින හා මෙම වාර්තාව නිකුත් කළ දින අතර කාල පරාසය තුළ සිදු වී නැති බවයි.

21. අඛණ්ඩභාවය

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩ පවැත්ම යන සංකල්පය භාවිතාකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 අප්‍රේල් 03 දින කොළඹ දීය.

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි අවශ්‍යතාවන්ට අනුකූලව, "සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ අනාවරණය" විස්තරාත්මක වශයෙන් මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 61 හි දක්වා ඇත.

අතිරේක වශයෙන්, සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති හෝ අධ්‍යක්ෂධූර දරණ අනෙකුත් ආයතනයන් සමඟ කරන ලද ගනුදෙනු සම්බන්ධව විස්තරයක් පහත දැක්වේ.

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2023 '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2022 '000
රොනල්ඩ් සී පෙරේරා මහතා (2023 ජනවාරි 20 දින ලංකා බැංකුවේ සභාපති වශයෙන් පත්විය)					
සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	සභාපති	ජංගම ගිණුම්		11,414	-
		ඉතිරිකිරීමේ ගිණුම්		49	-
		ස්ථාවර තැන්පතු		6,295,823	-
		බැංකු අයිරා	10,000	-	-
සී/ස හොටෙල් කළම්බු (1963) සමාගම	සභාපති	ජංගම ගිණුම්		1,568	3,105
		ස්ථාවර තැන්පතු		96,474	87,918
		බැංකු අයිරා	41,000	41,521	36,989
		ණය		231,883	227,308
		වෙනත් ලැබිය යුතු ශේෂයන්		164,699	87,290
සී/ස ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම	සභාපති	ජංගම ගිණුම්		35,001	9,863
		ස්ථාවර තැන්පතු		3,945,360	3,235,160
		ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්		62,400	167,953
ලංකා බැංකුව (යූ.කේ) සමාගම	සභාපති	ජංගම ගිණුම්		19,378	14,186
		ඉතිරිකිරීමේ ගිණුම්		42	48
		නොස්ට්‍රෝ ගිණුම්		ඇ.ඩො. 1,725	ඇ.ඩො. 783
				558,689*	284,331*
				ම.බ්‍රි.ප 846	ම.බ්‍රි.ප 826
				349,273*	361,250*
				යුරෝ 1,719	යුරෝ 1,316
				616,790*	509,039*
		බැංකු වල ඇති තැන්පතු		ඇ.ඩො. 6,000	ඇ.ඩො. 8,000
				1,943,540*	2,904,880*
				ම.බ්‍රි.ප 10,700	ම.බ්‍රි.ප 52,000
				4,414,964 *	22,742,086*
ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා (2020 අප්‍රේල් 28 වන දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත්විය.)					
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව	නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		27,678	82,492
		ස්ථාවර තැන්පතු		654	645
		බැංකු අයිරා		4	-
සී/ස කොළඹ නෙළුම් කුළුණ කළමණාකරණ (පුද්ගලික) සමාගම	විධායක නොවන අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		92,708	-
		ස්ථාවර තැන්පතු		156,222	-

* ශ්‍රී ලංකා රුපියල් වලට සමාන අගය

සටහන: මුදල් වීකක නිශ්චිතව සඳහන් නොකළ සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

වගකීම

2007 අංක 11 දරණ බැංකු පනත් විධානයෙහි 3 (8) (ii) (ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා බැංකුවෙහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මතාවය සහ සඵලදායීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. මෙහිදී බැංකු කටයුතු වලට අදාළ අවදානම් හා ප්‍රතිඵල සමබර ලෙස කළමනාකරණය කළ යුතු අතර, බැංකුවේ අවදානම් අභිරුචිය පිළිබඳ සීමා හා දර්ශකවල විචල්‍යතා ඉස්මතුවන සේ අභන්තර පාලන පද්ධති මූලික වශයෙන් නිර්මාණය කරයි. මේ අනුව මූල්‍ය තොරතුරු හා වාර්තා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බව හෝ මූල්‍ය අලාභයන් හෝ වංචා වලට විරෙහිව අභ්‍යන්තර පාලන පද්ධතීන්ට ලබා දිය හැක්කේ පූර්ණ සහතිකයක් නොව සාධාරණ සහතිකයක් පමණි.

බැංකුව විසින් මුහුණපෑ හැකි සැලකිය යුතු අවදානම් කාරකයන් හඳුනා ගැනීම, ප්‍රමාණ නිර්ණය, නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ අඛණ්ඩව බලපැවැත්වෙන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කර ඇත. ව්‍යාපාර පරිසරයේ සහ ව්‍යවස්ථාපිත මඟ පෙන්වීම් වල සිදු වන වෙනස්වීම් වලට අනුරූපීව මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමද මෙයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් බැංකු අධ්‍යක්ෂවරුන් හට මඟ පෙන්වීම සඳහා නිකුත් කර ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව උපයෝගී කර ගනිමින් සහ ඒ අනුව යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරතුරුවම ඉහත සඳහන් ක්‍රමවේදය නිරීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන කටයුතු නිරීක්ෂණයේ දී ඉහත මඟපෙන්වීමෙහි සඳහන් පරිදි අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේ මූලධර්ම යොදාගෙන ඇත.

දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති සාධාරණ සහතික ප්‍රතිඥාවක් ලබා දීමට ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. තවද බාහිර උපයෝගීතාවය සඳහා පිළියෙළ කරන මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

මතු වූ අවදානම් හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට මෙන්ම එම අවදානම් අවම කිරීමට හා පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන විධි නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මඟින් අවදානම් සහ පාලනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග භාවිතයට කළමනාකාරිත්වය සහය දක්වනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම හා සඵලදායිතාවය සමාලෝචනය කිරීමේදී අනුගමනය කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මකභාවය සහ සංගතභාවය සමාලෝචනය කිරීමට ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රමවේදයන්හි පහත දැ ඇතුළත් වේ:

- බැංකුවෙහි දෛනික කටයුතුවල සඵලතාවය සහ බැංකුවේ සමස්ත මෙහෙයුම් අනුමත කළ ආයතනික සැලැස්ම මඟින් උකහා පිළියෙළ කල ආයතනික අරමුණු, උපක්‍රම සහ වාර්ෂික අයවැය අනුව පවතීද, යන්න සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය පිණිස විවිධ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත.

- බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය නියැදි සහ චක්‍රීය ක්‍රියා පටිපාටි භාවිතා කරමින් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය පිළිබඳව අඛණ්ඩව පරීක්ෂා කරන අතර එමගින් සොයා ගනු ලබන කිසියම් අනුගත නොවීම් සම්බන්ධයෙන් අවධානයට ලක් කරනු ලබයි. සියලු අංශවල සහ ශාඛාවල විගණනයන් පවත්වනු ලබන අතර, ස්වාධීන හා විෂය මූලික වාර්තාවක් සැපයීම සඳහා විගණනයෙහි වාර ගණන ඇගයීමට ලක්වූ අවදානම මත තීරණය වේ. වාර්ෂික විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශයේ සොයාගැනීම් ඔවුන්ගේ නිරන්තර රැස්වීම්වලදී සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

- නියාමන අධිකාරීන්, කළමනාකාරිත්වය, අභ්‍යන්තර හා බාහිර විගණකයින් විසින් හඳුනාගත් අභ්‍යන්තර පාලනය පිළිබඳ ගැටළු අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවධානය යොමු කර අවදානම් කළමනාකරණයෙහි සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සිදු කරයි. අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය සහ විෂය පථය පිරික්සීමද විගණන කමිටුව මඟින් සිදු කරයි. සියලුම විගණන කමිටු රැස්වීම් වාර්තා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. බැංකුවේ විගණන කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණය පිටු 122 සිට 123 දක්වා විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත.

- මූල්‍ය වාර්තාකරණයට අදාල අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේදී බැංකුවේ අදාල නිලධාරීන් විසින් මූල්‍ය ප්‍රකාශනයන්හි වැදගත් ගිණුම්කරණ සහ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ සියළු ක්‍රියා පිළිවෙත් සහ පාලනයන් සිදු කරන ලදී. එම සැලැස්මේ උචිතභාවය හා සඵලතාවය පිළිබඳ අභ්‍යන්තර විගණන අංශය විසින් නැවත නිරීක්ෂණය කරන ලදී. මෙම ඇගයීමට බැංකුවේ පරිපාලිත සමාගම් ඇතුළත් නොවේ.

- බැංකුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" 2018 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුගත වන ලදී. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.- 9 හි අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා, බාහිර උපදේශකයෙකුගේ සහාය ඇතිව හානිකරණ ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා පුළුල් පරාසයක පුරෝකථන ආර්ථික අවස්ථා භාවිතා කරමින් බැංකුව අපේක්ෂිත ණය අලාභ (ECL) ආකෘති නිර්මාණය කරන ලදී. වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ඇතිව අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම ආකෘති තහවුරු කර ඇත. 2022 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. - 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අංක 13 සහ 14 උපදෙස් වලට අනුකූල වීමට බැංකුව ප්‍රමාණවත් පියවර ගෙන ඇති අතර එය අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර ඇත.

- මූල්‍ය උපකරණ වඩාත් සඵලදායීව හා කාර්යක්ෂමව හඳුනා ගැනීම, මැනීම, වර්ගීකරණය හා අනාවරණය කිරීම යන අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහ "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ" ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා බැංකුව ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් යොදාගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරමින් සිටී. ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ ඇති හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීමට හැකි වන අතර අභ්‍යන්තර හා බාහිර වාර්තාකරණ අවශ්‍යතා සපුරාලීමට පහසුකම් සපයයි.

- විදේශ මුදල් මූල්‍ය උපකරණ සහ ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ ප්‍රතිපාදන සම්පාදනය කිරීමේදී 2023 වර්ෂය තුළදී බාහිර පරිසරයේ සිදු වූ වෙනස්කම් බැංකුව අඛණ්ඩව අගය කළේය. ඒ සඳහා රජය ගෙන ඇති දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම, උද්ධමනයේ වෙනස්වීම් සහ පොළී අනුපාත ඇතුළු මූල්‍ය හා ආර්ථික ආතතීන් ලිහිල් කිරීම වැනි දැඩි ක්‍රියාමාර්ග මේ සම්බන්ධයෙන් සැලකිල්ලට ගන්නා ලදී.

- බැංකුව, රජය විසින් හඳුන්වා දෙන ලද සහන පැකේජවලට අනුකූලව 2023 දී ද කොවිඩ්-19 මඟින් පීඩාවට පත් වූවන්ට අඛණ්ඩව සහන සලසන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 - "මූල්‍ය උපකරණ" යටතේ අපේක්ෂිත ණය අලාභ (ECL) ආකෘති භාවිතා කරමින් හානි ප්‍රතිපාදන තක්සේරු කිරීමේදී සංචාරක ව්‍යාපාරය, ඉදිකිරීම් සහ රෙදිපිළි වැනි අවදානම් සහිත කර්මාන්තවල නියැලෙන බැංකුවේ ගනුදෙනුකරුවන්ට කොවිඩ් -19 හි පවතින බලපෑම ද සලකා බලන ලදී.

- විචක්ෂණ පදනමක් මත, 2023 සඳහා අපේක්ෂිත පාඩු ගණනය කිරීමේදී 2023 මැද භාගයේදී භාවිතා කරන ලද ආර්ථික සාධක ගැලපීම (EFA) බැංකුව විසින් අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදී. මන්ද, කළමණාකාරිත්වයේ අදහස වනුයේ 2023 වසර අවසාන වන විට ආර්ථික සාධක ගැලපීම් වලට හේතු වන ආර්ථික පරාමිතීන්හි හිතකර චලනයන් ග්‍රහණය කර ගැනීමට හැකියාවක් නොමැති බවයි.

- ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ මැනීම සඳහා නියාමකයා විසින් නිකුත් කරන ලද උපදෙස් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් බැංකුවේ විවිධ විෂයයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කරයි.


- බැංකුවේ සහ විදේශීය ශාඛාවල ණය හා අත්තිකාරම්, මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්, අවදානම් කළමනාකරණයට අදාළ පාර්ශ්වීය ගනුදෙනු සහ වෙනස්වන නියාමන සහ වෙළඳපළ තත්ත්වයන් මත පදනම්ව අනෙකුත් සියලුම වැදගත් බැංකු ක්‍රියාකාරකම්වලට අදාළ අන්තර් ක්‍රියා පටිපාටිය බැංකුව විසින් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරයි. පුහුණු සහ දැනුවත් කිරීමේ සැසි මඟින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර./ලං.ගි.ප්‍ර සහ නියාමන උපදෙස් යටතේ ඇති අවශ්‍යතා අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කර ඇත.

- පෙර වර්ෂයන්හි මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකයින්ගේ නිර්දේශයන් සමාලෝචනය කර යෝග්‍ය නිවැරදී කිරීමේ ක්‍රියාමාර්ග වර්ෂය තුළ දී ගන්නා ලදී. මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ දී බාහිර විගණක නිර්දේශයන් සම්බන්ධයෙන් අනාගතයේ ක්‍රියා කරනු ඇත.

සහතික කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලීන් හා ක්‍රියාදාමයන් පදනම්ව බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවයන් සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව, බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශන සැකසීමේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතිකවීමක් සැපයෙන අයුරින් බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදී,



සභාපති - විගණන කමිටුව



සභාපති



අධ්‍යක්ෂ

2024 මාර්තු 18 දින කොළඹ දීය.

ස්වාධීන සහතිකවීමේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/B/BOC/IC/2023

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 08 April 2024

සභාපති

ලංකා බැංකුව,

ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයන්ට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් අධ්‍යක්ෂවරුන් වෙත ඉදිරිපත් කරනු ලබන ස්වාධීන සහතික වීමේ වාර්තාව

හැඳින්වීම

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවේ ඇතුලත් ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතික වීමක් මෙම වාර්තාවෙන් සපයනු ලැබේ.

කළමනාකරණයේ වගකීම

බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ නියාමනයන් වල 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති "අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වූ මාර්ගොපදේශය" ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, කළමනාකරණය සතු වගකීම වේ.

මාගේ වගකීම හා ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාර ප්‍රමිත (ශ්‍රී. ලං. ස. කා .ප්‍ර) 3050 (සංශෝධිත) ට අනුකූල වීම

මාගේ වගකීම වන්නේ අධ්‍යක්ෂවරුන් විසින් සකස් කරන ලද ලියකියවිලි මඟින් මාගේ ප්‍රකාශනයට සහය දක්වයි යන්න සහ අභ්‍යන්තර පාලනයේ සැලසුම සහ සඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් අනුගමනය කර ඇති ක්‍රියාවලිය උචිත ලෙස පිලිබිඹු වේද යන්න තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු ආයතන සඳහා සහතික වීමේ වාර්තාව ශ්‍රී.ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුකූලව මාගේ සහතිකවීමේ කාර්යභාරය මා විසින් මෙහෙයවා ඇත. මෙම ප්‍රමිතියට අනුව කළමනාකරණය විසින් සිය ප්‍රමාණාත්මක ආකාරයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳව ප්‍රකාශය සකස් කර තිබේද යන්න පිළිබඳව සීමිත සහතිකයක් ලබා ගැනීම සඳහා ක්‍රියා පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුය. මෙම කටයුත්ත සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් මම වගකිව යුතු නොවේ. මෙම කටයුත්ත අතරතුර මම මූල්‍ය තොරතුරු විගණනයක් හෝ සමාලෝචනයක් කර නැත.

ඉටුකළ කාර්යයේ සාරාංශය

අදාළ ප්‍රකාශය, අධ්‍යක්ෂවරුන් විසින් හෝ අධ්‍යක්ෂවරුන් සඳහා හෝ පිළියෙළ කල ලිපි ලේඛන මඟින් තහවුරු වන්නේ ද, සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේ දී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන තිබෙන ක්‍රියාවලිය මඟින් මැනවින් පිලිබිඹු වන්නේ ද යන්න ඇගයීම සඳහා මාගේ කාර්යභාරය මෙහෙයවා තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කල ක්‍රියා මාර්ග සනාථ කර ගැනීම සඳහා නියැඳි ලෙස බැංකුවේ කාර්ය මණ්ඩලයෙන් විමසීම, ලිපි ලේඛන පරීක්ෂාව යන ක්‍රියා පටිපාටි සිදු කරන ලදී.

මෙම ප්‍රකාශය තුළින් සිය අවදානම් හා පාලනයන් ආවරණය වන්නේදැයි සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියා පටිපාටිවල සඵලදායීතාවය පිළිබඳ මතයක් ගොඩනැගීම හෝ ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුව අවශ්‍ය නොවේ. එසේම ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන අංශයන් පිළිබඳව පවතින සැලකිය යුතු ගැටළු සඳහා ක්‍රියා කිරීමට විස්තර කර ඇති ක්‍රියාවලීන් මඟින් එම ගැටළු සඳහා නියත පිළියම් ලැබේදැයි මා විසින් සලකා බැලීම අවශ්‍ය නොවේ.

තෝරාගත් ක්‍රියා පටිපාටි රඳා පවතින්නේ බැංකුවේ ස්වභාවය, ප්‍රකාශය සකස් කර ඇති සිද්ධිය හෝ ගනුදෙනුව පිළිබඳ මගේ විනිශ්චය සැලකිල්ලට ගෙනය.

මගේ නිගමනයට පදනමක් සැපයීමට මා ලබාගත් සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියා පටිපාටීන් මත පදනම්ව වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම හා සඵලදායකත්වය පිළිබඳ සමාලෝචනයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදවා ඇති ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය හා සංගත නොවන බවට විශ්වාස කිරීමට හේතුවන කරුණු කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

අත්සන් කලේ,

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණයට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ හා විගණකවරුන්ගේ වගකීම් පැහැදිලිව දැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ ප්‍රකාශය සකසනු ලබයි. ලංකා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශය මඟින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශ

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් සමඟ 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් සහ නියාමනයන්ට අනුව, සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් නිරවද්‍යතාවක් සමඟ බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබිඹු කෙරෙන ගිණුම් පොත් බැංකුව විසින් පවත්වාගෙන යාම තහවුරු කිරීමත් සහ බැංකුවේ කටයුතු පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය වන ආකාරයට සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කිරීම බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි මෙම වාර්ෂික වාර්තාවේ නිරූපණය කර ඇති, 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති අතර, ඒවා සංගතභාවයෙන් යුතුව භාවිතා කර, කළමනාකරණය විසින් වඩාත් සාධාරණ හා විචක්ෂණ ලෙස තම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම් පාදක කරගෙන ඇත. භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් එවැනි දෑ පිළිබඳව අනාවරණය හා පැහැදිලි කිරීම් කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති 2023 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන් හා අනෙකුත් නියාමන අවශ්‍යතාවයන් හා අනුකූලවන පරිදි සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ වලින් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කෙරේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, බැංකුවට හා සමූහයට අනාගත නිශ්චිත කාලයක් සඳහා තම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී තව දුරටත් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය භාවිතා කර ඇත.

අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය

බැංකුවේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් සහ අවකළමනාකරණය වලක්වාලීමට, වඩාත් ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරයක් පවත්වාගෙන යාම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දීම, අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය ද අධ්‍යක්ෂවරුන් සතු වගකීමකි.

ආවේනික හා අවශේෂ අවදානම් මුළුමනින්ම තුරන් කරලීම කළ නොහැකි නමුත් කලින් තීරණය කරන ලද පද්ධති හා සීමා පැනවීම් තුළ උචිත යටිතල පහසුකම්, පාලනයන්, පද්ධති හා ආචාරධර්ම පදනම් වූ චර්යාවන් භාවිතය හා ක්‍රියාවට නැංවීම තුළින් එවැනි දෑ අවම කරගැනීම තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

මූල්‍ය වාර්තාකරණයේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා දෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකසා ඇති බව පිටු අංක 156 සහ 157 හි මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මඟින් තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ ඒ සඳහා වන මඟපෙන්වීම් මනා ලෙස සංවිධානය කර ඇත. ප්‍රමාණාත්මක අවදානම් පාලනය කිරීමටත්, ඒවා කළමනාකරණය කිරීමටත් කළමනාකරණ කමිටු ස්ථාපිත කර ඇත. අවධානම් පිළිබඳ මාසික වාර්තා සමාලෝචනය සහ සාකච්ඡාව සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා විධිවිධාන ක්‍රියාත්මක වේ. අදාළ නීති, රෙගුලාසි, රීති, විධානයන් සහ මඟපෙන්වීම් සමඟ අනුකූලවන ආකාරය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් අධීක්ෂණය කරන අතර, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා විගණන කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩව ක්‍රියා කරයි. විගණන කමිටුවේ හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 122 සිට 125 දක්වා අන්තර්ගත වේ.

විගණන වාර්තාව


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත විගණන වාර්තාව සහ අවසාන විගණන මතය ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 160 සිට 164 දක්වා විගණකාධිපතිතුමාගේ වාර්තාවේ ඇතුළත් කර ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳව විගණකාධිපතිවරයා විසින් ලබාදුන් සහතිකය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 158 හි දක්වා ඇත.

අනුකූලතාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට නියාමන හා ව්‍යවස්ථාපිත අධිකාරීන්ට ගෙවීමට ඇති සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ පරිපාලිතයන් විසින් නියමිත පරිදි ගෙවා අවසන් කර හෝ ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි සෑහීමට පත් වේ.

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ඔවුන්ගේ වගකීම යථා පරිදි ඉටුකර ඇති බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 අප්‍රේල් 03 දින
කොළඹ දීය.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/B/BOC/FA/2023

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 28 February 2024

සභාපති
ලංකා බැංකුව

ලංකා බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා බැංකුවේ ("බැංකුව") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1971 අංක 38 දරණ මුදල් පනතේ 5(1) වන වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාට ලැබී ඇති බලතල අනුව 1992 මැයි 14 වන දින නිකුත් කර ඇති අංක 715 දරණ රාජ්‍ය ගැසට් පත්‍රය යටතේ, 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වන කොටස යටතේ ඇති විධිවිධානයන්ගෙන් බැංකුව නිදහස් කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සිදු කිරීම සඳහා මට පොදු පරිචයේ සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් සහාය විය.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං. වි .ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ප්‍රධාන විගණන කරුණු

ප්‍රවර්තන කාලපරිච්ඡේදය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී මාගේ වෘත්තිමය විනිශ්චය අනුව වඩාත් වැදගත් වන කරුණු ප්‍රධාන විගණන කරුණු ලෙස සලකයි. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ විගණනයේදී මෙම කරුණු සමස්තයක් ලෙස සලකා බලනු ලබන අතර මෙම කරුණු පිළිබඳ වෙන් වෙන්ව මතයක් මා විසින් ප්‍රකාශ කරුණු නොලැබේ.

මාගේ විගණනය තුළින් පහත සඳහන් සෑම කරුණක්ම ආමන්ත්‍රණය කළ ආකාරය පිළිබඳව සවිස්තරාත්මකව පැහැදිලි කර ඇත.

මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන අංශයේ විගණනය සඳහා විගණකවරයාගේ වගකීම්, මෙම කරුණුවලට අදාළව ද මම ඉටු කර ඇත්තෙමි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ අවදානම පිළිබඳ මගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්වීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රියා පටිපාටිවල කාර්යසාධනය මගේ විගණනයට ඇතුළත් විය. පහත කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියා පටිපාටි ඇතුළුව මගේ විගණන ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵල, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණන මතය සඳහා පදනම සපයයි.

ප්‍රධාන විගණන කරුණු	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කරන ලද ආකාරය

ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මනිනු ලබන මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය අලාභයන් සඳහා වන හානිය
 	
පිළිවෙලින් සටහන 28 සහ 29 හි දක්වා ඇති පරිදි ණය සහ අත්තිකාරම් සහ ණය සහ අනෙකුත් උපකරණ යන දෙකෙන්ම සමන්විත ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය අලාභය සඳහා වන හානිය, සටහන 4.4.11 හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පදනම්ව කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ.
 	
මෙය ප්‍රධාන විගණන කාරණයක් වන්නේ,
 	
• එවැනි මූල්‍ය වත්කම් ආපසු අයකර ගැනීම සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ කළමණාකරණ අපේක්ෂාව ඇස්තමේන්තු කිරීම සම්බන්ධ සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිත මට්ටම් හා සම්බන්ධ වීම සහ
 	
• අපේක්ෂිත ණය අලාභ හානි වාර්තා වූ අගයේ ඇති ප්‍රමාණාත්මක බව සහ එහි නිර්ණය කිරීමේදී සංකීර්ණ ගණනය කිරීම් භාවිතා කිරීම.
 	
ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා වන හානිය තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරන ලද සැළකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන වල ප්‍රධාන ක්ෂේත්‍රවලට පහත සඳහන් දෑ ඇතුළත් විය.
 	
උපකල්පනය කළ අනාගත සිද්ධීන් සහ සාකච්ඡා කළ විදේශ ව්‍යවහාර මුදල් වලින් ඇති ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී එකඟ වන කොන්දේසි, සාර්ව ආර්ථිකයේ අනාගතයේදී ඇති විය හැකි විචල්‍යයන් සහ ඒවායේ ඇති ප්‍රමාණාත්මක බව ආදිය නිසා ඇස්තමේන්තුවල පවතින අවිනිශ්චිත භාවය.
	ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ වල මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය අලාභයන් සඳහා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් බව ආමන්ත්‍රණය කිරීමේදී, මගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය.
	
	• මගේ වාර්තාවේ දිනය දක්වා පවතින තොරතුරු මත පදනම්ව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට සහ වත්මන් ආර්ථික තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම් සහ පාදකව පවතින ක්‍රමවේදයන් සඳහා බැංකුවේ විධිවිධාන පෙළගැස්වීම මම තක්සේරු කළෙමි.
	
	• බැංකුවේ කළමණාකාරිත්වය විසින් අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම ඇතුලත් හානිකර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ඇතුළත් අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු කිරීම පිළිබඳ පාලන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය මම ඇගයීමට ලක් කළෙමි.
	
	• බැංකුවේ අදාළ මූලාශ්‍ර වාර්තා සහ ගිණුම් වාර්තා වලට එකඟ කරමින් අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් සඳහා පාදක කරගත් දත්තවල සම්පූර්ණතාවය, නිරවද්‍යතාව සහ සාධාරණ බව මා විසින් පරීක්ෂා කරන ලදී.
	
	• ණය තත්ත්ව සහ අදාළ අදියර වර්ගීකරණයන්හි සාධාරණත්වය මම ඇගයීමට ලක් කළෙමි.
	
	ඉහත කරුණු වලට අමතරව, පහත සඳහන් ක්‍රියා පටිපාටි සිදු කරන ලදී.
	
	• කේවල පදනම මත හානිකරණය ගණනය කළ ණය සහ අත්තිකාරම් සඳහා,
	
	  • කේවල පදනමට හානිකරණය ගණනය කිරීම් වලට පාදක වූ අංක ගණිතමය නිරවද්‍යතාව පරීක්ෂා කළෙමි.
	
	  • වර්තමාන ආර්ථික වෙනස් වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සිදු කරන ලද අපේක්ෂිත ණය හානිය සඳහා ප්‍රතිපාදන සඳහා භාවිතා කරන ප්‍රධාන යෙදවුම් වල සාධාරණත්වය මම ඇගයීමට ලක් කළෙමි. විශේෂයෙන් ඉහළ අවදානම් කර්මාන්ත සහ ඇපකර වල ප්‍රතිසාධන ක්‍රියාමාර්ග වල තත්ත්වය සම්බන්ධයෙන් මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු වටිනාකම සහ කාලසීමාව සැලකිල්ලට ගනිමින් එවැනි ඇගයීම් සිදු කරන ලදී.
	
	• මූල්‍ය වත්කම් සාමූහික පදනමට හානිකරණය සඳහා වූ ඇගයීම.
	
	  • අපේක්ෂිත ණය අලාභ සඳහා භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම් සහ ගණනය කිරීම් පරීක්ෂා කරන ලදී.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රධාන විගණන කරුණු	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කරන ලද ආකාරය
	• කළමනාකරණය විසින් භාවිතා කරන ලද විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු, පාදක ක්‍රමවේදය සහ කළමනාකරණ ආවරණ සාධාරණ දැයි තක්සේරු කරන ලදි. සලකා බැලූ ආර්ථික අවස්ථා සහ එම එක් එක් අවස්ථා සඳහා පවරන ලද සම්භාවිතා බර මත පදනම්ව භාවිතා කරන ලද ඉදිරි දැක්ම තොරතුරු වල සාධාරණ බව ඇගයීම මගේ පරීක්ෂණයට ඇතුලත් විය. • මම සටහන් 28, 29 සහ 4.4.11 හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත් බව තක්සේරු කළෙමි.
තොරතුරු තාක්ෂණ (IT) පද්ධති සම්බන්ධ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීය ක්‍රියාවලි සහ අභ්‍යන්තර පාලනයන් සහිත බහු තොරතුරු තාක්ෂණ පද්ධති මත සැලකිය යුතු ලෙස රඳා පවතී. තවද, තොරතුරු තාක්ෂණ පද්ධති මගින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිතා කරමින් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සකස් කරනු ලැබේ, ඒවා පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කර ඇත. ඒ අනුව, මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ.	මගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය: • මූල්‍ය වාර්තාකරණයට සහ හෙළිදරව් කිරීම් වලට අදාළ ක්‍රියාවලියන්හි අභ්‍යන්තර පාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගත්තෙමි. • මම මගේ අභ්‍යන්තර විශේෂිත සම්පත් පහත ඇගයීම් වලට සම්බන්ධ කර ගන්නා ලදී. • පරිශීලක ප්‍රවේශය සහ වෙනස් කළමණාකරණයට අදාළ ඒවා ඇතුළුව තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ පාලනවල සැලසුම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීමට, ඇගයීමට සහ හඳුනා ගැනීම සහ • බැංකුවට බලපාන සයිබර් ආරක්ෂණ අවදානම් සහ මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මූලික වශයෙන් විමසීම් තුළින් ඉහළ මට්ටමේ අවබෝධයක් ලබා ගැනීමට. • සාමාන්‍ය ලෙජර් සැසඳීම ඇතුළුව නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය සඳහා හෙළිදරව් කිරීම් උත්පාදනය කිරීමට භාවිතා කරන වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කළෙමි.

1.4 සමූහයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව මාගේ විගණන වාර්තාවේ ඇතුලත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්දයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාලව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමය.

බැංකුවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කලොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශ්වයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමුහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමුහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමුහයේ අඛණ්ඩ පැවැත්වට අදාළ කරුණු අනාවරනය කිරීම ද කළමණාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමුහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමුහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැක අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවන්හිදී සුදුසු විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩව පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ සාක්ෂි ලබා ගැනීම ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් කල අතර පහත සඳහන් කරුණු සම්බන්ධව ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන්. අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන් කළේ,

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශන - පටුන

		පිටු අංකය
මූලික මූල්‍ය ප්‍රකාශන		
	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	166
	විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	167
	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	168
	හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය	170
	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	174
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		
1.	වාර්තාකරණ වීක්ෂය	176
2.	මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	177
3.	ගිණුම් පිළියෙල කිරීමේ පදනම	177
4.	වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති	180
5.	රක්ෂණ ව්‍යාපාරය	189
6.	අළුතින් නිකුත් කරන ලද සහ සංශෝධිත ගිණුම්කරණ ප්‍රමිති අර්ථකතනයන්	190
7.	මුළු ආදායම	192
8.	ශුද්ධ පොළී ආදායම	192
9.	ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	194
10.	වෙළඳපළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	195
11.	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	195
12.	මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	195
13.	වෙනත් මෙහෙයුම් ආදායම්	196
14.	ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) කිරීම	197
15.	සේවක මණ්ඩල වියදම්	198
16.	ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	199
17.	වෙනත් වියදම	200
18.	බදු වියදම	201
19.	ආශ්‍රිත සමාගම්වල ලාභ/ (පාඩු) කොටස, බදු පසු	203
20.	කොටසක ඉපැයුම සහ කොටසක ලාභාංශ	203
21.	මිනුම් කිරීමේ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය	205
22.	මුදල් සහ මුදල් හා සමාන දෑ	209
23.	මහ බැංකු සමඟ ඇති ශේෂයන්	210
24.	බැංකුවල ඇති තැන්පතු	211
25.	ප්‍රතිවික්‍රණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	212
26.	ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	213
27.	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	213
28.	ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	225
29.	ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	234
30.	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	242
31.	පරිපාලිත සමාගම්වල ආයෝජනය	245
32.	ආශ්‍රිත සමාගම්වල ආයෝජන	250
33.	ආයෝජන දේපළ	253
34.	දේපළ, පිරියත හා උපකරණ	255
35.	භාවිත අයිතිය සහිත වත්කම් / කල්බදු දේපළ	274
36.	අස්පෘශ්‍ය වත්කම්	276
37.	විලම්බිත බදු වත්කම්/(වගකීම්)	277
38.	වෙනත් වත්කම්	279
39.	බැංකුවලට ගෙවිය යුතු	279
40.	ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	280
41.	ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	280
42.	ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	280
43.	ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැහීම්	281
44.	නිකුත් කළ ණය සුරැකුම්පත්	282
45.	ප්‍රවර්තන බදු වගකීම්	284
46.	රක්ෂණ ගිවිසුම් වගකීම්	284
47.	වෙනත් වගකීම්	285
48.	සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්	286
49.	යටත් කාලීන වගකීම්	297
50.	කොටස් ප්‍රාග්ධනය	300
51.	ස්ථාවර සංචිත අරමුදල	300
52.	රඳවාගත් ඉපැයුම්	301
53.	මුදල් ප්‍රවාහ හෙජ් සංචිත	301
54.	වෙනත් සංචිත	302
55.	පාලනයට යටත් නොවන හිමිකම	304
56.	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳ සටහන්	304
57.	අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	305
58.	සුරැකුම් ලෙස ඔඩපණය කළ වත්කම්	308
59.	වාර්තාකරණ දිනට පසුව හටගන්නා සිදුවීම්	308
60.	වත්කම් සහ වගකීම්වල කල්පිරීම විශ්ලේෂණය	309
61.	සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය	312
62.	බණ්ඩ පදනම මත මූල්‍ය තොරතුරු වාර්තාකරණය	320
63.	වත්කම් හා වගකීම්වල සාධාරණ අගය	322
64.	අවදානම් කළමනාකරණය	332

ලාභ හෝ අලාභ ප්‍රකාශනය

		බැංකුව			සමූහය		
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023 රු. '000	2022 රු. '000	වෙනස %	2023 රු. '000	2022 රු. '000	වෙනස %
මුළු ආදායම	7	542,187,297	513,149,335	5.7	551,866,763	520,891,164	5.9
පොළී ආදායම		524,797,842	456,267,458	15.0	532,477,761	463,203,346	15.0
අඩු කළා: පොළී වියදම		433,610,256	329,921,080	31.4	436,967,649	333,434,454	31.1
ශුද්ධ පොළී ආදායම	8	91,187,586	126,346,378	(27.8)	95,510,112	129,768,892	(26.4)
ගාස්තු සහ කොමිස් ආදායම		25,875,048	22,837,771	13.3	26,235,325	23,165,682	13.3
අඩු කළා: ගාස්තු සහ කොමිස් වියදම		8,220,629	6,486,129	26.7	8,237,386	6,505,334	26.6
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	9	17,654,419	16,351,642	8.0	17,997,939	16,660,348	8.0
වෙළඳපළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	10	(5,347,822)	17,602,384	(130.4)	(5,163,417)	17,678,455	(129.2)
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	11	858,722	(804,438)	(206.7)	1,448,963	(956,745)	(251.4)
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	12	1,361,863	861,349	58.1	1,469,888	877,853	67.4
වෙනත් මෙහෙයුම් ආදායම්	13	(5,358,356)	16,384,811	(132.7)	(4,601,757)	16,922,573	(127.2)
මුළු මෙහෙයුම් ආදායම		100,356,412	176,742,126	(43.2)	106,661,728	180,951,376	(41.1)
අඩු කළා: ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) කිරීම	14	(4,906,277)	87,155,696	(105.6)	(5,048,666)	87,294,905	(105.8)
ශුද්ධ මෙහෙයුම් ආදායම		105,262,689	89,586,430	17.5	111,710,394	93,656,471	19.3
අඩු කළා: මෙහෙයුම් වියදම්							
සේවක මණ්ඩල වියදම්	15	29,818,199	28,991,429	2.9	32,311,681	31,352,978	3.1
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	16	3,852,931	4,286,899	(10.1)	4,229,242	4,507,368	(6.2)
වෙනත් වියදම්	17	18,585,567	14,018,161	32.6	20,474,129	15,423,966	32.7
මුළු මෙහෙයුම් වියදම		52,256,697	47,296,489	10.5	57,015,052	51,284,312	11.2
මූල්‍ය සේවා මත බදු වලට පෙර ලාභය/(අලාභය)		53,005,992	42,289,941	25.3	54,695,342	42,372,159	29.1
අඩු කළා: මූල්‍ය සේවා මත බදු	18.1	12,663,569	11,313,292	11.9	12,955,824	11,442,505	13.2
මූල්‍ය සේවා මත බදු වලට පසු ලාභය/(අලාභය)		40,342,423	30,976,649	30.2	41,739,518	30,929,654	34.9
ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස, බදු පසු	19	-	-	-	33,507	122,847	(72.7)
ආදායම් බද්දට පෙර ලාභය/(අලාභය)		40,342,423	30,976,649	30.2	41,773,025	31,052,501	34.5
අඩු කළා: ආදායම් බදු වියදම/(ප්‍රතිවර්ත්‍ය කිරීම)	18.2	13,648,897	(995,759)	(1,470.7)	14,155,438	(796,516)	(1,877.2)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		26,693,526	31,972,408	(16.5)	27,617,587	31,849,017	(13.3)
වර්ෂයේ ලාභයෙන්:							
බැංකුවේ කොටස් හිමියාට අදාළ කොටස		26,693,526	31,972,408	(16.5)	27,571,569	31,994,638	(13.8)
පාලනයට යටත් නොවන හිමිකම්		-	-	-	46,018	(145,621)	(131.6)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		26,693,526	31,972,408	(16.5)	27,617,587	31,849,017	(13.3)
කොටසක ඉපැයුම් සහ කොටසක ලාභාංශ	20						
කොටසක මූලික ඉපැයුම් (රු.)		1,067.74	1,278.90	(16.5)	1,102.86	1,279.79	(13.8)
කොටසක තනුක ඉපැයුම් (රු.)		1,037.45	1,272.08	(18.4)	1,071.57	1,272.96	(15.8)
කොටසක ලාභාංශ (රු.)		6.93	13.86	(50.0)	6.93	13.86	(50.0)

පිටු අංක 176 සිට 351 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	බැංකුව			සමූහය		
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000	වෙනස %	2023 රු. '000	2022 රු. '000	වෙනස %
වර්ෂය සඳහා ලාභය/(අලාභය)	26,693,526	31,972,408	(16.5)	27,617,587	31,849,017	(13.3)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්						
විදේශීය මෙහෙයුම්වල මූල්‍ය වාර්තා පරිවර්තනයේ දී ඇතිවන ශුද්ධ විනිමය ලාභ/(අලාභ)	(1,977,563)	7,564,044	(126.1)	(2,286,201)	9,843,204	(123.2)
මුදල් ප්‍රවාහ හෙජ් උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	(20,369,118)	22,381,369	(191.0)	(20,369,118)	22,381,369	(191.0)
වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන ණය උපකරණවල ආයෝජන මත ශුද්ධ ලාභ/(අලාභ)	165,673	1,328,890	(87.5)	272,685	1,312,732	(79.2)
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය ආයෝජන මත ශුද්ධ ලාභ/(අලාභ) ලාභයට හෝ අලාභයට මාරු කිරීම	-	(5,631)	(100.0)	-	(5,631)	(100.0)
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම	(148,518)	(140,185)	5.9	(148,518)	(140,185)	5.9
ආශ්‍රිත සමාගම්හි වෙනත් විස්තීර්ණ ආදායම් කොටස, බදු පසු	-	-	-	(2,109)	(20,342)	(89.6)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්ගේ එකතුව	(22,329,526)	31,128,487	(171.7)	(22,533,261)	33,371,147	(167.5)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්						
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන ස්කන්ධ උපකරණවල සාධාරණ අගයේ වෙනස්කම්	1,786,818	(313,328)	(670.3)	2,412,486	547,780	340.4
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම	(107,990)	(586,301)	(81.6)	(107,990)	(586,301)	(81.6)
ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) වල වෙනස්කම්	6,880,746	1,818,193	278.4	8,635,144	3,695,662	133.7
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම	(1,961,601)	(1,859,253)	5.5	(2,487,921)	(2,422,494)	2.7
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභ)	(18,940,273)	(3,845,217)	392.6	(19,021,132)	(3,797,222)	400.9
ඉහත අගය මත විලම්බිත බදු බලපෑම	5,682,082	1,464,274	288.0	5,705,542	1,421,714	301.3
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්ගේ එකතුව	(6,660,218)	(3,321,632)	100.5	(4,863,871)	(1,140,861)	326.3
වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු	(28,989,744)	27,806,855	(204.3)	(27,397,132)	32,230,286	(185.0)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	(2,296,218)	59,779,263	(103.8)	220,455	64,079,303	(99.7)
මුළු විස්තීර්ණ ආදායමෙන්:						
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස	(2,296,218)	59,779,263	(103.8)	157,628	64,189,129	(99.8)
පාලනයට යටත් නොවන හිමිකම	-	-	-	62,827	(109,826)	(157.2)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	(2,296,218)	59,779,263	(103.8)	220,455	64,079,303	(99.7)

පිටු අංක 176 සිට 351 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000	සමූහය වෙනස %
වත්කම්							
මුදල් සහ මුදල් හා සමාන දෑ	22	135,550,505	128,401,532	5.6	137,369,158	135,230,827	1.6
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	23	34,932,639	70,494,529	(50.4)	34,932,639	70,494,529	(50.4)
බැංකුවල ඇති තැන්පතු	24	74,966,171	16,459,303	355.5	73,024,979	17,811,665	310.0
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	25	3,711,918	1,480,403	150.7	3,695,392	1,463,368	152.5
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	26	20,525,840	57,155,486	(64.1)	20,525,840	57,155,486	(64.1)
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	27	40,642,530	10,280,055	295.4	48,830,871	10,636,190	359.1
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්							
ණය සහ අත්තිකාරම්	28	2,209,061,924	2,325,594,329	(5.0)	2,240,611,228	2,355,978,333	(4.9)
ණය සහ වෙනත් උපකරණ	29	1,653,728,403	1,555,897,307	6.3	1,660,012,978	1,562,373,679	6.2
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	30	49,533,998	8,690,802	470.0	52,199,685	10,750,044	385.6
පරිපාලිත සමාගම්වල ආයෝජන	31	8,181,138	8,181,138	-	-	-	-
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	32	92,988	92,988	-	737,115	684,536	7.7
ආයෝජන දේපළ	33	2,414,640	2,414,640	-	95,446	104,798	(8.9)
දේපළ, පිරියත හා උපකරණ	34	42,564,498	34,845,004	22.2	59,566,898	50,992,323	16.8
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ	35	3,508,618	3,002,305	16.9	2,986,704	2,624,300	13.8
අස්පෘශ්‍ය වත්කම්	36	1,554,875	1,442,433	7.8	1,654,722	1,593,344	3.9
විලම්බිත බදු වත්කම්	37	18,503,397	15,577,466	18.8	18,594,558	15,598,541	19.2
වෙනත් වත්කම්	38	112,274,233	96,449,984	16.4	112,921,804	97,276,598	16.1
මුළු වත්කම්		4,411,748,315	4,336,459,704	1.7	4,467,760,017	4,390,768,561	1.8
වගකීම්							
බැංකු වලට ගෙවිය යුතු	39	3,047,732	11,514,897	(73.5)	3,162,463	11,547,714	(72.6)
ප්‍රතිම්ලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	40	78,463,070	180,218,543	(56.5)	77,829,770	179,938,744	(56.7)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	41	2,169,202	921,033	135.5	2,169,202	921,033	135.5
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම්							
තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	42	3,882,232,323	3,334,774,261	16.4	3,909,580,686	3,358,198,424	16.4
වෙනත් ණය ගැනීම්	43	33,666,236	390,489,543	(91.4)	35,592,741	397,083,583	(91.0)
නිකුත් කළ ණය සුරැකුම්පත්	44	-	-	-	730,839	58,807	1,142.8
ප්‍රවර්තන බදු වගකීම්	45	7,621,675	6,523,443	16.8	7,877,471	6,853,709	14.9
විලම්බිත බදු වගකීම්	37	-	-	-	2,933,596	2,694,221	8.9
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	46.1	-	-	-	359,606	355,190	1.2
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	46.2	-	-	-	671,728	662,773	1.4
වෙනත් වගකීම්	47	88,141,547	94,075,650	(6.3)	89,835,809	96,425,230	(6.8)
යටත් කාලීන වගකීම්	49	64,691,810	63,758,191	1.5	64,437,320	63,498,599	1.5
මුළු වගකීම්		4,160,033,595	4,082,275,561	1.9	4,195,181,231	4,118,238,027	1.9

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000	සමූහය වෙනස %
ස්කන්ධය							
කොටස් ප්‍රාග්ධනය	50	25,730,000	25,730,000	-	25,730,000	25,730,000	-
ස්ථාවර සංචිත අරමුදල	51	15,665,000	15,131,000	3.5	15,665,000	15,131,000	3.5
රඳවාගත් ඉපැයුම්	52	171,351,609	158,616,238	8.0	173,063,302	159,819,481	8.3
මුදල් ප්‍රවාහ හෙජ් සංචිත	53	5,251,517	25,620,635	(79.5)	5,251,517	25,620,635	(79.5)
වෙනත් සංචිත	54	33,716,594	29,086,270	15.9	51,748,171	45,172,451	14.6
බැංකුවේ කොටස්හිමියාට අයත් මුළු ස්කන්ධය		251,714,720	254,184,143	(1.0)	271,457,990	271,473,567	-
පාලනයට යටත් නොවන හිමිකම	55	-	-	-	1,120,796	1,056,967	6.0
මුළු ස්කන්ධය		251,714,720	254,184,143	(1.0)	272,578,786	272,530,534	-
මුළු වගකීම් සහ ස්කන්ධය		4,411,748,315	4,336,459,704	1.7	4,467,760,017	4,390,768,561	1.8
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	57	1,539,206,229	1,344,899,769	14.4	1,548,892,111	1,346,920,056	15.0
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	50.2	10,068.59	10,167.37	(1.0)	10,858.32	10,858.94	-

පිටු අංක 176 සිට 351 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කරන බවට සහතික කරමි.

එම් පී රුවන් කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

රොනල්ඩ් සී පෙරේරා
සභාපති

එන් සී ඒ අබේසේකර
අධ්‍යක්ෂ

ඩබ්ලිව් පී රසල් ෆොන්සේකා
මහා කළමණාකරු

2024 පෙබරවාරි 27
කොළඹ දීය.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

බැංකුව

	සටහන	කොටස් ප්‍රාග්ධනය රු. '000	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය රු. '000	ස්ථාවර සංචිත අරමුදල රු. '000	මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය රු. '000
2022 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	-	14,491,000	3,239,266
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	-	22,381,369
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	-	22,381,369
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
අධිභාර බද්ද					
2022 සඳහා ලාභාංශ	20.3	-	-	-	-
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	50.1	-	730,000	-	-
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයෙන් මාරු කිරීම්	54.4	-	-	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	-	640,000	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ මුළු ගනුදෙනු		-	730,000	640,000	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	730,000	15,131,000	25,620,635
2023 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	730,000	15,131,000	25,620,635
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	-	(20,369,118)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	-	(20,369,118)
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
2023 සඳහා ලාභාංශ	20.3	-	-	-	-
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන අතිරික්තය	54.1	-	-	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	-	534,000	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ මුළු ගනුදෙනු		-	-	534,000	-
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	730,000	15,665,000	5,251,517

පිටු අංක 176 සිට 351 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

අනෙකුත් සංචිත				
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	වෙනත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
588,427	3,345,420	17,356,542	136,739,177	200,759,832
-	-	-	31,972,408	31,972,408
283,445	7,564,044	(41,060)	(2,380,943)	27,806,855
283,445	7,564,044	(41,060)	29,591,465	59,779,263
-	-	-	(6,738,542)	(6,738,542)
-	-	-	(346,410)	(346,410)
-	-	-	-	730,000
(10,548)	-	-	10,548	-
-	-	-	(640,000)	-
(10,548)	-	-	(7,714,404)	(6,354,952)
861,324	10,909,464	17,315,482	158,616,238	254,184,143
861,324	10,909,464	17,315,482	158,616,238	254,184,143
-	-	-	26,693,526	26,693,526
1,695,983	(1,977,563)	4,919,145	(13,258,191)	(28,989,744)
1,695,983	(1,977,563)	4,919,145	13,435,335	(2,296,218)
-	-	-	(173,205)	(173,205)
-	-	(7,241)	7,241	-
-	-	-	(534,000)	-
-	-	(7,241)	(699,964)	(173,205)
2,557,307	8,931,901	22,227,386	171,351,609	251,714,720

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

සමූහය

	සටහන	කොටස් ප්‍රාග්ධනය	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය
		රු. '000	රු. '000	රු. '000	රු. '000
2022 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	-	14,491,000	3,239,266
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	-	22,381,369
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	-	22,381,369
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
අධිභාර බද්ද		-	-	-	-
2022 සඳහා ලාභාංශ	20.3	-	-	-	-
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	50.1	-	730,000	-	-
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයෙන් මාරු කිරීම		-	-	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	-	640,000	-
පාලනයට යටත් නොවන හිමිකම වෙනස් වීම		-	-	-	-
ලබා නොගත් ලාභාංශ නැවත මාරු කිරීම		-	-	-	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු		-	730,000	640,000	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	730,000	15,131,000	25,620,635
2023 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	730,000	15,131,000	25,620,635
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		-	-	-	(20,369,118)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	-	(20,369,118)
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
2023 සඳහා ලාභාංශ	20.3	-	-	-	-
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	-	-	534,000	-
ඉවත් කරන ලද වත්කම්වල ප්‍රත්‍යාගණන අතිරික්තය	54.1	-	-	-	-
වෙනත් සංචිතවලට මාරු කිරීම		-	-	-	-
ලබා නොගත් ලාභාංශ නැවත මාරු කිරීම		-	-	-	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු		-	-	534,000	-
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	730,000	15,665,000	5,251,517

පිටු අංක 176 සිට 351 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස					
	අනෙකුත් සංචිත				
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	වෙනත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	පාලනයට යටත් නොවන හිමිකම	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
1,483,412	5,186,788	26,302,644	138,104,222	1,589,446	215,396,778
-	-	-	31,994,638	(145,621)	31,849,017
1,111,492	9,843,204	1,255,459	(2,397,033)	35,795	32,230,286
1,111,492	9,843,204	1,255,459	29,597,605	(109,826)	64,079,303
-	-	-	(7,042,422)	-	(7,042,422)
-	-	-	(346,410)	-	(346,410)
-	-	-	-	-	730,000
(10,548)	-	-	10,548	-	-
-	-	-	(640,000)	-	-
-	-	-	134,511	(422,653)	(288,142)
-	-	-	1,427	-	1,427
(10,548)	-	-	(7,882,346)	(422,653)	(6,945,547)
2,584,356	15,029,992	27,558,103	159,819,481	1,056,967	272,530,534
2,584,356	15,029,992	27,558,103	159,819,481	1,056,967	272,530,534
-	-	-	27,571,569	46,018	27,617,587
2,415,451	(2,286,201)	6,136,562	(13,310,635)	16,809	(27,397,132)
2,415,451	(2,286,201)	6,136,562	14,260,934	62,827	220,455
-	-	-	(173,205)	-	(173,205)
-	-	-	-	(5,437)	(5,437)
-	-	-	(534,000)	-	-
-	-	(7,241)	7,241	-	-
-	317,149	-	(317,149)	-	-
-	-	-	-	6,439	6,439
-	317,149	(7,241)	(1,017,113)	1,002	(172,203)
4,999,807	13,060,940	33,687,424	173,063,302	1,120,796	272,578,786

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
ආදායම් බදු පෙර ලාභය		40,342,423	30,976,649	41,773,025	31,052,501
ගැලපුම්:					
ශුද්ධ පොළී ආදායම	8	(91,187,586)	(126,346,378)	(95,510,112)	(129,768,892)
ලාභාංශ ආදායම	10/13	(322,009)	(450,977)	(389,099)	(515,426)
පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වලින් ලැබූ ලාභාංශ	13	(372,900)	(107,430)	-	-
ආශ්‍රිත සමාගම්වල (ලාභ)/පාඩු කොටස, බදු පසු	19	-	-	(33,507)	(122,847)
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	56.1	130,572,896	(392,658,229)	126,112,293	(389,853,461)
මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්	56.2	106,210,544	510,080,706	108,724,603	517,045,767
බදු පෙර ලාභයේ ඇතුළත් මුදල් නොවන වෙනත් අයිතමයන්	56.3	15,602,055	105,190,513	15,942,446	105,731,706
ආයෝජන කටයුතුවලින් ලද වෙනත් ශුද්ධ (ලාභ)/පාඩු		(2,220,585)	(56,912)	(2,918,851)	72,145
		198,624,838	126,627,942	193,700,798	133,641,493
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් ප්‍රතිලාභ ගෙවීම		(12,851,008)	(11,204,969)	(12,858,497)	(11,275,993)
පොළී ලැබීම්		287,270,252	289,089,403	292,995,798	295,198,149
පොළී ගෙවීම්		(402,296,042)	(177,094,051)	(405,747,564)	(180,307,490)
ලාභාංශ ලැබීම්		83,926	73,282	96,176	73,282
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්, බදු පෙර		70,831,966	227,491,607	68,186,711	237,329,441
ආදායම් බදු ගෙවීම්	45	(12,124,580)	(5,500,380)	(12,604,215)	(5,796,331)
අධිභාර බදු ගෙවීම්		-	(6,738,542)	-	(7,042,422)
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්		58,707,386	215,252,685	55,582,496	224,490,688
ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ					
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජනවල ශුද්ධ වැඩිවීම්		(97,158,853)	(136,219,260)	(96,952,346)	(142,193,560)
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම		(38,256,489)	10,731,712	(39,468,843)	14,095,845
දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්		(3,177,730)	(2,243,640)	(3,578,110)	(2,301,746)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම		(476,639)	(1,027,211)	(478,130)	(1,039,078)
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලැබීම්		60,688	1,414	96,196	8,748
ලාභාංශ ලැබීම්		610,983	485,126	292,923	448,891
පොළී ලැබීම්		179,414,013	115,497,384	181,368,386	116,324,524
ආයෝජන කටයුතු වලින් ලද/(භාවිතා කළ) ශුද්ධ මුදල්		41,015,973	(12,774,475)	41,280,076	(14,656,376)

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
වෙනත් ණයට ගැනීම්වල ශුද්ධ වැඩිවීම		(63,812,127)	(64,302,108)	(66,809,723)	(61,175,038)
කොටස් නිකුතුවෙන් ලද මුදල්		-	730,000	-	730,000
ණයකර/ප්‍රාග්ධන බැඳුම්කර නිකුතුවෙන් ලද මුදල්		10,000,000	6,490,000	10,622,830	6,557,700
ණයකර නිදහස් කිරීම සඳහා ගෙවූ මුදල්		(10,385,589)	(8,103,950)	(10,385,589)	(10,211,132)
බැංකුවේ කොටස්හිමියාට ගෙවූ ලාභාංශ		(173,205)	(346,410)	(173,205)	(346,410)
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ ලාභාංශ		-	-	(5,437)	-
කොටස් නැවත මිලදී ගැනීම සඳහා ගෙවීම්		-	-	-	(287,910)
ණය ගැනීම් හා ණය සුරැකුම්පත් සඳහා පොළී ගෙවීම්		(20,424,195)	(85,222,144)	(20,275,762)	(85,537,678)
මූල්‍ය කටයුතු වලින් ලද/(භාවිතා කළ) ශුද්ධ මුදල්		(84,795,116)	(150,754,612)	(87,026,886)	(150,270,468)
වර්ෂය තුළදී මුදල් සහ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		14,928,243	51,723,598	9,835,686	59,563,844
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		118,512,831	66,789,233	125,309,310	65,745,466
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		133,441,074	118,512,831	135,144,996	125,309,310
මුදල් සහ මුදල් හා සමාන දෑ විශ්ලේෂණය					
මුදල් සහ මුදල් හා සමාන දෑ	22	135,550,505	128,401,532	137,369,158	135,230,827
බැංකු අයිරා	39	(2,109,431)	(9,888,701)	(2,224,162)	(9,921,517)
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		133,441,074	118,512,831	135,144,996	125,309,310

පිටු අංක 176 සිට 351 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 වාර්තාකරණ ඒකකය

1.1 ආයතනික තොරතුරු

ලංකා බැංකුව ("බැංකුව"), 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත යටතේ 1939 අගෝස්තු 1 දින ශ්‍රී ලංකාව තුළ ප්‍රතිෂ්ඨාපිත රාජ්‍ය බැංකුවකි. 1988 අංක 30 දරණ බැංකු පනත හා ඒ හා අනුෂාංගික සංශෝධනවලට යටත්වන ලෙස ස්ථාපිත කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ලංකා බැංකුවේ ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ 01, ලංකා බැංකු මාවතේ, ලංකා බැංකු චතුරශ්‍රයෙහි අංක 01 දරණ ස්ථානයේ පිහිටා ඇත. ලංකා බැංකුව නිකුත් කර ඇති ණයකර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනට සේවකයින් 8,579 ක් ලංකා බැංකුවෙහි සේවයේ නියුක්තව සිටියහ (2022 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 8,209 කි).

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2023 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන බැංකුව, ඊට අයත් වන පරිපාලිතයන් (බැංකුව සහ එහි පරිපාලිතයන්ගේ එකතුව සමූහය සහ තනිව ගත් කල සමූහ ආයතන ලෙස හැඳින්වේ) සහ ආශ්‍රිත සමාගම්වල සමූහයට ඇති අයිතිය අයත් වන ආකාරයට සකස් කර ඉදිරිපත් කර ඇත. සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකොඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම සහ සී/ස සීබෑන්ක් ඇසෙට් මැනෙජ්මන්ට් සමාගම යන ආශ්‍රිත සමාගම් හැර සමූහයේ අනෙකුත් සමාගම්වල හිණුම් වර්ෂය දෙසැම්බර් 31 න් අවසන් වේ. සමූහයේ අවසාන මව් සමාගම බැංකුව වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම්

1.3.1 බැංකුව

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ප්‍රාථමික වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ වත්කම් කළමනාකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණයපත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

1.3.2 පරිපාලිතයන්

ලංකා බැංකුවේ පරිපාලිතයන්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත:

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම	ලංකා බැංකු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ අයිතිය, පාලනය, නඩත්තු කිරීම හා උපයෝගීතාවය රඳවා ගැනීම.
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	කල්බදුකරණය සහ කුලී පිට ගනුදෙනු, ආයතනික හා ශාඛා ණය පහසුකම්, ආයතනික උපදේශක සේවා, ප්‍රාග්ධන වෙළඳපල ක්‍රියාකාරකම්, ආන්තික වෙළඳාම සහ ක්ෂුද්‍ර මූල්‍යනය, කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම, දේපළ ආශ්‍රිත සේවා, උකස් සේවා, ඉස්ලාමීය මූල්‍යකරණය සහ තැන්පතු බාරගැනීම.
ලංකා බැංකුව (යූ කේ) සමාගම	එක්සත් රාජධානියේ මූල්‍ය සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති, වාණිජ බැංකුවක් වන අතර, ශාඛා සහ ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත බැංකු සේවා සහ වෙළඳ මූල්‍ය සේවා සැපයීමේ නිරතව සිටී.
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම	කොළඹ 03, බී ඕ සී මර්චන්ට් ටවර් හි සහ මහනුවර සීබෑන්ක් හවුස් හි කාර්යාල අවකාශ කුලියට දීම.
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සේවා සම්බන්ධ කටයුතුවල නිරතවීම.
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	හෝටල් සේවා සැපයීම.
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක නිවාස/හෝටල්/විවේකාගාර/ආගන්තුක නිවාස කළමනාකරණය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගම	ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ සේවා සැපයීම.
සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම	මෙහෙයුම් කටයුතු නවතා ඇත.

1.3.3 ආශ්‍රිතයන්

ලංකා බැංකුවේ ආශ්‍රිත සමාගම්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	ඒකක භාර අරමුදල් සහ ආයතනික සහ පෞද්ගලික ආයෝජන කළමනාකරණය.
සී/ස ලංකා සික්‍යුරිටීස් (පෞද්ගලික) සමාගම	ලියාපදිංචි කොටස් තැරැව්කරුවෙකු වන අතර ස්කන්ධ සහ ණය සුරැකුම් ගනුදෙනු, ස්කන්ධ සහ ණය සුරැකුම් තැරැව්කාර සේවා සහ ණය සහ ස්කන්ධ සුරැකුම් භාර ගැනීම.
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම	ගොඩනැගිලි සහ වත්කම් කුලියට දීම.
සී/ස සඳර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම	ක්‍රියාකාරිත්වයේ නොමැති අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම, 2007 වසරේ සිට සිය මූලික ව්‍යාපාර කටයුතු සිදු කර නැත. සී/ස සඳර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම ක්‍රියාකාරිත්වයේ නොමැති අතර සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් සමාගම ඈවර කිරීමට තීරණය කර ඈවර කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

2.1 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන ප්‍රතිපාදන, 1988 අංක 30 දරණ බැංකු ආඥා පනත හා එහි සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං.හි.ප්‍ර/ශ්‍රී.ල.මූ.වා.ප්‍ර) අනුව, බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි හා ආශ්‍රිතයන්හි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

- ලාභ හෝ අලාභ ප්‍රකාශනය
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 පෙබරවාරි 27 වන දින අනුමත කරන ලදි.

3 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

3.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං. මූ. වා. ප්‍ර.) හා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං. හි. ප්‍ර.) වලින් සමන්විත වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. (පොදුවේ ශ්‍රී. ලං. මූ. වා. ප්‍ර. ලෙස මෙම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත.)

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට, 1988 අංක 30 දරණ බැංකු පනතට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සිදුකර ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කෙරෙන පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2023 දෙසැම්බර් 31 වැනි දිනට බලපැවැත්වෙන ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. වලට අනුකූල වන පරිදි පිළියෙළ කර ඇති අතර ඒ සමඟ සංසන්දනාත්මක වර්ෂය වන 2022 දෙසැම්බර් 31 වැනි දිනට සහ දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දත්ත ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2019 අංක 2 දරණ බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළිදරව් කිරීම් ප්‍රසිද්ධ කිරීමට අදාල චක්‍ර ලේඛනය මඟින් නියම කර ඇති ආකෘතියට අනුගත වෙමින් මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළිදරව් කිරීම් සඳහා ආකෘති භාවිතා කර ඇත.

3.2 මිනුම්කරණයේ පදනම

පහත සඳහන් ඒවා හැරුණු විට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සංගතතා පදනමට චේතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නා වූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගය මත මැනීම (සටහන් අංක 26 සහ 41)
- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් (සටහන් අංක 27)
- වෙනත් විස්තීරණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් (සටහන් අංක 30)
- අයිතිකරු විසින් පදිංචි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන්කිරීම් අඩු කල අගයට වාර්තා කෙරේ (සටහන් අංක 34).
- නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් ආයුගණකවරයෙකු විසින් තක්සේරු කර වර්තමාන අගය මත හඳුනාගත් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වලින් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කර වාර්තා කරනු ලැබේ (සටහන් අංක 48).
- මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය, හෙජ් ගිණුම්කරණයට අනුව ගිණුම්ගත කර ඇත (සටහන් අංක 53).

3.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති අයිතම එම අයිතමයේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය හා කල්පිරීමේ කාලය අනුව පෙළගස්වා ඉදිරිපත් කරනු ලැබේ.

වාර්තාකරණ දිනයේ සිට මාස 12 ඇතුලත කල් පිරෙන (ජංගම) හා මාස 12 න් පසුව කල්පිරෙන (ජංගම නොවන) වත්කම් හා වගකීම් පිළිබඳ විස්තරයක් සටහන් අංක 60, වත්කම් හා වගකීම් වල කල්පිරීම විශ්ලේෂණය හි අන්තර්ගත වේ.

3.3.1 ව්‍යවහාර හා වාර්තාකරණ මුදල් ඒකක

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් අයිතමයන් මිනුම්කරණය හා වාර්තාකරණය කරනු ලබන්නේ බැංකුව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ පවතින මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

3.3.2 උපචිත පදනම මත ගිණුම්කරණය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැරුනු කොට අනෙකුත් මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

3.3.3 හිලව් කිරීම

සාමාන්‍යයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මූල්‍ය වත්කම් හා වගකීම් වෙන් වෙන් වශයෙන් වාර්තා කරන අතර මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කිරීම, ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදුවන්නේ නීතිමය වශයෙන් බලය ලබාදී ඇති විටක සහ පහත සඳහන් අවස්ථාවල දී සම්බන්ධිත පාර්ශවයන් විසින් එකවිටම වත්කම් උපලබ්ධිය මඟින් වගකීම් පියවා ගැනීමේ අදහස් ඇති විට පමණක් වේ.

- සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු
- ණය පැහැර හැර ඇති අවස්ථාවක දී
- බැංකුවට/ සමූහයට සහ එහි පාර්ශ්වයන්ට වගකීම් පියවීමට නොහැකි අවස්ථාවන්හි හෝ බුන්වත් අවස්ථා වල දී

ගිණුම්කරණ ප්‍රමිතයක් මඟින් ඉඩ සලසා ඇති අවස්ථාවල දී හෝ අර්ථ නිරූපනය කර ඇති විටක සහ විශේෂයෙන් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සඳහන් කර ඇති විටක පමණක් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සඳහන් ආදායම් සහ වියදම් හිලව් කරනු ලැබේ.

3.3.4 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අවශ්‍ය අවස්ථා හිදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු විස්තරාත්මකව දක්වා ඇත. ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට සමගාමීව පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අතර ප්‍රවර්තන

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කිරීම් වලට අනුකූල වීම සඳහා අවශ්‍ය අවස්ථාවන් වලදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලැබේ.

3.3.5 ප්‍රමාණාත්මකභාවය සහ ඒකරාශි කිරීම

ලං. ගි. ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අනුකූලව, සමාන අයිතමයන්හි සෑම ප්‍රමාණාත්මක වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. විවිධ ස්වභාවයේ අසමාන අයිතමයන් හෝ කාර්යයන් ද ප්‍රමාණාත්මකවේ නම් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

3.3.6 වැටයීම

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විටෙක, ලං.ගි.ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" ට අනුව සියලුම අගයන් ආසන්නම රුපියල් දහස දක්වා වන පරිදි වටයා ඇත.

3.3.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ලං. ගි. ප්‍ර. 7 - "මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" ප්‍රමිතියට අනුව ලාභයට ගැලපීම් කර මෙහෙයුම් මුදල් ප්‍රවාහ ගණනය කිරීමේ වක්‍ර ක්‍රමයට සිදු කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ යටතට අතැති මුදල්, ද්‍රවශීලතාවයෙන් ඉහළ දින 7 කට අඩු කාලයකදී පරිණත ආයෝජන සහ බැංකු අයිරා අයත්වේ.

3.3.8 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේ භාවිතය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ඒ සඳහා භාවිතා කළ යුතු සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, තීරණය කිරීම හා වාර්තා වන වත්කම් සහ වගකීම් අගයන් මෙන්ම ආදායම් සහ වියදම් නිශ්චය කිරීමේ දී ඒ සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිශ්චය කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. සැබෑ ප්‍රතිඵල ඇස්තමේන්තු සමඟ වෙනස් විය හැක. විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් අතීත අත්දැකීම් සහ විවිධ අවස්ථාවන් මත සෑහීමකට පත්විය හැකි සාධක මත පදනම් වන අතර මේවා කාලීන පදනමක් මත සමාලෝචනයට භාජනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සමාලෝචනයේ දී ඒවා පිළිබඳව සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළ දී සහ අනාගත කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධනයන් අදාළ වන පරිදි ගිණුම්ගත කෙරේ. සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමේ දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වඩා වැදගත් බලපෑමක් ඇති කරන්නා වූ අගයන් මත කළමනාකරණය විසින් පහත සඳහන් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් භාවිතා කර ඇත. තවද, සමූහයේ වත්කම් මැනීමේදී අදාළ පරිදි ඇස්තමේන්තුවල වෙනස්කම් සිදු කරන ලදී. උපකල්පන, ඇස්තමේන්තු තීරණයන් සහිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

3.3.8.1 අඛණ්ඩ පැවැත්ම

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි බවට සෑහීමකට පත්විය හැකි සම්පත්, සමූහය සතු බවට කළමනාකාරිත්වය තක්සේරුවක් කර ඇත. තවද, සමූහයෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැලකියයුතු අවිශ්වාසයක් හෝ අවිනිශ්චිතතාවයක් කළමනාකාරිත්වය හඳුනාගෙන නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සමූහය අඛණ්ඩව පවතීය යන සංකල්පය භාවිතා කර ඇති අතර අඛණ්ඩව පවතීය යන පදනම සාධාරණ යැයි කළමනාකාරිත්වය සෑහීමකට පත්වී ඇත.

3.3.8.2 බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියළුම හඳුනාගත හැකි සහ මැනිය හැකි වගකීම් හි වටිනාකම් ගිණුම් තබනු ලැබේ. අසම්භාව්‍ය වගකීම් යනු අනාගත අවිනිශ්චිත සිදුවීම්වල තහවුරු කිරීමක් මත ඇතිවිය හැකි බැඳියාවක් හෝ වර්තමානයේ බැඳීමක් ඇතත් ආර්ථික ප්‍රතිලාභයන් ගලා යාමේ සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි වගකීමය. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර, ඒවායේ සිදුවිය හැකි බව දුරස්ථ නොවන්නේ නම් අනාවරණ කරනු ලැබේ.

3.3.8.3 සාධාරණ අගය මත මූල්‍ය උපකරණ

අගය කරනු ලබන දිනට වෙළඳපළ ගනුදෙනුකරුවන් අතර සාමාන්‍ය ව්‍යාපාර කටයුත්තක් ලෙස වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් පියවීමට ගෙවන මුදල සාධාරණ අගය වේ. සාධාරණ අගයට වර්ගකරන වත්කම් වල හෝ වගකීම් වල සාධාරණ අගය ප්‍රශස්ත ක්‍රියාකාරී වෙළඳපළක ඇති ඉල්ලුම් මිල හෝ ඉදිරිපත් කරන මිල ලෙස තක්සේරු කරනු ලැබේ. කිසියම් වත්කමකට හෝ වගකීමකට අදාලව ක්‍රියාකාරී වෙළඳපළක් නොමැති අවස්ථාවල එම වත්කම් වල හෝ වගකීම් වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා ගණිතමය තක්සේරු ක්‍රම, ආසන්නව සිදුවූ සාධාරණ ගනුදෙනුවල තීරණය වූ මිල, වට්ටම් කල මුදල් ප්‍රවාහ විශ්ලේෂණය, මිල කිරීම් ආදී තක්සේරු ක්‍රම යොදා ගනී. සාධාරණ අගය ගණනය කිරීමේද ණය අවදානමද අදාල පරිදි ගලපනු ලැබේ. මෙම අගය කිරීමේ ක්‍රමවලදී අවම වශයෙන් ආයතනයට විශේෂ වූ යෙදවුම් පදනම් වන අතර උපරිම වශයෙන් හඳුනාගත හැකි වෙළඳපළ යෙදවුම් යොදාගනී. මූල්‍ය උපකරණයක් මුල් වරට හඳුනා ගැනීමේදී සාධාරණ අගය සඳහා ප්‍රශස්ත පදනම ගනුදෙනු කරන ලද මිලයි. එසේ නොමැතිනම් එම මූල්‍ය උපකරණ වල හඳුනාගත් වෙළඳපළක වර්තමාන ගනුදෙනු මිල හෝ හඳුනාගත් වෙළඳපළක දත්ත පදනම්ව සිදු කරන අගය කිරීම් යොදාගනු ලැබේ. සමූහය විසින් සාධාරණ අගය සහ ගනුදෙනු මිල අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයට හඳුනා ගනී. මූල්‍ය උපකරණ අගය කිරීම සවිස්තරාත්මකව සටහන් 63 හි දක්වා ඇත.

3.3.8.4 ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ

ණය හා අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ තීරණය කිරීමේදී ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ මුදල් ප්‍රවාහ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණයට නිගමන වලට එළඹීමට සිදුවේ.

ඒ අනුව සෑම වාර්තා කරන දිනකට අදාලව සමූහය විසින් කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් ඇගයීමක් සිදු කරන අතර හානිකරණ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කෙරේ.

විශේෂයෙන්ම හානිකරණ අලාභය ගණනයේදී අනාගත මුදල් ප්‍රවාහ ප්‍රමාණ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චයන් අවශ්‍යවේ.

මෙම මුදල් ප්‍රවාහ නිර්ණය කිරීමේදී සමූහය විසින් ණයකරුගේ මූල්‍ය තත්ත්වය, උකස්කරයන් විකුණා ලැබිය හැකි මිල ආදී කරුණු සලකා බලයි. සාධක බොහෝමයක් සඳහා සිදු කරනු ලබන උපකල්පන මත මෙම තක්සේරුව සිදු කරනු ලබන නිසා සත්‍ය ප්‍රතිඵල වෙනස් වීම මත හානිකරණ ප්‍රතිපාදන වලටද අනාගත වෙනස්කම් ඇති විය හැකිය. කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ කේවල වශයෙන් ප්‍රමාණාත්මක වුවත් හානිකරණය නොවූ ණය සහ අත්තිකාරම් සමාන ලක්ෂණ සහිත කාණ්ඩ වලට බෙදා සමූහ

හානිකරණ වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

සමූහ හානිකරණ ඇගයීමේදී ණය කළඹයන්හි ණයවල ගුණාත්මය, හිඟ මට්ටම, ණය භාවිතය ආදිය සහ සංකේන්ද්‍රණ අවදානම, විරැකියාව, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදන වර්ධනය, රටට අදාල දර්ශක ආදී ආර්ථික දත්තයන්ද, විවිධ පුද්ගල සමූහයන්ගේ කාර්යය සාධනයන්ද සැලකිල්ලට ගෙන ඇත.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" වලට අනුව අපේක්ෂිත ණය අලාභ ක්‍රමය පදනම්ව ණය හානි අවශ්‍යතා හඳුන්වා දී ඇති අතර එමඟින් මූල්‍ය උපකරණයන්හි ණය ගුණාත්මකතාවයේ වර්ධනය හෝ අඩුවීම නිරූපනය වේ. සමූහය විසින් කේවල වශයෙන් හෝ සමූහ වශයෙන් අපේක්ෂිත ණය අලාභය ගණනය කරනු ලැබේ. මූලික හඳුනා ගැනීමේ සිට ණය වල ගුණාත්වය පහළ යාම පදනම්ව ණය හානිකරණය හෝ වෙන් කිරීම් ලෙස අපේක්ෂිත අලාභ ප්‍රමාණය හඳුනා ගන්නා අතර එය පහත පරිදි ගණනය කරනු ලැබේ.

- ඉදිරි මාස 12 තුළ අපේක්ෂිත ණය අලාභ (අදියර 1); සැලකිය යුතු ලෙස ණය අවදානම් අඩු තත්ත්වයක්.
- ආයු කාලය පුරා අපේක්ෂිත ණය අලාභ (අදියර 2 සහ අදියර 3); තනි තනි වශයෙන් හෝ කාණ්ඩ වශයෙන් ණය අවදානම ඉහළ ගොස් ඇති විට මෙම පදනම යොදා ගැනේ.

සමූහය විසින් අපේක්ෂිත ණය අලාභ ක්‍රමයට අදාලව පහත සඳහන් අමතර නිගමනයන් හා තක්සේරු සිදු කර ඇත.

- මූල්‍ය වත්කම් වල ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්නම් ඒවා ආයුකාලය පුරා අපේක්ෂිත ණය අලාභ පදනමට අගය කල යුතුය.
- අපේක්ෂිත ණය අලාභ ආකෘතීන් ගොඩ නැගීමේදී විවිධ සමීකරණ සහ යෙදවුම් වල තෝරා ගැනීම් සිදු කල යුතුය.
- දළ දේශීය නිෂ්පාදන වර්ධනය, උද්ධමනය, පොළී අනුපාත, විදේශීය විනිමය අනුපාත සහ සේවා වියුක්තිය වැනි සාර්ව ආර්ථික තත්ත්වයන් ණය පැහැර හැරීමේ සම්භාවිතාව, ණය පැහැර හරින අවස්ථාවේ නිරාවරණ අගය සහ ණය පැහැර හැරීමේ අලාභය සමඟ පවතින සම්බන්ධතාවය නිර්ණය කිරීම.
- අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීමේ ආකෘතියට අනාගත සාර්ව ආර්ථික යෙදවුම් තෝරා ගැනීම හා බර තැබීම.

සාමූහික ප්‍රතිපාදන ගණනය කිරීම සඳහා පාදක වූ ආර්ථික අවස්ථා සහ ඉදිරි දැක්ම සාර්ව ආර්ථික උපකල්පන සටහන 4.4.11 හි දක්වා ඇත.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව සමාන ලක්ෂණ සහිත ණය සඳහා සමූහ හානිකරණ වෙන්කිරීම සංඛ්‍යාත්මක ආකෘතියක් හෝ අතීත පාඩු අනුපාත අත්දැකීම් පදනම් සමීකරණ ප්‍රවේශය, හිඟ හිටි දින පිළිබඳ තොරතුරු පදනම්ව අලාභ ප්‍රමාණය තීරණය කිරීම සඳහා සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමවේදයන්ද යොදා ගනිමින් ගණනය කරයි. අලාභ ඇස්තමේන්තුව තහවුරු කර ගැනීම සඳහා වාර්තා කරන දිනයට ගැලපෙන ආකාරයට ආර්ථික තත්ත්වයන් සහ ණය කළඹේ සුවිශේෂිතා ගැලපීම සඳහා අතීත තොරතුරු ගලපනු ලැබේ. අලාභ ප්‍රතිශත සත්‍ය අලාභ සමඟ නිරතුරුව සසඳා බලනු ලැබේ.

සත්‍ය අලාභ අත්දැකීම් පදනම්ව ආකෘති කාලානුරූප ඇගයීම් සිදු කිරීම හා ගැලපීම් සිදු කිරීම සමූහයේ ප්‍රතිපත්තියයි. ආකෘතිවල යොදාගන්නා උපකල්පන සහ හානිකරණ පරිමිතීන්වල නිවැරදිතාවය මත හානිකරණ වෙන්කිරීම් වල නිවැරදිතාවය තීරණය වේ. ණය හා අත්තිකාරම් මත හානිකරණ අලාභ පිළිබඳ විස්තරාත්මක තොරතුරු සටහන් 14 හි දක්වා ඇත.

3.3.8.5 පරිපාලිත සමාගම්වල ආයෝජනයන්හි හානිකරණය සහ වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් සඳහා හානිකරණය

ආයෝජනයක් හෝ මූල්‍ය වත්කමක් හානිකරණයට ලක්වේදැයි සලකා බැලීම සඳහා බැංකුව සහ සමූහය විසින් ලං.ගි.ප්‍ර. 36 - "වත්කම් සඳහා හානිකරණය" හා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" ප්‍රමිතියන්හි දී ඇති උපදෙස් අනුගමනය කරයි. වත්කමක පොත් අගයට වඩා අයකර ගත හැකි වටිනාකම අඩු වේ නම් හානිකරණයන් ඇති වන අතර එම හානිකරණය තීරණය කිරීම හා මැනීම සඳහා අදාළ බාහිර හා අභ්‍යන්තර පරිසරය මඟින් ලබා දෙන සංඥා හඳුනා ගත යුතු වේ. එම සංඥා හඳුනා ගැනීමට සහ හානිකරණ වටිනාකම තීරණය කිරීම සඳහා ආසන්න ව්‍යාපාරික පරිසරය විශ්ලේෂණය කිරීම සහ අදාළ වන ව්‍යාපාර ඛණ්ඩයේ මූල්‍ය පරිසරයේ ස්වාභාවය, කර්මාන්තය, තාක්ෂණය සහ මෙහෙයුම් පරිසරය වෙනස් වීම යන සාධක අනාගත මුදල් ප්‍රවාහ සමඟ විශ්ලේෂණය කළ යුතු වේ. මෙම ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු හිණුම්කරණ විනිශ්චයන් භාවිතා වේ.

3.3.8.6 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම්

ආයුගණක තක්සේරු යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් සහ අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් හි පිරිවැය නිර්ණය කරනු ලබයි. ආයුගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාත, සැලසුම් වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාතය සහ අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම යන උපකල්පන භාවිතා කරනු ලැබේ. මෙම සැලසුම් දිගු කාලීන ස්වභාවයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු අවිනිශ්චිත ස්වභාවයක් ගනු ඇත.

වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වලට අදාල කාලපරිච්ඡේදයන්ට සමාන ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කර වල පොළී අනුපාතය සලකා බලයි. උපත් හා මරණ අනුපාතය සඳහා ප්‍රසිද්ධ කර ඇති උපත් හා මරණ අනුපාත වගු යොදා ගෙන ඇත. වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම, අනාගත උද්ධමන අනුපාතය සහ සමූහයේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය මත පදනම් වී ඇත. සෑම උපකල්පනයක්ම වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලබන අතර වර්ෂය තුළදී යොදාගත් උපකල්පන සටහන් 48 හි දක්වා ඇත.

3.3.8.7 ඉඩම් සහ ගොඩනැගිලි වල සාධාරණ අගය

සමූහයේ නිදහස් අයිතිය සහිත ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ඇති ගොඩනැගිලි වල සාධාරණ අගයෙන් සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර සටහන් කරනු ලැබේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 13 - "සාධාරණ අගය මිනුම්කරණය" අනුව, දේපළ වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා සමූහය විශේෂඥ ස්වාධීන තක්සේරුකරුවන් යොදවනු ලැබේ. නිදහස් අයිතිය සහිත ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු අයිතිය සහිත ඉඩම් මත ගොඩනැගිලි තක්සේරුවට අදාළ විස්තර සටහන් 34 හි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

3.3.8.8 දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවිත කාලය

දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් වල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම තක්සේරු කිරීම් සඳහා කළමනාකරණය විසින් විවිධ ප්‍රතිශතයන්, අගයන් සහ ක්‍රමවේදයන් යොදාගනු ලබන බැවින් එම විනිශ්චයන් යම් අවිනිශ්චිතතාවයකට භාජනය විය හැක. එක් එක් වත්කම් බණ්ඩය සඳහා යොදා ගත් ක්ෂය කිරීමේ ක්‍රමවේදය සහ ක්ෂය අනුපාතයන් සටහන් 34 හි දක්වා ඇත.

3.3.8.9 ආයෝජන දේපළ වර්ග කිරීම

දේපළක් ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් ලැබීම නිර්ණය කිරීම කළමනාකරණ විනිශ්චයන් මත සිදුවේ. බදු කුලී ලබා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම හෝ ඒ අරමුණු දෙකම සඳහා පවත්වා ගනු ලබන දේපළ තුළින්, සමූහය පවත්වාගෙන යනු ලබන අනෙකුත් වත්කම් වලින් ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ජනනය කරනු ලබයි නම් එම දේපළ ආයෝජන දේපළක් ලෙස නිර්ණය කෙරේ. අනෙක් අතට මෙහෙයුම් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන හෝ සේවා සැපයීමේ ක්‍රියාවලියේ යොදාගන්නා හෝ පරිපාලන අරමුණින් පවත්වාගෙන යනු ලබන ස්වාධීනව මුදල් ප්‍රවාහ ජනනය නොකරන වත්කම්, දේපළ පිරියත සහ උපකරණ ලෙස නිර්ණය කරනු ලැබේ.

3.3.8.10 ආයෝජිතයන් පාලනය කිරීම තීරණය කිරීම

පරිපාලිතයන් යනු බැංකුව විසින් පාලනය කරන ආයතන වේ. බැංකුව ආයෝජිතයා තුළ ආයෝජනය කිරීම නිසා විචලනය වන ප්‍රතිලාභ ලැබීමට අයිතියක් හෝ එසේ ලැබීමට සිදුවේ නම් සහ ආයෝජකයාගේ කටයුතු පාලනය කිරීම තුළින් ලැබෙන ප්‍රතිලාභ වලට බලපෑමක් සිදු කිරීමට බැංකුවට හැකියාවක් ඇත්නම් එවැනි ආයෝජන මත බැංකුවට පාලනය කිරීමේ හැකියාවක් ඇතැයි නිගමනය කළ හැක. බැංකුව විසින් එහි ආයෝජිතයන් පාලනය කිරීම තීරණය කිරීම පිළිබඳව කළමනාකරණ විනිශ්චයන්ට එළඹීමට සිදු වේ.

3.3.8.11 බදුකරණය

සමූහය විසින් ආදායම් බදු සහ එකතුකළ අගය මත බද්ද (VAT) ඇතුළුව අනෙකුත් අදාල බදු ගෙවිය යුතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන කාලය තුළ අදාළ වන්නා වූ බදු නීතිරීතිවල හා එම නීති අර්ථ නිරූපනය කරන ආකාරයෙන් ඇති අවිනිශ්චිතතාවයන් නිසා ආදායම් බදු වගකීම, විලම්බිත බදු වගකීමට හා වෙනත් බදු වගකීම් වලට අදාළ වෙන් කිරීම් සඳහා ගිණුම්කරණ විනිශ්චයන් යොදා ගත යුතු වේ. අදාළ බදු අනුපාතයන් සහ බදුකරණයට අදාළ වෙනත් තොරතුරු සටහන් 4.8, 18 සහ 37 යටතේ දක්වා ඇත.

පැවරුම් මිල රෙගුලාසීන්ට සමූහය යටත් වන අතර මෙවැනි ගනුදෙනුවල බලපෑම තීරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චය භාවිතා කිරීම අවශ්‍ය වේ. ආශ්‍රිත ගනුදෙනු, සාධාරණ මිල තීරණය කිරීම සහ සුදුසු මිල ගණන් තෝරා ගැනීම ඇතුළුව පැවරුම් මිල රෙගුලාසිවලට අනුකූල වීම සඳහා එහි බලපෑම තීරණය කිරීමට අවශ්‍ය අවස්ථාවල දී මෙම කළමනාකරණ විනිශ්චයන් භාවිතා කරන ලදී. ප්‍රවර්තන බදු වියදම මෙම විනිශ්චයන් පදනම්ව ගණනය කර ඇත. ඇස්තමේන්තු කරන ලද ආදායම් බදු වියදම හා සත්‍ය බදු ගෙවීම් අතර වෙනසට හේතු වන්නේ කළමනාකාරීත්වයේ බදු සම්බන්ධ අර්ථ දැක්වීමේ වෙනස්කම් හා බදු රෙගුලාසි භාවිතා කිරීමෙන් ඇති වූ වෙනසයි.

4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

බැංකුව සහ සමූහය විසින් සිය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත ඇතුළත් කර ඇති අතර, වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් හැර, සමූහයේ සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ කර ඇත.

4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 10 - "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ" සහ ලං.ගි.ප්‍ර. 27 - " ඒකාබද්ධ හා කේවල මූල්‍ය ප්‍රකාශ" අනුව බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ කර සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. ලං.ගි.ප්‍ර. 28 - "ආශ්‍රිතයන් සහ ඒකාබද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන" අනුව ආශ්‍රිත සමාගම් වල ලාභ හා ශුද්ධ වත්කම් අයත් ප්‍රමාණය හා පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

දේශීය බැංකු අංශයේ, අක්වෙරළ බැංකු අංශයේ සහ අන්තර්ජාතික ගනුදෙනු අංශයේ ඒකාබද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 31 හා 32 යටතේ දක්වා ඇත.

4.1.1 ව්‍යාපාර සංයෝජනය

සමූහය, ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 - "ව්‍යාපාර සංයෝජන" හි නිර්වචනයට අනුකූලව දේපළ අත්පත් කරගැනීම සහ වගකීම් භාර ගැනීම සිදු වී ඇත්නම් ගනුදෙනුව හෝ වෙනත් සිද්ධියක් ව්‍යාපාර සංයෝජනයක්ද යන වග නිර්ණය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ ක්‍රමය මඟින් ව්‍යාපාර සංයෝජනය ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය මත හෝ ආයෝජකයාගේ හඳුනාගත් ශුද්ධ වත්කම්වල පාලනයට යටත් නොවන හිමිකමට සමානුපාත කොටසෙනි.

අත්පත් කර ගැනීම සම්බන්ධිත වියදම යනු ව්‍යාපාර සංයෝජනයේ දී අත්පත් කරනු ලබන්නා විසින් දරන ලද වියදම් වේ. එම වියදම්වල අඩංගු වන්නේ තැරැව්කාර ගාස්තු, උපදේශක, නීති, ගිණුම්කරණ, ඇස්තමේන්තු සහ අනෙකුත් වෘත්තිමය උපදේශන ගාස්තු, සාමාන්‍ය පරිපාලන වියදම්, අභ්‍යන්තර අත්පත් කරගැනීමේ දෙපාර්තමේන්තු පවත්වා ගැනීමේ වියදම් සහ ණය සහ ස්කන්ධ සුරුකුම්පත් ලියාපදිංචි කිරීමේ සහ නිකුත් කිරීමේ වියදම්ය. ණය සහ ස්කන්ධ සුරුකුම්පත් නිකුත් කිරීමේ කටයුතු හා සම්බන්ධ නොවන අනෙකුත් අත්පත් කර ගැනීම් සහ සම්බන්ධිත වියදම් එම සේවාවට අදාළව දැරූ විට එම කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම් ගණනය කිරීම සඳහා පදනම වශයෙන් සාධාරණ අගයට ගනුදෙනුවෙන් ගනුදෙනුවට හෝ ශුද්ධ වත්කම් වලින් සමානුපාතික කොටස සමූහය විසින් තෝරා ගනු ලැබේ.

සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයේ දී දරන ලද ණය නිකුත් කිරීමේ දී හා ස්කන්ධ සුරුකුම්පත් සඳහා ගන්නා ලද වියදම් හැරුණු විට අනෙකුත් වියදම් දැරූ අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනා ගැනේ.

4.1.2 පාලනය අහිමි වීම

පාලනය අහිමි වීමේ දී සමූහය විසින් පරිපාලිතයන්ගේ හඳුනාගත් වත්කම් සහ වගකීම්, පාලනයට යටත් නොවන හිමිකම් සහ ස්කන්ධය අදාලව වෙනත් අගයන්ද ඇත්නම් සියළු අගයන් පොත් වලින් ඉවත් කරනු ලැබේ. තවද වෙනත් විස්තීර්ණ ආදායම යටතේ පෙර හඳුනාගත් යම් අගයක් වේ නම් ඒවා සුදුසු පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශයට හෝ රඳවාගත් ඉපැයුම් වලට නැවත හඳුනාගනු ලැබේ. පාලනය අහිමි වීමේ දී ඇතිවන ඌනතාවය හෝ අතිරික්තය ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ගලපනු ලැබේ. සමූහය විසින් අදාළ පරිපාලිතයේ යම් ඇල්මක් රඳවා තබා ගනී නම් එවැනි රඳවාගත් හිමිකම පාලනය අහිමි වන දිනට සාධාරණ අගයට මනිනු ලැබේ. ඉන් පසු රඳවාගත් ආයෝජනය ස්කන්ධ ආයෝජන පදනමට හෝ සමූහයේ මූල්‍ය උපකරණ ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති අනුව ගිණුම් තැබේ.

4.2 විදේශ මුදල් පරිවර්තනය

4.2.1 විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ගනුදෙනු ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන්නේ ගනුදෙනුව සිදු වන දිනට පවතින විනිමය අනුපාත මඟින් පරිවර්තනය කිරීමෙනි. විදේශ වලංගු මුදල් වලින් නිරූපණය කෙරෙන මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනට බලපැවැත්වෙන විනිමය අනුපාතිකයන්ට අනුව ව්‍යවහාර මුදල් වලට නැවත පරිවර්තනය කරනු ලබන අතර වෙළඳ නොවන කටයුතු තුළින් ඇතිවන්නා වූ වෙනස්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ "සටහන් 13 - වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ සටහන් කරනු ලැබේ. විදේශ මුදල් වලින් වෙහිහාසික පිරිවැයට නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් එම ගනුදෙනුව මුලින්ම සිදු වන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදල් වලින් නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල වටිනාකම සාධාරණ අගයට වාර්තා කරන විට, ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ සාධාරණ අගය තීරණය කරන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය. නැවත පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය වෙනස්කම් ඇතුළු ලාභ හෝ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි. ඉදිරි විනිමය ගිවිසුම් තක්සේරු කරනු ලබන්නේ වාර්තා කරන දිනට බලපැවැත්වෙන ඉදිරි වෙළඳපල අනුපාතිකයන්ට අනුව වන අතර ඉන් ඇතිවන උපලබ්ධි නොවූ ශුද්ධ ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සටහන් කරනු ලැබේ.

4.2.2 විදේශීය මෙහෙයුම්

ශ්‍රී ලංකා රුපියල් නොවන ව්‍යවහාර මුදල් භාවිතා කරන්නා වූ විදේශීය මෙහෙයුම්වල මෙහෙයුම් ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වයන් පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශීය මෙහෙයුම්වල පවතින වත්කම් සහ වගකීම් වාර්තාකරණ දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ.

ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් කාලපරිච්ඡේදයේ සාමාන්‍ය විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කෙරේ. විදේශ මෙහෙයුම් පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය අසමානතා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි. යම් විදේශ මෙහෙයුමක් බැහැර කිරීමේ දී අදාළ මෙහෙයුමට අදාළව පරිවර්තන සංචිතයේ ඇති ප්‍රමාණය විකිණීමෙන් ලද ලාභයක් හෝ අලාභයක් ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් හෝ වියදම් යටතේ දැක්වේ.

4.2.3 හෙජ් ගිණුම්කරණය

විදේශ මුදල් ගනුදෙනුවලින් විදේශ විනිමය අවදානම අවම කිරීම සඳහා බැංකුව වෙනත් පාර්ශ්ව සමඟ හෙජින් විධිවිධානවලට එළඹේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" ට අනුව, ආයතනයක් අයිතමයක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෙජ් අයිතමයක් ලෙස නම් කළ හැක. හෙජින් සබඳතාවයක් හෙජින් ගිණුම්කරණය සඳහා සුදුසුකම් ලබන්නේ හෙජින් සම්බන්ධතාව සුදුසුකම් ලත් හෙජින් උපකරණ සහ සුදුසුකම් ලත් හෙජින් අයිතම වලින් පමණක් සමන්විත වන්නේ නම් පමණි.

හෙජින් සබඳතාවයේ ආරම්භයේ දී හෙජින් සබඳතාවයේ විධිමත් නම් කිරීම සහ ලේඛනගත කිරීම සහ ආයතනයේ අවදානම් කළමනාකරණ පරමාර්ථය සහ හෙජ් භාර ගැනීම සඳහා උපාය මාර්ග ඇත. එම ලේඛනයට හෙජින් උපකරණය හඳුනා ගැනීම, ආරක්ෂිත අයිතමය, ආරක්ෂිත අවදානමේ ස්වභාවය සහ හෙජින් සම්බන්ධතාව හෙජ් කාර්යක්ෂමතාවයේ ප්‍රභවයන් විශ්ලේෂණය කිරීම සහ එය තීරණය කරන්නේ කෙසේද යන්න ඇතුළුව, හෙජ් සඵලතා අවශ්‍යතා සපුරාලන්නේද යන්න තක්සේරු කරන්නේ කෙසේද යන්න ඇතුළත් විය යුතුය.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 09 - "මූල්‍ය උපකරණ" නම් කරන ලද කොටස් තුනක් යටතේ හෙජ් ගිණුම්කරණයට මඟ පෙන්වයි. මුදල් ප්‍රවාහ හෙජ් (ඉහළ සම්භාවිතා පුරෝකථනයක් සහිත ආයතනික බැඳීමක් සහිත ගනුදෙනු (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් නොකළ), විදේශ ව්‍යවහාර මුදල් ප්‍රවාහ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගත් හෝ පුරෝකථනය කළ අන්තර් සමාගම් ගනුදෙනු) සාධාරණ අගයට අගය කළ හෙජ් (ආයතනික බැඳීමක් සහිත (සටහන් නොකළ) හෝ විදේශ ව්‍යවහාර මුදල් වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගත් ගනුදෙනු), ශුද්ධ හෙජ් ආයෝජන (විදේශ මෙහෙයුම් ශුද්ධ ආයෝජන සඳහා නම් කරන ලද), ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 09 - "මූල්‍ය උපකරණ" හි නිශ්චිතව දක්වා ඇති හෙජ් ගිණුම්කරණය යටතේ බැංකුව මෙම ගනුදෙනු ගිණුම් ගත කරනු ලබන අතර එවැනි උපකරණවල එක් එක් වාර්තාකරණ දිනයන් අනුව ඉදිරි විනිමය අනුපාත භාවිතා කරමින් අගය කරනු ලැබේ.

4.3 මූල්‍ය උපකරණ ණය සහ ස්කන්ධ ලෙස වර්ග කිරීම

පහත සඳහන් ස්වභාවයන් මත පදනම්ව මූල්‍ය උපකරණ ණය හා ස්කන්ධ ලෙස වර්ග කෙරේ.

- මූල්‍ය උපකරණයට දී ඇති නම
- ස්ථිර පරිනත දිනයක් ඇති හෝ නොමැති බව
- උපකරණයේ ආයු කාලය
- ගෙවීමේ ප්‍රභව
- ගෙවීම් ලබා ගැනීම සඳහා බලපෑම් කිරීමේ අයිතිය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

- කළමනාකරණයට සහභාගීවීමේ අයිතිය
- උපකරණ සමඟ බැඳී ඇති අවදානම
- මුදල් ප්‍රවාහ වල විචලනය
- සුරැකුම් ලෙස දී ඇති දෑ

4.4 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

4.4.1 මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා බැහැර කිරීම


මූල්‍ය වත්කම් හා වගකීම් ගෙවීම් සිදුකරන දිනයේදී එනම් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමූහය පාර්ශ්වකරුවෙකු බවට පත් වන දිනයේදී මූලිකව හඳුනා ගනී. "ක්‍රමවත් ආකාරයේ වෙළඳාම" මෙයට ඇතුලත් වේ. ක්‍රමවත් ආකාරයේ වෙළඳාම යනු වෙළඳපළ තුළ සාමාන්‍යයෙන් පවතින සම්මුතීන් හා නියාමනයන් අනුව ස්ථාපනය කර ඇති කාල රාමුව අනුව වත්කම් ලබාදීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හා විකිණීමයි. ණය ලබා ගන්නාට මුදල් අත්තිකාරම් ලබා දුන් විට (හෝ ගෙවූ විට) ණය හා අත්තිකාරම් හඳුනාගනු ලබයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ වටිනාකමට හඳුනා ගනී. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම හා ඍජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට හඳුනා ගනී.

වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහ කල් පිරෙන විට හෝ හිමිකාරිත්වයේ සියලු අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස හුවමාරු වන ගනුදෙනුවකින් මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය හුවමාරු වේ නම් සමූහය විසින් මූල්‍ය වත්කම් බැහැර කරයි. හුවමාරු කල මූල්‍ය වත්කමක ඇති වූ හෝ රඳවාගත් අයිතියක් ඇත්නම් සමූහය විසින් එය වෙනමම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී.

වගකීම සඳහා ඇති බැඳියාව නිදහස් කල විට හෝ අවලංගු වූ විට හෝ කල් පිරී ඇති විට මූල්‍ය වගකීම් ඉවත් කරයි. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණය දෙන්නාගෙන් ප්‍රමාණවත් ලෙස වෙනත් වගකීමකින් වෙනස් වූ කොන්දේසි වලින් ප්‍රතිෂ්ඨාපනය කරන විට හෝ පවතින වගකීමේ කොන්දේසි ප්‍රමාණවත් ලෙස සංශෝධනය කර ඇත්නම් එවැනි හුවමාරුවක් හෝ සංශෝධනයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සලකා නව වගකීමක් හඳුනා ගනී. මුල් මූල්‍ය වගකීම පවත්වාගෙන යාමේ වටිනාකම හා ගෙවූ ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.4.2 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වර්ගීකරණය

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා පවතින සමූහයේ ව්‍යාපාර ආකෘතිය හා මූල්‍ය වත්කම් වල මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම්ගත කොන්දේසි මත පදනම්ව වර්ගීකරණය තීරණය වේ. බැංකුව මූල්‍ය වත්කම් වර්ගීකරණය කරන ආකාරය පහත රූප සටහන මඟින් නිරූපණය කෙරේ.



4.4.2.1 ආරම්භයේදී මූල්‍ය වත්කම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි

- ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනිනු ලබන මූල්‍ය වත්කම් (සටහන 4.4.7 සහ 27)
- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම්
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම් (සටහන 28)
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ (සටහන 4.4.8 සහ 29)
- වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම් (සටහන 4.4.9 සහ 30)

4.4.2.2 ආරම්භයේදී මූල්‍ය වගකීම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි

- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම්
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු (සටහන 42)
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් හා යටත්කාලීන ණය (සටහන 43 සහ 49)

4.4.3 මූල්‍ය උපකරණයන් මූලිකව අගය කිරීම

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කර ඇති අවස්ථාවලදී හැර මූල්‍ය වත්කම් හා වගකීම්

ඒවායේ සාධාරණ වටිනාකම හා ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට මූලිකව අගය කරයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වලට අදාල ගනුදෙනු පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

4.4.4 "එක් දින" ලාභ හෝ අලාභ

යම් මූල්‍ය උපකරණයක ගනුදෙනු වන මිල, එම මූල්‍ය උපකරණයම ගනුදෙනු වන වෙනත් නිරීක්ෂිත වර්තමාන වෙළඳපළක සාධාරණ අගයට හෝ නිරීක්ෂිත වර්තමාන වෙළඳපළ දත්ත මත ගණනය කරන ලද සාධාරණ අගයට හෝ වෙනස් වන්නේ නම් එම සාධාරණ අගයෙහි හා ගනුදෙනු මිලෙහි වෙනස සමූහය විසින් වහාම ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ("එක් දින" ලාභ හෝ අලාභ) හඳුනා ගනේ. නිරීක්ෂිත නොවන දත්ත මත සාධාරණ අගය ගණනය කරනු ලබන අවස්ථාවන්හිදී ගනුදෙනු මිල සහ ආදර්ශ මිල අතර වෙනස එම මූල්‍ය උපකරණයේ ආයුකාලය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.4.5 ව්‍යාපාර ආකෘති ඇගයීම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව, 2018 ජනවාරි 1 දින සිට බල පැවැත්වෙන පරිදි, සමූහය විසින් සිය ව්‍යාපාර ආකෘතිය හා එහි අරමුණු පදනම් කර ගනිමින් මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබයි. එහෙත් එය වත්කම වෙන වෙනම ඇගයීම සිදු නොකරනු ලබන අතර වත්කම් කළඹ වශයෙන් ව්‍යාපාර ආකෘතිය සමඟ සසඳා වර්ගීකරණය කරනු ලබයි. එයට හේතු වන්නේ ව්‍යාපාරය කළමනාකරණය කරන ක්‍රමය සහ කළමනාකරණයට තොරතුරු ගලාගෙන යන ආකාරය මෙය වන බැවිණි. මූල්‍ය වත්කම් වර්ගීකරණය සඳහා සලකා බලන තොරතුරු පහත දැක්වේ.

- ආයෝජන කළඹ සඳහා අදාල වන ප්‍රතිපත්ති හා අරමුණු හා ඒවා ක්‍රියාත්මක වන ආකාරය, විශේෂයෙන්ම, ගිවිසුම් ගත පොළී ආදායම උපයා ගැනීම, විශේෂිත පොළී අනුපාතයක් පවත්වා ගැනීම, වත්කම් ආයෝජනය කර ඇති කාලසීමාව හා එම වත්කම් සඳහා අරමුදල් ප්‍රතිග්‍රහණය කරණු ලබන වගකීම් වල කාලසීමාව සංසන්දනය කිරීම හෝ මුදල් ජනනය සඳහා වත්කම් විකිණීම වැනි කටයුතු කෙරෙහි කළමනාකාරිත්වයේ උපායමාර්ගික අවධානයේ ස්වභාවය,
- ආයෝජන කළඹේ කාර්යසාධනය ඇගයීමට ලක්කරන්නේ කෙසේද යන්න සහ බැංකුවේ කළමනාකාරිත්වයට වාර්තා කරන්නේ කෙසේද යන්න පිළිබඳව,
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ පවත්වා ගෙන යන මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න,
- ව්‍යාපාර කළමනාකරුවන්ට ගෙවීම් සිදුවන්නේ කෙසේද? එනම් කළමනාකරණය කරන වත්කම් වල සාධාරණ අගය මත පදනම්ව හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීම මඟින් ගෙවීම් සිදු වේද යන්න හා
- පෙර වර්ෂ වලදී මූල්‍ය වත්කම් විකුණූ වාර ගණන, ප්‍රමාණය සහ කාල සීමා, මෙම විකුණුම් වලට බලපාන ලද හේතු සහ අනාගතයේදී වත්කම් විකිණීමට ඇති අපේක්ෂාවන්. කෙසේ වෙතත්, විකුණුම් පිළිබඳ තොරතුරු වෙන්ව නොසැලකෙන අතර මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම තුළින් බැංකුවේ ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සහ මුදල් ප්‍රවාහ ජනනය කළ ආකාරයද සලකා බලයි.

ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කර ඇත්තේ "හානිකර අවස්ථාව" හෝ "ආතති අවස්ථාව" යන කරුණු සලකා නොගෙන සාධාරණ අපේක්ෂිත සිදුවීම මතය. මූලික හඳුනා ගැනීමකින් පසුව මූල්‍ය වත්කම් වලට අපේක්ෂිත මුදල් ප්‍රවාහයේ මූලික වෙනසක් සිදු වුවත්, බැංකුව විසින් ඉතිරි මූල්‍ය වත්කම් වල වර්ගීකරණයේ වෙනස් කිරීමක් සිදු නොකරනු ලැබේ. එහෙත් අළුතින් මිලදී ගන්නා මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී ඉහත අපේක්ෂාවන්ගේ වෙනස් වීම සැලකිල්ලට ගනු ලැබේ.

4.4.6 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි පොළිය හා මූලික මුදල් පමණක් ගෙවීමේ ලක්ෂණයන්ගෙන් යුක්ත දැයි තක්සේරු කිරීම (SPPI පරීක්ෂණය)

වත්කම් වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පියවර ලෙස, මූල්‍ය වත්කම් (SPPI) පරීක්ෂණය සමත් වන්නේ දැයි සොයා බැලීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම් ගත නියමයන් අධ්‍යයනය කරනු ලැබේ.

මෙම තක්සේරුව සිදු කිරීම සඳහා "මූලික මුදල" ලෙස අදාල මූල්‍ය වත්කම මූලික හඳුනාගැනීමේදී පොත්වල හඳුනාගන්නා ලද මූල්‍ය වත්කම් වල සාධාරණ අගය ලෙස අර්ථ දැක්විය හැකිය. එමෙන්ම මෙම වටිනාකම මූල්‍ය වත්කමේ ආයු කාලය පුරා වෙනස් විය හැකිය (උදා: අධිමිල හෝ අවමිල ක්‍රමක්ෂය කිරීම හෝ මූලික මුදල කොටස් වශයෙන් ගෙවීම).

"පොළිය" නිර්වචනයට මුදලේ කාල වටිනාකම සහ ආයෝජනය කරනු ලබන කාල පරිච්ඡේදය සඳහා ණය අවදානම සඳහා පිරිවැය මෙන්ම ලාභයද ඇතුලත් වේ.

මීට අමතරව, මූලික ණය දීමේ විවිධාන වලට සම්බන්ධ නොවන ප්‍රතිවිරෝධී මුදල් ප්‍රවාහයේ අවදානම් හෝ අස්ථාවරත්වය අවම කිරීමට වැඩි වශයෙන් හඳුන්වා දෙන ගිවිසුම් නියමයන් අනුව ප්‍රතිපත්තිමය ගෙවීම් සහ ප්‍රතිපත්තිමය ප්‍රමානය මත පොළී පමණක් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයක් ඇති නොකරයි. එවිට එම මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කරන මූල්‍ය වත්කම් ලෙස වර්ගකල යුතුය.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තුළ අන්තර්ගත වන්නේ මූලික මුදල හා පොළිය පමණක්ද යන්න තීරණය කිරීමේදී, සමූහය උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි සලකා බලයි. මූල්‍ය වත්කමෙහි මෙම කොන්දේසිය සපුරාලිය නොහැකි වන පරිදි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ වෙලාව හෝ ප්‍රමාණය වෙනස් කල හැකි ගිවිසුම්ගත යෙදුමක් තිබේද යන්න තක්සේරු කිරීම මෙයට ඇතුලත් වේ. තක්සේරුව සිදු කිරීමේදී සමූහය පහත දෑ සලකා බලයි.

- මුදල් ප්‍රවාහයන්ගේ වටිනාකම හා කාලය වෙනස් කරන අසම්භාව්‍ය සිද්ධීන්,
- තෝලන ලක්ෂණ,
- පෙරගෙවුම් හා දීර්ඝ කිරීමේ කොන්දේසි,
- නිශ්චිත වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා සමූහයේ හිමිකම් සීමාකරණ නියමයන් සහ
- මුදලේ කාල වටිනාකම සලකා බැලීම වෙනස් කරන ලක්ෂණ

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4.4.7 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට හඳුනාගන්නා මූල්‍ය වත්කම් අගය කිරීම

ලාභ හෝ අලාභ මඟින් හඳුනාගන්නා සාධාරණ අගයට අගය කරන අයිතමයන් ලෙස අඩංගු වන්නේ

- වෙළඳපල ගනුදෙනු සඳහා පවතින අයිතමයන්
- ආරම්භක හඳුනාගැනීමේදී ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට විශේෂයෙන් නම් කල අයිතමයන් හා
- මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම්ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට පවත්වාගෙන යන මූල්‍ය උපකරණ මූලිකව හඳුනාගනු ලබන්නේ ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනාගත් දැරෑ ගනුදෙනු පිරිවැය සමඟ සාධාරණ වටිනාකමටය. පසුව සාධාරණ වටිනාකමට අගය කරන අතර කිසියම් ලාභයක් හෝ අලාභයක් පැනනගින විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී. මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට අගය කරන විටදී ණය අවදානමේ වෙනස් වීම් වලට අදාලව සාධාරණ අගයේ සංචලනයන් නිරූපනය වන පරිදි, ප්‍රතිපාර්ශවයේ ණය ශක්‍යතාවය පිලිබිඹු වන සේ ණය තක්සේරුකරණ ගැලපුමක් සිදු කරයි.

4.4.7.1 වෙළඳ ගනුදෙනු සඳහා පවතින මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයන් වෙළඳපල ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ග කරනුයේ විකිණීමේ අරමුණින් මූලිකවම අත්පත් කරගෙන ඇති නම් හෝ දරා ඇත්නම් හෝ නුදුරේදී නැවත මිලදී ගන්නේ නම් හෝ, කෙටි කාලීනව ලාභ ලබා ගැනීමේ අරමුණ සහිත හා එක්ව කළමනාකරණය කරන මූල්‍ය උපකරණ වල ආයෝජන කළඹේ කොටසක් වන හෝ, සුදුසුකම් ලබන හෙජින් සම්බන්ධතාවයක් නොමැති ව්‍යුත්පන්න උපකරණයන් වන විටදීය. වෙළඳ ව්‍යුත්පන්න හා වෙළඳ සුරැකුම්පත්, වෙළඳපල ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ගීකරණය කරන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ වටිනාකමට හඳුනාගනී. සාධාරණ වටිනාකමේ වෙනස්වීම්, වෙළඳපල ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 10) සහ ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 11) යටතේ හඳුනා ගනී. වෙළඳපල ගනුදෙනු සඳහා පවතින මූල්‍ය උපකරණ වලින් ලද පොළී ආදායම ශුද්ධ පොළී ආදායම (සටහන 8) යටතේ හඳුනා ගන්නා අතර ලාභාංශ ආදායම ගෙවීමට ඇති අයිතිය ස්ථාපිත කර ඇති විට වෙළඳපල ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 10) යටතේ හඳුනාගනී.

4.4.7.2 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කල හා නම් කල මූල්‍ය උපකරණ

මූලික හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කිරීම හා නම් කිරීම සිදු කල හැක. වෙනත් පදනමක් මත මූල්‍ය වත්කම් හා වගකීම් මිනුම් කරන විට ඇති වන මිණුම්කරණ හෝ හඳුනාගැනීමේ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කරයි නම් හෝ සම්පූර්ණයෙන් ඉවත් කරයි නම් (එනම් ගිණුම්කරණ නොගැලපීම් ඉවත් කරයි) පමණක් මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක. ගිණුම්කරණ නොගැලපීම් ඉවත්කිරීමට හෝ සැලකිය යුතු ලෙස අඩු කළ හැකි නම් හෝ පහත අවස්ථාවල මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ හැක.

- ධාරක ගිවිසුම ව්‍යුත්පන්න උපකරණ එකක් හෝ කිහිපයකින් සමන්විත වේ නම් හෝ
- ලේඛනගත අවදානම් කළමනාකරණ හෝ ආයෝජන ක්‍රමවේදය අනුව සාධාරණ වටිනාකම පදනම මත මූල්‍ය වත්කම් හා වගකීම් දෙකම කළමනාකරණය හා එහි කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ නම් ගිණුම්කරණ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කල හොත් හෝ ඉවත් කල හොත් හෝ පහත අවස්ථාවල මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක. මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කර ඇති විට නීරීක්ෂණය කල හැකි වෙළඳපල පොළී අනුපාතිකයන්ට ඉහළ ණය විහිදීම් වල වෙනස්වීම් නිරීක්ෂණය කිරීමෙන් සමූහයේ ණය ගුණාත්වයේ වෙනස්වීම් වලට ආරෝපිත සාධාරණ අගයේ සංවලනයන් ගණනය කර වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වෙනමම ඉදිරිපත් කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කළ කිසිදු මූල්‍ය වගකීමක් 2023 දෙසැම්බර් 31 දිනට නොමැත.

4.4.7.3 මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම් ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම යන පරීක්ෂණයෙන් සමත් නොවන මූල්‍ය ණය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට ගිණුම් ගත කෙරේ.

4.4.8 ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම් - ණය උපකරණ

පහත අවස්ථා වලදී ණය උපකරණයන්හි ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දිනවලදී හිඟ හිටි මුදල මත පොළිය හා මූලික මුදල පමණක් පිලිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීමට තබා ගැනීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලගා කරගන්නා විට

මෙම ණය උපකරණයන් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර ඵලදායී පොළී අනුපාතය භාවිතා කිරීමෙන් ක්‍රමක්ෂය පිරිවැයට පසුව හඳුනා ගනී. මූල්‍ය වත්කම් හානිකරණය යටතේ සටහන 4.4.11 හි විස්තර කර ඇති මට්ටම් තුනක අපේක්ෂිත ණය හානි ආකෘතිය මත පදනම්ව ණය හානිකරණය ගණනය කරනු ලබයි.

4.4.9 වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට මිනුම් ලබන මූල්‍ය වත්කම්

4.4.9.1 ණය උපකරණ

පහත අවස්ථාවන්හිදී ණය උපකරණයන්හි ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දින වලදී හිඟ හිටි මුදල මත මූලික මුදල හා පොළිය පමණක් පිලිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලඟා කර ගන්නා විට

මෙම ණය උපකරණ මූලිකව හඳුනා ගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර පසුකාලීනව සාධාරණ වටිනාකමට හඳුනා ගනී.

සාධාරණ වටිනාකමේ වෙනස්වීම මත ඇති වන ලාභ හෝ අලාභයන් ස්කන්ධයේ වෙනම කොටසක් යටතේ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ දක්වයි. හානිකරණ අලාභයන් හෝ ප්‍රතිවර්ත්‍ය කිරීම්, පොළී ආදායම හා විදේශ විනිමය ලාභ හෝ අලාභයන් ලාභ හෝ අලාභ යටතේ හඳුනා ගනී. විකුණන අවස්ථාවේදී කලින් වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභයන් වෙනත් විස්තීර්ණ ආදායමේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.

වත්කම්හි යොදාගත් ආකෘතිය අනුව ක්‍රමක්ෂය මත පදනම් වූ මූල්‍ය ශේෂ හානිකරණ මැනීම අපේක්ෂිත ණය අලාභ අදියර 3 මත පදනම් වේ. මෙම අපේක්ෂිත ණය අලාභ ආකෘති සටහන් අංක 4.4.11 විස්තර කර ඇත.

4.4.9.2 ස්කන්ධ උපකරණ

වෙළඳපළ ගනුදෙනු සඳහා පවතින හා ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 3 - "ව්‍යාපාර සංයෝජනය" යටතේ ව්‍යාපාර සංයෝජනය සඳහා සමූහය විසින් හඳුනාගන්නා අසම්භාව්‍ය ප්‍රතිෂ්ඨාව සඳහා වන ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන හැර කළමනාකරණය විසින් වෙනස්කල නොහැකි විකල්පය තෝරාගෙන ඇතිවිට එම ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන, වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට අගය කරයි. වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට යන වෙනස් කල නොහැකි විකල්පය ආයෝජන කලඹයන් සඳහා කළමනාකරණය සලකා නොබලයි නම් එම ආයෝජන නිරායාසයෙන් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට අගය කල යුතුයි.

විකිණීමේදී වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට මාරු නොකරයි. කෙසේ වෙතත් සම්පූර්ණ විකිණීමකදී හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයේ සිට ස්කන්ධය තුළ රඳවාගත් ඉපයීම් වලට මාරු කරයි. මෙම ආයෝජන වල ලාභාංශ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" (සටහන 13) යටතේ හඳුනා ගනී.

4.4.10 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමට අදාල ව්‍යාපාර ආකෘතිය සමූහය විසින් වෙනස් කරන විටදී පමණක් සමූහය විසින් එහි මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරයි. ක්‍රමක්ෂය පිරිවැයට, වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කරනු ලබන මූල්‍ය වත්කම් සමූහය විසින් නැවත වර්ගීකරණය කරනු ලබයි නම් නැවත වර්ගීකරණය කරන දිනයේ සිට අනාගතයට බලපාන පරිදි නැවත වර්ගීකරණය ගලපනු ලබයි. සමූහය කලින් හඳුනාගත් ලාභ, අලාභ (හානිකරණ අලාභයන්ද ඇතුලත්ව) හෝ පොළිය නැවත සංශෝධනය සිදු නොකෙරේ.

නැවත වර්ගීකරණය කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ සඳහා වන ගිණුම්කරණ පිළියම් පහත වගුව මඟින් සාරාංශ ගත කර ඇත.

මූලික මිනුම් කිරීම	නැවත වර්ගීකරණය කිරීමෙන් පසු මිනුම් කිරීම	නැවත වර්ගීකරණය සඳහා වූ ගිණුම්ගත කිරීම්
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම එහි නව පවත්වාගෙන යාමේ දළ වටිනාකම බවට පත් වේ. එම වටිනාකම මත පදනම්ව ඵලදායි පොළී අනුපාතය ගණනය කරයි. හානිකරණ අවශ්‍යතා සඳහා යොදා ගන්නා ආරම්භක දිනය ලෙස නැවත වර්ගීකරණය කල දිනය භාවිතා කරයි.
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ අගය නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පත් වේ. නැවත වර්ගීකරණය කරන දිනයට ඇති වත්කම් වල සාධාරණ වටිනාකම මත පදනම්ව ඵලදායි පොළී අනුපාතිකය තීරණය කරයි.
වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	කලින් වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයෙන් ඉවත් කර මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන දිනයේ සාධාරණ වටිනාකමට ගලපනු ලැබේ. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානියට ගැලපීමක් සිදු නොකෙරේ.
වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පත් වේ. නැවත වර්ගීකරණය කරන දිනයේ නැවත වර්ගීකරණය කිරීමේ ගැලපුමක් ලෙස කලින් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.
ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම හා කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසින් ඇතිවන ලාභය හෝ අලාභය ලාභ හෝ අලාභය යටතේ හඳුනාගනී.
ක්‍රමක්ෂය පිරිවැයට	වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	මූල්‍ය වත්කමක කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය හා නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම අතර වෙනසින් ඇතිවන ලාභය හෝ අලාභය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනී. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානිය මැනීමට කිසිදු ගැලපීමක් සිදු කරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4.4.10.1 මූල්‍ය උපකරණ වැඩිදියුණු/උසස් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 අංක 14 දරණ විධිවිධානය අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල ප්‍රතිපත්ති වලට අනුකූලව බැංකුවට මූල්‍ය උපකරණ ඉහළ ස්ථරයකට වැඩිදියුණු කළ හැක. එම නිසා, බැංකුව විසින් සුදුසු තර්කනයකට අනුව ප්‍රධාන අවදානම් නිලධාරියාගේ අභිමතය පරිදි මූල්‍ය උපකරණ වැඩිදියුණු කරයි.

4.4.11 මූල්‍ය වත්කම් හානිකරණය

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මිනුම් නොකරන පහත සඳහන් වර්ගයේ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සමූහය මට්ටම් තුනක් යටතේ සිදු කරයි.

- ක්‍රමක්ෂය පිරිවැයට හා වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට මනිනු ලබන ණය උපකරණ
- ණය බැඳීම්; සහ
- මූල්‍ය ඇප ගිවිසුම්

ස්කන්ධ ආයෝජන සඳහා කිසිදු අපේක්ෂිත ණය අලාභ හඳුනා නොගනී.

මූල්‍ය උපකරණයේ ඉතිරි ආයු කාලය පුරාවට, සිදු වූ පැහැර හැරීමේ අවදානමෙහි වෙනස සැලකිල්ලට ගනිමින් මූල්‍ය උපකරණයන්ගේ ණය අවදානම ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදීම සමූහය විසින් තක්සේරු කරයි. මෙම ක්‍රියාවලිය මත පදනම්ව ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි වෙනස්වීම මත මූල්‍ය වත්කම් පහත සඳහන් මට්ටම් තුන තුළ සංක්‍රමණය වේ.

4.4.11.1 අදියර 1 - මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය අලාභය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදුවී නොමැති හා ආරම්භයේ සිට ණය හානිකරණය වී නොමැති නිරාවරණයන් සඳහා ඉදිරි මාස 12 තුළ සිදුවිය හැකි පැහැර හැරීම් අවස්ථා වල සම්භාවිතාවය සඳහා වූ අපේක්ෂිත ණය හානියේ කොටස හඳුනා ගනී. සැලකිය යුතු ලෙස ණය පිරිහීමට ලක් නොවූ ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය අලාභය බැංකුව විසින් තීරණය කරයි.

4.4.11.2 අදියර 2 - ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය අලාභය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදු වූ නමුත් ණය හානිකරණය නොවූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා වූ (එනම් මූල්‍ය වත්කම් වල ඉතිරි ආයුකාලය පිළිඹිබු වන පරිදි) අපේක්ෂිත ණය අලාභය හඳුනාගනී.

4.4.11.3 අදියර 3 - ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය අලාභය

වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර බලපෑමක් ඇතිකරන සිද්ධීන් එකක් හෝ වැඩි ගණනක් සිදු වූ විට, එම නිරාවරණයන් ණය හානිකරණය වූ නිරාවරණයන් ලෙස තක්සේරු කරනු ලැබේ. ණය හානිකරණය වූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය අලාභය හඳුනා ගනී. පොළී ආදායම ගණනය කිරීමේ දී පවත්වාගෙන යන දළ වටිනාකමට නොව, ක්‍රමක්ෂය පිරිවැයට (ප්‍රතිපාදනයන්ට පසු) ඵලදායි පොළී අනුපාතය භාවිත කිරීමෙන් ගණනය කරයි.

4.4.11.4 අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීම

අපේක්ෂිත මුදල් හිඟය ගණනය කිරීම සඳහා සම්භාවිතාවය මත බර තැබූ අවස්ථා තුනක් මත පදනම්ව අපේක්ෂිත ණය අලාභය ගණනය කරනු ලබන්නේ ඵලදායී පොළී අනුපාතිකයකට ආසන්න අනුපාතයකින් වට්ටම් කිරීමෙනි. මුදල් හිඟය යනු ගිවිසුමට අනුව ආයතනය සඳහා ලැබිය යුතු මුදල් ප්‍රවාහයන් සහ ආයතනය අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනස වේ. සමූහයේ අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීම් පිළිබඳ යාන්ත්‍රණය පහත දැක්වෙන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ:

පැහැර හැරීමේ සම්භාවිතාවය (PD)

පැහැර හැරීමේ සම්භාවිතාවය යනු කිසියම් කාල සීමාවක් තුළදී ණය පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳව තක්සේරුවකි. ණය පහසුකම පෙර කාලච්ඡේදයකදී හඳුනාගෙන නොමැති නම් හා තවමත් එම වත්කම කළඹ තුළ ඇත්නම් පැහැර හැරීමේ සම්භාවිතාවක් ඇතිවිය හැක්කේ තක්සේරු කරන ලද කාලසීමාව තුළ නිශ්චිත වෙලාවක පමණි. පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳ සංකල්පය සටහන 28 යටතේ තවදුරටත් විස්තර කර ඇත.

ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය (EAD)

ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය යනු අනාගත දිනකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවේදී පැහැර හැරීම සිදුවන අගයයි. මෙම අගය ගණනය කරනු ලබන්නේ වාර්තාකරණ දිනට පසුව සිදුවන පොළී සහ ප්‍රාග්ධන ගෙවීම්, එකඟ වූ පහසුකම් ලබාගැනීම්, මග හැරුණු ගෙවීම් වලට අදාළ උපචිත පොළිය යනාදිය ගැලපීමෙන් පසු ලැබෙන නිරාවරණය වීමේ අගය වේ. සටහන 28 යටතේ ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

පැහැර හැරීමේ අලාභය (LGD)

පැහැර හැරීමේ අලාභය යනු කිසියම් පැහැර හැරීමක් සිදුවන අවස්ථාවක ඇතිවන අලාභයේ ඇස්තමේන්තුවක් වේ. යම් කිසි කාලච්ඡේදයක් තුළදී පැහැර හැරීමෙන් පසුව සුරැකුම් උපලබ්ධි කිරීම් වැනි දෑ සැලකිල්ලට ගනිමින් අයකර ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය හා ගිවිසුම්ගත මුදල් ප්‍රමාණය අතර වෙනස මත පැහැර හැරීමේ අලාභය පදනම් වේ. මෙය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගයෙහි ප්‍රතිශතයක් ලෙස සාමාන්‍යයෙන් දක්වයි. සටහන 28 යටතේ පැහැර හැරීමේ අලාභය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

4.4.11.5 හානිකරණය සඳහා මට්ටම නිර්ණය කිරීම

සෑම වාර්තාකරණ දිනයකදීම ආරම්භක හඳුනාගැනීමේ සිට නිරාවරණයන්ගේ ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි. මෙය තක්සේරු කරනු ලබන්නේ ආරම්භක හඳුනාගැනීමේ දිනය හා අපේක්ෂිත ජීවිත කාලය අතර පැහැර හැරීමේ අවදානමක් තිබේද යන්න සැසඳීමෙනි. මෙම කාර්යයේදී විශේෂ වියදමක් හෝ වෑයමක් නොමැතිව ලබාගන්නා සාධාරණ හා විශ්වාසදායක තොරතුරු පිලිබඳව සමූහය සලකා බලයි. මෙය ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු මෙන්ම ඉදිරි දැක්මක් සහිත විශ්ලේෂණයකින්ද යුක්ත වේ.

වත්කම් වල ගුණාත්මකභාවය පිරිහීයාමේදී නිරාවරනයන් අපේක්ෂිත ණය හානියේ අදියර තුළ සංක්‍රමණය වේ. පසුකාලීනව වත්කම් වල ගුණාත්මකභාවය වර්ධනය වුවහොත් හා කලින් තක්සේරු කරන ලද ආරම්භයේ සිට ඇති ණය අවදානමෙහි සැලකිය යුතු අඩු වීමක් සිදු වුවහොත් අවිනිශ්චිත ණය සඳහා කරන වෙන් කිරීම් ජීවිත කාලය සඳහා වන අපේක්ෂිත ණය හානියේ සිට මාස 12 සඳහා වූ ණය හානිය දක්වා අඩු වේ. ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස පිරිහී ගොස් නොමැති හෝ පිරිහීම සමූහයේ ආයෝජන ශ්‍රේණිගත නිර්නායකයන් තුළ පවතින හෝ හිඟ හිටි දින ගණන සිට දින

30 කට වඩා අඩු නිරාවරණයන් පහල ණය අවදානමක් ඇති නිරාවරණයන් ලෙස සැලකේ. මෙම මූල්‍ය වත්කම් සඳහා හානිකරණ වෙන් කිරීම මාස 12 ක් සඳහා වූ අපේක්ෂිත ණය අලාභය මත පදනම්ව සිදු කරයි.

කේවල හා සාමූහික පදනම මත නිරාවරණයන් සඳහා වන ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි. උපකරණයේ වර්ගය, ණය අවදානම් ඇගයුම්, ඇප වර්ගය, ආරම්භක හඳුනාගැනීමේ දිනය, කල් පිරීමට ඇති කාලය, කර්මාන්තය, ණය ගැතියාගේ භූගෝලීය ව්‍යාප්තිය හා අනෙකුත් අදාල සාධක යනාදිය සැලකිල්ලට භාජනය කර සාමූහික හානිකරණ ඇගයීම සඳහා ණය අවදානම් ලක්ෂණ පදනම් කරගෙන මූල්‍ය උපකරණ කාණ්ඩගත කෙරේ.

4.4.11.6 ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණය ගණනය කිරීම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ අවසර දී ඇති ණය සහ අත්තිකාරම් සඳහා වන හානිකරණය ගණනය කිරීමේදී බැංකුව උපකල්පනයන් භාවිතා කරයි. පහත සඳහන් පරිදි හිඟහිටි දින ගණන මත පදනම්ව ණය කළඹ අදියර තුනකට වර්ගීකරණය කර ඇති අතර මාස 12 අපේක්ෂිත ණය අලාභ (ECL) සහ ජීවිත කාලය අපේක්ෂිත ණය අලාභ (LTECL) වල අදාළ වීමේ මට්ටම අදියර මත රඳා පවතී. ණය පහසුකමක වර්ගීකරණ තීරණය කිරීමේදී ණය පහසුකම්වලට අදාලව ලබා ගන්නා ලද සුරැකුම් වර්ගය සහ වටිනාකම සලකා බලනු නොලැබේ. ණය ගැණුම්කරුවෙකුට බැංකුව සමඟ අයිරා සීමාවන් සහිත පංගම ගිණුම් කිහිපයක් තිබේ නම්, අයිරා වර්ගීකරණය කිරීමේ අරමුණු සඳහා, සමස්ථ අනුමත සීමාව සහ එවැනි සියලුම ගිණුම්වල දෛනික හිඟ සමස්ත ශේෂය සලකා බලනු ලැබේ.

4.4.11.6.1 සක්‍රීය ණය පහසුකම්

(අ) ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ අදියර 1 ලෙස වර්ග කර ඇති සියලුම ණය පහසුකම් සහ

(ආ) ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ ණය පහසුකම් ණය අවදානම් සැලකිය යුතු වැඩි වීමක් හඳුනාගෙන ඇත්නම් ඒවා (ඌන ක්‍රියාකාරී ණය පහසුකම්), 2 වන අදියර ලෙස වර්ගීකරණය කර ඇත.

4.4.11.6.2 අක්‍රීය ණය පහසුකම් (NPCF)

අක්‍රීය ණය පහසුකම් (NPCF) යන්නෙන් අදහස් වන්නේ,

(අ) ගනුදෙනුකරුවෙකුගේ ගෙවිය යුතු ගිවිසුම්ගත නියමිත දින සිට දින 90 කට වැඩි කාලයක් ගතවී ඇති (ගෙවිය යුතු ගිවිසුම්ගත නියමිත දින සිට ගෙවිය යුතු දින ගණන ගණනය කරනු ලැබේ).

(ආ) අනුමත සීමාව දින 90 කට වඩා වැඩි කාලයක් පුරා පැවතීම.

(ඇ) ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 9 - "මූල්‍ය උපකරණ" අනුව අදියර 3 ලෙස වර්ග කර ඇති වෙනත් ඕනෑම ණය පහසුකම් (විභව අවදානම් සහ ආරම්භයේ හානිකරණය මත පදනම්ව අක්‍රීය ණය පහසුකම් ලෙස වර්ග කර ඇති පහසුකම්).



	සක්‍රීය ණය	අක්‍රීය ණය පහසුකම් (NPCF)
අදියර 1	**අදියර 2**	**අදියර 3**
• ගෙවිය යුතු දින සිට 30ක් හෝ දින 30 කට අඩු කාලයක් හිඟහිටි	• ගෙවිය යුතු දින සිට දින 31 ක් සිට දින 89 ක කාලයක් හිඟහිටි	• ගෙවිය යුතු දින සිට දින 90 ක් හෝ දින 90 කට වඩා වැඩි කාලයක් හිඟහිටි
• අදියර 2 හෝ 3 යටතේ වර්ගීකරණය කර නොමැති සියලුම ණය පහසුකම්	• ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු පළමු ප්‍රාග්ධනය සහ/හෝ පොළී වාරිකය නියමිත දින සිට අවම වශයෙන් දින 90 ක සතුටුදායක සක්‍රීය කාලසීමාවක් යටතේ, ණය පහසුකම් වැඩිදියුණු කිරීම හැර, දෙවරක් ප්‍රතිව්‍යුහගත කරන ලද සියලුම ප්‍රතිව්‍යුහගත ණය. • සටහන 28 - "ණය සහ අත්තිකාරම්" යටතේ දක්වා ඇති පිරිහීමේ සාධක මත පදනම්ව හඳුනාගත් සැලකිය යුතු ණය පිරිහීමක් ලෙස අර්ධක්‍රියාකාරී ණය පහසුකම්/ නිරාවරණය	• ප්‍රතිව්‍යුහගත ණය පහසුකම්/නිරාවරණ වැඩිදියුණු කිරීම් සහ සතුටුදායක තත්ත්වයන් යටතේ වන පළමු ප්‍රාග්ධනය සහ/හෝ පොළී වාරිකය නියමිත දින සිට අවම වශයෙන් දින 90 ක සතුටුදායක සක්‍රීය කාලසීමාවක් යටතේ කාර්යසාධන කාලයක් නොමැති දෙවරකට වඩා වැඩි වාර ගණනක් ප්‍රතිව්‍යුහගත කර ඇති ණය පහසුකම් • නැවත ගිවිසුම් ගත කර ඇති සියලුම ණය සහ අත්තිකාරම් • මහ බැංකුවේ විධිවිධාන අනුව අක්‍රීය ලෙස වර්ග කර ඇති සියලුම ණය පහසුකම් • සටහන 28 - "ණය සහ අත්තිකාරම්" යටතේ ලබා දී ඇති පිරිහීමේ සාධක අනුව සැලකිය යුතු ණය පිරිහීමකින් හඳුනාගත් ගනුදෙනුකරුවන්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ඉහත වර්ගීකරණ කාර්යය සඳහා, ණය ගුණාත්මක භාවයේ පිරිහීම හේතුවෙන් මුදල් ආපසු ගෙවීමේ නියමයන් සංශෝධනය කර ඇත්නම්, එම පහසුකම ප්‍රතිව්‍යුහගත පහසුකමක් ලෙස සලකනු ලබන අතර ප්‍රතිව්‍යුහගත පහසුකම් හඳුනාගැනීමේදී බැංකුවේ "ණය දරාගැනීමේ ප්‍රතිපත්තිය" ද සලකා බැලිය යුතුය. බැංකුවේ ණය දරාගැනීමේ ප්‍රතිපත්තියට අනුව, පහත සඳහන් වෙනස්කම්/නිර්ණායක ණය පහසුකමක මුදල් ආපසු ගෙවීමේ කොන්දේසිවලට වෙනස්කම් ලෙස පිළිගැනේ.

- පොළී අනුපාත වෙනස් වීම
- දිගුවන් (පරිණත) වෙනස් කිරීම
- සහන කාල සීමාවට වෙනස්කම්
- පොළී කපාහැරීම

4.4.11.6.3 අක්‍රීය ණය පහසුකම් (NPCF) උප වර්ගීකරණය

හිඟ හිටි දින ගණන සහ විභව අවදානම් මට්ටම මත පදනම්ව අක්‍රීය ණය පහසුකම් (NPCF) පහත සඳහන් පරිදි තවදුරටත් කාණ්ඩ හතරකට වර්ග කර ඇත:

වර්ගීකරණය	හිඟ හිටි දින ගණන	විභව අවදානම් නිර්ණායක
විශේෂයෙන් හඳුනාගත්	> 90 සහ < = 180	කාලානුරූපීව නිවැරදි නොකළහොත් අනාගතයේදී ගණුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාවට අහිතකර ලෙස බලපෑ හැකි දුර්වලතා පෙන්නුම් කරයි.
ආශ්‍රිත සම්මත	> 180 සහ < = 270	පවත්නා කොන්දේසි මත ආපසු ගෙවීමේ අවදානම සහ ආපසු ගෙවීමේ අවිනිශ්චිතතාවයට බාධා ඇති කළ හැකි ව්‍යාපාරය, මුදල් ප්‍රවාහය හෝ ගණුදෙනුකරුගේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් නිශ්චිත දුර්වලතා ප්‍රදර්ශනය කරයි.
අඩමාණ	> 270 සහ > = දින 360	පැහැර හැරීමේ ඉහළ හෝ අර්ධ අවදානමක් පෙන්නුම් කරන හෝ සම්පූර්ණ එකතු කිරීම අවිනිශ්චිත විට සහ පැහැර හැරීමේ ඉහළ අවදානමක් ඇතිවිට වේ.
අලාභයට ගිය	> දින 360	එකතු කළ නොහැකි යැයි සලකන හෝ බොහෝ දුරට නිශ්චිත ආපසු ගෙවීමක් සිදු නොකරනු ඇති අතර ඉහත කාණ්ඩ යටතේ ඇතුළත් නොවන අනෙකුත් සියලුම අක්‍රීය ණය පහසුකම් (NPCF).

4.4.11.7 ණය පහසුකම් වැඩිදියුණු කිරීම

ආරම්භක අවස්ථාවට සාපේක්ෂව පසු දිනවලදී ණය පිරිහීමෙහි වැඩිදියුණු වීමේ මට්ටම මත පදනම්ව අදියර අතර ණය පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරේ.

ණය පහසුකම් වැඩිදියුණු කිරීමට අදාළ ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය යටතේ සපයා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව බැංකුව විසින් ණය පහසුකම් වැඩිදියුණු කරනු ඇත.

4.5 මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනකටම අදාළව මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය හා සම්බන්ධ වන සංඥාවන් පිළිබඳව බැංකුව තක්සේරු කරනු ලැබේ. එවන් සංඥාවක් පවතින විට දී හෝ හානිකරණය පිළිබඳව පරීක්ෂාවක් අවශ්‍ය විටක දී එම මූල්‍ය නොවන වත්කම් යළි අයකර ගැනීමේ ශක්‍යතාවය පිළිබඳව සළකා බැලේ. වත්කම් නැවත අයකර ගත හැකි අගය වනුයේ වත්කම භාවිතයේ පවතින වටිනාකම සහ එහි මුදල් ජනනය කරන ඒකකයන්ගේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් ඉවත් කළ පසු අගය යන දෙකෙහි උපරිම අගයයි. වත්කමේ ධාරණ අගය එහි නැවත අයකර ගැනීමේ අගය ඉක්මවන විට, එය හානිකරණයට ලක් වූ ලෙස සලකා වත්කම නැවත අයකර ගත හැකි අගයට ගිණුම්වල ගලපනු ලැබේ. භාවිතයේ පවතින වටිනාකම ගණනයේ දී, වත්කමට බද්ධ වන අවදානම සහ වෙළඳපළ තක්සේරුව මත මුදලේ කාලානුරූපී වටිනාකම අර්ථ නිරූපනය කෙරෙන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ඇත. විකුණුම් පිරිවැය සාධාරණ අගයෙන් අඩුකර තීරණය කිරීමේදී ඒ සඳහා සුදුසු තක්සේරු ආකෘතීන් භාවිතා කෙරේ. මෙම තක්සේරුකරණයන් බහුවිධ තක්සේරු ක්‍රම, ප්‍රසිද්ධියේ විකිණෙන පරිපාලිතයන්ගේ ලැයිස්තු ගත කොටස් මිල හෝ අනෙකුත් වටිනාකම් ඇති සාධාරණ මිලක් පෙන්වන සංඥාවක් මඟින් තව දුරටත් තහවුරු කෙරේ.

4.6 භාරකාර සේවා

ගනුදෙනුකරුවන් වෙනුවෙන් වත්කම් රඳවා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සමූහය විසින් භාරකාර සේවා සපයනු ලැබේ. භාරකාරත්වයේ පවතින වත්කම් සමූහය මඟින් පාලනය නොකරන නිසා සහ සමූහය එම වත්කම් වල ප්‍රතිලාභ ලබාගන්නා අයිතිකරු නොවන නිසා එම වත්කම් සමූහයේ මූල්‍ය ප්‍රකාශවල හඳුනා නොගැනේ.

4.7 ප්‍රතිපාදනයන්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමානයේ දී නෛතික හෝ සම්මුතික වගකීමක් ඇති වූ විට දී එම වගකීම නිවැරදිව තක්සේරුගත කල හැකි නම් සහ අදාළ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයන්හි පිටතට ගලා යාමක් සිදුවන බවට අපේක්ෂාවක් වේ නම් ඒ සඳහා ප්‍රතිපාදනයන් වෙන් කෙරේ. ප්‍රතිපාදන වටිනාකම තීරණය කිරීමේදී වාර්තාකරණ දිනට පවතින වගකීම් පියවීමට අවශ්‍ය වඩාත් යෝග්‍යතම අගය ඇස්තමේන්තු කරන අතර එහිදී අදාළ සිද්ධිය සිදුවීමට ඇති අවිනිශ්චිතතාව හා අවදානම සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රතිපාදන තීරණය කිරීමේදී වර්තමාන වගකීම පියවීමට අවශ්‍ය මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරනු ලබයි නම්, එහිදී අදාළ මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය මත පදනම්ව ධාරණ අගය තීරණය කරයි. භාරදූර ගිවිසුම් සඳහා ප්‍රතිපාදනයන් කරනු ලබන්නේ අදාල ගිවිසුමෙන් සමූහයට ලැබෙන අපේක්ෂිත ප්‍රතිලාභ එම ගිවිසුම් ඉටු කිරීමේදී දැරීමට සිදු වන නොවැලැක්විය හැකි පිරිවැයට වඩා අඩු නම් පමණි. අදාල ගිවිසුම අත්හිටුවීමට සිදුවුවහොත් එහිදී දැරීමට සිදුවන පිරිවැය හා ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යාමට දැරිය යුතු අපේක්ෂිත ශුද්ධ පිරිවැය යන දෙකෙහි වර්තමාන අගයන්ගේ අඩු අගය ප්‍රතිපාදනය ලෙස හඳුනාගනු ලැබේ.

4.8 ආදායම් බදු වියදම හා අනෙකුත් බදු

4.8.1 ආදායම් බදු වියදම

ආදයම් බදු, ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු යන කොටස් දෙකකින් සමන්විත වේ. විස්තරාත්මක තොරතුරු සටහන 18 යටතේ දක්වා ඇත.

4.8.2 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VATFS)

එකතු කළ අගය මත බද්ද සඳහා පදනම වන්නේ සේවක පාරිශ්‍රමික හා බදු පෙර ලාභයට නියම කර ඇති ආකාරයට ක්ෂය ගැලපීමෙන් පසු ලැබෙන ලාභයයි. 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත හා ආනුෂාංගික සංශෝධන අනුව 2022 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බැංකුවේ මුළු එකතු කළ අගය මත 18% ක බද්දකට යටත් වේ. එසේම සමූහය "වටිනාකම ආරෝපිත ක්‍රමය" යටතේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කෙරේ.

4.8.3 බෝග රක්ෂණ බද්ද (CIL)

2013 අංක 12 දරණ මුදල් පනත යටතේ බෝග රක්ෂණ බද්ද 2013 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන අතර බදු අය කිරීමෙන් පසු ලාභයෙන් 1% ක බද්දක් ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවිය යුතු වේ.

4.8.4 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL)

2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට අනුව, 2022 ඔක්තෝම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා සඳහා එකතු කල අගය මත 2.5% ක ප්‍රමාණයක සහ මූල්‍ය නොවන සේවා පිරිවැටුම මත 2.5% ක ප්‍රමාණයක් සමාජ ආරක්ෂණ දායකත්ව බදු ලෙස ගණනය කරනු ලැබේ.

4.8.5 බැංකුව, පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන් විසින් බෙදා හරින ලද ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT)

බැංකුව විසින් බෙදා හරින ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද

බැංකුව එහි එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජයට ලාභාංශ බෙදා දෙන ලදී. 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ තුන්වන උපලේඛනය අනුව සහ එහි සංශෝධනවලට අනුව, ශ්‍රී ලංකා රජය විසින් ව්‍යුත්පන්න කරන ලද මුදල් ආදායම් බද්දෙන් නිදහස් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රජයට කරන ලද ලාභාංශ ගෙවීම් මත රඳවා ගැනීමේ බද්දක් අඩු නොවේ.

පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන් විසින් බෙදා හරින ලද ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT)

2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුව,ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT) 2023 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දී ඇත. ඒ අනුව, පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්වලින් ලැබෙන ලාභාංශ ආදායම 15% ක අනුපාතයකට ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT) සඳහා යටත් අතර එය අවසාන බද්දක් විය යුතුය.

5 රක්ෂණ ව්‍යාපාරය

5.1 ප්‍රතිරක්ෂණය

මෙමඟින් සමූහය සිය සියලු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සමඟ බැඳී රක්ෂණ අවදානම පැවරීමකට ලක්කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම මඟින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු ශේෂයන් නිරූපණය වේ. ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු ප්‍රමාණය තීරණයේ දී ප්‍රතිරක්ෂණ ගිවිසුම් සහ බැඳි හිමිකම්පෑම් සඳහා වන ප්‍රතිපාදන සහ ගෙවා නිමකල හිමිකම් සැලකිල්ලට භාජනය කරනු ඇත. වාර්තාකරණ වර්ෂය තුළ සංඥාවක් ලද විට හෝ වාර්තාකරණ දිනයේ දී හෝ ප්‍රතිරක්ෂණ වත්කම්වල හානිකරණය පිළිබඳව සමාලෝචනයකට ලක්කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කමෙහි මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව සිදු වන ලද යම් සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු මුදල් නොලැබී යාමේ විෂයානුබද්ධ සාක්ෂියක් සපයනු ලබන විට හානිකරණයක් සිදු ව ඇති බවට නිගමනය කෙරේ. එය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිරක්ෂණය කරන ලද හෝ කිරීමට බලාපොරොත්තු වන ගිවිසුම්වලට අදාළ වාරික ලැබීම් හා හිමිකම් වල දළ පදනම මත වාර්තා කරනු ලැබේ. ගිවිසුම් ගත අයිතිය නිම වූ පසු හෝ වෙනත් පාර්ශ්වයකට පැවරූ පසු ප්‍රතිරක්ෂණ වත්කම හෝ වගකීම බැහැර කිරීම සිදු වේ.

5.2 ලැබිය යුතු රක්ෂණ

ලැබිය යුතු රක්ෂණයන් උපචිත වූ විට හඳුනා ගැනෙන අතර මූලික හඳුනා ගැනීමේ දී ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ගිණුම් ගත කෙරේ. ධාරණ අගය ගත නොහැකි බවට යම් සිද්ධියක් හෝ අවස්ථාවක් සංඥාවන් සපයන විට දී, ලැබිය යුතු රක්ෂණයන්හි ධාරණ අගයෙහි හානිකරණය පිළිබඳව සලකා බැලේ. එසේ හානිකරණ අලාභයක් වේ නම් එය ලාභ හෝ පාඩු ප්‍රකාශයෙහි හඳුනාගනී.

5.3 විලම්බිත වියදම්

5.3.1 විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය (DAC)

නව ව්‍යාපාර අත්පත්කර ගැනීම සඳහා දරන කොමිස්, ප්‍රතිරක්ෂණය, අලෙවිකරණ, ගිවිසුම් නිකුත් කිරීමේ පිරිවැය වැනි පිරිවැයන් නව ව්‍යාපාර හෝ අභිමතය පරිදි සහභාගී වීමේ විශේෂාංග සහිත ආයෝජන ගිවිසුම්වල අනාගත වාරික වලින් ආවරණය කරගත හැකි ආකාරයට විලම්බිත කෙරේ. අනෙකුත් සියළු අත්පත් කර ගැනීමේ වියදම් වීවා දරන අවස්ථාවේදීම වියදම් ලෙස වාර්තා කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මූලිකව හඳුනා ගැනීමෙන් පසුව සාමාන්‍ය රක්ෂණ සඳහා විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය නොඉපයූ වාරික ක්‍රමක්ෂය කරනු ලබන කාල පදනමට ක්‍රමක්ෂය කරනු ලැබේ. ප්‍රතිරක්ෂණකරුවන්ගේ විලම්බිත අත්පත්කර ගැනීම් පිරිවැය කොටස අදාල වත්කම ක්‍රමක්ෂය කරන ආකාරයටම ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කෙරේ.

වත්කමට අදාලව අපේක්ෂිත ඵලදායි ජීවකාලයේ හෝ අනාගත ප්‍රතිලාභ ලැබීමේ රටාවේ වෙනස් වීමක්, ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය වෙනස් කිරීම් මඟින් ගිණුම්ගත කරන අතර එය ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස් වීමක් ලෙස සලකනු ලැබේ. ගිවිසුම් අවසන් වීම හෝ අවලංගු කිරීමකදී විලම්බිත අත්පත්කර ගැනීමේ පිරිවැය ඉවත්කරනු ලැබේ.

5.4 ප්‍රතිරක්ෂණ කොමිස්

පිටස්තර ප්‍රතිරක්ෂණ ගිවිසුම මත ලැබිය යුතු කොමිස් එම ප්‍රතිරක්ෂණ ගිවිසුම් කාලයට අදාලව විලම්බනය සහ ක්‍රමක්ෂය කරනු ලැබේ.

5.5 ආයෝජන ගිවිසුම් වගකීම්

ආයෝජන ගිවිසුම් අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.) සහිත හා රහිත ගිවිසුම් ලෙස වර්ගීකරණය කරයි. අ.ස.ල. සහිත ආයෝජන ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිටින රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සමාන වේ.

අ.ස.ල. රහිත ආයෝජන ගිවිසුම් වගකීම් හඳුනා ගනු ලබන්නේ ගිවිසුමට ඇතුලත් වූ පසු සහ වාරිකය අය කිරීමෙන් පසුවය. මෙම වගකීම් මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර මෙම සාධාරණ අගය වන්නේ ගිවිසුම නිකුත් කෙරෙන ගනුදෙනු මිලයි. එම ගනුදෙනු මිල සඳහා සෘජුවම ආරෝපිත කල හැකි ගනුදෙනු පිරිවැය ඇතුලත් නොවේ. ආයෝජන ගිවිසුම් වගකීම මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව එය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මනිනු ලැබේ.

තැන්පතු හා නැවත ගැනීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම්වලට ගැලපුමක් වශයෙන් සෘජුවම වාර්තා කරයි. සාධාරණ අගයට ගැලපුම් සෑම වාර්තා කරන දිනකම සටහන් කරන අතර ඒවා ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනු ලබයි. සාධාරණ අගය අනාගතය සඳහා වූ වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රම භාවිතය තුළින් නිර්ණය කරනු ලබයි. ඒකක ගත ගිවිසුම් සඳහා සාධාරණ අගය ගණනය කරනුයේ සෑම ඒකකයකම ඔප්පු හිමියන් සඳහා ඇති ඒකක ගණන එම අරමුදල වාර්තාකරණ දිනයේ දී ඇති ඒකක මිලෙන් වැඩි කිරීම මඟින්ය. වාර්තාකරණ දිනයට ඒකක මිල තීරණය කිරීම සඳහා යොදා ගනු ලබන අරමුදල්මය වත්කම් සහ වගකීම්වල පදනම රඳා පවතින්නේ ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්වෙන අගයට විලම්බිත බදු සහ උපචිත නොවූ ලාභ වෙනුවෙන් වන ගැලපීම් සිදු කළ පසු අගයයි. ඒකක ගත නොවූ ගිවිසුම් ද අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලබන අතර ඒවා වට්ටම් ගත මුදල් ප්‍රවාහ හා අනුමානගත ආකෘති යන තක්සේරු ක්‍රම භාවිතය මඟින් නිර්ණය කරනු ලබයි. මෙම ආකෘතිවල වලංගු භාවය, ක්‍රමාංකිත බව සුදුසුකම් සහිත ස්වාධීන පුද්ගලයෙකු විසින් කලින් කල ඇගයීම් කරනු ලබයි.

ගිවිසුම කල් පිරුණු පසුව නිදහස් කිරීමෙන් හෝ අවලංගු කිරීමක් මඟින් වගකීම් බැහැර කල යුතුය. ඔප්පු හිමියාට අවලංගු කල හැකි ගිවිසුම් සඳහා වන සාධාරණ අගය අයිතිය අත්හරින අගයට වඩා අඩු නොවිය යුතුය. ගිවිසුම් මූල්‍ය අවදානම් සංරචක සහ සැළකිය යුතු රක්ෂණ අවදානම් සංරචකවලින් සමන්විත වන අතර සහ මෙම සංරචක දෙක සඳහා වූ මුදල් ප්‍රවාහයන් එකිනෙකට වෙනස් අතර ඒවා විශ්වාසී ලෙස මිනුම්කරණය කළ හැකිය. මේ සඳහා පාදක වන වටිනාකම් කලඹයක් ලෙස නොපවතී. රක්ෂණ අවදානම් සඳහා වන අධිභාර රක්ෂණය ගිණුම් ගත කරන පදනමට සමානව ගිණුම් ගත කෙරේ.

5.6 අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.)

අ.ස.ල. මඟින් ගිවිසුම් ගත අයිතීන් ඔප්පු හිමියන් වෙත පරිපූරක පොරොන්දු වූ ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ගේ අයිතීන් ලබාදෙනු ලබන අතර සැලකිය යුතු වැඩිපුර ප්‍රතිලාභ අ.ස.ල. කළඹ පවතින වත්කම්වල ක්‍රියාකාරිත්වය මත පදනම් වේ. 90/10 පදනම මත ඔප්පු හිමියන්ට සහ කොටස් හිමියන්ට අ.ස.ල. අරමුදලේ අතිරික්ත, කොන්දේසි ප්‍රකාරව බෙදා දිය හැකිය. මෙම අතිරික්ත ඔප්පු හිමියන් වෙත බෙදා දීමේ දී එහි වටිනාකම සහ කාලය තීරණය කිරීමේ අභිමතය සමූහය සතුය. පොරොන්දු වූ සහ අභිමතානුරූපී, වෙන්නොකළ අතිරික්ත ද ඇතුව සියලුම අ.ස.ල. වගකීම් රක්ෂණය යටතේ හෝ ආයෝජන ගිවිසුම් වගකීම් යටතේ සුදුසු ලෙස වාර්ෂිකව රඳවා තබා ගනු ලැබේ.

5.7 නොඉපැයූ වාරික මුදල් සංචිතය

නොඉපැයූ වාරික මුදල් සංචිතය නිරූපණය කරන්නේ නොඉක්ම වූ කාල සීමාව සඳහා ආවරණය වන අදාළ වාරිකවල අගයයි. නාමික නොඉපැයූ වාරික මුදල් ගණනය කර ඇත්තේ 1/24 පදනමටය.

6 අළුතින් නිකුත් කරන ලද සහ සංශෝධිත ගිණුම්කරණ ප්‍රමිති අර්ථකතනයන්

6.1 වර්ෂය තුළ නිකුත් කරන ලද නව ගිණුම්කරණ ප්‍රමිති/දැනටමත් පවතින ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස් කිරීම්

6.1.1 ලං.ගි.ප්‍ර. 8 සඳහා සංශෝධන - "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ දෝෂ"

සංශෝධන පහත සඳහන් කරුණු පැහැදිලි කරයි.

- ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම්, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සහ දෝෂ නිවැරදි කිරීම් අතර වෙනස.
- ගිණුම්කරණ ඇස්තමේන්තු සංවර්ධනය කිරීම සඳහා ආයතන විසින් මිනුම් ශිල්පීය ක්‍රම සහ යෙදවුම් භාවිතා කරන ආකාරය.
- පෙර කාල පරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමක ප්‍රතිඵලයක් නොවන්නේ නම් යෙදවුම් දත්තවල වෙනසක් හෝ මිනුම් ක්‍රමයක වෙනසක් යනු ගිණුම් ඇස්තමේන්තු වල වෙනස්කම් වේ.

මෙම සංශෝධන බලාත්මක වන දිනය 2023 ජනවාරි 1 වේ.

මෙම සංශෝධන බැංකුවේ/සමූහයේ මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක බලපෑමක් නැත.

6.1.2 ලං.ගි.ප්‍ර. 1 සඳහා සංශෝධන - "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම"

මෙම සංශෝධන:

- ආයතන සඳහා ඔවුන්ගේ "සැලකිය යුතු" ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනුවට "ප්‍රමාණාත්මක" ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයක් ප්‍රතිස්ථාපනය කරයි.

- ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් පිළිබඳ තීරණ ගැනීමේදී ප්‍රමාණාත්මක සංකල්පය අදාළ කරගන්නා ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සපයයි.
- වගකීම් ජංගම හෝ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීම සඳහා අවශ්‍යතාවය සපයයි.

මෙම සංශෝධනය බලාත්මක වන දිනය 2023 ජනවාරි 1 වේ. මෙම සංශෝධන බැංකුවේ/සමූහයේ මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක බලපෑමක් නැත.

6.1.3 ලං.ගි.ප්‍ර. 12 සඳහා සංශෝධන - "ආදායම් බදු"

සංශෝධන මගින් ලං.ගි.ප්‍ර. 12 - "ආදායම් බදු" හි මූලික හඳුනාගැනීමේ නිදහස් කිරීම් සඳහා වන ව්‍යාතිරේකයක් හඳුන්වා දෙයි. මෙම සංශෝධනවල බලපෑමෙන් මූලික වශයෙන් අදහස් වන්නේ සමාන හා ප්‍රතිවිරුද්ධ තාවකාලික වෙනස්කම්වලට තුඩු දෙන වත්කම් සහ වගකීම් යන දෙකම හඳුනාගැනීම සම්බන්ධ ගනුදෙනු සඳහා මූලික පිළිගැනීම් නිදහස් කිරීම් ලබා ගත නොහැකි බවයි. එබැවින්, මූලික හඳුනාගැනීමේදී සහ පසුව තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු ගණනය කර ගිණුම් ගතකරනු ලැබේ.

මෙම සංශෝධනය බලාත්මක දිනය 2023 ජනවාරි 1 වේ.

මෙම සංශෝධන බැංකුවේ/සමූහයේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් නැත.

6.2 නිකුත් කරන ලද නමුත් වාර්තා කරන දිනට බලාත්මක නොවන නව ගිණුම්කරණ ප්‍රමිතීන්

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අතර ඒවා 2024 ජනවාරි 1 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාව සඳහා ක්‍රියාත්මක වේ. ඒ අනුව, මෙම ගිණුම් ප්‍රමිතීන් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කරගෙන නොමැත. සමූහයට අදාළ වන පහත ප්‍රමිති හඳුනාගෙන ඇති අතර වැඩිදුර විස්තර පහත දක්වා ඇත.

6.2.1 ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 17 - "රක්ෂණ ගිවිසුම්"

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 17 - "රක්ෂණ ගිවිසුම්" ප්‍රමිතියේ විෂය පථය තුළ රක්ෂණ ගිවිසුම් හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සඳහා මූලධර්ම ස්ථාපිත කෙරේ. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 17 - "රක්ෂණ ගිවිසුම්" හි පරමාර්ථය වන්නේ යම් ආයතනයක් එම ගිවිසුම් විශ්වාසනීයත්වයකින් අදාළ තොරතුරු සපයන බව සහතික කිරීමයි. මෙම තොරතුරු මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට රක්ෂණ ගිවිසුම් මඟින් ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති කරන බලපෑම තක්සේරු කිරීමට පදනමක් සපයයි.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 17 - "රක්ෂණ ගිවිසුම්" 2026 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ඇරඹෙන වාර්ෂික කාල පරිච්ඡේදය බලාත්මක වේ.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 17- "රක්ෂණ ගිවිසුම්" යොදා ගැනීම නිසා මූල්‍ය ප්‍රකාශන වලට ඇතිවිය හැකි බලපෑම සමූහය විසින් තක්සේරු කරමින් සිටී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

7 මුළු ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආර්ථික ප්‍රතිලාභ බැංකුවට/සමූහයට ගලා ආ බවට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කල හැකිතාක් දුරට ආදායම් හඳුනාගනු ලැබේ.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
පොළී ආදායම	8.1	524,797,842	456,267,458	532,477,761	463,203,346
ගාස්තු සහ කොමිස් ආදායම	9.1	25,875,048	22,837,771	26,235,325	23,165,682
වෙළඳපොළ ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	10	(5,347,822)	17,602,384	(5,163,417)	17,678,455
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	11	858,722	(804,438)	1,448,963	(956,745)
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	12	1,361,863	861,349	1,469,888	877,853
වෙනත් මෙහෙයුම් ආදායම්	13	(5,358,356)	16,384,811	(4,601,757)	16,922,573
මුළු ආදායම		542,187,297	513,149,335	551,866,763	520,891,164

8 ශුද්ධ පොළී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පොළී ආදායම හා වියදම සඵල පොළී අනුපාත ක්‍රමය පදනම් කර ගනිමින් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනු ලබයි.

ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සඳහන් කර ඇති පොළී ආදායම හා වියදම යටතේ පහත සඳහන් අයිතමයන් ඇතුළත් වේ.

- ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබූ මූල්‍ය වත්කම් හා වගකීම්
- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්
- වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්

සඵල පොළී අනුපාතය (EIR)

සඵල පොළී අනුපාතය යනු මූල්‍ය වත්කමට හෝ වගකීමට අදාළව ජනනය වන්නා වූ හෝ ගෙවනු ලබන මුදල් ප්‍රවාහය අදාළ වත්කමේ හෝ වගකීමේ ධාරණ අගයට සමාන වීමට වට්ටම් කළ යුතු අනුපාතය වේ. මෙම සඵල පොළී අනුපාතය ගණනය කරන විට මූල්‍ය උපකරණ තුළ සියළුම ගිවිසුම්ගත කොන්දේසි සලකා බලා මුදල් ප්‍රවාහය තක්සේරු කරයි.

මූල්‍ය උපකරණ අත්පත් කර ගැනීමේදී අදාළ වන වට්ටම් හෝ අධිභාරයන්, ගනුදෙනු පිරිවැය සහ ගෙවූ හෝ ලද ගාස්තු සඵල පොළී අනුපාතය ගණනය කිරීමේ දී එහි ඇතුළත් වේ. ගනුදෙනු පිරිවැය තුළ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීමට සම්බන්ධ සෘජුවම ගතහැකි වර්ධන වියදම් ඇතුළත් වේ.

ණය හානිකරණය වූ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය ඇස්තමේන්තු ඇසුරෙන් හානිකරණය ගැලපූ සඵල පොළී අනුපාතය ගණනය කරනු ලබයි.

ණය අවදානම හැර වෙනත් හේතූන් මත මූල්‍ය වත්කම් මත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් සංශෝධනය කරනු ලැබේ නම් පොළී ආදායමට හෝ ආදායම් ප්‍රකාශයේ සමාන ආදායමට ගැලපීම මඟින් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වත්කම්වල වටිනාකමට ගැලපීම සිදු කෙරේ.

8.1 පොළී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	2,162,274	595,465	2,162,274	881,761
බැංකුවල ඇති තැන්පතු	2,635,457	396,817	3,091,095	405,672
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	1,776,019	96,718	1,810,576	75,167
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණ	5,328,979	444,197	5,328,979	447,726
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්				
ණය හා අත්තිකාරම්	335,051,290	310,238,562	340,286,641	316,070,181
ණය සහ වෙනත් උපකරණ	175,305,169	143,777,962	177,255,006	144,543,793
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	2,538,654	717,737	2,543,190	779,046
මුළු පොළී ආදායම	524,797,842	456,267,458	532,477,761	463,203,346

ණය සහ අත්තිකාරම් මත පොළී ආදායම තුළ 2023 වර්ෂය සඳහා රු. මිලියන 5,827.9 (2022: රු. මිලියන 1,745.7) ක හානිකරණය වූ ණය මත පොළිය ඇතුලත් වේ.

8.2 පොළී වියදම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000
බැංකුවලට ගෙවිය යුතු	94,251	477,472	114,668	511,004
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	33,146,868	36,443,268	33,146,868	36,438,543
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම්				
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	377,581,695	231,793,666	381,012,800	234,767,352
වෙනත් ණය ගැනීම්	10,734,756	52,848,179	10,716,574	53,413,547
යටත් කාලීන වගකීම්	12,052,686	8,358,495	11,976,739	8,304,008
මුළු පොළී වියදම	433,610,256	329,921,080	436,967,649	333,434,454
ශුද්ධ පොළී ආදායම	91,187,586	126,346,378	95,510,112	129,768,892

8.3 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්වලින් ලද ශුද්ධ පොළී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000
පොළී ආදායම	171,796,811	119,745,901	173,685,878	119,805,011
අඩු කළා: පොළී වියදම	33,146,868	36,443,268	33,146,868	36,438,543
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්වලින් ලද ශුද්ධ පොළී ආදායම	138,649,943	83,302,633	140,539,010	83,366,468

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

9 ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය විසින් පුළුල් පරාසයක සේවා සැපයීම මඟින් ලබා ගන්නා ලද ගාස්තු සහ කොමිස්, ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම තුළ අන්තර්ගත වේ. එම ආදායම පහත පරිදි ප්‍රධාන අංශ දෙකක් යටතේ වර්ග කළ හැකිය.

(i) යම් නිශ්චිත කාලයක් පුරා ලබා දී ඇති සේවා වෙනුවෙන් උපයාගන්නා ලද ගාස්තු හා කොමිස් ආදායම

යම් නිශ්චිත කාලයක් පුරා සේවා සැපයීම වෙනුවෙන් ලබාගන්නා ලද ගාස්තු හා කොමිස් එම කාලය පුරාම උපචිත පදනම යටතේ හඳුනාගනු ලබයි. මෙහි කොමිස් ආදායම් සහ පුද්ගලික ධනය හා වත්කම් කළමනාකරණ ගාස්තු, භාරකාරත්ව සේවා, වෙනත් කළමනාකරණ සේවා හා උපදේශන ගාස්තු අන්තර්ගත වේ.

(ii) නිශ්චිත ගනුදෙනුකාර සේවාවන් ඉටුකිරීම සම්බන්ධයෙන් උපයන ගාස්තු හා කොමිස් ආදායම

කොටස් සහ වෙනත් සුරැකුම් මිලදී ගැනීමේ ගනුදෙනු වලට සහභාගී වීම, ව්‍යාපාර මිල දී ගැනීමේ හෝ විකිණීමේ ගිවිසුම් වැනි ක්‍රියාවන් වලට අදාළ කාර්යය සම්පූර්ණ කළ පසු අදාළ ගාස්තු හා කොමිස් ආදායම හඳුනාගනු ලබයි.

සේවා ලබා ගැනීම වෙනුවෙන් දරනු ලබන ගාස්තු හා කොමිස් වියදම් උපචිත පදනමට හඳුනා ගනු ලබයි.

9.1 ගාස්තු සහ කොමිස් ආදායම

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
වෙළඳ සේවා	3,261,176	3,931,144	3,261,176	4,060,300
හර කාඩ්පත් හා ණය කාඩ්පත් සම්බන්ධිත සේවා	11,633,316	8,876,177	11,634,947	8,876,177
සංචාරක හා ප්‍රේෂණ සේවා	3,335,485	3,744,864	3,335,485	3,753,231
භාරකාරත්ව සේවා	64,847	60,667	64,847	60,667
ශාඛා බැංකු සේවා	4,699,583	3,890,089	4,883,879	4,057,370
ඇපකර සම්බන්ධිත සේවා	1,921,328	1,582,641	1,921,328	1,582,641
වෙනත් මූල්‍ය සේවා	959,313	752,189	1,133,663	775,296
මුළු ගාස්තු සහ කොමිස් ආදායම	25,875,048	22,837,771	26,235,325	23,165,682

9.2 ගාස්තු සහ කොමිස් වියදම

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
හර කාඩ්පත් හා ණය කාඩ්පත් සම්බන්ධිත සේවා	7,303,632	5,830,252	7,304,476	5,830,252
සංචාරක හා ප්‍රේෂණ සේවා	258,035	266,482	258,035	266,482
ශාඛා බැංකු සේවා	599,440	360,240	599,440	379,445
ඇපකර සම්බන්ධිත සේවා	19,864	10,728	19,864	10,728
වෙනත් මූල්‍ය සේවා	39,658	18,427	55,571	18,427
මුළු ගාස්තු සහ කොමිස් වියදම	8,220,629	6,486,129	8,237,386	6,505,334
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	17,654,419	16,351,642	17,997,939	16,660,348

10 වෙළඳපල ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙළඳපල ගනුදෙනු වලින් ලැබූ විදේශ විනිමය ලාභ හෝ පාඩු, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වෙළඳපල අගයට තක්සේරු කිරීමෙන් ලැබූ ලාභ හෝ පාඩු සහ වෙළඳපල ගනුදෙනු සඳහා ඇති ස්කන්ධයන් මත ලාභාංශ මේ යටතේ දක්වා ඇත.

ලාභාංශ ලබා ගැනීමට සමූහයට ඇති අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
විදේශ විනිමය				
බැංකුවලින්	-	6,494	172,155	76,071
ගනුදෙනුකරුවන්ගෙන් හා වෙනත්	(5,431,748)	17,522,608	(5,431,748)	17,529,102
ස්කන්ධයන්				
ලාභාංශ ආදායම	83,926	73,282	96,176	73,282
වෙළඳපළ ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	(5,347,822)	17,602,384	(5,163,417)	17,678,455

11 ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු) වල අන්තර්ගත වන්නේ ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ ස්කන්ධ ආයෝජනයන්ගේ සහ ණය උපකරණ වල සාධාරණ අගයේ වෙනස් වීම මත වන උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
වෙළඳපල අගයට වාර්තා කල ලාභ/(පාඩු)				
ස්ථාවර ආදායම් ලැබෙන සුරැකුම්	79,102	29,671	638,326	29,671
ස්කන්ධයන්	437,879	(691,331)	440,102	(843,638)
විකක භාර	341,741	(142,778)	370,535	(142,778)
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	858,722	(804,438)	1,448,963	(956,745)

12 මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල, ක්‍රමක්ෂය පිරිවැයට සහ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කල ණය උපකරණ විකිණීමෙන් ලද ලාභ හෝ පාඩු සහ ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ ස්කන්ධයන් විකිණීමෙන් ලද ලාභ හෝ පාඩු, මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) යටතේ දැක්වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
හඳුනාගැනීම:				
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට	702,105	751,322	702,105	766,423
ක්‍රමක්ෂය පිරිවැයට	-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට	659,758	110,027	767,783	111,430
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	1,361,863	861,349	1,469,888	877,853

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

13 වෙනත් මෙහෙයුම් ආදායම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභාංශ ආදායම

ලාභාංශ ලබා ගැනීමට බැංකුවට හෝ සමූහයට ඇති අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලද ලාභ/(පාඩු)

දේපළ, පිරියත හා උපකරණ සහ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමට අදාළ ලැබීම් වලින් ඒවායේ ධාරණ අගය සහ අදාළ විකුණුම් වියදම් අඩුකර ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ගිණුම්ගත කෙරේ.

විදේශ විනිමය ආදායම

විදේශ විනිමය වත්කම් හා වගකීම් සෑම වාර්තා කරන දිනයකම නැවත අගය කරනු ලබයි. මෙම වත්කම් හා වගකීම් වල සාධාරණ අගයන් වෙනස් වීම ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ අදාළ කාලපරිච්ඡේදය තුළදී හඳුනා ගනු ලබයි.

කුලී ආදායම

කුලී ආදායම උපචිත පදනම යටතේ හඳුනා ගනී. බැංකු පරිශ්‍රය කුලියට දීමෙන් ලැබූ ආදායම, සුරක්ෂිතාගාර වලින් ලද ආදායම වැනි ආදායම් මෙහි අන්තර්ගතවේ.

දළ රක්ෂණ වාරික

අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.) සමඟ ඇති ජීවිත සහ ආයෝජන ගිවිසුම්වල නැවත ගෙවිය යුතු දළ වාරික ඔප්පු හිමියන්ගෙන් ලැබිය යුතු විට ඒවා ආදායම් ලෙස හඳුනා ගනී. එක් වාරිකයක් පමණක් ලැබෙන ගනුදෙනුවල ආදායම හඳුනා ගනු ලබන්නේ ඔප්පුව බල සහිත වන දින දීය.

දළ සාමාන්‍ය රක්ෂණ වාරික මුදල් සමන්විත වන්නේ ගිණුම්කරණ කාලය තුළ දී ගිවිසුමට එළඹෙන විට ලැබිය යුතු මුළු ගිවිසුම් කාලය සඳහාම අදාළ වාරික මුදල්ය. එය ගිවිසුම ආරම්භ වන දිනයේදීම හඳුනා ගනු ලැබේ.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් වලින් ලද ලාභාංශ ආදායම්		238,083	377,695	292,473	441,973
පරිපාලිත හා ආශ්‍රිතයන්ගෙන් ලද ලාභාංශ ආදායම්		372,900	107,430	-	-
ඒකක භාරවල ඒකකවලින් ලද ලාභාංශ ආදායම්		-	-	450	171
විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)		(7,231,150)	15,450,104	(7,231,150)	15,450,104
දේපළ, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ/(පාඩු)		(6,612)	(7,950)	8,607	(7,410)
අත්පත් කරගත් දේපළ විකිණීමෙන් ලද ලාභ/(පාඩු)		47,145	23,507	47,145	23,507
කුලී ආදායම		300,057	235,980	272,756	232,728
සේවා ආදායම		-	-	850,557	280,468
රත්‍රන් විකිණීමෙන් ලද ලාභය		6,789	6,069	6,974	-
විවිධ ආදායම්		950,333	131,581	708,772	84,685
දළ රක්ෂණ වාරික		-	-	477,560	355,952
ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම	13.1	(35,901)	60,395	(35,901)	60,395
මුළු වෙනත් මෙහෙයුම් ආදායම		(5,358,356)	16,384,811	(4,601,757)	16,922,573

13.1 ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව/සමූහය 2023 රු. '000	2022 රු. '000
ඉස්ලාමීය බැංකුකරණ මෙහෙයුම්වලින් ලද ආදායම	155,252	266,617
අඩුකළා: ආයෝජකයන්ට ගෙවූ ලාභ	191,153	206,222
ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම	(35,901)	60,395

14 ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා හානිකරණ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය උපකරණ සඳහා වූ හානිකරණයට අදාළ වෙන් කිරීම් වල වෙනස්වීම බැංකුව හා සමූහය විසින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" වලට අදාළව හඳුනා ගනී. මෙයට අදාළ විස්තරාත්මක සටහන ''ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්'' (සටහන 28) යටතේ දක්වා ඇත. තවද බැංකුව හෝ සමූහය විසින් මූල්‍ය නොවන වත්කම් සඳහා හානිකරණයන් වෙතොත් එයද හඳුනා ගනී. එම හානිකරණය හඳුනා ගනු ලබන්නේ ලං.ගි.ප්‍ර. 36 - "වත්කම් හානිකරණය" ප්‍රමිතිය ට අනුව ධාරණ අගය වත්කමේ නැවත අයකර ගත හැකි අගයට වඩා වැඩි නම් පමණි.

මූල්‍ය උපකරණ වලට අදාළව ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වර්ෂය තුළ හඳුනාගත් අපේක්ෂිත ණය හානිය පහත වගුවේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2023 අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000	සමූහය 2023 අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	22.2	38,436	-	-	38,436	38,436	-	-	38,436
බැංකුවල ඇති තැන්පතු	24.2	(275,170)	-	-	(275,170)	(275,170)	-	-	(275,170)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	28.2	(7,670,654)	6,263,585	(1,256,775)	(2,663,844)	(7,817,368)	6,257,962	(1,261,537)	(2,820,943)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය උපකරණ	29.3	(320,867)	(1,684,832)	-	(2,005,699)	(320,867)	(1,684,832)	-	(2,005,699)
වෙනත් විස්තීරණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	30.4	-	-	-	-	14,710	-	-	14,710
ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ප්‍රතිපාදන/ (ප්‍රතිවර්ත්‍ය) කිරීම් එකතුව		(8,228,255)	4,578,753	(1,256,775)	(4,906,277)	(8,360,259)	4,573,130	(1,261,537)	(5,048,666)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2022 අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000	සමූහය 2022 අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	22.2	11,952	-	-	11,952	10,356	-	-	10,356
බැංකුවල ඇති තැන්පතු	24.2	319,416	-	-	319,416	317,348	-	-	317,348
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	28.2	15,135,491	10,344,926	45,280,265	70,760,682	15,204,835	10,365,092	45,174,250	70,744,177
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය උපකරණ	29.3	(13,446,853)	29,510,499	-	16,063,646	(13,287,475)	29,510,499	-	16,223,024
ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ප්‍රතිපාදන /(ප්‍රතිවර්ත්‍ය) කිරීම් එකතුව		2,020,006	39,855,425	45,280,265	87,155,696	2,245,064	39,875,591	45,174,250	87,294,905

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

15 සේවක මණ්ඩල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සේවක පාරිශ්‍රමික, නිශ්චිත දායකත්ව හා ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය හා සේවක මණ්ඩලය සඳහා දරනු ලබන වෙනත් වියදම් සේවක මණ්ඩල වියදම් යටතේ ඇතුළත් වේ. කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වට්ටම් කිරීමෙන් තොරව එම සේවාව ලැබූ කාලච්ඡේදයට අදාළව හඳුනා ගනු ලබයි. සේවකයින්ට ලබා දෙන ඉදිරියේ දී ගෙවීමට අපේක්ෂා කරන කෙටිකාලීන ප්‍රසාද දීමනා වගකීමක් ලෙස හඳුනා ගනු ලබන්නේ අතීතයේ සැපයූ සේවාවන් වෙනුවෙන් සේවකයාට එම මුදල ගෙවීමට නීතිමය හෝ සාධනීය වගකීමක් ඇත්නම් හා එම වගකීම විශ්වාසවන්තභාවයකින් ඇස්තමේන්තු කළ හැකි නම් පමණි.

අභ්‍යන්තර හා බාහිර නීති හා රෙගුලාසිවලට අනුකූලව සේවකයා විසින් නිශ්චිත ප්‍රතිලාභ හා දායකත්ව සැලසුම් සඳහා අරමුදල් දායකත්වය සැපයීමට බැඳී සිටි.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා කරන ලද වෙන් කිරීම්වලට අදාළ වියදම් හා ආදායම් ආයුගණක තක්සේරුවක් මඟින් ලං.හි.ප්‍ර. 19 "සේවක ප්‍රතිලාභ" ප්‍රමිතියට අදාළව ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
සේවක පාරිශ්‍රමික		23,866,223	23,859,475	25,711,503	25,693,378
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය	15.1	2,201,668	2,048,765	2,383,340	2,229,393
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය	15.2	1,868,440	1,455,762	1,982,003	1,539,682
වෙනත් සේවක පිරිවැය		1,881,868	1,627,427	2,234,835	1,890,525
මුළු සේවක මණ්ඩල වියදම්		29,818,199	28,991,429	32,311,681	31,352,978

15.1 නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් යටතේ ආයතනය විසින් වෙනත් පාර්ශ්වයකට දක්වන ස්ථාවර දායකත්වයයි. මෙම ස්ථාවර දායකත්ව අගය හැරුනු විට වැඩිමනත් ගෙවීමක් සඳහා වෙනත් නීතිමය හෝ වෙනත් වගකීමක් නොමැත. වාර්තා කරන කාලච්ඡේදය අවසානයට පෙර කරන ලද සේවය උදෙසා වන නිශ්චිත දායකත්ව සැලසුම් වෙනුවෙන් ආයතනය තම වගකීම මත දක්වනු ලබන නිශ්චිත දායකත්වය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වියදමක් වශයෙන් හඳුනා ගැනේ. නියමිත දිනට පෙර ගෙවන ලද දායකත්වය එහි මුදල් ප්‍රතිගෙවීමක් හෝ ඉදිරි ගෙවීම්වල අඩුවීමක් ලෙස සලකයි නම් එය වත්කමක් ලෙස හඳුනා ගැනේ.

ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදල

බැංකුවේ සියළුම සේවකයින් ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදලේ සාමාජිකයෝ වෙති. මෙම අරමුදලට, සේවකයාගේ දළ වැටුපෙන් 12% ක මුදලක් බැංකුව විසින් දායක මුදල් වශයෙන් ගෙවනු ලබන අතර, සේවකයින්ගේ දායක මුදල 8% කි. බැංකුවේ අර්ථසාධක අරමුදල අනුමත අරමුදලක් වන අතර, එය ස්වාධීනව පරිපාලනය කෙරේ.

සේවක අර්ථසාධක අරමුදල

ලංකා බැංකු සේවකයින් හැර සියළුම පරිපාලිතයින් ඔවුන්ගේ සේවකයන් වෙනුවෙන්, 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත හා එහි සංශෝධනවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් සහ හොටෙල්ස් කලම්බු සමාගම - 15%) ප්‍රමාණයක් දායක මුදල් ගෙවන අතර, සෑම සේවකයකුගෙන්ම සේවක අර්ථසාධක අරමුදල් සඳහා 8% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් සහ හොටෙල්ස් කලම්බු සමාගම - 10%) ක දායකත්වයක් දරයි. මෙම අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත අනුව, බැංකුව සහ සියළුම පරිපාලිතයින් සේවකයින් සඳහා මෙම අරමුදලට දායක විය යුතු අතර, මාසිකව බැංකුව/සමූහය සේවකයාගේ දළ වැටුපෙන් 3% ක මුදලක් මේ සඳහා ගෙවනු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
සේවය දායකත්වය:				
ලංකා බැංකු/සේවක අර්ථසාධක අරමුදල	1,766,295	1,643,180	1,912,518	1,792,776
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	435,373	405,585	470,822	436,617
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා මුළු දායකත්වය	2,201,668	2,048,765	2,383,340	2,229,393

15.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත සමූහයේ ශුද්ධ වගකීම හෝ බැඳීම එක් එක් සැලසුම වෙන් වශයෙන් සලකා එම සේවකයන් විසින් ඔවුන්ගේ වර්තමාන සහ පෙර සේවාවන් උදෙසා උපයාගත් අනාගත ප්‍රතිලාභයන් වර්තමාන අගයට වට්ටම් කර, ඉන් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය ඉවත් කල පසු අගයට ගණනය කෙරේ. වට්ටම් අනුපාතය ලෙස සලකනු ලබන්නේ වාර්තාකරණ දිනට සමූහයේ බැඳීම් වල කාලයට ආසන්න වශයෙන් සමාන කාලයක් සහිත දිගුකාලීන භාණ්ඩාගර බැඳුම්කරවල ඉපැයුම් අනුපාතයයි. මෙම ගණනය කිරීම් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් "ප්‍රෝක්ඨනය කළ ඒකක බැර ක්‍රමය" භාවිතයෙන් ගණනය කෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්හි ගණනය කරන ලද, ලාභ හෝ අලාභ සමූහය විසින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගන්නා අතර, ඊට අදාළ වියදම්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සේවක මණ්ඩල වියදම් යටතේ හඳුනාගනී. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් විස්තරාත්මකව (සටහන් අංක 48) "සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්" යටතේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ලාභයේ හෝ අලාභයේ හඳුනාගත් ශුද්ධ වියදම්					
ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල	48.1.1	4,896,595	2,514,177	4,896,595	2,514,177
ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල	48.2.1	(1,807,265)	(1,319,754)	(1,807,265)	(1,319,754)
විශ්‍රාම පාරිතෝෂික	48.3	173,686	105,253	273,972	180,221
ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් අරමුදල - 2014	48.4.1	(1,566,380)	83,081	(1,566,380)	83,081
අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා ප්‍රතිපාදන	48.5	171,804	73,005	171,804	73,005
විශ්‍රාම අරමුදල - ලංකා බැංකුව (යූ කේ) සමාගම		-	-	13,277	8,952
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා මුළු දායකත්වය		1,868,440	1,455,762	1,982,003	1,539,682

16 ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වත්කම් භාවිතය සඳහා පවතින දිනයේ සිට ආර්ථික කටයුතු සඳහා වත්කම් භාවිතා කළ හැකි මට්ටම දක්වා සමූහය ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන සිදු කරයි. වත්කම විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති දිනයේ හෝ වත්කම ඉවත් කිරීමට හඳුනාගත් දිනයේ දී වත්කම් ක්ෂය කිරීම නතර කෙරේ. වත්කම සම්පූර්ණයෙන් ක්ෂය වී ඇත්නම් මිස වත්කම අක්‍රිය වූ විට හෝ ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගිය විට ක්ෂය වීම නතර නොකෙරේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ආයෝජන දේපළ වල ක්ෂය	33	-	-	9,190	2,906
දේපළ පිරියත හා උපකරණ වල ක්ෂය	34	1,846,426	1,894,960	2,692,672	2,717,917
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ වල ක්‍රමක්ෂය	35	1,522,030	1,759,054	1,002,250	990,918
අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය	36	484,475	632,885	525,130	795,627
මුළු ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්		3,852,931	4,286,899	4,229,242	4,507,368

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

17 වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාළව වෙනත් වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනී. ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සඳහා සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉවහල් වන ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා දරන ලද සියළු වියදම් සමූහයේ ලාභය ගණනය කිරීම සඳහා ආදායමෙන් අඩුකර පෙන්වනු ලබයි. අතීත සිදුවීමක් සම්බන්ධයෙන් වර්තමාන වගකීමක් බැංකුවට හෝ සමූහයට ඇති විට දී සහ එම වගකීම් පියවීමට ආර්ථික ප්‍රතිලාභ බැංකුවෙන්/සමූහයෙන් ගලා යන්නේ නම් සහ එම වටිනාකම විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් එය වියදම් ලෙස වෙන් කිරීමක් සිදුකෙරේ.

තැන්පතු සඳහා රක්ෂණ ගාස්තු

2010 ඔක්තෝබර් 1 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2010 අංක 6 දරණ විධිවිධානයන්ට යටත්ව ආසන්න විගණිත මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) මත පදනම්ව සුදුසුකම්ලත් තැන්පතු වගකීම් වලින් 0.1% ක හෝ 0.125% ක ගෙවීමක් කාර්තුමය පදනමින් බැංකුව විසින් තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමයට සිදු කළ යුතුය.

ප්‍රතිරක්ෂණ වාරික, හිමිකම් හා වෙනත් ප්‍රතිලාභ

ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල) සමඟ ඇති ආයෝජන ගිවිසුම් සඳහා වන දළ ප්‍රතිලාභ සහ හිමිකම්වල ඇතුළත් වර්ෂය තුළ ජනිත වූ හිමිකම් පිරිවැයයි. මෙම පිරිවැයෙහි සැකසුම් කිරීම සහ බේරුම් කිරීම සඳහා සෘජුවම සම්බන්ධවන බාහිර සහ අභ්‍යන්තර පරිහරණය කිරීමේ පිරිවැය සහ අ.ස.ල. ගිවිසුම් සඳහා ප්‍රකාශිත ප්‍රසාද දීමනා ද, එමෙන්ම රක්ෂණයේ දළ තක්සේරුවේ සහ අ.ස.ල සමඟ ඇති අයෝජන ගිවිසුම් හිමිකම්වල සිදුවන වෙනස්වීම් ද ඇතුළත්ය. මරණ හිමිකම් සහ අයිතිය අත් හැරීම වාර්තාවන්නේ දැනුම්දීම ලැබුණු පසුයි. කල් පිරීම් සහ වාර්ෂික ගෙවීම් වාර්තා වන්නේ යථාවත් වූ විටය. අතුරු ගෙවීම් සහ අයිතිය අත්හැරීම් ගිණුම්ගත වන්නේ ඒවා බේරුම් කරන විටය.

සාමාන්‍ය රක්ෂණය යටතේ වර්ෂය තුළදී සිදුවූ හෝ වාර්තා වූ හෝ වාර්තානොවූ සියළු හිමිකම්පෑම් හිමිකම් ගෙවීමට අදාල සියළු අභ්‍යන්තර සහ බාහිර සැකසීම් හා ගෙවීම් සම්බන්ධ වියදම් සහ පසුගිය වසරට අදාල හිමිකම් පෑම්ද ගලපා ඇති අතර සුන්බුන් හෝ වෙනත් ලැබීම් අඩු කර වාර්තා කරනු ලැබේ.

සෘජු සහ අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ ව්‍යාපාර ලෙස නොපිය වූ හිමිකම් වන හිමිකම් වියදම් සහ වගකීම් හඳුනා ගෙන ඇත. වගකීම් ලෙස ආවරණය වනුයේ වාර්තා කළ නමුදු තවම ගෙවා නොමැති හිමිකම්, සිදු වූ නමුදු වාර්තාකර නොමැති හිමිකම් පියවීමට අදාළ වන සෘජු සහ වක්‍ර පිරිවැයයි. නොපිය වූ හිමිකම් එක් එක් හිමිකම් පාදකව තක්සේරු කර ඇති අතර, මෙහි දී හිමිකම් නිරවුල් කිරීමේ දී ගෙවිය යුතු අවසාන පිරිවැය මත එය ඇස්තමේන්තු කර ඇත. මෙතෙක් සිදුවී ඇති එහෙත් වාර්තා නොකරන ලද හිමිකම් සඳහා වඩාත් තාත්වික ඇස්තමේන්තු කිරීමක් වෙනුවෙන් අතීත පළපුරුදු සහ ප්‍රවනතා මත ගණනය කරන ලද අනාගත බැරකම් පිළිබඳව ආයුගණකවරයෙකුගේ තක්සේරුව ලබා ගනු ලබයි.

එකී තක්සේරු හිමිකම් නිරවුල් කිරීම සඳහා වන සම්පූර්ණ වගකීම පසුව ලැබෙන තොරතුරු හා සිදුවන සිද්ධීන් මත තීරණය වුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි වර්තමානයේ පවතින තොරතුරු අනුව හිමිකම් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත. මෙම තත්ත්වය නිසා ප්‍රතිපාදනය කරන ලද අගයක් වෙනුවෙන් සිදු කරන ගැලපීම් අදාළ කාලච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. හිමිකම් වෙනුවෙන් භාවිතා කරන ලද ක්‍රම හා ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

ප්‍රතිරක්ෂණ හිමිකම හඳුනාගනු ලබන්නේ එයට අදාළ දළ රක්ෂණ වගකීම ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව හඳුනාගත් විට දීය.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
අධ්‍යක්ෂ පාරිශ්‍රමික	2,975	4,200	117,961	13,748
විගණක ගාස්තු				
විගණන සේවා ගාස්තු	46,612	35,504	99,805	78,277
විගණන නොවන සේවා ගාස්තු	-	-	1,372	766
තැන්පතු රක්ෂණ ගාස්තු	3,271,248	3,111,665	3,306,617	3,146,594
බෘහස්පතිය හා නීති ගාස්තු	236,828	158,948	303,084	242,892
ඉඩම් හා ගොඩනැගිලි මත ප්‍රත්‍යාගණන (ලාභ)/පාඩු	341,757	(3,200)	341,757	(3,200)
ස්ථාවර වත්කම් නඩත්තු කිරීමේ වියදම්	5,872,616	3,737,614	5,956,869	3,408,364
ප්‍රතිරක්ෂණ වාරික, හිමිකම් හා වෙනත් ප්‍රතිලාභ	-	-	459,618	291,024
කාර්යාල පරිපාලන සහ මෙහෙයුම් වියදම්	8,813,531	6,973,430	9,887,046	8,245,501
මුළු වෙනත් වියදම්	18,585,567	14,018,161	20,474,129	15,423,966

18 බදු වියදම

18.1 මූල්‍ය සේවා මත බදු වියදම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය සේවා මත බදු වියදම තුළ ඇතුලත් වන්නේ මූල්‍ය සේවා සඳහා එකතු කිරීමේ අගය මත ගණනය කල එකතු කළ අගය මත බදු (VAT) සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු වියදමයි (SSCL).

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
එකතු කළ අගය මත බදු	11,122,618	11,031,979	11,378,354	11,155,847
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	1,540,951	281,313	1,577,470	286,658
මුළු මූල්‍ය සේවා මත බදු වියදම	12,663,569	11,313,292	12,955,824	11,442,505

18.2 ආදායම් බදු වියදම/ (ප්‍රතිවර්තය)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සෘජුවම ස්කන්ධය යටතේ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගැනෙන අයිතම හැර අනෙකුත් අයිතමයන්ට අදාළ වන ප්‍රවර්තන සහ විලම්බිත බදු, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු ලෙස හඳුන්වනුයේ වාර්තාකරණ දිනට පවතින බදු අනුපාතය යොදා ගනිමින් වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම හෝ අලාභය මත ගණනය කරන ලද බදු ගෙවීම හෝ ලැබීමයි. තවද, පෙර වර්ෂයන් හි බදු ගෙවීම් සඳහා යම් ගැලපීමක් වේ නම් එයද සැලකිල්ලට භාජනය කෙරේ. ප්‍රවර්තන බදු ගෙවීම හෝ ලැබීම් වටිනාකම යනු ආදායම් බදු වෙනස්වීම කෙරෙහි බලපාන යම් අවිනිශ්චිතතාවයක් තිබිය හැකි නමුත්, බදු ලැබීමක් හෝ ගෙවීමක් සඳහා කල හැකි ප්‍රශස්ත ඇස්තමේන්තුවකි.

මේ අනුව 2018 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත, 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත, 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත සහ 2023 අංක 04 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනතේ විධිවිධාන අනුව, බදු අරමුණු සඳහා සකස් කර ඇති පරිදි, වර්ෂය සඳහා ගිණුම්කරණ ලාභය පදනම් කරගෙන බදුකරණය සඳහා ප්‍රතිපාදන සිදු කෙරේ. ලං.ගි.ප්‍ර 12 - "ආදායම් බදු" ප්‍රමිතයේ අවශ්‍යතාවයන්ට අනුව සඵල බදු අනුපාත, ආදායම් බදු වියදම සහ බදු පෙර ලාභය අතර සැසඳීම සටහන් අංක 18.2.2 යටතේ දක්වා ඇත.

විදේශීය මෙහෙයුම් මත, ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්කරණ ලාභයෙන් වෙන්කරන ලද බදු මුදල ගණනය කරන ලද්දේ, වර්ෂය සඳහා වන ගිණුම්කරණ ලාභය පදනම්ව බදුකරණය සඳහා වන ගැලපීම් සිදු කර ඒ ඒ රට වලට අදාල වන නීති හා රෙගුලාසි මත, වාර්තා කරන දිනට බලපාන හෝ ඉදිරියේදී බලපවත්නා බදු අනුපාත සැලකිල්ලට ගෙන වේ.

විලම්බිත බදු

තාවකාලික වෙනස්කම් මත විලම්බිත බදු වත්කම් හා වගකීම් වල සැසඳීමක් සටහන් අංක 37 යටතේ දක්වා ඇත.

18.2.1 ආදායම් බදු වියදමෙහි සංරචක

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ප්‍රවර්තන බදු වියදම					
වර්ෂයේ ලාභය මත ආදායම් බදු වියදම		12,328,943	13,403,667	12,961,669	13,627,737
ආදායම් බද්දට අදාළව පෙර වර්ෂවල ගැළපුම්		781,912	146,793	989,298	146,793
විලම්බිත බදු වියදම					
විලම්බිත බදු ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය) කිරීම	37	538,042	(14,546,219)	204,471	(14,571,046)
වර්ෂය සඳහා ආදායම් බදු වියදම		13,648,897	(995,759)	14,155,438	(796,516)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

18.2.2 ගිණුම්කරණ ලාභය සහ ආදායම් බදු වියදම සැසඳීම

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
බදු පෙර ගිණුම්කරණ ලාභය		40,342,423	30,976,649	41,773,025	31,052,501
එකතු කළා: පරිපාලිතයන්ගෙන් හා අශ්‍රිතයන්ගෙන් ලද ලාභාංශ ආදායම		-	-	372,900	107,430
		40,342,423	30,976,649	42,145,925	31,159,931
එකතු කළා: ඉඩ නොදෙන වියදම්		21,841,873	74,023,401	22,268,407	74,916,711
		62,184,296	105,000,050	64,414,332	106,076,642
අඩු කළා: ඉඩ දෙන වියදම්		5,541,992	27,313,674	5,662,941	27,527,907
අඩු කළා: බදු නිදහස් ආදායම		16,683,203	26,607,014	16,683,203	26,607,015
බදු ගෙවිය යුතු ආදායම		39,959,101	51,079,362	42,068,188	51,941,720
30% අනුපාතයට බදු අය කළ හැකි ආදායම (2022 - 24% හා 30%)		39,959,101	50,561,160	42,068,188	51,292,184
15% අනුපාතයට බදු අය කළ හැකි ආදායම (ලද ලාභාංශ) (2022 - 14% හා 15%)		-	518,202	-	649,536
30% අනුපාතයට ප්‍රවර්තන බද්ද (2022 - 24% හා 30%)		11,987,730	13,314,547	12,620,456	13,519,805
15% අනුපාතයට ලාභාංශ මත බද්ද (2022 - 14% හා 15%)		-	75,072	-	93,884
වෙනත් රටවල විවිධ බදු අනුපාතවල බලපෑම		341,213	14,048	341,213	14,048
පෙර වර්ෂ වෙනුවෙන් කල බදු ගැළපීම		781,912	146,793	989,298	146,793
විලම්බිත බදු ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය කිරීම)	37	538,042	(14,546,219)	204,471	(14,571,046)
වර්ෂය සඳහා ආදායම් බදු වියදම		13,648,897	(995,759)	14,155,438	(796,516)
සඵල බදු අනුපාතය (%)		33.8	(3.2)	33.9	(2.6)

ශ්‍රී ලංකා ස්වෛරී බැඳුම්කර වල අපේක්ෂිත ණය හානිය මත විලම්භිත බදු

සටහන 37 හි අනාවරණය කර ඇති පරිදි, 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 20,998.6 ක් මූල්‍ය වත්කම් වල හානිකරන මත විලම්බිත බදු වත්කමක් ලෙස බැංකුව විසින් හඳුනා ගෙන ඇත. මෙයින් රු. මිලියන 11,667.3 ක් ශ්‍රී ලංකා ස්වෛරී බැඳුම්කර වල ආයෝජනයන්හි හානිකරන මත බැංකුව විසින් විනිශ්චයට අනුව ඇස්තමේන්තු කරන ලදි.

18.2.3 නේවාසික සමාගම්වල බදු වගකීම් 2022 ජූලි 1 සිට 30% සම්මත අනුපාතයට ගණනය කෙරේ. (2022 ජූනි 30 දක්වා: 24%, සම්පූර්ණ හෝ අර්ධ නිදහස් කිරීම් සහ සහන භුක්ති විඳින බැංකුවේ සහ අනුබද්ධ සමාගම්වල පහත සඳහන් මෙහෙයුම් හැර)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023	2022	
		2022 ජූලි 1 සිට	2022 ජූනි 30 දක්වා
	%	%	%
දේශීය මෙහෙයුම් සඳහා අදාල වන බදු අනුපාත			
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	30.00	30.00	14.00
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	30.00	30.00	14.00

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 %	2022 %
විදේශීය මෙහෙයුම් සඳහා අදාල වන බදු අනුපාත		
මාලේ ශාඛාවේ බැංකු කටයුතු	25.00	25.00
චෙන්නායි ශාඛාවේ බැංකු කටයුතු	40.00	40.00
සීෂෙල්ස් ශාඛාවේ බැංකු කටයුතු		
සීෂෙල්ස් රුපියල් 1,000,000 දක්වා	25.00	25.00
ඉතිරිය සඳහා	33.33	33.33
ලංකා බැංකුව (යූ කේ) සමාගම	19.00	19.00

19 ආශ්‍රිත සමාගම් වල ලාභ/(පාඩු) කොටස, බදු පසු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහයේ ආශ්‍රිතයන්ගේ ලාභ හෝ අලාභ කොටස් වල විකතුව ස්කන්ධ ගිණුම්කරණ ක්‍රමය අනුව ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ දක්වා ඇත.

	සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	37,681	26,394
සී/ස ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගම	(2,056)	70,240
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම	(2,118)	26,213
මුළු ආශ්‍රිත සමාගම් වල ලාභ/ (පාඩු) කොටස, බදු පසු	33,507	122,847

20 කොටසක ඉපැයුම සහ කොටසක ලාභාංශ

20.1 කොටසක මූලික ඉපැයුම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලං. ගි. ප්‍ර. - 33 "කොටසක ඉපැයුම" අනුව කොටසක් වෙනුවෙන් මූලික ඉපැයුම ගණනය කරනු ලබන්නේ මව් සමාගමේ සාමාන්‍ය කොටස්හිමියන්ට අයත් ශුද්ධ ලාභය හෝ අලාභය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් (හරය) බෙදීමෙනි.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023	2022	2023	2022
බැංකුවේ සාමාන්‍ය කොටස්හිමියාට අයත් වර්ෂයේ ශුද්ධ ලාභය (රු. '000)		26,693,526	31,972,408	27,571,569	31,994,638
නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	20.1.1	25,000,000	25,000,000	25,000,000	25,000,000
කොටසක මූලික ඉපැයුම (රු.)		1,067.74	1,278.90	1,102.86	1,279.79

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

20.1.1 නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023	2022	2023	2022
ජනවාරි 1 වන දිනට නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් ප්‍රමාණය	25,000,000	25,000,000	25,000,000	25,000,000
වර්ෂය තුළ නිකුත් කළ හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	-	-	-	-
දෙසැම්බර් 31 දිනට නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	25,000,000	25,000,000	25,000,000	25,000,000

20.2 කොටසක තනුක ඉපැයුම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

කොටසක තනුක ඉපැයුම ගණනය කරනු ලබන්නේ, බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ලාභය හෝ අලාභය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් සහ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමේ සම්භාවිතාවක් ඇති කොටස්වල බලපෑම ගැලපුම් කළ පසු හරිත සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් (හරය) බෙදීමෙනි.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023	2022	2023	2022
බැංකුවේ සාමාන්‍ය කොටස්හිමියාට අයත් වර්ෂයේ ශුද්ධ ලාභය (රු. '000)		26,693,526	31,972,408	27,571,569	31,994,638
ගැලපුම් සිදු කළ පසු හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	20.2.1	25,730,000	25,134,000	25,730,000	25,134,000
කොටසක තනුක ඉපැයුම (රු.)		1,037.45	1,272.08	1,071.57	1,272.96

20.2.1 තනුක කිරීම සඳහා ගැලපුම් සිදු කළ පසු හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023	2022	2023	2022
නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	25,000,000	25,000,000	25,000,000	25,000,000
සාමාන්‍ය කොටස්වලට පරිවර්තනය කිරීම සඳහා සම්භාවිතාවක් සහිත විභජනයට ඇති ප්‍රාග්ධනයට අදාළ බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	730,000	134,000	730,000	134,000
තනුක කිරීම සඳහා ගැලපුම් සිදු කළ පසු හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	25,730,000	25,134,000	25,730,000	25,134,000

20.3 කොටසක ලාභාංශය

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

කොටසක ලාභාංශය ගණනය කර ඇත්තේ, කොටස්හිමියන්ට බෙදා හරින මුළු ලාභාංශය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් (හරය) බෙදීමෙනි.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023	2022	2023	2022
වර්ෂය තුළ සාමාන්‍ය කොටස්හිමියාට බෙදා දුන් ලාභාංශ (රු. '000)		173,205	346,410	173,205	346,410
නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	20.1.1	25,000,000	25,000,000	25,000,000	25,000,000
කොටසක ලාභාංශය (රු.)		6.93	13.86	6.93	13.86

21 මිනුම් කිරීමේ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය

සියළුම මූල්‍ය වත්කම් හා වගකීම් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" ප්‍රමිතයට අනුකූලව මිනුම් කිරීමේ පදනම මත පහත දක්වා ඇත.

21.1 බැංකුව

දෙසැම්බර් 31 දිනට	2023			
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	-	135,550,505	135,550,505
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	34,932,639	34,932,639
බැංකුවල ඇති තැන්පතු	-	-	74,966,171	74,966,171
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	3,711,918	3,711,918
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	20,525,840	-	-	20,525,840
ණය හා අත්තිකාරම්	-	-	2,209,061,924	2,209,061,924
ණය උපකරණ	38,411,078	42,437,931	1,653,728,403	1,734,577,412
ස්කන්ධ උපකරණ	2,231,452	7,096,067	-	9,327,519
මුළු මූල්‍ය වත්කම්	61,168,370	49,533,998	4,111,951,560	4,222,653,928

දෙසැම්බර් 31 දිනට	2023		
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	-	3,047,732	3,047,732
ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	-	78,463,070	78,463,070
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	2,169,202	-	2,169,202
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට			
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	-	3,882,232,323	3,882,232,323
වෙනත් ණය ගැනීම්	-	33,666,236	33,666,236
යටත් කාලීන වගකීම්	-	64,691,810	64,691,810
මුළු මූල්‍ය වගකීම්	2,169,202	4,062,101,171	4,064,270,373

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට	2022			
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	-	128,401,532	128,401,532
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	70,494,529	70,494,529
බැංකුවල ඇති තැන්පතු	-	-	16,459,303	16,459,303
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	1,480,403	1,480,403
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	57,155,486	-	-	57,155,486
ණය හා අත්තිකාරම්	-	-	2,325,594,329	2,325,594,329
ණය උපකරණ	7,892,241	3,361,267	1,555,897,307	1,567,150,815
ස්කන්ධ උපකරණ	2,387,814	5,329,535	-	7,717,349
මුළු මූල්‍ය වත්කම්	67,435,541	8,690,802	4,098,327,403	4,174,453,746

දෙසැම්බර් 31 දිනට	2022		
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	-	11,514,897	11,514,897
ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	-	180,218,543	180,218,543
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	921,033	-	921,033
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට			
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	-	3,334,774,261	3,334,774,261
වෙනත් ණය ගැනීම්	-	390,489,543	390,489,543
යටත් කාලීන වගකීම්	-	63,758,191	63,758,191
මුළු මූල්‍ය වගකීම්	921,033	3,980,755,435	3,981,676,468

21.2 සමූහය

දෙසැම්බර් 31 දිනට	2023			
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	-	137,369,158	137,369,158
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	34,932,639	34,932,639
බැංකුවල ඇති තැන්පතු	-	-	73,024,979	73,024,979
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	3,695,392	3,695,392
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	20,525,840	-	-	20,525,840
ණය හා අත්තිකාරම්	-	-	2,240,611,228	2,240,611,228
ණය උපකරණ	46,236,604	42,524,390	1,660,012,978	1,748,773,972
ස්කන්ධ උපකරණ	2,594,267	9,675,295	-	12,269,562
මුළු මූල්‍ය වත්කම්	69,356,711	52,199,685	4,149,646,374	4,271,202,770

දෙසැම්බර් 31 දිනට	2023		
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	-	3,162,463	3,162,463
ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	-	77,829,770	77,829,770
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	2,169,202	-	2,169,202
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට			
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	-	3,909,580,686	3,909,580,686
වෙනත් ණය ගැනීම්	-	35,592,741	35,592,741
නිකුත් කළ ණය සුරැකුම්පත්	-	730,839	730,839
යටත් කාලීන වගකීම්	-	64,437,320	64,437,320
මුළු මූල්‍ය වගකීම්	2,169,202	4,091,333,819	4,093,503,021

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට	2022			
	ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ	වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	-	135,230,827	135,230,827
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	70,494,529	70,494,529
බැංකුවල ඇති තැන්පතු	-	-	17,811,665	17,811,665
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	1,463,368	1,463,368
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	57,155,486	-	-	57,155,486
ණය හා අත්තිකාරම්	-	-	2,355,978,333	2,355,978,333
ණය උපකරණ	7,954,525	3,361,267	1,562,373,679	1,573,689,471
ස්කන්ධ උපකරණ	2,681,665	7,388,777	-	10,070,442
බැංකුව විසින් තම ගනුදෙනුකරුවන්ට විවිධත්වයෙන් යුතු ආයතනික හා ශාඛා බැංකු පහසුකම් පිරිනමා ඇති අතර බැංකුවට තම අභිමතය පරිදි එක් දින දැනුම් දීමකින් පහසුකම අඩු කිරීමට හෝ ඈවර කිරීමට හැකියාවක් පවතින නිෂ්පාදන මේ යටතට අයත් වේ (උදා: බැංකු අයිරා සහ ණය කාඩ්පත්). මෙහිදී බැංකුව විසින් ණය හානිය ගණනය කිරීමේදී අදාළ ගිවිසුම් ගත කාල වකවානුව මත පදනම් නොවී ගනුදෙනුකරුගේ හැසිරීම පිලිබඳ බැංකුවට ඇති අපේක්ෂාව, පැහැර හැරීමක් සිදුවීමට ඇති හැකියාව සහ බැංකුව විසින් අදාළ පහසුකම අඩුකිරීම හෝ ඈවර කිරීම සිදු කිරීම සහිත විය හැකි අනාගත අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි මත පදනම්ව අපේක්ෂිත ණය හානිය ගණනය කරයි.

අනෙකුත් ණය නිෂ්පාදන මෙන්ම චක්‍රීය පහසුකම් සඳහාද ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේද යන්න සලකා බලයි. ගනුදෙනුකරුගේ ණය ගෙවීම පැහැර හරින කාලය මත පදනම්ව ණය අවදානම ගණනය කරයි.

කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සඳහා තනි තනිවද අනෙක් ණය සඳහා සමූහ වශයෙන්ද බලාපොරොත්තු වන නිරාවරණ ප්‍රමාණය හා වට්ටම් අනුපාතය පදනම්ව අපේක්ෂිත ණය අලාභ නිර්ණය කෙරේ. සමාන ලක්ෂණ සහිත කළඹයන් සමූහ වශයෙන් වෙන වෙනම ඇගයීමට ලක් කෙරේ.

අනාගත තොරතුරු

අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීමේ ආකෘතිය තුළ පුළුල් පරාසයක ඉදිරි දැක්මක් සහිත තොරතුරු ආර්ථික යෙදවුම් ලෙස භාවිතා කරයි. එම යෙදවුම් පහත දැක්වේ.

- දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය
- පොළී අනුපාත
- උද්ධමනය
- විනිමය අනුපාත
- සේවා වියුක්තිය
- ව්‍යාපාරික ක්ෂේත්‍රයේ තත්වය
- නෛතික බලපෑම
- රාජ්‍ය ප්‍රතිපත්ති

හානිකරණය ගණනය කිරීම

පැහැර හැරීම හා උසස් කිරීම අර්ථ දැක්වීම

ණයගැතියා ගිවිසුම් ගත දිනයේ සිට දින 90 ක් දක්වා ණය නොගෙවා සිටිය හොත් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපාදනයන්ට අනුව අක්‍රීය ණය මුදලක් ලෙස වර්ගීකරණය කරනු ලබන සෑම අවස්ථාවකම, මූල්‍ය උපකරණ වල අපේක්ෂිත ණය අවදානම ගණනය කරනු ලබන්නේ 3 වෙනි අදියරට (ණය හානිකරණය වූ ලෙස) අදාලවයි.

ණය කරුවෙකු විසින් ණය පැහැර හැරීමට ඇති ගුණාත්මක සාධක කෙරෙහිද, බැංකුව සැලකිලිමත් වේ. මෙහිදී, මෙම පැහැර හැරීමේ අවදානමින් හට ගන්නා විවෘති අවස්ථාවන් වල, අපේක්ෂිත ණය හානිය ගණනය කිරීමේදී විය 3 වෙනි මට්ටම යටතේ ද නැතහොත් 2 වන මට්ටම යටතේද යන්න ඇගයීම් සිදු කර බැලිය යුතුය. විවෘති අවස්ථාවන් වන්නේ,

- ණය ගැනුම්කරුවකුගේ ණය තක්සේරුව බාහිර ණය තක්සේරුකරණ ආයතනයක් මඟින් ජාතික ණය තක්සේරුව අනුව B+ හෝ ඊට පහල දැමීම.
- ණය හානියේ අවදානම තක්සේරු කිරීම සඳහා අභ්‍යන්තරව භාවිතා කරන ණය ශ්‍රේණිගත කිරීමේ අනුපාතයන්ගේ ඒකක දෙකක හෝ ඊට වැඩි ගණනක අඩුවීමක් සිදුවීම.
- ණය වගකීම් ඉටුකිරීමට කැපීපෙනෙන වෙනසක් ඇතිවන ණයගැතියෙකුගේ අනාගත ආර්ථික දර්ශක වල පැහැදිලි අවාසිදායක වෙනසක් සිදු වීම.
- ණයගැතියාගේ ව්‍යාපාර මෙහෙයුම් මත අහිතකර ලෙස බලපාන භූ ගෝලීය හෝ ස්වාභාවික සැලකිය යුතු වෙනසක් සිදු වීම.
- ණය ලබාගැනීමේදී ඇප තැබූ සුරැකුමෙහි නැවත විකිණීමෙන් ලබාගත හැකි අගයෙහි සැලකිය යුතු අඩුවීමක්.
- ආයතනික ණයගැතියන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය නිරන්තරයෙන් වෙනස් වීම.
- ව්‍යාපාර මෙහෙයුම් හෝ ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට විකඟ වූ දිනට වසර දෙකකට වඩා පමා වීම.
- ණය ආපසු ගෙවීමේ අපහසුතා නිසා ඇතිවෙන දීර්ඝ කිරීම්, ගෙවීම් කල් දැමීම, ගිවිසුම් අතහැරීම ඇතුළු සහන ලබාදීම සඳහා වන කොන්දේසි වෙනස් කිරීම.
- අනාගත මුදල් ප්‍රවාහ වලට බලපාන ලෙස මුළු ආදායමේ හෝ බදු පෙර ලාභයෙහි පෙර වසරට සාපේක්ෂව 50% ක හෝ ඊට වැඩි පහල යාමක් හෝ/සහ මුළු ප්‍රාග්ධනයේ 25% ක පහල යාමක් (ප්‍රාග්ධන සංයුතියේ වෙනසක් සිදුවීම හෝ ලාභාංශ ගෙවීම හේතුවෙන් හැර).
- ණය ගෙවීමට අහිතකර ලෙස බලපානු ලබන නීතිමය තත්වයන් ඇති වීම.
- ණය ගැතියාව සොයාගැනීමට හෝ සම්බන්ධ වීමට නොහැකි වීම.

- බැංකු ඇපකර බැඳීම් මත හිමිකම් පෑම සිදු වීම.
- ණය ගැතියා බුන්වත්වීම හෝ මිය යාම.
- ණය අයකර ගැනීමට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකි වෙනත් ඕනෑම කරුණක්.

පැහැර හරින ලද බවට නිර්ණායක කිසිවක් නොපවතින විට මූල්‍ය උපකරණයක් "උසස් කරන ලද" ලෙස සැලකීම බැංකුවේ ප්‍රතිපත්තිය වන අතර එබැවින් 3 වන අදියරෙන් නැවත වර්ගීකරණය කෙරේ. මෙහිදී වත්කමක්, අදියර 1 හෝ අදියර 2 යටතට හඳුනා ගැනීමේ තීරණය පදනම් වන්නේ යාවත් කාලීන කරන ලද කාල සීමාවේ පැවති ණය ශ්‍රේණිය හා මූලික හඳුනාගැනීමේදී හඳුනාගත් ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමක් මත වේ. ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු ගෙවන ලද පළමු ප්‍රාග්ධන හා/හෝ පොළී වාරිකයෙන් පසු අවම වශයෙන් දින 90 ක සතුටුදායක කාර්යසාධන කාලපරිච්ඡේදයකට පසු ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් "උසස් කරන ලද" ලෙස සැලකේ. මෙවැනි උසස් කිරීමක් සිදුකරන විට ප්‍රධාන අවදානම් නිලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතුය.

පැහැර හැරීමේ සම්භාවිතාව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය

බැංකුව විසින් පෙර කාලපරිච්ඡේද වලදී ණය හා අත්තිකාරම් පැහැර හැරීමේ සම්භාවිතාවය මත පදනම්ව පැහැර හැරීමේ සම්භාවිතාව ගණනය කරයි. මෙම ක්‍රියාවලියේදී, අදාළ ණය වල ස්වභාවය අනුව පසුගිය වර්ෂ 3 සිට 5 දක්වා කාලයක දත්ත ඇගයීමක් සිදු කරයි.

ණය පැහැර හරින අවස්ථාවේ නිරාවරණ අගය

ණය පැහැර හරින අවස්ථාවේ නිරාවරණ අගය යනු, යම් කිසි මූල්‍ය උපකරණයක පැහැරහරින අවස්ථාවේ ඇති දළ වටිනාකමට හානිකරන අගය ගලපා ලැබෙන අගයයි. මෙහිදී ගනුදෙනුකරුට පැහැර හරින අවස්ථාව දක්වා නිරාවරණ අගය වැඩි කිරීමට ඇති හැකියාව සහ ඉදිරියේදී අයවිය හැකි අගයන් යන දෙකම කෙරෙහි අවධානය යොමු කරයි.

අදියර 1 ණය පහසුකම් සඳහා පැහැර හරින අවස්ථාවේදී නිරාවණ අගය ගණනය කිරීමේදී, බැංකුව විසින් ඉදිරි මාස 12 තුළ යම්කිසි පැහැර හැරීමේ සිද්ධියක් සිදුවිය හැකිදැයි ඇස්තමේන්තු කරයි. තවද අදියර 2, අදියර 3 සහ මිලදී ගත් හෝ ණය හානිකරණය ආරම්භ වී ඇති මූල්‍ය වත්කම් සඳහා පැහැර හරින අවස්ථාවේ නිරාවරණ අගය ගණනය කිරීමේදී, අදාළ උපකරණයේ ගිවිසුම් ගත කාලය තුළ කවර හෝ අවස්ථාවකදී පැහැර හැරීමේ අවස්ථාවක් තිබේදැයි සළකා බලනු ලබයි.

විවිධ අවස්ථාවලදී වියහැකි නිරාවරණ ප්‍රතිඵල වල පරාසය ආදේශනය කිරීමෙන් බැංකුව පැහැරහරින ලද අවස්ථාවේ නිරාවරණ අගය තීරණය කරයි. ගණනය කරන ලද පැහැර හැරීමේ සම්භාවිතාවයන් පසුව පැහැර හරින අවස්ථාවේ ඇති නිරාවණ අගයන් සමඟ ගලපයි.

පැහැර හැරීමේ අලාභය

අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමට අදාළ වන මූලික ලක්ෂණ මත පදනම්ව බැංකුව විසින් ණය කලඹ සමජාතීය කොටස් වලට බෙදා වෙන් කර දක්වයි. අතීතයේ අලාභ මත පදනම්ව රැස් කර ගත් දත්ත මඟින් පැහැර හැරීමේ අලාභය ගණනය කරයි.

ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වීම

මූල්‍ය උපකරණයන් කලඹ ඉදිරි මාස 12 තුළ අපේක්ෂිත ණය හානියට හෝ ආයු කාලය පුරා අපේක්ෂිත ණය හානියට යටත් වේ දැයි නිගමනය කිරීම සඳහා එම උපකරණ මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී තිබේදැයි නිරතුරුව බැංකුව නිරීක්ෂණය කරනු ලබයි. ගිවිසුම්ගතව ගෙවීමට නියමිත දින සිට දින 30 කට වඩා කල්පසු වී ඇති පහසුකම් වල ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම්, ණය අවදානම් දර්ශකයට මාරු කිරීම වැනි ගුණාත්මක දර්ශකයන් වෙනස්වීම ද ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමක් ලෙස බැංකුව තීරණය කරයි. ණය ශ්‍රේණීන් වෙනස්වීම නොසලකා හැරියද ගිවිසුම්ගතව ගෙවීමට නියමිත දිනට වඩා දින 30 ක් කල්පසු වී ඇති පහසුකම් වල ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

සාමූහික වශයෙන් අපේක්ෂිත ණය අලාභය ගණනය කරනු ලබන සමාන වත්කම් කාණ්ඩ වල අපේක්ෂිත ණය හානිය ගණනය කිරීමේදී, ආරම්භක හඳුනා ගැනීමේ සිට ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී තිබේදැයි ගණනය කිරීම සඳහාද ඉහත මූලධර්ම යොදාගනු ලබයි.

සාමූහික/කේවල පදනම මත මැනීම සිදුකරන මූල්‍ය උපකරණ කාණ්ඩගත කිරීම

පහත සඳහන් නිර්ණායකයන් සලකා බලා අපේක්ෂිත ණය අලාභය සාමූහික හෝ කේවල පදනම මත මැනීම සිදුකරයි.

කේවල වශයෙන් ප්‍රමාණාත්මක ලෙස සැළකෙන සීමාව ඉක්මවූ ආයතනික, සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපාර වල ණය සඳහා බැංකුව විසින් කේවල පදනම මත අපේක්ෂිත ණය හානිය ගණනය කරයි. ඉහත අවස්ථාවන් හැර අනෙකුත් සියළුම ණය සඳහා සහ කේවල පදනම මත අපේක්ෂිත ණය හානිය ගණනයට යටත්නොවූ ණයවල අපේක්ෂිත ණය හානිය ගණනය කරනු ලබන්නේ සාමූහික පදනම මත වේ. ණය උපකරණ වල බාහිර හෝ අභ්‍යන්තර ලක්ෂණ එනම් උපකරණ වල ස්වභාවය, ව්‍යාපාර අංශය සහ පාරිභෝගික කාණ්ඩය යනාදි සාධක මත පදනම්ව එම උපකරණ කුඩා සමජාතීය කණ්ඩායම් වලට කාණ්ඩගත කිරීම බැංකුව විසින් සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ශ්‍රී ලංකා රජය විසින් දැනට කරගෙන යනු ලබන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමයට අමතරව, රජය සතු ව්‍යවසායන්ට ලංකා බැංකුව විසින් ලබා දී ඇති ඇතැම් සහතික කළ ණය කැබිනට් තීරණයක් අනුව ක්‍රියාත්මක වන පරිදි මුදල් අමාත්‍යාංශය යටතේ ඇති රජයේ ශේෂ පත්‍රයට 2022 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි මාරු කරන ලදී. අයවිය යුතු එවැනි ණය සම්බන්ධයෙන් දර්ශක ණය සේවා කොන්දේසි පිළිබඳව එකඟ වීමට බැංකුව මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් සිටී. මෙම ණය සම්බන්ධයෙන් දර්ශක ණය සේවා නියමයන් සඳහා වන එකඟතා අවසන් වන තෙක් මුදල් අමාත්‍යාංශය විසින් අතුරු ණය සේවා අනුපාතයකට එකඟ වී ඇත.

කෙසේ වෙතත්, වාර්තා කරන දිනය වන විට බැංකුව සහ මුදල් අමාත්‍යාංශය අතර සාකච්ඡා තවමත් සිදුවෙමින් පවතින බැවින්, එම ප්‍රතිව්‍යුහගත කිරීමේ බලපෑම තවමත් අවසන් කර නොමැති අතර කොන්දේසි එකඟ වූ පසු දර්ශක ණය සේවා කොන්දේසි සඳහා බැංකුව ගිණුම් ගත කරනු ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනය වන විට ලබා ගත හැකි හොඳම තොරතුරු මත පදනම්ව, දර්ශක නියමයන් මත පදනම් විය හැකි ප්‍රතිව්‍යුහගත කිරීම් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුකූලව බැංකුවේ ආදායම් ප්‍රකාශනයට හෝ ශුද්ධ වත්කම්වලට ප්‍රමාණාත්මක අහිතකර බලපෑමක් ඇති කළ නොහැකි බව කළමනාකාරිත්වයේ අදහසයි.

28.1 ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
දළ ණය සහ අත්තිකාරම්		2,457,771,739	2,584,778,967	2,491,980,528	2,617,905,189
අදියර 1		1,807,745,963	1,986,928,070	1,830,121,287	2,002,738,770
අදියර 2		338,162,831	273,220,831	347,245,385	277,121,666
අදියර 3		311,862,945	324,630,066	314,613,856	338,044,753
අඩුකළා: සමුච්චිත හානිකරණය		248,709,815	259,184,638	251,369,300	261,926,856
අදියර 1	28.2	31,412,474	39,710,949	32,622,298	39,904,019
අදියර 2	28.2	28,817,796	25,419,553	29,929,889	25,564,731
අදියර 3	28.2	188,479,545	194,054,136	188,817,113	196,458,106
ශුද්ධ ණය සහ අත්තිකාරම්		2,209,061,924	2,325,594,329	2,240,611,228	2,355,978,333

28.1.1 දළ ණය සහ අත්තිකාරම් විශ්ලේෂණය - ණය නිෂ්පාදන වර්ගය අනුව

		බැංකුව					
දෙසැම්බර් 31 දිනට		2023			2022		
	සටහන	දේශීය මුදලින් දුන් ණය රු. '000	විදේශීය මුදලින් දුන් ණය රු. '000	එකතුව රු. '000	දේශීය මුදලින් දුන් ණය රු. '000	විදේශීය මුදලින් දුන් ණය රු. '000	එකතුව රු. '000
කාලීන ණය		712,215,257	704,469,083	1,416,684,340	746,658,700	788,273,917	1,534,932,617
නිවාස ණය		71,231,393	32,858	71,264,251	78,125,880	46,205	78,172,085
වෙළඳ මූල්‍යනය		51,417,495	70,443,434	121,860,929	39,846,557	73,328,306	113,174,863
පුද්ගල ණය		360,375,320	-	360,375,320	413,928,850	-	413,928,850
අයිරා පහසුකම්		130,674,115	68,855,646	199,529,761	146,415,234	67,382,222	213,797,456
ණය කාඩ්පත්		9,624,273	-	9,624,273	7,483,788	-	7,483,788
ලැබිය යුතු කල්බදු වාරික	28.4	15,995,619	-	15,995,619	20,673,590	-	20,673,590
උකස් ණය		163,247,841	-	163,247,841	116,879,501	-	116,879,501
අත්පත් කරගත් දේපළ		3,891,415	8,149	3,899,564	3,325,096	8,624	3,333,720
සේවක මණ්ඩල ණය		23,342,463	218,051	23,560,514	26,186,008	32,490	26,218,498
වෙනත් ණය		61,411,227	10,318,100	71,729,327	47,861,160	8,322,839	56,183,999
දළ ණය සහ අත්තිකාරම්		1,603,426,418	854,345,321	2,457,771,739	1,647,384,364	937,394,603	2,584,778,967

දෙසැම්බර් 31 දිනට		සමූහය					
		2023			2022		
	සටහන	දේශීය මුදලින් දුන් ණය	විදේශීය මුදලින් දුන් ණය	එකතුව	දේශීය මුදලින් දුන් ණය	විදේශීය මුදලින් දුන් ණය	එකතුව
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
කාලීන ණය		718,675,881	718,143,803	1,436,819,684	755,678,340	795,933,677	1,551,612,017
නිවාස ණය		71,256,953	32,858	71,289,811	78,155,920	46,205	78,202,125
වෙළඳ මූල්‍යනය		51,641,847	70,443,434	122,085,281	40,077,612	73,328,306	113,405,918
පුද්ගල ණය		361,359,304	-	361,359,304	415,315,733	-	415,315,733
අයිරා පහසුකම්		130,597,463	69,150,463	199,747,926	146,223,589	67,622,802	213,846,391
ණය කාඩ්පත්		9,624,273	-	9,624,273	7,483,788	-	7,483,788
ලැබිය යුතු කල්බදු වාරික	28.4	24,381,339	-	24,381,339	29,509,308	-	29,509,308
උකස් ණය		167,225,944	-	167,225,944	122,545,263	-	122,545,263
අත්පත් කරගත් දේපළ		3,891,415	8,149	3,899,564	3,325,096	8,624	3,333,720
සේවක මණ්ඩල ණය		23,580,654	237,421	23,818,075	26,420,658	46,269	26,466,927
වෙනත් ණය		61,411,227	10,318,100	71,729,327	47,861,160	8,322,839	56,183,999
දළ ණය සහ අත්තිකාරම්		1,623,646,300	868,334,228	2,491,980,528	1,672,596,467	945,308,722	2,617,905,189

28.1.2 දළ ණය සහ අත්තිකාරම් විශ්ලේෂණය - මුදල් ඒකකය අනුව

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2023	2022	2023	2022
	රු. '000	රු. '000	රු. '000	රු. '000
ශ්‍රී ලංකා රුපියල්	1,603,426,418	1,647,384,364	1,623,646,300	1,672,596,467
ඇමරිකානු ඩොලර්	806,985,112	888,791,091	806,985,112	888,791,091
බ්‍රිතාන්‍ය පවුම්	1,076,789	1,110,713	15,065,696	9,024,833
මාලදිවයින් රුෆියා	23,941,822	27,629,480	23,941,822	27,629,480
යූරෝ	1,367,590	2,641,218	1,367,590	2,641,218
ඉන්දියානු රුපියල්	18,172,969	14,344,266	18,172,969	14,344,266
සීෂෙල්ස් රුපියල්	2,796,005	2,871,299	2,796,005	2,871,299
වෙනත් මුදල් වර්ග	5,034	6,536	5,034	6,535
දළ ණය සහ අත්තිකාරම්	2,457,771,739	2,584,778,967	2,491,980,528	2,617,905,189

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

28.2 වර්ෂය තුළ හානිකරණය පිළිබඳ සංචලනයන්

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
අදියර 1 හානිකරණ සංචලනයන්				
ජනවාරි 1 දිනට ශේෂය	39,710,949	24,417,936	39,904,019	24,541,662
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	(7,670,654)	15,135,491	(7,817,368)	15,204,835
වර්ෂය තුළ අය කර ගැනීම්	-	-	-	-
විදේශ මුදල් ණය හානිකරණය මත විනිමය අනුපාත වෙනස	(627,821)	347,791	(627,821)	347,791
වර්ෂය තුළදී කපාහල අගය	-	-	-	-
අනෙකුත් සංචලනයන්	-	(190,269)	1,163,468	(190,269)
දෙසැම්බර් 31 දිනට ශේෂය	31,412,474	39,710,949	32,622,298	39,904,019

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
අදියර 2 හානිකරණ සංචලනයන්				
ජනවාරි 1 දිනට ශේෂය	25,419,553	15,122,165	25,564,731	15,247,177
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	6,263,585	10,344,926	6,257,962	10,365,092
වර්ෂය තුළ අය කර ගැනීම්	-	-	-	-
විදේශ මුදල් ණය හානිකරණය මත විනිමය අනුපාත වෙනස	(2,865,342)	687,473	(2,865,342)	687,473
වර්ෂය තුළදී කපාහල අගය	-	-	-	-
අනෙකුත් සංචලනයන්	-	(735,011)	972,538	(735,011)
දෙසැම්බර් 31 දිනට ශේෂය	28,817,796	25,419,553	29,929,889	25,564,731

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
අදියර 3 හානිකරණ සංචලනයන්				
ජනවාරි 1 දිනට ශේෂය	194,054,136	123,365,781	196,458,106	126,448,164
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	16,465,658	49,602,382	16,460,896	49,496,367
වර්ෂය තුළ අය කර ගැනීම්	(17,722,433)	(4,322,117)	(17,722,433)	(4,322,117)
විදේශ මුදල් ණය හානිකරණය මත විනිමය අනුපාත වෙනස	(4,317,816)	24,289,327	(4,317,816)	24,289,327
වර්ෂය තුළදී කපාහල අගය	(86,065)	(18,554)	(86,065)	(18,554)
අනෙකුත් සංචලනයන්	86,065	1,137,317	(1,975,575)	564,919
දෙසැම්බර් 31 දිනට ශේෂය	188,479,545	194,054,136	188,817,113	196,458,106

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
මුළු හානිකරණයේ සංචලනයන්				
ජනවාරි 1 දිනට ශේෂය	259,184,638	162,905,882	261,926,856	166,237,003
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	15,058,589	75,082,799	14,901,490	75,066,294
වර්ෂය තුළ අය කර ගැනීම්	(17,722,433)	(4,322,117)	(17,722,433)	(4,322,117)
විදේශ මුදල් ණය හානිකරණය මත විනිමය අනුපාත වෙනස	(7,810,979)	25,324,591	(7,810,979)	25,324,591
වර්ෂය තුළදී කපාහල අගය	(86,065)	(18,554)	(86,065)	(18,554)
අනෙකුත් සංචලනයන්	86,065	212,037	160,431	(360,361)
දෙසැම්බර් 31 දිනට ශේෂය	248,709,815	259,184,638	251,369,300	261,926,856

28.3 හානිකරණ ප්‍රතිපාදන අගය කිරීම සඳහා භාවිත කල සංවේදී සාධක

		හානිකරණ ප්‍රතිපාදන සඳහා සංවේදී සාධකවල බලපෑම	
	සංවේදිතාව	2023 රු. '000	2022 රු. '000
පැහැර හැරීමේ අලාභයේ වෙනස් වීම (LGD)	1%	3,063,592	5,600,134
	-1%	(3,063,592)	(5,600,134)
ආර්ථික සාධක ගැලපුම් වල වෙනස් වීම (EFA)	හානිදායි සිද්ධිය 5% කින් පහළ දැමීම	1,086,540	402,585
	හානිදායි සිද්ධිය 5% කින් ඉහළ නැංවීම	(1,086,540)	(402,585)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

28.4 ලැබිය යුතු කල්බදු වාරික

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නීතිමය අයිතිය හැර හිමිකාරිත්වය සමඟ පැන නඟින සියළු අවදානම් සහ ප්‍රතිලාභ ක්‍රමානුකූලව ගනුදෙනුකරුවන්ට හුවමාරුවන කල්බදු මූල්‍ය කල්බදු යටතේ වර්ගීකරණය කරනු ලබයි. මූල්‍ය කල්බදු යටතේ අයවිය යුතු මුදල් ලැබිය යුතු කල්බදු යටතේ වර්ගීකරණය කරන අතරම නොඉපයූ මූල්‍ය ආදායම් සහ හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන අඩුකිරීමෙන් පසු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ණය යටතේ ඉදිරිපත් කරනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ලැබිය යුතු දළ කල්බදු වාරික				
වසරකට අඩු	9,662,055	12,339,150	10,042,150	15,170,120
වසර එකක සිට වසර පහ දක්වා	10,693,168	14,505,542	18,531,230	18,531,230
වසර පහට වැඩි	83,228	53,441	333,621	333,620
	20,438,451	26,898,133	28,907,001	34,034,970
අඩු කළා: නොඉපයූ මූල්‍ය ආදායම්	4,442,832	6,224,543	4,525,662	4,525,662
ලැබිය යුතු දළ කල්බදු වාරික	15,995,619	20,673,590	24,381,339	29,509,308
අඩු කළා: හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන	1,021,043	777,902	2,145,118	1,901,977
ලැබිය යුතු ශුද්ධ කල්බදු වාරික	14,974,576	19,895,688	22,236,221	27,607,331

29 ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - සටහන 4.4.8 දක්වා ඇති පරිදි ණය උපකරණ සාධාරණ අගයට මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව ඉන්පසු කාලච්ඡේද වලදී සඵල පොළී අනුපාතිකය මත ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කල පිරිවැයට, ණය හානිකරණය සඳහා වන වෙන්කිරීම් ගලපා මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනේ. ක්‍රමක්ෂය කල පිරිවැය ගණනය කිරීමේදී අත්පත් කර ගැනීමේදී පැන නගින අව මිල හෝ අධි මිලත් සඵල පොළී අනුපාතිකයේ සැලකිය යුතු කොටසක් බවට පත්වන ගාස්තු සහ පිරිවැයත් සැලකිල්ලට ගනු ලැබේ. ක්‍රමක්ෂය, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ "පොළී ආදායම" (සටහන 8.1) යටතේ ඇතුළත් වන අතර, හානිකරණය මඟින් පැන නගින අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ "ණය හානි සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය) කිරීම" (සටහන 14) යටතේ දක්වා ඇත.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
රාජ්‍ය සුරැකුම්පත්					
භාණ්ඩාගාර බිල්පත්		312,941,117	30,163,644	314,299,888	34,264,372
භාණ්ඩාගාර බැඳුම්කර		1,260,787,465	1,236,801,214	1,264,752,387	1,238,665,103
ශ්‍රී ලංකා ස්වේරී බැඳුම්කර	29.4	87,344,675	92,256,000	87,669,056	92,609,945
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	29.5	-	193,631,101	-	193,631,101
ශ්‍රී ලංකා රාජ්‍ය ප්‍රතිව්‍යුහගතකරණ බැඳුම්කර	29.6	-	8,968,474	-	8,968,474
ණයකර	29.7	2,132,036	3,427,632	2,159,648	3,427,632
භාරකාර සහතිකපත්	29.8	-	-	574,675	-
රාජ්‍ය සුරැකුම්පත් - මාලදිවයින		38,752,030	44,463,297	38,752,030	44,463,297
වෙනත් ආයෝජන		-	-	228,946	375,597
ක්‍රමක්ෂය පිරිවැයට දළ මූල්‍ය වත්කම් ණය සහ වෙනත් උපකරණ		1,701,957,323	1,609,711,362	1,708,436,630	1,616,405,521
අඩුකළා: සමුච්චිත හානිකරණය	29.3	48,228,920	53,814,055	48,423,652	54,031,842
ක්‍රමක්ෂය පිරිවැයට ශුද්ධ මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ		1,653,728,403	1,555,897,307	1,660,012,978	1,562,373,679

29.1 ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් විශ්ලේෂණය - ණය හා වෙනත් උපකරණ මුදල් ඒකකය අනුව

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ශ්‍රී ලංකා රුපියල්	1,575,860,618	1,279,360,964	1,582,015,544	1,285,701,178
ඇමරිකානු ඩොලර්	87,344,675	285,887,101	87,669,056	286,241,046
මාලදිවයින් රුෆියා	38,752,030	44,463,297	38,752,030	44,463,297
එකතුව	1,701,957,323	1,609,711,362	1,708,436,630	1,616,405,521

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

29.2 ක්‍රමක්ෂය පිරිවැයට වාර්ථා කර ඇති මූල්‍ය වත්කම් විශ්ලේෂණය - ණය අවදානම සඳහා නිරාවරණය පදනම්ව ණය සහ වෙනත් උපකරණ

බැංකුව

දෙසැම්බර් 31 දිනට	2023				2022
	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000	එකතුව රු. '000
ශ්‍රී ලංකා ස්වෛර්ී බැඳුම්කර	-	87,344,675	-	87,344,675	92,256,000
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	-	-	-	-	193,631,101
ණයකර	2,103,722	-	28,314	2,132,036	3,427,632
රාජ්‍ය සුරැකුම්පත් - මාලදිවයින	38,752,030	-	-	38,752,030	44,463,297
	40,855,752	87,344,675	28,314	128,228,741	333,778,030
අඩුකළා: සමුච්චිත හානිකරණය	3,047	48,197,559	28,314	48,228,920	53,814,055
එකතුව	40,852,705	39,147,116	-	79,999,821	279,963,975

සමූහය

දෙසැම්බර් 31 දිනට	2023				2022
	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000	එකතුව රු. '000
ශ්‍රී ලංකා ස්වෛර්ී බැඳුම්කර	-	87,669,056	-	87,669,056	92,609,945
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	-	-	-	-	193,631,101
ණයකර	2,131,334	-	28,314	2,159,648	3,427,632
භාරකාර සහතිකපත්	574,675	-	-	574,675	-
රාජ්‍ය සුරැකුම්පත් - මාලදිවයින	38,752,030	-	-	38,752,030	44,463,297
වෙනත් ආයෝජන	228,946	-	-	228,946	375,597
	41,686,985	87,669,056	28,314	129,384,355	334,507,572
අඩුකළා: සමුච්චිත හානිකරණය	220,834	48,174,504	28,314	48,423,652	54,031,842
එකතුව	41,466,151	39,494,552	-	80,960,703	280,475,730

29.3 වර්ෂය තුළ හානිකරණය පිළිබඳ සංචලනයන්

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
හානිකරණ අදියර 1 හි සංචලනය				
ජනවාරි 1 දිනට ශේෂය	323,914	13,770,767	541,701	13,829,176
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	(320,867)	(13,446,853)	(320,867)	(13,287,475)
විනිමය අනුපාත ගැළපුම්	-	-	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	3,047	323,914	220,834	541,701

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
හානිකරණ අදියර 2 හි සංචලනය				
ජනවාරි 1 දිනට ශේෂය	53,461,827	-	53,461,827	-
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	(1,684,832)	29,510,499	(1,684,832)	29,510,499
විනිමය අනුපාත ගැළපුම්	(3,579,436)	23,951,328	(3,602,491)	23,951,328
දෙසැම්බර් 31 දිනට ශේෂය	48,197,559	53,461,827	48,174,504	53,461,827

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
හානිකරණ අදියර 3 හි සංචලනය				
ජනවාරි 1 දිනට ශේෂය	28,314	28,314	28,314	28,314
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	-	-	-	-
විනිමය අනුපාත ගැළපුම්	-	-	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	28,314	28,314	28,314	28,314

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
මුළු හානිකරණයේ සංචලනය				
ජනවාරි 1 දිනට ශේෂය	53,814,055	13,799,081	54,031,842	13,857,490
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	(2,005,699)	16,063,646	(2,005,699)	16,223,024
විනිමය අනුපාත ගැළපුම්	(3,579,436)	23,951,328	(3,602,491)	23,951,328
දෙසැම්බර් 31 දිනට ශේෂය	48,228,920	53,814,055	48,423,652	54,031,842

ශ්‍රී ලංකා ස්වෛරී බැඳුම්කර (ISB) වල අපේක්ෂිත ණය අලාභය (ECL) සඳහා අදියර වර්ගීකරණය කිරීම සහ ප්‍රතිපාදන වෙන්කිරීම

බලපත්‍රලාභී බැංකුවල, ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම සඳහා වන බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2021 අංක 14 දරන බැංකු පනතේ විධානයන්ට අනුව ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (SLISB) අදියර 2 යටතේ වර්ගීකරණය කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (SLISB) වල හානිකරණ ප්‍රතිපාදන ඇස්තමේන්තු කරමින් දැනට පවතින බාහිර ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමයේ ඇඟවුම් නියාමයන් ඇතුළුව පවතින නවතම තොරතුරු බැංකුව විසින් සලකා බලන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙනුවට ලබාදුන් ශ්‍රී ලංකා රුපියල් බැඳුම්කර වල පළමු දින අලාභය

2023 ජූලි මාසයේදී ශ්‍රී ලංකා රජය විසින් සිදු කරන ලද දේශීය ණය ප්‍රතිඝටනකරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙනුවට ලබාදුන් ශ්‍රී ලංකා රුපියල් බැඳුම්කර සම්බන්ධව පළමු දිනයේ අලාභය, 2023 දෙසැම්බර් 31 දිනට සමාන බැඳුම්කර හා සංසන්ධනාත්මකව සලකා බලා ඇස්තමේන්තු කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

29.4 ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර (අ.ඩො. බැඳුම්කර)

දෙසැම්බර් 31 දිනට		බැංකුව			
		2023		2022	
	පරිණත වන දිනය	ආයෝජන මුදල අ.ඩො. '000	ආයෝජන පිරිවැය රු. '000	ආයෝජන මුදල අ.ඩො. '000	ආයෝජන පිරිවැය රු. '000
ස්ථාවර පොළී අනුපාතික					
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 5.875%	අ/නො*	26,856	8,699,284	26,856	9,751,854
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 5.75%	අ/නො**	20,519	6,646,582	20,519	7,450,631
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 6.85%	14.03.2024	11,656	3,775,650	11,656	4,232,374
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 6.35%	28.06.2024	2,014	652,382	2,014	731,412
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 6.85%	03.11.2025	49,101	15,904,958	49,101	17,829,182
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 6.825%	18.07.2026	22,600	7,320,667	22,600	8,206,193
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 6.20%	11.05.2027	23,565	7,633,253	23,565	8,556,675
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 6.75%	18.04.2028	33,077	10,714,411	33,077	12,010,705
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 7.85%	14.03.2029	32,352	10,479,567	32,352	11,747,322
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කර - ස්ථාවර පොළී 7.55%	28.03.2030	4,168	1,350,112	4,168	1,513,584
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කරවල එකතුව		225,908	73,176,866	225,908	82,029,932
පොළී මත ක්‍රමක්ෂය ගැලපීම්		43,738	14,167,809	28,162	10,226,068
ශ්‍රී ලංකා ස්ථෛර් බැඳුම්කරවල එකතුව		269,646	87,344,675	254,070	92,256,000

* නියමිත පරිණත වන දිනය 2022 ජූලි 25 වන නමුත් තවමත් ගෙවා අවසන් කර නොමැත.

** නියමිත පරිණත වන දිනය 2023 අප්‍රේල් 18 වන නමුත් තවමත් ගෙවා අවසන් කර නොමැත.

සටහන: 2023 අ.ඩො./රුපියල් 323.9233 සහ 2022 අ.ඩො./රුපියල් 363.1100

29.5 ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (අ.ඩො. බැඳුම්කර)

දෙසැම්බර් 31 දිනට		බැංකුව/සමූහය					
		2023			2022		
	පරිණත වන දිනය	ආයෝජන මුදල අ.ඩො. '000	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ආයෝජන මුදල අ.ඩො. '000	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000
ස්ථාවර පොළී අනුපාතික							
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර - ස්ථාවර පොළී 5.75%	01.05.2023	-	-	-	5,000	1,815,550	1,832,881
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර - ස්ථාවර පොළී 7.75%	01.05.2023	-	-	-	150,000	54,466,500	55,165,043
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර - ස්ථාවර පොළී 7.95%	01.05.2024	-	-	-	200,000	72,622,000	73,577,120
විචල්‍ය පොළී අනුපාතික							
මාස 6 LIBOR + 370 මූලික ඒකක පදනම	22.01.2023	-	-	-	5,000	1,815,550	1,873,026
මාස 6 LIBOR + 375 මූලික ඒකක පදනම	22.01.2023	-	-	-	5,000	1,815,550	1,872,621
මාස 6 LIBOR + 390 මූලික ඒකක පදනම	16.03.2023	-	-	-	5,000	1,815,550	1,857,695
මාස 6 LIBOR + 395 මූලික ඒකක පදනම	16.03.2023	-	-	-	5,000	1,815,550	1,857,432
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල එකතුව		-	-	-	375,000	136,166,250	138,035,818
පරිණත වී ඇති නමුත් 2022/12/31 වන විට ගෙවා අවසන් කර නොමැති		-	-	-	130,000	47,204,300	55,595,283
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල එකතුව		-	-	-	505,000	183,370,550	193,631,101

සමූහය

2023		2022	
ආයෝජන මුදල ඇ.ඩො. '000	ආයෝජන පිරිවැය රු. '000	ආයෝජන මුදල ඇ.ඩො. '000	ආයෝජන පිරිවැය රු. '000
26,856	8,699,284	26,856	9,751,854
21,494	6,962,407	21,494	7,804,578
11,656	3,775,650	11,656	4,232,374
2,014	652,382	2,014	731,412
49,101	15,904,958	49,101	17,829,182
22,600	7,320,667	22,600	8,206,193
23,565	7,633,253	23,565	8,556,675
33,077	10,714,411	33,077	12,010,705
32,352	10,479,567	32,352	11,747,322
4,168	1,350,112	4,168	1,513,584
226,883	73,492,691	226,883	82,383,879
43,764	14,176,365	28,162	10,226,066
270,647	87,669,056	255,045	92,609,945

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

29.6 ශ්‍රී ලංකා රාජ්‍ය ප්‍රතිව්‍යුහගතකරණ බැඳුම්කර

				බැංකුව/සමූහය			
දෙසැම්බර් 31 දිනට				2023		2022	
	අනුපාතය %	නිකුත් කළ දිනය	පරිණත වන දිනය	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000
නැවත ප්‍රාග්ධනීකරණය කිරීමේ අරමුණු සඳහා	12.0	24.03.1993	01.02.2023	-	-	4,780,000	5,015,714
ණය පියවීම සඳහා	12.0	24.03.1993	01.02.2023	-	-	3,767,000	3,952,760
ශ්‍රී ලංකා රාජ්‍ය ප්‍රතිව්‍යුහගතකරණ බැඳුම්කරවල එකතුව				-	-	8,547,000	8,968,474

29.7 ණයකර

			බැංකුව					
දෙසැම්බර් 31 දිනට			2023			2022		
	පරිණත වන දිනය	කූපන් අනුපාතය %	ණයකර ගණන	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ණයකර ගණන	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000
බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී	31.03.2027	15.42	500,000	50,000	51,951	500,000	50,000	51,946
ලංකා විදුලිබල මණ්ඩලය	15.04.2026	9.35	4,601,000	460,100	490,279	4,601,000	460,100	490,793
සිටිසන් ඩිවලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් පී එල් සී	27.03.2023	14.20	-	-	-	2,000,000	200,000	221,212
කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	04.03.2026	9.00	1,000,000	100,000	107,389	1,000,000	100,000	107,389
ඩී එෆ් සී සී බෑන්ක් පී එල් සී	29.03.2025	13.00	2,250,000	225,000	246,619	2,250,000	225,000	246,797
හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී	01.11.2023	13.00	-	-	-	193,300	19,330	19,722
හේලීස් පී එල් සී	31.07.2023	12.50	-	-	-	2,500,000	250,000	263,128
හේලීස් පී එල් සී	26.08.2024	7.82	1,000,000	100,000	106,041	1,000,000	100,000	103,625
හේලීස් පී එල් සී	26.08.2024	13.00	1,811,500	181,150	189,303	1,811,500	181,150	190,575
කොටගල ප්ලාන්ටේෂන්ස් පී එල් සී	31.08.2025	7.50	අ/නො	6,086	5,613	අ/නො	9,129	9,050
කොටගල ප්ලාන්ටේෂන්ස් පී එල් සී	31.08.2025	7.50	අ/නො	6,639	6,825	අ/නො	9,959	10,252
ලංකා ඔරික්ස් ලීසිං කම්පැනි පී එල් සී	27.09.2024	15.00	1,250,000	125,000	130,189	1,250,000	125,000	130,657
ලංකා ඔරික්ස් ලීසිං කම්පැනි පී එල් සී	24.02.2026	10.25	1,300,000	130,000	137,444	1,300,000	130,000	139,972
එම් ටී ඩී වෝකර්ස් පී එල් සී	අ/නො	11.75	254,784	25,478	28,314	254,784	25,478	28,314
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	18.04.2023	12.80	-	-	-	2,500,000	250,000	272,125
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	05.08.2026	9.00	999,915	99,992	119,559	999,915	99,992	112,615
සම්පත් බෑන්ක් පී එල් සී	20.03.2023	12.50	-	-	-	2,500,000	250,000	258,703
සෙලාන් බෑන්ක් පී එල් සී	29.03.2023	12.85	-	-	-	2,500,000	250,000	258,244
ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී	19.04.2028	12.75	5,000,000	500,000	512,510	5,000,000	500,000	512,513
ණයකරවල එකතුව				2,009,445	2,132,036		3,235,138	3,427,632

දෙසැම්බර් 31 දිනට	සමූහය							
			2023			2022		
	පරිණත වන දිනය	කූපන් අනුපාතය %	ණයකර ගණන	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ණයකර ගණන	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000
බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී	31.03.2027	15.42	500,000	50,000	51,951	500,000	50,000	51,946
ලංකා විදුලිබල මණ්ඩලය	15.04.2026	9.35	4,601,000	460,100	490,279	4,601,000	460,100	490,793
සිටිසන් ඩිවලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් පී එල් සී	27.03.2023	14.20	-	-	-	2,000,000	200,000	221,212
කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	04.03.2026	9.00	1,000,000	100,000	107,389	1,000,000	100,000	107,389
ඩී එෆ් සී සී බෑන්ක් පී එල් සී	29.03.2025	13.00	2,250,000	225,000	246,619	2,250,000	225,000	246,797
හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී	01.11.2023	13.00	-	-	-	193,300	19,330	19,722
හේලීස් පී එල් සී	31.07.2023	12.50	-	-	-	2,500,000	250,000	263,128
හේලීස් පී එල් සී	26.08.2024	7.82	1,000,000	100,000	106,041	1,000,000	100,000	103,625
හේලීස් පී එල් සී	26.08.2024	13.00	1,811,500	181,150	189,303	1,811,500	181,150	190,575
කොටගල ප්ලාන්ටේෂන්ස් පී එල් සී	31.08.2025	7.50	අ/නො	6,086	5,613	අ/නො	9,129	9,050
කොටගල ප්ලාන්ටේෂන්ස් පී එල් සී	31.08.2025	7.50	අ/නො	6,639	6,825	අ/නො	9,959	10,252
ලංකා ඔරික්ස් ලීසිං කම්පැනි පී එල් සී	27.09.2024	15.00	1,250,000	125,000	130,189	1,250,000	125,000	130,657
ලංකා ඔරික්ස් ලීසිං කම්පැනි පී එල් සී	24.02.2026	10.25	1,300,000	130,000	137,444	1,300,000	130,000	139,972
එම් ටී ඩී වෝකර්ස් පී එල් සී	අ/නො	11.75	254,784	25,478	28,314	254,784	25,478	28,314
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	18.04.2023	12.80	-	-	-	2,500,000	250,000	272,125
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	05.08.2026	9.00	999,915	99,992	119,559	999,915	99,992	112,615
සම්පත් බෑන්ක් පී එල් සී	20.03.2023	12.50	-	-	-	2,500,000	250,000	258,703
සෙලාන් බෑන්ක් පී එල් සී	29.03.2023	12.85	-	-	-	2,500,000	250,000	258,244
සෙලාන් බෑන්ක් පී එල් සී	02.05.2023	25.00	263,800	26,380	27,612	-	-	-
ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී	19.04.2028	12.75	5,000,000	500,000	512,510	5,000,000	500,000	512,513
ණයකරවල එකතුව				2,035,825	2,159,648		3,235,138	3,427,632

29.8 භාරකාර සහතිකපත්

දෙසැම්බර් 31 දිනට	සමූහය			
	2023		2022	
	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ආයෝජන පිරිවැය රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000
කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	150,000	167,663	-	-
එල් ඕ එල් සී ෆයිනෑන්ස් පී එල් සී	350,000	407,012	-	-
මුළු භාරකාර සහතිකපත්	500,000	574,675	-	-

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

30 වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් යටතට අඩංගු වන්නේ මූලික හඳුනාගැනීමේදී විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කරන විකල්පය තෝරාගත් ස්කන්ධ උපකරණ හා ව්‍යාපාර ආකෘතියෙහි මූලික අරමුණ ලඟා කරගනු ලබන්නේ එකඟ වූ මූලික ආයෝජන හා පොළිය පමණක් වන මුදල් ප්‍රවාහයන් එකතුකර ගැනීම හා මූල්‍ය වත්කම් විකිණීමෙන් වන ණය උපකරණයන්ය.

වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන සියළු මූල්‍ය වත්කම් මූලිකව සහ පසු කාලීනව සාධාරණ අගය මත හඳුනා ගනු ලැබේ. උපලබ්ධි නොවූ ලාභ හෝ අලාභ, වෙනත් විස්තීර්ණ ආදායම් හරහා වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය මඟින් සෘජුවම ස්කන්ධයට හඳුනා ගනී. මේ යටතේ ඇති ණය උපකරණ ඉවත් කිරීමේ දී සංචිත යටතේ ඊට අදාලව පෙර හඳුනාගත් ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේදී හඳුනා ගන්නා අතර "මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(අලාභ)" යටතේ නිරූපනය වේ (සටහන 12). මේ යටතේ ඇති ස්කන්ධ උපකරණ ඉවත් කිරීමේ දී සංචිත යටතේ ඊට අදාලව පෙර හඳුනාගත් ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා නොගන්නා අතර සෘජුවම රඳවාගත් ඉපයීම් වලට මාරු කරයි. වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් මඟින් උපයනු ලබන පොළී ආදායම, "පොළී ආදායම" යටතේ (සටහන 8.1) ඉදිරිපත් කරන අතර ලාභාංශ ලැබීමේ අයිතිය තහවුරු වූ පසු, වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ලබන ලාභාංශ ලාභ අලාභ ප්‍රකාශනයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" (සටහන 13) යටතේ හඳුනා ගනී.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්					
භාණ්ඩාගාර බිල්පත්		27,551,288	-	27,551,288	-
භාණ්ඩාගාර බැඳුම්කර		12,020,034	326,563	12,106,493	326,563
රාජ්‍ය සුරැකුම්පත් - ඉන්දියාව		2,866,609	3,034,704	2,866,609	3,034,704
මිල ප්‍රකාශිත ස්කන්ධයන්	30.2	2,949,810	1,543,243	5,528,440	3,601,623
මිල ප්‍රකාශ නොකළ ස්කන්ධයන්	30.3	4,146,257	3,786,292	4,146,855	3,787,154
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මුළු මූල්‍ය වත්කම්		49,533,998	8,690,802	52,199,685	10,750,044

30.1 මුදල් ඒකකය අනුව

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ශ්‍රී ලංකා රුපියල්	42,756,145	2,104,819	45,421,832	4,164,061
ඇමරිකානු ඩොලර්	3,851,891	3,487,263	3,851,891	3,487,263
යුරෝ	59,353	64,016	59,353	64,016
ඉන්දියානු රුපියල්	2,866,609	3,034,704	2,866,609	3,034,704
එකතුව	49,533,998	8,690,802	52,199,685	10,750,044

30.2 මිල ප්‍රකාශිත ස්කන්ධයන්

දෙසැම්බර් 31 දිනට	2023			2022		
	සාමාන්‍ය කොටස් ගණන	ආයෝජන පිරිවැය රු. '000	වෙළඳපළ වටිනාකම රු. '000	සාමාන්‍ය කොටස් ගණන	ආයෝජන පිරිවැය රු. '000	වෙළඳපළ වටිනාකම රු. '000
බැංකුව						
නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී එල් සී	31,749,539	1,928,451	2,063,720	30,210,035	1,859,497	966,721
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	14,803,129	240,815	158,393	14,803,129	240,815	74,016
සෙලාන් බෑන්ක් පී එල් සී	16,690,292	654,921	727,697	15,902,140	627,887	502,506
මුළු මිල ප්‍රකාශිත ස්කන්ධයන්		2,824,187	2,949,810		2,728,199	1,543,243
සමූහය						
ආසිරි හොස්පිටල්ස් හෝල්ඩිංස් පී එල් සී	30	30	1	30	30	1
සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පී එල් සී	26	26	64	26	26	58
හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී	18	18	3	18	18	2
එල් වී එල් එනර්ජි ෆන්ඩ් පී එල් සී	2,500,000	20,000	13,750	2,500,000	20,000	20,000
නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී එල් සී	31,749,539	1,928,451	2,063,720	30,210,035	1,859,497	966,721
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	14,803,129	240,815	158,393	14,803,129	240,815	74,016
සෙලාන් බෑන්ක් පී එල් සී	16,690,292	654,921	727,697	15,902,140	627,887	502,506
ලංකා හොස්පිටල් කෝපරේෂන් පී එල් සී	21,329,000	213,290	2,564,812	21,329,000	213,290	2,038,319
මුළු මිල ප්‍රකාශිත ස්කන්ධයන්		3,057,551	5,528,440		2,961,563	3,601,623

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

30.3 මිල ප්‍රකාශ නොකල ස්කන්ධයන්

දෙසැම්බර් 31 දිනට		2023			2022		
	සටහන	සාමාන්‍ය කොටස් ගණන	ආයෝජන පිරිවැය රු. '000	වෙළඳපළ වටිනාකම රු. '000	සාමාන්‍ය කොටස් ගණන	ආයෝජන පිරිවැය රු. '000	වෙළඳපළ වටිනාකම රු. '000
බැංකුව							
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය		46,600	43,645	43,645	46,600	43,645	43,645
සී/ස ෆිච් රේටින්ස් ලංකා සමාගම		62,500	625	625	62,500	625	625
සී/ස ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම		2,113,861	23,443	23,443	2,113,861	23,443	23,443
සී/ස ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ සමාගම		500,000	5,000	5,000	500,000	5,000	5,000
මාස්ටර්කාඩ් ඉන්කෝපරේටඩ්		17,200	-	2,378,799	17,200	-	2,171,745
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව		16,448,448	162,300	162,300	16,448,448	162,300	162,300
වීසා ඉන්කෝපරේටඩ්		17,438	-	1,473,092	17,438	-	1,315,518
ස්විෆ්ට්		29	64,016	59,353	29	64,016	64,016
			299,029	4,146,257		299,029	3,786,292
සාධාරණ අගයට ගැලපුම්			3,847,228			3,487,263	
අඩුකලා - හානිකරණය සඳහා ප්‍රතිපාදන	30.4		-			-	
මුළු මිල ප්‍රකාශ නොකළ ස්කන්ධයන්			4,146,257	4,146,257		3,786,292	3,786,292
සමූහය							
සී/ස සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට් සමාගම		500,000	5,000	-	500,000	5,000	-
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය		47,140	43,699	43,699	47,140	43,699	43,699
සී/ස ෆිච් රේටින්ස් ලංකා සමාගම		62,500	625	625	62,500	625	625
සී/ස ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම		2,113,861	23,443	23,443	2,113,861	23,443	23,443
සී/ස ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ සමාගම		500,000	5,000	5,000	500,000	5,000	5,000
මාස්ටර්කාඩ් ඉන්කෝපරේටඩ්		17,200	-	2,378,799	17,200	-	2,171,745
සී/ස මෙගා කන්ටේනර්ස් සමාගම		1,000,000	10,000	-	1,000,000	10,000	-
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව		16,448,448	162,300	162,300	16,448,448	162,300	162,300
සී/ස රන්වන් ඉන්ඩස්ට්‍රීස් (පෞද්ගලික) සමාගම		165,900	3,600	-	165,790	3,600	-
සී/ස යූ බී ෆයිනෑන්ස් සමාගම		2,506,562	17,546	544	2,506,562	17,546	808
වීසා ඉන්කෝපරේටඩ්		17,438	-	1,473,092	17,438	-	1,315,518
ස්විෆ්ට්		29	64,016	59,353	29	64,016	64,016
			335,229	4,146,855		335,229	3,787,154
සාධාරණ අගයට ගැලපුම්			3,847,228			3,472,817	
අඩුකලා - හානිකරණය සඳහා ප්‍රතිපාදන	30.4		35,602			20,892	
මුළු මිල ප්‍රකාශ නොකළ ස්කන්ධයන්			4,146,855	4,146,855		3,787,154	3,787,154

30.4 හානිකරණ ප්‍රතිපාදකයන්හි වර්ෂය තුල සංචලනයන්

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
හානිකරණ අදියර 1 හි සංචලනය				
ජනවාරි 1 දිනට ශේෂය	-	-	20,892	21,392
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය)	-	-	14,710	-
වර්ෂය තුළදී කපාහල අගය	-	-	-	(500)
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	35,602	20,892

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
මුළු හානිකරණයේ සංචලනය				
ජනවාරි 1 දිනට ශේෂය	-	-	20,892	21,392
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය)	-	-	14,710	-
වර්ෂය තුළදී කපාහල අගය	-	-	-	(500)
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	35,602	20,892

31 පරිපාලිත සමාගම්වල ආයෝජන

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

බැංකුව විසින් පාලනය කරනු ලබන ආයතන පරිපාලිතයන් වේ. බැංකුවට තම ආයෝජන තුළින් විචල්‍ය ප්‍රතිලාභ ලැබීමට යම් අයිතියක් ඇත්නම් හෝ ලැබීමට සිදුවේනම් සහ එම ප්‍රතිලාභ වලට තම බලය පාවිච්චි කරමින් බලපෑම් කිරීමට හැකියාවක් ඇත්නම්, බැංකුව විසින් එම ආයතනය පාලනය කරනු ලැබේ. විශේෂයෙන්ම පහත අවස්ථාවන් පවතීනම් බැංකුව ආයෝජනය පාලනය කරනු ලබයි.

- අයෝජනය කෙරෙහි පාලනයක් ඇත්නම්
- අයෝජනය සමඟ සම්බන්ධවීම තුලින් විචල්‍ය ප්‍රතිලාභ ලැබීමට අයිතියක් හෝ නිරාවරණයක් ඇත්නම්
- අයෝජනයේ ප්‍රතිලාභ වලට බලපෑම් කිරීමට තම බලතල භාවිතා කල හැකි වීම

පරිපාලිතයන්ගේ පාලනය පටන් ගත් දින සිට පාලනය අහිමිවන දින තෙක් එම පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අඩංගු වේ. පාලනය සඳහා බලපාන යම් සාධකයක් හෝ සාධක කිහිපයක සිදුවන වෙනස්කම් මත පාලනය සඳහා බැංකුවට බලයක් ඇත්ද යන්න සලකා බැලීම සඳහා බැංකුව විසින් නැවත තක්සේරුවක් සිදු කරනු ලැබේ. පාලන බලයේ බිඳ වැටීමකින් තොරව, පරිපාලිතයේ හිමිකම වෙනස්වී ඇත්නම් ඒවා ස්කන්ධය වෙනස්වීමේ ගනුදෙනු ලෙස සලකයි. යම් පරිපාලිතයක් සඳහා වන සමූහයේ පාලන බලය අහිමි වුවහොත් ඒ හා සම්බන්ධ වත්කම් (කීර්තිනාමයද ඇතුළුව), වගකීම්, සුළු කොටස් හිමියන්ගේ ස්කන්ධ අයිතිය සහ ස්කන්ධය තුළ ඇතුලත් අනෙකුත් සංරචක සියල්ල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් බැහැර කරනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට හඳුනා ගැනීම සිදු කරයි. තවදුරටත් රඳවා ගත් ආයෝජනයක් වෙතොත් එය පාලන බලය අහිමි වූ දිනයේ සිට සාධාරණ අගයට හඳුනා ගැනීම සිදු කරයි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් පොදු මූල්‍ය වර්ෂය සඳහා වන අතර සමාන ගනුදෙනු සහ සමාන තත්ත්වයන් තුළ සිදුවූ වෙනත් සිදුවීම් සඳහා ඒකාකාරී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කරනු ලබයි.

සියලුම අන්තර් - සමාගම් ගනුදෙනු සහ ශේෂයන්, ආදායම් හා වියදම් (විදේශ විනිමය ගනුදෙනුවල ලාභ සහ අලාභ හැර) ඒකාබද්ධකරණයේ දී ඉවත් කෙරේ. සමූහය සහ එහි ආශ්‍රිත සමාගම් අතර කරනු ලබන ගනුදෙනුවලදී ඇතිවිය හැකි උපලබ්ධි නොවූ ලාභ හෝ අලාභද ආශ්‍රිත සමාගම්වල සමූහයේ අයිතිය ප්‍රමාණයට ඒකාබද්ධකරණයේදී ඉවත් කෙරේ. හානිකරණය පිළිබඳව සාක්ෂි නොමැති විට පමණක් උපලබ්ධි නොවූ ලාභ මෙන්ම අලාභද ඉවත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පරිපාලිතයන්ට ණය හා අත්තිකාරම් නැවත ගෙවීම හෝ ලාභාංශ ආකාරයෙන් මවි සමාගමට මුදල් ප්‍රේෂණයට කිසිදු සැළකිය යුතු බාධාවක් නොමැත. එක්සත් රාජධානියේ පිහිටුවා ඇති ලංකා බැංකුව (යූ කේ) සමාගම හැර බැංකුවේ අනෙකුත් සියලුම පරිපාලිතයන් ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර ඇත. බැංකුවේ පරිපාලිත සමාගම්වල නාම ලේඛනයක් මෙම මූල්‍ය ප්‍රකාශවල 31.5 වන සටහන යටතේ පෙන්නුම් කොට ඇත.

දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000
මිල ප්‍රකාශිත පරිපාලිතයන්හි ආයෝජන	31.3	3,922,772	3,922,772
මිල ප්‍රකාශ නොකළ පරිපාලිතයන්හි ආයෝජන	31.4	4,658,366	4,658,366
මුළු පරිපාලිත සමාගම්වල ආයෝජන		8,581,138	8,581,138
අඩුකළා: පරිපාලිත සමාගම්හි ආයෝජන හානිකරණය සඳහා ප්‍රතිපාදන	31.2	400,000	400,000
පරිපාලිත සමාගම්වල ආයෝජනයේ ධාරණ අගය		8,181,138	8,181,138

31.1 පරිපාලිත සමාගම් වල ආයෝජනයන්හි සංචලනය

දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	8,581,138	8,581,138
වර්ෂය තුළ ආයෝජනයන්ගේ වැඩිවීම/(අඩු වීම)	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	8,581,138	8,581,138

31.2 පරිපාලිත සමාගම්හි ආයෝජන හානිකරණය සඳහා ප්‍රතිපාදනයන්*

දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	400,000	400,000
වර්ෂය තුළ කරන ලද හානිකරණ ප්‍රතිපාදනයන්/(ප්‍රතිවර්ත්‍යයන්)	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	400,000	400,000

* එක්සත් රාජධානියේ පිහිටුවා ඇති ලංකා බැංකුව (යූ කේ) සමාගමේ ආයෝජනය සඳහා බැංකුව හානිකරණ ප්‍රතිපාදනයන් වෙන්කර ඇත.

31.3 මිල ප්‍රකාශිත පරිපාලිත සමාගම්වල ආයෝජන

	බැංකුව			
දෙසැම්බර් 31 දිනට	2023		2022	
	පිරිවැය රු. '000	වෙළඳපළ වටිනාකම රු. '000	පිරිවැය රු. '000	වෙළඳපළ වටිනාකම රු. '000
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී (සාමාන්‍ය කොටස් 401,577,368)	3,922,772	1,766,940	3,922,772	1,365,363
මුළු මිල ප්‍රකාශිත පරිපාලිත සමාගම්වල ආයෝජනය	3,922,772	1,766,940	3,922,772	1,365,363

31.4 මිල ප්‍රකාශ නොකළ පරිපාලිතයන්හි ආයෝජන

දෙසැම්බර් 31 දිනට	බැංකුව			
	2023		2022	
	පිරිවැය රු. '000	අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව රු. '000	පිරිවැය රු. '000	අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව රු. '000
සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම (සාමාන්‍ය කොටස් 99,996)	1,000	1,000	1,000	1,000
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම (සාමාන්‍ය කොටස් 100,999,998)	1,010,000	1,010,000	1,010,000	1,010,000
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම (සාමාන්‍ය කොටස් 250,004)	2,500	2,500	2,500	2,500
ලංකා බැංකුව (යූ.කේ.) සමාගම (සාමාන්‍ය කොටස් 15,000,000)	2,683,859	2,283,859	2,683,859	2,283,859
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම (සාමාන්‍ය කොටස් 10,073,667)	100,737	100,737	100,737	100,737
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම (සාමාන්‍ය කොටස් 63,064,957)	860,270	860,270	860,270	860,270
මුළු මිල ප්‍රකාශ නොකළ පරිපාලිතයන්හි ආයෝජනය	4,658,366	4,258,366	4,658,366	4,258,366

31.5 බැංකුවේ පරිපාලිත සමාගම්වල තොරතුරු

දෙසැම්බර් 31 දිනට	බැංකුව සතු හිමිකම් අයිතිය (වක්‍ර අයිතිය ඇතුලත්ව)	
	2023 %	2022 %
මිල ප්‍රකාශිත පරිපාලිත සමාගම්		
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී (MBSL)	84.50	84.50
මිල ප්‍රකාශ නොකළ පරිපාලිතයන්හි ආයෝජන		
සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම (MSS)	100.00	100.00
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම (PDML)	100.00	100.00
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම (TRAVELS)	100.00	100.00
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම (HCL)	99.99	99.99
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම (HH)	100.00	100.00
සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගම (MBSL INS)	45.47	45.47
ලංකා බැංකුව (යූ කේ) සමාගම (BOC UK)	100.00	100.00
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම (PDL)	97.89	97.89

සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම සහ සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගම යන ආයතන ලංකා බැංකුවේ වක්‍ර පරිපාලිත සමාගම් වේ.

සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් ස්පෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම ක්‍රියාකාරිත්වයේ නොමැත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

31.6 පරිපාලිත සමාගම්වල සුළු කොටස් හිමියන්ගේ අයිතිය

	2023			
	PDL	MBSL	MBSL INS	HCL
සුළු කොටස් හිමියන්ගේ ස්කන්ධ අයිතිය (%)	2.11	23.44	46.19	0.01
වර්ෂය තුළ අන්තර්ග්‍රහණය කරන ලද ලාභ/(අලාභ) (රු. '000)	19,282	3,317	13,966	(30)
දෙසැම්බර් 31 දිනට සුළු කොටස් හිමියන්ගේ සමුච්චිත ශේෂය (රු. '000)	146,619	860,526	454,977	(29)
සුළු කොටස්හිමියන් සඳහා ගෙවූ ලාභාංශ (රු. '000)	11,468	-	-	-

	2022			
	PDL	MBSL	MBSL INS	HCL
සුළු කොටස් හිමියන්ගේ ස්කන්ධ අයිතිය (%)	2.11	23.44	46.19	0.01
වර්ෂය තුළ අන්තර්ග්‍රහණය කරන ලද ලාභ/(අලාභ) (රු. '000)	16,739	(92,418)	13,093	(8)
දෙසැම්බර් 31 දිනට සුළු කොටස් හිමියන්ගේ සමුච්චිත ශේෂය (රු. '000)	121,654	835,058	436,750	(20)
සුළු කොටස්හිමියන් සඳහා ගෙවූ ලාභාංශ (රු. '000)	-	-	-	-

31.7 පරිපාලිත සමාගම්වල මූල්‍ය තොරතුරුවල සාරාංශ

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023				
	PDL රු. '000	MBSL රු. '000	MSS රු. '000	PDML රු. '000	TRAVELS රු. '000
වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය					
මුළු ආදායම	1,877,158	7,478,050	-	649,878	257,420
බදු පෙර ලාභ/(අලාභ)	1,292,120	68,395	-	453,794	126,107
බදු පසු ලාභ/(අලාභ)	913,854	21,403	-	309,255	126,107
වෙනත් විස්තීර්ණ ආදායම	520,607	(45,760)	-	32,065	(2,314)
මුළු විස්තීර්ණ ආදායම	1,434,461	(24,357)	-	341,320	123,793
දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය					
මුළු වත්කම්	7,777,012	33,659,529	819	2,350,448	457,723
මුළු වගකීම්	828,248	30,028,343	43	134,046	130,051
ශුද්ධ වත්කම්	6,948,764	3,631,186	776	2,216,402	327,672
ගෙවූ ලාභාංශ	257,707	-	-	139,380	6,500
වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය					
මෙහෙයුම් කටයුතුවල මුදල් ප්‍රවාහය	12,358	6,383,468	(36)	47,527	58,705
ආයෝජන කටයුතුවල මුදල් ප්‍රවාහය	158,268	(6,717,620)	-	104,463	180,991
මූල්‍ය කටයුතුවල මුදල් ප්‍රවාහය	(255,702)	421,018	-	(139,306)	(8,983)
මුදල් සහ මුදල් හා සමාන දෑ හි සිදු වූ ශුද්ධ වැඩි වීම/(අඩු වීම)	(85,076)	86,866	(36)	12,684	230,713

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022				
	PDL රු. '000	MBSL රු. '000	MSS රු. '000	PDML රු. '000	TRAVELS රු. '000
වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය					
මුළු ආදායම	1,551,547	6,542,591	-	546,701	108,870
බදු පෙර ලාභ/(අලාභ)	1,104,620	(658,149)	-	403,931	52,365
බදු පසු ලාභ/(අලාභ)	793,328	(596,244)	-	278,910	52,365
වෙනත් විස්තීර්ණ ආදායම	872,970	(10,179)	-	(101,895)	-
මුළු විස්තීර්ණ ආදායම	1,666,298	(606,423)	-	177,015	52,365
දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය					
මුළු වත්කම්	6,638,715	31,253,210	1,470	2,169,300	353,795
මුළු වගකීම්	873,145	27,690,678	470	154,837	137,293
ශුද්ධ වත්කම්	5,765,570	3,562,532	1,000	2,014,463	216,502
ගෙවූ ලාභාංශ	-	-	-	93,930	-
වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය					
මෙහෙයුම් කටයුතුවල මුදල් ප්‍රවාහය	362,702	5,102,515	-	148,742	32,094
ආයෝජන කටයුතුවල මුදල් ප්‍රවාහය	(1,508,845)	(2,174,036)	-	1,387	12,285
මූල්‍ය කටයුතුවල මුදල් ප්‍රවාහය	(288,025)	(2,747,972)	-	(114,456)	(23,402)
මුදල් සහ මුදල් හා සමාන දෑ හි සිදු වූ ශුද්ධ වැඩි වීම/(අඩු වීම)	(1,434,168)	180,507	-	35,673	20,977

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023			
	HCL රු. '000	HH රු. '000	MBSL INS රු. '000	BoC UK රු. '000
වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය				
මුළු ආදායම	271,397	177,976	977,383	3,031,190
බදු පෙර ලාභ/(අලාභ)	(295,358)	3,849	25,278	441,240
බදු පසු ලාභ/(අලාභ)	(295,358)	3,849	25,611	378,310
වෙනත් විස්තීර්ණ ආදායම	-	-	4,136	(308,638)
මුළු විස්තීර්ණ ආදායම	(295,358)	3,849	29,747	69,672
දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය				
මුළු වත්කම්	596,052	22,219	2,593,473	63,629,159
මුළු වගකීම්	888,466	85,947	1,608,461	57,543,838
ශුද්ධ වත්කම්	(292,414)	(63,728)	985,012	6,085,321
ගෙවූ ලාභාංශ	-	-	-	-
වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය				
මෙහෙයුම් කටයුතුවල මුදල් ප්‍රවාහය	201,500	10,920	181,274	1,530,967
ආයෝජන කටයුතුවල මුදල් ප්‍රවාහය	(129,486)	24,381	(110,301)	(47,402)
මූල්‍ය කටයුතුවල මුදල් ප්‍රවාහය	7,895	(26,484)	(55,429)	-
මුදල් සහ මුදල් හා සමාන දෑ හි සිදු වූ ශුද්ධ වැඩි වීම/(අඩු වීම)	79,909	8,817	15,544	1,483,565

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022			
	HCL රු. '000	HH රු. '000	MBSL INS රු. '000	BoC UK රු. '000
වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය				
මුළු ආදායම	106,659	135,284	810,894	1,362,433
බදු පෙර ලාභ/(අලාභ)	(76,832)	194	24,010	(54,096)
බදු පසු ලාභ/(අලාභ)	(76,832)	194	24,010	(54,096)
වෙනත් විස්තීර්ණ ආදායම	-	-	2,281	2,279,165
මුළු විස්තීර්ණ ආදායම	(76,832)	194	26,291	2,225,069
දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය				
මුළු වත්කම්	543,961	47,751	2,565,042	48,810,630
මුළු වගකීම්	748,676	112,642	1,619,490	42,794,981
ශුද්ධ වත්කම්	(204,715)	(64,891)	945,552	6,015,649
ගෙවූ ලාභාංශ	-	-	-	-
වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය				
මෙහෙයුම් කටයුතුවල මුදල් ප්‍රවාහය	(17,234)	(1,094)	165,912	122,457
ආයෝජන කටයුතුවල මුදල් ප්‍රවාහය	(6,962)	685	1,359	(875)
මූල්‍ය කටයුතුවල මුදල් ප්‍රවාහය	(1,300)	(3,859)	(116,495)	-
මුදල් සහ මුදල් හා සමාන දෑ හි සිදු වූ ශුද්ධ වැඩි වීම/(අඩු වීම)	(25,496)	(4,268)	50,776	121,582

32 ආශ්‍රිත සමාගම්වල ආයෝජන

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආශ්‍රිත සමාගම් යනු බැංකුව විසින් සැලකිය යුතු බලපෑමක් කළ හැකි එහෙත් මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනයකින් තොර සමාගම් වේ. ආශ්‍රිත සමාගම්වල ආයෝජන සමූහයේ ආයෝජන පිරිවැයට මූලිකව හඳුනා ගන්නා අතර, පසුව ස්කන්ධ ක්‍රමය (ආයෝජිතයාගේ ගිණුම් මත ස්කන්ධය) භාවිතා කර ගිණුම් තබයි. ආයෝජන පිරිවැයට ගනුදෙනු පිරිවැය ද ඇතුළත්ය.

සැලකිය යුතු පාලනය පටන් ගත් දින සිට අවසාන වන දින තෙක් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වලට ගලපන ලද බැංකුවට අයත් ලාභයේ හෝ අලාභයේ කොටස සහ විස්තීර්ණ ආදායමේ කොටස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අඩංගු වේ.

බැංකුවට අදාළ අලාභයේ කොටස, ආයෝජිතයාගේ ස්කන්ධයට වඩා වැඩි වන විට දිගුකාලීන ආයෝජන ද ඇතුළුව ධාරණ අගය වාර්තා කරනු ලබන්නේ ශූන්‍ය අගයට වන අතර, සමූහය ආයෝජිතයා වෙත බැඳීමක් නොමැති විට තවදුරටත් අලාභ හඳුනා නොගනී. ආශ්‍රිතයන් විසින් ඉන් පසුව ලාභ වාර්තා කරන විට බැංකුවේ ලාභයේ කොටස හඳුනා ගැනීම ආරම්භ වන්නේ හඳුනා නොගත් අලාභයේ කොටස ලාභයේ කොටසින් සමාන වූ පසුවය.

බැංකුවේ ආශ්‍රිත සමාගම්වල නාම ලේඛනයක් මෙම මූල්‍ය ප්‍රකාශවල සටහන 32.4 යටතේ පෙන්නුම් කොට ඇත.

ආශ්‍රිත සමාගමකට බැංකුව විසින් කළ සැලකිය යුතු බලපෑම් කිරීමට නොහැකි තත්ත්වයක දී බැංකුව විසින් එම ආශ්‍රිත සමාගම ස්කන්ධ ක්‍රමය යටතේ ගිණුම් තැබීම අත්හිටුවන අතර, එය ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ වාර්තා කිරීම කරනු ලබයි.

එවැනි අවස්ථාවකදී එම ආශ්‍රිත සමාගමේ සාධාරණ අගය ගිණුම් පොත්වල හඳුනා ගනු ලබන අතර පොත් අගය හා කොටසක් බැහැර කිරීමෙන් පසු රඳවා ගන්නා අගය අතර, වෙනස සහ විකුණුම් ලැබීම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

32.1 මිල ප්‍රකාශ නොකළ ආශ්‍රිත සමාගම්

දෙසැම්බර් 31 දිනට		බැංකුව				සමූහය			
		2023		2022		2023		2022	
	සටහන	පිරිවැය	අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව	පිරිවැය	අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව	පිරිවැය	අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව	පිරිවැය	අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම (සාමාන්‍ය කොටස් 1,240,002)		31,048	31,048	31,048	31,048	335,162	335,162	312,274	312,274
සී/ස ලංකා සික්‍යුරිටීස් (පෞද්ගලික) සමාගම (සාමාන්‍ය කොටස් 3,594,857)		41,940	41,940	41,940	41,940	247,544	247,544	209,603	209,603
සී/ස සද්ධර්ම ඩිවලොප්මන්ට් ෆයිනෑන්ෂියල් සමාගම (සාමාන්‍ය කොටස් 2,500,001)		25,000	-	25,000	-	-	-	-	-
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම (සාමාන්‍ය කොටස් 2,000,000)		20,000	20,000	20,000	20,000	154,409	154,409	162,659	162,659
මුළු මිල ප්‍රකාශ නොකළ ආශ්‍රිත සමාගම්වල ආයෝජනය		117,988	92,988	117,988	92,988	737,115	737,115	684,536	684,536
අඩුකලා: ආශ්‍රිත සමාගම්වල ආයෝජනවල හානිකරණය සඳහා ප්‍රතිපාදන	32.3	25,000	-	25,000	-	-	-	-	-
මිල ප්‍රකාශ නොකළ ආශ්‍රිත සමාගම්වල ශුද්ධ ආයෝජනය		92,988	92,988	92,988	92,988	737,115	737,115	684,536	684,536

32.2 ආශ්‍රිත සමාගම්වල ආයෝජනයන්හි සංචලනය

	බැංකුව		සමූහය	
	පිරිවැය		හිමිකම් වටිනාකම	
පරිශ්‍රයේ නම	ගොඩනැගිලි ගණන	ඉඩමේ ප්‍රමාණය (පර්චස්)	ගොඩනැගිලි (වර්ග අඩි)	තක්සේරු කළ දිනය	තක්සේරුකරු	තක්සේරු කිරීමේ පදනම
වෙනත්						
කොළඹ 7 - මහා කළමනාකාරතුමාගේ නිල නිවස, 75, ආනන්ද කුමාරස්වාමී මාවත, කොළඹ 07	1	79.80	6,380	30.11.2023	ඒ. පී. ගුණරත්න	පිරිවැය ප්‍රවේශය
කොළඹ ඩාර්ලි පාර ගබඩාව, බ්‍රවුන්ස් ගොඩනැගිල්ල, 481, ටී. බී. ජයා මාවත, කොළඹ 10	1	151.00	26,209	30.11.2023	ඩබ්ලිව්. ඩී. පී. රූපානන්ද	කොන්ත්‍රාත්කරුගේ ක්‍රමය
කොළඹ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, 08, 8-2/1, ලංකා බැංකු මාවත, කොළඹ 01	1	-	6,347	30.11.2023	කේ. ටී. ඩී. තිසේරා	ආයෝජන ක්‍රමය
බී. ඕ. සී. මර්චන්ට් ටවර්, (පෙර වෝකර්ස් - ඇන්ඩ් සන්ස්), 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03	-	57.00	-	30.11.2023	කේ. ටී. ඩී. තිසේරා	සන්සන්දනාත්මක ක්‍රමය
මුළු එකතුව						

ඉඩම්වල ධාරණ අගය	ඉඩම්වල ප්‍රත්‍යාගණන අගය	ඉඩම්වල ප්‍රත්‍යාගණන අතිරික්තයන්/ (අලාභයන්)	ගොඩනැගිලිවල ධාරණ අගය	ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන/ ධාරණ අගය	ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන අතිරික්තයන්/ (අලාභයන්)	මුළු ප්‍රත්‍යාගණන අතිරික්තයන්/ (අලාභයන්)	මුළු ප්‍රත්‍යාගණන අගය/ ධාරණ අගය
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
1,436,400	1,512,400	76,000	11,200	17,864	6,664	82,664	1,530,264
1,600,000	1,736,000	136,000	32,648	44,000	11,352	147,352	1,780,000
-	-	-	366,181	399,900	33,719	33,719	399,900
600,000	1,140,000	540,000	-	-	-	540,000	1,140,000
3,636,400	**4,388,400**	**752,000**	**410,029**	**461,764**	**51,735**	**803,735**	**4,850,164**
20,264,953	**25,821,192**	**5,556,239**	**5,429,170**	**6,411,916**	**982,746**	**6,538,985**	**32,233,108**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

35 භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූලික හඳුනාගැනීම සහ මිනුම්කරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පියවීමට ඇති කල්බදු වගකීම නියෝජනය වන පරිදි, අදාළ කල්බදු වත්කම හා කල්බදු වගකීම භාවිතා කිරීමට ඇති අයිතිය නිරූපනය වන ලෙස බදුකරු භාවිත අයිතිය සහිත වත්කමක් හඳුනාගැනීමට අවශ්‍ය වේ.

බදුකරු විසින් වෙනත් මූල්‍ය නොවන වත්කම් (දේපළ, පිරියත සහ උපකරණ වැනි) හඳුනාගන්නා පරිදි භාවිත අයිතිය සහිත වත්කම් ද අනෙකුත් මූල්‍ය වගකීම් හඳුනාගන්නා පරිදි බදු වගකීම්ද මිනුම් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස බදුකරු විසින් භාවිත අයිතිය සහිත වත්කම් ක්‍රමක්ෂය කිරීම සහ බදු වගකීමට පොළියද හඳුනා ගනී.

කල්බදු ක්‍රමයකින් පැන නගින වත්කම් හා වගකීම් වල මූලික මිනුම්කරණය සිදු කරනු ලබන්නේ වර්තමාන වටිනාකම පදනම් කරගෙනය. ආරම්භක අවස්ථාවේදී කල්බදු වත්කම බොහෝ අවස්ථාවන්හි කල්බදු වගකීමට සමාන වේ.

බදු ආරම්භයේදී, බදුකරු සංරචක දෙකක් සඳහා ගිණුම් තබයි:

(අ) භාවිත අයිතිය සහිත වත්කම්: ආරම්භයේදී, භාවිත අයිතිය සහිත වත්කම් මනිනු ලබන්නේ කල්බදු වගකීම් ප්‍රමාණය සහ ආරම්භක සෘජු පිරිවැයෙහි එකතුවයි. ඉන්පසුව ආරම්භක දිනට පෙර හෝ පසුව කරන ලද බදු ගෙවීම්, ලැබුණු කල්බදු දිරි දීමනා සහ ඉවත් කිරීමේ හා ප්‍රතිෂ්ඨාපන පිරිවැය යනාදිය ගැලපුම් කරයි.

(ආ) බදු වගකීම: ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු වගකීම් සඳහා වූ සත්‍ය සියළුම ගෙවීම් කල්බදු පොළී අනුපාතය හෝ එය තීරණය කල නොහැකි නම් නව ණය ගැනීමේ අනුපාතය භාවිතා කරමින් වර්ථමාන වටිනාකමට වට්ටම් කර ඇත. මෙම ගෙවීම් තුළ ස්ථාවර ගෙවීම්, විචල්‍ය ගෙවීම්, අවශේෂ වටිනාකම් ඇපකර යටතේ ගෙවීම්, මිලදී ගැනීමේ විකල්පය ක්‍රියාත්මක වන්නේ නම් මිලදී ගැනීමේ මිල ඇතුළත් විය හැකිය.

පසුකාලීන මිනුම්කරණ පදනම

ආරම්භක දිනයට පසු, මුලින් හඳුනාගත් සංරචක දෙක සඳහාම බදුකරු විසින් ගැලපීම් සිදුකළ යුතුය. බදුකරු විසින් පොළිය නිරූපණය වන පරිදි බදු වගකීම ඉහළ නැංවීම ද වාරික ගෙවීම නිරූපනය වන පරිදි බදු වගකීම අඩු කිරීමද සිදු කරයි.

භාවිත අයිතිය සහිත වත්කම්

භාවිත අයිතිය සහිත වත්කම් ලං.හි.ප්‍ර. 16 - "දේපළ, පිරියත සහ උපකරණ" යටතේ පිරිවැය ක්‍රමයට හඳුනාගන්නා අතර සරල මාර්ග ක්‍රමයට බදු කාලසීමාව පුරා ක්ෂය කරයි. අදාළ ක්ෂය ප්‍රමාණය ලාභ හෝ අලාභයට ගැලපුම් කරයි.

බදු වගකීම

බදු වගකීම සඳහා පොළියක් බදුකරු විසින් හඳුනාගත යුතු අතර කල්බදු ගෙවීම් කල්බදු වගකීම අඩු කිරීමක් ලෙස හඳුනා ගනී. කල්බදු වගකීම් සඳහා පොළිය ලාභයට හෝ අලාභයට ගලපනු ලැබේ.

ඇතැම් සිදුවීම් (උ. දා. කල්බදු කාල සීමාව වෙනස් කිරීම, දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම්ව විචල්‍ය කුළී වෙනස් කිරීම) ඇති වූ විට බදුකරු විසින් බදු වගකීම නැවත මැනීම සිදුකළ යුතුය. එය සාමාන්‍යයෙන් භාවිත අයිතිය සහිත වත්කම් සඳහා වූ ගැලපීමක් ලෙස හඳුනා ගනී.

ලං.හි.ප්‍ර. 16 - "දේපළ, පිරියත උපකරණ" සහ ලං.හි.ප්‍ර. 40 - "ආයෝජන දේපළ" අනුව යම් යම් තත්ත්වයන් යටතේ භාවිත අයිතිය සහිත වත්කම් සඳහා පසුකාලීන විකල්ප මිනුම් පදනමක් බදුකරුට භාවිතා කල හැක. ලං.හි.ප්‍ර. 36 - "වත්කම් හානිකරණය" යටතේ භාවිත අයිතිය සහිත වත්කම් හානිකරණ පරීක්ෂාවට යටත් වේ.

භාවිත අයිතිය සහිත වත්කම් වල වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී බදු ගිවිසුමේ කාල සීමාව සලකා බැලීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ.

දෙසැම්බර් 31 දිනට	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ	11,366,987	9,310,524	7,520,322	6,461,627
අඩුකලා: සමුච්චිත ක්‍රමක්ෂය වීම්	7,858,369	6,308,219	4,533,618	3,837,327
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළවල ශුද්ධ පොත් අගය	3,508,618	3,002,305	2,986,704	2,624,300

	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000
පිරිවැය				
ජනවාරි 1 දිනට ශේෂය	9,310,524	7,710,364	6,461,627	5,605,695
මාරු කිරීම්	73,441	-	79,024	-
වර්ෂය තුළ එකතු කිරීම්	2,937,581	1,413,734	1,470,986	661,506
ගැළපුම්	(954,559)	186,426	(491,315)	194,426
දෙසැම්බර් 31 දිනට ශේෂය	11,366,987	9,310,524	7,520,322	6,461,627
සමුච්චිත ක්‍රමක්ෂය				
ජනවාරි 1 දිනට ශේෂය	6,308,219	4,572,409	3,837,327	2,779,976
මාරු කිරීම්	61,977	-	61,977	-
වර්ෂය සඳහා ප්‍රතිපාදන	1,522,030	1,759,054	1,002,250	990,918
ගැළපුම්	(33,857)	(23,244)	(367,936)	66,433
දෙසැම්බර් 31 දිනට ශේෂය	7,858,369	6,308,219	4,533,618	3,837,327
දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	3,508,618	3,002,305	2,986,704	2,624,300

තම භාවිතය සඳහා ඇති ඉඩම් වලට ඇති කල්බදු අයිතිය කල්බදු දේපළ වලින් නිරූපනය වේ. බදු ඉඩම් වල පිහිටා ඇති ගොඩනැගිලිවල වටිනාකම දේපළ පිරියත සහ උපකරණ යටතේ වෙනම දක්වා ඇත. කල්බදු ඉඩම් සඳහා වන අයිතිය පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකර දක්වා ඇත.

35.1 බදු වගකීම්

වෙනත් වගකීම් (සටහන 47) යටතේ දක්වා ඇති කල්බදු වගකීම් වල ධාරණ අගය සහ වර්ෂය තුළ සංචලනය පහත පරිදි වේ.

	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	2,407,189	2,962,878	1,828,636	2,233,145
එකතු කිරීම්	2,937,581	1,413,734	1,115,139	520,207
පොළී එකතු කිරීම්	751,003	358,362	433,816	328,936
ගෙවීම්	(2,474,244)	(2,462,165)	(1,589,289)	(1,558,956)
ගැළපුම්	(922,708)	134,380	(138,189)	305,304
දෙසැම්බර් 31 දිනට ශේෂය	2,698,820	2,407,189	1,650,113	1,828,636

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

35.1.1 කල්බදු වගකීම් වල කල්පිරීම් විශ්ලේෂණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
වසර 1 කට නොවැඩි	139,269	646,877	168,355	686,801
වසර 1 කට වැඩි එහෙත්, වසර 5 කට නොවැඩි	2,177,818	420,980	1,039,808	321,073
වසර 5 කට වැඩි	381,733	1,339,332	441,950	820,762
මුළු කල්බදු වගකීම	2,698,820	2,407,189	1,650,113	1,828,636

35.2 භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු වගකීම් ගණනය කිරීම සඳහා භාවිතා කරන සංවේදී සාධක

	සංවේදීතාව	භාවිත අයිතිය සහිත වත්කම් සඳහා සංවේදීතාවයේ බලපෑම රු. '000	කල්බදු වගකීම සඳහා සංවේදීතාවයේ බලපෑම රු. '000	බදු පෙර ලාභය සඳහා සංවේදීතාවයේ බලපෑම රු. '000
වර්ධනාත්මක ණය ගැනීමේ අනුපාතය	+1%	(79,346)	(65,254)	6,053
	-1%	83,477	67,830	(6,522)
බදු කාලය	වසරකින් වැඩි කිරීම	1,037,512	1,154,275	(60,623)

36 අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනාගැනීමේ පදනම

සමූහය තුළට අනාගත ආර්ථික ප්‍රතිලාභයන් වත්කම් තුළින් ගලා ඒම පිළිබඳ භව්‍යතාවයක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විටක අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගනී. අස්පෘශ්‍ය වත්කම් ආරම්භයේදී පිරිවැයට ගිණුම් තබයි.

පරිගණක උපකරණයන්හි මෘදුකාංග හැර අනෙකුත් පරිගණක යෙදවුම් මෘදුකාංග සහ බලපත්‍රවල වටිනාකම අස්පෘශ්‍ය වත්කම් වලින් නිරූපණය වේ.

මිණුම්කරණ පදනම

සමූහය විසින් අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් හි අගය එහි පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂයවීම සහ හානිකරණයන් අඩුකර දක්වා ඇත. මූලික හඳුනා ගැනීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් උදෙසා දරනු ලබන පිරිවැය මඟින් ඒ හා බැඳි අනාගත ආර්ථික ලාභයන්හි වැඩිවීමක් වේ නම් පමණක් එම පිරිවැය ප්‍රාග්ධනීකරණය කරන අතර නොඑසේ නම් එය වියදමක් ලෙස ගිණුම්ගත කරනු ඇත.

ක්‍රමක්ෂය වීම් සහ හානිකරණය

අස්පෘශ්‍ය වත්කම් එහි ඇස්තමේන්තු කරනු ලබන ඵලදායී ජීව කාලය තුළ සරල මාර්ග පදනම මත ක්‍රමක්ෂයවීම් සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ප්‍රතිපාදන සලස්වනු ලැබේ. මෙම ක්‍රමය එම වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ පරිභෝජනය හා බොහෝ විට ගැලපේ. අස්පෘශ්‍ය වත්කම්වල අපේක්ෂිත ඵලදායී ආයුකාලය වනුයේ වසර පහක් හෝ එහි යෝග්‍යතම අපේක්ෂිත ආයුකාලය යන දෙකින් අඩු කාලයයි. හානිකරණය පිළිබඳව සංඥාවක් ඇති සෑම විටකදීම නිශ්චිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල අගයන් හානිකරණය සඳහා සලකා බලන අතර එය අනාගත ප්‍රතිලාභයක් මඟින් පියවාගත නොහැකි බව තහවුරු වන ප්‍රමාණයට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී. ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය, ඵලදායී ආයුකාලය සහ සුන්බුන් අගය සෑම මූල්‍ය වසරක් අවසානයේදීම සමාලෝචනය කර යම් ගැලපීමක් අවශ්‍ය වේ නම් සිදු කරනු ලැබේ.

බැහැර කිරීම්

අස්පෘශ්‍ය වත්කම් මඟින් අනාගත ප්‍රතිලාභයන් ජනනය නොවන බව පැහැදිලි වන විට සහ ධාරණ අගය හානිකරණයට ලක්ව ඇති බව තහවුරු වන විට එම වත්කම් පොත්වලින් බැහැර කෙරේ.

බැහැර කිරීම් මඟින් වන ලාභ හෝ අලාභ වනුයේ අස්පෘශ්‍ය වත්කම්හි ධාරණ අගය සහ ශුද්ධ විකුණුම් අගය යන දෙකෙහි වෙනසයි. එය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි ඇතුළත් කෙරේ.

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
පිරිවැය				
ජනවාරි 1 දිනට ශේෂය	5,526,320	4,499,109	6,298,056	5,147,815
වර්ෂය තුළ එකතු කිරීම්	476,639	1,027,211	478,130	1,027,390
විනිමය අනුපාත සහ වෙනත් ගැලපුම්	-	-	123,018	122,851
දෙසැම්බර් 31 දිනට ශේෂය	6,002,959	5,526,320	6,899,204	6,298,056
සමුච්චිත ක්‍රමක්ෂය				
ජනවාරි 1 දිනට ශේෂය	4,166,055	3,533,170	4,786,880	4,007,270
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	484,475	632,885	525,130	795,627
විනිමය අනුපාත සහ වෙනත් ගැලපුම්	-	-	134,918	(16,017)
දෙසැම්බර් 31 දිනට ශේෂය	4,650,530	4,166,055	5,446,928	4,786,880
සංවර්ධන අදියරේ පවතින මෘදුකාංග	202,446	82,168	202,446	82,168
දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	1,554,875	1,442,433	1,654,722	1,593,344

36.1 සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය වූ අස්පෘශ්‍ය වත්කම්

සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය වූ එහෙත් තවමත් භාවිතයේ පවත්නා අස්පෘශ්‍ය වත්කම්හි මූලික පිරිවැය පහත පරිදි වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
පරිගණක මෘදුකාංග	3,595,628	3,027,433	3,707,180	3,087,982
සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය වූ අස්පෘශ්‍ය වත්කම් වල එකතුව	3,595,628	3,027,433	3,707,180	3,087,982

37 විලම්බිත බදු වත්කම් /(වගකීම්)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වත්කම් සහ වගකීම්වල මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වනු ලබන ධාරණ අගය සහ ඒවා බදු පදනම උදෙසා දක්වනු ලබන අගය අතර තාවකාලික වෙනස්කම් පවතිනවිට, එම වෙනසට අදාළව විලම්බිත බදු ගණනය කරනු ලැබේ. පහත සඳහන් වන තාවකාලික වෙනස්කම් මත විලම්බිත බදු හඳුනා නොගනී.

- කීර්තිනාමයෙහි මූලික හඳුනාගැනීම
- ගිණුම්කරණ හා බදු ලාභ හෝ අලාභ කෙරෙහි බලපෑමක් නොමැති ව්‍යාපාර ඒකාබද්ධකරණය හැර වෙනත් ගනුදෙනුවකින් මූලික හඳුනාගැනීමේදී පැනනගින වත්කම් හෝ වගකීම්
- නුදුරු අනාගතයේ දී ප්‍රතිවර්තනය නොවන බවට තහවුරු වන, පරිපාලිත සමාගම් හි සිදු කර ඇති ආයෝජනයන්හි සිදු වන වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

විලම්බිත බදු ගණනයේ දී වාර්තාකරණ දිනට බලපැවැත්වෙන බදු නීතිය අනුව ප්‍රකාශිත බදු අනුපාතය භාවිතා කෙරෙන අතර, තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය කිරීම සඳහා ද එම අනුපාතය ම භාවිතා කෙරේ. ප්‍රවර්තන බදු වගකීම් ප්‍රවර්තන බදු වත්කමකට එරෙහිව කපා හැරීමට නෛතිකමය අවසරය සහ අයිතිය පවතින විටක පමණක් ඊට අනුරූපි වන විලම්බිත බදු වගකීම් සහ වත්කම් එකිනෙක හිලව් කරනු ඇත. තව දුරටත් එම ප්‍රවර්තන බදු වගකීම සහ වත්කම එකම ආයතනයකට අදාළව හෝ බදු වගකීම සහ වත්කම හිලව් කර පියවීමට අදහස් කරන වෙන් වශයෙන් වූ ආයතනයන්ට අදාළව හෝ එකම බදු අධිකාරියක් විසින් ආදායම් මත පනවනු ලැබුවක් විය යුතුය.

අනාගතයේ දී බදු ලාභයක් මඟින් පියවා ගත හැකි බවට විශ්වාසනීයත්වයක් ඇති විට පමණක් එම අපේක්ෂිත බදු ලාභයේ ප්‍රමාණය තෙක් භාවිතා නොකළ බදු අලාභයක්, බදු බැර අගයන් සහ අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් මත ප්‍රවර්තන බදු වත්කම හඳුනා ගනී. සෑම වාර්තාකරණ දිනයකදීම විලම්බිත බදු වත්කම විශ්ලේෂණයකට ලක් කර එය අනාගතයේ දී බදු ප්‍රතිලාභයක් ලෙස නිෂ්කාශනය නොවන බව හැඟීයන ප්‍රමාණය විලම්බිත බදු වත්කමට ගලපනු ලැබේ.

පහත වගුව මඟින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ ආදායම් බදු වියදම් (සටහන 18.2) යටතේ (ප්‍රතිපාදන)/ප්‍රතිවර්ත්‍ය කිරීම් ලෙස වාර්තා කර ඇති විලම්බිත බදු පෙන්නුම් කරයි.

37.1 බැංකුව

දෙසැම්බර් 31 දිනට	2023				2022			
	විලම්බිත බදු වත්කම්	විලම්බිත බදු වගකීම්	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	වෙනත් විස්තීර්ණ ආදායම/ස්කන්ධය	විලම්බිත බදු වත්කම්	විලම්බිත බදු වගකීම්	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	වෙනත් විස්තීර්ණ ආදායම/ස්කන්ධය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
විශ්‍රාම ප්‍රතිලාභ	7,702,974	-	(329,348)	5,682,082	2,350,240	-	(401,392)	1,464,274
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම	(9,137,381)	-	102,589	(1,961,601)	(7,278,369)	-	(5,272)	(1,859,253)
මූල්‍ය උපකරණයන්හි ආයෝජන	(1,272,671)	-	-	(256,508)	(1,016,163)	-	-	(726,486)
හානිකරණය සඳහා වෙන්කිරීම්වල තාවකාලික වෙනස්කම්	20,998,637	-	(445,941)	-	21,444,578	-	14,259,491	-
වෙනත් තාවකාලික වෙනස්කම්	211,838	-	134,658	-	77,180	-	693,392	-
එකතුව	18,503,397	-	(538,042)	3,463,973	15,577,466	-	14,546,219	(1,121,465)

37.2 සමූහය

දෙසැම්බර් 31 දිනට	2023				2022			
	විලම්බිත බදු වත්කම්	විලම්බිත බදු වගකීම්	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	වෙනත් විස්තීර්ණ ආදායම/ස්කන්ධය	විලම්බිත බදු වත්කම්	විලම්බිත බදු වගකීම්	ලාභ හෝ අලාභ ප්‍රකාශනය	වෙනත් විස්තීර්ණ ආදායම/ස්කන්ධය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
විශ්‍රාම ප්‍රතිලාභ	7,702,975	7,357	(440,542)	5,705,542	2,350,241	95,091	(350,615)	1,421,714
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම	(9,137,381)	(2,678,399)	282,969	(2,487,921)	(7,278,369)	(2,332,459)	169,893	(2,422,494)
මූල්‍ය උපකරණයන්හි ආයෝජන	(1,272,670)	-	-	(256,508)	(1,016,162)	-	-	(726,486)
හානිකරණය සඳහා වෙන්කිරීම්වල තාවකාලික වෙනස්කම්	20,998,637	-	(395,619)	-	21,444,578	(50,322)	14,207,758	-
වෙනත් තාවකාලික වෙනස්කම්	302,997	(262,554)	348,721	-	98,253	(406,531)	544,010	-
එකතුව	18,594,558	(2,933,596)	(204,471)	2,961,113	15,598,541	(2,694,221)	14,571,046	(1,727,266)

38 වෙනත් වත්කම්

කලින් ගෙවූ සේවක පිරිවැය

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව සේවක ණය සාධාරණ අගයට මූලිකව හඳුනා ගනී. මෙහිදී සාධාරණ අගය හා දුන් ණය මුදල අතර වෙනස කලින් ගෙවූ සේවක පිරිවැය ලෙස හඳුනා ගන්නා අතර එය ණය මුදලේ ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබයි.

අතැති රන් තොගය

රන් තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට තක්සේරු කරනු ලැබේ. ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය සහ තොග වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමට දැරූ අනෙකුත් පිරිවැය රන් තොගවල පිරිවැය තුළ අඩංගු වේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් විකිණීම සඳහා සුදානම් කිරීමට ඇස්තමේන්තු කල වියදම් අඩු කල පසු අගයයි.

සේවක ප්‍රතිලාභ වත්කම්

ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම අරමුදලේ සහ 2014 ලංකා බැංකු විශ්‍රාම වැටුප් අරමුදලෙහි ශුද්ධ ප්‍රතිලාභ වත්කම් වලින් සේවක ප්‍රතිලාභ වත්කම් නියෝජනය කරයි. වැඩිදුර විස්තර සටහන් 48 "සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්" මඟින් දක්වා ඇත.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
අතැති පරිභෝජන තොගය		1,172,243	927,014	1,235,588	1,023,662
කලින් ගෙවූ සේවක පිරිවැය		28,662,256	19,419,943	28,662,256	19,419,943
මාර්ගස්ථ චෙක්පත් - දේශීය		9,302,509	2,467,486	9,302,509	2,467,486
මාර්ගස්ථ චෙක්පත් - විදේශීය		4,808	7,974	4,808	7,974
ආපසු ලැබිය යුතු ආදායම් බදු	45	-	-	2,774	17,312
අතැති රන් සංචිත හා රන් කාසි		184,026	237,624	184,026	237,624
ශුද්ධ සේවක ප්‍රතිලාභ වත්කම්	48	18,884,191	20,526,202	18,884,191	20,526,202
වෙනත්		54,064,200	52,863,741	54,645,652	53,576,395
මුළු වෙනත් වත්කම්		112,274,233	96,449,984	112,921,804	97,276,598

39 බැංකුවලට ගෙවිය යුතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නොස්ට්‍රෝ ගිණුම්වල බැර ශේෂයන් සහ බැංකුවලින් ලබා ගත් කෙටි කාලීන ණයවල බැර ශේෂයන් බැංකුවලට ගෙවිය යුතු ශේෂයන් නියෝජනය කරයි. මේවා මූලිකවම සාධාරණ අගයට හඳුනා ගනී. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, සඵල පොළී අනුපාත පදනම මත ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කරනු ලැබේ. සඵල පොළී අනුපාතිකයෙහි සංකලිත කොටසක් වශයෙන් ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි "පොළී වියදම" (සටහන 8.2) යටතේ ඇතුළත් වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
වෙනත් බැංකුවලට අයිති තැන්පතු	938,301	1,626,196	938,301	1,626,196
බැංකු අයිරා	2,109,431	9,888,701	2,224,162	9,921,518
බැංකුවලට ගෙවිය යුතු අයිතමයන්හි එකතුව	3,047,732	11,514,897	3,162,463	11,547,714

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

40 ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය වෙත ප්‍රමාණාත්මක සහ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභයන් රඳවා ගනිමින්, නිශ්චිත අනාගත දිනයක දී ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක් මත විකුණනු ලබන සුරැකුම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර කරනු නොලැබේ. මෙම ගනුදෙනු මත ලද මුදල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආපසු ලබාදීමට අනුරූප වගකීමක් සහිත වත්කමක් ලෙස හඳුනාගනු ලබන අතර, එය ගනුදෙනුවේ ආර්ථිකමය යථා ස්වභාවය මත වගකීම උපචිත පොළිය ද සහිතව සමූහයේ ණය වගකීමක් ලෙස විදහා දැක්වේ. විකුණුම් සහ ප්‍රතිමිලදී ගැණුම් මිල අතර අන්තරය පොළී වියදම ලෙස සලකන අතර, ප්‍රතිමිලට ගැණුම් ගිවිසුමේ ආයු කාලය තුළ එය ක්‍රමක්ෂය වන පරිදි සඵල පොළී අනුපාතිකය යටතේ ගිණුම් ගත කෙරේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
බැංකු සමඟ	1,720,373	134,550,201	1,087,073	134,270,402
වෙනත් ගනුදෙනුකරුවන් සමඟ	76,742,697	45,668,342	76,742,697	45,668,342
මුළු ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	78,463,070	180,218,543	77,829,770	179,938,744

41 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව හෙජින් ගිවිසුම් යටතේ හෙජින් උපකරණ ලෙස හඳුනා නොගන්නා බැංකුව ඇති කර ගන්නා ගිවිසුම්වලින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වේ.

ව්‍යුත්පන්න උපකරණ සාධාරණ අගයට වාර්තා කරනු ලබන අතර, ඒවායේ සාධාරණ අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙස වාර්තා කරනු ලබයි. ව්‍යුත්පන්න උපකරණවල සාධාරණ අගයේ වෙනස් වීම "වෙළඳපොළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)" (සටහන් 10) ඇතුළත් වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
විදේශීය මුදල් ව්‍යුත්පන්න				
ඉදිරි විනිමය ගිවිසුම්	79,062	585,333	79,062	585,333
මුදල් හුවමාරු ගිවිසුම්	2,090,140	335,700	2,090,140	335,700
මුළු ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	2,169,202	921,033	2,169,202	921,033

42 ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා පොළී රහිත තැන්පතු, ඉතුරුම් තැන්පතු, කාලීන තැන්පතු, ඉල්ලූ විට ගෙවිය යුතු තැන්පතු සහ තැන්පතු සහතිකවලින් ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු ශේෂය සමන්විත වේ. සමූහය විසින් ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ වගකීම් හැර, සඵල පොළී අනුපාත පදනම යටතේ තැන්පතු ක්‍රමක්ෂය පිරිවැයට මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව හඳුනා ගනී. සඵල පොළී ක්‍රමක්ෂය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි "පොළී වියදම" (සටහන 8.2) යටතේ ඇතුළත් වේ.

42.1 තැන්පතු වර්ගය අනුව

දෙසැම්බර් 31 දිනට	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000
දේශීය මුදල් තැන්පතු				
ජංගම ගිණුම් තැන්පතු	180,592,681	174,674,605	180,048,039	174,245,474
ඉතුරුම් තැන්පතු	1,034,735,718	558,213,697	1,035,696,345	558,984,668
කාලීන තැන්පතු	1,695,628,262	1,558,730,483	1,714,698,285	1,576,815,334
වෙනත් තැන්පතු	4,035,128	4,785,426	4,042,100	4,785,426
මුළු දේශීය මුදල් තැන්පතු	2,914,991,789	2,296,404,211	2,934,484,769	2,314,830,902
විදේශීය මුදල් තැන්පතු				
ජංගම ගිණුම් තැන්පතු	50,829,782	56,168,342	51,778,862	57,356,149
ඉතුරුම් තැන්පතු	174,171,409	189,799,490	174,970,315	190,755,490
කාලීන තැන්පතු	738,711,301	786,788,397	744,818,698	789,642,062
වෙනත් තැන්පතු	3,528,042	5,613,821	3,528,042	5,613,821
මුළු විදේශීය මුදල් තැන්පතු	967,240,534	1,038,370,050	975,095,917	1,043,367,522
මුළු තැන්පතු	3,882,232,323	3,334,774,261	3,909,580,686	3,358,198,424

42.2 මුදල් ඒකකය අනුව

දෙසැම්බර් 31 දිනට	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000
ශ්‍රී ලංකා රුපියල් (LKR)	2,914,991,789	2,296,404,211	2,934,484,769	2,314,830,902
ඇමරිකානු ඩොලර් (USD)	847,884,778	914,129,417	847,900,906	914,141,915
මහා බ්‍රිතාන්‍ය පවුම් (GBP)	52,998,951	58,144,433	60,810,245	63,096,794
මාලදිවයින් රුෆියා (MVR)	21,677,540	18,382,271	21,677,540	18,382,271
සීෂෙල්ස් රුපියල් (SCR)	3,323,312	2,611,922	3,323,312	2,611,922
යුරෝ (EUR)	16,257,495	18,344,077	16,266,078	18,362,504
ඕස්ට්‍රේලියානු ඩොලර් (AUD)	11,700,572	12,679,056	11,700,572	12,679,056
ඉන්දියානු රුපියල් (INR)	9,545,387	10,282,833	9,545,387	10,282,833
වෙනත් මුදල්	3,852,499	3,796,041	3,871,877	3,810,227
මුළු තැන්පතු	3,882,232,323	3,334,774,261	3,909,580,686	3,358,198,424

සටහන : තැන්පතුවල කල්පිරීමේ විශ්ලේෂණය සටහන් අංක 60 මඟින් දක්වා ඇත.

43 ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නිත්‍ය ණය පහසුකම්, දේශීය හා විදේශීය බැංකුවලින් හා වෙනත් මූල්‍ය ආයතනවලින් ලබා ගත් කාලීන ණය සහ ප්‍රතිමූල්‍ය ණය වලින් වෙනත් ණය ගැනීම් සමන්විත වේ. මූලික හඳුනා ගැනීමේදී වෙනත් ණය ගැනීම් සාධාරණ අගයට පොත්වල හඳුනා ගන්නා අතර පසුව සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) යොදා ගනිමින් ක්‍රමක්ෂය පදනමට හඳුනා ගනු ලැබේ. ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී මූල්‍ය උපකරණයට අදාළ අධි මිල, වට්ටම් සහ ගනුදෙනු පිරිවැය මෙහි සඵල පොළී අනුපාතිකය තුළ ඇතුළත් වේ. සඵල පොළී අනුපාතිකය යටතේ ගණනය කරන ලද ක්‍රමක්ෂය වියදම්, "පොළී වියදම්" (සටහන 8.2) යටතේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
නිත්‍ය ණය දීමේ පහසුකම	-	294,055,219	-	294,055,219
ශ්‍රී ලංකාවේ බැංකු හා වෙනත් මූල්‍ය ආයතන වලින් ගත් කෙටිකාලීන ණය	-	-	1,168,008	628,373
විදේශීය බැංකුවලින් ගත් කාලීන ණය	25,989,374	83,925,643	26,557,602	89,670,712
ශ්‍රී ලංකාවේ බැංකු හා වෙනත් මූල්‍ය ආයතන වලින් ගත් කාලීන ණය	-	2,617,349	190,269	2,837,947
ප්‍රතිමූල්‍ය ණය	7,676,862	9,891,332	7,676,862	9,891,332
මුළු වෙනත් ණය ගැනීම්	33,666,236	390,489,543	35,592,741	397,083,583

44 නිකුත් කළ ණය සුරුකුම්පත්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

දිගු කාලීන අරමුදල් අවශ්‍යතා සඳහා ලබා ගන්නා ලද ණය, නිකුත් කළ ණය සුරුකුම් යටතේ දැක්වේ. මෙම ණය ගිවිසුම් වලට අනුව අදාළ ණය උපකරණයන්ගේ වටිනාකමට සරිලන ලෙස මුදල් වෙනත් වත්කමක් හෝ තම ස්කන්ධ කොටස් ප්‍රමාණයක් අදාළ පාර්ශ්වයන් වෙත ගෙවීමේ වගකීමට සමූහය බැඳී සිටී. නිකුත් කළ ණය සුරුකුම් මූලිකව සාධාරණ අගයට පොත්වල හඳුනා ගන්නා අතර, පසුව සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) යොදා ගනිමින් ක්‍රමක්ෂය පදනමට හඳුනා ගනු ලැබේ. ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී මූල්‍ය උපකරණයට අදාළ අධි මිල, වට්ටම් සහ ගනුදෙනු පිරිවැය මෙම සඵල පොළී අනුපාතිකය තුළ ඇතුළත් වේ. සඵල පොළී අනුපාතිකය යටතේ ගණනය කරන ලද ක්‍රමක්ෂය වියදම, "පොළී වියදම" (සටහන 8.2) තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ජ්‍යේෂ්ඨ ණයකර	44.1	-	-	730,839	58,807
මුළු නිකුත් කළ ණය සුරුකුම්		-	-	730,839	58,807

සටහන : ණය සුරුකුම්වල කල්පිරීමේ විශ්ලේෂණය සටහන් අංක 60 මඟින් දක්වා ඇත.

44.1 ජ්‍යේෂ්ඨ ණයකර

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ලැයිස්තුගත ණයකර				
සුරුකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර, එකක් රු. 100/-	-	-	730,839	58,807
මුළු නිකුත් කළ ණය සුරුකුම්	-	-	730,839	58,807

44.2 ජ්‍යෙෂ්ඨ ණයකරවල සංචලනය

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	-	-	58,807	2,107,182
වර්ෂය තුළදී නිකුත් කිරීම්	-	-	622,830	67,700
නිදහස් කිරීම්	-	-	-	(2,107,182)
ක්‍රමක්ෂය ගැලපුම්	-	-	49,202	(8,893)
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	730,839	58,807

44.3 ජ්‍යෙෂ්ඨ ණයකර

දෙසැම්බර් 31 දිනට අගය	සටහන	පොළිය ගෙවිය යුතු වාර ගණන	නිකුත් කළ දිනය	පරිණත වන දිනය	කූපන් අනුපාතය		බැංකුව		සමූහය	
					2023 %	2022 %	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ස්ථාවර පොළී අනුපාත										
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	වාර්ෂික	16.11.2022	15.11.2027	29.50	24.00	-	-	22,894	24,472
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	අර්ධ වාර්ෂික	16.11.2022	15.11.2027	28.00	23.50	-	-	31,132	34,335
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	වාර්ෂික	10.04.2023	09.04.2028	29.50	-	-	-	315,719	-
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	අර්ධ වාර්ෂික	10.04.2023	09.04.2028	28.00	-	-	-	254,259	-
සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර	(අ)	කල් පිරිමේදී	10.04.2023	09.04.2028	30.00	-	-	-	106,835	-
මුළු නිකුත් කළ ණය සුරැකුම්							-	-	730,839	58,807

සටහන:

(අ) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත ණයකර වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

45 ප්‍රවර්තන බදු වගකීම්

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	6,523,443	647,993	6,836,397	978,532
ප්‍රවර්තන බදු වියදම	13,110,855	13,550,460	13,950,967	13,774,530
වර්ෂය තුළදී සිදු කළ ගෙවීම්	(12,124,580)	(5,500,380)	(12,604,215)	(5,796,331)
ද්විත්ව බදු සහන සහ බදු බැර	(3,091,907)	(2,133,684)	(3,285,976)	(1,961,485)
පෙර වසර සඳහා සහ වෙනත් ගැලපුම්	3,203,864	(40,946)	2,977,524	(141,537)
දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	7,621,675	6,523,443	7,874,697	6,836,397
ප්‍රවර්තන බදු වත්කම්	-	-	2,774	17,312
ප්‍රවර්තන බදු වගකීම්	7,621,675	6,523,443	7,877,471	6,853,709
ප්‍රවර්තන බදු වගකීම්/(වත්කම්)	7,621,675	6,523,443	7,874,697	6,836,397

46 රක්ෂණ ගිවිසුම් වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ජීවිත රක්ෂණ ගිවිසුම් මත වගකීම්

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනත මඟින් විස්තර කරනු ලබන, දළ වාරික තක්සේරු ක්‍රමය භාවිතයෙන් මෙම වගකීම් මිනුම්කරණය කරනු ලැබේ. අනාගත අපේක්ෂිත ප්‍රතිලාභයන්, හිමිකම් පෑමේ හා ඔප්පු කළමනාකරණයන්හි වියදම්, ඔප්පු හිමියන්ගේ විකල්ප අවස්ථා සහ ඇපවීම් යන වටිනාකම්හි වට්ටම් කළ අගයෙන් අනාගත මුදල් ප්‍රවාහයන්ගේ පිටතට ගලායාම් පියවීම සඳහා අවශ්‍ය වන අපේක්ෂිත සෛද්ධාන්තික වාරිකයන් හි වට්ටම් කළ අගය අඩුකළ පසු ලැබෙන ශේෂය වගකීම ලෙස සැලකේ. වගකීම් වාර්තා කිරීමේ දී වර්තමානයේ වන උපකල්පනයන් හෝ ගිවිසුම ආරම්භයේ දී වූ උපකල්පනයන් යොදා ගැනෙන අතර, අවදානම හෝ හානිකරණ අපගමනයන් උදෙසා යම් ගැලපීමක් කෙරේ.

පවත්නා වගකීම් ප්‍රමාණාත්මතාවය මැනීමේ පරීක්ෂණය මඟින් සෑම වාර්තාකරණ දිනකටම හඳුනාගත් ජීවිත රක්ෂණ වගකීමෙහි ප්‍රමාණාත්මතාවය පිළිබඳව තක්සේරුවක් කරනු ඇත.

වගකීම් ප්‍රමාණාත්මතාවය මැනීමේ පරීක්ෂණය (LAT)

පවත්නා වගකීම් ප්‍රමාණාත්මකතාවය මැනීමේ පරීක්ෂණය මඟින් සෑම වාර්තාකරණ දිනකටම ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 4 - "රක්ෂණ ගිවිසුම්" මඟින් නියාමනය කර ඇති පරිදි හඳුනාගත් ජීවිත රක්ෂණ වගකීමෙහි ප්‍රමාණාත්මකතාවය පිළිබඳව තක්සේරුවක් කරනු ඇත. අනාගත ප්‍රතිලාභයන් සහ වියදම් දැරීමට ප්‍රමාණවත් වන පරිදි වගකීම් සඳහා ගැලපීම් සිදු කෙරේ.

වගකීම් සඳහා ප්‍රමාණාත්මක වෙන් කිරීම ස්ථාපනය කිරීම මඟින් ඇති වන ඌනතාවය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගැනේ.

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් මත වගකීම්

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම්වල වගකීම් හඳුනාගනු ලබන්නේ අදාළ ගිවිසුමට ඇතුළත්ව වාරික අයකර ගැනීම සිදු කළ විටදීය. වාර්තා කරන දිනට ගෙවිය යුතු හිමිකම්පෑම් හි ඇස්තමේන්තුගත අවසාන පිරිවැය සටහන් කළ හෝ නොකළ හිමිකම්පෑම් වෙනුවෙන් වන කළමනාකරණ ගාස්තු හා වියදම්වලින් යම් ප්‍රතිගෙවීමක් හෝ ශේෂ වූ ද්‍රව්‍ය මඟින් පියවා ගැනීමක් වේ නම් එය අඩුකර ලැබෙන අගයට සිදු කරන ප්‍රතිපාදන මේ යටතේ වන වගකීම් ලෙස සටහන් කරනු ඇත. යම් හිමිකම්පෑම් සම්බන්ධයෙන් දැනුම්දීම් සහ තක්සේරු කිරීම්වල සිදුවන ප්‍රායෝගික ප්‍රමාදවීම් මත වාර්තාකරණ දින වනවිට එම හිමිකම්පෑමෙහි වටිනාකම නිශ්චිතවම තහවුරු වී නොතිබීමට පුළුවන. එබැවින් වාර්තාකරණ දිනට වන වගකීම ප්‍රත්‍යක්ෂ මූලික දත්ත සහ අවදානම් වෙනසට ගැලපුම් ද සැලකිල්ලට ගෙන සකස් කරන ලද ආයුගණක හිමිකම්පෑමේ ප්‍රක්ෂේපන ක්‍රමය මඟින් තීරණය කෙරේ. වගකීම් මුදලේ කාල අගයට ගැලපීමක් නොකරන අතර සමතකරණයන් සහ විපත්තීන් සඳහා ද ප්‍රතිපාදන වෙන් නොකෙරේ. ගිවිසුම අවසන්වීම මත හෝ කල්පිරීම මත හෝ අවලංගුවීම මත ඒ හා බැඳි වගකීම ගිණුම්වලින් බැහැර කෙරේ.

වගකීම් ප්‍රමාණාත්මකතාවය මැනීමේ පරීක්ෂණය (LAT)

උපයා නොගත් වාරික සඳහා වන ප්‍රතිපාදනයන් මඟින් මෙතෙක් අවදානම උදෙසා වන බැඳීමෙහි කාලය ඉක්ම නොවූ ගිවිසුම් මත ලද වාරික නිරූපණය වන අතර සාමාන්‍යයෙන් සංචිතය, ගිවිසුමේ කොන්දේසි මත නිදහස් කෙරෙන අතර, එය වාරික ආදායම ලෙස හඳුනාගනී. සෑම වාර්තාකරණ දිනයකටම සමූහය එහි කල් ඉකුත්නොවූ ගිවිසුම්වල අවදානම් මත වන වගකීම පිළිබඳ පරීක්ෂාවට ලක් කරයි.

මෙම ගණනය කිරීමට රක්ෂණ - ජීවිත නොවන තාක්ෂණික විධිවිධානවලට අදාළ වත්කම් මත පැන නඟින ආයෝජන ප්‍රතිලාභය සලකා බැලීමෙන් පසු අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවල වර්තමාන ඇස්තමේන්තු භාවිතා කරයි. මෙහි දී උපයා නොගත් වාරිකවල ධාරණ අගයෙහි ඇස්තමේන්තුගත අගය (සම්බන්ධිත විලම්බිත ගැනුම් පිරිවැය අඩු කර) ප්‍රමාණාත්මක නොවන බව පෙනීයයි නම් වගකීම්වල ප්‍රමාණාත්මකතාවය සඳහා වන ප්‍රතිපාදනයන් වැඩි කරමින් එම වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ.

46.1 රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත

	සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	355,190	413,743
ජීවිත රක්ෂණ අරමුදලේ වැඩිවීම/(අඩුවීම)	23,602	(105,016)
සාධාරණ වටිනාකම් සංචිතය	(18,463)	6,814
හිමිකම් නොපෑ ප්‍රතිලාභ	(723)	39,649
දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	359,606	355,190

46.2 රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත නොවන

	සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
ඔප්පු හිමියන්ගෙන් වාර්තා වූ හිමිකම් සඳහා ප්‍රතිපාදන	373,695	363,604
ඇතිවූ නමුත් මෙතෙක් වාර්තා නොවූ හිමිකම් සඳහා ප්‍රතිපාදන (IBNR)	41,497	44,414
හිඟහිටි හිමිකම් ප්‍රතිපාදන	415,192	408,018
නොඉපයූ වාරික සඳහා ප්‍රතිපාදන	256,536	254,755
මුළු රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත නොවන	671,728	662,773

47 වෙනත් වගකීම්

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
නිෂ්කාශනය සඳහා යැවූ චෙක්පත්		690,217	2,948,898	690,217	2,948,898
කල්බදු ණය හිමියන්					
මාස 12 ඇතුළත		139,269	646,877	168,355	686,801
මාස 12 ට පසු		2,559,551	1,760,312	1,481,758	1,141,835
සේවක ප්‍රතිලාභ වගකීම් - ශුද්ධ	48	44,560,774	28,360,338	45,018,752	28,716,772
වෙනත්		40,191,736	60,359,225	42,476,727	62,930,924
මුළු වෙනත් වගකීම්		88,141,547	94,075,650	89,835,809	96,425,230

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48 සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

කර්මාන්ත ප්‍රතිලාභ යටතේ ලංකා බැංකුව තනිවම අරමුදල් සපයන විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රමයන් බැංකුව තුල ඇත. තවද, සාමාජිකයින් විසින් ස්ථාපනය කරනු ලැබූ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල වශයෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ද ඇත.

මෙම විශ්‍රාම සැලසුම් තුනෙහිම වත්කම් බැංකුවේ වත්කම්වලින් ස්වාධීන වූ කළමනාකරණයෙන් සහ සේවකයින්ගෙන් සැදුම්ලත් භාරකාර මණ්ඩලයක්/කළමනාකරුවන් විසින්, එක් එක් අරමුදලේ ඇති භාරකාර ඔප්පුව/රෙගුලාසි අනුව පරිපාලනය කෙරේ.

මෙම අරමුදල් බැංකුවේ විගණනයෙන් ස්වාධීන වූ සාමාජිකයන් විසින් පත්කරනු ලබන වරලත් ගණකාධිකාරී ආයතනයක් විසින් වාර්ෂිකව විගණනයට භාජනය කරන අතර, මෙම අරමුදල් පාලනයට අදාල වූ රෙගුලාසි අනුව ආයුගණන තක්සේරුවක් කරනු ලැබේ.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම්					
ලංකා බැංකු විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල	48.1.3	42,665,507	26,738,169	42,665,507	26,738,169
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	48.3	792,280	667,703	1,250,258	1,024,137
අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා ප්‍රතිපාදන	48.5	1,102,987	954,466	1,102,987	954,466
මුළු ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම		44,560,774	28,360,338	45,018,752	28,716,772
ශුද්ධ සේවක ප්‍රතිලාභ වත්කම්					
ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල	48.2.3	9,024,137	10,060,347	9,024,137	10,060,347
ලංකා බැංකු විශ්‍රාම වැටුප් අරමුදල - 2014	48.4.3	9,860,054	10,465,855	9,860,054	10,465,855
මුළු ශුද්ධ සේවක ප්‍රතිලාභ වත්කම්		18,884,191	20,526,202	18,884,191	20,526,202

48.1 ලංකා බැංකු විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල

ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල, අරමුදල් සපයනු ලබන, දායක මුදල් අය නොකරන නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි. බැංකුවෙහි අවම වශයෙන් වසර දහයක අඛණ්ඩ සේවා කාලයක් ඇති විශ්‍රාම ගැනීමේ වයස් සීමාව වන වයස අවුරුදු 55 දී හෝ ඉන්පසු විශ්‍රාම ගැනීමේදී හෝ ඊට පෙරාතුව සෞඛ්‍ය හේතු මත විශ්‍රාම ගන්නා වූ බැංකුවේ සේවකයින් සඳහා යාව ජීව විශ්‍රාම වැටුපක් ගෙවීම සඳහා මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. විශ්‍රාම වැටුප, සමහර දීමනා අත්හැර සේවකයා විසින් අවසාන වරට ලැබූ වැටුපෙහි ප්‍රතිශතයක් මත පදනම් වේ.

විශ්‍රාම වැටුප් භාර අරමුදලට දායක මුදල් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකුගේ උපදෙස්වලට අනුව බැංකුව විසින් මාසිකව ගෙවනු ලබේ. වර්තමානයේ එය දළ වැටුපෙන් 56.8% කි. මෙම අරමුදල වසරකට වරක් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් අගය කර ඇත. මෙම අරමුදල රජය විසින් අනුමත කර ඇති අතර, ස්වාධීනව පරිපාලනය කරයි. පරිපාලිතයන්ගේ හෝ ආශ්‍රිත සමාගම් වල විශ්‍රාම අරමුදල් ක්‍රියාත්මක කරනු නොලැබේ.

සී/ස ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන් (පෞද්ගලික) සමාගම විසින් 2023 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදලේ ආයුගණක තක්සේරුව සිදුකර ඇත.

මෙම තක්සේරුව කරන ලද්දේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - ලං.ගි.ප්‍ර. - 19 "සේවක ප්‍රතිලාභ" නිර්දේශ කරන "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" පාදකවයි. 1996 ජනවාරි 1 දිනට පෙර බැංකුවට බැඳුණු සියළු ස්ථිර සේවකයන්ට මෙම ප්‍රතිලාභය හිමිවේ. විශ්‍රාම භාරකාර අරමුදලේ ආයුගණක තක්සේරුවේ ප්‍රතිඵල සාරාංශය පහත වේ.

48.1.1 ශුද්ධ ප්‍රතිලාභ වියදම (සේවක පිරිවැය යටතේ හඳුනා ගන්නා)

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000
ප්‍රවර්තන සේවා පිරිවැය	83,724	148,893
ශුද්ධ පොළී වියදම	4,812,871	2,365,284
ශුද්ධ ප්‍රතිලාභ වියදම	4,896,595	2,514,177

48.1.2 වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා අගයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම් හි ආයුගණක (ලාභ)/අලාභ	19,950,025	859,487
සැලසුම්ගත වත්කම්හි ආයුගණක තක්සේරුව මත (ලාභ)/අලාභ	(7,767,826)	3,098,205
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා ආයුගණක තක්සේරුව මත ශුද්ධ (ලාභ)/අලාභ	12,182,199	3,957,692

48.1.3 ශුද්ධ විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

		බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය	48.1.4	51,144,443	44,663,506
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	48.1.5	93,809,950	71,401,675
ශුද්ධ විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම		42,665,507	26,738,169

48.1.4 සැලසුම්ගත වත්කම්හි සාධාරණ අගයෙහි වෙනස්වීම්

	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	44,663,506	50,384,695
අපේක්ෂිත ප්‍රතිලාභය	8,039,431	5,542,317
සේවායෝජකයාගේ දායකත්වය	1,151,456	1,236,285
ගෙවන ලද ප්‍රතිලාභ	(10,477,776)	(9,401,586)
සැලසුම්ගත වත්කම්හි ආයුගණක තක්සේරුව මත ලාභ/(අලාභ)	7,767,826	(3,098,205)
දෙසැම්බර් 31 දිනට ශේෂය	51,144,443	44,663,506

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48.1.5 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙහි වෙනස්වීම්

	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	71,401,675	71,887,280
පොළී පිරිවැය	12,852,302	7,907,601
ප්‍රවර්තන සේවා පිරිවැය	83,724	148,893
ගෙවන ලද ප්‍රතිලාභ	(10,477,776)	(9,401,586)
උපකල්පනයන්හි වෙනස්වීම් මත (ලාභ)/අලාභ	23,293,538	(22,346,040)
බැඳීම්වල ආයුගණක තක්සේරුව මත (ලාභ)/අලාභ	(3,343,513)	23,205,527
දෙසැම්බර් 31 දිනට ශේෂය	93,809,950	71,401,675

තක්සේරු දිනට ක්‍රියාකාරී සේවකයින් සහ විශ්‍රාමිකයින්ට අදාළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වලට අදාළ වර්තමාන අගය පිළිවෙලින් රු. මිලියන 3,677.7 සහ රු. මිලියන 90,132.3 ක් වේ.

48.1.6 සැලසුම්ගත වත්කම් පහත දැවලින් සමන්විත වේ:

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
ස්ථාවර තැන්පතු	41,941,651	33,880,775
භාණ්ඩාගාර බැඳුම්කර	-	3,119,344
ණයකර	2,900,525	4,131,592
කොටස්වල ආයෝජන	5,141,011	2,630,160
වෙනත්	1,161,256	901,635
මුළු සැලසුම්ගත වත්කම්	51,144,443	44,663,506

48.1.7 ආයුගණක උපකල්පනයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 %	2022 %
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය	වාර්ෂිකව 10.00	වාර්ෂිකව 15.00
ජීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 8.00	වාර්ෂිකව 8.00
විශ්‍රාම ගෙවීම්වල වැඩිවීම (මූලික)	වාර්ෂිකව 1.75	වාර්ෂිකව 1.75
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 13.00	වාර්ෂිකව 18.00
සේවය හැරයාමේ අනුපාතිකය	නැත	නැත

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2006-2008) භාවිතා කර ඇත.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයට ඇති කරන බලපෑම පහත පෙන්නුම් කෙරේ:

	බැංකුව/සමූහය	
	0.5% වැඩිවීම රු. '000	0.5% අඩුවීම රු. '000
වට්ටම් අනුපාතය	90,818,577	96,987,303
වැටුප් වර්ධක	93,843,551	93,776,944
ජීවන වියදම් දීමනාව	96,217,355	91,534,611

තවදුරටත්, ප්‍රතිලාභ ගෙවීම් සඳහා අපේක්ෂිත ඉතිරි වසර ගණන වසර 7.4 කි.

අනාගත වර්ෂවලදී මෙම විශ්‍රාම වැටුප් භාරකාර අරමුදලෙන් පහත සඳහන් ගෙවීම් සිදු කිරීමට අපේක්ෂා කරයි.

දෙසැම්බර් 31 දිනට	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ඉදිරි මාස 12 තුළ	9,965,676	9,657,728
වසර 1 සහ 5 අතර	38,297,398	33,257,597
වසර 5 සහ 10 අතර	23,122,645	16,610,499
වසර 10 කට වැඩි	22,424,231	11,875,851
අපේක්ෂිත මුළු ගෙවීම්	93,809,950	71,401,675

48.2 ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල

1996 ජනවාරි 1 වන දිනට පෙර බැංකුවට බැඳුණු බැංකු සේවකයින් තම දළ වැටුපෙන් 8% ක මාසික දායකත්වය දැරූ ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි අර්ථලාභීන්ට ගෙවීම් කිරීමට බැංකුව බැඳී සිටින අතර, එම ගෙවීම සහතික කෙරේ. මෙම අරමුදලට අබණ්ඩව අවුරුදු පහක් තුළ දායක මුදල් ගෙවනු ලැබූ සේවකයෙකු සේවයේ යෙදී සිටියදී මියගියහොත් එම සේවකයාගේ අර්ථලාභීන් වෙනුවෙන් බැංකුවට වගකීමක් ඇති වේ. තවද විශ්‍රාමිකයෙකු මියගිය විටදී ඔහුගේ/ඇයගේ අර්ථලාභීන්ට මාසික වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපක් ගෙවීමට බැංකුව බැඳී සිටී. සේවයේ යෙදී සිටියදී මියයන සේවකයෙකු වෙනුවෙන් ඔහුගේ/ඇයගේ අර්ථලාභීන්ට හිමිවන විශ්‍රාම වැටුප, සමහර දීමනා රහිතව ඔහු/ඇය විසින් අවසාන වරට ලැබූ වැටුප මත පදනම් වේ.

2023 දෙසැම්බර් 31 දිනට සී/ස ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන් (පෞද්ගලික) සමාගම විසින් මෙම වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ ආයුගණක තක්සේරුව සිදු කර ඇත. ආයුගණක, භාරකරුවන් හා අර්ථලාභීන්ගේ උපදේශනයෙන් අරමුදල් සම්පාදනය කරයි.

මෙම අරමුදල රජය විසින් අනුමත කොට ඇති අතර, ස්වාධීනව පරිපාලනය කෙරේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - ලං. ගි. ප්‍ර. - 19 "සේවක ප්‍රතිලාභ" නිර්දේශ කරන "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කරමින් මෙම ආයුගණක තක්සේරුව කර ඇත. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා ආයුගණක තක්සේරු ප්‍රතිඵල පහත සාරාංශ ගත කර ඇත.

48.2.1 ශුද්ධ ප්‍රතිලාභ වියදම (සේවක පිරිවැය යටතේ හඳුනා ගන්නා)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ප්‍රවර්තන සේවා පිරිවැය	3,597	8,285
ශුද්ධ පොළී ආදායම	(1,810,862)	(1,328,039)
ශුද්ධ ප්‍රතිලාභ වියදම / (ආදායම)	(1,807,265)	(1,319,754)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48.2.2 වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා අගයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්හි ආයුගණක තක්සේරුව මත (ලාභ)/අලාභ	8,570,729	2,443,015
සැලසුම්ගත වත්කම්හි ආයුගණක තක්සේරුව මත (ලාභ)/අලාභ	(5,688,999)	629,318
ආයුගණක තක්සේරුව මත ආයුගණක (ලාභ)/අලාභ	2,881,730	3,072,333

48.2.3 විශ්‍රාමික ප්‍රතිලාභ වත්කම්

		බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය	48.2.4	37,901,108	29,011,391
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	48.2.5	(28,876,971)	(18,951,044)
විශ්‍රාමික ප්‍රතිලාභ වත්කම්		9,024,137	10,060,347

48.2.4 සැලසුම්ගත වත්කම්හි සාධාරණ අගයෙහි වෙනස්වීම

	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	29,011,391	28,076,481
අපේක්ෂිත ප්‍රතිලාභ	5,222,050	3,172,642
සැලසුම සඳහා ගෙවන ලද දායකත්වය	38,255	60,366
ගෙවන ලද ප්‍රතිලාභ	(2,059,587)	(1,668,780)
සැලසුම්ගත වත්කම්හි ආයුගණක තක්සේරුව මත ලාභ/(අලාභ)	5,688,999	(629,318)
දෙසැම්බර් 31 දිනට ශේෂය	37,901,108	29,011,391

48.2.5 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙහි වෙනස්වීම්

	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	18,951,044	16,323,921
පොළී පිරිවැය	3,411,188	1,844,603
ප්‍රවර්තන සේවා පිරිවැය	3,597	8,285
ගෙවන ලද ප්‍රතිලාභ	(2,059,587)	(1,668,780)
බැඳීම් මත ආයුගණක (ලාභ)/අලාභ	(452,310)	8,900,020
උපකල්පනයන්හි වෙනස්වීම මත (ලාභ)/අලාභ	9,023,039	(6,457,005)
දෙසැම්බර් 31 දිනට ශේෂය	28,876,971	18,951,044

තක්සේරු දිනට ක්‍රියාකාරී සේවකයින්, විශ්‍රාමිකයන් සහ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් කියන විශ්‍රාමික පවුල් සාමාජිකයන්ට අදාළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වලට අදාළ වර්තමාන අගය පිළිවෙලින් රු. මිලියන 236.9, රු. මිලියන 8,836.0 සහ රු. මිලියන 19,804.0 ක් වේ.

48.2.6 සැලසුම්ගත වත්කම් පහත දැ වලින් සමන්විත වේ:

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
ස්ථාවර තැන්පතු	37,899,905	26,822,116
ණයකර	-	2,187,743
වෙනත්	1,203	1,532
මුළු සැලසුම්ගත වත්කම්	37,901,108	29,011,391

48.2.7 ආයුගණක උපකල්පනයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 %	2022 %
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය	වාර්ෂිකව 10.00	වාර්ෂිකව 15.00
ජීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 8.00	වාර්ෂිකව 8.00
වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම ගෙවීම්වල වැඩිවීම (මූලික)	නැත	නැත
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 13.00	වාර්ෂිකව 18.00
සේවය හැරයාමේ අනුපාතිකය	නැත	නැත

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2006-2008) භාවිතා කර ඇත.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම මඟින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයට ඇති කරන බලපෑම පහත පෙන්නුම් කෙරේ.

	බැංකුව/සමූහය	
	0.5% වැඩිවීම රු. '000	0.5% අඩුවීම රු. '000
වට්ටම් අනුපාතය	27,672,432	30,173,454
වැටුප් වර්ධක	28,877,831	28,876,124
ජීවන වියදම් දීමනාව	30,079,913	27,754,930

තවදුරටත්, ප්‍රතිලාභ ගෙවීම් සඳහා අපේක්ෂිත ඉතිරි වසර ගණන වසර 9.7 කි.

අනාගත වර්ෂ වලදී මෙම අරමුදලෙන් පහත සඳහන් ගෙවීම් සිදු කිරීමට අපේක්ෂා කරයි.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
ඉදිරි මාස 12 තුළ	2,131,329	1,943,567
වසර 1 සහ 5 අතර	9,187,803	7,441,936
වසර 5 සහ 10 අතර	6,912,710	4,576,467
වසර 10 වඩා වැඩි	10,645,129	4,989,074
අපේක්ෂිත මුළු ගෙවීම්	28,876,971	18,951,044

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48.3 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ, විශ්‍රාම වැටුප් සඳහා අයත් නොවන දස වසරකට වඩා අඩු සේවා කාලයක් සහිත සේවකයින්ට පාරිතෝෂික ගෙවීම සඳහා පළමු සේවා වර්ෂයේ සිටම හිණුම් පොත්පත්වල ප්‍රතිපාදන සලසා ඇත. බලපවත්නා විශ්‍රාම අරමුදල් සඳහා හිමිකම් ලබන සේවකයින් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල ගලපා නැත. කෙසේවුවද වසර පහක සේවාකාලයකින් පසු සේවකයින් විශ්‍රාම නොගොස් වෙනත් අයුරකින් ඔවුන්ගේ සේවය නතර කරනු ලැබුව හොත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ඔවුන්ට පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇත. මෙම පාරිතෝෂිකය ගෙවනු ලබන්නේ අදාළ මුදල් වර්ෂයේ අවසාන මාසයට අදාළ වන පීවන වියදම් දීමනා සහ අනෙකුත් දීමනාද ඇතුව සේවකයාගේ මූලික මාසික හෝ ඒකාබද්ධ වැටුපෙන් අඩක් ඒ සේවකයා අඛණ්ඩ සේවය කළ එක් එක් වර්ෂය සඳහා ගණන් බැලීමෙනි.

ශ්‍රී ලංකා හිණුම්කරණ ප්‍රමිත - ලං.හි.ප්‍ර. - 19 "සේවක ප්‍රතිලාභ" අනුව නිර්දේශිත ආයුගණක තක්සේරු ක්‍රමවේදය මත පදනම්ව බැංකුව සහ එහි පරිපාලිත සමාගම් පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනය කර ඇත. පාරිතෝෂික වගකීම් සඳහා බාහිරව අරමුදල් සම්පාදනය නොකෙරේ.

2023 දෙසැම්බර් 31 දිනට සී/ස ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන් (පෞද්ගලික) සමාගම විසින් මෙම අරමුදලේ ආයුගණක තක්සේරුව සිදු කර ඇත.

ශ්‍රී ලංකා හිණුම්කරණ ප්‍රමිත - ලං.හි.ප්‍ර. 19 - "සේවක ප්‍රතිලාභ" නිර්දේශ කරන "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කරමින් මෙම ආයුගණක තක්සේරුව කර ඇත.

	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	667,703	486,334	1,024,137	882,629
වර්ෂය තුළ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) කිරීම්	173,686	105,253	273,972	180,221
ආයුගණක (ලාභ)/අලාභ	60,994	136,580	78,302	(47,995)
වර්ෂය තුළදී සිදු කළ ගෙවීම්	(110,103)	(60,464)	(117,592)	(74,417)
ගැලපුම්/පැවරුම්	-	-	(8,561)	83,699
දෙසැම්බර් 31 දිනට ශේෂය	792,280	667,703	1,250,258	1,024,137

ආයුගණනයේදී භාවිතා කරන ලද මූලික ආයුගණක උපකල්පනයන් පහත පරිදි වේ.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 %	2022 %
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය	වාර්ෂිකව 10.00	වාර්ෂිකව 15.00
පීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 8.00	වාර්ෂිකව 8.00
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 13.00	වාර්ෂිකව 18.00

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2006-2008) භාවිතා කර ඇත. තවදුරටත්, ප්‍රතිලාභ ගෙවීම් සඳහා අපේක්ෂිත ඉතිරි වසර ගණන වසර 11.3 කි.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම මඟින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන අගයට ඇති බලපෑම පහත පෙන්නුම් කෙරේ.

	බැංකුව		සමූහය	
	0.5% වැඩිවීම රු. '000	0.5% අඩුවීම රු. '000	0.5% වැඩිවීම රු. '000	0.5% අඩුවීම රු. '000
වට්ටම් අනුපාතය	754,146	833,355	1,190,081	1,315,076
වැටුප් වර්ධක	819,414	766,932	1,293,077	1,226,038
පීවන වියදම් දීමනාව	809,286	776,432	1,277,094	1,225,249

48.4 ලංකා බැංකු විශ්‍රාම අරමුදල - 2014

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිර්දේශය මත 1996 ජනවාරි 1 වෙනි දින හෝ ඊට පසු බඳවා ගත් සේවකයින් සඳහා වන මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, 2014 දෙසැම්බර් මස 16 වෙනි දින බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලැබීමට අවම වශයෙන් මාස 120 ක අඛණ්ඩ සේවා කාලයක් බැංකුව තුළ සේවය කර තිබිය යුතුය. තවද මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන්නන් සඳහා මරණ පාරිතෝෂික දීමනාව හැර බැංකුවේ පවත්නා වර්තමාන සේවා පාරිතෝෂික ක්‍රමය යටතේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ලැබීමට හැකියාවක් නොමැත. මෙම විශ්‍රාම වැටුප් භාර අරමුදලට දායක මුදල් සුදුසුකම්ලත් ආයුගණකවරයෙකුගේ උපදෙස්වලට අනුව බැංකුව විසින් මාසිකව ගෙවනු ලැබේ. වර්තමානයේ එය දළ වැටුපෙන් 12% කි.

2023 දෙසැම්බර් 31 දිනට සී/ස ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන් (පෞද්ගලික) සමාගම විසින් මෙම අරමුදලේ ආයුගණක තක්සේරුව සිදු කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - ලං.ගි.ප්‍ර. 19 - "සේවක ප්‍රතිලාභ" නිර්දේශ කරන "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කරමින් මෙම ආයුගණක තක්සේරුව කර ඇත. මෙම අරමුදල සඳහා ආයුගණක තක්සේරු ප්‍රතිඵල පහත පරිදි සාරාංශ ගත කර ඇත.

48.4.1 ශුද්ධ ප්‍රතිලාභ වියදම (සේවක පිරිවැය යටතේ හඳුනා ගන්නා)

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000
ප්‍රවර්තන සේවා පිරිවැය	317,474	717,701
ශුද්ධ පොළී ආදායම	(1,883,854)	(634,620)
ශුද්ධ ප්‍රතිලාභ වියදම	(1,566,380)	83,081

48.4.2 වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා අගයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2023 රු. '000	2022 රු. '000
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක (ලාභ)/පාඩු	5,691,442	(4,224,874)
සැලසුම්ගත වත්කම් මත ආයුගණක (ලාභ)/පාඩු	(1,859,075)	712,909
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගන්නා ආයුගණක ශුද්ධ (ලාභ)/පාඩු	3,832,367	(3,511,965)

48.4.3 විශ්‍රාම ප්‍රතිලාභ වත්කම්

		බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	2023 රු. '000	2022 රු. '000
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය	48.4.4	20,667,766	14,667,395
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	48.4.5	(10,807,712)	(4,201,540)
ශුද්ධ විශ්‍රාමික ප්‍රතිලාභ වත්කම්		9,860,054	10,465,855

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48.4.4 සැලසුම්ගත වත්කම්හි සාධාරණ අගයෙහි වෙනස්වීම

	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	14,667,395	12,512,509
අපේක්ෂිත ප්‍රතිලාභ	2,640,131	1,438,939
සේවායෝජකයාගේ දායකත්වය	1,660,186	1,518,540
ගෙවන ලද ප්‍රතිලාභ	(159,021)	(89,684)
සැලසුම්ගත වත්කම් මත ආයුගණක ලාභ/(අලාභ)	1,859,075	(712,909)
දෙසැම්බර් 31 දිනට ශේෂය	20,667,766	14,667,395

48.4.5 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙහි වෙනස්වීම්

	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	4,201,540	6,994,078
පොළී පිරිවැය	756,277	804,319
අතීත සේවා පිරිවැය	-	-
ප්‍රවර්තන සේවා පිරිවැය	317,474	717,701
ගෙවන ලද ප්‍රතිලාභ	(159,021)	(89,684)
බැඳීම් මත ආයුගණක (ලාභ)/අලාභ	(279,673)	945,849
උපකල්පනයන්හි වෙනස්වීම මත (ලාභ)/අලාභ	5,971,115	(5,170,723)
දෙසැම්බර් 31 දිනට ශේෂය	10,807,712	4,201,540

තක්සේරු දිනට ක්‍රියකාරී සේවකයින් හා විශ්‍රාමිකයින්ට අදාල නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වලට අදාල වර්තමාන අගය පිළිවෙලෙන් රු. මිලියන 10,652.2 සහ රු. මිලියන 155.5 කි.

48.4.6 සැලසුම්ගත වත්කම් පහත දැවලින් සමන්විත වේ

දෙසැම්බර් 31 දිනට	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ස්ථාවර තැන්පතු	19,841,821	13,739,827
ණයකර	824,206	916,136
වෙනත්	1,739	11,432
මුළු සැලසුම්ගත වත්කම්	20,667,766	14,667,395

48.4.7 ආයුගණක උපකල්පනයන්

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 %	2022 %
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය	වාර්ෂිකව 10.00*	වාර්ෂිකව 15.00
ජීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 8.00	වාර්ෂිකව 8.00
විශ්‍රාම ගෙවීම්වල වැඩිවීම (මූලික)	නැත	නැත
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 13.00	වාර්ෂිකව 18.00
සේවය හැරයාමේ අනුපාතිකය	නැත	නැත

* තක්සේරු කිරීමේ කාර්යය සඳහා බැංකුව වැටුප සඳහා වසරකට 10% ක වර්ධක අනුපාතයක් උපකල්පනය කර ඇත. කෙසේ වෙතත්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අනුපාත අනුව, සියළු අනාගත වර්ධක අනුපාත වැටුප සඳහා 8% දක්වා සීමා කර ඇත.

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2006-08) භාවිතා කර ඇත.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයට ඇති කරන බලපෑම පහත පෙන්නුම් කෙරේ.

	බැංකුව/සමූහය	
	0.5% වැඩිවීම රු. '000	0.5% අඩුවීම රු. '000
වට්ටම් අනුපාතය	9,721,822	11,699,437
වැටුප් වර්ධක	11,117,052	10,225,289
ජීවන වියදම් දීමනාව	11,017,098	10,319,203

තවදුරටත්, ප්‍රතිලාභ ගෙවීම් සඳහා අපේක්ෂිත ඉතිරි වසර ගණන වසර 20.7 කි.

අනාගත වර්ෂවලදී මෙම අරමුදලෙන් පහත සඳහන් ගෙවීම් සිදු කිරීමට අපේක්ෂා කරයි.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
ඉදිරි මාස 12 තුළ	76,946	50,618
වසර 1 සහ 5 අතර	810,205	520,751
වසර 6 සහ 10 අතර	1,256,707	727,835
වසර 10 වඩා වැඩි	8,663,854	2,902,336
අපේක්ෂිත මුළු ගෙවීම්	10,807,712	4,201,540

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

48.5 අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා ප්‍රතිපාදන

	බැංකුව/සමූහය	
	2023 රු. '000	2022 රු. '000
ජනවාරි 1 දිනට ශේෂය	954,466	646,064
වර්ෂය තුළ වෙන්කිරීම්/(ප්‍රතිවර්ත්‍ය) කිරීම්	171,804	73,005
ආයුගණක (ලාභ)/අලාභ	21,238	250,942
වර්ෂය තුළදී සිදු කළ ගෙවීම්	(44,521)	(15,545)
දෙසැම්බර් 31 දිනට ශේෂය	1,102,987	954,466

ආයුගණනයේදී භාවිතාකරණ ලද ආයු ගණක උපකලපනයන් පහත පරිදි වේ.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 %	2022 %
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතිකය	වාර්ෂිකව 10.00	වාර්ෂිකව 15.00
ජීවන වියදම් දීමනාවෙහි අනාගත වැඩිවීමේ ප්‍රමාණය (COLA)	වාර්ෂිකව 8.00	වාර්ෂිකව 8.00
වට්ටම් අනුපාතය	වාර්ෂිකව 13.00	වාර්ෂිකව 18.00

බැංකුව විසින් ඉන්දියාවේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද පරම උපත් හා මරණ දත්ත වගුව IALM (2006-2008) භාවිතා කර ඇත. තවදුරටත්, ප්‍රතිලාභ ගෙවීම් සඳහා අපේක්ෂිත ඉතිරි වසර ගණන වසර 17.1 කි.

උපකල්පනවල වැඩිවීම/අඩුවීම මඟින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයට ඇති කරන බලපෑම පහත පෙන්නුම් කෙරේ.

	බැංකුව/සමූහය	
	0.5% වැඩිවීම රු. '000	0.5% අඩුවීම රු. '000
වට්ටම් අනුපාතය	1,023,341	1,190,835
වැටුප් වර්ධක	1,162,040	1,049,140

අනාගත වර්ෂ වලදී අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා වූ ප්‍රතිපාදන තුලින් පහත ගෙවීම් සිදු කිරීමට අපේක්ෂා කරයි.

	බැංකුව/සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
ඉදිරි මාස 12 තුළ	33,965	39,678
වසර 1 සහ 5 අතර	135,359	132,361
වසර 6 සහ 10 අතර	118,513	107,164
වසර 10 වඩා වැඩි	815,150	675,263
අපේක්ෂිත මුළු ගෙවීම්	1,102,987	954,466

49 යටත් කාලීන වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

යටත් කාලීන වගකීම් යනු දිගු කාලීන අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීමට ගත් ප්‍රමුඛතාවය හිමි නොවන ණය මුදල් වන අතර යටත්කාලීන වගකීම් පළමුවෙන් සාධාරණ අගයට පොත් වල හඳුනා ගන්නා අතර පසුව සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පදනමට හඳුනා ගනු ලැබේ. ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී මූල්‍ය උපකරණයට අදාල අධි මිල, වට්ටම් සහ ගනුදෙනු පිරිවැය මෙහි සඵල පොළී අනුපාතිකය තුළ ඇතුළත් වේ. සඵල පොළී අනුපාතිකය යටතේ ගණනය කරන ලද වියදම "පොළී වියදම" (සටහන 8.2) තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000	2023 රු. '000	2022 රු. '000
ලැයිස්තුගත ණයකර				
සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර වකක් රු. 100/-	10,020,013	5,038,775	10,020,013	5,038,775
ලැයිස්තුගත නොකළ ණයකර				
සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර වකක් රු. 100/- (පුද්ගලික නිකුතුව)	35,608,086	39,169,530	35,608,086	39,169,530
අමතර පළමු පෙළ ප්‍රාග්ධන බැඳුම්කර				
ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා බැංකුව විසින් අවලංගු කල නොහැකි විවිධ බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් වලට එළඹේ. එවැනි බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා නොගත්තද එහි ණය අවදානමක්/පැහැර හැරීමේ අවදානමක් තිබේ. නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව අදාළ ණය පරිවර්තනය කිරීමේ සාධක මත පදනම්ව එවැනි බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රාග්ධන ගාස්තු වෙන් කරනු ලැබේ.

බැඳීම් සහ ඇපකර සඳහා බැංකුවේ උපරිම නිරාවරණය පහත වගුවේ දැක්වේ. බැංකුවේ බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් සඳහා ණය අවදානම නිරාවරණය සටහන අංක 57 හි අනාවරණය කර ඇත.

	බැංකුව	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
ප්‍රතිග්‍රහණ හා ණයවර ලිපි	168,992,212	157,948,135
රැස් කිරීම සඳහා වූ බිල්පත්	58,195,110	64,815,618
ඉදිරි විනිමය ගිවිසුම්	393,201,966	199,453,327
ඇපකර	164,216,780	167,974,583
වෙනත් බැඳීම්	131,208,997	56,983,452
	915,815,065	647,175,115

64.2.8 අපේක්ෂිත ණය අවදානම මත කළමනාකරණ ආවරණ

වසංගත සමයේ සිට අබණ්ඩව පවත්නා අහිතකර ආර්ථික තත්ත්වය මඟින් බලපෑමට ලක් වූ කර්මාන්ත පිළිබඳව ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 සහ මහ බැංකු නියාමනයන් අනුව ණය සහ අත්තිකාරම් සඳහා බැංකුවේ සාමාන්‍ය ණය හානිකරණය ගණනය කිරීමේ ක්‍රියාවලියෙන් ඔබ්බට බැංකුව විසින් සලකා බලන ලදී. ඒ අනුව, කළමනාකරණ ආවරණ ලෙස සංචාරක ඉදිකිරීම් සහ ඇඟළුම් අපනයන යන අංශ අවදානම් සහිත කර්මාන්ත ලෙස සලකා එම අංශ වල ගනුදෙනුකරුවන් හානිකරණය තක්සේරු කිරීමේදී පළවන මට්ටම යටතේ ඉදිරි මාස 12 ක අපේක්ෂිත ණය හානිය සලකා බලනු වෙනුවට, ආයු කාලය තුළ අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම සඳහා පළමු මට්ටමේ ගනුදෙනුකරුවන් සියළු දෙනා දෙවන මට්ටම වෙත මාරු කරන ලදී. තවද, විභව අවදානම සැලකිල්ලට ගනිමින් වසර තුළ විවිධ ණය සහන සහ සහන යෝජනා ක්‍රම යටතේ නව ණය බවට පරිවර්තනය කරන ලද ණය පහසුකම් සඳහා අමතර ප්‍රතිපාදන සිදු කිරීමට බැංකුව තීරණය කරන ලදී.

සාමූහික පදනම මත තක්සේරු කරන ලද කළඹ සඳහා අපේක්ෂිත ණය හානිය ගණනයේදී ආර්ථික සාධක ගැලපීම (EFA) සඳහා පවතින ආර්ථික තත්ත්වයන් ග්‍රහණය කිරීම සඳහා බැංකුව විසින් විචක්ෂණ පදනම මත අපේක්ෂිත ආර්ථික තත්ත්ව මත වූ බරතැබීම ඉහළ නැංවූ අගයන් තවදුරටත් පවත්වාගෙන යන ලදි.

ආර්ථික තත්ත්වය	2023 බර තැබීම %
ප්‍රශස්ත	10
පදනම්	20
හානිදායී	70

64.3 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතාවය ගතික වන අතර අපේක්ෂිත සහ අනපේක්ෂිත ව්‍යාපාර සහ වෙළඳපල තත්ත්වයන් අනුව වෙනස් විය හැක. පිරිවැය ඵලදායී ලෙස සහ නියමිත කාලයට සිය ගෙවීම් වගකීම් ඉටු කිරීමට හෝ තම වත්කම් සුදුසු කාලසීමාවන් තුළ අපේක්ෂිත මිලකට අලෙවි කිරීමට බැංකුව අපොහොසත් වන විට ද්‍රවශීලතා අවදානම පැන නගියි. ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණයක් සහතික කිරීම සඳහා බැංකුව විසින් තම බැඳීම් දිනපතා අධීක්ෂණය සහ කලමනාකරණය කරන අතර සිය තැන්පතු පදනමට අමතරව විවිධාංගීකරණය වූ අරමුදල් ප්‍රභවයන් පවත්වාගෙන යයි. ද්‍රවශීලතා පීඩන තත්ත්ව වලදී මහ බැංකුවේ රිපෝ කවුළුව ප්‍රධාන අරමුදල් මූලාශ්‍රවලින් එකක් ලෙස සැලකේ. තවද, බැංකුවේ ගෙවීම් වගකීම් පියවීම නියමිත කාලයට හා කාර්යක්ෂම ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව වැදගත් කර්යභාරයක් ඉටු කරයි. මීට අමතරව, ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවට නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම, ඉහළ ප්‍රතිලාභ සඳහා ද්‍රවශීල වත්කම්වල ප්‍රශස්ත භාවිතය සහ ව්‍යාපාර ව්‍යාප්තිය සඳහා අරමුදල් සැපයීම ඇතුළත් වේ. ප්‍රශස්ත ද්‍රවශීලතා තත්ත්වයන් සහතික කිරීම සඳහා බැංකුව විසින් ද්‍රවශීලතා අනුපාත නියාමකයා විසින් නියම කරන ලද සීමාවන් තුළ පවත්වාගනු ලබයි.

64.3.1 ද්‍රවශීලතා අවදානම් නිරාවරණය

බැංකුව භාවිතා කරන ප්‍රධාන ද්‍රවශීලතා මිනුම්කරණ මෙවලම වන්නේ නියාමන ද්‍රවශීලතා මිනුම් උපකරණය වන ද්‍රවශීල වත්කම් අනුපාතයයි. මුදල්, මුදල් හා සමාන දෑ සහ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම තුලින් ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලමින් ප්‍රශස්ත ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා බැංකුව ක්‍රමානුකූලව කළමනාකරණය කරන ප්‍රධාන ද්‍රවශීල වත්කම් වේ. මීට අමතරව, ඕනෑම තත්ත්වයක් යටතේ ද්‍රවශීලතා කළමනාකරණය සහතික කිරීම සඳහා බැංකුවට විශේෂිත වූ, වෙළඳපල විශේෂිත වූ සහ ඒකාබද්ධ තත්ත්වයන්ට අදාලව සාමාන්‍ය සහ ආතති අවස්ථා යටතේ ද්‍රවශීලතා තත්ත්වය තක්සේරු කරනු ලැබේ.

	බැංකුව		අක්වෙරළ බැංකු අංශය	
	2023 (%)	2022 (%)	2023 (%)	2022 (%)
දෙසැම්බර් 31 දිනට	45.12	21.22	54.20	32.79
වර්ෂය සඳහා සාමාන්‍ය	35.99	23.37	48.15	27.64
අවම නියාමන අවශ්‍යතාවය	20.00	20.00	20.00	20.00

64.3.2 මූල්‍ය වත්කම් සහ වගකීම් කල්පිරීම විශ්ලේෂණය

64.3.2.1 වාර්තා කරන දින සිට මාස 12 කට පසු අයකර ගැනීමට හෝ පියවීමට අපේක්ෂා කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්.

පියවීමේ දින සිට මාස 12කට පසු අයකර ගැනීමට හෝ පියවීමට බලාපොරොත්තු වන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල ධාරණ අගය පහත වගුවේ දැක්වේ.

	බැංකුව	
දෙසැම්බර් 31 දිනට	2023 රු. '000	2022 රු. '000
මූල්‍ය වත්කම්		
ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්		
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	4,435,342	4,483,675
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අත්තිකාරම්	1,185,512,161	1,246,524,775
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය උපකරණ	987,694,007	1,111,684,272
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	18,996,459	6,322,150
මුළු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්	2,196,637,969	2,369,014,872
මූල්‍ය වගකීම්		
ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්		
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	253,050,308	248,014,772
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - වෙනත් ණය ගැනීම්	25,989,374	58,196,922
යටත් කාලීන ණය	55,049,327	53,372,602
මුළු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්	334,089,009	359,584,296

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

64.3.2.2 මූල්‍ය වගකීම්වල වට්ටම් රහිත මුදල් ප්‍රවාහය

2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය වගකීම්වල වට්ටම් නොකළ කල්පිරීම පහත වගුවේ දැක්වේ.

2023 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුමේදී	මාස 3 ට අඩු	මාස 3 සිට 12 දක්වා	වසර 1 සිට 5 දක්වා	වසර 5 ට වැඩි	මුළු එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකුවලට ගෙවිය යුතු	3,047,732	-	-	-	-	3,047,732
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	-	74,593,102	4,449,127	-	-	79,042,229
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	2,169,202	-	-	-	2,169,202
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	778,990,277	1,571,774,683	829,013,746	103,630,782	684,528,079	3,967,937,567
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - වෙනත් ණය ගැහීම්	-	7,676,861	-	26,725,999	-	34,402,860
යටත් කාලීන ණයකර	-	-	10,244,531	41,896,390	36,589,092	88,730,013
මුළු එකතුව	782,038,009	1,656,213,848	843,707,404	172,253,171	721,117,171	4,175,329,603

2022 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුමේදී	මාස 3 ට අඩු	මාස 3 සිට 12 දක්වා	වසර 1 සිට 5 දක්වා	වසර 5 ට වැඩි	මුළු එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකුවලට ගෙවිය යුතු	11,514,897	-	-	-	-	11,514,897
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	-	184,677,045	-	-	-	184,677,045
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	921,033	-	-	-	921,033
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	989,255,381	1,263,861,028	859,092,295	317,787,701	3,576,984	3,433,573,389
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට - වෙනත් ණය ගැහීම්	303,945,327	25,820,523	2,657,748	59,452,683	-	391,876,281
යටත් කාලීන ණයකර	-	-	11,465,533	56,040,654	19,549,885	87,056,072
මුළු එකතුව	1,304,715,605	1,475,279,629	873,215,576	433,281,038	23,126,869	4,109,618,717

64.4 වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු පොළී අනුපාත, විදේශ විනිමය අනුපාත, කොටස් මිල සහ වෙළඳ භාණ්ඩ මිල වැනි වෙළඳපල විචල්‍යයන්හි අහිතකර චලනයන් හේතුවෙන් අලාභ සිදුවීමේ අවදානමයි. වෙළඳපල අවදානමට නිරාවරණය වීම ප්‍රධාන වශයෙන් පොළී අනුපාත අවදානම (IRR) සහ විදේශ විනිමය අවදානම (FX) මඟින් පැන නගී. වෙළඳ භාණ්ඩ ආශ්‍රිත අවදානමට නිරාවරණය වීම රන් තොගයේ මිල උච්චාවචනය වන ප්‍රමාණයට පමණක් සීමා වී ඇති බැවින් එය අවම මට්ටමක පවතී. වෙළඳ හෝ වෙළඳ නොවන කළඹ වශයෙන් බැංකුව මෙම නිරාවරණයවීම් වර්ග කර වෙන වෙනම කළමනාකරණය කරනු ලබයි.

විදේශ විනිමය හුවමාරු සහ කොටස් වෙළඳාම් කළඹයන් හි වෙළඳපල අවදානම කළමනාකරණය සහ අධීක්ෂණය කරනු ලබන්නේ අවදානම් විචල්‍යයන්හි අන්තර් බැඳීම් පෙන්නුම් කරනු ලබන "අවදානමේදී අගය - (Value at Risk –VaR) ක්‍රමවේදය අනුව වේ. ශුද්ධ විවෘත තත්ත්වයට අමතරව විදේශ විනිමය අනුපාත අවදානම කළමණාකරණය කිරීමේ සීමාව හා රඳවා ගැනීමේ කාලය ස්කන්ධ අවදානම කළමණාකරණයට සීමා වේ. පදනම් අගය මත මිල වෙනස්වීම (Price Value of Basis Point – PVBP) සහ කාල විශ්ලේෂණය (Duration Analysis) ඇසුරෙන් වෙළඳ කළඹට බලපාන පොළී අනුපාත අවදානම කළමනාකරණය සිදු කරයි. මීට අමතරව, අවදානම් අධීක්ෂණය, අවදානම් තක්සේරු කිරීම, සංවේදීතා අධ්‍යයනය හා ආතති පරීක්ෂාව ආදිය මඟින් වෙළඳ හෝ වෙළඳ නොවන කළඹ කළමනාකරණය සිදු කෙරේ. බැංකු වත්කම්වල පොළී අනුපාත අවදානම (IRRBB) සංවේදීතා අධ්‍යනය හරහා නිරීක්ෂණය කෙරේ.

64.4.1 වෙළඳ සහ වෙළඳ නොවන කළඹ - බැංකුව

වෙළඳ සහ වෙළඳ නොවන කළඹ අතර වෙළඳපල අවදානමට යටත්ව වත්කම් සහ වගකීම් වෙන් කිරීම පහත වගුවේ දක්වා ඇත.

2023 දෙසැම්බර් 31 දිනට	සටහන	ධාරණ අගය	වෙළඳපල අවදානම් මැනීම	
			වෙළඳ කළඹ	වෙළඳ නොවන කළඹ
		රු. '000	රු. '000	රු. '000
වෙළඳපල අවදානමට යටත් වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	22	135,550,505	-	135,550,505
මහ බැංකු සමඟ ශේෂයන්	23	34,932,639	-	34,932,639
බැංකුවල ඇති තැන්පතු	24	74,966,171	-	74,966,171
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	25	3,711,918	-	3,711,918
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	26	20,525,840	20,525,840	-
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	27	40,642,530	40,642,530	-
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට				
- ණය සහ අත්තිකාරම්	28	2,209,061,924	-	2,209,061,924
- ණය සහ වෙනත් උපකරණ	29	1,653,728,403	-	1,653,728,403
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	30	49,533,998	-	49,533,998
පරිපාලිත සමාගම්වල ආයෝජන	31	8,181,138	-	8,181,138
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	32	92,988	-	92,988
ආයෝජන දේපළ	33	2,414,640	-	2,414,640
දේපළ, පිරියත හා උපකරණ	34	42,564,498	-	42,564,498
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ	35	3,508,618	-	3,508,618
අස්පෘශ්‍ය වත්කම්	36	1,554,875	-	1,554,875
විලම්බිත බදු වත්කම්	37	18,503,397	-	18,503,397
වෙනත් වත්කම්	38	112,274,233	-	112,274,233
මුළු වත්කම්		4,411,748,315	61,168,370	4,350,579,945
වෙළඳපල අවදානමට යටත් වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	39	3,047,732	-	3,047,732
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	40	78,463,070	-	78,463,070
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	41	2,169,202	2,169,202	-
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට				
- තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	42	3,882,232,323	-	3,882,232,323
- වෙනත් ණය ගැනීම්	43	33,666,236	-	33,666,236
ප්‍රවර්තන බදු වගකීම්	45	7,621,675	-	7,621,675
වෙනත් වගකීම්	47	88,141,547	-	88,141,547
යටත් කාලීන ණය	49	64,691,810	-	64,691,810
මුළු වගකීම්		4,160,033,595	2,169,202	4,157,864,393

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 දිනට	සටහන	ධාරණ අගය	වෙළඳපල අවදානම් මැනීම	
			වෙළඳ කළඹ	වෙළඳ නොවන කළඹ
		රු. '000	රු. '000	රු. '000
වෙළඳපල අවදානමට යටත් වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	22	128,401,532	-	128,401,532
මහා බැංකු සමඟ ශේෂයන්	23	70,494,529	-	70,494,529
බැංකුවල ඇති තැන්පතු	24	16,459,303	-	16,459,303
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	25	1,480,403	-	1,480,403
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	26	57,155,486	57,155,486	-
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	27	10,280,055	10,280,055	-
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට				
- ණය සහ අත්තිකාරම්	28	2,325,594,329	-	2,325,594,329
- ණය සහ වෙනත් උපකරණ	29	1,555,897,307	-	1,555,897,307
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්	30	8,690,802	-	8,690,802
පරිපාලිත සමාගම්වල ආයෝජන	31	8,181,138	-	8,181,138
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	32	92,988	-	92,988
ආයෝජන දේපළ	33	2,414,640	-	2,414,640
දේපළ, පිරියත හා උපකරණ	34	34,845,004	-	34,845,004
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ	35	3,002,305	-	3,002,305
අස්පෘශ්‍ය වත්කම්	36	1,442,433	-	1,442,433
විලම්භිත බදු වත්කම්	37	15,577,466	-	15,577,466
වෙනත් වත්කම්	38	96,449,984	-	96,449,984
මුළු වත්කම්		4,336,459,704	67,435,541	4,269,024,163
වෙළඳපල අවදානමට යටත් වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	39	11,514,897	-	11,514,897
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	40	180,218,543	-	180,218,543
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	41	921,033	921,033	-
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට				
- තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	42	3,334,774,261	-	3,334,774,261
- වෙනත් ණය ගැනීම්	43	390,489,543	-	390,489,543
ප්‍රවර්තන බදු වගකීම්	45	6,523,443	-	6,523,443
වෙනත් වගකීම්	47	94,075,650	-	94,075,650
යටත් කාලීන ණය	49	63,758,191	-	63,758,191
මුළු වගකීම්		4,082,275,561	921,033	4,081,354,528

64.4.2 පොළී අනුපාත අවදානම

ශුද්ධ පොළී ආදායම කෙරෙහි අහිතකර ලෙස බලපාන පරිදි පොළී අනුපාතයන්හි බලාපොරොත්තු නොවූ වෙනස්වීම් හේතුවෙන් අනාගත මුදල් ප්‍රවාහයන්ට හෝ මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකමට බලපෑම් සිදු වීමේ හැකියාව පොළී අනුපාත අවදානම වේ. අබණ්ඩ අධීක්ෂණය සහ කාලානුරූපීව සිදු කරන ප්‍රතිමිලකරණ උපාය මාර්ග පොළී අනුපාත අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කරයි.

පොළී අනුපාත සංවේදී උපකරණ වන බැංකුවේ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල වෙළඳ කළඹ සඳහා පොළී අනුපාත වෙනස් වීමෙන් සිදුවිය හැකි බලපෑම තක්සේරු කිරීම සඳහා පදනම් අගය මත මිල වෙනස්වීම (PVBP) සහ කාල විශ්ලේෂණය අවදානම් අභිරුචියෙහි සීමාවන් සමඟ දෛනිකව නිරීක්ෂණය කරනු ලැබේ.

	2023 රු.	2022 රු.	අවදානම් අභිරුචිය රු.
පදනම් අගය මත මිල වෙනස්වීම (PVBP)			
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	32,444	3,088	900,000
භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන	577,985	75,767	2,100,000

බැංකුවේ පොළී අනුපාත අවදානම අධීක්ෂණය කිරීම සඳහා පොළී සංවේදී වත්කම් සහ වගකීම් පිළිබඳ සංවේදීතා විශ්ලේෂණය සිදු කරනු ලැබේ. එම වත්කම් සහ වගකීම් කල් පිරීමේ ඉතිරි කාලය සැළකිල්ලට ගෙන කලින් තීරණය කරන ලද කල්පිරීමේ කාණ්ඩ වලට යොමු කිරීම මඟින් සහ පරතර සීමාවන් සහ ප්‍රතිමිලකරණ පැතිකඩ නියම කිරීම සහ අධීක්ෂණය මඟින් මෙය සිදු කරනු ලැබේ. බැංකුවේ පොළී අනුපාත අවදානම් නිරාවරණය එහි මූල්‍ය වත්කම් සහ වගකීම් හි ප්‍රතිශතයක් ලෙස විශ්ලේෂණය කිරීම පහත වගුව මඟින් දක්වා ඇත.

2023	මාසයක් දක්වා (%)	මාස 1-3 දක්වා (%)	මාස 3-6 දක්වා (%)	මාස 6-12 දක්වා (%)	අවුරුදු 1-2 දක්වා (%)	අවුරුදු 2-3 දක්වා (%)	අවුරුදු 3-4 දක්වා (%)	අවුරුදු 4-5 දක්වා (%)	අවුරුදු 5 ට වැඩි (%)
පොළී අනුපාත සංවේදී වත්කම්	9.7	14.9	12.6	12.1	6.2	6.2	5.9	5.9	26.6
පොළී අනුපාත සංවේදී වගකීම්	10.2	13.9	14.7	14.2	5.1	5.1	5.4	5.4	26.0
පරතරය	(0.5)	1.0	(2.1)	(2.1)	1.1	1.1	0.5	0.5	0.7

2022	මාසයක් දක්වා (%)	මාස 1-3 දක්වා (%)	මාස 3-6 දක්වා (%)	මාස 6-12 දක්වා (%)	අවුරුදු 1-2 දක්වා (%)	අවුරුදු 2-3 දක්වා (%)	අවුරුදු 3-4 දක්වා (%)	අවුරුදු 4-5 දක්වා (%)	අවුරුදු 5 ට වැඩි (%)
පොළී අනුපාත සංවේදී වත්කම්	13.0	12.6	5.9	7.9	10.2	17.0	6.3	5.2	22.0
පොළී අනුපාත සංවේදී වගකීම්	16.2	17.2	12.2	15.7	3.9	3.9	3.4	3.4	24.2
පරතරය	(3.2)	(4.7)	(6.4)	(7.8)	6.3	13.2	2.9	1.8	(2.2)

64.4.3 විදේශ විනිමය අවදානම

විදේශ විනිමය අනුපාත විචලනය වීම නිසා විදේශ මුදලින් ඇති මූල්‍ය උපකරණවල වටිනාකම උච්ඡාවචනය වීමෙන් බැංකුවේ මූල්‍ය ප්‍රතිඵල වලට සහ මූල්‍ය තත්ත්වයට ඇතිවන අවදානම විදේශ විනිමය අවදානම වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති සීමාව තුළ පවතින පරිදි බැංකුව විවෘත තත්ත්වයන් වර්ෂය තුළ පවත්වාගෙන ගොස් ඇත. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් නියම කරන ලද කේවල නිරාවරණයන් මෙන්ම සමස්ත නිරාවරණයන්ද ඇතුලත් පුළුල් සීමා කළමනාකරණ රාමුවක් තුලින් විදේශ විනිමය අවදානම පාලනය කරයි. ආතති අවස්ථාවන්හිදී ලාභයට සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයට ඇති බලපෑම මැනීම සඳහා විදේශ විනිමය අනුපාත මත ආතති පරීක්ෂණ විශ්ලේෂණය සිදු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට විදේශ විනිමය තත්ත්වය	2023		2022	
	සමස්ත ධන අගය (ශුද්ධ) රු. '000	සමස්ත සෘණ අගය (ශුද්ධ) රු. '000	සමස්ත ධන අගය (ශුද්ධ) රු. '000	සමස්ත සෘණ අගය (ශුද්ධ) රු. '000
මුදල් ඒකකය				
ඇමරිකානු ඩොලර්	6,195,839	-	1,220,240	-
බ්‍රිතාන්‍ය පවුම්	12,550	-	29,415	-
යූරෝ	-	(54,227)	340,914	-
ජපන් යෙන්	1,061,958	-	-	(819)
ඔස්ට්‍රේලියන් ඩොලර්	4,261	-	2,279	-
කැනේඩියන් ඩොලර්	-	(21,098)	1,203	-
ස්විස් ෆ්‍රෑන්ක්	-	-	896	-
සිංගප්පූරු ඩොලර්	1,399	-	14,808	-
හොංකොං ඩොලර්	174,491	-	6,905	-
උප එකතුව	7,450,498	(75,325)	1,616,660	(819)
වෙනත් මුදල් ඒකක වර්ග	7,958,248	(116,391)	13,220,700	(1,795,396)
මුළු එකතුව	15,408,746	(191,716)	14,837,360	(1,796,215)
ධන හෝ සෘණ අගයන්හි වැඩි අගය		15,408,746		14,837,360

විනිමය අනුපාත විචලනයන් නිසා ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වන බලපෑම

	2023		2022	
	ශුද්ධ විවෘත තත්ත්වය (අනුපාතික වෙනස්වීමෙන් පසු) රු. '000	2023 දෙසැම්බර් 31 දිනට ලාභ හෝ අලාභ ප්‍රකාශනයට බලපෑම රු. '000	ශුද්ධ විවෘත තත්ත්වය (අනුපාතික වෙනස්වීමෙන් පසු) රු. '000	2022 දෙසැම්බර් 31 දිනට ලාභ හෝ අලාභ ප්‍රකාශනයට බලපෑම රු. '000
විදේශ විනිමය අනුපාතයේ වෙනස්වීම				
5%	14,638,308	(770,437)	14,095,492	(741,868)
10%	13,867,871	(1,540,875)	13,353,624	(1,483,736)
-5%	16,179,183	770,437	15,579,228	741,868
-10%	16,949,620	1,540,875	16,321,096	1,483,736

64.4.4 ස්කන්ධ අවදානම

ස්කන්ධ අවදානම යනු ස්කන්ධ දර්ශක සහ තනි කොටස්වල මට්ටමේ වෙනසක් හේතුවෙන් කොටස් කළඹේ සාධාරණ වටිනාකම පිරිහීමේ අවදානමයි. ස්කන්ධ අවදානම අධීක්ෂණය කරනු ලබන්නේ සමස්ත කළඹ සීමාවන්, තැරැව්කාර සීමාවන්, පාඩු සීමාවන් සහ අවදානමේදී අගය (VaR) ක්‍රමවේදය භාවිතා කිරීමෙනි.

64.5 මෙහෙයුම් අවදානම

ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයින්ගේ හෝ පද්ධතිවල ප්‍රතිඵලයක් ලෙස හෝ බාහිර සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස අලාභ ඇතිවීමේ අවදානම මෙහෙයුම් අවදානම ලෙස නිර්වචනය කෙරේ. මූලික දර්ශක ප්‍රවේශය (Basic Indicator Approach - BIA) ඇසුරෙන්, මෙහෙයුම් අවදානම සඳහා සැළකිය යුතු ප්‍රාග්ධනයක් වෙන් කිරීම බැංකුව විසින් සිදු කරන නමුත්, සත්‍ය මෙහෙයුම් අලාභය උක්ත සඳහන් ප්‍රාග්ධන වෙන් කිරීමට සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පැවතිනි. බැංකුවේ සාර්ව සහ විස්තීරණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව මඟින් අදාල සියළු අවදානම් සක්‍රීයව කළමනාකරණය කිරීම සහතික කරයි.

64.6 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය යනු බැංකුව විසින් උපකල්පනය කරන අවදානම් වලට එරෙහිව ඇති මූල්‍යමය ආවරණයයි. ව්‍යාපාරයේ දිගුකාලීන ස්ථාවරත්වය සහතික කිරීම සඳහා නිසි ප්‍රාග්ධන කළමනාකරණය ඉතා වැදගත් වේ. ප්‍රාග්ධන කළමනාකරණයේ මූලික පරමාර්ථය වන්නේ අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා පවත්වාගෙන යාම සහ උපරිම ලාභදායීතාවය සඳහා ප්‍රශස්ථ ප්‍රාග්ධන භාවිතය සහතික කිරීමය. ව්‍යාපාරයේ විශාලත්වය සහ ස්වභාවය අනුව, බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනයේ මූලික මූලාශ්‍රය වන්නේ රඳවාගත් ඉපැයීම් ය. ව්‍යාපාර ව්‍යාප්තිය සඳහා පූර්ව තීරණය කළ ප්‍රාග්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රභවයන් ප්‍රාග්ධන වර්ධක සැලැස්ම තීරණය කරයි.

64.6.1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය යනු බැංකුවේ මූල්‍ය ශක්තියේ මිනුමක් වන අතර එහි ප්‍රාග්ධනයේ හා ණය, වෙළඳපළ සහ ව්‍යාපාරයේ මෙහෙයුම් අංශවල අවදානමේ බර සහිත වත්කම් (RWAs) වල අනුපාතයක් ලෙස ප්‍රකාශ වේ. මෙම අනුපාතය මඟින් පෙන්නුම් කරන්නේ, සාධාරණ මට්ටමේ අවදානමක් පවත්වා ගත හැකි ආකාරය ඵලදායී ලෙස තහවුරු කරන මූල්‍ය ශක්තිය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාවයි. දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු (DSIBs) සඳහා අවම මුළු ප්‍රාග්ධන අවශ්‍යතාවය 14% වන අතර බැංකුවට ස්ථර I ප්‍රාග්ධන මට්ටම 10% පවත්වා ගැනීමට අවශ්‍ය වේ.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) නියාමකයා විසින් නියම කර ඇති බාසල් අවශ්‍යතාවයට සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව සියළු අවදානම් වලට අදාලව පවත්වා ගත යුතු ප්‍රාග්ධන මට්ටම තීරණය කරයි. බැංකුව නිරාවරණය වන සියළුම අවදානම් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගෙන යන බව සහතික කරන ලද සහ සැලසුම් කළ ව්‍යාපාරික ක්‍රියාවලිය මත පදනම්ව ප්‍රාග්ධන සැලසුම්කරණය අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) විසින් පහසු කරනු ලැබේ. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) හි ස්ථම්භ II අවදානම් තක්සේරු කිරීම සඳහා බැංකුව ජාත්‍යන්තරව පිළිගත් අභ්‍යන්තර ආකෘති භාවිතා කරන අතර මුළු ප්‍රාග්ධන අවශ්‍යතාවය තීරණය කිරීම සඳහා බහුවිධ අවස්ථා භාවිතා කරමින් පුළුල් ආතති පරීක්ෂාවක් සිදු කරයි. කේන්ද්‍රීකරණ අවදානම, අනුකූලතා අවදානම සහ තොරතුරු තාක්ෂණ අවදානම වැනි සියලුම ගුණාත්මක අවදානම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) මඟින් සලකා බලනු ලැබේ. උපායමාර්ගික අවදානම තක්සේරු කරනු ලබන්නේ අභ්‍යන්තරව ගොඩනගන ලද අවදානම් දර්ශකයක් හරහා වන අතර සංකේන්ද්‍රන අවදානම තක්සේරු කිරීම මඟින් බැංකුව කුමන හෝ පාර්ශ්වයකට, නිෂ්පාදනයකට, අංශයකට හෝ භූගෝලීය කාණ්ඩයකට අධික ලෙස නිරාවරණය නොවූ විවිධාංගීකරණය වූ කළඹක් ඇති බව සහතික කරයි.

ප්‍රාග්ධන මට්ටම්	2023 රු. '000	2022 රු. '000
ණය අවදානම් බරිත වත්කම් සඳහා ප්‍රාග්ධන ගාස්තුව	219,933,107	216,511,528
ණය වෙළඳපළ අවදානම් බරිත වත්කම් සඳහා ප්‍රාග්ධන ගාස්තුව	2,857,769	2,763,445
මෙහෙයුම් අවදානම් බරිත වත්කම් සඳහා ප්‍රාග්ධන ගාස්තුව	21,570,870	21,422,430
ස්ථර I ප්‍රාග්ධනය (අවම නියාමනය - 10%)	12.76	12.41
මුළු ප්‍රාග්ධනය (අවම නියාමනය - 14%)	15.84	15.38

8

අනුකූලතා ඇමුණුම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා	353
2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා	359
කොළඹ කොටස් හුවමාරුව විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත කිරීමේ රීතිවල 9 වන වගන්තියට අනුකූලවීම	378
කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා	384
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා	386
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය	390

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
අ	**අධ්‍යක්ෂවරු**
අ.1	**අධ්‍යක්ෂ මණ්ඩලය**
අ.1 මූලධර්මය	1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ විධිවිධාන සහ එහි සංශෝධන ප්‍රකාරව 2024 වසරේ පළමු කාර්තුවේදී නව අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු (03) පත් කිරීමත් සමඟ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් හය දෙනෙකුගෙන් (06) සමන්විත වේ. ඉන් පස් දෙනෙක් (05) ස්වාධීන අධ්‍යක්ෂවරු වෙති. භාණ්ඩාගාර නියෝජිත ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් යුත් අධ්‍යක්ෂවරයෙකු ලෙස සැලකේ. අධ්‍යක්ෂවරුන් විවිධ ඉදිරි දර්ශන, විශේෂඥ දැනුම සහ අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ගෙන එයි. අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් සිදු කරනු ලබන්නේ ඉහත ආඥාපනතට අනුව බැංකුව යටතට වන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හරහා කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසිනි. අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ප්‍රතිපත්තියක් හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍ය නිපුණතා හඳුනාගෙන ඇත. ඒ අනුව නිපුණතා සහ පළපුරුද්ද ඇති අධ්‍යක්ෂවරුන් ඵලදායී පාලනයක් සහිතව බැංකුව මෙහෙයවීම සිදු කරයි. 2023 වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩලයේ සංයුතිය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 113 හි සඳහන් වේ. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් හා අත්දැකීම් ඔවුන් පිලිබඳ විස්තර වලින් දැක්වේ.
අ.1.1.	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සති දෙකකට වරක් පවත්වනු ලබන අතර අවශ්‍ය වූ විට විශේෂ රැස්වීම් පැවැත්වීමට නියමිතය. රැස්වීම් කාලසටහන වසර ආරම්භය වන විට ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේ ව්‍යුහයට එකඟ වී ඇත. තීරණ ගැනීම සක්‍රීය කිරීම සඳහා එකඟ වූ පරිදි අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කෙරේ. සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසි දෙවතාවක් (22) රැස් වූ අතර රැස්වීම් වලට පැමිණීම 116 පිටුවේ සාරාංශ කර ඇත. මෙම වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති තොරතුරු අදාළ උපකමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡා කෙරේ.
අ.1.2.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්** බැංකුවේ ආයතනික යහපාලන ප්‍රතිපත්ති සමාලෝචනය සමඟ අවසන් වරට 2023 වර්ෂයේදී සමාලෝචනය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම් ඇතුළත් කර ඇත.
අ.1.3.	**රටේ බලපවත්වන නීතියට අනුව කටයුතු කිරීම** 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන්ට අනුව බැංකුව නියාමනය වේ. තවද ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකුවේ විදේශීය ශාඛා ඇති රටවල නියාමනයන්, සුරුකුම්පත් හා විනිමය කොමිසම හා කොළඹ කොටස් හුවමාරුව මඟින් නිකුත් කර ඇති නියාමනයන්ට බැංකුව අනුකූල වන අතර බැංකුවට අදාළ වන නීති වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කරයි. අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය වූ විට බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සඳහා අනුමත ප්‍රතිපත්තිය මත ප්‍රවේශ විය හැකි අතර එය 2023 වසර තුළ සමාලෝචනය කර ඇත.
අ.1.4.	**සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන්** සියළුම අධ්‍යක්ෂවරුන්ට, නීතිඥවරියක් වන ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමියගෙන් උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති හා රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සහ බැංකුවට අදාළ වාර්තා තබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, ඉවත් කිරීමේ අවශ්‍යතාවයන් පැන නැඟුන විට එය මුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම සැලකිල්ල යොමු කර ක්‍රියාවට නැංවිය යුතු කාර්යයක් වේ. සමාගම් ලේකම්වරයාගේ භූමිකාව 115 පිටුවේ දක්වා ඇත.
අ.1.5.	**ස්වාධීන විනිශ්චය** ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික සැළසුම්, කාර්යසාධනය, සම්පත් විභාජනය, අවදානම් කළමනාකරණය, අනුකූල වීම් හා සම්මතයන් පවත්වාගෙන යාමට අදාළ කාර්යයන් හා වගකීම් වලදී ස්වාධීන විනිශ්චයන් දරනු ලැබේ.
අ.1.6.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ බැංකුවේ කටයුතු සඳහා ප්‍රමාණවත් කාලය සහ ශ්‍රමය කැප කිරීම** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සලස්වන අතර එමඟින් වැඩිදුර තොරතුරු සොයා බැලීමට හා අවශ්‍ය දත්ත ගැන විමසීමට ප්‍රමාණවත් කාලයක් ලැබී ඇත. පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය යැයි සැලකෙන විට සැලසුම් කරනු ඇත. ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින් සහ බාහිර විශේෂඥයින් බැංකුවේ උපායමාර්ගික දිශාව, මෙහෙයුම්, මූල්‍ය කාර්යසාධනය, අවදානම් කළමනාකරණය සහ අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළ විවිධ කරුණු සම්බන්ධයෙන් යාවත්කාලීන කිරීම්, අනුමැතිය හෝ මගපෙන්වීම් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම් සිදු කරයි.
අ.1.7.	**යෝජනාවන් ඉදිරිපත් කිරීම** බැංකුවේ කටයුතු පිළිබඳව බැංකුවේ යහපත උදෙසා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හට තනි තනිව තමන්ගේ යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
අ.1.8.	**අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව** බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පළමු වරට පත් වීමේදී හඳුන්වාදීමේ වැඩසටහනකට සහභාගි වීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සැලසෙන අතර එහිදී බැංකුවට අදාළ නියාමන අවශ්‍යතාවන්, බැංකුවේ ඉතිහාසය, සංවිධාන ව්‍යුහය, බැංකුවේ පරිපාලිතයන් හා ආශ්‍රිතයන් පිළිබඳ විස්තර, බැංකුවේ නිෂ්පාදන හා සේවා පිළිබඳ විස්තර ද අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ද ඇතුළත් සවිස්තරාත්මක ලිපිගොනුවක් ලබාදෙන අතර දත්ත ලබා ගැනීම සඳහා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයට පිවිසීමට ඉඩ සලස්වනු ලැබේ. පුහුණු සැසි සඳහා සහභාගී වීමට අධ්‍යක්ෂවරුන් උනන්දු කරවන අතර බැංකුවේ බාහිර පරිසරයේ වර්තමාන සහ නව්‍ය උපායමාර්ගයන් පිළිඳව බැංකුවේ ආයතනික කළමනාකාරිත්වය මඟින් හෝ බාහිර සම්පත් දායකයකු මඟින් හෝ විස්තරාත්මකව පැහැදිලි කිරීම් සිදු කෙරේ. අධ්‍යක්ෂවරු වසර තුළ එක් පුහුණු වැඩසටහනකට සහභාගි වූහ. කෙසේ වෙතත්, බැංකුවේ ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීන කිරීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය අවස්ථාවලදී ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.
අ.2.	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී (CEO) අතර වගකීම් බෙදා හැරීම.** ලංකා බැංකුවේ සභාපති තනතුර හා ප්‍රධාන විධායක නිලධාරී තනතුර (ලංකා බැංකුවේ මහා කළමනාකරු) පුද්ගලයන් දෙදෙනෙකු විසින් දරණු ලබයි. සභාපති, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. බැංකුව විසින් නිකුත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුව ලංකා බැංකුවේ සභාපතිතුමාගේ හා මහා කළමනාකාරතුමාගේ වගකීම් ඉතා පැහැදිලිව දක්වා ඇත.
අ.3.	**සභාපති භූමිකාව** බැංකුවේ සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සපයනු ලැබේ. මහා කළමනාකාරතුමා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් අදාළ කරුණු වලට අනුව ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය සභාපතිතුමාගේ අවසරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍ර සකස් කරයි. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය විසින් සකස් කරන ලද න්‍යාය පත්‍රය සභාපතිතුමා විසින් අනුමත කරයි. උපායමාර්ග, කාර්යසාධනය, සම්පත් විභජනය, අවදානම් කළමනාකරණය හා අනුකූල වීම යන සියළු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි මෙම න්‍යාය පත්‍ර සකස් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින හතකට පෙර අදාළ කරුණු පිළිබඳ ප්‍රමාණවත් විස්තර ඇතුලත් න්‍යාය පත්‍රය ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. සියළුම අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ යුතුකම් හා වගකීම් ද (අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි) අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල ව්‍යුහයද පැහැදිලිව ප්‍රකාශ කිරීම හේතු කොට ගෙන සිය වගකීම් නිසි ආකාරයෙන් ඉටු කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් ඔවුන්ගේ හැකියාවන් මත බැංකුවේ සාර්ථකත්වයට උපරිම දායකත්වය ලබා දෙයි. සියළුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම් න්‍යාය පත්‍රයට අදාළ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට හා අවශ්‍ය වැඩිදුර දත්ත ලබා ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දී ඇති අතර ආයතනිකමය වශයෙන් වැදගත් යැයි හැඟෙන කරුණු න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ඉල්ලා සිටීමට අවස්ථාව සලසා ඇත. සැලකිල්ලට භාජනය කරන ලද ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තහවුරු කරනු ලබන අතර, එවැනි සාකච්ඡාවන් පිළිබඳ විස්තරාත්මකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ සටහන් කර ඇත.
අ.4.	**මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මග පෙන්වීමක් ලබා දීම සඳහා මූල්‍ය දැනුම හා නිපුණතාවය** බැංකුවේ කටයුතු වලට මඟපෙන්වීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය දැනුමක් හා නිපුණතාවයක් අධ්‍යක්ෂවරුන් සතුව ඇති අතර ඒ සඳහා ඔවුන්ට තම ව්‍යාපාර/ වෘත්තීය තුළින් ලද පෙරහුරුවන් මහෝපකාරී වේ.
අ.5.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිතතාවය** සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සෑම විටම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. ඒ අතරින් භාණ්ඩාගාර නියෝජිත හැර පස් දෙනෙක් (05) ස්වාධීන වෙති. මෙම සංග්‍රහයේ අදාළ රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූලව ස්වාධීන/ ස්වාධීන නොවන තහවුරු කිරීම සඳහා ස්වාධීන ප්‍රකාශයක් 2024 දී ලබා ගනු ඇත. විකල්ප අධ්‍යක්ෂවරුන් පත්වන අවස්ථා වලදී ද ඔවුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වීම අනිවාර්ය වේ.
අ.6.	**කාලීන තොරතුරු සැපයීම** න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පත්‍රිකා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු රැස්වීම් වලට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වීම මඟින් ඒ සඳහා තොරතුරු සොයා බැලීමට අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සුමටව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී අවශ්‍ය කරුණු පැහැදිලි කර ගැනීම සඳහා පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කරනු ලැබේ. පැහැදිලි කිරීම් කටයුතු සඳහා ආයතනික කළමනාකාරිත්වයේ අදාළ සාමාජිකයන් සුදානම්ව සිටී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සිට දින 10 ක් ඇතුළත දී එහි වාර්තාව අධ්‍යක්ෂවරුන්ට ලබා ගැනීමට ඉඩ සලස්වා ඇත.
අ.7.	**අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම්: නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුව**
අ.7.1.	ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් තම විෂය පථයට බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් බැංකු ආඥා පනත හා එහි සංශෝධන හා අදාළ නීතිරීති වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් කරනු ලැබේ. එමෙන්ම අදාළ අමාත්‍යාංශය සමඟ හුවමාරු කරගත් අධ්‍යක්ෂවරුන් පත් කිරීමට අදාළ අභ්‍යන්තර ප්‍රතිපත්තියක් බැංකුව සතුව පවතී.

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
7.2.	නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව, 2023 වසරේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (03) සමන්විත වූ අතර ඔවුන් අතරින් සභාපතිවරයා ඇතුළු දෙදෙනෙකු (02) ස්වාධීන වේ. අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා කිරීමෙන් පසු, ඔවුන්ගේ යෝග්‍යතාවය කමිටුවේ සාමාජිකයින් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝගයේ 3(6)(iv) (අෑ). නියාමන අංක 11 ප්‍රකාරව තක්සේරු කරනු ලැබේ.
7.3.	බැංකුව සතුව ආයතනික කළමනාකරණය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් ඇති අතර එය වසර තුළ සංශෝධනය කර ඇත. 2024 දී අනුමත කරන ලද ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා නව ප්‍රවර්ධන ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව කමිටුව සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලදී.
7.4.	අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් ඉහත අ.7. හි සඳහන් පරිදි කොටස් හිමියා විසින් සිදු කරනු ලැබේ. නව අධ්‍යක්ෂවරුන් සම්බන්ධ තොරතුරු බැංකුවේ වෙබ් අඩවියේ, මාධ්‍යයේ පළ කර කොළඹ කොටස් වෙළඳපළ වෙත නිවේදනය කෙරේ.
7.5.	නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව පිළිබඳ වාර්තාව 128 සහ 129 පිටුවල දක්වා ඇති අතර කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් ද දක්වා ඇත.
අ.8.	**නැවත පත් කිරීම** තම සේවා කාලයට ප්‍රථම අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කළහොත් හෝ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට අනුව ධුරය හෙබවීමෙන් ඉවත් වුවහොත් හැර සෑම අධ්‍යක්ෂවරයෙකුම අවුරුදු තුනක සේවා කාලයක් සඳහා පත් කරනු ලබන අතර මෙම අවස්ථා දෙකෙහිදීම බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් වීමට බාධාවක් ඇති නොවේ. ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා වසර තුනක (03) ඔහුගේ ධුර කාලය අවසන් වූ පසු 2023.04.29 දින සිට බලපැවැත්වෙන පරිදි නැවත පත්කරන ලදී. **ධුරයෙන් ඉල්ලා අස්වීම** පත් වූ අධ්‍යක්ෂවරයෙකු තම අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වන විට හා සේවා කාලය අවසන් වනවිට තම ඉල්ලා අස්වීමේ ලිපිය බැංකු කටයුතු විෂය භාර අමාත්‍යවරයාට ලිඛිතව ලබාදිය යුතුවේ. තවද විශේෂ හේතුවක් මත සේවයෙන් ඉවත් වන්නේ නම් එයද තම ලිපියෙහි සඳහන් කළ යුතුවේ. අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම්/ ඉල්ලා අස්වීම් පිළිබඳ විස්තර පිටු අංක 115 හි දක්වා ඇත.
අ.9.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ හා එහි උපකමිටු වල කාර්යසාධනය ඇගයීම** අධ්‍යක්ෂ මණ්ඩලයේ හා උපකමිටු වල අදාළ ඉලක්ක නිවැරදිව ළඟා කර ගනිමින් අදාළ කමිටු වගකීම් තෘප්තිමත් විය හැකි අයුරින් ඉටුකර ඇති බව තහවුරු කර ගැනීමට ස්වයං ඇගයීම් ක්‍රියාවලියක අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාළ උපකමිටු නිරත වේ. එම කමිටු සියල්ලේම සාමූහික ප්‍රතිඵලය අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සමාලෝචනය කරනු ලැබේ. මෙම වර්ෂයේදී මෙම ස්වයං ඇගයීම් හා සමාලෝචන ක්‍රියාවලිය නාමයෝජනා සහ යහපාලන අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු හරහා සිදු කර ඇත. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සාමාජිකයන් එම උපකමිටු වල කාර්යසාධනයන් හි ඵලදායකත්වය සහ කාර්යක්ෂමත්වය සාමූහිකව ඇගයීමට ලක් කරන ලදී.
අ.10.	**අධ්‍යක්ෂවරු සම්බන්ධයෙන් තොරතුරු වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කිරීම** අධ්‍යක්ෂවරු හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු වාර්ෂික වාර්තාවේ සඳහන් වේ. නම, සුදුසුකම්, ප්‍රවීණතාවය දක්වන ක්ෂේත්‍ර, විධායක හෝ විධායක නොවන බව ද ඇතුළුව අධ්‍යක්ෂවරුන්ට අදාළ විස්තර පිටු අංක 28 සිට 31 දක්වා ඇත. බැංකුව සමඟ හිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිටු අංක 155. මූල්‍ය ප්‍රකාශන්හි සටහන් අංක 17 හි අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද පාරිතෝෂික පිටු අංක 200. සම්බන්ධිත පාර්ශ්ව විස්තර පිටු අංක 312 සහ 319 දක්වා ඇති අතර වෙනත් ආයතන වල දරණ අධ්‍යක්ෂධුර පිළිබඳ විස්තර පිටු අංක 155 දක්වා ඇත. උපකමිටු වල සාමාජිකත්වය, වර්ෂය තුළ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම් වල සහභාගීත්වය පිළිබඳ පිටු අංක 116 හි දක්වා ඇත.
අ.11.	**ප්‍රධාන විධායක නිලධාරී/ මහා කළමනාකරු ඇගයීම** මහා කළමනාකාරතුමාගේ වාර්ෂික කාර්යසාධන වාර්තාව මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මඟින් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර කාර්යසාධනය මැන බැලීමට ගන්නා නිර්ණායක ලෙස බැංකුව අදාළ වර්ෂය තුළ ළඟා කරගත් ඉලක්ක හා ඊට අනුබද්ධිතව ඇති වර්ෂය ආරම්භයේ සකස් කල ආයතනික සැලැස්ම යොදා ගනී.
ආ	**අධ්‍යක්ෂ පාරිශ්‍රමික**
ආ.1.	2023 දී සමාලෝචනය කර සංශෝධනය කරන ලද සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය (සියලු විධායක නොවන) සඳහා විධිමත් පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. ඉහත ප්‍රතිපත්තිය සකස් කරනු ලබන්නේ රජය, කොටස් හිමියා විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ වෙනත් අදාළ නීති මත පදනම්වය. ඔහුගේ/ඇයගේ වේතනය තීරණය කිරීමට කිසිදු අධ්‍යක්ෂකවරයෙකු සම්බන්ධ නොවේ.
ආ.2.	**මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව** අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය වන්නේ රජය, කොටස් හිමියා විසින් කලින් කලට නිකුත් කරන චක්‍රලේඛ සහ වෙනත් අදාළ නීති සම්පාදනය පදනම් කරගෙනය. ඒ අනුව අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කිරීමේදී බැංකුවේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට කාර්යභාරයක් නොමැත. (කෙසේ වෙතත් ජ්‍යේෂ්ඨ විධායක නිලධාරීන්ගේ වේතනය නිර්දේශ කරයි.)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
ආ.3.	**පාරිශ්‍රමික පිළිබඳ හෙළිදරව් කිරීම**
	සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවන ලද පාරිශ්‍රමික පිළිබඳ විස්තර පිටු අංක 200 දක්වා ඇත.
	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සංයුතිය පිටු අංක 126 දැක්වේ.
	ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ගෙවන ලද පාරිශ්‍රමික පිටු අංක 313 දැක්වේ.
ඇ	**කොටස් හිමියන් සමඟ ඇති සබඳතා**
ඇ.1.	බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජය වන අතර බැංකුව හා කොටස් හිමියා අතර විවිධ ආකාරයෙන් සන්නිවේදන කටයුතු සිදු වේ. ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් නිලධාරියෙක් (මුදල් අමාත්‍යාංශ නිලධාරියෙකු) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන අතර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම ද සිදුවේ. වාර්ෂික වාර්තාව පිළිබඳ විමසීම් කිරීම් සඳහා පාර්ලිමේන්තුවේදී ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.
ඇ.2.	බැංකුවේ කොටස්කරු වශයෙන් රජය සතුව පවතින බැංකුවට අදාළ වන ප්‍රධාන ගැටළු හා විශේෂිත අංශයන් පිළිබඳ සාකච්ඡා කිරීම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සිදු කරන අතර එහිදී රජයේ ප්‍රධාන නියෝජිතයා හා අවශ්‍ය වූ විට අමාත්‍යාංශයේ උසස් නිලධාරීන් සහභාගි වේ. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්ව සමඟ සාර්ථක සන්නිවේදනයක් සඳහා පිහිටුවා ඇති සන්නිවේදනය ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.
ඇ.3.	312 සිට 319 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ අනාවරණය කර ඇති දේ හැර, වර්ෂය තුළ බැංකුවේ ක්‍රියාකාරිත්වයට, එහි ශුද්ධ වත්කම් පදනමට හෝ අදාළ පාර්ශ්ව ගනුදෙනුවලට ප්‍රමාණාත්මකව බලපාන කිසිදු ගනුදෙනුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදු කර නොතිබුණි.
ඈ	**වගවීම සහ විගණනය**
ඈ.1	සමාගමේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ අභියෝග, අවස්ථා සහ අපේක්ෂාවන් පිළිබඳ සමබර සහ තේරුම්ගත හැකි තක්සේරුවක් ඉදිරිපත් කිරීම.
	අදාළ මිනුම් දඬු භාවිතා කර බැංකුවේ මූල්‍ය තත්ත්වය, බැංකුවේ කාර්යසාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන හා අභියෝග, අවස්ථාවන් හා අපේක්ෂා පිළිබඳ වාර්තා පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයෙන් මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත.
	අදාළ නීති නියාමන හා මඟ පෙන්වීම් වලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කර ඇති අතර සැලකිය යුතු අපගමන අවස්ථා වලදී සාධාරණ පැහැදිලි කිරීම් ද මෙම වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කර ඇත.
	ව්‍යවස්ථාපිත අවශ්‍යතා, වෙනත් නියාමන ආයතන වලට ලබා දෙන වාර්තා, අතුරු සහ වෙනත් මිල සංවේදී ප්‍රසිද්ධ වාර්තා පිළියෙල කිරීමේදී සමතුලිත සහ පහසුවෙන් අවබෝධ කරගත හැකි අයුරින් පිළියෙල කර ඇති බව තහවුරු කරයි.
	බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තා සත්‍ය හා සාධාරණ බවට ප්‍රධාන මූල්‍ය නිලධාරී හා මහා කළමනාකාරතුමන් විසින් සහතික කරයි. සියළු මූල්‍ය වාර්තා ප්‍රසිද්ධ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පෙර විගණන කමිටුව මඟින් සමාලෝචනය කර අනුමැතිය සඳහා නිර්දේශ කරයි.
	අනුකූලතා අනාවරණ අවශ්‍යතා සපුරාලීම සඳහා පහත ප්‍රකාශන වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇත. බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව පිටු අංක 150 සිට 154 දක්වා ඇත.
	මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිටු අංක 156 සහ 157 දක්වා ඇත. අඟය එකතු කිරීම යටතේ කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණ පිටු අංක 68 සිට 72 දක්වා ඇත.
	ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම හා ඔවුන්ට සම්බන්ධිත පාර්ශ්ව මඟින් කළ ගනුදෙනු පිළිබඳ සාරාංශය පිටු අංක 312 සහ 319 දක්වා ඇත.
	මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිටු අංක 159 හි දක්වා ඇත. විගණකාධිපති වාර්තාව පිටු අංක 160 සිට 164 දක්වා ඇත.
	පිටු 68 සිට 72 දක්වා මූල්‍ය සමාලෝචනය යටතේ කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය.
ඈ.2	අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ කොටස් හිමියන්ගේ ආයෝජන සහ සමාගමේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියකි.
	බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීමට යාමේදී ඇතිවිය හැකි ප්‍රධාන අවදානම් වල ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් බැංකුවේ පැවැත්ම, අවදානම් කළමනාකරණ වැඩසටහන් වල මෙහෙයුම් හා කාර්යක්ෂමතාවය, බැංකුවට බලපෑ හැකි විවිධ අවදානම් වළක්වා ගැනීම සඳහා ඇති ප්‍රතිපත්ති හා භාවිතයන් ද ඊට අදාළ අනුකූලතා පිළිබඳ විස්තරද සපයමින් අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුකම් සලසයි.
	බැංකුවේ උපායමාර්ගික, මෙහෙයුම් සහ මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී එහි සඵලතාවය සහතික කිරීම සඳහා පැහැදිලි වගකීම් පැවරීමකින් යුතුව අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවදානම් කළමනාකරණ රාමුවක් ඇත.
	බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ මෙහෙයුම් කටයුතු, මූල්‍ය හා අනුකූලතා කටයුතු නිවැරදිව හැසිරවීම විගණන කමිටුවේ තවත් වගකීමක් වේ.
	බැංකුවේ අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන පද්ධති සුපරීක්ෂණය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා විගණන කමිටුව පත් කර ඇති අතර එම කමිටු වල කාර්යක්ෂමතාව වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කෙරේ.
	බැංකුව සතුව සියළු අංශ වලින් පරිපූර්ණ වූ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් ඇති අතර එමඟින් අභ්‍යන්තර විගණන කටයුතු පරීක්ෂාවට ලක්විය. බැංකුවේ බාහිර විගණක ලෙස විගණකාධිපති කටයුතු කරයි.

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
3(6) වගන්තිය බැංකුකරණය ඇ.3	**විගණන කමිටුව** සමාලෝචිත වසර තුළ බැංකුවේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත විය. එම වසර තුළ විගණන කමිටුවේ සභාපතිධුරය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් හෙබවීය. විගණන කමිටුවේ සභාපති ඇතුළු සාමාජිකයන් මූල්‍ය වාර්තාකරණය හා මූල්‍ය තත්ත්ව පාලනය පිළිබඳ මනා දැනුමකින් හා අත්දැකීම් වලින් පරිපූර්ණ අය වේ. අධීක්ෂණ වගකීම් ඉටුකිරීමේදී විගණන කමිටුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. විගණන කමිටුව විසින් අවදානම් කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරිත්වය හා කාර්යක්ෂමතාවයන් පිළිබඳ සමාලෝචන පැවැත්වීම, අභ්‍යන්තර විගණනය හා විගණන වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුවේ කාර්යභාරය හා වගකීම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 122 සහ 123 දක්වා ඇති විගණන කමිටු වාර්තාවේ හෙළිදරව් කර ඇත. විගණන කමිටුව සඳහා ලිඛිත නියමයන් නියම කර ඇති අතර එහි භූමිකාව සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කරයි. එමෙන්ම එය වර්ෂය තුළ සමාලෝචනය කරන ලදී. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කමිටුව විසින් සිදු කරන ලද කාර්යයන් මෙම වාර්තාවේ පිටු අංක 122 සහ 123 හි සඳහන් කර ඇත.
ඇ.4	**ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)** ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් සංස්කෘතිය, අවදානම් අභිරුචිය, අවදානම් හඳුනාගැනීම සහ වර්ගීකරණය, ශ්‍රේණිගත කිරීම සහ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කරයි. කමිටුවේ සංයුතිය සහ වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් 125 සහ 126 පිටුවල දක්වා ඇත.
ඇ.5	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු** සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අරමුණ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තීරණ ගැනීමේදී අනවශ්‍ය ලෙස බලපෑම් කිරීමට ඇති බැඳියාව වලක්වාලීමයි. ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම් හා ඔවුන්ගේ ආසන්න පවුලේ සාමාජිකයන් විසින් සිදුකළ ගනුදෙනු පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් ප්‍රකාශයේ පිටු අංක 312 සහ 319 තුළ ඇතුළත් වේ.
ඇ.6	**ව්‍යාපාර හැසිරවීම හා ආචාරධර්ම සංග්‍රහය** අදාළ නියාමනයන් හා ප්‍රතිපත්ති වලට අනුකූල වීම සඳහා බැංකුව විසින් එහි සේවකයන්ට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන වෙනම ආචාරධර්ම සංග්‍රහයන් පවත්වා ගෙන යන අතර ඒවා පිළිගැනීම සඳහා ප්‍රතිඥා ලබාදේ. නීතිවිරෝධී සහ වංචා වාර්තාවීම් කඩිනමින් වාර්තා කිරීමට හැකිවන පරිදි විසිල් බ්ලෝවිං ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතිපත්තිය වර්ෂය තුළ දී සමාලෝචනය කරන ලදී.
ඇ.7	**ආයතනික යහපාලන අනාවරණය** ආයතනික යහපාලන පුරුදු සමඟ අනුගත වීමට අදාළ තොරතුරු මෙම වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවේ පිටු අංක 111 සිට 121 දක්වා ඇතුලත් වේ.
ඉ	**කොටස් හිමිකාරිත්වය**
ඉ.1 සහ ඉ.2	බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජයයි.
ඊ	**අන්තර්ජාලය හා සයිබර් අවකාශයේ සුරක්ෂිතතාව** බැංකුවේ ව්‍යාපාර ක්‍රමවේදය පවත්වා ගැනීමට භාවිතා වන තොරතුරු තාක්ෂණික මෙවලම් හරහා බැංකු පරිසරය තුළ හා ඉන් පිටත හුවමාරුවීම හේතු කොටගෙන බැංකුවට බලපෑ හැකි සයිබර් අවකාශ අවදානම හඳුනා ගැනීමේ ක්‍රියාපිලිවෙලක් බැංකුව සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් තොරතුරු සුරක්ෂණ ප්‍රතිපත්තිය, කළමනාකාරිත්වයට බැංකුවේ තොරතුරු සුරක්ෂිතභාවය තහවුරු කරලීමට අවශ්‍ය දිශානතිය සපයයි. මීට අමතරව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් බැංකුව, සයිබර් අවකාශ අවදානම් වලින් මිදීමට නිර්දේශිත පිළිවෙත් අනුගමනය කරන බවට සහතික වේ. සයිබර් අවකාශ අවදානම් වලින් ආරක්ෂා වීමට හා තත්ත්වය සමනය කිරීමට බැංකුව භාවිතා කරන ක්‍රියා පිලිවෙත් මෙම වාර්ෂික වාර්තාවේ අවදානම් කළමනාකරණ වාර්තාවේ පිටු අංක 132 සිට 148 තෙක් දක්වා ඇත. සයිබර් අවකාශීය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම උදෙසා බැංකුව විසින් ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව අධ්‍යක්ෂවරුන් හට බැංකුවට අදාළව තොරතුරු තාක්ෂණය සම්බන්ධ කාර්යයන්ට අදාළ තීරණ ගැනීමේදී හා අධීක්ෂණ කටයුතු වලදී මනා පිටුවහලක් වේ.
උ	**තිරසාරත්වය: පරිසරය, සමාජීය සහ යහපාලන අවදානම සහ අවස්ථා** මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 61 සිට 63 දක්වා පරිසරය, සමාජීය සහ යහපාලනයට (ESG) අදාළ අනාවරණය කිරීම ඇතුළත් වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2023 සංග්‍රහයට අනුකූලතා

සංග්‍රහයේ සඳහන් කර ඇති වගන්තිය	අනුකූල වීමේ මට්ටම
ඒ	**ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම**
ඒ.1 ඒ.2	2024 දී අනුකූල වන (ආ) (ඒ) සහ (ඒ) හැර පහත සඳහන් ක්ෂේත්‍රවලට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වේ: (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කරුණු (ආ) අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු (ඇ) ආයතනික යහපාලනය, නාමයෝජනා සහ නැවත තෝරී පත්වීම (ඈ) පාරිශ්‍රමික (ඉ) ආයතනයේ ලැයිස්තුගත සුරුකුම්පත්වල වෙළඳාම් කිරීමේ ප්‍රතිපත්ති ඇතුළුව සියලුම අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් සඳහා අභ්‍යන්තර ව්‍යාපාරික හැසිරීම් සංග්‍රහය සහ ආචාරධර්ම (ඊ) අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය (උ) කොටස් හිමියන් සහ ආයෝජකයින් සමඟ සබඳතා (ඌ) පාරිසරික, සමාජීය සහ යහපාලන තිරසාරත්වය (එ) සමාගම් වත්කම් සහ කොටස් හිමියන්ගේ ආයෝජන පාලනය සහ කළමනාකරණය (ඒ) ආයතනික හෙළිදරව් කිරීම් (ඔ) වීසිල් බ්ලෝවිං (ඕ) අල්ලස් හා දූෂණ විරෝධී

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3. (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්		
3. (1) (i)	පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම තුළින් බැංකුවේ ආරක්ෂාව හා අඛණ්ඩතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශක්තිමත් කර ඇත.	
	(අ) බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීමත් ඒවා බැංකුව තුළ සන්නිවේදනය කිරීම.	අනුකූල වී ඇත. උපායමාර්ගික අරමුණු සකස් කිරීම සහ ආයතනික වටිනාකම් සමාලෝචනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඉහළ කළමනාකාරිත්වයේ සහභාගිත්වය සහිතව සිදු කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික සැලැස්ම සහ ආයතනික වටිනාකම් පිළිබඳව ශාඛා කළමනාකරුවන් දක්වා වූ සියලු කාර්ය මණ්ඩලයට සන්නිවේදනය කිරීම සිදු කරන ලදී. නිරන්තරයෙන් පවත්වන ලද සාකච්ඡා සැසි සහ රැස්වීම් හරහා අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල මේ පිළිබඳව දැනුවත් කරන ලදී. උපායමාර්ගික සැලැස්ම දියත් කිරීම බැංකුවෙන් පරිබාහිර ස්ථානයකදී සිදු කරන ලදී. 2024-2028 සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ උපායමාර්ගික සැලැස්ම ද පිළියෙල කර ඇත. තවද, ආයතනික වටිනාකම් අභ්‍යන්තර ජාලයට ඇතුළත් කර ඇත.
	(ආ) අඩුම වශයෙන් ඊළඟ වසර තුන සඳහා සමස්ථ අවදානම් ප්‍රතිපත්තිය හා අවදානම් කළමනාකරණ පටිපාටීන් සහ මැනිය හැකි අරමුණු සහිත යාන්ත්‍රණයන් ඇතුළත් බැංකුවේ සමස්ථ වෙළඳ කටයුතු පිළිබඳව උපායමාර්ග අනුමත කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ග ඇතුලත් වසරක් පාසා සංශෝධනය වන, ආයතනික සැලැස්ම හා ඊට සමගාමී ක්‍රියාකාර් සැලැස්ම වසර තුනක කාලයක් සඳහා සකස් කරන නමුදු 2024 වර්ෂයේදී එය වසර 5 ක් දක්වා වූ ආයතනික සැලැස්ම හා ඊට සමගාමී ක්‍රියාකාර් සැලැස්ම සකස් කරන ලද අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. උපායමාර්ගික සැලසුම සමඟ යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් අභිරුචිය, ප්‍රතිපත්තිය, කළමනාකරණ රාමුව සහ යාන්ත්‍රණය අනුමත කර ඇත. සමස්ථ බැංකුවට මැනිය හැකි ඉලක්ක පිහිටුවා ඇති අතර, එම ඉලක්කයන් පදනම්ව කාර්යඵලයන් ඇගයීම සිදු කරයි.
	(ඇ) ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම හා විවක්ෂණ ලෙස අවදානම් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ අවදානම් ප්‍රතිපත්තිය අනුමත කිරීම, අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම, ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම, පාලන ව්‍යුහයක් ඇති කිරීම, ප්‍රධාන අවදානම් මැනීම, අධීක්ෂණය හා පාලන සහ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම ආදිය අරමුණු කරගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් විසින් නව උපායමාර්ග හා එමගින් පැන නඟින අවදානම් තවදුරටත් අවම කිරීමේ ක්‍රම හා උපක්‍රම සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කරන ක්‍රියාවලියක් බැංකුව ආරම්භ කර ඇත. අවදානම් සම්බන්ධ සියළුම පැතිකඩ ආවරණය කරන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංශෝධිත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. පහත වාර්තා මඟින් මේ පිළිබඳ වැඩි දුර තොරතුරු සපයනු ලැබේ: • පිටු 132 සිට 148 දක්වා අවදානම් කළමනාකරණ වාර්තාව • පිටු 124 සහ පිටු 125 දක්වා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වාර්තාව
	(ඈ) තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස්කරුවන් සහ ණයගැතියන් ඇතුළු ඇල්ම දක්වන සියළුම පාර්ශ්වයන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම.	අනුකූල වී ඇත. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ ඇල්ම දක්වන සෑම පාර්ශ්වයක්ම ආවරණය වන පරිදි සන්නිවේදන ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ක්‍රියාත්මක කර ඇත.
	(ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණාත්මකභාවය සහ විශ්වසනීයත්වය විමර්ශනය කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමාණාත්මකභාවය හා අඛණ්ඩභාවය සමාලෝචනය කිරීම විගණන කමිටුවට පැවරී ඇත. මෙම කටයුතු සිදු කිරීමට විගණන කමිටුව ඔවුන්ට සෘජුව වාර්තා කරන අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙන් වාර්තා ලබා ගන්නා අතර, බාහිර විගණකයින්ගෙන්ද වාර්තා ලබා ගනී. විගණන කමිටුව විසින් තවදුරටත් අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා වන මෙවලමක් වශයෙන් නියාමකයින්ගේ සොයාගැනීම් නිවැරදි කිරීම් නිති පතා පසු විපරම් කරයි. කළමනාකරණ තොරතුරු පද්ධතියේ ථලදායිත්වය ඇගයීම, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වගකීමක් වන අතර ඔවුන් විසින් ඒ සඳහා තොරතුරු පද්ධති විගණනය සිදු කරන ලදී. අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඊ) ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් හඳුනා ගැනීම හා නම් කිරීම.	අනුකූල වී ඇත. සහකාර මහා කළමනාකරුවන් සහ ඊට ඉහළ ශ්‍රේණිවලට අයත් නිලධාරීන් හා සමාන ශ්‍රේණිවලට අයත් නිලධාරීන් බැංකුවේ ආයතනික යහපාලන අරමුණු යටතේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්/නිලධාරීන් (KMP) ලෙස බැංකුව හඳුනාගෙන තිබේ.
	(උ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අයත් අධිකාරී බල ක්ෂේත්‍රය හා ප්‍රධාන වගකීම් නිර්වචනය කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරී බලතල හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි ද ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ අධිකාරී බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි ද පිළිවෙලින් අර්ථ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන අතර එය මෙම වර්ෂය තුළ සමාලෝචනය කර ඇත.
	(ඌ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති වලට අනුකූලව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් බැංකුවේ කටයුතු යෝග්‍ය ආකාරයෙන් අධීක්ෂණය කරනු ලබන බවට සහතික කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ උපායමාර්ගික සැලැස්මට එරෙහිව කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලැබේ. ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් තමන්ගේ විෂය පථයට අදාළ කරුණු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් සිදු කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ විෂය පථයට අදාළව කරුණු පැහැදිලි කිරීම් වලටද කැඳවනු ලැබේ.
	(එ) පහත සඳහන් දේ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ යහපාලන පරිචයන්හි ඵලදායීතාවය කලින් කලට දැන ගැනීම: (i) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම, නම් කිරීම සහ තේරී පත්වීම (ii) බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීම සහ (iii) දුර්වලතාවයන් නිශ්චය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී වෙනස්කම් කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳ ස්වයං ඇගයීමක් වසරක් පාසා එහි පාලන භාවිතයන් තක්සේරු කිරීම සිදු කරනු ලැබේ. වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒවා පසු විපරම් කරමින් පවතී. 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනතේ විධිවිධාන සහ එහි සංශෝධන අනුව බැංකුව අයත් අමාත්‍යවරයා හරහා කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම සිදු කරනු ලබයි. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත බැඳියාවන් මත ගැටුම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතිපත්ති දෙකම වර්ෂය තුළදී සමාලෝචනය කරන ලදී.
	(ඒ) ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා යෝග්‍ය වූ අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතු බව සහතික කිරීම.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (නියෝජ්‍ය හා සහකාර මහා කළමනාකරුවන්) සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලසුමක් බැංකුව සතුව ඇත. නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව විසින් මෙය සමාලෝචනය සහ සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.
	(ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග පිහිටුවීම සහ ආයතනික අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම යනාදිය සඳහා අවශ්‍යතාවය අනුව නිරන්තරයෙන් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ රැස්වීම් පැවැත්වීම.	අනුකූල වී ඇත. තමන්ගේ විෂය පථයට අදාළව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් ක්‍රමානුකූල පදනමින් සිදු කරන අතර, අවශ්‍ය නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට හා උපකමිටු වලට කැඳවනු ලැබේ. උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව ආයතනික පරමාර්ථ වල ප්‍රගතිය අධීක්ෂණය කරනු ලැබේ.
	(ඕ) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ නියාමකයින් සමඟ බැංකුව ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගන්නා බවට සහතික කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරයකු ලෙස පත් වීමේදී විද්‍යුත් ආකෘතියෙන් පවතින "අධ්‍යක්ෂ මණ්ඩල අත්පොත" සමඟ බැංකුවට අදාළ සියළුම නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ ලිපි ගොනුවක් ඔහුට ලබා දේ. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් හරිහැටි ඉටු කිරීම සඳහා ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට නියාමන පරිසරයේ සිදුවන වෙනස්වීම් පිළිබඳ අධ්‍යක්ෂවරුන් කලින් කලට දැනුවත් කරනු ලැබේ. නියාමක ආයතන වලින් ලැබෙන වැදගත් තොරතුරු එසැනින්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරන අතර ඔවුන් නියාමකයින් විසින් සංවිධානය කරනු ලබන ඕනෑම රැස්වීම්/පුහුණු සැසි/වැඩමුළු/සම්මන්ත්‍රණ සඳහා සහභාගී වේ. නියාමකවරුන්ට ලබා දෙන ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදෙන අනුකූලතා වාර්තා ඇතුළු නියාමන ආයතනයන්ට ලබා දෙන සියලුම වාර්තා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඕනෑකමින් අධීක්ෂණය කරනු ලැබේ. බැංකුවේ වෙන්නායි, මාලේ සහ සීෂෙල්ස් මෙහෙයුම් කටයුතු වලට අදාළ වන නියාමන අවශ්‍යතා පිළිබඳව ද එම ශාඛා පිළිබඳ කාර්යසාධන වාර්තාව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලැබේ.

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ක) බාහිර විගණකයින්ගේ සේවය ලබාගැනීමේදී සහ අධීක්ෂණයේදී නිසි ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කටයුතු කිරීම.	අනුකූල වී ඇත. බැංකුව රජය සතු ව්‍යාපාරයක් වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.
3 (1) (ii)	මෙම නියමයන්ගේ 3 (5) නියමයේ දක්වා ඇති ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමත් ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් නිශ්චය කර අනුමත කිරීමත් කළයුතු වන්නේය.	නියාමන අංක 3(9)(ii) සමඟ එක්ව කියවන විට අනුකූල වේ. සභාපතිවරයා පත් කරනු ලබන්නේ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත සහ එහි සංශෝධන ප්‍රකාරව බැංකුව අයත් වන අමාත්‍යවරයා විසිනි. එම අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස සඳහන් වන ප්‍රධාන විධායක නිලධාරිවරයා පත්කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. ඩබ්ලිව් පී ආර් පී එච් ගොන්සේකා මහතා, කේ ඊ ඩී සුමනසිරි මහතා විශ්‍රාම යාමෙන් පසුව 2023 ජනවාරි 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස පත් කරන ලදී. ලංකා බැංකුවේ මහා කළමනාකරු තෝරා ගැනීම සඳහා අලුතින් සකස් කරන ලද උසස්වීම් ප්‍රත්පත්තියක් ක්‍රියාත්මක වේ.
3 (1) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය අබණ්ඩව රැස්විය යුතු අතර ආසන්න වශයෙන් මාසික පරතරයක් සහිතව අවම වශයෙන් වසරකට දොළොස් වතාවක්වත් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතුය. එවැනි රැස්වීම් වලට පැමිණීමට අයිතිය ඇත්තා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයකගේ පුද්ගලික ක්‍රියාශීලී සහභාගිත්වය තිබිය යුතුය. ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය සංසරනය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම හැකිතාක් දුරට වැලැක්විය යුතුවේ.	අනුකූල වී ඇත. අබණ්ඩ අර්ධ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන අතර විශේෂ රැස්වීම් අවශ්‍යතාව පැන නඟින ආකාරයට සැලසුම් කරනු ලැබේ. සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය 22 වතාවක් රැස්වී තිබේ. චක්‍රලේඛ යෝජනා මඟින් අනුමැතිය ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම කර තිබෙන අතර එය විශේෂිත පදනමක් මත පමණක් කරනු ලබන අතර එවැනි යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊළඟ රැස්වීමේදී සම්මත කෙරේ. 2023 වසර තුළ යෝජනා 15 ක් චක්‍රලේඛ මඟින් සම්මත කර ඇත.
3 (1) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍රයට වැදගත් කරුණු හා යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලැබෙන අයුරින් නිසි පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුත්තේය. ඒවා බැංකු ව්‍යාපාරික කටයුතු හා අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීමට අදාළ වූ විෂයයන් හා යෝජනා විය යුතුය.	අනුකූල වී ඇත. ක්‍රමානුකූලව පැවැත්වෙන රැස්වීම් සඳහා සකස් කළ න්‍යාය පත්‍රය යෝජනා ඇතුළත් කළ හැකි වන පරිදි සෑම වර්ෂයක්ම ආරම්භයේදී රැස්වීම් නියම කර අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වනු ලැබේ.
3 (1) (v)	සියළුම අධ්‍යක්ෂවරුන්ට සහභාගි වීමට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින හතකට පෙර දැනුම්දීමක් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටියක් මඟින් සහතික කළ යුත්තේය. අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කළ හැකිය.	අනුකූල වී ඇත. වර්ෂය ආරම්භයේදී වාර්ෂික දින දර්ශනය මඟින් රැස්වීම් පිළිබඳ දැනුම් දීම සිදු කෙරේ. රැස්වීම් වලට දින හතකට පෙර නැවත දැනුම් දීම සිදු කෙරේ. අනෙකුත් විශේෂ රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කරනු ලබන අතර විශේෂිත රැස්වීමක් යොදා ගැනීමට පෙර සියලුම අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත ද ලබා ගනු ලැබේ.
3 (1) (vi)	පසුගිය මාස 12 ක කාලය තුළ පැවැත්වූ රැස්වීම් වාර අඩුම වශයෙන් 2/3 කට සහභාගි නොවුණ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ පසුගිය රැස්වීම් වාර තුනකට අඛණ්ඩව සහභාගි නොවුණු අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂධූරය අහිමි වන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටිය මඟින් සහතික කළ යුතුය. විකල්ප අධ්‍යක්ෂවරයෙකු මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීම, නිසි පැමිණීමක් ලෙස පිළිගත හැකිය.	අනුකූල වී ඇත. ආයතනික යහපාලන සංග්‍රහයට අනුව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ දැනුවත් කර ඇත. අධ්‍යක්ෂවරුන් රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ පිටු අංක 116 හි දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම මෙම නියමයන්ට අනුකූලව තිබේ.
3 (1) (vii)	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ දැක්වෙන විධිවිධාන සපුරන්නා වූ සමාගම් ලේකම්වරයකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුත්තේය. එම තැනැත්තාගේ මූලික වගකීම විය යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් සේවා ලබාදීම සහ අණ පනත්වල හා වෙනත් නියාමනයන් මඟින් දක්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් නීතිඥවරියක වන අතර 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන ඇය විසින් සපුරාලනු ලබයි.
3 (1) (viii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ පටිපාටීන් සහ අදාළ රීති හා නියාමනයන් පිළිපදින බව සහතික කරනු පිණිස සියළුම අධ්‍යක්ෂවරුන්ට සමානව ලේකම්ගෙන් උපදෙස් හා සේවා ලබාගැනීම සඳහා අවකාශය තිබිය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගෙන් උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය නීතිඥවරියක වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සඳහා ඇය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (ix)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ලේකම්වරිය විසින් පවත්වා ගතයුතු අතර ඕනෑම සාධාරණ වේලාවක දී සාධාරණ දැනුම්දීමකින් පසු ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට එවැනි වාර්තා පරීක්ෂා කිරීම සඳහා විවෘතව පැවතිය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ලේකම්වරිය විසින් පවත්වාගෙන යන අතර, ඒවා ආරක්ෂිත මෘදුකාංගය තුළ තැන්පත් කරන අතර ඒවා සෑම අධ්‍යක්ෂවරයකුටම ලැබීමට සලස්වා ඇත. රැස්වීම් වාර්තා ඊට පසුව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කරනු ඇත. අධ්‍යක්ෂවරුන්ට ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික් සම්බන්ධතාවයක් හරහා පැරණි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවලට ප්‍රවේශ වීමට හැකියාව ඇත.
3 (1) (x)	අධ්‍යක්ෂ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලී බවකින් කටයුතු කළා ද යන්න අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා මඟින් තොරතුරු ලබාගත හැකිවන ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් අයුරින් විස්තරාත්මක විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇති වන සාකච්ඡාවන්ගේ ගැඹුරු බව පිළිබඳ තක්සේරු කිරීමට මෙම වාර්තා නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට උපකාරී විය යුතය. එම නිසා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තුළ පහත දෑ පැහැදිලිව ඇතුළත් විය යුතුය: (අ) අධ්‍යක්ෂ මණ්ඩලය තම සාකච්ඡා සඳහා භාවිතා කරනු ලැබූ තොරතුරු හා දත්ත පිළිබඳ සාරාංශයක් (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමට යෙදුන විෂය කරුණු (ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම යුතුකම් නිසි සැලකිල්ලෙන් හා ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කරගෙන යන්නේ ද යන්න පිළිබඳ තොරතුරු, රැස්වීමේ සාකච්ඡා සහ මතභේදයට හෝ විරෝධයට බඳුන් වූ විෂය කරුණු (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්ති සහ අදාළ නීති හා නියාමනයන් වලට අනුකූල වන බව විදහාපාන්නා වූ, අදාළ විධායකයින් විසින් කරනු ලබන සාක්ෂිදීම් සහ සනාථ කිරීම් (ඉ) බැංකුව විවෘත වන අවදානම් වලට සම්බන්ධ කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ තේරුම් ගැනීම් හා අවදානම් කළමනාකරණය පිළිබඳ අනුගමනය කල ක්‍රමෝපාය පිළිබඳ විශ්ලේෂණය (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා	අනුකූල වී ඇත. විස්තරාත්මක අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා මඟින් මෙම නිර්ණායකයන්ට අදාළ කරුණු ආවරණය වේ.
3 (1) (xi)	යෝග්‍ය අවස්ථාවන්හි දී සාධාරණ ඉල්ලීම් මත බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීයමය උපදෙස් පැතීම සඳහා අධ්‍යක්ෂවරුන්ට අවස්ථා ලබාදෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ පටිපාටියක් තිබිය යුත්තේය. අදාළ අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරුන්ට ඔහුගෙන්/ඇයගෙන්/ඔවුන්ගෙන් බැංකුවට ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීම සඳහා ආධාර වීම පිණිස වෙනම ස්වාධීන වෘත්තීයමය උපදෙස් ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. අවශ්‍ය අවස්ථා වලදී අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන වෘත්තීය උපදෙස් පැතීම සඳහා වන වර්ෂය තුළ සමාලෝචනය කරන ලද ප්‍රඥාප්තියක් බැංකුව සතු වන අතර අවශ්‍ය අවස්ථාවලදී ඉහත ප්‍රඥාප්තිය පදනම් කොටගෙන අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි උපදෙස් කරා යොමුවෙයි.
3 (1) (xii)	අනෙකුත් සංවිධාන හෝ සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ කටයුතු කිරීමේදී සහ ඒවාට ඇති බැඳීම්වල දී, බැඳියාවන් අතර ගැටුම් ඇතිවීම හෝ එවැනි ගැටුම් ඇති බව පෙන්නුම් කිරීම අධ්‍යක්ෂවරුන් විසින් වළක්වා ගත යුත්තේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කිරීමට ඇති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිය යුතු වැදගත්කමකින් යුතු විෂය කරුණක් බව නිශ්චය කර ඇති විෂය කරුණක් සම්බන්ධයෙන් යම් අධ්‍යක්ෂවරයෙකුට අරමුණු අතර ගැටුමක් තිබේ නම් එවැනි විෂය කරුණු සාකච්ඡාවට බඳුන් කළ යුත්තේ අදාළ විෂය කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු හිමිකමක් නොමැති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් (මෙම නියමයන්ගේ 3(2)(iv) නියමය බලන්න) සහභාගි වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දීය. තවද, ඔහුට/ඇයට හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු හිමිකමක් ඇත්තා වූ ව්‍යාපාරයකට සම්බන්ධතාවයක් ඇති කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක දී අධ්‍යක්ෂවරයෙකු විසින් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය. එසේම එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නඩය පත්‍රයේ අදාළ අධීක්ෂණය සඳහා ගණපූරණය ගණන් බැලීමේ දී ඔහු/ඇය ඊට ඇතුළත් නොකළ යුතු ය.	මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන නිලබලයෙන් පත්වූ අධ්‍යක්ෂ ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන භාණ්ඩාගර නියෝජ්‍ය ලේකම් ගිණුමේ ශේෂයන් පිළිබඳව විගණකාධිපතිවරයාගේ අවධානය යොමු කළ අවස්ථාව හැරුණු කොට අනෙකුත් කරුණු වලට අනුකූල විය. අධ්‍යක්ෂවරුන්ගේ අරමුණු අතර ගැටුමක් ඇති වන තත්ත්වයක් තුළ අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමට ඔවුන්ගේ වගකීම් පිළිබඳව අධ්‍යක්ෂවරු දැනුවත්ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැඳියාවන් අතර ගැටුම් සඳහා වූ ප්‍රතිපත්තීන් යොදාගෙන ඇති අතර වර්ෂය තුළදී සමාලෝචනය කරන ලදී. පරිචයක් ලෙස අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාවන් හෝ වෙනත් ආයතනයන් හි අධ්‍යක්ෂවරු ලෙස ලැබූ නව පත් වීම් වේනම් ඒ බව පවත්වන සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී හෙළිදරව් කළ යුතුය. බැඳියාවන් අතර ගැටුමක් පවතින අවස්ථාවක අධ්‍යක්ෂවරුන් තීරණ ගැනීමට සහභාගී වීමෙන්, ඡන්දය දීමෙන් හෝ සම්මත කිරීමෙන් වැළකී සිටී.
3 (1) (xiii)	බැංකුවේ මෙහෙයවීම හා පාලනය ස්ථිරසාර ලෙස තම අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම පිණිස තම තීරණ ගැනීම සඳහා තමන්ට විශේෂයෙන් වෙන් කරන ලද්දා වූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තබාගත යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ ඇතුළත් කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (xiv)	බැංකුවට තම වගකීම් ගෙවීමට නොහැකි යැයි හෝ නොහැකි වීමට ඉඩ ඇතැයි හෝ බැංකුව බුන්වත් වීමට ආසන්න යැයි හෝ තැන්පතුකරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට නියමිත ගෙවීම් අත්හිටුවීමට ආසන්න යැයි හෝ බැංකුව සළකන්නේ නම් වෙනත් කිසිම තීරණයක් හෝ ක්‍රියාවක් ගැනීමට පෙර වහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු වේ.	අනුකූල වී ඇත. 2023 වර්ෂය තුළ මෙවැනි තත්ත්වයක් මතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද මාසික මූල්‍ය වාර්තා මඟින් බැංකුවේ නුබුන්වත් බව සහතික වනු ඇත.
3 (1) (xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ අනෙකුත් විවක්ෂණශීලී පදනම් අනුව මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති මට්ටම් වලට අනුකූල වන මට්ටමක බැංකුවේ ප්‍රාග්ධනය පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුව මුදල් මණ්ඩලයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයන්ට පූර්ණ අනුකූලතාවයක් දක්වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරුවක් ලබා දෙයි. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත වල තත්ත්වය බැංකුවේ මාසික මූල්‍ය ප්‍රකාශන සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.
3 (1) (xvi)	මෙම නියමයන්ගේ 3 වැනි නියමයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් වූ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවක්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාව තුළින් ප්‍රසිද්ධ කළ යුතු ය.	අනුකූල වී ඇත. මෙම අනාවරණයන් බැංකුවේ වාර්ෂික වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවට අඩංගු කොටසක් වේ.
3 (1) (xvii)	වාර්ෂිකව සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම ස්වයං ඇගයීමක් කිරීම සඳහා වූ ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කළයුතු අතර එවැනි ඇගයීම්වල වාර්තා තබාගතයුතු වන්නේය.	අනුකූල වී ඇත. ස්වයං ඇගයීමේ යාන්ත්‍රණයක් බැංකුව විසින් භාවිතයට ගන්නා අතර එය වසර අවසානයේ සිදුකරයි. ලංකා බැංකුවේ ලේකම්තුමිය/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය විසින් ස්වයං ඇගයීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වාගෙන යනු ලැබේ.
3 (2) අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය		
3 (2) (i)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතකට වඩා අඩු නොවිය යුතු අතර, 13 ට වඩා වැඩි නොවිය යුතුය.	1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව හයක් වේ. 2023 වසර තුළ සිටි අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය අනුකූලතා වාර්තාවේ නියාමන අංක 3(2)(viii) යටතේ දක්වා ඇත. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 112 දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම ද ඇතුළත්ව මෙම විධිවිධානයන්හි අවශ්‍යතා සපුරාලීමට ලංකා බැංකු ආඥා පනතට යෝජනා කරන ලද සංශෝධන අනුමත කර ගැනීමේ ක්‍රියාවලියේ පවතී.
3 (2) (ii)	(අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුරෙහි සිටින අධ්‍යක්ෂවරයා හැර, අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නවයක් නොඉක්මවිය යුතු අතර එම සේවා කාලයට 2008 ජනවාරි 01 දින දක්වා එවැනි අධ්‍යක්ෂවරයෙකු එම ධූරයේ සේවය කරන ලද මුළු කාලයද ඇතුළත් විය යුත්තේය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ වත්මන් අධ්‍යක්ෂවරුන් වසර නවයකට වඩා අඩු සේවා කාලයක් එම තනතුරෙහි සේවය කර ඇත. වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 115 සඳහන් කර ඇත.
3 (2) (iii)	විධායක අධ්‍යක්ෂවරුන් ගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් තුනෙන් එකක ප්‍රමාණය නොඉක්ම වන පරිදි බැංකු සේවකයකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස (මින් මතු විධායක අධ්‍යක්ෂවරුන් ලෙස හඳුන්වන) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එවැනි අවස්ථාවකදී එක් විධායක අධ්‍යක්ෂවරයකු ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකු ආඥා පනතට අනුව ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂවරුන් සිටීමට නොහැකිය.
3 (2) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් එක යන දෙකෙන් වැඩි ගණනකින් සමන්විත විය යුතු ය. මෙම අනු විධානය අදාළ වන්නේ 2010 ජනවාරි 01 දිනෙන් පසුවය. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු පහත සඳහන් දෑට යටත් වන්නේ නම් ඔහු/ඇය ස්වාධීන අයෙකු ලෙස නොසැලකේ; (අ) බැංකුවේ කොටස් හිමිකාරත්වයෙන් 1% කට වඩා සෘජු ලෙස හෝ වක්‍ර ලෙස අත්කර ගෙන සිටීම. (ආ) දැනට හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාල සීමාවක් තුළ මෙහි 3(7) වන වගන්තියෙන් දක්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන කිසිදු ව්‍යාපාරික ගනුදෙනුවක වර්තමානයේ යෙදී සිටීම/යෙදී සිට තිබීම. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාලයක් තුළ බැංකුවේ සේවා නියුක්ත වී සිට තිබීම.	අනුකූල වී ඇත. (ජනවාරි 13 සිට 17 දක්වා දින 04 හැර) මුදල් අමාත්‍යංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා ස්වාධීන නොවන අතර, ඔහු විසින් බැංකුවේ එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජය නියෝජනය කරයි. ඒවා අධ්‍යක්ෂවරුන් පිළබඳ තොරතුරු යටතේ සහ අංක 3 (2)(viii) යටතේ හඳුනා ගෙන ඇත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඈ) සමීප ඥාතිත්වයක් ඇති අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ ජ්‍යේෂ්ඨ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයෙක් හෝ වෙනත් සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු බැංකුවේ හෝ වෙනත් බැංකුවක සිටීම. මෙහි අරමුණ සඳහා, සමීප ඥාතියකු, යන්නෙන් අදහස් වන්නේ කාලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන්නා වූ ළමයෙකි. (ඉ) බැංකුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් නියෝජනය කිරීම. (ඊ) පහත දැක්වෙන සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වීම: i. පහත 3(7) විධානයේ දැක්වෙන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක බැංකුව සමඟ වර්තමානයේ සිටින හෝ ii. බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරුන් සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරයෙක් වන හෝ සැලකිය යුතු කොටස් හිමියකු වී සිටින හෝ iii. මෙම විධානයන්ගේ 3(7) වන විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක යෙදී සිටින.	
3 (2) (v)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති විටක එසේ පත් කරන ලද පුද්ගලයා ද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන මිනුම් දඬු සම්පූර්ණ කළ යුතුය.	අනුකූල වී ඇත. ස්වාධීන අධ්‍යක්ෂවරුන් සඳහා විකල්ප අධ්‍යක්ෂවරුන් පත්කර නොමැත.
3 (2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් තරමේ විශ්වාසනීය පෙර වාර්තා සහිත ඉහළ හැකියාවකින් යුතු පුද්ගලයන් වියයුතු අතර, ක්‍රමෝපාය, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳව මතුවන ගැටළුවලට ස්වාධීන වූ තීරණ ගැනීමේ පළපුරුද්ද සහ හැකියාවන්ගෙන් ද යුක්ත විය යුතුය.	අනුකූල වී ඇත. අවශ්‍ය තොරතුරු නිර්ණය කිරීම සඳහා වර්තමාන අධ්‍යක්ෂවරුන්ගේ පැතිකඩ තොරතුරු පිටු අංක 28 සිට 31 දක්වා ඇත.
3 (2) (vii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ ගණපූර්ණය සම්පූර්ණ වුවද, එම රැස්වීමට සහභාගී වන අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් භාගයකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටිය යුතු අතර, එසේ නොවේ නම් එවැනි රැස්වීමක් නිසි පරිදි පවත්වන ලද්දක් නොවනු ඇත. මෙම අනුවිධානය බල පැවැත්වෙනුයේ 2010 ජනවාරි 01 දින සිටය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (2) (viii)	සියළුම ආයතනික සන්නිවේදන කටයුතු වලදී බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළි කිරීමේ දී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නිශ්චිතව හඳුනාගත යුතුය. සභාපති, විධායක අධ්‍යක්ෂ, විධායක නොවන අධ්‍යක්ෂ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයක් බැංකුව විසින් තම වාර්ෂික යහපාලන වාර්තා මඟින් අනාවරණය කළ යුතුය.	අනුකූල වී ඇත. 2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය: **කාංචන රත්වත්තේ මහතා** සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2020 ජනවාරි 02 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2023 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය). **රොනල්ඩ් සී පෙරේරා (ජනාධිපති නීතිඥ)** සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2023 ජනවාරි 18 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2024 මාර්තු 13 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය). **කාවන් රත්නායක මහතා** සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2024 මාර්තු 14 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය). **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා** ස්වාධීන නොවන, විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ (2020 අප්‍රේල් 28 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2023 අප්‍රේල් 29 සිට බල පැවැත්වෙන පරිදි නැවත පත් විය) **ජී හර්ෂ විජයවර්ධන මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2020 ජනවාරි 14 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2023 ජනවාරි 13 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2020 අප්‍රේල් 21 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2023 අප්‍රේල් 21 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
		මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජි ඒ චන්ද්‍රසිරි විචිස්වි ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2021 ජනවාරි 08 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2024 ජනවාරි 07 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) **මහාචාර්ය කිත්සිරි එම් ලියනගේ** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2023 මාර්තු 31 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) **නරේෂ් අබේසේකර මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2023 මැයි 04 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) **ජෙහාන් ස්මයිල් මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2024 පෙබරවාරි 07 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) **ජයමින් පැල්පොල මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2024 පෙබරවාරි 22 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය)
3 (2) (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වූ විධිමත්, නිසි තක්සේරුවකින් පසු සකස් කරන ලද විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය. එසේම අධ්‍යක්ෂ මණ්ඩලයට අනුප්‍රාප්තිකයන් පත් කිරීම සිදු කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ද තිබිය යුතු ය.	ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් කරනු ලැබේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට සහ පත්කිරීමේ ක්‍රියාවලියට සලකා බැලීමට අවශ්‍ය වන නිපුණතා, පළපුරුද්ද සහ දැනුම පිළිබඳ විස්තරාත්මකව ඇතුළත් වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද අදාළ අමාත්‍යාංශය සමග එකඟ වූ ප්‍රතිපත්තියක් ද සකස් කර ඇත.
3 (2) (x)	තාවකාලික ඇබෑර්තු පිරවීම සඳහා පත් කරනු ලැබූ සියළුම අධ්‍යක්ෂවරුන් එම පත් කිරීම් වලින් පසුව එළඹෙන පළවෙනි මහා සභා රැස්වීමේදී කොටස්කරුවන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමට යටත් විය යුතු ය.	අදාළ ඇමතිවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරන නිසා මෙය පැන නොනඟී.
3 (2) (xi)	අධ්‍යක්ෂවරයෙකු සිය ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් හෝ ඉල්ලා අස්වූයේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, (අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීමේ හෝ ඉවත් කිරීමේ හේතූන් එම අධ්‍යක්ෂවරයා බැංකුව සමඟ එකඟ නොවීමට අදාළ තොරතුරු තිබේ නම් එම තොරතුරු ද සමඟ ප්‍රසිද්ධ කළයුතුය; සහ (ආ) කොටස්කරුවන්ගේ අවධානයට ලක්විය යුතු කිසියම් කරුණක් ඇත්නම් ඒ බව ද නොමැතිනම් ඒ බව ද සහතික කරමින් ප්‍රකාශනයක් නිකුත් කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පත්කිරීම් හා ඉවත් කිරීම් සිදුකරයි. ඉල්ලා අස්වීමක් වේ නම් එයද එම අමාත්‍යවරයාට යොමු කරයි. ඉල්ලා අස්වීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට හා කොළඹ කොටස් හුවමාරුවට දැනුම් දෙනු ලැබේ. බැංකුවේ කොටස් හිමියා රජය වන අතර අධ්‍යක්ෂධූරයන්හි සිදු කරන වෙනස්වීම් අදාළ අමාත්‍යවරයා හරහා ශ්‍රී ලංකා රජය විසින් සිදු කරනු ලැබේ.
3 (2) (xii)	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම නොකළ යුතුය.	2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතා අනුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට නියෝජ්‍ය මහා කළමනාකාරවරයකු අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම හැර ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරුන් හෝ සේවකයින් වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරුන් නොවේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට පෙර, 2019 දෙසැම්බර් 19 වැනි දින නිකුත් කරන ලද 2019 අංක 8 දරණ නියෝගයට අනුකූලව 1988 අංක 30 දරණ බැංකු පනතේ 42 (1) වගන්තියට අනුව දිවුරුම් ප්‍රකාශයක් ලබා ගනී.
3 (3) අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය ඇගයීමේ නිර්ණායක		
3 (3) (i)	අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරන පුද්ගලයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු ය. (අ) මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන සාමාන්‍ය නිදහස් කිරීම් අදාළ වන්නේය: 2008 ජනවාරි 01 දිනට වයස අවුරුදු 70 සපුරන හෝ 2008 දෙසැම්බර් 31 දිනට පෙර වයස අවුරුදු 70 සපුරන අධ්‍යක්ෂවරයෙකුට 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන උපරිම වසර 3 ක කාලසීමාවක තවදුරටත් රාජකාරියේ යෙදිය හැක.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කිසිම අයෙකු වයස අවුරුදු 70 ට වඩා වැඩි නොවේ.
3 (3) (ii)	පුද්ගලයකු විසින් බැංකුවේ පරිපාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළත්ව සමාගම්/ ඒකකයන්/ ආයතන 20 කට වඩා වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂ තනතුර නොදැරිය යුත්තේය.	අනුකූල වී ඇත. සමාගම්/ආයතන 20 කට වඩා අධ්‍යක්ෂධූර හොබවන අධ්‍යක්ෂවරුන් නොමැත. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පතිවීමෙන් පසු වසර අවසානයේ මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගනී.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (3) (iii)	ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුවන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුට හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකුට තම ධූරයෙන් ඉවත් වූ දින සිට මාස හයක් ඉකුත් වීමට පෙර ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුවන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස පත්වීමට නොහැක. ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වන බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පිහිටුමේදී විශ්‍රාමික බැංකුකරුවන්ගේ විශේෂ දැනුම අවශ්‍ය වීම වැනි සුවිශේෂී අවස්ථාවන්හි දී සිදුවන වෙනස්කම් මූල්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත් විය යුතුය. මේ සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීමේදී අත්හිටුවීමේ සහන කාලය අවශ්‍ය බව සහතික කළ යුතුය. පත් කිරීමේ අධිකාරියක් විසින් බලපත්‍රලාභී බැංකුවකට අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමේදී මෙම විධිවිධාන කඩකරන්නේ නම්, බලපත්‍රලාභී බැංකුව විසින් එවැනි පත්වීම්ලාභියෙකු බලය හෝ ප්‍රතිලාභ භුක්ති විඳීමෙන් වැලැක්වීමට පියවර ගත යුතුය.	අනුකූල වී ඇත. සමාලෝචනය කරන ලද වසර තුළදී මෙවැනි තත්ත්වයක් පැන නැඟී නොමැත.
3 (4) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති කළමනාකරණ කාර්යයන්		
3 (4) (i)	බලතල පවරා දීම සඳහා පවතින ක්‍රියාවලිය අධ්‍යක්ෂවරුන් විසින් සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීම හා නිරවුල්ව අවබෝධ කර ගැනීම කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය බලය පවරා දීමේ කටයුතු කාලෝචිතව අධීක්ෂණය හා අනුමත කිරීම කරන අතර, බලය බෙදීමේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීමට ඉඩ තබමින් බැංකුවේ කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට ප්‍රමාණවත් බව තහවුරු කර ගනී. මෙම ක්‍රියාවලියේදී දැනට පවතින පාලන ආඥා, පනතේ සඳහන් නියමයන් සලකා බලනු ලැබේ.
3 (4) (ii)	අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්තයක් ලෙස තම කාර්යයන් ඉටු කිරීම සඳහා සැලකිය යුතු ලෙස අවහිරවන්නා වූ හෝ ඉටුකිරීමේ හැකියාව අඩු කරන්නාවූ ආකාරයේ ප්‍රමාණයකට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලීය කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියාට කිසිම කාර්යයක් පවරා දීම නොකළ යුත්තේය.	
3 (4) (iii)	බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ වන ආකාරයෙන් තිබෙන බව සහතික කර ගැනීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවතින බලතල පවරාදීමේ ක්‍රියාවලිය කාලීනව විමර්ශනය කළයුතු වේ.	
3 (5) සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි		
3 (5) (i)	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරිගේ කාර්යභාරයන් වෙන් කළ යුතු අතර, මෙම කාර්යයන් තනි පුද්ගලයෙකු විසින් සිදු නොකළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති, තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.
3 (5) (ii)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයකු වන්නේ නම් මැනවි. සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන විට, ස්වාධීනත්වය සහතික කිරීම පිණිස ලිඛිත කාර්යභාරයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කළ යුතුය. මෙම ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි පළ කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු හෙයින් ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟී.
3 (5) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික වාර්තාවේ අනිවාර්ය කොටසක් විය යුතු ආයතනික යහපාලන වාර්තාවේ, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරිගේ අනන්‍යතාවය ද, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර කිසියම් සම්බන්ධතාවයක් ඇත්නම්, (මූල්‍ය, ව්‍යාපාරික, පවුලේ හෝ අනෙකුත් සැලකිය යුතු/අදාළ සම්බන්ධතාවයන් ඇතුළුව) එයද පළ කළ යුතුයි.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.
3 (5) (iv)	සභාපතිතුමා විසින් (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම, (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බව හා සිය වගකීම් නිසි ලෙස ඉටුකරන බව සහතික කිරීම (ඇ) ප්‍රධාන ගැටළු කාලීන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡා කරන බව සහතික කිරීම කළයුතු වේ.	අනුකූල වී ඇත.
3 (5) (v)	අනිකුත් අධ්‍යක්ෂවරුන් විසින් රැස්වීම්වල දී සාකච්ඡා කිරීමට යෝජනා කරනු ලබන කාරණා සැලකිල්ලට ගනිමින් රැස්වීම්වල න්‍යාය පත්‍රය සැකසීමේ වගකීම සභාපතිතුමා සතුවන අතර, සමාගම් ලේකම්ට අදාළ කාර්යය පැවරිය හැකිය.	අනුකූල වී ඇත. සභාපති විසින් බලය පවරාදීම හා අනුමත කිරීම යටතේ, ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් මහා කළමනාකරු හරහා ඉදිරිපත් කරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මත න්‍යාය පත්‍රය පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර බෙදා හරින අතර කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන වෙනත් අදාළ කරුණු ද පදනම්ව රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය පිළියෙල කරයි.

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (5) (vi)	සභාපති විසින් සියළුම අධ්‍යක්ෂවරුන් රැස්වීමේ පැන නඟින කරුණු පිළිබඳව නිසි ලෙස දැනුවත්ව සිටින බවට සහතික විය යුතු අතර, ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට ද සහතික විය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇතිවන කරුණු පිළිබඳව දැනුවත්ය යන්න සභාපති විසින් සොයා බලා තහවුරු කරගත යුතුය. මෙම කටයුත්ත තහවුරු කිරීම සඳහා පහත ක්‍රියාපටිපාටි ඇති කර ඇත: • අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රැස්වීමට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. හදිසි පත්‍රිකා සඳහා මෙය අදාළ නොවේ. • අවශ්‍ය වූ විට පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වේ. කළමනාකරණ කණ්ඩායමේ අදාළ සාමාජිකයින් ඕනෑම පැහැදිලි කිරීමක් සඳහා සුදානමින් සිටී. • බැංකුවේ කාර්යථලය හා ස්ථායිතාවය ඇගයීම සඳහා අවශ්‍ය කළමනාකරණ තොරතුරු එකඟ වූ ආකෘතියකට නියමිත කාලවකවානු අනුව අධ්‍යක්ෂවරුන්ට සපයනු ලැබේ. • අධ්‍යක්ෂවරුන්ට අවශ්‍යතාවය පරිදි බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීමය උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත.
3 (5) (vii)	සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා සම්පූර්ණ හා සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා සියළුම අධ්‍යක්ෂවරුන් ධෛර්යමත් කළ යුතු අතර, බැංකුවේ උපරිම වාසිය සඳහා ක්‍රියාකරන බව සහතික කිරීමට මූලිකත්වය ගත යුතුය.	අනුකූල වී ඇත.
3 (5) (viii)	සභාපතිතුමා විසින් විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය ලබාගැනීමට පහසුකම් සැපයිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර හිතකර සබඳතාවයන් පවත්වා ගැනීම ද සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (5) (ix)	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හෝ වෙනත් කිසිම විධායක කාර්යයක් සෘජුවම අධීක්ෂණය සඳහා සභාපති සම්බන්ධ නොවිය යුතුය.	අනුකූල වී ඇත. සභාපතිතුමන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ.
3 (5) (x)	කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය වන බවට සභාපති විසින් සහතික විය යුතුය.	අනුකූල වී ඇත. මුළුමනින්ම කොටස් හිමිකාරිත්වය දරණ ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගනී. නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමිකාරිත්වය අතර සම්බන්ධිත මඟක් ලෙස ක්‍රියා කරයි.
3 (5) (xi)	ප්‍රධාන විධායක නිලධාරිවරයා බැංකුවේ දෛනික මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතු භාර ඉහළම විධායකයා වශයෙන් ක්‍රියා කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ එදිනෙදා මෙහෙයුම් ඉටු කිරීම මහා කළමනාකාරතුමාගේ වගකීමයි. මහා කළමනාකරුගේ බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ විශේෂයෙන් සඳහන් වේ.
3 (6) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ කමිටු		
3 (6) (i)	මෙම විධානයන්ගේ 3(6)(ii), 3(6)(iii), 3(6)(iv) සහ 3(6)(v) යන විධානවල දක්වා ඇති ආකාරය අනුව සෑම බැංකුවකම අඩුම තරමේ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක්වත් තිබිය යුතු ය. සෑම කමිටුවක්ම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම හා රැස්වීම් වාර්තා පවත්වා ගැනීම යනාදිය සඳහා සෑම කමිටුවක් විසින්ම ලේකම්වරයෙකු පත්කර ගත යුතුය. සෑම කමිටුවකම යුතුකම් හා කාර්යයන් ඇතුළත් කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම විධිවිධානය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලීය උපකමිටු හතරක් (විගණන, මානව සම්පත් හා පාරිශ්‍රමික, නාමයෝජනා හා ආයතනික යහපාලන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ) ස්ථාපිත කර ඇති අතර, රැස්වීම් වාර්තා සමඟ නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. මීට අමතරව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කමිටුව නමින් උපකමිටුවක් ද පිහිටවනු ලැබීය. සෑම උපකමිටුවක් සඳහා පවතින විෂය ක්ෂේත්‍රය වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ලංකා බැංකුවේ ලේකම් සියළුම උපකමිටුවල ලේකම් ලෙස පත්කර ඇති අතර, උපකමිටුවේ සභාපතිගේ අධීක්ෂණය යටතේ රැස්වීම් වාර්තා පවත්වා ගනී. උපකමිටු වල වාර්තා වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත. එකම කොටස්කරුවා රජය වන නිසා, බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට හා බැංකුව අදාළ අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරේ.
3 (6) (ii)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත ඊති අදාළ වේ: (අ) ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපතිවරයා විය යුතුය.	අනුකූල වී ඇත. විගණන කමිටුවේ සභාපතිත්වය දරනු ලබන්නේද අවශ්‍ය සුදුසුකම් හා අත්දැකීම් ඇති ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ආ) කමිටුවේ සෑම සාමාජිකයෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු ය. (ඇ) කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය: i. අදාළ නීති ප්‍රකාරව විගණන සේවා සඳහා බාහිර විගණක පත් කිරීම. ii. මහ බැංකුව විසින් විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද උපදෙස් මාලාවන් ක්‍රියාත්මක කිරීම. iii. අදාළ ගිණුම්කරණ ප්‍රමිති භාවිතා කිරීම. iv. විගණකවරුන්ගේ සේවා කාලය, ගාස්තු සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීමක් හෝ ඉවත් කිරීම; මෙහි දී විගණක හවුල්කරුවකුගේ සේවය ලබා ගැනීම වසර පහක් නොඉක්මවිය යුතු අතර, එම කාලය සපිරූ හවුල්කරුවකු නැවත පත්කළ හැකි වන්නේ මුල් වාරය සම්පූර්ණකර වසර තුනක් ඉක්මවූ පසුවය.	අනුකූල වී ඇත. විෂය ක්ෂේත්‍රය අනුව, විගණන කමිටුවේ අනිකුත් කරුණුවලට අමතරව පහත නිර්දේශ කර ඇත: • විගණකවරුන්ට කලින් කල නිකුත් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම. • අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතය විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන නිසා, බාහිර විගණකගේ කටයුතු සම්බන්ධයෙන් කමිටුවට ඉටු කළ හැකි භූමිකාවක් නැත.
	(ඈ) බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියේ සඵලදායකත්වය, අදාළ ප්‍රමිතීන් සහ මනා පරිචයන් අනුව සමාලෝචනය කිරීම කමිටුවේ කාර්යයකි.	විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන නිසා ඔහුගේ ස්වාධීනත්වය හා සඵලතාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවට අනුව සහතික කර ඇත.
	(ඉ) අදාළ නීති නියමයන්, අවශ්‍යතාවයන් සහ මාර්ගෝපදේශ මඟින් අවසර දෙන ලද විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකයින් යොදා ගැනීම පිළිබඳව ප්‍රතිපත්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම විගණන කමිටුවේ වගකීමකි. බාහිර විගණකවරයා විසින් සපයනු ලබන ඒවැනි විගණන නොවන සේවා ඔහුගේ ස්වාධීනත්වය සහ විෂය මූලිකභාවයට හානි නොවන බවට කමිටුව වගබලා ගත යුතුය. විගණන නොවන සේවා සැපයීමේ දී විගණකවරයාගේ ස්වාධීනත්වය හෝ විෂය මූලිකභාවය තක්සේරු කිරීමේදී කමිටුව විසින් පහත කරුණු සළකා බැලිය යුතුය: i. විගණන සමාගමේ නිපුණතා සහ පළපුරුද්ද විගණන නොවන සේවා සැපයීම සඳහා යෝග්‍ය වන්නේ ද නැද්ද යන්න ii. බාහිර විගණකවරයා විසින් එවැනි සේවා සැපයීමේදී විගණනයේ ස්වාධීනත්වය හා/හෝ විෂය මූලිකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇද්දැයි යන්න සහ iii. විගණන නොවන සේවාවල ස්වභාවය, අදාළ ගාස්තු මට්ටම්, විගණන සමාගමට සාපේක්ෂව එක් එක් ගාස්තු මට්ටම් හා සමුච්චිත ගාස්තු මට්ටම් යනාදිය බාහිර විගණකවරයාගේ විෂය මූලිකභාවයට හෝ ස්වාධීනත්වයට කිසියම් බලපෑමක් කරන්නේ ද යන වග.	විගණකාධිපති, බැංකුවේ විගණක නිසා මෙය පැන නොනඟී. බැංකුවේ විගණන නොවන කටයුතු සඳහා යොදා ගන්නා බාහිර විගණක ආයතනය (විගණකාධිපති විසින් ඔහුගේ සහයට පත් කරන ලද) කරන විගණන නොවන සේවා මඟින් ගාස්තු හේතු කොට ගෙන එම බාහිර විගණකවරයාගේ විගණන සම්බන්ධයෙන් වන ස්වාධීනත්වයට හෝ විෂය මූලිකභාවයට බලපෑමක් නොකරන බවට කමිටුව සහතික කරයි.
	(ඊ) විගණනය ආරම්භ කිරීමට පෙර කමිටුව විසින් පහත සඳහන් දේ ඇතුළත් විගණනයේ ස්වභාවය සහ විෂය පථය පිළිබඳව බාහිර විගණකවරයා සමඟ සාකච්ඡා කර අවසන් කළ යුතුය: i. අදාළ ආයතනික නීති සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකරණයේ අභ්‍යන්තර පාලන විධිවිධානවලට බැංකුවේ අනුකූලවීම පිළිබඳ ඇගයීමක්. ii. අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් අනුව බාහිර අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම. iii. එක් විගණන සමාගමකට වඩා වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ වන විට ඒවා අතර සම්බන්ධීකරණය යනාදියයි.	අනුකූල වී ඇත. 2023 වර්ෂයේ විගණනයේ දී විගණකාධිපතිවරයාට සහය වූ අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරී ආයතනය (EY) විසින් විගණන විෂය පථය සහ ප්‍රමාණය තීරණය කරනු ඇත. අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරී ආයතනය (EY) විසින් 2023 වර්ෂයේ සඳහා විගණන සැලැස්ම ඉදිරිපත් කළ අතර කමිටුව ඊට එකඟ විය.

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(උ) තොරතුරු අනාවරණය කිරීම සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල සත්‍යතාවය සහ ඒවායේ අඩංගු මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් පරීක්ෂා කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර කමිටුව විසින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු වන්නේ i. ප්‍රධාන විනිශ්චයන් සහිත ක්ෂේත්‍ර, ii. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්ගේ වූ වෙනස්කම්, iii. විගණනය තුළින් ඇති වූ ප්‍රධාන ගැලපීම්, iv. අඛණ්ඩ පැවැත්මේ උපකල්පනයන් සහ v. අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම ආදියයි.	අනුකූලවී ඇත. මෙය කමිටුව විසින් මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික මූල්‍ය තොරතුරු සමාලෝචනය කරමින් සිදුකරන අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.
	(ඌ) කමිටුව විසින් අතුරු සහ වාර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කළයුතු අතර, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සහභාගිත්වය නොමැතිව විගණකවරයාට සාකච්ඡා කිරීමට අවශ්‍ය දෑ වේ නම් ඒවාද ඇතුළු අනෙකුත් කරුණු ද අවශ්‍ය විට සාකච්ඡා කළ යුතුය.	අනුකූල වී ඇත. කමිටුව විසින් අතුරු සහ වසර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කරයි. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන අතර, ඔහුගේ නියෝජිතයෙකු විගණන කමිටුව සමඟ සංවෘත සාකච්ඡා වලට ඉදිරිපත් වෙයි. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සංවෘත සාකච්ඡා දෙකක් පැවැත්වුන අතර, ඒ සඳහා නිතිපතා පවත්වන විගණන කමිටු න්‍යාය හා අයිතම ඇතුලත් කිරීම මඟින් පහසුකම් සපයනු ලැබී.
	(එ) කමිටුව බාහිර විගණනයේ කළමනාකරණ ලිපිය හා එයට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළ යුතුය.	අනුකූල වී ඇත.
	(ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳව කමිටුව විසින් පහත දැක්වෙන පියවර ගත යුතුය: i. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් ප්‍රමාණවත්ද යන්න සමාලෝචනය හා සිය කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය බලය තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත් වීම.	අනුකූල වී ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත්හි ප්‍රමාණාත්මකභාවය සම්බන්ධයෙන් විගණන කමිටුව සමාලෝචනය කර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ පවතින/අවශ්‍ය කාර්ය මණ්ඩල පිහිටීම ඇතුළත් වූ කාල සීමාවක් සහිත විගණන සැලැස්මක්, කමිටුව විසින් සලකා බලන ලදී.
	ii. අභ්‍යන්තර විගණන වැඩසටහන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය සහ අදාළ වන පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත උචිත ක්‍රියාමාර්ග ගෙන තිබේදැයි සහතික කිරීම.	අනුකූල වී ඇත. කමිටුව මඟින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කරයි. වැඩි දියුණු කිරීම් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන තිබෙන බවට එහිදී සහතික කරනු ලැබේ.
	iii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හා ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය කිරීම.	අනුකූල වී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය හා අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියාපටිපාටිය හා ප්‍රතිඵල විගණන කමිටුව විසින් 2023 වසරදී අගයන ලදී. ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ඇගයුම් ක්‍රියාපටිපාටිය අනුව යමින්, ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් 2023 වර්ෂය සඳහා ඉටු කරන ලද අතර එය අනුමත කිරීම සඳහා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.
	iv. අංශ ප්‍රධානී, ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා අභ්‍යන්තර විගණන කාර්යය සඳහා බාහිර සේවා සපයන්නන් බඳවා ගැනීම හා සේවය හමාර කිරීම පිළිබඳ නිර්දේශ කිරීම.	අභ්‍යන්තර විගණන කාර්යය සඳහා අභ්‍යන්තර විගණන ප්‍රධානියා සහ බාහිරින් ලබා ගත් සේවා සපයන්නන් සම්බන්ධයෙන් අනුකූල වේ. අනෙකුත් ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලය පත් කරනු ලබන්නේ බැංකු කාර්ය මණ්ඩලය අතරින් ය.
	v. ප්‍රධාන අභ්‍යන්තර විගණක ද ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ හා බාහිර සේවා සම්පාදකයන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කරන බවට ද ඉල්ලා අස්වන ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයට හා බාහිර සේවා සම්පාදකයන්ට තමන් ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් සලසා දී ඇති බවට සහතික වීම.	අනුකූල වී ඇත. මෙබඳු අවස්ථාවක් වසර තුළ පැන නැඟුනේ නැත.
	vi. අභ්‍යන්තර විගණනය, එහි විගණනයට බඳුන්වන කටයුතු වලින් ස්වාධීන වන බවට හා අපක්ෂපාතීව, ප්‍රවීණතාවයෙන් යුක්තව හා නිසි වෘත්තීය සැලකිල්ල සහිතව ඉටු කෙරෙන බවට සහතික වීම.	අනුකූල වී ඇත. බැංකුවේ සංවිධාන ව්‍යුහය අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක, විගණන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරන අතර, ඔහු බැංකුවේ මෙහෙයුම් කටයුතු වලින් ස්වාධීනව කටයුතු කරයි.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඔ) කමිටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සලකා බැලිය යුතුය.	අනුකූල වී ඇත. විගණක කමිටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළේය.
	(ඕ) ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක හා බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙක් සාමාන්‍යයෙන් රැස්වීම් සඳහා සහභාගි වනු ඇත. සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා ප්‍රධාන විධායක නිලධාරීන්ට, කමිටුවේ ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි වීමට ඉඩ ඇත. කෙසේ වුවත් කමිටුව යටත් පිරිසෙයින් වසරකට දෙවරක් විධායක අධ්‍යක්ෂවරුන් රහිතව බාහිර විගණකවරුන් හමුවිය යුතුය.	අනුකූල වී ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරි, අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරි, අනුකූලතා නිලධාරි හා විගණකාධිපතිවරයාගේ නියෝජිතවරයා කමිටු රැස්වීම් වලට සහභාගි විය. මහා කළමනාකාරතුමාද කමිටුවේ ආරාධනය මත රැස්වීම් වලට සහභාගි විය. කළමනාකාරිත්වයේ සාමාජිකයන් අවශ්‍යතාවය මත, කරුණු පැහැදිලි කිරීම සඳහා කඳවනු ලබති. සංවෘත දොරටු රැස්වීම්, රැස්වීම්වල නඩය පත්‍රයට ඇතුළත් කර ඇති අතර විගණකාධිපතිවරයාගේ නියෝජිතයා අවශ්‍යතාවය තීරණය කරයි. ඉහත "ඌ" යටතේ දක්වා ඇති පරිදි විධායක නිලධාරීන් නොමැතිව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සමඟ සංවෘත දොරටු රැස්වීම් දෙකක් වර්ෂය තුළ පවත්වන ලදී.
	(ක) පහත කියැවෙන දෑ කමිටුව සතුව තිබිය යුතුය: i. විෂය පථයට අයත් වන කරුණක් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ප්‍රකාශිත අධිකාරිය ii. එසේ කටයුතු කරන්නට අවශ්‍ය සම්පත්, iii. තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය, iv. අවශ්‍ය නම්, බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමට හා අදාළ පළපුරුද්ද සහිත බාහිර පාර්ශ්වයන්ට රැස්වීම් සඳහා ආරාධනා කිරීම උදෙසා අධිකාරිය.	අනුකූල වී ඇත.
	(ග) සාකච්ඡාවට නියමිත කරුණු පිළිබඳ නිසි දැනුම්දීමක් සහිතව ක්‍රමිකව රැස්විය යුතු අතර, සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමෙහි දී එළඹී නිගමනයන් වාර්තාගත කළ යුතුය.	අනුකූල වී ඇත. විගණන කමිටුව ක්‍රමිකව රැස්වීම් පැවත්වීය. අවශ්‍ය කරන පරිදි අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ. ඒ අනුව මෙම වසර තුළදී දස වතාවක් කමිටුව රැස්වන ලදී. කමිටුවේ සාමාජිකයන් වෙත සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳ කල් ඇතිව දැනුම් දී ඇති අතර, එහි බලතල හා වගකීම් ඉටු කිරීමේදී එළඹෙන නිගමනයන් නිසි පරිදි වාර්තා කර ඇත.
	(ඵ) අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් කරුණු පිළිබඳ සවිස්තරාත්මක හෙළිදරව්වක් කළ යුතුය: i. විගණන කමිටුවේ කටයුතු පිළිබඳ සවිස්තර තොරතුරු, ii. වසර තුළ පැවැත්වූ විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව, හා iii. එම රැස්වීම් තුළ ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම.	අනුකූල වී ඇත. කමිටුවේ කටයුතු වාර්ෂික වාර්තාවේ පිටු අංක 122 සහ 123 හි විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත. කමිටුව සහභාගිවීම් විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 116 හි දක්වා ඇත.
	(ව) කමිටුවේ ලේකම් (සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්ය ප්‍රධානී විය හැක) කමිටු රැස්වීම්වල වාර්තා සවිස්තරව වාර්තා ගත කර පවත්වාගෙන යා යුතුය.	අනුකූල වී ඇත. කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන ලංකා බැංකුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් රැස්වීම්වල වාර්තා පවත්වා ගනු ලබයි.
	(ඩ) බැංකු කාර්ය මණ්ඩලයට, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන විධි හෝ වෙනත් දෑ පිළිබඳ විය හැකි අයථා ක්‍රියාවන් සම්බන්ධ සිය සැලකිලිමත් වීම්, රහස්‍යභාවයෙන් යුතුව මතු කිරීමට පවත්නා විධිවිධාන කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය. ඒ අනුව කමිටුව මෙකී කරුණු මත සාධාරණ හා ස්වාධීන විමර්ශනය සඳහා නිසි විධිවිධාන ස්ථාපිත කර ඇති බවට හා උචිත පසු විපරම් කාර්යයන් පිළිබඳව සහතික විය යුතු අතර, බාහිර විගණනකවරුන් හා බැංකුවේ සම්බන්ධතා සුපරීක්සුම සඳහා වන ප්‍රධානතම නියෝජන මණ්ඩලය ලෙසද කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම කරුණු ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් 'විසිල් බ්ලෝවිං ප්‍රතිපත්තියක්' ස්ථාපිත කර ඇති අතර, සැලකිය යුතු මට්ටමේ සොයා ගැනීම්, උචිත පසු විපරම් කටයුතු සඳහා විගණන කමිටුවට වාර්තා කරන ලදී. විගණන කමිටුව, බාහිර විගණකවරු සමඟ බැංකුවේ සම්බන්ධතා නිරීක්ෂණයේ ප්‍රධානතම නියෝජිතයා වන අතර බැංකුවේ බාහිර විගණක වන විගණකාධිපති සමඟ සම්බන්ධීකරණ කටයුතු කරයි.
3 (6) (iii)	පහත දැක්වෙන ඊති මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් බල පවත්වනු ඇත: (අ) කමිටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ගේ පාරිශ්‍රමික (වැටුප්, දීමනා හා සෙසු මූල්‍යමය ගෙවීම්) ප්‍රතිපත්තිය නිශ්චය කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික අදාළ අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ/ලිපි හා 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන වලට අනුරූප වන අතර, තවද බැංකුව ඉහත සඳහන් කළ චක්‍රලේඛ/ලිපි සහ ලංකා බැංකු ආඥා පනත මත පදනම් ව පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සම්මත කොට ඇති අතර එය 2023 වසරේදී සමාලෝචනය කරන ලදී. ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ස්ථාපිතය. කමිටුව විසින් වසර තුනකට වරක් මහා කළමනාකාරතුමාගේ සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ගේ පාරිශ්‍රමික පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරයි. සමාලෝචිත වර්ෂය තුළ කමිටුව දෙවරක් (02) රැස්වී ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ආ) කමිටුව, අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් සඳහා අරමුණු හා ඉලක්ක ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට අදාලව පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගීත්වයෙන් යුතුව ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් සඳහා අරමුණු හා ඉලක්ක බැංකුවේ උපායමාර්ගික සැලැස්ම පදනම් කොට සැකසූ ක්‍රියාකාරී සැලැස්ම තුළ විස්තරාත්මකව වාර්තා ගතකර ඇත. ප්‍රධාන කළමනාකාරිත්ව කණ්ඩායම තුළින් උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කරලීමේ වගකීම මහා කළමනාකරුට පැවරේ. ඉහත සැලසුම් මත පදනම්ව, කමිටුව විසින් 2023 වර්ෂය සඳහා මහා කළමනාකරුගේ සහ ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින් සඳහා පිහිටුවා ඇති අරමුණු සහ ඉලක්ක නිර්දේශ කරන ලදී. මහා කළමනාකරුගේ අනුදැනුම ඇතිව අදාළ නියෝජ්‍ය මහා කළමනාකරුවන් විසින් බැංකුවේ උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව විධායක කළමනාකාරිත්වය සඳහා ඉලක්ක සකස් කරන ලදී. සියළුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරුන් නිසා අධ්‍යක්ෂවරුන් සඳහා ඉලක්ක පනවා නැත. අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගික සැලැස්ම අධීක්ෂණය සහ මෙහෙය වීම සිදු කරයි.
	(ඇ) කමිටුව ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් ගේ කාර්යසාධනය, ඔවුන්ට ලබාදුන් ඉලක්ක හා අරමුණු සමඟ කලින් කලට ඇගයීමට ලක්කෙරුණු ලබන අතර, පාර්ශ්වමික, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත පදනම් අනෙකුත් ගෙවීම් සමාලෝචනය කිරීමේ පදනම නිශ්චය කළ යුතුය.	මහා කළමනාකරුගේ සහ ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින්ගේ වර්ෂ අවසාන කාර්යසාධන ඇගයීම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පවත්වන ලද අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ, ප්‍රධාන අවධානම් නිලධාරීගේ සහ නියෝජ්‍ය මහා කළමනාකාර (අනුකූලතා) ගේ කාර්යසාධන ඇගයීම් ඔවුන් වාර්තාකරන අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු හරහා ඇගයීමට ලක් වේ. විධායක කළමනාකාරිත්වයේ ඇගයීම ආයතනික කළමනාකාරිත්වයේ අදාළ නියෝජ්‍ය මහා කළමනාකරුවන් විසින් සිදු කරන ලදී.
	(ඈ) ප්‍රධාන විධායක නිලධාරී පිළිබඳ කරුණු සාකච්ඡා වන අවස්ථාවන්හි හැර සෙසු සියළුම කමිටු රැස්වීම් වල දී ප්‍රධාන විධායක නිලධාරීගේ පෙනී සිටීම අවශ්‍යය.	අනුකූල වී ඇත.
3 (6) (iv)	නාමයෝජනා කමිටුව සම්බන්ධව පහත දැක්වෙන රීති බලපානු ඇත:	බැංකුව නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවක් ස්ථාපනය කර ඇත. මෙම නිර්දේශයේ දක්වා ඇති වැඩ කටයුතු වලට අමතරව අදාළ ආයතනික යහපාලන මූලධර්ම පවත්වාගෙන යාම හා බැඳුණු අනෙකුත් නිශ්චිත වැඩ කටයුතුද කමිටුවේ විෂය ක්ෂේත්‍රය තුළ අන්තර්ගත කර ඇත. කමිටුව සඳහා වන ප්‍රඥප්තිය 2023 වර්ෂය තුළ සමාලෝචනය කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ කමිටුව දස වතාවක් (10) රැස්වී ඇත.
	(අ) කමිටුව, නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් තෝරා පත් කර ගැනීම සඳහා පටිපාටියක් ක්‍රියාත්මක කළ යුතුය.	බැංකුව අයත් වන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබයි. අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් ද අදාල අමාත්‍යාංශය සමඟ හුවමාරු කර ගෙන ඇත. ලංකා බැංකු ආඥා පනත දක්වා ඇති පරිදි ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත කී අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව මහා කළමනාකරු පත් කරයි. මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් පත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පොදු පටිපාටියක්/ යෝජනා ක්‍රමයක් පවතී.
	(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් අදාළ අධ්‍යක්ෂවරයාගේ කාර්යසාධනය හා දායකත්වය සැලකිල්ලට ගනිමින් වර්තමාන අධ්‍යක්ෂවරුන් යළි පත් කිරීම නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම) සලකා බැලිය යුතුය.	අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන්නේ අදාළ අමාත්‍යවරයා විසින් බැවින් මෙය පැන නොනඟී.
	(ඇ) ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් යන තනතුරු සඳහා තෝරා පත් කිරීමට/ උසස් කිරීමට සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද හා විශේෂිත ගුණාංග වැනි නිර්ණායකයන් කමිටුව විසින් ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. සෙසු ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරී තනතුරු සඳහා තෝරා ගැනීම හෝ උසස් කිරීමට යෝග්‍යතාවය ලැබීමට අවශ්‍ය කරණු, අවශ්‍ය සුදුසුකම්ද සඳහන් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උසස් කිරීමේ ක්‍රියාවලියක් ඇත.
	(ඈ) කමිටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් නියෝග අංක 3 (3) ආඥා පනත්වල දක්වා ඇති නිර්ණායක පරිදි අදාළ තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. තමන්, අංක 3 (3) නියෝගය හා ආඥා පනත් වල දක්වා ඇති නිර්ණායක තුළින් විශේෂිතව පෙන්වා ඇති පරිදි සිය තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කරමින් අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ප්‍රකාශ ලබා ගන්නා අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කෙරේ. තවද ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් වීම තනතුරු වලට පත් කරන හෝ උසස් කෙරෙන අවස්ථාවන්හි දී ඔවුන් එකී තනතුර දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බව කමිටුව තහවුරු කරයි.
	(ඉ) කමිටුව, අතිරේක/නව නිපුණතාවයන් පිළිබඳව අවශ්‍යතා හා විශ්‍රාම ගන්නා අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීගේ අනුප්‍රාප්තික සැලසුම් පිළිබඳව සළකා බලා, විටින් විට නිර්දේශ කරනු ලැබේ.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් උදෙසා අනුප්‍රාප්තික සැලැස්ම ස්ථාපිත කර ඇත. අවශ්‍ය අතිරේක හෝ නව නිපුණතා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු විසින් හෝ නැතහොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කෙරේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඊ) කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුගේ සභාපතිත්වය සහිත විය යුතු අතර, වඩා යෝග්‍ය ලෙස බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරියාට, ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි විය හැකිය.	අනුකූල වී ඇත.
3 (6) (v)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන රීති බලපවත්වනු ඇත:	අනුකූල වී ඇත.
	(අ) කමිටුව, යටත් පිරිසෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී සහ ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් කාණ්ඩ සුපරීක්ෂණය කරන ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය. කමිටුව, ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන් හා සමීපව කටයුතු කළ යුතු අතර, කමිටුවට අනුයුක්ත වගකීම් හා අධිකාරීත්ව රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.	සමාලෝචනය කරන ලද වර්ෂය තුළ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මහා කළමනාකරු සහ ණය, වෙළඳපළ, මෙහෙයුම්, කීර්තිනාම හා උපායමාර්ගික අවදානම් සුපරීක්ෂණය කරන ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන මූල්‍ය නිලධාරී හා අනුකූලතා නිලධාරී කමිටුවේ ආරාධනාව මත සෑම කමිටු රැස්වීමකටම සහභාගි වෙති. සෙසු ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් හා සෙසු කාර්ය මණ්ඩලය කමිටුවට ඔවුන්ගේ පැමිණීම අවශ්‍ය අවස්ථා වලදී ආරාධනය කරනු ලැබේ. කමිටුව, එහි අධිකාරීත්ව රාමුව හා ඊට අනුයුක්ත වගකීම් තුළ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් හා සමීපව කටයුතු කරයි.
	(ආ) කමිටුව බැංකුවට ඇති සියළුම අවදානම් උදාහරණ ලෙස ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම්, සුදුසු අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු තුළින් මාසිකව තක්සේරු කළ යුතුය. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණය බැංකුව පදනමින් හා සමූහ පදනමින් යන දෙයාකාරයෙන්ම සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය, බැංකුවේ ණය, වෙළඳපළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, උපායමාර්ගික හා කීර්තිනාම අවදානම් කමිටුව විසින් නිර්දේශ කොට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති ලේඛණ මත පදනම්ව, මාසික පදනමකින් තක්සේරු කරන අතර, සාරාංශ ගත වාර්තා කමිටු රැස්වීම් වලටද ඉන් පසු එළෙඹෙන ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමටද ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් අවදානම් පිළිබඳව කටයුතු කිරීම සඳහා අවදානම් කළමනාකරණ දර්ශන පුවරුවක් සකස් කොට ඇති අතර කමිටුවට වාර්තා ද සපයයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සාමූහික අවදානම් ප්‍රතිපත්තියක් ද ස්ථාපිතය.
	(ඇ) කමිටුව, විශේෂිත අවදානම් කෙරේ පියවර ගැනීමට හා කමිටුව විසින් පැහැදිලිව පනවා ඇති ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් සීමා තුළ හිඳිමින්, මෙකී අවදානම් කළමනාකරණය කිරීමට, ණය කමිටුව හා වත්කම් හා වගකීම් කමිටු බඳු කළමනාකාරීත්ව මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මකතාව හා සඵලතාවයන් සමාලෝචනය කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම කාර්යය සෑම වසරකම සිදු කරනු ලැබේ. 2022 වසරේ සමාලෝචනය 2023 දී සිදු කරන ලද අතර 2023 වසරේ සමාලෝචනය 2024 අප්‍රේල් මාසයේදී පැවැත්වීමට නියමිත රැස්වීමේ සිදු කෙරේ.
	(ඈ) බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමක හා සුපරීක්ෂණ අවශ්‍යතා පදනම මත කමිටුව විසින් තීරණය කළ විචක්ෂණශීලීතාවයන්ට ඔබ්බෙන් වන මට්ටමේ විශේෂිත අවදානම් පවත්නා අවස්ථාවන් හිදී කමිටුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.	අනුකූල වී ඇත. සීමාවන් ඉක්මවා ගිය විශේෂිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම්, ප්‍රධාන අවදානම් නිලධාරී විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධ ගැටළුවල තීව්‍රතාවය මත කමිටුවට සෘජුවම වාර්තා කෙරේ.
	(ඉ) මෙම කමිටුව, යාවත්කාලීන කළ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්ද ඇතුළුව අවදානම් කළමනාකාරීත්වයේ සියළු පැතිකඩ තක්සේරු කිරීම සඳහා යටත් පිරිසෙන් ත්‍රෛමාසිකව හමුවිය යුතුය.	අනුකූල වී ඇත. වසර තුළදී කමිටුව හය (06) වතාවක් රැස්විය. රැස්වීම් තොරතුරු හා සහභාගිත්වය පිටු අංක 116 හි දැක්වේ.
	(ඊ) විශේෂිත අවදානම් හඳුනා ගැනීමට අසමත් වීමට වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කමිටුව උචිත ක්‍රියාමාර්ග ගත යුතු අතර, කමිටුව විසින් නිර්දේශ කළ පරිදි හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් නිර්දේශ කළ පරිදි, කඩිනම් ප්‍රතිකර්ම ක්‍රියාත්මක යුතුය.	මෙම විධානයට අනුකූල වීම සඳහා විධිමත් ලේඛනගත විනය ක්‍රියා පටිපාටියක් බැංකුව තුළ ක්‍රියාත්මක වේ.
	(උ) කමිටුව, සෑම රැස්වීමක්ම පවත්වා සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර, එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය හා/හෝ විශේෂිත නියෝග ඉල්ලා සිටිය යුතුය.	අනුකූල වී ඇත. සෑම රැස්වීමකටම පසු එළඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට, විස්තරාත්මක කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කරන අතර, ඒ හා සමඟ අවදානම් කළමනාකරණ වාර්තා සහ නිර්දේශ ද යොමු කෙරේ.
	(ඌ) කමිටුව, නීති, රෙගුලාසි, නියාමන මඟ පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා ව්‍යාපාරික මෙහෙයුම් තුළ සෑම අංශයකම අනුමත ප්‍රතිපත්ති හා බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම උදෙසා අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කළ යුතුය. ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරී කාර්ය මණ්ඩලය තුළින් තෝරා ගැනුණු කැපවූ අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කෘත්‍යය ඉටුකළ යුතු අතර, කලින් කලට කමිටුවට වාර්තා කළ යුතුය.	අනුකූල වී ඇත. සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍රවල අදාළ නීති, නියාමන, නියාමන මඟ පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා අනුමත ප්‍රතිපත්ති හා සමඟ බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා බැංකුව විශේෂ අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කර ඇත. මෙම කෘත්‍යය සඳහාම කැපවූ අනුකූලතා නිලධාරියකු විසින් එය මෙහෙයවන අතර, ඔහු ත්‍රෛමාසික අනුකූලතා වාර්තා කමිටුවට ද මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ද ඉදිරිපත් කරයි. අභ්‍යන්තර පාලන විධි හා බැංකුවේ සෑම ව්‍යාපාරික අංශයක් තුළම අනුමත ප්‍රතිපත්ති හා සමඟ බැංකුවේ අනුකූලතාවය ද තක්සේරු කරයි.

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7) සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු		
3 (7) (i)	විශේෂයෙන් මෙම නිර්දේශයට අනුව සම්බන්ධිත පාර්ශ්ව සේ සැලකෙන පහත දැක්වෙන කාණ්ඩ හා බැංකුවේ කිසියම් ගනුදෙනුවකින් මතු විය හැකි අරමුණු අතර, ගැටුම් ඇතිවීම වළකාලන්නට අවශ්‍ය පියවර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගත යුතුය:	අනුකූල වී ඇත. සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අරමුණ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර අරමුණු සඳහා ගැටුම් ඇතිවීම වළකාලීමය.
	(අ) බැංකුවේ පරිපාලිත සමාගම් අතරින් කිසිවක්. (ආ) බැංකුවේ ආශ්‍රිත සමාගම් අතරින් කිසිවක්. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරුන් අතරින් කිසිවෙක්. (ඈ) බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් අතරින් කිසිවෙක්. (ඉ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධානතම කළමනාකාරිත්ව නිලධාරියෙකුගේ ආසන්නතම පවුලේ සාමාජිකයෙක්. (ඊ) බැංකුවේ සැලකිය යුතු බැඳියාවක් සහිත කොටස් හිමියෙක්. (උ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක්, බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් ආසන්න පවුලේ සාමාජිකයෙක් හෝ කිසියම් සැලකිය යුතු කොටස් හිමියන් සැලකිය යුතු බැඳියාවක් දරණ ව්‍යාපාරයකි.	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහිත අධ්‍යක්ෂවරුන්ගෙන් සිය ගනුදෙනු හෙළිදරව් කරන ලෙස පුද්ගලිකව ඉල්ලා සිටිනු ලැබේ. එම ගනුදෙනු ස්වයංක්‍රීය පද්ධතියක් හරහා අධීක්ෂණය කෙරේ.
3 (7) (ii)	මෙම නියෝගය මඟින් ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව හා ගනුදෙනු වර්ග තුළ පහත දැක්වෙන දෑ ඇතුළත්විය යුතුය: (අ) උපරිම ණය පහසුකම් පිළිබඳ මුදල් මණ්ඩලයේ නියෝග තුළ නිර්වචනය කර ඇති කිසියම් ආකාරයක ණය පහසුකමක් පිරිනැමීම. (ආ) තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන යන ආකාරයෙන් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම. (ඇ) බැංකුවට සැපයූ හෝ බැංකුවෙන් ලබාගත් කිසියම් මූල්‍යමය හෝ මූල්‍යමය නොවන සේවා සම්පාදනය. (ඈ) බැංකුව හා කිසියම් සම්බන්ධිත පාර්ශ්ව අතර, එබඳු සම්බන්ධිත පාර්ශ්වයන්ට ප්‍රතිලාභ අත්කර දිය හැකි, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනයම් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු හුවමාරු කිරීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හෝ තොරතුරු ප්‍රවාහ ගොඩනැගීම හා පවත්වා ගෙන යාම.	අනුකූල වී ඇත. මේ පිළිබඳ තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් යටතේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇත.
3 (7) (iii)	බැංකුව ඉහත සඳහන් විධාන අංක 3 (7) (i) තුළ නිර්වචනය කර ඇති අන්දමට සම්බන්ධිත පාර්ශ්ව හා සමඟ, සමාන ව්‍යාපාරික කටයුතු වල නිරත බැංකුවේ සෙසු ගනුදෙනුකරුවන්ට සපයනවාට වඩා වැඩි වාසිදායක සැලකීමක් එබදු පාර්ශ්වයන්ට පිරිනැමෙන අන්දමේ ගනුදෙනුවල නිරත නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩි වාසිදායක සැලකීම යන්නට, පහත දැක්වෙන දෑ ඇතුළත් වෙයි. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කළ පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණශීලි ප්‍රතිශතය ඉක්මවමින් සමස්ථ ශුද්ධ ණය පහසුකම්, සම්බන්ධිත පාර්ශ්වයන්ට සැපයීම. මෙම උප විධානය අනුව, i. 2007 අංක 7 දරණ බැංකු ආඥා පනත අනුව පහසුකම් යනුවෙන් නිර්වචනය කරනුයේ උපරිම ප්‍රමාණයේ පහසුකමයි. ii. සමස්ත ශුද්ධ ණය පහසුකම සමස්ථ ණය පහසුකමෙන්, මුදල්මය සුරැකුම් හා මෙබඳු සම්බන්ධිත පාර්ශ්ව විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තුළ හා වසර 5 කට හා එයට වැඩි කල්පිරීමේ කාලසීමාවක් සහිත ණය උපකරණයන් හි ආයෝජනය අඩු කිරීමෙන් ගණනය කළ යුතුය. (ආ) අසම්බන්ධිත සංසන්දනාත්මක ප්‍රතිපාර්ශ්වයක් සමඟ සංසන්දනාත්මක ගනුදෙනුවකදී බැංකුවේ ප්‍රශස්තම ණය පොළී අනුපාතයට වඩා අඩු පොළියක් අය කිරීම හෝ බැංකුවේ තැන්පතු පොළියට වඩා වැඩි පොළියක් ගෙවීම.	අනුකූල වී ඇත. බැංකුව, අනුකූලතා අංශය විසින් අධීක්ෂණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීමේ පටිපාටියක් ක්‍රියාත්මක කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව ඉදිරිපත් කරනු ලබන අනුකූලතා වාර්තාවෙහි අනුකූලතා තත්ත්වය සඳහන් කර ඇත. තවදුරත් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කාර්තුමය පදනමින් විගණන කමිටුව වෙත වාර්තා කරයි. අනුකූල නොවූ අවස්ථා වලදී එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරනු ලැබේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඈ) ඇගයීම් පටිපාටියක් රහිතව සම්බන්ධිත පාර්ශ්වයකට සේවා සැපයීම හෝ සේවා ලබා ගැනීම. (ඉ) නීත්‍යානුකූල වැඩ කටයුතු හා ක්‍රියාවලි සාධනය සඳහා අවශ්‍ය ප්‍රමාණ හැර, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනත් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හා බෙදාගැනීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හා තොරතුරු ප්‍රවාහ පවත්වාගෙන යාම.	
3 (7) (iv)	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී, අදාළ අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන් අතරින් තුනෙන් දෙකක්, එබඳු ණය පහසුකමක් පිරිනැමීම සඳහා කැමැත්තෙන් ඡන්දය පාවිච්චි කොට එකී පහසුකම අනුමත කළ අවස්ථාවේ හැර, බැංකුව කිසිඳු අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරයාගේ සමීප ඥාතියෙකුට කිසිදු ණය පහසුකමක් පිරි නොනැමිය යුතුය. මෙබඳු ණය පහසුකමක්, මුදල් මණ්ඩලය මඟින් වරින් වර නිශ්චය කරනු හැකි කිසියම් සුරැකුමකින් ආවරණය කළ යුතුය.	අනුකූල වී ඇත.
3 (7) (v)	(අ) බැංකුවක් කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ පුද්ගලයා විසින් සැලකිය යුතු බැඳියාවක් දරණ කිසියම් ව්‍යාපාරයකට කිසියම් ණය පහසුකමක් පිරිනමනු ලැබූ අවස්ථාවක එකී පුද්ගලයා පසු කාලීනව බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත්කර ඇත්නම්, බැංකුව විසින් එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කළ දිනයේ සිට වසරක් ඇතුළත, මුදල් මණ්ඩලය විසින් මෙබදු කරුණක් සඳහා වරින් වර අනුමත කරනු ලැබිය හැකි අවශ්‍ය සුරැකුම් ලබාගැනීමට බැංකුව විසින් පියවර ගැනිය යුතුය. (ආ) ඉහත කී 3(7) (v) (අ) විධානය මඟින් සලසා ඇති පරිදි එකී කාලසීමාව තුළ එබඳු සුරැකුමක් සම්පාදනය නොකළ අවස්ථාවකදී බැංකුව එකී පහසුකම සම්බන්ධයෙන් ගෙවීමට නියමිත මුදල පොළිය සමඟ, ණය මුදල පිරිනමන අවස්ථාවේදී නියාමනය කළ කාල සීමාව ඇතුළත හෝ එකී අධ්‍යක්ෂවරයෙකු ලෙසින් පත් කළ දිනයේ සිට මාස දහඅටක් ඉකුත්වූ පසු යන මේ දෙකින් මුලින් එළඹෙන දිනයේදී ආපසු අය කරගත යුතුය.	අනුකූල වී ඇත.
	(ඇ) මෙකී උප නියෝග අනුව කටයුතු කරන්නට අපොහොසත් වන කිසියම් අධ්‍යක්ෂවරයෙකු වේ නම් ඔහු එකී අධ්‍යක්ෂධුරය හැර ගියා සේ සැලකෙන අතර, බැංකුව ඒ බව පොදු මහජනතාව වෙත හෙළිදරව් කළ යුතුය. (ඈ) කෙසේ වුවද, පහසුකම පිරිනමන අවස්ථාවේදී එකී අධ්‍යක්ෂවරයා බැංකුවේ සේවකයකුව සිටීමින් හා එකී පහසුකම බැංකුවේ සියළුම සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් යටතේ ලබා දුන් අවස්ථාවකදී මෙම උප විධානය අදාළ නොවිය යුතුය.	
3 (7) (vi)	බැංකුවක්, බැංකුවේ සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් මත වන පදනමින් හෝ ඉහත 3(7)(v) විධානය ප්‍රකාර පහසුකම් පිරිනැමීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කළ හැකි සුරැකුමකින් ආවරණය කළ අවස්ථාවකදී හැර කිසියම් සේවකයෙකුට හෝ සේවකයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ එකී සේවකයා හෝ ආසන්න පවුලේ සාමාජිකයකු සැලකිය යුතු බැඳියාවක් දරණ කිසියම් ව්‍යාපාරයකට හෝ ගාස්තු හෝ කොමිස් කපා හැරීම හා බැඳුණු කිසිඳු පහසුකමක් හෝ වඩා වාසිදායක සැලකීමක් පිරි නොනැමිය යුතුය.	අනුකූල වී ඇත. බැංකුව සියළුම සේවකයන්ට අදාළ වන සාමාන්‍ය සේවක ණය යෝජනා ක්‍රම යටතේ හැර බැංකුවේ කිසිම සේවකයෙකුට වඩා වාසිදායක සැලකීමත්/ ණය පහසුකම් සපයා නැත. මේ පිළිබඳව චක්‍රලේඛන උපදෙස් නිකුත් කර ඇත. බැංකු සේවකයන්ගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට කිසිදු වාසිදායක සැලකීමක්/ පහසුකමක් සපයන්නේ ද නැත.
3 (7) (vii)	බැංකුවක් විසින් ඉහත 3(7)(v), 3(7)(vi) විධාන මත ලබා දුන් කිසිදු පහසුකමක් හෝ එකී පහසුකමක කිසියම් කොටසක් හෝ ඒ සඳහා ලැබිය යුතු කිසියම් පොළියක්, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය රහිතව ප්‍රේෂණය නොකළ යුතු අතර, කිසියම් ප්‍රේෂණයක් සිදු කරයි නම් එය වලංගු රහිත හා බලනොපාන එකක් විය යුතුය.	අනුකූල වී ඇත. 2023 වසර තුළ මෙබඳු තත්ත්වයක් උද්ගත නොවීය.
3 (8) හෙළිදරව් කිරීම		
3 (8) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දෑ තහවුරු කල යුතුය. (අ) වාර්ෂිකව විගණනය කළ මූල්‍ය ප්‍රකාශ හා ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ, සුපරීක්ෂණය හා නියාමන බලධාරීන් විසින් නියම කර ඇති ආකෘතිය හා බල පවත්වනා ගිණුම්කරණ ප්‍රමිති හා සමඟ අනුරූපව සකස් කොට ප්‍රකාශයට පත් කර ඇති බව ද,	අනුකූල වී ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ආ) එකී ප්‍රකාශයන් හි සංක්ෂිප්තයක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පුවත්පත් වල ප්‍රසිද්ධ කරන බව ද,	
3 (8) (ii)	පහත දැක්වෙන අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවේ තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය:	අනුකූල වී ඇත.
	(අ) වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, විශේෂිත හෙළිදරව් කිරීම් ද ඇතුළත්ව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවය අනුව යමින් සකස් කොට ඇති බවට ප්‍රකාශයක්.	වාර්තා පිටු අංක 150 සිට 154 දක්වා බැංකුවේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව යටතේ ද, පිටු අංක 159 හි මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් යටතේ ද හෙළිදරව් කර ඇත.
	(ආ) මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇති බවට හා බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සැකසීම අදාළ මූල්‍යකරණ හා නියාමන අවශ්‍යතා හා අනුරූපවෙමින් ඉටු කළ බවට ද, බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුකූල වී ඇත. වාර්ෂික වාර්තාවේ පිටු අංක 156 සහ 157 හි මූල්‍ය වාර්තාකරණයේ 'අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය' හා පිටු අංක 159 හි 'මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම' තුළ හෙළිදරව් කර ඇත.
	(ඇ) ශ්‍රී ලංකා සහතික කිරීමේ කාර්යභාර ප්‍රමිති 3050 යටතේ අභ්‍යන්තර පාලනය මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ පිළිබඳව බැංකු සඳහා සහතික වාර්තා යටතේ විගණනකරුවන් විසින් නිකුත් කළ සහතික වාර්තා.	අනුකූල වී ඇත. බැංකුව මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලන විධින් හි සඵලතාවය පිළිබඳව විගණනකාධිපතිවරයාගෙන් සහතිකයක් ලබාගෙන ඇති අතර එය මෙම වාර්තාවේ පිටු අංක 158 යටතේ දැක්වේ.
	(ඈ) නාමයන්, යෝග්‍යතාවය, බැංකුව සමඟ ඇති ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවූ මුළු ගාස්තු/ පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තරාත්මක තොරතුරු.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු පිටු අංක 28 සිට 31 හි දක්වා ඇත. බැංකුව සමඟ වන හිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත පිටු අංක 155 හි දක්වා ඇත. බැංකුව විසින් ගෙවූ පාරිශ්‍රමික පිළිබඳ විස්තර, පිටු අංක 200 හි 17 වන සටහන යටතේ දක්වා ඇත.
	(ඉ) 3 (7) (iii) හි නිර්වචනය කර ඇති පරිදි එක් එක් අදාළ පාර්ශ්ව සඳහා ලබා දී ඇති සම්පූර්ණ ශුද්ධ ණය පහසුකම් අදාළ පාර්ශ්වවල එක් එක් කාණ්ඩයට ලබා දී ඇති ශුද්ධ ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස ද හෙළි කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස 2023 වර්ෂය තුළ එක් එක් අදාළ පාර්ශ්වයන් සඳහා ප්‍රදානය කරන ලද සම්පූර්ණ ශුද්ධ ණය පහසුකම් පහත දැක්වේ. අනුකූල වී ඇත.

	රු. '000	%
ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්	808,033	0.29
පරිපාලිතයන්	1,761,103	0.64
ආශ්‍රිත සමාගම්	618,540	0.22
රජය හා රජයට සම්බන්ධිත ආයතන (මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක 61 හි සඳහන් නිර්වචනය බලන්න.)	2,555,864,482	924.66

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඊ) බැංකුව ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට ගෙවූ පාරිශ්‍රමික වල මුළු එකතුව හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් සමඟ බැංකුවේ මුළු ගනුදෙනු එකතුව, ගෙවූ පාරිශ්‍රමික, සැපයූ ණය පහසුකම්, තැන්පතු හා ආයෝජන ආදී විශයෙන් පුළුල් වර්ග යටතේ වෙන්ව දැක්වීම.	අනුකූල වී ඇත. 2023 වර්ෂය සඳහා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට ගෙවූ පාරිශ්‍රමික හා බැංකුව හා ඔවුන් අතර වූ ගනුදෙනු පහත දැක්වේ:
		රු. '000
		කෙටි කාලීන රැකියා ප්‍රතිලාභ 934,076
		පශ්චාත් රැකියා ප්‍රතිලාභ 156,313
		මෙයට අමතරව බැංකුව එහි අනුමත ප්‍රතිලාභ සැලසුම් යටතේ, ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට වාහන පරිහරණය වැනි මුදල්මය නොවන ප්‍රතිලාභ ද සපයා ඇත.
		රු. '000
		ණය 658,976
		බැංකු අයිරා 3,099
		ණය කාඩ්පත් 27,863
		තැන්පතු 1,475,673
		ණයකර -
		භාවිතා නොකළ පහසුකම් 135,847
	(උ) "ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පරිච ප්‍රකාශය 4750" යටතේ නිකුත් කළ විගණකවරුන්ගේ "සත්‍ය සොයා ගැනීම් වාර්තාවන්" හි සියළුම සොයා ගැනීම්, වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව තුළට අන්තර්ගත කර ඇති බවට සහ විගණකවරුන් විසින් ඒ පිළිබඳව බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ වෙත දැනුවත් කර ඇති බව අධ්‍යක්ෂවරුන් විසින් සිය වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවේ සහතික කල යුතුය.	අනුකූල වී ඇත. බැංකුව 2007 අංක 11 දරණ ආයතනික යහපාලන විධානය පිළිබඳව විගණකාධිපතිවරයා ගෙන් සහතිකයක් ලබා ගෙන ඇත. විගණකවරුන්ගේ සියළුම සොයාගැනීම් මෙම ආයතනික යහපාලන වාර්තාව තුළ අන්තර්ගත කර ඇති බවට ද, කිසියම් නිර්දේශයක් වේ නම් ඒ පිළිබඳව අදාල වර්ෂය තුළ කටයුතු කරන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.
	(ඌ) විවක්ෂණශීලී අවශ්‍යතා, නියාමන නීති රීති හා අභ්‍යන්තර පාලන විධි හා කිසියම් සැලකිය යුතු අනුකූල නොවීම් නිවැරදි කරන්නට ගත් ක්‍රියාමාර්ග සමඟ අනුකූලතා විස්තර විදහා පෙන්වන වාර්තාවක්.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව. පිටු 150 සිට 154 දක්වා.
	(එ) බැංකුවේ අවදානම් කළමනාකරණයේ ප්‍රමාද දෝෂ හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දී ඇති පරිදි මෙකී විධානයන් හා අනුකූල නොවීම් පිළිබඳ නියාමන හා සුපරීක්ෂණ සැලකිලිමත් වීම පිළිබඳ ප්‍රකාශයක් හා එවැන්නක් පොදු මහජනතාවට හෙළිදරව් කළ යුතු යැයි මුදල් මණ්ඩලය විසින් නියෝග කළ අවස්ථාවක, එකී සැලකිලිමත් වීම් පිළිබඳව බැංකුව විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග පිළිබඳවද ඇතුලත් කල යුතුය.	අනුකූල වී ඇත. ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාව, 2026 අංක 1 දරණ මූල්‍ය ආයතන (ගනුදෙනුකාර නිසි ප්‍රවේශම් සහගත බව) රීතිවල 59 සහ 95 ට අනුකූල නොවන අවස්ථා සහ එහි සංශෝධන පෙන්නුම් කරයි.
3 (9) (i)	තාවකාලික හා වෙනත් පොදු ප්‍රතිපාදන අනුකූලතාවයට අදාල මෙම විධානය හා අනුකූලත්වය 2008 ජනවාරි 01 දා සිට ඉදිරියට ආරම්භ කෙරෙන අතර, මෙම විධානය තුළ සපයා ඇති අනුකූලතා දිනයන් විශේෂයෙන් සම්පාදනය කර ඇති විටෙක හැර සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු 2009 ජනවාරි 01 දා හෝ ඊට ප්‍රථම මෙම විධානයේ විධිවිධානයට පූර්ණ ලෙසින් අනුකූල විය යුතුය.	අනුකූල වී ඇත.
3 (9) (ii)	ශ්‍රී ලංකාව තුළ විශේෂිත ව්‍යවස්ථාපිත පනත් මඟින් සංස්ථාපනය කරන ලද බැංකු සම්බන්ධයෙන් එකී ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන සමඟ පටහැනි නොවන මෙම විධානයේ සියළුම ප්‍රතිපාදන හා අනුකූල වන්නට පියවර ගත යුතු අතර එකී පනත් තුළින් විශේෂිතව දක්වා ඇති ප්‍රතිපාදන අනුව යමින් දිගටම කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුව 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන මඟින් පැන නැඟෙන ප්‍රතිපාදන හා පටහැනි නොවන ලෙස මෙම විධානයේ අදාළ හැම ප්‍රතිපාදනයක්ම හා අනුකූල වන්නට ගත හැකි හැම ක්‍රියාමාර්ගයක්ම ගනිමින්, එහි නීතිය බලාත්මක කර ඇත. කිසියම් අනුකූල අවස්ථා හා එකඟ නොවන අවස්ථාවන්හි බැංකුව ඊට අදාළ ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන අනුව යමින් කටයුතු කරගෙන යන අවස්ථාවන්හිදී, ඒ බැව් ඉහත අදාළ පරිච්ඡේදයන්හි විශේෂිතව සඳහන් කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2023 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (9) (iii)	මෙම විධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විදේශ බැංකු ශාඛාවකට අදාළ විය යුත්තේ, එය එකී බැංකුවේ සංස්ථාපිත රට තුළ බලාත්මක නීති හා රෙගුලාසි සමඟ පටහැනි නොවන වපසරිය තුළය. විදේශීය බැංකු ශාඛාව, එහි වාර්ෂික වාර්තාව හා ගිණුම් හා ශ්‍රී ලංකා ශාඛා මෙහෙයුම් හා බැඳුණු ගිණුම් සමඟ මව් බැංකුවේ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව ද ප්‍රකාශයට පත් කළ යුතුය.	අදාළ නොවේ.
3 (9) (iv)	මෙම විධානයේ ප්‍රතිපාදන සහ කිසියම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය (හෝ අභ්‍යන්තර රීති) අතර ගැටුමක් මතු වූ කිසියම් අවස්ථාවක මෙම විධානයේ ප්‍රතිපාදන බලපවත්වනු ඇත. කෙසේ වූවත්, එක් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන, මෙම විධානයේ දක්වා ඇති ප්‍රතිපාදනවලට වඩා දැඩි වේ නම් සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ හැකිය.	අදාළ නොවේ.
3 (9) (v)	යම් හෙයකින් අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ බැංකු පනතේ විධි විධාන සලසා ඇති පරිදි විධාන අංක 3 (2) (ii) (ආ), 3 (3) (i) (අ) හා 3 (3) (ii) (අ) හා යොමුවෙන මුදා හැරීම් ලබා නොගත යුතු යැයි මුදල් මණ්ඩලය අදහස් කරන්නේ නම්, එකී පදනම මුදල් මණ්ඩලය විසින් එම තැනැත්තාට දැනුම් දිය හැකි අතර, විභාගයකට පසු මුදල් මණ්ඩලයට මුදා හැරීමේ කාලසීමාව සීමා කළ හැකිය.	අදාළ නොවේ.

කොළඹ කොටස් හුවමාරුව විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත කිරීමේ රීතිවල 9 වන වගන්තියට අනුකූල වීම

අංශය	මූලධර්මය, අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	බලාත්මක දිනය	අනුකූල වීම
9.1.3	ආයතනික යහපාලන නීතිවලට අනුකූල වීමේ තරම තහවුරු කරන ප්‍රකාශය. මෙම ඇමුණුම මෙම අවශ්‍යතාවය සපුරාලයි.		අනුකූල වී ඇත.
9.2.1	බැංකුව විසින් පහත සඳහන් ප්‍රතිපත්ති ස්ථාපිත කර පවත්වාගෙන යා යුතු අතර, ආයතනය විසින් එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ විස්තර සමඟ එම ප්‍රතිපත්ති පවතින බව එහි වෙබ් අඩවියේ හෙළිදරව් කළ යුතුය. (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කරුණු පිළිබඳ ප්‍රතිපත්තිය (ආ) අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පිළිබඳ ප්‍රතිපත්තිය (ඇ) ආයතනික යහපාලනය, නාමයෝජනා සහ නැවත පත්වීම පිළිබඳ ප්‍රතිපත්තිය (ඈ) පාර්ශ්වික පිළිබඳ ප්‍රතිපත්තිය (ඉ) ආයතනයේ ලැයිස්තුගත සුරැකුම්පත්වල වෙළඳාම් කිරීමේ ප්‍රතිපත්ති ඇතුළුව සියලුම අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් සඳහා අභ්‍යන්තර ව්‍යාපාර හැසිරීම් සංග්‍රහය සහ ආචාරධර්ම පිළිබඳ ප්‍රතිපත්තිය (ඊ) අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රතිපත්තිය (උ) කොටස් හිමියන් සහ ආයෝජකයින් සමඟ සබඳතා පිළිබඳ ප්‍රතිපත්තිය (ඌ) පාරිසරික, සමාජීය සහ යහපාලන තිරසාරභාවය පිළිබඳ ප්‍රතිපත්තිය (එ) සමාගම් වත්කම් සහ කොටස් හිමියන්ගේ ආයෝජන පාලනය සහ කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්තිය (ඒ) ආයතනික හෙළිදරව් කිරීම් පිළිබඳ ප්‍රතිපත්තිය (ඔ) විස්ල් බ්ලෝවිං පිළිබඳ ප්‍රතිපත්තිය (ඕ) අල්ලස් සහ දූෂණ විරෝධී ප්‍රතිපත්තිය	2024 ඔක්තෝබර් 01	(ඉ), (එ) සහ (ඒ) හැර අනෙකුත් ඒවාට අනුකූල වේ. බලපවත් වන දිනට හෝ ඊට පෙර අනුකූල වේ.
9.2.2	අභ්‍යන්තර ව්‍යාපාරික හැසිරීම් සංග්‍රහයට අනුකූල වීම සහ ආචාරධර්ම හෝ ලබා දී ඇති නිදහස් කිරීම්වලට අනුකූල වීම සඳහා වන ඕනෑම ලිහිල් කිරීමක්.		කිසිවක් නැත.
9.2.3	බැංකුව සිය වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කළ යුතුය: (i) එහි වෙබ් අඩවියට අදාළව ඉහත රීති 9.2.1 ට අනුකූලව ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති ලැයිස්තුව. (ii) අනුගමනය කරන ලද ප්‍රතිපත්තිවල යම් වෙනස්කම්.	2024 ඔක්තෝබර් 01	බලපවත්වන දිනට හෝ ඊට පෙර අනුකූල විය යුතුය.
9.2.4	ඕනෑම ප්‍රතිපත්තියක් සඳහා ලිඛිත ඉල්ලීමක් මත කොටස් හිමියන්ට එම ප්‍රතිපත්ති සියල්ල ලබා දීම.	2024 ඔක්තෝබර් 01	කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය ඉල්ලීමක් කරන විට ඊට අනුකූල වේ.
9.3.1	බැංකුව පහත (අ), (ආ) සහ (ඇ) කමිටු පිහිටුවා ඇත - (අ) නාමයෝජනා සහ යහපාලන කමිටුව (ආ) පාර්ශ්වික කමිටුව (ඇ) විගණන කමිටුව බැංකුව විසින් වෙනම ස්ථාපිත කළ යුතුය (ඈ) සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව	2024 ඔක්තෝබර් 01	(අ), (ආ) සහ (ඇ) අනුකූලවී ඇත. (ඈ) සම්බන්ධයෙන් බලපවත්වන දිනට පෙර නව කමිටුවක් පිහිටුවනු ලැබේ. දැනට විගණන උපකමිටුව අදාළ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කරයි.
9.3.2	මෙම රීතිවල දක්වා ඇති ඉහත අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සම්බන්ධයෙන් අවශ්‍ය සංයුතිය, වගකීම් සහ හෙළිදරව් කිරීම්වලට බැංකුව අනුකූල විය යුතුය.		කරුණාකර පිටු 122 සිට 131 දක්වා ඇති දැනට පවතින උපකමිටු වාර්තා බලන්න.
9.3.3	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ඉහත රීති 9.3.1 හි සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල සභාපතිවරයා නොවිය යුතුය.		අනුකූලවී ඇත.
9.4.1	රැස්වීම් ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමේදී ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම පිළිපැදීම සහ කොටස් හිමියා සමඟ සියලුම මහා සභා රැස්වීම් පැවැත්වීම.		අදාළ නොවේ. රජය එකම කොටස් හිමියා වන අතර, බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සහ බැංකුව අයත් වන අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

අංශය	මූලධර්මය, අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	බලාත්මක දිනය	අනුකූල වීම
9.4.2	(අ) කොටස් හිමියන් සහ ආයෝජකයින් සමඟ ඵලදායී සන්නිවේදනය සහ සබඳතා පිළිබඳ ප්‍රතිපත්තිය.		අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සන්නිවේදන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.
	(ආ) එවැනි සන්නිවේදනය සඳහා සම්බන්ධ වන පුද්ගලයා.		අනුකූලවී ඇත.
	(ඇ) කොටස් හිමියන් සහ ආයෝජකයින් සමඟ සබඳතා පිළිබඳ ප්‍රතිපත්තියට කොටස් හිමියන්ගේ ප්‍රධාන ගැටළු සහ උත්සුකයන් පිළිබඳව සියලුම අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමේ ක්‍රියාවලියක් ඇතුළත් විය යුතුය.		නිල බලයෙන් අධ්‍යක්ෂවරයා බැංකුව සහ එහි කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය අතර අතරමැදියා ලෙස ක්‍රියා කරයි.
	(ඈ) අතථ්‍ය හෝ දෙමුහුන් ක්‍රම හරහා කිසියම් කොටස් හිමියන්ගේ රැස්වීමක් පැවැත්වීම.		අදාළ නොවේ.
9.5.1	පහත සඳහන් කරුණු ආවරණය වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කරුණු පාලනය කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම.		පවතින ආයතනික යහපාලන ප්‍රතිපත්තිය හරහා අනුකූල වේ.
	(අ) විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර නියෝජන සමතුලිතතාවයක අවශ්‍යතාවය, සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ භූමිකාවන් සහ කාර්යයන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිතය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය තක්සේරු කිරීම සහ ප්‍රධාන විධායක නිලධාරී ඇගයීම සඳහා වූ ක්‍රියා පටිපාටි හඳුනා ගැනීම.		මෙය වසර 2024 දී වැඩිදියුණු වනු ඇත.
	(ආ) ලැයිස්තුගත ආයතනයක් සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාව ඒකාබද්ධ කිරීමට තීරණය කරන්නේ නම්,		බැංකුවේ සභාපති සහ සාමාන්‍යාධිකාරී තනතුරු සක්‍රීය කිරීමේ බලතල අනුව වෙනස් පුද්ගලයන් දෙදෙනෙකු විසින් දරනු ලැබේ.
	(i) එවැනි තනතුරු ඒකාබද්ධ කිරීම සඳහා තාර්කික කරුණු දක්වන්න; සහ,		
	(ii) ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයාගේ (SID) යොමු නියමයන්/ කාර්යයන් සහ එහි බලතල අවශ්‍ය වන අතර, එය මත ගැටුමකදී සභාපතිවරයාගේ බලයට සමාන විය යුතුය.		
	(iii) ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයාගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග සකස් කිරීම.		
	(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියේ විවිධත්වය අවශ්‍ය වේ.		අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය මෙය ආවරණය කරයි.
	(ඈ) ඒ සඳහා තාර්කිකත්වය සමඟ උපරිම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව නියම කරන්න.		1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත සහ එහි සංශෝධන අනුව ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසර ලත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හයකි.
	(ඉ) ලැයිස්තුගත කිරීමේ රීති යටතේ ඇති අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන සඳහන් කිරීම.		මහ බැංකුවේ උපදෙස් මගින් ආවරණය කර ඇත.
	(ඊ) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ස්ථාවර පැමිණීම සහතික කිරීම සඳහා සහ එම තනතුරෙන් ඉවත් වීමට සැලකීම වළක්වා ගැනීම සඳහා අධ්‍යක්ෂවරයකු සහභාගි විය යුතු අවම රැස්වීම් සංඛ්‍යාව සංඛ්‍යාවෙන් සහ ප්‍රතිශතයෙන් සඳහන් කරන්න.		
	(උ) ලැයිස්තුගත ආයතනයේ සහ එහි ලැයිස්තුගත කණ්ඩායම් සමාගම්වල සුරුකුම්පත්වල වෙළඳාම් කිරීම සහ එම අවශ්‍යතා හෙළිදරව් කිරීම සම්බන්ධ අවශ්‍යතා සැපයීම.		අදාළ නොවේ.
	(ඌ) ලැයිස්තුගත ආයතනවල අධ්‍යක්ෂවරුන් විසින් දැරිය හැකි උපරිම අධ්‍යක්ෂ ධුර සංඛ්‍යාව සඳහන් කරන්න.		මහ බැංකුවේ උපදෙස් මගින් ආවරණය කර ඇත
	(එ) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු රැස්වීම්වලට සහභාගී වීමේ අයිතිය පිළිගෙන ගණපූරණය තීරණය කිරීමේදී එම සහභාගිත්වය සැලකිල්ලට ගත යුතුය.		අවශ්‍ය අනුමැතිය සහිතව දැනටමත් ප්‍රායෝගිකව පවතී. ප්‍රතිපත්තියට ඇතුළත් කරනු ඇත.
9.5.2	ලැයිස්තුගත ආයතන විසින් 9.5.1 රීතියේ සඳහන් කර ඇති ප්‍රතිපත්තියේ අවශ්‍යතා වලට අනුකූල වීම තහවුරු කළ යුතු අතර, එවැනි කිසියම් අවශ්‍යතාවයකට අනුකූල නොවීම සඳහා හේතු සහ යෝජිත ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග.		ඉහත දක්වා ඇත.

කොළඹ කොටස් හුවමාරුව විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත කිරීමේ රීතිවල 9 වන වගන්තියට අනුකූල වීම

අංශය	මූලධර්මය, අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	බලාත්මක දිනය	අනුකූල වීම
9.6.1	බැංකුවේ සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි තනතුර එකම පුද්ගලයා විසින් දරනු නොලැබේ.		රීති අංක 9.5.1 හි සඳහන් පරිදි අනුකූල වේ.
9.6.2	ඉහත 9.6.1 රීතියට අනුකූල වීමට නොහැකි ලැයිස්තුගත ආයතනයක් මෙම රීති ක්‍රියාත්මක කළ දින සිට මාසයක් (1) කාලයක් ඇතුළත වෙළඳපල නිවේදනයක් හෝ අනුකූල නොවන දින සිට ක්ෂණික වෙළඳපල නිවේදනයක් නිකුත් කළ යුතුය.		අදාළ නොවේ.
9.6.3	ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයාගේ අවශ්‍යතාවය.		ඉහත රීති අංක 9.5.1 හි දක්වා ඇති පරිදි අදාළ නොවේ.
9.7.1	අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරි සෑම විටම, නීති අංක 9.7.3. ප්‍රකාරව අවශ්‍ය පරිදි සුදුසු පුද්ගලයන් බව සහතික කිරීමට අවශ්‍ය පියවර ගැනීම.		අනුකූලවී ඇත.
9.7.2	අධ්‍යක්ෂවරුන් ලෙස නාමයෝජනා සහ යහපාලන කමිටුව විසින් නිර්දේශ කරන ලද පුද්ගලයින් කොටස් හිමියන්ගේ රැස්වීමට හෝ පත්වීම් කිරීමට පෙර එවැනි නාමයෝජනා ඉදිරිපත් කිරීමට පෙර මෙම රීතිවලට අනුව අවශ්‍ය පරිදි සුදුසු බව බැංකුව සහතික කළ යුතුය.		අනුකූලවී ඇත.
9.7.3	2023 මූල්‍ය වර්ෂය සඳහා සුදුසු සහ නිසි තක්සේරු නිර්ණායක පිළිබඳ තහවුරු කිරීම.		අනුකූලවී ඇත.
9.7.4	ලැයිස්තුගත ආයතන තම අධ්‍යක්ෂවරුන්ගෙන් සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් වාර්ෂික පදනමින් ප්‍රකාශ ලබා ගත යුතු අතර, ඔවුන් එක් එක් අය අදාළ මූල්‍ය වර්ෂය තුළ මෙම රීතිවල දක්වා ඇති සුදුසු සහ නිසි ඇගයීම් නිර්ණායක අඛණ්ඩව තෘප්තිමත් කර ඇති බව තහවුරු කරන අතර එම තහවුරු කරන දිනට එම නිර්ණායක සපුරාලයි.		අනුකූලවී ඇත.
9.7.5	බැංකුවේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම්: (අ) ලැයිස්තුගත ආයතනයේ අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතිවල දක්වා ඇති සුදුසු සහ නිසි ඇගයීම් නිර්ණායක සපුරාලන බවට ප්‍රකාශයක්. (ආ) මූල්‍ය වර්ෂය තුළ මෙම රීතිවල දක්වා ඇති සුදුසු සහ නිසි ඇගයීම් නිර්ණායක සමඟ ලැයිස්තුගත ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු සහ/හෝ ප්‍රධාන විධායක නිලධාරි විසින් යම් අනුකූලතාවයක් නොමැති වීම සහ එවැනි නොගැලපීම් නිවැරදි කිරීමට ලැයිස්තුගත ආයතනය විසින් ගන්නා ලද ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග.		අනුකූලවී ඇත. ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන විධායක නිලධාරි කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතිවල දක්වා ඇති සුදුසු සහ නිසි ඇගයීම් නිර්ණායක සපුරා ඇත.
9.8.1	ලැයිස්තුගත ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩලය, අවම වශයෙන්, අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකුගෙන් (05) සමන්විත විය යුතුය.		අනුකූලවී ඇත. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය හය (06) දෙනෙකුගෙන් සමන්විත වේ.
9.8.2	ස්වාධීන අධ්‍යක්ෂවරුන් අවම සංඛ්‍යාව: (අ) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අවම වශයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු (2) හෝ ලයිස්තුගත ආයතනයේ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට (1/3) සමාන සංඛ්‍යාවක් ඕනෑම අවස්ථාවක ඇතුළත් විය යුතුය.		අනුකූලවී ඇත.
9.8.3 සහ 9.8.5	මෙම රීතිය යටතේ ලබා දී ඇති නිර්ණායක මත පදනම්ව අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය තීරණය කිරීම.	2024 ඔක්තෝබර් 01	වර්තමානයේ ස්වාධීනත්වය තීරණය වන්නේ මහ බැංකුවේ උපදෙස් මත ය. කොළඹ කොටස් හුවමාරුවේ නීති මත පදනම්ව ස්වාධීනත්වය බලපවත්වන දිනට හෝ ඊට පෙර තීරණය කරනු ලැබේ.
9.9	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට අනුකූල වීමේ අවශ්‍යතා.		අවශ්‍යතාවය පැනනඟින විට සහ විකල්ප අධ්‍යක්ෂවරයෙකුගේ අවශ්‍යතාවයට අනුකූල වේ.

අංශය	මූලධර්මය, අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	බලාත්මක දිනය	අනුකූල වීම
9.10.1	9.5.1 රීතියේ දක්වා ඇති ආකාරයට එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට පැවැත්වීමට අවසර දී ඇති උපරිම අධ්‍යක්ෂ ධුර සංඛ්‍යාව පිළිබඳ බැංකුව සිය ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය. අධ්‍යක්ෂවරයෙකු(ය) විසින් එම සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවකදී, ඉහත රීති 9.5.2 හි නිශ්චිතව දක්වා ඇති ආකාරයට ආයතනය විසින් එවැනි නොගැලපීම් සඳහා පැහැදිලි කිරීමක් සැපයිය යුතුය.		ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත පදනම්ව උපරිම අධ්‍යක්ෂ ධුර සංඛ්‍යාව තීරණය කරනු ලබන අතර එයට අනුකූලව කටයුතු කර ඇත.
9.10.2	බැංකුව, එහි අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමෙන් පසු, පහත සඳහන් දෑ සඳහන් කරමින් ක්ෂණික වෙළඳපල නිවේදනයක් නිකුත් කළ යුතුය. i. එවැනි අධ්‍යක්ෂවරයෙකුගේ කෙටි සාරාංශයක්; ii. ඔහුගේ/ඇයගේ අධ්‍යක්ෂක හැකියාව; සහ, iii. එවැනි පත්කිරීමක් ආයතනයේ නාමයෝජනා සහ යහපාලන උපකමිටුව විසින් සමාලෝචනය කර තිබේද යන්න පෙන්නුම් කරන ආයතනයේ ප්‍රකාශය.		(i) සහ (ii) සමඟ අනුකූල වේ.
9.10.3	ඉහත රීති 9.3 හි සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සංයුතියේ කිසියම් වෙනස්කමක් සම්බන්ධයෙන් බැංකුව විසින් ක්ෂණික වෙළඳපල නිවේදනයක් නිකුත් කළ යුතුය.		අනුකූල විය යුතුය.
9.10.4	වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය කිරීම: (අ) නම, සුදුසුකම් සහ කෙටි පැතිකඩ 26 සිට 31 දක්වා පිටුවල දක්වා ඇත. (ආ) අදාළ ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ ප්‍රවීණත්වයේ ස්වභාවය පිටු 28 සිට 31 දක්වා දක්වා ඇත. (ඇ) අධ්‍යක්ෂවරයාට හෝ පවුලේ සමීප සාමාජිකයන්ට වෙනත් අධ්‍යක්ෂවරුන් සමඟ කිසියම් ප්‍රමාණාත්මක ව්‍යාපාරික සබඳතාවක් තිබේද යන්න පිටු 312 සිට 319 දක්වා දක්වා ඇත. (ඈ) විධායක, විධායක නොවන සහ/හෝ ස්වාධීන අධ්‍යක්ෂ යන්න පිටු 26 සිට 31 දක්වා දක්වා ඇත. (ඉ) අදාළ අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂවරයෙකු සහ/හෝ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස සේවය කරන ශ්‍රී ලංකාවේ සමාගම්වල මුළු නාම සංඛ්‍යාව, එවැනි සමාගම් ලැයිස්තුගත කර තිබේද හෝ ලැයිස්තුගත කර නොමැතිද යන්න පෙන්නුම් කරමින්, එවැනි අධ්‍යක්ෂකවරයෙකු විධායක හෝ විධායක නොවන ධාරිතාවක් ලෙස ක්‍රියා කරන්නේද යන්න (එසේ නම්, අධ්‍යක්ෂ ධුර බැංකුවේ කොටසක් වන සමූහයේ ඒවා හෙළිදරව් කළ යුතු නැත) පිටු 312 සිට 319 දක්වා දක්වා ඇත. (ඊ) සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන 116 පිටුවේ දක්වා ඇත. (උ) අධ්‍යක්ෂවරයා සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල නම් 122 සිට 131 දක්වා පිටුවල දක්වා ඇත. (ඌ) අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල රැස්වීම්වලට පැමිණීම පිළිබඳ විස්තර 116 පිටුවේ දක්වා ඇත. (එ) ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයාගේ නියමයන් සහ බලතල (අදාළ වන විට).		අනුකූලවී ඇත. අදාළ නොවේ
9.11.1	මෙම රීතිවල 9.11 රීතියේ දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල වන නාමයෝජනා සහ යහපාලන කමිටුවක් බැංකුව සතුව තිබිය යුතුය.		අනුකූලවී ඇත.
9.11.2	නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ අධ්‍යක්ෂවරුන් නැවත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම සඳහා නාමයෝජනා සහ යහපාලන කමිටුව හරහා විධිමත් ක්‍රියා පටිපාටියක් බැංකුව විසින් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතුය.		බැංකුව යටත් වන අමාත්‍යවරයා අධ්‍යක්ෂවරුන් පත් කරයි. කෙසේ වෙතත්, මෙය නව පත්වීම් සමඟ අනුකූල වේ.
9.11.3	නාමයෝජනා සහ යහපාලන කමිටුවට එහි විෂය පථය, අධිකාරිය, රාජකාරි සහ රැස්වීම්වල ගණපූරණයට අදාළ කරුණු පැහැදිලිව නිර්වචනය කරන ලිඛිත යොමු කොන්දේසි තිබිය යුතුය.		අනුකූලවී ඇත.

කොළඹ කොටස් හුවමාරුව විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත කිරීමේ රීතිවල 9 වන වගන්තියට අනුකූල වීම

අංශය	මූලධර්මය, අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	බලාත්මක දිනය	අනුකූල වීම
9.11.4	නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුවේ සංයුතිය (1) නාමයෝජනා සහ යහපාලන කමිටුවේ සාමාජිකයින් විසින්; (අ) අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (03) සමන්විත වන අතර ඉන් අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකු (02) ලැයිස්තුගත ආයතනයේ ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය. (ආ) ලැයිස්තුගත ආයතනයේ විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත නොවේ. (2) ස්වාධීන අධ්‍යක්ෂවරයකු සභාපතිවරයා ලෙස පත් කළ යුතුය. (3) නාමයෝජනා සහ යහපාලන කමිටුවේ සභාපතිවරයා සහ සාමාජිකයින් බැංකුවේ වාර්ෂික වාර්තාවෙන් හඳුනාගත යුතුය.		අනුකූලවී ඇත.
9.11.5	නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුවේ කාර්යයන් මෙම වාර්ෂික වාර්තාවේ 128 සහ 129 පිටුවල ඇතුළත් වේ.		බැංකුව, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත සහ එහි සංශෝධන බලාත්මක කිරීමේ විධිවිධානවලට යටත්ව අනුකූල වේ.
9.11.6	නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුවේ වාර්තාවේ හෙළිදරව් කිරීම්.		යෙදුම් අදාළව අනුකූල වේ.
9.12	පාරිශ්‍රමික කමිටුව		අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය විසින් වන අතර බැංකුවේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ලෙස හඳුන්වන මෙම කමිටුව ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ පාරිශ්‍රමික සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොමු කරනු ලබන අනෙකුත් මානව සම්පත් කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරයි. මෙම කමිටුවේ වාර්තාව 126 සහ 127 පිටුවල දක්වා ඇත.
9.13	විගණන කමිටුව		
9.13.2	විගණන කමිටුවට එහි විෂය පථය, අධිකාරිය සහ රාජකාරි පැහැදිලිව නිර්වචනය කරන ලිඛිත යොමු කොන්දේසි තිබිය යුතුය.		අනුකූලවී ඇත.

අංශය	මූලධර්මය, අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	බලාත්මක දිනය	අනුකූල වීම
9.13.3.	විගණන කමිටුවේ සංයුතිය		
	(1) (අ) ලැයිස්තුගත ආයතනයේ අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (03) සමන්විත වන අතර, ඉන් අවම වශයෙන් දෙදෙනෙකු (02) හෝ සාමාජිකයින්ගෙන් බහුතරයක්, ඉන් ඉහළ අය ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය.		අනුකූලවී ඇත.
	(ආ) ලැයිස්තුගත ආයතනයේ විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත නොවේ.		
	(2) විගණන කමිටුවේ රැස්වීමක් සඳහා ගණපූරණයට පැමිණ සිටින අයගෙන් බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය.	2024 ඔක්තෝබර් 01	මෙම අවශ්‍යතාවයට අනුකූල වේ. කෙසේ වෙතත්, එය ක්‍රියාත්මක වන දිනට හෝ ඊට පෙර කමිටු ප්‍රඥප්තිය වෙත ඇතුළත් කෙරේ.
	(3) මූල්‍ය වෙළඳපළට නිකුත් කිරීමට නිර්දේශ කිරීමට පෙර විගණන කමිටුව කාර්තුමය පදනමින් අනිවාර්යයෙන් රැස්වන්නේ නම් විගණන කමිටුවට අවශ්‍ය සෑම විටම රැස්විය හැක.		අනුකූලවී ඇත.
	(4) මව් සමාගම සහ අනුබද්ධ ආයතනය යන දෙකම ලැයිස්තුගත ආයතන නම්, මව් සමාගමේ විගණන කමිටුව අනුබද්ධිත ආයතනයේ විගණන කමිටුව ලෙස ක්‍රියා කළ හැකිය.		ලැයිස්තුගත අනුබද්ධ ආයතනය සඳහා වෙනම විගණන කමිටුවක් ඇත.
	(5) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවේ සභාපතිවරයා ලෙස ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත් කළ යුතුය.		අනුකූලවී ඇත.
	(6) විගණන කමිටුව විසින් වෙනත් ආකාරයකින් තීරණය කරනු ලැබුවහොත් මිස, ලැයිස්තුගත ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී ආරාධනයෙන් විගණන කමිටු රැස්වීම්වලට සහභාගී විය යුතුය. කෙසේ වෙතත් ලැයිස්තුගත ආයතනය වෙනම අවදානම් කමිටුවක් පවත්වාගෙන යන විට, ප්‍රධාන විධායක නිලධාරී ආරාධනයෙන් අවදානම් කමිටු රැස්වීම්වලට සහභාගි විය යුතුය.		අනුකූලවී ඇත.
	(7) විගණන කමිටුවේ සභාපතිවරයා පිළිගත් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක සාමාජිකයෙකු විය යුතුය.		අනුකූලවී ඇත.
9.13.4	විගණන කමිටුවේ කාර්යයන්.		අනුකූලවී ඇත.
9.13.5	වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම්.	2024 ඔක්තෝබර් 01	අර්ධ වශයෙන් අනුකූලවී ඇත.
9.14.1	ලැයිස්තුගත ආයතනවලට අදාළ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවක් තිබිය යුතුය.	2024 ඔක්තෝබර් 01	බලපවත් වන දිනට හෝ ඊට පෙර අනුකූල විය යුතුය.
9.16	අතිරේක හෙළිදරව් කිරීම්		අනුකූලවී ඇත.

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය හා බැඳුණු ලැයිස්තුගත රීති හා අනුකූලවීම් පහත පරිදි සාරාංශ කළ හැකිය.

රීති අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේදය	ඉදිරිපත් කළ දිනය
7.4.අ.(i)	කාර්තුමය පදනම මත සකස් කළ අතුරු මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර, කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, පළමු කාර්තු තුන සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තු නිමවී දින 45 ක් තුළ දී ද අවසන් කාර්තුව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තුව අවසන් වූ දින සිට මාස දෙකක් තුළ ද ඉදිරිපත් කළ යුතුය.	2023 මාර්තු 31 න් අවසන් පළමු කාර්තුව	2023 මැයි 15
		2023 ජූනි 30 න් අවසන් දෙවන කාර්තුව	2023 අගෝස්තු 15
		2023 සැප්තැම්බර් 30 න් අවසන් තෙවන කාර්තුව	2023 නොවැම්බර් 15
		2023 දෙසැම්බර් 31 න් අවසන් සිව්වන කාර්තුව	2024 පෙබරවාරි 29

රීති අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේදය
7.4.ආ.(i)	ශ්‍රී ලං.ගි.ප්‍ර. 34 ට අනුකූලවීම සහ බැංකුව හා සමූහය වෙන් වෙන්ව හෙළිදරව් කිරීම.	අනුකූල වී ඇත.
7.4.ආ.(ii)	ලැයිස්තුගත රීති වලට අනුව අතිරේක සටහන් සහ අනුපාත හෙළිදරව් කිරීම.	අනුකූල වී ඇත.
7.4.ආ.(iii)	අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කිරීම.	අනුකූල වී ඇත.
7.4.ආ.(iv)	මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇති ද යන්න සඳහන් කිරීම.	අනුකූල වී ඇත.
7.5.අ	අදාළ මූල්‍ය වර්ෂය අවසන් වන දින සිට මාස 5 ක් තුළ වාර්ෂික වාර්තාව කොළඹ කොටස් හුවමාරුවට ඉදිරිපත් කළ යුතුය.	2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි 29 දින ඉදිරිපත් කර ඇත. 2023 වසර සඳහා වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර ඉදිරිපත් කෙරෙනු ඇත.

රීති අංකය	අනාවරණ අවශ්‍යතාවය	පරිශීලනය/අදහස්	පිටු අංකය
7.6.(i)	අදාළ මූල්‍ය වර්ෂය තුළ ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව	152-153
7.6.(ii)	අදාළ මූල්‍ය වර්ෂය තුළ දී ආයතනයෙහි සහ එහි පරිපාලිතයන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ එම ක්‍රියාකාරකම්හි ස්වභාවයේ සිදුවූ වෙනස්කම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව	150
		මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්	176
7.6.(iii)	ජන්ද හිමි හා අහිමි කොටස් හිමිකාරිත්වය මත, ඉහළම ප්‍රමුඛත්වය ලැබූ ප්‍රථම කොටස් හිමියන් 20 දෙනාගේ නම්, හිමිකම් කියනු ලබන කොටස් ප්‍රමාණය සහ අදාළ හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	ශ්‍රී ලංකා රජය ලංකා බැංකුවෙහි එකම කොටස්හිමියා වේ.	413
7.6.(iv)	පොදු හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	අදාළ නොවේ.	
7.6.(v)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රකාශය	අදාළ නොවේ.	
7.6.(vi)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රකාශය	අවදානම් සහ අවස්ථා.	132-148
7.6.(vii)	ආයතනයෙහි සේවක සහ ක්ෂේත්‍ර සබඳතාවයන්ට අදාළ ප්‍රමාණාත්මක ගැටළු පිළිබඳ තොරතුරු	සලකා බලනු ලබන වර්ෂය තුළ දී ප්‍රමාණාත්මක ගැටළු කිසිවක් පැන නොනැඟිණි.	
7.6.(viii)	ආයතනය සතු ඉඩම් සහ ආයෝජිත දේපළවල ප්‍රමාණ, පිහිටීම, තක්සේරු වටිනාකම සහ ඒවායේ ඇති ගොඩනැඟිලි සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 33 සහ 34	253-273
7.6.(ix)	ආයතනයෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් නියෝජනය වන කොටස් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 50.1	300

රීති අංකය	අනාවරණ අවශ්‍යතාවය	පරිශීලනය/අදහස්	පිටු අංකය
7.6.(x)	එක් එක් වර්ගයේ ස්කන්ධ සුරැකුම් හිමිකරුවන් ගණන සහ ඒම හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස දක්වන ලද ව්‍යාප්ති සටහන	ශ්‍රී ලංකා රජය ලංකා බැංකුවෙහි එකම කොටස්හිමියා වේ.	413
7.6.(xi)	අනුපාතයන් සහ වෙළඳපළ මිල පිළිබඳ තොරතුරු		
	1. කොටසක ලාභාංශය, කොටසක ශුද්ධ වත්කම්, සංසන්දනීය රාජ්‍ය සුරැකුම්පත්වල පොළී අනුපාතිකය, ණය/ප්‍රාග්ධන අනුපාතිකය, පොළී ආවරණය සහ ද්‍රවශීල වත්කම් අනුපාතය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 20 සහ 50.2	203, 300
		අතිරේක තොරතුරු	401
	2. ලැයිස්තුගත ණයකර වලට අදාළ වෙළඳපළ තොරතුරු	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 49	297
		අතිරේක තොරතුරු	401
	3. ණය ශ්‍රේණිගත කිරීමෙහි සිදුවූ වෙනස්වීම්	ආයතනික තොරතුරු	432
7.6.(xii)	ආයතනයේ සහ එහි පරිපාලිතයන්ගේ ස්ථාවර වත්කම්වල සහ ඉඩම්වල වෙළඳපළ වටිනාකම, පොත් අගයත් අතර සැලකිය යුතු වෙනස්වීම්	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 34	255-273
7.6.(xiii)	ආයතනය වර්ෂය තුළදී ප්‍රසිද්ධ නිකුතුවකින්, හිමිකම් නිකුතුවකින් හෝ පුද්ගලික නිකුතුවකින් අරමුදල් සම්පාදනය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 44, 49 සහ 50	282, 297 and 300
7.6.(xiv)	සේවකයින් සතු කොටස් හිමිකාරිත්වය හෝ කොටස් යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු	අදාළ නොවේ.	
7.6.(xv)	7 වන කොටසෙහි 7.10.3, 7.10.5 (ඇ), 7.10.6 (ඇ) යන රීතීන් වලට අදාළව ආයතනික යහපාලනය පිළිබඳ අනාවරණයන්	ආයතනික යහපාලනය සම්බන්ධයෙන් 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධාන වලට අනුකූලව බැංකුව කටයුතු කරන බැවින් ලැයිස්තුගත කිරීමේ 7.10 විධානය යටතේ නිදහස් කර ඇත.	
7.6.(xvi)	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇති ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම් වලින් 5% යන දෙකෙන් අඩු අගය ඉක්මවන සම්බන්ධිත පාර්ශ්වයන් හා සිදුකළ ගනුදෙනු	අතිරේක තොරතුරු	415

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

චක්‍ර ලේඛ අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේද	සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් වල පලකළ දිනය
2019 අංක 02 2019 ජනවාරි 18	6.1 සෑම කාර්තුවකම අවසාන දිනෙන් මාස දෙකක් ඇතුළත සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පතක අවම වශයෙන් එක් වරක්වත් පළකළ යුතුය.	2023 මාර්තු 31 න් අවසන් පළමු කාර්තුව	2023 මැයි 26
		2023 ජූනි 30 න් අවසන් දෙවන කාර්තුව	2023 අගෝස්තු 25
	6.2 වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශනය මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස පහක් ඇතුළත සිදු කළ යුතුය.	2023 සැප්තැම්බර් 30 න් අවසන් තෙවන කාර්තුව	2023 නොවැම්බර් 30
	6.3 මූල්‍ය වර්ෂය අවසාන වී මාස 3 ක් ඇතුළත බැංකුව විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කළ හොත්, 4 වෙනි කාර්තුව සඳහා වන මූල්‍ය ප්‍රකාශන පල කිරීම සම්බන්ධයෙන් ඉහත 6.1 ට අනුව කටයුතු කිරීම අනිවාර්ය නොවේ.	2023 දෙසැම්බර් 31 න් අවසන් සිව් වන කාර්තුව (විගණනය කරන ලද)	2024 මාර්තු 22

බලපත්‍රලාභී වාණිජ බැංකු වල මූල්‍ය ප්‍රකාශන වලට අදාළ අනෙකුත් හෙළිදරව් කිරීම් වලට අනුකූල වීම් පහත පරිදි සාරාංශ කළ හැකිය:

1.	**මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය සඳහා මූල්‍ය උපකරණ වල වැදගත්කම පිළිබඳ තොරතුරු**	
1.1	**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**	
1.1.1	මූල්‍ය වත්කම් හා වගකීම් වර්ග හෙළිදරව් කිරීම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 21
1.1.2	අනෙකුත් හෙළිදරව් කිරීම්	
	(i) ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට ගණනය කිරීම සඳහා නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම් පිළිබඳ විශේෂ හෙළිදරව් කිරීම්. ණය අවදානම හා වෙළඳපල අවදානම, මෙම අවදානම් සඳහා ආරෝපිත සාධාරණ අගයෙහි වෙනස්වීම් සහ ඇගයීම් ක්‍රම යනාදිය ද මෙයට ඇතුළත් වේ.	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 4.4, 27 සහ 64
	(ii) මූල්‍ය උපකරණ එක් කාණ්ඩයකින් තවත් වර්ගයකට නැවත වර්ගීකරණය කිරීම.	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.4
	(iii) සුරැකුම් ලෙස අඩපණය කළ මූල්‍ය වත්කම් පිළිබඳ තොරතුරු සහ සුරැකුම් වශයෙන් තබා ඇති මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 58
	(iv) මූල්‍ය වත්කම් වර්ග වල ණය අලාභය සඳහා ප්‍රතිපාදන ගිණුම සංසන්දන කිරීම.	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 28.1 සහ 28.2
	(v) බහුවිධ ව්‍යුත්පන්න උපකරණ වලින් සමන්විත සංයුක්ත මූල්‍ය උපකරණ පිළිබඳ තොරතුරු	නැත.
	(vi) ණය ගිවිසුම් කොන්දේසි කඩකිරීම් පිළිබඳ	නැත.
1.2	**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**	
1.2.1	ආදායම්, වියදම්, ලාභ හා පාඩු අයිතම අනාවරණය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 7 සිට 18 දක්වා
1.2.2	අනෙකුත් හෙළිදරව් කිරීම්	
	(i) ලාභ හා පාඩු මඟින් සාධාරණ අගයට නම් නොකළ මූල්‍ය උපකරණ මත වන මුළු පොළී ආදායම සහ පොළී වියදම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 8
	(ii) ගාස්තු ආදායම් සහ වියදම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 9
	(iii) මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව හානිකරණ අලාභ වටිනාකම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 14
	(iv) හානිකරණය වූ මූල්‍ය වත්කම් මත පොළී ආදායම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 8.1
1.3	**අනෙකුත් හෙළිදරව් කිරීම්**	
1.3.1	මූල්‍ය උපකරණ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 4.4, 21 සිට 30 දක්වා, 39 සිට 44 දක්වා සහ 49
1.3.2	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වගකීම් පිළිබඳ තොරතුරු	නැත.
1.3.3	වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ස්කන්ධ උපකරණ වල ආයෝජන	
	(i) වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ස්කන්ධ උපකරණ වල තොරතුරු සහ එලෙස හඳුනා ගැනීමට හේතු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 30
	(ii) ශේෂ පත්‍ර දිනට එක් එක් ආයෝජන වල සාධාරණ අග	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 30.2 සහ 30.3
	(iii) සැසඳිය හැකි ධාරණ අගයන්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 30
	(iv) සාධාරණ අගය තීරණය කළ ආකාරය පිළිබඳ විස්තරයක්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
	(v) වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ හඳුනා නොගත් සහ ශේෂ පත්‍ර දිනට දරා සිටින ආයෝජන සඳහා කාලපරිච්ඡේදය තුළ හඳුනා ගත් ලාභාංශ	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 13
	(vi) කාලපරිච්ඡේදය තුළ ස්කන්ධයේ සිදු වූ සමුච්චිත ලාභ හෝ පාඩු මාරු කිරීම් සහ එලෙස මාරු කිරීමට හේතු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 12

	(vii) වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ස්කන්ධ උපකරණ වල ආයෝජන වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ ඉවත් කෙරේ නම්,	නැත.
	• ආයෝජන ඉවත් කිරීමට හේතු	
	• ඉවත් කිරීමේ දිනට ආයෝජන වල සාධාරණ අගය	
	• ඉවත් කිරීමෙන් ලද සමුච්චිත ලාභ හෝ අලාභ	
1.3.4	මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම.	
	(i) වාර්තා කරන කාලපරිච්ඡේදය හෝ පෙර කාලපරිච්ඡේදය තුළ සියළුම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම් සඳහා	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.4
	• නැවත වර්ගීකරණය කල දිනය	
	• ව්‍යාපාර ආකෘතියේ වෙනස්කම් පිලිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීම් සහ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි එහි බලපෑම දැක්වෙන ගුණාත්මක විස්තරයක්	
	• එක් එක් කාණ්ඩයේ නැවත වර්ගීකරණය කිරීමේ වටිනාකම	
	(ii) ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ අගයේ සිට වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ක්‍රමක්ෂය පිරිවැයට නැවත වර්ගීකරණය කිරීම් සඳහා	නැත.
	• නැවත වර්ගීකරණය සිදු කරන දිනට තීරණය කළ සවල පොළී අනුපාතය	
	• හඳුනාගත් පොළී ආදායම	
	(iii) වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයේ සිට ක්‍රමක්ෂය පිරිවැයට නැවත වර්ගීකරණය කිරීම් සඳහා හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ අගයේ සිට ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට නැවත වර්ගීකරණය කිරීම් සඳහා	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.4
	• ශේෂ පත්‍ර දිනට මූල්‍ය වත්කම් වල සාධාරණ අගය	
	• මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කර නොමැති නම් වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගත් සාධාරණ අගයේ ලාභ හෝ අලාභ	
1.3.5	හෙජින් ගිණුම් පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 53
1.3.6	සාධාරණ අගයට නම් කළ සියළුම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල සාධාරණ අගයන් පිළිබඳ තොරතුරු පහත කරුණු සමඟ:	
	(i) සැසඳිය හැකි ධාරණ අගයන්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
	(ii) සාධාරණ අගය තීරණය කළ ආකාරය පිළිබඳ විස්තරයක්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
	(iii) සාධාරණ අගය තීරණය කිරීමට භාවිතා කළ යෙදවුම් වල මට්ටම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
	(iv) (අ) සාධාරණ අගය මැනීමේ ධූරාවලි මට්ටම් සංචලනයේ සැසඳුම්	නැත.
	(ආ) තෙවන මට්ටමේ යෙදවුම් යොදාගෙන සාධාරණ අගයට අගය කළ මූල්‍ය උපකරණ සඳහා වන අමතර හෙළිදරව් කිරීම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.1.3
	(v) විශ්වාසනීය ලෙස අගය කළ නොහැකි සාධාරණ අගය පිළිබඳ තොරතුරු	නැත.
2.	**මූල්‍ය උපකරණ වල ස්වභාවය හා ඉන් පැන නඟින අවදානම් වල ප්‍රමාණය පිළිබඳ තොරතුරු**	
2.1	**ගුණාත්මක හෙළිදරව් කිරීම්**	
2.1.1	සියළුම මූල්‍ය උපකරණ වර්ගයන්හි අවදානම් අනාවරණයන්	අවදානම් සහ අවස්ථා සහ මූල්‍ය ප්‍රකාශ වල සටහන් අංක 64
2.1.2	කළමනාකරණ අරමුණු ප්‍රතිපත්ති සහ ඒම අවදානම කළමනාකරණය කිරීමේ ක්‍රියාවලි	අවදානම් සහ අවස්ථා
2.1.3	කලින් වර්ෂ වල වෙනස් වීම්	අවදානම් සහ අවස්ථා
2.2	**ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම්**	
2.2.1	ශේෂ පත්‍ර දිනට එක් එක් අවදානම් පිළිබඳ අනාවරණයන්ගේ ප්‍රමාණාත්මක දත්ත සාරාංශය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64
2.2.2	ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, වෙළඳපළ අවදානම, මෙහෙයුම් අවදානම, පොළී අනුපාත අවදානම පිළිබඳ හෙලිදරව් කිරීම් හා මෙම අවදානම් කළමනාකරණය කරන ආකාරය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64
	(i) ණය අවදානම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64.2
	(අ) අනාවරණය කරන ඉහළම ප්‍රමාණය (සුරැකුම් වල වටිනාකම අඩු කිරීමට පෙර), සුරැකුම් පිළිබඳ විස්තරයක්, හිඟ හෝ හානිකරණය නොවූ මූල්‍ය වත්කම් වල ණය ගුණාත්වය පිළිබඳ තොරතුරු සහ මූල්‍ය වත්කම් වල ණය ගුණාත්වය පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64.2.2
	(ආ) හිඟ හෝ හානිකරණය වූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ඒම වත්කම් වල කාල ප්‍රමාණය, හානිකරණය වූ ලෙස තීරණය කිරීමට සලකා බලන ලද කරුණු, සියළුම වර්ගයේ මූල්‍ය වත්කම් වල සුරැකුම් පිළිබඳ විස්තරයක්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64.2.1

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

(ඇ) ලබාගත් හෝ කැදවූ සුරැකුම් හෝ වෙනත් ණය වැඩි කිරීම් පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 64.2.2.1
(ඈ) ණය අවදානම කළමනාකරණ පරිචයන් - ණය අවදානම කළමනාකරණ පරිචයන් සහ අපේක්ෂිත ණය අලාභ මැනීමට භාවිතා කළ ක්‍රම, උපකල්පන සහ තොරතුරු ඇතුළත්ව ඒවා අපේක්ෂිත ණය අලාභ මැනීමට සහ හඳුනා ගැනීමට අදාළ වන ආකාරය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 28 සහ 64
• අපේක්ෂිත ණය අලාභ මඟින් පැන නඟින මූල්‍ය ප්‍රකාශන වර්නාකම් වල වෙනස්කම් සහ වෙනස්කම් වලට බලපෑ හේතු ඇගයීමට ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු	
• මූල්‍ය උපකරණ වල ණය අවදානම මූලික හඳුනා ගැනීමෙන් පසු සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති ද යන්න බැංකුව තීරණය කරන ආකාරය	
• විවිධ මූල්‍ය උපකරණ පැහැර හැරීම් සඳහා බැංකුවේ නිර්වචන සහ එම නිර්වචන තෝරා ගැනීමට හේතු	
• අපේක්ෂිත ණය අලාභ සාමූහික පදනමක් මත අගය කරන්නේ නම් උපකරණ කාණ්ඩ ගත කරන ආකාරය	
• මූල්‍ය වත්කම් ණය හානිකරණය වන්නේද යන්න බැංකුව තීරණය කරන ආකාරය	
• නැවත අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් නොමැති බවට ඇති දර්ශකද ඇතුළත්ව බැංකුවේ කපා හැරීමේ ප්‍රතිපත්තිය	
• සංශෝධන අවශ්‍යතා යොදාගෙන ඇති ආකාරය	
(ඉ) අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 28
• අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු කිරීමේදී භාවිතා කළ යෙදවුම් වල පදනම, උපකල්පන සහ ඇස්තමේන්තු කිරීමේ ශිල්ප ක්‍රම	
• අපේක්ෂිත ණය අලාභ තීරණය කිරීමේදී සාර්ව ආර්ථික තොරතුරු ද ඇතුළත්ව අනාගතයට අදාළ තොරතුරු යොදා ගෙන ඇති ආකාරය. ඇස්තමේන්තු කිරීමේ ශිල්ප ක්‍රම වල සිදු වූ වෙනස්කම් හෝ වාර්තා කරන කාල පරිච්ඡේදය තුළ සිදු කළ සැලකිය යුතු උපකල්පන	
(ඊ) අපේක්ෂිත ණය අලාභ වලින් පැන නඟින වර්නාකම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 22, 24, 28 සහ 29
